Vol. XLIV

# SIMON HEWAVITARNE BEQUEST.

# PAPANCA SŪDANĪ

OR

THE COMMENTARY ON THE

# MAJJHIMA NIKĀYA.

PART II

පපඤ්චසූදනී

නාම

# මජ්ඣිමනිකායට්ඨකථා

දුතියො භාගො.

විමලධම්ම හේවාවිතාරණ මහාසයෙන

සිරිනාථ කුමාරදාස මුනසිංහ මහාසයෙන චාති

ද්වීහි සොධිතෙහි

තිපිටකමුද්දාලයෙ මුද්දාපිතා.

මිල රු. 120/=

බු: ව: 2486

ක්‍රි: ව: 1943

(තිපිටකමුද්දණසභෙ චතුචත්තාලීසතිමං පොත්ථකං)

භදන්තාචරියබුද්ධඝොසමහාථෙරවරවිරචිතා

# පපඤ්චසූදනී

නාම

# මජ්ඣිමනිකායට්ඨකථා.

## දුතියො භාගො.

විජ්ජාලඞ්කාර මහාපරිවෙණාධිපතිනා

තිපිටකවාගීස්සරාචරියෙන

සිරි ලඞ්කා විස්සවිජ්ජාලයෙ ඩී. ලිට්. උපාධිනා සම්මානිතෙන

ධම්මකිත්ති සිරි ධම්මානන්දාභිධානෙන

ලඞ්කායං පච්ඡිමදිසානුදිසාසු

පධාන සඞ්ඝනායකථෙරෙන

සංසොධිතා.

සයිමන් හෙවාවිතාරණ මහාසයාණත්තියා

විමලධම්ම හෙවාවිතාරණ මහාසයෙන

සිරිනාථ කුමාරදාස මුනසිංහ මහාසයෙන චාති

අඤ්ඤෙහි සොගතෙහි

තිපිටකමුද්දාලයෙ මුද්දාපිතා.

බු: ව: 2486.

කි: ව: 1943

ප්‍රථම මුද්‍රණය - 1943 පිටපත් 1000
දෙවන මුද්‍රණය - 1986 පිටපත් 1000
තෙවන මුද්‍රණය - 1999 දෙසැම්බර් 15 පිටපත් 1000

Vol. XLIV.

# SIMON HEWAVITARNE BEQUEST.

BHADANTĀCARIYA BUDDHAGHOSA MAHĀ THERA'S

# PAPANCASŪDANĪ

OR

THE COMMENTARY ON THE

# MAJJHIMA NIKĀYA

OF THE

## SUTTA PITAKA

**PART II.**

EDITED BY

*Tipitaka Vācissarācariya*

**DHAMMAKITTI SIRI DHAMMĀNANDA**

D. Litt. (Ceylon) *Honoris Causa.*

*Padhāna Sanghanāyaka Mahā Thera,*

*Colombo & Chilaw Districts,*

*Principal of Vidyālankāra Oriental College,*

*Peliyagoda, Kelaṇiya.*

PUBLISHED BY THE TRUSTEES:

WIMALA DHAMMA HEWAVITARNE, ESQ.

AND

SIRINATHA KUMARADASA MOONESINGHE, ESQ.

THE TRIPITAKA PUBLICATION PRESS,

MALIGAKANDA,

COLOMBO. (CEYLON)

B: E: 2486.

C: E: 1943.



THE LATE
**MR. SIMON ALEXANDER HEWAVITARNE.**

BORN 20TH MARCH, 1875. DIED 17TH JANUARY, 1913.



සෝමාවතී හේවාවිතාරණ මැතිනිය



THE LATE

**VEN'BLE ANAGARIKA DHARMAPALA.**

(SIRI DEVAMITTA DHAMMAPALA)

*Director of Tripitaka Muddrana Sabha*

BORN 17TH SEPTEMBER, 1864. DIED 29TH APRIL, 1933

# THE PALI ALPHABET

## IN SINHALESE CHARACTERS.

### VOWELS.

අa ආá ඉi ඊī උu ඌū එé ඔó

### CONSONANTS.

කka ඛkha ගga ඝgha ඞṅa

චca ඡcha ජja ඣjha ඤña

ටṭa ඨṭha ඩḍa ඪḍha ණṇa

තta ථtha දda ධdha නna

පpa ඵpha බba භbha මma

යya රra ලla වva සsa හha ළḷa අංaṇ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා ká | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ké | කො kó |
| ඛ kha | ඛා khá | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khé | ඛො khó |
| ග ga | = | = | = | = | = | = | = |

| | | | |
|---|---|---|---|
| කක kka | ඤඤ ñña | තව tva, ත්‍ර tra | මඵ mpha |
| කඛ kkha | ණහ ñha | දද dda | මබ, ඹ mba |
| කය kya | ඤච, ච ñca | දධ, ඩ ddha | මභ mbha |
| ක්‍රි kri | ඡ, ඤඡ ñcha | ද්‍ර dra | මම mma |
| කව kva | ජ, ඤජ ñja | ව, දව dva | මහ mha |
| ඛය khya | ඤඣ ñjha | ධව dhva | යය, යය yya |
| ඛව khva | ටට ṭṭa | නත nta | යහ yha |
| ගග gga | ටඨ, ඨ ṭṭha | නථ ntha | ලල lla |
| ගඝ ggha | ඩඩ ḍḍa | නද nda | ලය lya |
| ග්‍ර gra, ඞක ṅka | ඩඪ ḍḍha | නධ ndha | ලහ lha |
| ඞඛ ṅkha | ණණ ṇṇa | නන nna, නහ nha | වහ wha |
| ඞග ṅga | ණට ṇṭa | පප ppa | සස ssa |
| ඞඝ ṅgha | ණඨ ṇṭha | පඵ ppha | සම sma |
| චච cca | ණඩ, ඩ ṇḍa | බබ bba | සව swa |
| චඡ ccha | ණහ ṇha | බභ bbha | හම hma |
| ජජ jja | තත tta | බ්‍ර bra | හව hva |
| ජඣ jjha | තථ ttha | මප mpa | ළහ ḷha |

ා á ි i ී ī ු u ූ ū ෙ é ො ó

# PUBLISHERS NOTE

The late Mr. SIMON ALEXANDER HEWAVITARANE, who in his life time had begun to publish the TRIPITAKA, left a bequest for its completion after his death. He died suddenly on 17th January 1913 and in accordance with his wishes his Trustees had published the Commentaries on the Text in 49 volumes. After seventy years these books are no longer readily available.

His widow Mrs. SOMAWATI HEWAVITARANE who passed away on 10th January 1982 at the age of 94, had prior to her death, created the SOMAWATI HEWAVITARANE TRUST to carry on the good work started by her late husband and bequeathed her entire estate to this Trust.

We the Trustees of the Somawati Hewavitarane Trust, having seen the need to re-print the Commentaries, have undertaken this task to help both the student and teacher .of the Dhamma and in the hope that this act of ours will help to preserve the Noble Teachings of the Blessed One for the benefit of the future generations and thereby prolong the life of the Buddha Sasana by many more thousands of years.

May the fruits of this meritorious act help the late Simon Alexander Hewavitarane and Somawati Hewavitarane Maha Upasikawa in Sansara and towards their final attainment of Nibbana.

*Noel Wijenaike*
*Nanda Amerasinghe*
*Tissa Ratnatunge*

**23 - 11 - 1986.**

Somawati Hewavitarane Trust Office,
130, Maligakanda Road, Colombo-10,
SRI LANKA.

# - විඤ්ඤාපනං -

සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බාණසමයතො චතුපඤ්ඤාසාධිකෙ නවසත-සංවච්ඡරෙ මහානාම රඤ්ඤො සමයෙ ජම්බුදීපා ලඞ්කාදීපමාගතෙන පරම විසුද්ධ සද්ධාබුද්ධිපතිමණ්ඩිතෙන අනුබුද්ධබුද්ධඝොසත්ථෙරවරෙන ච ධම්ම-පාලත්ථෙරෙන ච උපසෙනත්ථෙරෙන ච මහානාමත්ථෙරෙන ච බුද්ධදත්ත-ත්ථෙරෙනචා'ති බුද්ධිමන්තෙහි එතෙහි ථෙරවරෙහි තිණ්ණං පිටකාන මත්ථවණ්ණනාවසෙනාට්ඨකථායො ලිඛිතාති වදන්ති. තා පෙනෙතා අට්ඨකථා, නෙවමුද්දිතා. තස්මා ගවජ්ජති කාලෙ තා අට්ඨකථායො'ති දුල්ලභා අහෙසුං. තස්මා දිවඞ්ගතස්ස ධඤ්ඤපුඤ්ඤ පරිපුණ්ණස්ස සයිමන් හේවාවිතාරණ මහාසයස්සජ්ඣාසයවසෙන තස්ස ධනබ්බයෙන තොනාණතෙතන ආඞ්ගලවෙ-ජ්ජාචරියෙන සිරිමතා සී ඒ. හේවාවිතාරණ මහාසයෙන ච සිරිනාථමුණසිංහ මහාසයෙන ච ධම්ලිවු. ඩී හේවාවිතාරණ මහාසයෙන ච, පාළ්‍යට්ඨකථායො මුද්දිතා ච පාකටී කතා ච. තථාපි මුද්දිතා තා අට්ඨකථායොපි ඉදානි සුදුල්ලභා භවන්ති. තස්මා තාසමට්ඨකථානං සුලභභාවමපෙක්ඛමානෙන සද්ධාබුද්ධිසම්පන්නෙන සද්ධම්මට්ඨිතිකාමෙන සිරිලඞ්කාරජ්ජෙ ලද්ධ පරික්ඛකාධිකාරිනා නීතිවෙදිනා නොයෙල් විජේනායක මහාසයෙන ච තිසරත්නතුඞ්ග මහාසයෙනචා'ති එතෙහි ද්වීහි මහාසයෙහි තථා අමරසිංහ මහාසයස්ස සංවිධායකත්තෙන සම්බුද්ධසාසන චිරට්ඨිතිකාමාය සද්ධාබුද්ධි සම්පන්නාය මහොපාසිකාය දිවඞ්ගතාය සෝමාවතී හේවාවිතාරණ මනාතිනිය, ධනබ්බයෙන සම්බුද්ධපරිනිබ්බාණා ද්විසහස්ස පඤ්චසතාධිකෙ අට්ඨවීසති-මෙවස්සෙ එසාපනට්ඨකථා තිලකමුද්දණාලයෙ මුද්දිතා ච පාකටීකතා ච, භවති.

ලිඛිතමිදම්ත්ථං දෙයියන්දර වැවලපියද්දේ සුවිසුද්ධාරාමාධිපතිනා විජ්ජාකිත්ති පරිවෙණජ්ඣක්ඛෙන විජේපාදය පරිවෙණෙ උපපධානා-චරියෙන රාජකීයපණ්ඩිත සත්ථපති උපාධිධාරිනා පවිනාචරියෙන පල්ලාවෙල සිරිසද්ධාතිස්සාභිධානෙන නායකත්ථෙරෙනාති.

2529

23 - 11 - 1986.

# PREFATORY NOTE.

With the issue of the Papaneasūdanī Part II, the commentary to the Majjhima Nikāya, we have great pleasure in placing before the public the 44th volume of the Simon Hewavitarne Bequest Series. The editing of this part has also been done by the Ven'ble Lunupokune Siri Dhammānanda Nāyaka Thero, D. Litt. (Ceylon) Principal, Vidyalankara Pirivena, Peliyagoda, Kelaniya, to whom our sincere thanks are due. We congratulate the Nāyaka Thero on his having been conferred a Doctorate in Literature by the Ceylon University. Our thanks are also due to the Ven'ble Pandit Palannoruwe Vimaladhamma Nāyaka Thero of the Tutorial Staff of Vidyodaya Pirivena, Maligakanda, Colombo, for the valuable advice and suggestions so kindly made.

The first part of Papancasūdanī was printed under the same editorship in 1933, and it is hoped to publish the remaining part at an early date. In printing this volume, the book edited by the Late Ven'ble Dhammakitti Siri Dhammārāma Nāyaka Thero has been of great help.

We wish to inform that the second part of the Samantapāsādikā is in print and will be out by the end of the year. Owing to the shortage of paper due to the war, the printing of these Series is liable to be delayed a little.

W. D. Hewavitarne,
S. K. Moonesinghe.

Tripitaka Publication Office
130, Maligakanda.
Colombo,
4th January $\frac{2486}{1948}$

# LIST OF ABBREVIATIONS.

A. Asgiri Vihāra Mahānāyaka Library.
B. Book in Burmese characters.
D¹ Digha Nikāya Atthakathā, Vidyālankāra College, Kälaniya.
D² Dīgha Nikāya Atthakathā, Siamese Manuscript.
E. P. T. S. Edition Vol. II
L. Lankā Potthaka (Ceylon Books).
M¹ Mīripänne Vihāra, Galle.
M² Malvatta Vihāra, Sangharāja Library, Kandy.
P¹ Paranātala Nilame's Library, Kandy
P² Late Pilimatalawwa Mahanilame's.
R. Ratmalāne Purāna Vihāra, Mount Lavinia.
S. Book in Siamese characters.
T¹ Tänumpata Vihāra, Dickvella, Matara.
T² Tīkā, Dharmaprāsāda Vihāra, Colombo
V. Vijayārāma Vihāra, Kumbalvella, Galle.
W¹ Waskaduwa Abninavārāma Library, Kalutara.
W² Wattegama Vidyādarsana Pirivena, Mātale.

# CONTENTS.

# සූචිපත්තං.

## දුතියවග්ග.


| සුත්තසඞ්ඛ්‍යා. | | | පිට්ඨඞ්කා. |
|---|---|---|---|
| 1. | චූළසීහනාද | සුත්තවණ්ණනා | 1 |
| 2. | මහාසීහනාද | ,, | 15 |
| 3. | මහාදුක්ඛක්ඛන්ධ | ,, | 44 |
| 4. | චූළදුක්ඛක්ඛන්ධ | ,, | 50 |
| 5. | අනුමාන | ,, | 54 |
| 6. | චෙතොඛිල | ,, | 56 |
| 7. | වත්ථ | ,, | 59 |
| 8. | මධුපිණ්ඩික | ,, | 60 |
| 9. | ද්වෙධාවිතක්ක | ,, | 65 |
| 10. | විතක්කසණ්ඨාන | ,, | 71 |


## තතියවග්ග.


| | | | |
|---|---|---|---|
| 1. | කකචූපම | සුත්තවණ්ණනා | 78 |
| 2. | අලගද්ද | ,, | 85 |
| 3. | වම්මික | ,, | 100 |
| 4. | රථවිනීත | ,, | 111 |
| 5. | නිවාප | ,, | 133 |
| 6. | පාසරාසි (=අරියපරියෙසන) | ,, | 136 |
| 7. | චූළහත්ථිපදොපම | ,, | 161 |
| 8. | මහාහත්ථිපදොපම | ,, | 182 |
| 9. | මහාසාරොපම | ,, | 193 |
| 10. | චූළසාරොපම | ,, | 194 |


## චතුත්ථවග්ග.


| | | | |
|---|---|---|---|
| 1. | චූළගොසිඞ්ග | සුත්තවණ්ණනා | 196 |
| 2. | මහාගොසිඞ්ග | ,, | 204 |
| 3. | මහාගොපාලක | ,, | 214 |
| 4. | චූළගොපාලක | ,, | 220 |
| 5. | චූළසච්චක | ,, | 223 |

| සුත්තසඞ්ඛ්‍යා. | | | පිට්ඨඞ්කො. |
|---|---|---|---|
| 6. | මහාසච්චක | සුත්තවණ්ණනා | 236 |
| 7. | චූළතණ්හාසඞ්ඛය | ,, | 246 |
| 8. | මහාතණ්හාසඞ්ඛය | ,, | 254 |
| 9. | මහාඅස්සපුර | ,, | 260 |
| 10. | චූළඅස්සපුර | ,, | 270 |


---

## පඤ්චමවග්ග.


| | | | |
|---|---|---|---|
| 1. | සාලෙය්‍යක | සුත්තවණ්ණනා | 272 |
| 2. | වෙරඤ්ජක | ,, | 278 |
| 3. | මහාවෙදල්ල | ,, | ,, |
| 4. | චූළවෙදල්ල | ,, | 296 |
| 5. | චූළධම්මසමාදාන | ,, | 309 |
| 6. | මහාධම්මසමාදාන | ,, | 311 |
| 7. | වීමංසක | ,, | 315 |
| 8. | කොසම්බක | ,, | 324 |
| 9. | බ්‍රහ්මනිමන්තනික | ,, | 336 |
| 10. | මාරතජ්ජනික | ,, | 346 |


---

නිට්ඨිතා මූලපණ්ණාසකවණ්ණනා.

---

පපඤ්චසූදනී

නාම

# මජ්ඣිමනිකායට්ඨකථා.

## (දුතියො භාගො.)

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

### 1. 2. 1.

**එවම්මෙ සුත**න්ති චූළ[1]සීහනාදසුත්තං. යස්මා පනස්ස අට්ඨුප්පත්තිකො නික්ඛෙපො, තස්මා තං දස්සෙත්වාවස්ස අපුබ්බ[2]පදවණ්ණනං කරිස්සාම.[3] කතරාය පන ඉදං අට්ඨුප්පත්තියා නික්ඛිත්තන්ති? ලාභසක්කාරපච්චයා තිත්ථියපරිදෙවිතෙ. භගවතො කිර ධම්මදායාදසුත්තෙ වුත්තනයෙන මහාලාභසක්කාරො උප්පජ්ජි. චතුප්පමාණිකො හි අයං ලොකසන්නිවාසො: රූපප්පමාණො රූපප්පසන්නො, ඝොසප්පමාණො ඝොසප්පසන්නො, ලූඛප්පමාණො ලූඛප්පසන්නො, ධම්මප්පමාණො ධම්මප්පසන්නොති ඉමෙසං පුග්ගලානං වසෙන චතුධා ඨිතො.

තෙසං ඉදං නානාකරණං: කතමො ච පුග්ගලො රූපප්පමාණො රූපප්පසන්නො? ඉධෙකච්චො පුග්ගලො ආරොහං වා පස්සිත්වා, පරිණාහං වා පස්සිත්වා, සණ්ඨානං වා පස්සිත්වා, පාරිපූරිං වා පස්සිත්වා, තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො රූපප්පමාණො රූපප්පසන්නො. කතමො ච පුග්ගලො ඝොසප්පමාණො ඝොසප්පසන්නො? ඉධෙකච්චො පුග්ගලො පරවණ්ණනාය පරත්ථොමනාය පරපසංසනාය පරවණ්ණහාරිකාය, තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො ඝොසප්පමාණො ඝොසප්පසන්නො. කතමො ච පුග්ගලො ලූඛප්පමාණො ලූඛප්පසන්නො? ඉධෙකච්චො පුග්ගලො චීවරලූඛං වා පස්සිත්වා පත්තලූඛං වා පස්සිත්වා සෙනාසනලූඛං වා පස්සිත්වා විවිධං වා දුක්කරකාරිකං පස්සිත්වා තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො ලූඛප්පමාණො ලූඛප්පසන්නො. කතමො ච පුග්ගලො ධම්මප්පමාණො ධම්මප්පසන්නො? ඉධෙකච්චො පුග්ගලො සීලං වා පස්සිත්වා සමාධිං වා පස්සිත්වා පඤ්ඤං වා පස්සිත්වා තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො ධම්මප්පමාණො ධම්මප්පසන්නොති.

---

1. චුල්ල L. S. 2. අනුපුබ්බ E. 3. කරිස්සාමි B.

ඉමෙසු චතූසු පුග්ගලෙසු රූපප්පමාණොපි භගවතො ආරොහපරිණාහං සණ්ඨානපාරිපූරිං වණ්ණපොක්ඛරතං, අසීතිඅනුබ්‍යඤ්ජනපතිමණ්ඩිතත්තා නානාරතනවිචිත්තමිව සුවණ්ණමහාපටං, ද්වත්තිංසමහාපුරිසලක්ඛණසමාකිණ්ණතාය තාරාගණසමුජ්ජලං විය ගගනතලං, සබ්බපාලිඵුල්ලං විය ච යොජනසතුබ්බෙධං පාරිච්ඡත්තකං, අට්ඨාරසරතනුබ්බෙධං ව්‍යාමප්පභාපරික්ඛෙපසස්සිරීකං අනොපමං සරීරං දිස්වා සම්මාසම්බුද්ධොයෙව පසීදති.

ඝොසප්පමාණොපි භගවතා කප්පසතසහස්සාධිකානි චත්තාරි අසඞ්ඛ්‍යෙය්‍යානි දසපාරමියො දසඋපපාරමියො දසපරමත්ථපාරමියො පූරිතා, අඞ්ගපරිච්චාගො පුත්තදාරපරිච්චාගො රජ්ජපරිච්චාගො අත්තපරිච්චාගො නයනපරිච්චාගො ච කතොති ආදිනා නයෙන පවත්තං ඝොසං සුත්වා සම්මාසම්බුද්ධොයෙව පසීදති.

ලූඛප්පමාණොපි භගවතො චීවරලූඛං දිස්වා සචෙ භගවා අගාරං අජ්ඣාවසිස්ස[1], කාසිකවත්ථමෙව අධාරයිස්ස; පබ්බජිත්වා පනානෙන සාණපංසුකූලචීවරෙන සන්තුස්සමානෙන භාරියං කතන්ති සම්මාසම්බුද්ධොයෙව පසීදති. පත්තලූඛම්පි දිස්වා ඉමිනා අගාරං අජ්ඣාවසන්තා රතනවරසුවණ්ණභාජනෙසු චක්කවත්තිභොජනාරහං සුගන්ධසාලිභොජනං පරිභුත්තං, පබ්බජිත්වා පන පාසාණමයං පත්තං ආදාය උච්චනීචකුලද්වාරෙසු සපදානං පිණ්ඩාය චරිත්වා ලද්ධපිණ්ඩියාලොපෙන සන්තුස්සමානො භාරියං කරොතීති සම්මාසම්බුද්ධොයෙව පසීදති. සෙනාසනලූඛං දිස්වාපි අයං අගාරං අජ්ඣාවසන්තො තිණ්ණං උතූනං අනුච්ඡවිකෙසු තීසු[2] පාසාදෙසු තිවිධනාටකපරිවාරො දිබ්බසම්පත්තිං විය රජ්ජසිරිං අනුභවිත්වා ඉදානි පබ්බජ්ජූපගතො රුක්ඛමූලසෙනාසනාදීසු දාරුඵලක-සිලාපට්ට-බිදල[3]මඤ්චකාදීසු සයමානො භාරියං කරොතීති සම්මාසම්බුද්ධොයෙව පසීදති. දුක්කරකාරිකමස්ස දිස්වාපි ඡබ්බස්සානි නාම[4] මුග්ගයූස-කුලත්ථයූස-හරෙණුයූසාදීනං පසතපසතමත්තෙන යාපෙස්සති, අප්පාණකං ඣානං ඣායිස්සති, සරීරෙ ච ජීවිතෙ ච අනපෙක්ඛො විහරිස්සති, අහො දුක්කරකාරකො භගවාති සම්මාසම්බුද්ධොයෙව පසීදති.

ධම්මප්පමාණොපි භගවතො සීලගුණං සමාධිගුණං පඤ්ඤාගුණං ඣානවිමොක්ඛ[5]සමාපත්තිසම්පදං අභිඤ්ඤාපාරිපූරිං යමකපාටිහාරියං දෙවොරොහණං පාටියපුත්තදමනාදීනි ච අනෙකානි අච්ඡරියානි දිස්වා සම්මාසම්බුද්ධොයෙව පසීදති.

තෙ එවං පසන්නා භගවතො මහන්තං සක්කාරං[6] අභිහරන්ති, තිත්ථියානං පන බාවෙරුජාතකෙ කාකස්ස විය ලාභසක්කාරො පරිහායිත්ථ.

1. භගවා අජ්ඣාවසිත්ථ S.
2. අනුච්ඡවිකෙසු B. L.
3. බිදල S. බිරල B.
4. ඡබ්බස්සානි L.
5. විමොක්ඛසමාධි A. S.
6. ලාභසක්කාරා B. S.

යථාහ:

"අදස්සනෙන මොරස්ස සිඛිනො මඤ්ජුභාණිනො
කාකං තත්ථ අපූජෙසුං මංසෙන ච ඵලෙන ච.

යදා ච සරසම්පන්නො මොරො බාවෙරුමාගමා,
අථ ලාභො ච සක්කාරො වායසස්ස අහායථ.

යාව[1] නුප්පජ්ජති බුද්ධො ධම්මරජා පභඞ්කරො,
අථ අඤ්ඤෙ අපූජෙසුං පුථූසමණබ්‍රාහ්මණෙ.

යදා ච සරසම්පන්නො බුද්ධො ධම්මං අදෙසයි,
අථ ලාභො ච සක්කාරො තිත්ථියානං අහායථා"ති.

තෙ එවං පහීනලාභසක්කාරා රත්තිං එකඞ්ගුලමත්තං ඔභාසෙත්වාපි සුරියුග්ගමනෙ ඛජ්ජූපනකා[2] විය හතප්පභා අහෙසුං.

යථා හි ඛජ්ජූපනකා[3] කාළපක්ඛම්හි රත්තියා,
නිද්දස්සයන්ති ඔභාසං එතෙසං විසයො හි සො.

යදා ච රස්මිසම්පන්නො අබ්භුදෙති පභඞ්කරො,
අථ ඛජ්ජූපසඞ්ඛානං[4] පභා අන්තරධායති.

එවං ඛජ්ජූපසදිසා තිත්ථියාපි පුථූ ඉධ,
කාළපක්ඛූපමෙ ලොකෙ දීපයන්ති සකං ගුණං.

යදා ච බුද්ධො ලොකස්මිං උදෙති අමිතප්පභො,
නිප්පභා තිත්ථියා හොන්ති සුරියෙ ඛජ්ජූපකා යථාති.

තෙ එවං නිප්පභා හුත්වා කාචජ්ජුපිළකාදිපරිකිණ්ණසරීරා පරමපාරිජුඤ්ඤප්පත්තා යෙන බුද්ධො යෙන ධම්මො යෙන සඞ්ඝො යෙන ච මහාජන[5]සන්නිපාතො තෙන තෙන[6] ගන්ත්වා අන්තරවීථියම්පි සිඞ්ඝාටකෙපි[7] චතුක්කෙපි සභායම්පි ඨත්වා පරිදෙවන්ති: කිං භො සමණො [L]යෙව ගොතමො සමණො, මයං අස්සමණා? කිං සමණස්සෙව ගොතමස්ස සාවකා සමණා, අම්හාකං සාවකා අස්සමණා? සමණස්සෙව ගොතමස්ස සාවකානඤ්චස්ස දින්නං මහප්ඵලං, න අම්හාකං දින්නං මහප්ඵලං? නනු සමණොපි ගොතමො සමණො, මයම්පි සමණා? සමණස්සපි ගොතමස්ස සාවකා සමණා, අම්හාකම්පි සාවකා සමණා; සමණස්සපි ගොතමස්ස සාවකානඤ්චස්ස දින්නං මහප්ඵලං, අම්හාකම්පි සාවකානඤ්ච නො දින්නං මහප්ඵලමෙව, සමණස්සපි ගොතමස්ස සාවකානඤ්චස්ස දෙථ කාරෙථ, අම්හාකම්පි සාවකානඤ්ච නො දෙථ කාරෙථ නනු සමණො ගොතමො පුරිමානි දිවසානි උප්පන්නො, මයං පන ලොකෙ උප්පජ්ජමානෙයෙව උප්පන්නාති එවං නානප්පකාරං විරවන්ති.

1. යදා B. S.
2. ඛජ්ජොපනකා B, S.
3. යථාපි ඛජ්ජොපනකා B. S.
4. ඛජ්ජොපසඞ්ඛානං B. S.
5. මහාජනස්ස B, S, E, I.,
6. තෙන තෙ B. A, T.
7. සිඞ්ඝාටෙපි L

අථ භික්ඛූ භික්ඛුණියො උපාසකා උපාසිකාති චතස්සො පරිසා තෙසං සද්දං සුත්වා භගවතො ආරොචෙසුං: තිත්ථියා භන්තෙ ඉදඤ්චිදඤ්ච කථෙන්තීති. තං සුත්වා භගවා මා තුම්හෙ භික්ඛවෙ තිත්ථියානං වචනෙන අඤ්ඤත්ථ සමණො අත්ථීති සඤ්ඤිතො අහුවත්ථාති වත්වා අඤ්ඤතිත්ථියෙසු සමණභාවං පටිසෙධෙන්තො, ඉධෙව ච අනුජානන්තො ඉමිස්සා අට්ඨුප්පත්තියා ඉධෙව භික්ඛවෙ සමණොති ඉදං සුත්තං අභාසි.

තත්ථ ඉධෙවාති ඉමස්මිංයෙව සාසනෙ. අයං පන නියමො සෙසපදෙසුපි වෙදිතබ්බො. දුතියාදයොපි හි සමණා ඉධෙව, නාඤ්ඤත්ථ. සමණොති සොතාපන්නො. තෙනෙවාහ: "කතමො ච භික්ඛවෙ සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති, අවිනිපාතධම්මො, නියතො, සම්බොධිපරායනො. අයං භික්ඛවෙ සමණො"ති. දුතියොති සකදාගාමී. තෙනෙවාහ: "කතමො ච භික්ඛවෙ දුතියො සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයං භික්ඛවෙ දුතියො සමණො"ති. තතියොති අනාගාමී. තෙනෙවාහ: "කතමො ච භික්ඛවෙ තතියො සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති, තත්ථ පරිනිබ්බායී, අනාවත්තිධම්මො තස්මා ලොකා. අයං භික්ඛවෙ තතියො සමණො"ති. චතුත්ථොති අරහා.[1] තෙනෙවාහ: "කතමො ච භික්ඛවෙ චතුත්ථො සමණො? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං භික්ඛවෙ චතුත්ථො සමණො"ති. ඉති ඉමස්මිං ඨානෙ චත්තාරො ඵලට්ඨකසමණාව අධිප්පෙතා.

සුඤ්ඤාති රිත්තා තුච්ඡා. පරප්පවාදාති චත්තාරො සස්සතවාදා, චත්තාරො එකච්චසස්සතිකා, චත්තාරො අන්තානන්තිකා, චත්තාරො අමරාවික්ඛෙපිකා, ද්වෙ අධිච්චසමුප්පන්නිකා, සොළස සඤ්ඤිවාදා,[2] අට්ඨ අසඤ්ඤිවාදා[3] අට්ඨ නෙවසඤ්ඤිනාසඤ්ඤිවාදා,[4] සත්ත උච්ඡෙදවාදා, පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදාති ඉමෙ සබ්බෙපි බ්‍රහ්මජාලෙ ආගතා ද්වාසට්ඨි දිට්ඨියො ඉතො බාහිරානං පරෙසං වාදා පරප්පවාදා නාම. තෙ සබ්බෙපි ඉමෙහි චතූහි ඵලට්ඨකසමණෙහි සුඤ්ඤා. න හි තෙ එත්ථ සන්ති.

න කෙවලඤ්ච එතෙහෙව සුඤ්ඤා චතූහි පන මග්ගට්ඨකසමණෙහිපි චතුන්නං මග්ගානං අත්ථාය ආරද්ධවිපස්සකෙහිපීති ද්වාදසහිපි සමණෙහි සුඤ්ඤා එව. ඉමමෙවත්ථං සන්ධාය භගවතා මහාපරිනිබ්බානෙ වුත්තං:-

1. අරහන්තො L. B.
2. සඤ්ඤීවාදා S.
3. අසඤ්ඤීවාදා S.
4. නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා S.

"එකූනතිංසො වයසා සුභද්ද යං පබ්බජිං කිංකුසලානුඑසී,
වස්සානි පඤ්ඤාස සමාධිකානි යතො අහං පබ්බජිතො සුභද්ද,
ඤායස්ස ධම්මස්ස පදෙසවත්තී ඉතො බහිද්ධා සමණොපි නත්ථි-

දුතියොපි සමණො නත්ථි, තතියොපි සමණො නත්ථි, චතුත්ථොපි සමණො නත්ථි. සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ"ති. එත්ථ හි පදෙසවත්තීති ආරද්ධවිපස්සකො අධිප්පෙතො. තස්මා සොතාපත්තිමග්ගස්ස ආරද්ධවිපස්සකං, මග්ගට්ඨං, ඵලට්ඨන්ති තයොපි එකතො කත්වා සමණොපි නත්ථීති ආහ. සකදාගාමිමග්ගස්ස ආරද්ධවිපස්සකං, මග්ගට්ඨං, ඵලට්ඨන්ති තයොපි එකතො කත්වා දුතියොපි සමණො නත්ථීති ආහ. ඉතරෙසුපි ද්වීසු එසෙව නයො.

කස්මා පනෙතෙ අඤ්ඤත්ථ නත්ථීති? අඛෙත්තතාය. යථා හි න ආරග්ගෙ සාසපො තිට්ඨති, න උදකපිට්ඨෙ අග්ගි ජලති, න පිට්ඨිපාසාණෙ බීජානි[1] විරූහන්ති[2]; එවමෙව බාහිරෙසු තිත්ථායතනෙසු න ඉමෙ සමණා උප්පජ්ජන්ති; ඉමස්මිං යෙව පන සාසනෙ උප්පජ්ජන්ති. කස්මා? ඛෙත්තතාය.[3] සා පනෙසා අඛෙත්තතා ඛෙත්තතා ච[4] අරියමග්ගස්ස අභාවතො භාවතො ච වෙදිතබ්බා. තෙනාහ භගවා: "යස්මිං ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො න උපලබ්භති, සමණොපි තත්ථ න උපලබ්භති, දුතියොපි තත්ථ සමණො න උපලබ්භති, තතියොපි තත්ථ සමණො න උපලබ්භති, චතුත්ථොපි තත්ථ සමණො න උපලබ්භති. යස්මිඤ්ච ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති, සමණොපි තත්ථ උපලබ්භති, දුතියොපි තත්ථ-පෙ-තතියොපි තත්ථ-චතුත්ථොපි තත්ථ සමණො උපලබ්භති. ඉමස්මිං ඛො සුභද් ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති. ඉධෙව සුභද්ද සමණො, ඉධ දුතියො සමණො-පෙ-සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ"ති.

එවං යස්මා තිත්ථායතනං අඛෙත්තං, සාසනං ඛෙත්තං. තස්මා යථා සුරත්තහත්ථපාදො භාසුරකෙසරසටො සීහො[5] මිගරාජා න සුසානෙ වා, සඞ්කාරකූටෙ වා පටිවසති, තියොජනසහස්සවිත්ථතං පන හිමවන්තං අජ්ඣොගාහෙත්වා මණිගුහායං වසති. යථා ච ඡද්දන්තො නාගරාජා න ගොචරියහත්ථි[6]කුලාදීසු නවසු කුලෙසු[7] උප්පජ්ජති, ඡද්දන්තකුලෙයෙව උප්පජ්ජති. යථා ච වලාහකො අස්සරාජා න ගද්‍රභකුලෙ වා ඝොටකකුලෙ වා උප්පජ්ජති, සින්ධුයා තීරෙ පන[8] සින්ධවකුලෙයෙව උප්පජ්ජති. යථා ච සබ්බකාමදදං මනොහරං මණිරතනං න සඞ්කාරකූටෙ වා පංසුපබ්බතාදීසු වා උප්පජ්ජති, වෙපුල්ල[9]පබ්බතබ්භන්තරෙයෙව උප්පජ්ජති. යථා ච තිමිරපිඞ්ගලො[10] මච්ඡරාජා න ආවාටබුද්දක[11]

1. වීජානි S.
2. රූහන්ති B. S.
3. ඛෙත්තතාය B. L. S. E.
4. ඛෙත්තතා ච B, L, S,
5. භාසුරකෙසරසීහො L B මහාසීහො M I, P I, R, E
6. කාලාවකහත්ථි B.
7. නාගකුලෙසු B. S.
8. සින්ධුතීර පන L.
9. විපුල S, විපුල්ල B.
10. තිමිරම්ඞගලො S. තිමිඞ්ගලො B.
11. න බුද්දක B, L.

පොක්ඛරණීසු උප්පජ්ජති, චතුරාසීති යොජනසහස්සගම්භීරෙ මහාසමුද්දෙයෙව උප්පජ්ජති. යථා ච දියඩ්ඪයොජනසතිකො සුපණ්ණරාජා න ගාමද්වාරෙ එරණ්ඩවනාදීසු පටිවසති, මහාසමුද්දං පන අජ්ඣොගහෙත්වා[1] සිම්බලිදහවනෙයෙව පටිවසති. යථා ච ධතරට්ඨො සුවණ්ණහංසො න ගාමද්වාරෙ ආවාටකාදීසු පටිවසති, නවුතිහංසසහස්සපරිවාරො පන හුත්වා චිත්තකූටෙ පබ්බතෙයෙව පටිවසති. යථා ච චාතුද්දීපිස්සරො[2] චක්කවත්තිරාජා න නීචකුලෙ උප්පජ්ජති, අසම්භින්න ජාතිඛත්තිය[3]කුලෙයෙව උප්පජ්ජති. එවමෙව ඉමෙසු[4] එකසමණොපි න අඤ්ඤතිත්ථියායතනෙ[5] උප්පජ්ජති, අරියමග්ගපරික්ඛිතෙ[6] පන බුද්ධසාසනෙයෙව උප්පජ්ජති. තෙනාහ භගවා: "ඉධෙව භික්ඛවෙ සමණො, -පෙ- සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ"ති.

**සම්මා සීහනාදං නදථාති** එත්ථ **සම්මාති** හෙතුනා, නයෙන, කාරණෙන. **සීහනාදන්ති** සෙට්ඨනාදං, අභීතනාදං, අප්පටිනාදං.[7] ඉමෙසං[8] චතුන්නං සමණානං ඉධෙව අත්ථිතාය අයං නාදො සෙට්ඨනාදො නාම හොති, උත්තමනාදො. ඉමෙ සමණා ඉධෙව අත්ථීති වදන්තස්ස අඤ්ඤතො භයං වා ආසඞ්කා වා නත්ථීති අභීතනාදො නාම හොති. අම්හාකම්පි සාසනෙ ඉමෙ සමණා අත්ථීති පූරණාදීසු එකස්සපි උට්ඨහිත්වා වත්තුං අසමත්ථතාය අයං නාදො අප්පටිනාදො[7] නාම හොති. තෙන වුත්තං: සීහනාදන්ති සෙට්ඨනාදං, අභීතනාදං, අප්පටිනාදන්ති.

**ඨානං ඛො පනෙතං විජ්ජතීති** ඉදං ඛො පන කාරණං විජ්ජති. **යං අඤ්ඤතිත්ථියාති** යෙන කාරණෙන අඤ්ඤතිත්ථියා. එත්ථ ච තිත්ථං ජානිතබ්බං, තිත්ථකරො ජානිතබ්බො, තිත්ථියා ජානිතබ්බා, තිත්ථියසාවකා ජානිතබ්බා. තිත්ථං නාම ද්වාසට්ඨි දිට්ඨියො. එත්ථ හි සත්තා තරන්ති උප්ලවන්ති[9] උම්මුජ්ජනිමුජ්ජං[10] කරොන්ති, තස්මා තිත්ථන්ති වුච්චන්ති. තාසං දිට්ඨීනං උප්පාදෙතා තිත්ථකරො නාම. තස්ස ලද්ධිං ගහෙත්වා පබ්බජිතා තිත්ථියා නාම. තෙසං පච්චයදායකා තිත්ථියසාවකාති වෙදිතබ්බා. **පරිබ්බාජකාති** ගිහිබන්ධනං පහාය පබ්බජ්ජුපගතා. **අස්සාසොති** අවස්සයො, පතිට්ඨා, උපත්ථම්භො. **බලන්ති** ථාමො. **යෙන තුම්හෙති** යෙන අස්සාසෙන වා බලෙන වා එවං වදෙථ.

**අත්ථි ඛො නො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙනාති** එත්ථ අයං සඞ්ඛෙපත්ථො: යො සො භගවා සමතිංසපාරමියො පූරෙත්වා සබ්බකිලෙසෙ භඤ්ජිත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො, **තෙන භගවතා.** තෙසං තෙසං සත්තානං ආසයානුසයං **ජානතා,** හත්ථතලෙ ඨපිතං ආමලකං විය සබ්බං ඤෙය්‍යධම්මං **පස්සතා.** අපි ච පුබ්බෙනිවාසාදීහි **ජානතා,**

1. අජ්ඣොගාහෙත්වා S. E.
2. චතුද්දීපිස්සරො S. E
3. අසම්භින්නජාතිඛත්තිය S.
4. ඉමෙසු සමණෙසු B. S.
5. තිත්ථායතනෙ S. E.
6. පරික්ඛිත්තෙ B. S.
7. අප්පටිහතනාදං S.
8. ඉමෙසඤ්ච B. S.
9. උප්පිලවන්ති B.
10. නිමුජ්ජං S.

දිබ්බෙන චක්ඛුනා **පස්සතා**. තීහි විජ්ජාහි ඡහි වා පන අභිඤ්ඤාහි **ජානතා**, සබ්බත්ථ අප්පටිහතෙන සමන්තචක්ඛුනා **පස්සතා**. සබ්බධම්මජානනසමත්ථාය පඤ්ඤාය **ජානතා**, සබ්බසත්තානං චක්ඛුවිසයාතීතානි තිරොකුඩ්ඩාදිගතානි වාපි රූපානි අතිවිසුද්ධෙන මංසචක්ඛුනා **පස්සතා**. අත්තහිතසාධිකාය සමාධිපදට්ඨානාය පටිවෙධපඤ්ඤාය **ජානතා**, පරහිතසාධිකාය කරුණාපදට්ඨානාය දෙසනාපඤ්ඤාය **පස්සතා**. අරීනං හතත්තා පච්චයාදීනං අරහත්තා **අරහතා**. සම්මා සාමඤ්ච සච්චානං බුද්ධත්තා **සම්මාසම්බුද්ධෙන**.

අන්තරායිකධම්මෙ වා **ජානතා**, නිය්‍යානිකධම්මෙ **පස්සතා**. කිලෙසාරීනං හතත්තා **අරහතා**, සාමං[1] සබ්බධම්මානං බුද්ධත්තා **සම්මාසම්බුද්ධෙනාති** එවං චතුවෙසාරජ්ජවසෙන චතූහි ආකාරෙහි ථොමිතෙන **චත්තාරො ධම්මා අක්ඛාතා යෙ මයං අත්තනි සම්පස්සමානා එවං වදෙම**; න රාජරාජමහාමත්තාදීනං උපත්ථම්භං, න කායබලන්ති.

**සත්ථරි පසාදොති** "ඉතිපි සො භගවා"ති ආදිනා නයෙන බුද්ධගුණෙ අනුස්සරන්තානං උප්පන්නපසාදො. **ධම්මෙ පසාදොති** "ස්වාක්ඛාතො භගවතා ධම්මො"ති ආදිනා නයෙන[2] අනුස්සරන්තානං උප්පන්නපසාදො. **සීලෙසු පරිපූරකාරිතාති** අරියකන්තෙසු සීලෙසු පරිපූරකාරිතා. අරියකන්තසීලානි නාම පඤ්චසීලානි. තානි හි භවන්තරගතොපි අරියසාවකො අත්තනො අරියසාවකභාවං අජානන්තොපි න වීතික්කමති. සචෙපි හි නං කොචි වදෙය්‍ය: ඉමං සකලචක්කවත්තිරජ්ජං පටිච්ඡිත්වා[3] ඛුද්දකමක්ඛිකං ජීවිතා වොරොපෙහීති, අට්ඨානමෙතං යං සො තස්ස වචනං ක්‍රෙය්‍ය. එවං අරියානං සීලානි කන්තානි පියානි මනාපානි. තානි සන්ධාය වුත්තං: **සීලෙසු පරිපූරකාරිතාති.**

**සහධම්මිකා[4] ඛො පනාති** භික්ඛු භික්ඛුනී සික්ඛමානා සාමණෙරො සාමණෙරී උපාසකො උපාසිකාති එතෙ සත්ත සහධම්මචාරිනො. එතෙසු හි භික්ඛු භික්ඛූහි සද්ධිං සහධම්මං චරති, සමානසික්ඛත්තා. තථා භික්ඛුනී භික්ඛුනීහි පෙ උපාසිකා උපාසිකාහි, සොතාපන්නො සොතාපන්නෙහි, සකදාගාමී සකදාගාමීහි, අනාගාමී අනාගාමීහි සහධම්මං චරති. තස්මා සබ්බෙපෙතෙ[5] සහධම්මිකාති වුච්චන්ති. අපි චෙත්ථ අරියසාවකායෙව අධිප්පෙතා. තෙසං හි භවන්තරෙපි මග්ගදස්සනම්හි විවාදො නත්ථි තස්මා තෙ අච්චන්තං එකධම්මචාරිතාය සහධම්මිකා. ඉමිනා "සුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝො"ති ආදිනා නයෙන සඞ්ඝං අනුස්සරන්තානං උප්පන්නපසාදො කථිතො. එත්තාවතා චත්තාරි සොතාපන්නස්ස අඞ්ගානි කථිතානි හොන්ති. **ඉමෙ ඛො නො ආවුසොති** ආවුසො ඉමෙ චත්තාරො ධම්මා තෙන භගවතා අම්හාකං අස්සාසො චෙව බලඤ්චාති අක්ඛාතා, යෙ මයං අත්තනි සම්පස්සමානා එවං වදෙම.

1. සම්මා සාමං E. 2. නයෙන ධම්මගුණෙ E. 3. සම්පටිච්ඡිත්වා B. S. 4. සහධම්මියා L. 5. සබ්බෙ චෙතෙ S.

**සො අම්හාකං සත්ථාති** ඉමිනා පූරණකස්සපාදිකෙ ඡ සත්ථාරෙ අපදිසන්ති.[1] යථා පන ඉධ සාසනෙ ආචරියුපජ්ඣායාදිසු අම්හාකං ආචරියො අම්හාකං උපජ්ඣායොති ගෙහසිතපෙමං හොති, එවරූපං පෙමං සන්ධාය **සත්ථරි පසාදොති** වදන්ති. ථෙරො පනාහ: යස්මා සත්ථා නාම න එකස්ස න ද්වින්නං හොති, සදෙවකස්ස ලොකස්ස එකොව සත්ථා. තස්මා තිත්ථියා **අම්හාකං සත්ථාති** එකපදෙනෙව සත්ථාරං විසුං කත්වා ඉමිනාව පදෙන විරද්ධා[2], පරාජිතාති.

**ධම්මෙ පසාදොති** ඉදං පන[3] යථා ඉධ සාසනෙ අම්හාකං දීඝනිකායො අම්හාකං මජ්ඣිමනිකායොති මමායන්ති, එවං අත්තනො අත්තනො පරියත්තිධම්මෙ ගෙහසිතං පෙමං සන්ධාය වදන්ති. **සීලෙසූති** අජසීල-ගොසීල-මෙණ්ඩකසීල-කුක්කුරසීලාදිසු. **ඉධ නො ආවුසොති** එත්ථ ඉධාති පසාදං සන්ධාය වදන්ති. **කො අධිප්පයාසො**[4]ති කො අධිකපයොගො. **යදිදන්ති** යං ඉදං. **තුම්හාකඤ්චෙව අම්හාකඤ්ච** නානාකරණං වදෙය්‍යාථ, තං කිං නාම? තුම්හාකම්පි හි චතූසු ඨානෙසු පසාදො, අම්හාකම්පි. තත්‍ථ එතස්මිං පසාදෙ[5] තුම්හෙ ච අම්හෙ ච ද්වෙධාභිහතසුවණ්ණං විය එකසදිසාති වාචාය සමධුරා[6] හුත්වා අට්ඨංසු. අථ නෙසං තං සමධුරතං භින්දන්තො භගවා **එවංවාදිනොති** ආදිමාහ.

**තත්ථ එකා නිට්ඨාති** යා තස්ස පසාදස්ස පරියොසානභූතා නිට්ඨා, කිං සා එකා උදාහු පුථූති එවං පුච්ඡථාති වදති. යස්මා පන තස්මිං තස්මිං සමයෙ නිට්ඨං අපඤ්ඤපෙන්තො නාම නත්ථි, බ්‍රාහ්මණානං හි බ්‍රහ්මලොකො නිට්ඨා,[7] තාපසානං ආභස්සරා, පරිබ්බාජකානං සුභකිණ්හා, ආජීවකානං අනන්තමානසොති[8] එවං පරිකප්පිතො අසඤ්ඤිභවො, ඉමස්මිං සාසනෙ[9] අරහත්තං නිට්ඨා, සබ්බෙව චෙතෙ අරහත්තමෙව නිට්ඨාති වදන්ති, දිට්ඨිවසෙන පන බ්‍රහ්මලොකාදීනි පඤ්ඤපෙන්ති, තස්මා අත්තනො අත්තනො ලද්ධිවසෙන එකමෙව නිට්ඨං පඤ්ඤපෙන්ති. තං දස්සෙතුං භගවා **සම්මා ව්‍යාකරමානාති** ආදිමාහ.

ඉදානි භික්ඛූනම්පි එකා නිට්ඨා තිත්ථියානම්පි එකා නිට්ඨාති වීසු අට්ටකාරකෙසු විය ඨිතෙසු භගවා අනුයොගවත්තං[10] දස්සෙන්තො **සා පනාවුසො නිට්ඨා සරාගස්ස උදාහු වීතරාගස්සාති** ආදිමාහ. තත්ථ යස්මා රාගරත්තාදීනං නිට්ඨා නාම නත්ථි, යදි සියා සොණසිගාලාදීනම්පි සියාති ඉමං දොසං පස්සන්තානං තිත්ථියානං වීතරාගස්ස ආවුසො සා නිට්ඨාති ආදිනා නයෙන ව්‍යාකරණං දස්සිතං. තත්ථ **විද්දසුනොති** පණ්ඩිතස්ස; **අනුරුද්ධපටිවිරුද්ධස්සාති** රාගෙන අනුරුද්ධස්ස කොධෙන පටිවිරුද්ධස්ස; **පපඤ්චාරාමස්ස පපඤ්චරතිනොති** එත්ථ

1. ඡ සත්ථාරෙ අපදිසන්ති S.
2. විරුද්ධා B. S.
3. ඉධ පන L. S.
4. අධිප්පායසො L. අධිප්පයොගො B.
5. එකස්මිං පසාදෙ B. S.
6. වා උභයසමධුරා A. M2. P2. R.
7. නිට්ඨා එසා භික්ඛූනන්ති S.
8. අනන්තමානසොති L.
9. සාසනෙ පන B. S.
10. අනුයොගං B.

ආරමතාති එත්ථාති ආරාමො; පපඤ්චො ආරාමො අස්සාති පපඤ්චාරාමො. පපඤ්චෙ රති අස්සාති පපඤ්චරති. පපඤ්චොති ච මත්තපමත්තාකාරභාවෙන පවත්තානං තණ්හාදිට්ඨිමානානං එතං අධිවචනං. ඉධ පන තණ්හාදිට්ඨියොව අධිප්පෙතා.

**සරාගස්සාති** ආදිසු පඤ්චසු ඨානෙසු එකොව කිලෙසො ආගතො. තස්ස ආකාරතො නානත්තං වෙදිතබ්බං. **සරාගස්සාති** හි වුත්තට්ඨානෙ පඤ්චකාමගුණිකා[1]රාගවසෙන ගහිතො; **සතණ්හස්සාති** භවතණ්හාවසෙන; **සඋපාදානස්සාති** ගහණවසෙන; **අනුරුද්ධපටිවිරුද්ධස්සාති** යුගලවසෙන;[2] **පපඤ්චාරාමස්සාති** පපඤ්චුප්පත්තිදස්සනවසෙන. **සරාගස්සාති** වා එත්ථ අකුසලමූලවසෙන ගහිතො, **සතණ්හස්සාති** එත්ථ තණ්හාපච්චයා උපාදානදස්සනවසෙන. සෙසං පුරිමසදිසමෙව. ථෙරො පනාහ: කස්මා එවං විද්ධංසෙථ?[3] එකොයෙව හි අයං ලොභො රජ්ජනවසෙන රාගොති වුත්තො, තණ්හාකරණවසෙන පන තණ්හා, ගහණට්ඨෙන උපාදානං, යුගලවසෙන අනුරොධපටිවිරොධො[4], පපඤ්චුප්පත්තියට්ඨෙන[5] පපඤ්චොති.

ඉදානි ඉමෙසං කිලෙසානං මූලභූතං දිට්ඨිවාදං දස්සෙන්තො, **ද්වෙමා භික්ඛවෙ දිට්ඨියොති** ආදිමාහ. තත්ථ **භවදිට්ඨීති** සස්සතදිට්ඨි. **විභවදිට්ඨීති** උච්ඡේදදිට්ඨි. **භවදිට්ඨිං අල්ලීනාති** තණ්හාදිට්ඨිවසෙන සස්සතදිට්ඨිං අල්ලීනා. **උපගතාති** තණ්හාදිට්ඨිවසෙනෙව උපගතා. **අජ්ඣොසිතාති** තණ්හාදිට්ඨිවසෙනෙව අනුපවිට්ඨා. **විභවදිට්ඨියා තෙ පටිවිරුද්ධාති** තෙ සබ්බෙ උච්ඡේදවාදීහි සද්ධිං, තුම්හෙ අන්ධබාලා න ජානාථ, සස්සතො අයං ලොකො, නායං ලොකො උච්ඡිජ්ජතීති පටිවිරුද්ධා නිච්චං කලහභණ්ඩනපසුතා විහරන්ති. දුතියවාරෙපි එසෙව නයො.

**සමුදයඤ්චාති** ආදිසු ද්වෙ දිට්ඨීනං සමුදයා: ඛණිකසමුදයො ච පච්චයසමුදයො ච. ඛණිකසමුදයො දිට්ඨීනං නිබ්බත්ති. පච්චයසමුදයො අට්ඨට්ඨානානි. සෙය්‍යථිදං: "ඛන්ධාපි දිට්ඨිට්ඨානං...අවිජ්ජාපි ....ඵස්සොපි... සඤ්ඤාපි... විතක්කොපි..., අයොනිසොමනසිකාරොපි... පාපමිත්තොපි...පරතොඝොසොපි දිට්ඨිට්ඨානං. ඛන්ධා හෙතු ඛන්ධා පච්චයො දිට්ඨීනං උප්පාදය[6] සමුට්ඨානට්ඨෙන, එවං ඛන්ධාපි දිට්ඨිට්ඨානං. අවිජ්ජා.... ඵස්සො... සඤ්ඤා... විතක්කො... අයොනිසොමනසිකාරො... පාපමිත්තො...පරතොඝොසො හෙතු, පරතොඝොසො පච්චයො දිට්ඨීනං උප්පාදය[6] සමුට්ඨානට්ඨෙන, එවං පරතොඝොසොපි[7] දිට්ඨිට්ඨානං". අත්ථඞ්ගමොපි ද්වෙයෙව: ඛණිකත්ථඞ්ගමො ච පච්චයත්ථඞ්ගමො ච. ඛණිකත්ථඞ්ගමො නාම ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තර

1. පඤ්චකාමගුණ L.
2. යුගවසෙන L
3. විද්ධංසෙථ B. S.
4. අනුරුද්ධපටිවිරුද්ධො L.
5. පපඤ්චුප්පත්තිදස්සනට්ඨෙන E
6. උපාදය S.
7. පරතොපි ඝොසො L.

ධාතං. පච්චයත්ථඞ්ගමො නාම සොතාපත්තිමග්ගො. සොතාපත්තිමග්ගො හි දිට්ඨීනං[1] සමුග්ඝාතොති වුත්තො. **අස්සාදන්ති** දිට්ඨිමූලකං ආනිසංසං, යං සන්ධාය වුත්තං: "යංදිට්ඨිකො සත්ථා හොති තංදිට්ඨිකා සාවකා හොන්ති. යංදිට්ඨිකං සත්ථාරං සාවකා සක්කරොන්ති, ගරුකරොන්ති, මානෙන්ති, පූජෙන්ති, ලභන්ති ච තතො නිදානං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, අයං භික්ඛවෙ දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො"ති. **ආදීනවන්ති** දිට්ඨිගහණමූලකං උපද්දවං. සො වග්ගුලිවතං, උක්කුටිකප්පධානං, කණ්ටකාපස්සයතා, පඤ්චාතපතප්පනං[2] මරුප්පපාතපතනං, කෙසමස්සුලුඤ්චනං[3] අප්පාණකජ්ඣානන්ති ආදීනං වසෙන වෙදිතබ්බො. **නිස්සරණන්ති** දිට්ඨීනං නිස්සරණං නාම නිබ්බානං. **යථාභූතං නප්පජානන්තීති** යෙ එතං සබ්බං යථාසභාවං[4] න ජානන්ති. **න පරිමුච්චන්ති දුක්ඛස්මාති** සකලවට්ටදුක්ඛතො න පරිමුච්චන්ති. ඉමිනා එතෙසං නිට්ඨා නාම නත්ථීති දස්සෙති. **පරිමුච්චන්ති දුක්ඛස්මාති** සකලවට්ටදුක්ඛතො පරිමුච්චන්ති. ඉමිනා එතෙසං නිට්ඨා[5] අත්ථීති දීපෙත්වා අට්ටකාරකානං අට්ටං ඡින්දන්තො විය සාසනස්මිංයෙව නිට්ඨාය අත්ථිතං පතිට්ඨාපෙති.

ඉදානි දිට්ඨිච්ඡෙදනං දස්සෙන්තො **චත්තාරිමානි භික්ඛවෙ උපාදානානීති** ආදිමාහ. තෙසං විත්ථාරකථා විසුද්ධිමග්ගෙ වුත්තායෙව. **සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානාති** මයං සබ්බෙසං උපාදානානං පරිඤ්ඤං සමතික්කමං වදාමාති එවං පටිජානමානා. **න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං** පඤ්ඤපෙන්තීති සබ්බෙසං උපාදානානං සමතික්කමං සම්මා න පඤ්ඤපෙන්ති; කෙචි කාමුපාදානමත්තස්ස පඤ්ඤපෙන්ති; කෙචි දිට්ඨුපාදානස්සාපි;[6] කෙචි සීලබ්බතුපාදානස්සාපි.[7] අත්තවාදුපාදානස්ස පන පරිඤ්ඤං පඤ්ඤපෙන්තො නාම නත්ථි. තෙසං පන භෙදං දස්සෙන්තො **කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්තීති** ආදිමාහ. තත්ථ සබ්බෙපි කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්තියෙව. ඡන්නවුති පාසණ්ඩාපි හි, කාමා ඛො පබ්බජිතෙන න සෙවිතබ්බාති වදන්ති, සෙවනකාමං කප්පන්තීති න පඤ්ඤපෙන්ති; අකප්පියමෙව කත්වා පඤ්ඤපෙන්ති. යෙ පන සෙවන්ති තෙ ථෙය්‍යෙන සෙවන්ති. තෙන වුත්තං: **කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්තීති.** යස්මා තත් දිට්ඨානන්ති ආදීනි ගහෙත්වා චරන්ති, සීලෙන සුද්ධි, වතෙන සුද්ධි, භාවනාය[8] සුද්ධීති ගණ්හන්ති, අත්තුපලද්ධිං නප්පජහන්ති, තස්මා **න දිට්ඨුපාදානස්ස,[9] න සීලබ්බතුපාදානස්ස, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතූති** තං අපඤ්ඤපනං එතෙසං කිස්ස හෙතු, කිං කාරණා? **ඉමානි හි තෙ භොන්තොති** යස්මා තෙ භොන්තො ඉමානි තීණි කාරණානි යථාසභාවතො න ජානන්තීති අත්ථො.

1. දිට්ඨිට්ඨානං L.
2. පඤ්චාතපතප්පනං E. S.
3. ලොචනං B. S.
4. යථාසභාවතො L.
5. නිට්ඨා නාම B. S.
6. දිට්ඨුපාදානමත්තස්ස B. S.
7. සීලබ්බතුපාදානමත්තස්සාපි B. S.
8. න භාවනාය S
9. දිට්ඨුපාදානස්ස අත්තවාදුපාදානස්ස S.

යෙ පනෙත්ථ දිට්ඨීනං පරිඤ්ඤතං පඤ්ඤපනකාරණං දිට්ඨිං චෙව සීලබ්බතඤ්ච, එතං පහාතබ්බන්ති යථාසභාවතො ජානන්ති, තෙ සබ්බාය පරතො ද්වෙ වාරා වුත්තා. තත්ථ යෙ අත්ථි දින්නන්ති ආදීනි ගණ්හන්ති, තෙ දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. යෙ න[1] සීලෙන සුද්ධි, න වතෙන සුද්ධි, න භාවනාය සුද්ධීති ගණ්හන්ති, තෙ සීලබ්බතුපාදානස්සපි පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පන එකොපි පඤ්ඤපෙතුං න සක්කොති. අට්ඨසමාපත්තිලාභිනොපි හි චන්දිමසූරියෙ පාණිනා පරිමජ්ජිත්වා චරමානා පි ච තිත්ථියා තිස්සො පරිඤ්ඤා පඤ්ඤපෙන්ති, අත්තවාදුපාදානං මුඤ්චිතුං න සක්කොන්ති; තස්මා පුනප්පුනං වට්ටස්මිංයෙව පතන්ති.

පඨවිජිගුච්ඡක[2]සසකො විය හි එතෙ. තත්රායං අත්ථසල්ලාපිකා උපමා: පඨවී කිර සසකං ආහ: භො සසකාති. සසකො ආහ: කො එසොති. 'කස්මා මමෙව උපරි සබ්බිරියාපථෙ කප්පෙන්තො, උච්චාරපස්සාවං කරොන්තො මං න ජානාසීති? 'සුට්ඨු තයා අහං දිට්ඨො, මයා අක්කන්තට්ඨානම්පි අඞ්ගුලග්ගෙහි ඵුට්ඨට්ඨානං විය හොති, විස්සට්ඨඋදකං අප්පමත්තකං, කරීසං කතකඵලමත්තකං; හත්ථිඅස්සාදීහි පන අක්කන්තට්ඨානම්පි මහන්තං, පස්සාවොපි තෙසං ඝටමත්තො, උච්චාරොපි පච්ඡිමත්තො හොති; අලං මය්හං තයා'ති උප්පතිත්වා අඤ්ඤස්මිං ඨානෙ පතිතො. තතො නං පඨවී ආහ: අම්භො[3] දූරං ගතොසි! නනු මය්හං උපරියෙව පතිතොසීති? සො පුන[4] තං ජිගුච්ඡන්තො උප්පතිත්වා අඤ්ඤත්ථ පතිතො. එවං වස්සසහස්සම්පි උප්පතිත්වා පතමානො සසකො පඨවිං මුඤ්චිතුං න සක්කොති. එවමෙව තිත්ථියා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්තාපි කාමුපාදානාදීනං තිණ්ණංයෙව සමතික්කමං පඤ්ඤපෙන්ති, අත්තවාදුපාදානං[5] පන මුඤ්චිතුං අසක්කොන්තා පුනප්පුනං වට්ටස්මිංයෙව පතන්තීති.

එවං යං තිත්ථියා සමතික්කමිතුං න සක්කොන්ති, තස්ස වසෙන දිට්ඨිච්ඡෙදවාරං[6] වත්වා[7] ඉදානි පසාදච්ඡෙදවාරං දස්සෙන්තො එවරූපෙ ඛො භික්ඛවෙ ධම්මවිනයෙති ආදිමාහ. තත්ථ ධම්මවිනයෙති ධම්මෙ ච විනයෙ ච. උභයෙනාපි අනිය්යානිකසාසනං දස්සෙති. යො සත්ථරි පසාදො, සො න සම්මග්ගතොති අනිය්යානිකසාසනස්මිං හි සත්ථා කාලං කත්වා සීහොපි හොති, ව්‍යග්ඝොපි, දීපීපි, අච්ඡොපි, තරච්ඡොපි. සාවකා පනස්ස මිගාපි, සූකරාපි, පසදාපි[8] හොන්ති. සො ඉමෙ මය්හං පුබ්බෙ උපට්ඨාකා පච්චයදායකාති භත්තිං වා මෙත්තං වා අනුද්දයං වා අකත්වා තෙසං උපරි පතිත්වා ලොහිතම්පි පිවති, ථූලථූලමංසානිපි ඛාදති. සත්ථා වා පන බිළාරො හොති, සාවකා කුක්කුටා, මූසිකා වා. අථ තෙ වුත්තනයෙනෙව අනුකම්පං අකත්වා ඛාදති. අථ වා සත්ථා,

1. පන B. S.
2. ජිගුච්ඡන S.
3. අරෙ B.
4. පන E.
5. අත්තවාද° B, S.
6. දිට්ඨිච්ඡෙදවාද° B. S.
7. ඨත්වා L.
8. සසකාපි S.

නිරයපාලො හොති, සාවකා නෙරයිකසත්තා. සො ඉමෙ මය්හං පුබ්බෙ[1] පච්චයදායකාති අනුකම්පං අකත්වා විවිධා කම්මකාරණා[2] කරෙති; ආදිත්තෙපි රථෙ යොජෙති; අඞ්ගාරපබ්බතම්පි ආරොපෙති; ලොහකුම්භියම්පි ඛිපති; අනෙකෙහිපි දුක්ඛධම්මෙහි සම්පයොජෙති. සාවකා පන කාලං කත්වා සීහාදයො හොන්ති; සත්ථා මිගාදිසු අඤ්ඤතරො. තෙ ඉමං මයං පුබ්බෙ චතූහි පච්චයෙහි උපට්ඨහිම්හ, සත්ථා නො අයන්ති තස්මිං ඛන්තිං වා මෙත්තං වා අනුද්දයං වා අකත්වා වුත්තනයෙනෙව අනයව්‍යසනං පාපෙන්ති. එවං අනිය්‍යානිකසාසනෙ යො සත්ථරි පසාදො සො න සම්මග්ගතො හොති; කඤ්චි[3] කාලං ගන්ත්වාපි පච්ඡා විනස්සතියෙව.

**යො ධම්මෙ පසාදො**ති අනිය්‍යානිකසාසනස්මිං හි ධම්මෙ පසාදො නාම උග්ගහිතපරියාපුණිතවාචිතධාරිතමත්තකො තන්තිධම්මෙ පසාදො හොති. වට්ටමොක්ඛො පනෙත්ථ නත්ථි. තස්මා යො එත්ථ පසාදො සො පුනප්පුනං වට්ටමෙව ගම්භීරං කරොතීති අසම්මග්ගතො, අසභාවගතො අක්ඛායති. **යා සීලෙසු පරිපූරකාරිතා**ති යාපි අනිය්‍යානිකසාසනෙ අජසීලාදීනං වසෙන පරිපූරකාරිතා, සාපි යස්මා වට්ටමොක්ඛං භවනිස්සරණං න සම්පාපෙති; සම්පජ්ජමානා පන තිරච්ඡානයොනිං ආවහති, විපජ්ජමානා නිරයං; තස්මා **න සම්මග්ගතා අක්ඛායති**.

**යා සහධම්මිකෙසූ**ති අනිය්‍යානිකසාසනස්මිං හි යෙ සහධම්මිකා, තෙසු යස්මා එකච්චෙ කාලං කත්වා සීහාදයොපි හොන්ති, එකච්චෙ මිගාදයො; තත්ථ සීහාදිභූතා, ඉමෙ අම්හාකං සහධම්මිකා අහෙසුන්ති මිගාදිභූතෙසු ඛන්තිආදීනි අකත්වා පුබ්බෙ වුත්තනයෙනෙව තෙසං මහාදුක්ඛං උප්පාදෙන්ති; තස්මා එත්ථ සහධම්මිකෙසු පියමනාපතාපි අසම්මග්ගතා අක්ඛායති.

ඉමං පන සබ්බම්පි කාරණභෙදං එකතො කත්වා දස්සෙන්තො භගවා **තං කිස්ස හෙතු? එවං හෙතං භික්ඛවෙ හොතී**ති ආදිමාහ. තත්‍රායං සඞ්ඛෙපත්ථො: එවං හෙතං භික්ඛවෙ හොති, යං මයා වුත්තං, යො සත්ථරි පසාදො, **සො න සම්මග්ගතො හොතී**ති ආදි, තං එවමෙව හොති. කස්මා? යස්මා තෙ පසාදාදයො දුරක්ඛාතෙ ධම්මවිනයෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙති. එත්ථ හි **යථා ත**න්ති කාරණත්ථෙ නිපාතො. තත්ථ **දුරක්ඛාතෙ**ති දුක්කථිතෙ. දුක්කථිතත්තායෙව **දුප්පවෙදිතෙ**. සො පනෙස යස්මා මග්ගඵලත්ථාය න නිය්‍යාති, තස්මා **අනිය්‍යානිකො**, රාගාදීනං උපසමාය අසංවත්තනතො **අනුපසමසංවත්තනිකො**, න සම්මාසම්බුද්ධෙන සබ්බඤ්ඤුනා පවෙදිතොති **අසම්මාසම්බුද්ධප්පවෙදිතො**. තස්මිං අනිය්‍යානිකෙ, අනුපසමසංවත්තනිකෙ, අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

එත්තාවතා භගවා තිත්ථියෙසු පසාදො සුරාපීතසිගාලෙ පසාදො විය නිරත්ථකොති දස්සෙති. එකො කිර කාණසිගාලො[4] රත්තිං නගරං

1 පුබ්බෙ උපට්ඨාකා B.
2. කම්මකරණා B. S.
3. කිඤ්චි B. S.
4. කාළසිගාලො B.

පවිට්ඨො සුරාජල්ලිකං ඛාදිත්වා පුන්නාගවනෙ නිපජ්ජිත්වා නිද්දායන්තො සුරියුග්ගමනෙ පබුජ්ඣිත්වා චින්තෙසි : ඉමස්මිං කාලෙ න සක්කා ගන්තුං; බහූ අම්හාකං වෙරිනො; එකං වඤ්චෙතුං වට්ටතීති. සො එකං බ්‍රාහ්මණං ගච්ඡන්තං දිස්වා ඉමං වඤ්චෙස්සාමීති, අය්‍ය බ්‍රාහ්මණාති ආහ. 'කො එස බ්‍රාහ්මණං පක්කොසතී'ති. 'අහං සාමි, ඉතො තාව එහී'ති. 'කිං භො'ති. 'මං බහිගාමං නෙහි, අහං තෙ ද්වෙ කහාපණසතානි දස්සාමී'ති. සො නයිස්සාමීති පාදෙසු ගණ්හි. 'අරෙ[1] බාල බ්‍රාහ්මණ, න මය්හං කහාපණා ජඞ්ඝිතකා අත්ථි, දුල්ලභා කහාපණා, සාධුකං මං ගණ්හාහී'ති. 'කථං භො ගණ්හාමී'ති? 'උත්තරසඞ්ගෙ භණ්ඩිකං කත්වා අංසෙ ලග්ගෙත්වා ගණ්හාහී'ති. බ්‍රාහ්මණො තං තථා ගහෙත්වා දක්ඛිණද්වාර සමීපට්ඨානං ගන්ත්වා, එත්ථ ඔතාරෙමීති පුච්ඡි. 'කතරං ඨානං නාම එත'න්ති? 'මහාද්වාරං එත'න්ති. 'අරෙ බාල බ්‍රාහ්මණ, කිං තව ඤාතකා අන්තරද්වාරෙ කහාපණෙ ඨපෙන්ති? පරතො[2] මං හරා'ති. සො පුනප්පුන ථොකථොකං ගන්ත්වා එත්ථ ඔතාරෙමි, එත්ථ ඔතාරෙමීති පුච්ඡිත්වා, තෙන තජ්ජිතවඤ්චිතො[3] ඛෙමට්ඨානං ගන්ත්වා, එත්ථ ඔතාරෙහීති වුත්තො ඔතාරෙත්වා සාටකං ගණ්හි.

කාණසිගාලො ආහ : අහං තෙ ද්වෙ කහාපණසතානි දස්සාමීති අවොචං; මය්හං පන කහාපණා බහූ, න ද්වෙ කහාපණසතානෙව. යාව අහං කහාපණෙ ආහරාමි, තාව ත්වං සුරියං ඔලොකෙන්තො තිට්ඨාහීති[4] වත්වා ථොකං ගන්ත්වා නිවත්තිත්වා පුන බ්‍රාහ්මණං ආහ : අය්‍ය බ්‍රාහ්මණ, මා ඉතො ඔලොකෙහි, සුරියමෙව ඔලොකෙන්තො තිට්ඨාහීති.[4] එවඤ්ච පන වත්වා කෙතකවනං පවිසිත්වා යථාරුචිං පක්කන්තො. බ්‍රාහ්මණස්සපි සුරියං ඔලොකෙන්තස්සෙව නලාටතො චෙව කච්ඡෙහි ච සෙදා මුච්චිංසු.[5] අථ තං රුක්ඛදෙවතා ආහ :

"සද්දහාසි සිගාලස්ස සුරාපීතස්ස බ්‍රාහ්මණ,
සිප්පියානං සතං නත්ථි කුතො කංසසතා දුවෙ"ති.

එවං යථා කාණසිගාලෙ[6] පසාදො නිරත්ථකො, එවං තිත්ථියෙසුපීති අනිය්‍යානිකසාසනෙ පසාදස්ස නිරත්ථකභාවං දස්සෙත්වා නිය්‍යානිකසාසනෙ තස්ස සාත්ථකභාවං දස්සෙතුං කථාගතො ච ඛො භික්ඛවෙති ආදිමාහ. තත්ථ කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙතීති අරහත්තමග්ගෙන කාමුපාදානස්ස පහානපරිඤ්ඤං, සමතික්කමං පඤ්ඤපෙති. ඉතරෙසං තිණ්ණං උපාදානානං සොතාපත්තිමග්ගෙන පරිඤ්ඤං පඤ්ඤපෙති. එවරූපෙ ඛො භික්ඛවෙ ධම්මවිනයෙති භික්ඛවෙ එවරූපෙ ධම්මෙ ච විනයෙ ච; උභයෙනාපි නිය්‍යානිකසාසනං දස්සෙති. සත්ථරි පසාදොති එවරූපෙ සාසනෙ යො සත්ථරි පසාදො, සො සම්මග්ගතා අක්ඛායති, භවදුක්ඛනිස්සරණාය සංවත්තති.

1. අය්‍ය B. L S
2. පුරතො E.
3. තජ්ජිතො E, S.
4. තිට්ඨාති B, S.
5. මුඤ්චිංසු B,
6. කාළසිඞ්ගාලෙ. B,

තත්‍රිමානි වත්ථූනි: භගවා කිර වෙදියක[1] පබ්බතෙ ඉන්දසාලගුහායං පටිවසති. අථෙකො උලූකසකුණො භගවති ගාමං පිණ්ඩාය පවිසන්තෙ උපඩ්ඪමග්ගං අනුගච්ඡති; නික්ඛන්තෙ[2] උපඩ්ඪමග්ගං පච්චුග්ගමනං කරොති. සො එකදිවසං සම්මාසම්බුද්ධං සායන්හසමයෙ භික්ඛුසඞ්ඝපරිවුතං නිසින්නං පබ්බතා ඔරුය්හ වන්දිත්වා පක්ඛෙ පනාමෙත්වා අඤ්ජලිං පග්ගය්හ සීසං හෙට්ඨා කත්වා දසබලං නමස්සමානො අට්ඨාසි. භගවා තං ඔලොකෙත්වා සිතං අකාසි.[3] ආනන්දත්ථෙරො කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො සිතස්ස පාතුකම්මායාති පුච්ඡි. පස්සානන්ද ඉමං උලූකසකුණං අයං මයි ච භික්ඛුසඞ්ඝෙ ච චිත්තං පසාදෙත්වා සතසහස්සකප්පෙ දෙවමනුස්සෙසු[4] සංසරිත්වා සොමනස්සො නාම පච්චෙකබුද්ධො භවිස්සතීති ආහ.

“උලූකක[5] මණ්ඩලක්ඛික වෙදියකෙ චිරදීඝවාසික,
සුඛිතොසි ත්වං අය්‍ය කොසිය කාලුට්ඨිතං පස්සසි බුද්ධවරං.

මයි චිත්තං පසාදෙත්වා භික්ඛුසඞ්ඝෙ අනුත්තරෙ,
කප්පානි සතසහස්සානි දුග්ගතිං සො න ගච්ඡති.

දෙවලොකා චවිත්වාන කුසලමූලෙන චොදිතො,
භවිස්සති අනන්තඤාණො සොමනස්සොති විස්සුතො”ති.

අඤ්ඤානිපි චෙත්ථ රාජගහනගරෙ[6] සුමනමාලාකාරවත්ථුං, මහාභෙරිවාදකවත්ථුං, මොරජිකවත්ථුං, වීණාවාදකවත්ථුං, සඞ්ඛධමනකවත්ථූනීති එවමාදීනි වත්ථූනි විත්ථාරෙතබ්බානි. එවං නිය්‍යානිකසාසනෙ සත්ථරි පසාදෙ සම්මග්ගතො හොති.

**ධම්මෙ පසාදෙති** නිය්‍යානිකසාසනස්මිං ධම්මෙ පසාදෙ සම්මග්ගතො හොති; සරමත්තෙන නිමිත්තං ගහෙත්වා සුණන්තානං තිරච්ඡානගතානම්පි සම්පත්තිදායකො හොති. අයමත්ථො මණ්ඩූකදෙවපුත්තාදීනං වත්ථුවසෙන වෙදිතබ්බො. **සීලෙසු පරිපූරකාරිතාති** නිය්‍යානිකසාසනස්මිං සීලෙසු පරිපූරකාරිතාපි සම්මග්ගතා හොති; සග්ගමොක්ඛසම්පත්තිං ආවහති. තත්ථ ඡත්තමාණවකවත්ථුසාමණෙරවත්ථු ආදීනි දීපෙතබ්බානි.

**සහධම්මිකෙසූති** නිය්‍යානිකසාසනෙ සහධම්මිකෙසු පියමනාපතාපි සම්මග්ගතා හොති; මහාසම්පත්තිං ආවහති. අයමත්ථො විමානපෙතවත්ථූහි දීපෙතබ්බො. වුත්තං හෙතං:

“ඛීරොදනං අහමදාසිං භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස-පෙ-
ඵාණිතං. .උච්ඡුඛණ්ඩිකං... තිම්බරූසකං... කක්කාරුකං...
එලාලුකං... වල්ලිපක්කං... ඵාරුසකං... හත්ථපතාකං...
සාකමුට්ඨිං... පුප්ඵකමුට්ඨිං... මූලකං... නිම්බමුට්ඨිං... අම්බිලකඤ්ජිකං...

1. වෙදිස්සක S. වෙදිසක B.
2. නික්ඛමන්තෙ B. S
3. පාත්වාකාසි B.
4. දෙවෙසු ච මනුස්සෙසු ච B. S.
5. උලූක E. S.
6. නගරද්වාරෙ E.

**දොණිනිම්මජ්ජනිං**... කායබන්ධනං... අංසවට්ටකං[1] ... ආයොගපට්ටං...
විධූපනං... තාලවණ්ටං... මොරහත්ථං...
ඡත්තං... උපාහනං. .පූවං... මොදකං...
සඞ්කුලිකං[2] අහමදාසිං භික්ඛුනො පිණ්ඩාය චරන්තස්ස,
තස්සා මෙ පස්ස විමානං අච්ඡරා කාමවණ්ණිනීහමස්මී"ති.

**තං කිස්ස හෙතූති** ආදි වුත්තනයානුසාරෙනෙව යොජෙත්වා වෙදිතබ්බං ඉදානි යෙසං උපාදානානං තිත්ථියා න සම්මා පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, තථාගතො පඤ්ඤපෙති, තෙසං පච්චයං දස්සෙතුං, **ඉමෙ ච භික්ඛවෙති** ආදිමාහ. තත්ථ **කිංනිදානාති** ආදීසු නිදානාදීනි සබ්බානෙව කාරණවෙවචනානි. කාරණං හි යස්මා ඵලං නිදෙති, හන්ද නං ගණ්හථාති අප්පෙති විය, තස්මා නිදානන්ති වුච්චති. යස්මා තං තතො ජායති, සමුදෙති, පභවති; තස්මා **සමුදයො, ජාති, පභවොති** වුච්චති. අයං පනෙත්ථ පදත්ථො: කිං නිදානං එතෙසන්ති **කිංනිදානා**. කො සමුදයො එතෙසන්ති **කිංසමුදයා**. කා ජාති එතෙසන්ති **කිංජාතිකා**. කො පභවො එතෙසන්ති **කිංපභවා**. යස්මා පන තෙසං තණ්හා යථාවුත්තෙන අත්ථෙන නිදානඤ්චෙව සමුදයො ච ජාති ච පභවො ච, තස්මා **තණ්හානිදානාති** ආදිමාහ. එවං සබ්බපදෙසු අත්ථො වෙදිතබ්බො. යස්මා පන භගවා න කෙවලං උපාදානස්සෙව පච්චයං ජානාති, උපාදානස්ස පච්චයභූතාය තණ්හායපි, තණ්හාදිපච්චයානං වෙදනාදීනම්පි පච්චයං ජානාතියෙව, තස්මා **තණ්හා චායං භික්ඛවෙති** ආදිමාහ.

**යතො ච ඛොති** යස්මිං කාලෙ. **අවිජ්ජා පහීනා හොතීති** වට්ටමූලිකා අවිජ්ජා අනුප්පාදනිරොධෙන පහීනා හොති. **විජ්ජා උප්පන්නාති** අරහත්තමග්ගවිජ්ජා උප්පන්නා. **සො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදාති** සො භික්ඛු අවිජ්ජාය ච පහීනත්තා විජ්ජාය ච උප්පන්නත්තා; **නෙව කාමුපාදානං උපාදියතීති** නෙව කාමුපාදානං ගණ්හාති,[3] න සෙසානි උපාදානානි. **අනුපාදියං න පරිතස්සතීති** එවං කිඤ්චි උපාදානං අගණ්හන්තො තණ්හාපරිත්තාසනාය න පරිතස්සති. **අපරිතස්සන්ති** අපරිතස්සන්තො, තණ්හං අනුප්පාදෙන්තො. **පච්චත්තංයෙව පරිනිබ්බායතීති** සයමෙව කිලෙසපරිනිබ්බානෙන පරිනිබ්බායති. එවමස්ස ආසවක්ඛයං **දස්සෙත්වා** ඉදානි ඛීණාසවස්ස භික්ඛුනො පච්චවෙක්ඛණං දස්සෙන්තො **ඛීණා ජාතීති** ආදිමාහ. තං[4] වුත්තත්ථමෙවාති.

**චූළසීහනාදසුත්තවණ්ණනා නිට්ඨිතා.**

---

## 1. 2. 2.

**එවම්මෙ සුතන්ති** මහාසීහනාදසුත්තං. තත්ථ **වෙසාලියන්ති** එවංනාමකෙ නගරෙ. තං කිර අපරාපරං විසාලීභූතත්තාය වෙසාලීති සඞ්ඛං ගතං.

---

1 අංසබන්ධකං B. S.
2. සක්ඛලිකං L. B. සඞ්ඛලිකං S.
3. ගණ්හාති න උපෙති B. S.
4. සෙසං B. S.

තත්‍රායං අනුපුබ්බකථා:[1] බාරාණසිරඤ්ඤො කිර අග්ගමහෙසියා කුච්ඡිම්හි ගබ්භො සණ්ඨාසි. සා ඤත්වා රඤ්ඤො නිවෙදෙසි. රාජා ගබ්භපරිහාරං අදාසි. සා සම්මාපරිහරියමානගබ්භා[2] ගබ්භපරිපාකකාලෙ විජායනඝරං පාවිසි. පුඤ්ඤවන්තීනං පච්චූසසමයෙ ගබ්භවුට්ඨානං හොති; සා ච තාසං අඤ්ඤතරා, තෙන පච්චූසසමයෙ අලත්තකපටලබන්ධුජීවකපුප්ඵසදිසං මංසපෙසිං විජායි. තතො, අඤ්ඤා දෙවියො සුවණ්ණබිම්බසදිසෙ පුත්තෙ විජායන්ති, අග්ගමහෙසී මංසපෙසින්ති රඤ්ඤො පුරතො මම අවණ්ණො උප්පජ්ජෙය්‍යාති චින්තෙත්වා තෙන අවණ්ණභයෙන තං මංසපෙසිං එකස්මිං භාජනෙ පක්ඛිපිත්වා පටිකුජ්ජිත්වා රාජමුද්දිකාය ලඤ්ඡෙත්වා ගඞ්ගාය සොතෙ[3] පක්ඛිපාපෙසි. මනුස්සෙහි ඡඩ්ඩිතමත්තෙ දෙවතා ආරක්ඛං සංවිදහිංසු. සුවණ්ණපට්ටිකඤ්චෙත්ථ ජාතිහිඞ්ගුලකෙන, බාරාණසිරඤ්ඤො අග්ගමහෙසියා පජාති ලිඛිත්වා බන්ධිංසු. තතො තං භාජනං ඌමිභයාදීහි අනුපද්දුතං ගඞ්ගාසොතෙන පායාසි.

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපකකුලං[4] නිස්සාය ගඞ්ගාතීරෙ විහරති. සො පාතොව ගඞ්ගං ඔතිණ්ණො තං භාජනං ආගච්ඡන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අග්ගහෙසි. අථෙත්ථ තං අක්ඛරපට්ටිකං රාජමුද්දිකාලඤ්ඡනඤ්ච දිස්වා මුඤ්චිත්වා මංසපෙසිං අද්දස. දිස්වානස්ස එතදහොසි: සියා ගබ්භො, තථාහිස්ස දුග්ගන්ධපූතිභාවො නත්ථීති අස්සමං ආනෙත්වා සුද්ධෙ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන ද්වෙ මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං[5] ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පිළකා උට්ඨහිංසු. අථ තතො අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො, එකා දාරිකා අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උප්පජ්ජි. අඞ්ගුට්ඨකතො චස්ස ඛීරං නිබ්බත්ති. තතොප්පභුති ච ඛීරභත්තං ලභි.[6] තාපසො භත්තං භුඤ්ජිත්වා ඛීරං දාරකානං මුඛෙ ආසිඤ්චති. තෙසං උදරං යං යං පවිසති තං තං සබ්බං මණිභාජනගතං විය දිස්සති. එවං නිච්ඡවී අහෙසුං. අපරෙ ආහු සිබ්බෙත්වා ඨපිතා විය තෙසං අඤ්ඤමඤ්ඤං ලීනා ඡවි අහොසීති. එවං තෙ නිච්ඡවිතාය වා ලීනච්ඡවිතාය වා ලිච්ඡවීති පඤ්ඤායිංසු.

තාපසො දාරකෙ පොසෙන්තො උස්සූරෙ ගාමං පිණ්ඩාය පවිසති; අතිදිවා පටික්කමති. තස්ස තං ව්‍යාපාරං ඤත්වා ගොපාලකා ආහංසු: භන්තෙ පබ්බජිතානං දාරකපොසනං පලිබොධො; අම්හාකං දාරකෙ දෙථ; මයං පොසෙස්සාම; තුම්හෙ අත්තනො කම්මං කරොථාති. තාපසො සාධූති පටිස්සුණි. ගොපාලකා දුතියදිවසෙ මග්ගං සමං කත්වා පුප්ඵෙහි ඔකිරිත්වා ධජපටාකා උස්සාපෙත්වා තූරියෙහි වජ්ජමානෙහි අස්සමං ආගතා. තාපසො, මහාපුඤ්ඤා දාරකා, තෙ[7] අප්පමාදෙන වඩ්ඪෙථ,

1. අනුපුබ්බිකථා B. S. 2. සම්මා පරිහරියමානා B. S. 3 ගඞ්ගාසොතෙ F.
4. ගොපාලකකුලං B, ගොපකුලං S, ගොකුලං M1, M2. T.
5. සංගුත්තතරං L. 6. ලභති B, S. 7. දාරකෙ B, S.

වඩ්ඪෙත්වා ච අඤ්ඤමඤ්ඤං ආවාහං[1] කරෙථ; පඤ්චගොරසෙන රජානං තොසෙත්වා භූමිභාගං ගහෙත්වා[2] නගරං මාපෙථ; තත්ථ කුමාරං අභිසිඤ්චථාති වත්වා දාරකෙ අදංසු. තෙ සාධූති පටිස්සුණිත්වා දාරකෙ නෙත්වා පොසෙසුං.

දාරකා වුද්ධිමන්වාය කීළන්තා විවාදට්ඨානෙසු අඤ්ඤෙ ගොපාලදාරකෙ හත්ථෙනපි පාදෙනපි පහරන්ති. තෙ රොදන්ති.[3] කිස්ස රොදථාති ච මාතාපිතූහි වුත්තා,[4] ඉමෙ නිම්මාතාපිතිකා තාපසපොසිතා අම්හෙ අතීව පහරන්තීති වදන්ති. තතො තෙසං මාතාපිතරො, ඉමෙ දාරකා අඤ්ඤෙ දාරකෙ විහෙසෙන්ති දුක්ඛාපෙන්ති, න ඉමෙ සංගහෙතබ්බා, වජ්ජෙතබ්බා ඉමෙති ආහංසු. තතොපපභුති කිර සො පදෙසො වජ්ජීති වුච්චති, යොජනසතපරිමාණෙන.

අථ තං පදෙසං ගොපාලකා රජානං තොසෙත්වා අග්ගහෙසුං. තත්ථ ච නගරං මාපෙත්වා සොළසවස්සුද්දෙසිකං කුමාරං අභිසිඤ්චිත්වා රජ්ජං අකංසු. තාය චස්ස දාරිකාය සද්ධිං වාරෙය්‍යං[5] කත්වා කතිකං අකංසු: න බාහිරතො දාරිකා ආනෙතබ්බා, ඉතො දාරිකා න කස්සචි දාතබ්බාති. තෙසං පඨමසංවාසෙන ද්වෙ දාරකා ජාතා: ධීතා ච පුත්තො ච. එවං සොළසක්ඛත්තුං ද්වෙ ද්වෙ ජාතා. තතො තෙසං දාරකානං යථාක්කමං වඩ්ඪන්තානං[6] ආරාමුය්‍යානනිවාසට්ඨානපරිවාරසම්පත්තිං ගහෙතුං අප්පහොන්තං නගරං තික්ඛත්තුං ගාවුතන්තරෙන ගාවුතන්තරෙන පරික්ඛිපිංසු. තස්ස පුනප්පුනං විසාලීකතත්තා වෙසාලීත්වෙව නාමං ජාතං. තෙන වුත්තං: **වෙසාලියන්ති** එවංනාමකෙ නගරෙති.

**බහිනගරෙති** නගරස්ස බහි, න **අම්බපාලිවනං**[7] විය අන්තොනගරම්හි, අයං පන ජීවකම්බවනං විය නගරස්ස බහි වනසණ්ඩො. තෙන වුත්තං: **බහි නගරෙති. අවරපුරෙති**[8] පුරස්ස අවරෙ;[9] පච්ඡිමදිසායන්ති අත්ථො. **වනසණ්ඩෙති** සො කිර වනසණ්ඩො නගරස්ස පච්ඡිමදිසායං ගාවුතමත්තට්ඨානෙ. තත්ථ මනුස්සා භගවතො ගන්ධකුටිං කත්වා තං පරිවාරෙත්වා භික්ඛූනං රත්තිට්ඨානදිවාට්ඨානචඞ්කමලෙණකුටිමණ්ඩපාදීනි පතිට්ඨාපෙසුං. භගවා තත්ථ විහරති. තෙන වුත්තං: **අවරපුරෙ**[8] **වනසණ්ඩෙති.**

**සුනක්ඛත්තොති** තස්ස නාමං. ලිච්ඡවිරඤ්ඤො පන පුත්තත්තා **ලිච්ඡවිපුත්තොති** වුත්තො. **අචිරපක්කන්තොති** විබ්භමිත්වා ගිහිභාවූපගමනෙන අධුනා පක්කන්තො. **පරිසතීති** පරිසමජ්ඣෙ. **උත්තරි මනුස්සධම්මාති** එත්ථ මනුස්සධම්මා නාම දසකුසලකම්මපථා. තෙ පටිසෙධෙතුං න සක්කොති. කස්මා? උපාරම්භභයා. වෙසාලියං හි බහූ මනුස්සා රතනත්තයෙ පසන්නා බුද්ධමාමකා, සඞ්ඝමාමකා. තෙ දසකුසල

1. ආවාහං විවාහං-B. S. E.
2. තොසෙත්වා-E.
3. රොදන්තා-L.
4. පුට්ඨා-B.
5. විවාහං-B. S. E.
6. වඩ්ඪන්තානං-L.
7. වනෙ-E.
8. අපරපුරෙ-B. S
9. අපරෙ-B S.

කම්මපථමත්තම්පි නත්ථි සමණස්ස ගොතමස්සාති වුත්තෙන, ත්වං කත්ථ භගවන්තං ඤාණං ගච්ඡන්තං අද්දස, කත්ථ අදිස්වා ආදියන්තන්ති ආදීනි වත්වා, අප්පමාණං න ජානාසි? කිං ජානන්තා මෙ අත්ථීති පාසාණසක්ඛරං ඛාදසි, අග්ගිනඛන්ධවෙඨන සණ්ඩසිතුං[1] වායමසි, කකචදන්තෙසු පුප්ඵාවලිකං කීළිතුං ඉච්ඡසි? මුඛතො තෙ දන්තෙ පාතෙස්සාමාති වදෙය්‍යුං සො තස්මා උපාරම්භභයා එවං වත්තුං න සක්කොති. යතො උත්තරිං පන විසෙසාධිගමං පටිසෙධෙන්තො, **උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො**ති ආහ.

තත්ථ අලමරියං කාතුන්ති[2] අලමරියො, අරියභාවාය සමත්ථොති වුත්තං හොති. ඤාණදස්සනමෙව ඤාණදස්සනවිසෙසො. අලමරියො ච සො ඤාණදස්සනවිසෙසො චාති **අලමරියඤාණදස්සනවිසෙසො**. ඤාණදස්සනන්ති දිබ්බචක්ඛුම්පි, විපස්සනාපි, මග්ගොපි, ඵලම්පි, පච්චවෙක්ඛණඤාණම්පි, සබ්බඤ්ඤුතඤාණම්පි වුච්චති. "අප්පමත්තො සමානො ඤාණදස්සනං ආරාධෙතී"ති හි එත්ථ දිබ්බචක්ඛු ඤාණදස්සනං නාම. "ඤාණදස්සනාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙතී"ති එත්ථ විපස්සනාඤාණං. "අභබ්බා තෙ ඤාණදස්සනාය අනුත්තරාය සම්බොධායා"ති එත්ථ මග්ගො. "අයමඤ්ඤො[3] උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො"ති එත්ථ ඵලං. "ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො"ති එත්ථ පච්චවෙක්ඛණඤාණං. "ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, සත්තාහකාලකතො ආළාරො කාලාමො"ති එත්ථ සබ්බඤ්ඤුතඤාණං. ඉධ පන ලොකුත්තරමග්ගො අධිප්පෙතො. තං හි සො භගවතො පටිසෙධෙති.

**තක්කපරියාහතන්ති** ඉමිනා ආචරියං පටිබාහති. එවං කිරස්ස අහොසි: සමණෙන ගොතමෙන ආචරියෙ උපසඞ්කමිත්වා සුඛුමං ධම්මන්තරං ගහිතං නාම නත්ථි; තක්කපරියාහතං පන තක්කෙත්වා විතක්කෙත්වා, එවං භවිස්සති, එවං භවිස්සතීති විතක්කපරියාහතං[4] කත්වා ධම්මං දෙසෙති. **වීමංසානුචරිතන්ති** ඉමිනාස්ස ලොකියපඤ්ඤං අනුජානාති: සමණො ගොතමො පඤ්ඤවා, සො තං පඤ්ඤාසඞ්ඛාතං ඉන්දවජිරූපමං වීමංසං එවං වට්ටිස්සති, එවං වට්ටිස්සතීති ඉතො චිතො ච අනුචරාපෙත්වා වීමංසාය අනුචරිතං ධම්මං දෙසෙති. **සයං පටිභානන්ති** ඉමිනාස්ස ධම්මෙසු පච්චක්ඛභාවං පටිබාහති එවං හිස්ස අහොසි: සමණස්ස ගොතමස්ස සුඛුමං ධම්මන්තරං විපස්සනා වා මග්ගො වා ඵලං වා පච්චක්ඛං නාම නත්ථි. අයං පන ලද්ධපරිසො, රාජානං චක්කවත්තිං විය තං චත්තාරො වණ්ණා පරිවාරෙන්ති. සුඵුසිතං පනස්ස දන්තාවරණං, මුදුකා ජිව්හා, මධුරො සරො, අනෙලගලා වාචා. සො යං යදෙවස්ස උපට්ඨාති, තං තං ගහෙත්වා සයං පටිභානං කත්වා කථෙන්තො මහාජනං රඤ්ජෙති.

1. පාබ්බුවෙඨ ගණ්ඨිතුං-B. S. 2. ඤාතුන්ති–B, S.
3. අයං මඤ්ඤො-L. S. 4. තක්කපරියාහතං-E. S.

**යස්ස ච ඛ්වාස්ස[1] අත්ථාය ධම්මො දෙසිතොති** යස්ස ච ඛො අත්ථාය අස්ස ධම්මො දෙසිතො, සෙය්‍යථිදං? රාගපටිඝාතත්ථාය අසුභකම්මට්ඨානං, දොසපටිඝාතත්ථාය මෙත්තාභාවනා, මොහපටිඝාතත්ථාය පඤ්චධම්මා; විතක්කුපච්ඡෙදාය ආනාපානස්සති. **සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති** සො ධම්මො, යො තං යථාදෙසිතං කරොති, තස්ස තක්කරස්ස සම්මා හෙතුනා නයෙන කාරණෙන වට්ටදුක්ඛක්ඛයාය නිය්‍යාති, ගච්ඡති. තං අත්ථං සාධෙතීති දීපෙති.

ඉදං පනායං[2] න අත්තනො අජ්ඣාසයෙන වදති. බුද්ධානං හි ධම්මො අනිය්‍යානිකොති එවමෙස[3] වදෙය්‍ය; න පන සක්කොති වත්තුං. කස්මා? උපාරම්භභයා. වෙසාලියං හි බහූ සොතාපන්නා සකදාගාමී අනාගාමී උපාසකා චෙව උපාසිකායො ච. තෙ එවං වදෙය්‍යුං: සුනක්ඛත්ත, ත්වං භගවතා දෙසිතධම්මො අනිය්‍යානිකොති වදසි. යදි අයං ධම්මො අනිය්‍යානිකො ඉමස්මිං නගරෙ ඉමෙ කස්මා එත්තකා සොතාපන්නා ජාතා, එත්තකා සකදාගාමී, එත්තකා අනාගාමීති? පුබ්බෙ වුත්තනයෙන උපාරම්භං කරෙය්‍යුන්ති. සො ඉමිනා උපාරම්භභයෙන අනිය්‍යානිකොති වත්තුං අසක්කොන්තො අජ්ජුනෙන[4] විසසට්ඨකාණ්ඩං විය අස්ස ධම්මො අමොක්ඛො නිය්‍යාති, අබ්භන්තරෙ පනස්ස කිඤ්චි නත්ථීති වදති.

**අපෙසාසි ඛොති** වෙසාලියං බ්‍රාහ්මණකුලසෙට්ඨිකුලාදීසු තත්ථ තත්ථ පරිසමජ්ඣෙ එවං භාසමානස්ස තං වචනං සුණි, න පන පටිසෙධෙසි. කස්මා? කාරුඤ්ඤතාය. එවං කිරස්ස අහොසි: අයං කුද්ධො ඛායමානං වෙළුවනං විය, පක්ඛිත්තලොණඋද්ධනං විය ච කොධවසෙන තටතටායති; මයා පටිබාහිතො පන මයිපි ආඝාතං බන්ධිස්සති; එවමස්ස තථාගතෙ ච මයි චාති ද්වීසු ජනෙසු ආඝාතො අතිභාරියො භවිස්සතීති කාරුඤ්ඤතාය න පටිසෙධෙසි. අපි චස්ස එවම්පි අහොසි: බුද්ධානං අවණ්ණකථනං[5] නාම පුණ්ණචන්දෙ දොසාරොපනසදිසං. කො ඉමස්ස කථං ගණ්හිස්සති? සසමෙව ඛෙළෙ පවජ්ජන්තො, මුඛෙ පුක්ඛො ඔරමිස්සතීති. ඉමිනාපි කාරණෙන න පටිසෙධෙසි. **පිණ්ඩපාතපටික්කන්තොති** පිණ්ඩපාතපරියෙසනතො අපගතො. **කොධනොති** චණ්ඩො ඵරුසො. **මොඝපුරිසොති** තුච්ඡපුරිසො. යස්ස හි තස්මිං අත්තභාවෙ මග්ගඵලානං උපනිස්සයො නත්ථි, තං බුද්ධා මොඝපුරිසොති වදන්ති. උපනිස්සයෙ සතිපි තස්මිං ඛණෙ මග්ගෙ වා ඵලෙ වා අසති[6] මොඝපුරිසොති වදන්තියෙව. ඉමස්ස පන තස්මිං අත්තභාවෙ මග්ගඵලානං උපනිස්සයො සමුච්ඡින්නොයෙව; තෙන තං මොඝපුරිසොති ආහ. **කොධා ච පනස්ස එසා වාචා භාසිතාති** එසා ච පනස්ස වාචා කොධෙන භාසිතා.

---

1. ඛ්වස්ස-B, S
2. පනෙතං-B, S.
3. එවමෙව-B, S.
4. අජ්ඣිතෙන-B, S
5. අවණ්ණභණනං-MI, S. T. V, WI, E.
6. අසතිපි-I,

කස්මා පනෙස භගවතො කුද්ධොති? අයං හි පුබ්බෙ භගවන්තං උපසඞ්කමිත්වා දිබ්බචක්ඛුපරිකම්මං පුච්ඡි. අථස්ස භගවා කථෙසි. සො දිබ්බචක්ඛුං නිබ්බත්තෙත්වා ආලොකං වඩ්ඪෙත්වා ඔලොකෙන්තො දෙවලොකෙ[1] නන්දනවනචිත්තලතාවනඵාරුසකවනමිස්සකවනෙසු දිබ්බසම්පත්තිං අනුභවමානෙ දෙවපුත්තෙ ච දෙවධීතරෙ ච දිස්වා, එතෙසං එවරූපාය අත්තභාවසම්පත්තියා ඨිතානං කීව[2] මධුරො නු ඛො සද්දො භවිස්සතීති සද්දං සොතුකාමො හුත්වා දසබලං උපසඞ්කමිත්වා දිබ්බසොතධාතුපරිකම්මං පුච්ඡි. භගවා පනස්ස දිබ්බසොතධාතුයා උපනිස්සයො නත්ථීති ඤත්වා පරිකම්මං න කථෙසි. න හි බුද්ධා යස්ස න භවිස්සති තස්ස[3] පරිකම්මං කථෙන්ති. සො භගවති ආඝාතං බන්ධිත්වා චින්තෙසි: අහං සමණං ගොතමං පඨමං දිබ්බචක්ඛුපරිකම්මං පුච්ඡිං සො මය්හං තං සම්පජ්ජතු වා මා වා සම්පජ්ජතූති කථෙසි. අහං පන පච්චත්තපුරිසකාරෙන තං නිබ්බත්තෙත්වා දිබ්බසොතධාතුපරිකම්මං පුච්ඡිං. තං මෙ න කථෙසි. අද්ධාස්ස එවං හොති: අයං රාජපබ්බජිතො, දිබ්බචක්ඛුඤාණං නිබ්බත්තෙත්වා, දිබ්බසොතධාතුඤාණං නිබ්බත්තෙත්වා, චෙතොපරියඤාණං නිබ්බත්තෙත්වා, ආසවානං ඛයඤාණං නිබ්බත්තෙත්වා මයා සමසමො භවිස්සතීති ඉස්සාමච්ඡරියවසෙන මය්හං න කථෙතීති, භිය්‍යොසො[4] ආඝාතං බන්ධිත්වා කාසායානි ඡඩ්ඩෙත්වා ගිහිභාවං පත්වාපි න තුණ්හීභූතො විචරති. දසබලං පන අසතා තුච්ඡෙන අබ්භාචික්ඛන්තො විචරති. තෙනාහ භගවා: කොධනො ච පනස්ස එසා වාචා භාසිතාති.

**වණ්ණො හෙසො සාරිපුත්තාති** සාරිපුත්ත, තථාගතෙන සතසහස්සකප්පාධිකානි චත්තාරි අසඞ්ඛෙය්‍යානි පාරමියො පූරෙන්තෙන එතදත්ථමෙව වායාමො කතො: දෙසිතො ධම්මො මෙ නිය්‍යානිකො භවිස්සතීති. තස්මා යො එවං වදෙය්‍ය, සො වණ්ණංයෙව තථාගතස්ස භාසති. වණ්ණො හෙසො සාරිපුත්ත, ගුණො එසො තථාගතස්ස, න අගුණොති දස්සෙති.

**අයම්පි හි නාම සාරිපුත්තාති** ආදිනා කිං දස්සෙති? සුනක්ඛත්තෙන පටිසිද්ධස්ස[5] උත්තරිමනුස්සධම්මස්ස අත්තනි අත්ථිතං දස්සෙති. භගවා කිර "පස්ස[6] සාරිපුත්ත සුනක්ඛත්තො මොඝපුරිසො, නත්ථි තථාගතස්ස උත්තරිමනුස්සධම්මොති වදති; මය්හඤ්ච සබ්බඤ්ඤුතඤ්ඤාණං නාම අත්ථි, ඉද්ධිවිධඤ්ඤාණං නාම අත්ථි; දිබ්බසොතධාතුඤ්ඤාණං නාම අත්ථි; චෙතොපරියඤ්ඤාණං නාම අත්ථි; දසබලඤ්ඤාණං නාම අත්ථි; චතුවෙසාරජ්ජඤ්ඤාණං නාම අත්ථි; අට්ඨසු පරිසාසු අකම්පනඤ්ඤාණං නාම අත්ථි; චතුයොනිපරිච්ඡෙදකඤ්ඤාණං නාම අත්ථි; පඤ්චගතිපරිච්ඡෙදකඤ්ඤාණං නාම අත්ථි; සබ්බපි චෙතෙ උත්තරිමනුස්සධම්මායෙව. එවරූපෙසු

1. දෙවලොකෙ ඔලොකෙන්තො-B. S.
2. කිං ච-B; කිං-S.
3. න හි බුද්ධා උපනිස්සයවිරහිතස්ස-B S.
4. භිය්‍යොසොමත්තාය-B S
5. පටිසෙධිතස්ස-E. S.
6. පස්ස අයං-B. S.

උත්තරිමනුස්සධම්මෙසු එකස්සපි ජානනමත්තං ධම්මන්වයමත්තම්පි නාම එතස්ස මොඝපුරිසස්ස න භවිස්සතී”ති එතමත්ථං දස්සෙතුං, **අයම්පි හි නාම සාරිපුත්තාති** ආදිනා නයෙන ඉමං දෙසනං ආරභි.

තත්ථ **අන්වෙතීති** අන්වයො. ජානාති, අනුබුජ්ඣතීති අත්ථො. ධම්මස්ස අන්වයො **ධම්මන්වයො**. තං තං සබ්බඤ්ඤුතඤ්ඤාණාදිධම්මා ජානනපඤ්ඤායෙතං අධිවචනං. **ඉතිපි සො භගවාති** ආදීහි එවරූපම්පි නාම මය්හං සබ්බඤ්ඤුතඤ්ඤාණසඞ්ඛාතං උත්තරිමනුස්සධම්මං විජ්ජමානමෙව **අත්ථීති** ජානිතුං තස්ස මොඝපුරිසස්ස ධම්මන්වයොපි න භවිස්සතීති දස්සෙති; ඉද්ධිවිධඤාණාදීසුපි එවං යොජනා වෙදිතබ්බා.

**එත්ථ ච** කිඤ්චාපි චෙතොපරියඤාණානන්තරං තිස්සො විජ්ජා වත්තබ්බා සියුං, යස්මා පන තාසු වුත්තාසු උපරි දසබලඤාණං න පරිපූරති, තස්මා තා අවත්වා තථාගතබලඤාණං[1] පරිපූරං කත්වා දස්සෙන්තො, **දස ඛො පනිමානි සාරිපුත්තාති** ආදිමාහ. තත්ථ **තථාගතබලානීති** අඤ්ඤෙහි අසාධාරණානි තථාගතස්සෙව බලානි. යථා වා පුබ්බබුද්ධානං බලානි පුඤ්ඤුස්සයසම්පත්තියා ආගතානි, තථා ආගතබලානීතිපි අත්ථො.

තත්ථ දුවිධං තථාගතස්ස බලං : කායබලඤ්ච ඤාණබලඤ්ච. තෙසු කායබලං හත්ථිකුලානුසාරෙන වෙදිතබ්බං. වුත්තඤ්හෙතං පොරාණෙහි :

“කාළාවකඤ්ච ගඞ්ගෙය්‍යං පණ්ඩරං තම්බපිඞ්ගලං,
ගන්ධමඞ්ගලහෙමඤ්ච උපොසථඡද්දන්තිමෙ දසා”ති.

ඉමානි හි දස හත්ථිකුලානි. තත්ථ කාළාවකන්ති පකතිහත්ථිකුලං දට්ඨබ්බං. යං දසන්නං පුරිසානං කායබලං, තං එකස්ස කාළාවකහත්ථිනො. යං දසන්නං කාළාවකානං බලං, තං එකස්ස ගඞ්ගෙය්‍යස්ස; යං දසන්නං ගඞ්ගෙය්‍යානං, තං එකස්ස පණ්ඩරස්ස; යං දසන්නං පණ්ඩරානං, තං එකස්ස තම්බස්ස; යං දසන්නං තම්බානං, තං එකස්ස පිඞ්ගලස්ස; යං දසන්නං පිඞ්ගලානං, තං එකස්ස ගන්ධහත්ථිනො; යං දසන්නං ගන්ධහත්ථීනං, තං එකස්ස මඞ්ගලස්ස; යං දසන්නං මඞ්ගලානං, තං එකස්ස හෙමවතස්ස; යං දසන්නං හෙමවතානං, තං එකස්ස උපොසථස්ස; යං දසන්නං උපොසථානං, තං එකස්ස ඡද්දන්තස්ස; යං දසන්නං ඡද්දන්තානං, තං එකස්ස තථාගතස්ස. නාරායනසඞ්ඝාතබලන්තිපි[2] ඉදමෙව වුච්චති. තදෙතං පකතිහත්ථිගණනාය හත්ථීනං කොටිසහස්සස්ස, පුරිසගණනාය දසන්නං පුරිසකොටිසහස්සානං බලං හොති. ඉදං තාව තථාගතස්ස කායබලං.

ඤාණබලං පන පාළියං තාව ආගතමෙව. දසබලඤාණං, චතුවෙසාරජ්ජඤාණං, අට්ඨසු පරිසාසු අකම්පනඤාණං, චතුයොනිපරිච්ඡෙදකඤාණං, පඤ්චගතිපරිච්ඡෙදකඤාණං, සංයුත්තකෙ ආගතානි තෙසත්තති

1. තථාගතස්ස දසබලඤාණං-B. S.    2. නාරායනබලන්තිපි-E.

ඤාණානි, සත්තසත්තති ඤාණානීති එවං අඤ්ඤානිපි අනෙකානි ඤාණසහස්සානි. එතං ඤාණබලං නාම. ඉධාපි ඤාණබලමෙව අධිප්පෙතං. ඤාණං හි අකම්පියට්ඨෙන උපත්ථම්භනට්ඨෙන බලන්ති වුත්තං.

**යෙහි බලෙහි සමන්නාගතොති** යෙහි දසහි ඤාණබලෙහි උපෙතො සමුපෙතො. **ආසභං ඨානන්ති** සෙට්ඨට්ඨානං, උත්තමට්ඨානං. ආසභා වා පුබ්බබුද්ධා, තෙසං ඨානන්ති අත්ථො. අපි ච ගවසතජෙට්ඨකො උසභො, ගවසහස්සජෙට්ඨකො වසභො. වජසතජෙට්ඨකො වා උසභො, වජසහස්සජෙට්ඨකො වසභො. සබ්බගවසෙට්ඨො, සබ්බපරිස්සයසහො, සෙතො, පාසාදිකො, මහාභාරවහො, අසනිසතසද්දෙහිපි අකම්පියො[1] නිසභො. සො ඉධ උසභොති අධිප්පෙතො. ඉදම්පි හි තස්ස පරියායවචනං. උසභස්ස ඉදන්ති **ආසභං**. **ඨානන්ති** චතූහි පාදෙහි පථවිං උප්පීළෙත්වා අවට්ඨානං.[2] ඉදම්පන ආසභං වියාති ආසභං. යථෙව හි නිසභසඞ්ඛාතො උසභො උසභබලෙන සමන්නාගතො චතූහි පාදෙහි පථවිං උප්පීළෙත්වා අචලට්ඨානෙන[3] තිට්ඨති, එවං තථාගතොපි දසහි තථාගතබලෙහි සමන්නාගතො චතූහි වෙසාරජ්ජපාදෙහි අට්ඨපරිසපථවිං උප්පීළෙත්වා සදෙවකෙ ලොකෙ කෙනචි පච්චත්ථිකෙන පච්චාමිත්තෙන අකම්පියො අචලට්ඨානෙන[3] තිට්ඨති. එවං තිට්ඨමානො ච තං ආසභං ඨානං පටිජානාති, උපගච්ඡති, න පච්චක්ඛාති, අත්තනි ආරොපෙති. තෙන වුත්තං: **ආසභං ඨානං පටිජානාතීති.**

**පරිසාසූති** අට්ඨසු පරිසාසු. **සීහනාදං නදතීති** සෙට්ඨනාදං අභීතනාදං නදති. සීහනාදසදිසං වා නාදං නදති. අයමත්ථො සීහනාදසුත්තෙන දීපෙතබ්බො. යථා වා සීහො සහනතො ච හනනතො ච සීහොති වුච්චති, එවං තථාගතො ලොකධම්මානං සහනතො; පරප්පවාදානඤ්ච හනනතො සීහොති වුච්චති. එවං වුත්තස්ස සීහස්ස නාදං සීහනාදං. තත්ථ යථා සීහො සීහබලෙන සමන්නාගතො සබ්බත්ථ විසාරදො විගතලොමහංසො සීහනාදං නදති, එවං තථාගතසීහොපි තථාගතබලෙහි සමන්නාගතො අට්ඨසු පරිසාසු විසාරදො විගතලොමහංසො, "ඉති රූප"න්ති ආදිනා නයෙන නානාවිධදෙසනාවිලාසසම්පන්නං සීහනාදං නදති. තෙන වුත්තං: පරිසාසු සීහනාදං නදතීති.

**බ්‍රහ්මචක්කං පවත්තෙතීති** එත්ථ බ්‍රහ්මන්ති සෙට්ඨං උත්තමං, විසිට්ඨං. චක්කසද්දො පනායං:

සම්පත්තියං ලක්ඛණෙ ච රථඞ්ගෙ ඉරියාපථෙ
දානෙ රතනධම්මූරචක්කාදිසු[4] ච දිස්සති,
ධම්මචක්කෙ ඉධ මතො තඤ්ච ද්වෙධා විභාවයෙ.

"චත්තාරිමානි භික්ඛවෙ චක්කානි, යෙහි සමන්නාගතානං දෙවමනුස්සාන"න්ති ආදිසු හි අයං සම්පත්තියං දිස්සති. "පාදතලෙසු චක්කානි ජාතානී"ති එත්ථ ලක්ඛණෙ. "චක්කංව වහතො පද"න්ති එත්ථ

1. අසම්පකම්පියො-L, E. 2. අචලට්ඨානං-B.
3. අචලට්ඨානෙ-E. 4. ධම්මචක්කාදිසු-S.

රථඞ්ගෙ.[1] "චතුචක්කං නවද්වාර"න්ති එත්ථ ඉරියාපථෙ. "දද භුඤ්ජ ච මා ච පමාදො, චක්කං වත්තය සබ්බපාණින"න්ති එත්ථ දානෙ. "දිබ්බං චක්කරතනං පාතුරහොසී"ති එත්ථ රතනචක්කෙ. "මයා පවත්තිතං චක්ක"න්ති එත්ථ ධම්මචක්කෙ. "ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙ"ති එත්ථ උරචක්කෙ.[2] "ඛුරපරියන්තෙන චෙපි චක්කෙනා"ති එත්ථ පහරණචක්කෙ. "අසනි විය චක්ක"න්ති එත්ථ අසනිමණ්ඩලෙ. ඉධ පනායං ධම්මචක්කෙ මතො.[3]

තං පන ධම්මචක්කං දුවිධං හොති: පටිවෙධඤාණඤ්ච දෙසනාඤාණඤ්ච. තත්ථ පඤ්ඤාපභාවිතං අත්තනො අරියඵලාවහං පටිවෙධඤාණං, කරුණාපභාවිතං සාවකානං අරියඵලාවහං දෙසනාඤාණං. තත්ථ පටිවෙධඤාණං උප්පජ්ජමානං උප්පන්නන්ති දුවිධං. තං හි අභිනික්ඛමනතො යාව අරහත්තමග්ගා උප්පජ්ජමානං, ඵලක්ඛණෙ උප්පන්නං නාම. තුසිතභවනතො වා යාව මහාබොධිපල්ලඞ්කෙ අරහත්තමග්ගා උප්පජ්ජමානං, ඵලක්ඛණෙ උප්පන්නං නාම. දීපඞ්කරතො පට්ඨාය වා යාව අරහත්තමග්ගා උප්පජ්ජමානං, ඵලක්ඛණෙ උප්පන්නං නාම. දෙසනාඤාණම්පි පවත්තමානං පවත්තන්ති දුවිධං. තං හි යාව අඤ්ඤාකොණ්ඩඤ්ඤස්ස[4] සොතාපත්තිමග්ගා පවත්තමානං, ඵලක්ඛණෙ පවත්තං නාම. තෙසු පටිවෙධඤාණං ලොකුත්තරං, දෙසනාඤාණං ලොකියං. උභයම්පි පනෙතං අඤ්ඤෙහි අසාධාරණං, බුද්ධානංයෙව ඔරසං ඤාණං.

ඉදානි යෙහි දසහි[5] බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, යානි ආදිතොව **දස ඛො පනිමානි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලානීති** නික්ඛිත්තානි, තානි විත්ථාරතො දස්සෙතුං, **කතමානි දස? ඉධ සාරිපුත්ත තථාගතො ඨානඤ්ච ඨානතොති** ආදිමාහ. තත්ථ **ඨානඤ්ච ඨානතොති** කාරණඤ්ච කාරණතො. කාරණං හි යස්මා තත්ථ ඵලං තිට්ඨති, තදායත්තවුත්තිතාය උප්පජ්ජති චෙව පවත්තති ච, තස්මා ඨානන්ති වුච්චති. තං භගවා, යෙ යෙ ධම්මා යෙසං යෙසං ධම්මානං හෙතුපච්චයා උප්පාදාය, තං තං ඨානං; යෙ යෙ ධම්මා යෙසං යෙසං ධම්මානං න හෙතුපච්චයා උප්පාදාය, තං තං අට්ඨානන්ති පජානන්තො **ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති.** අභිධම්මෙ පනෙතං "තත්ථ කතමං තථාගතස්ස ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණ"න්ති ආදිනා නයෙන විත්ථාරිතමෙව. **යම්පීති** යෙන ඤාණෙන. **ඉදම්පි සාරිපුත්ත තථාගතස්සාති** ඉදම්පි ඨානාඨානඤාණං තථාගතස්ස තථාගතබලං නාම හොතීති අත්ථො. එවං සබ්බපදෙසු යොජනා වෙදිතබ්බා.

---

1. රථචක්කෙ-B.
2. ඛුරචක්කෙ-B. S.
3. අභිප්පෙතො-S.
4. අඤ්ඤාතකොණ්ඩඤ්ඤස්ස-B
5. යෙහි-B, S.

**කම්මසමාදානාන**න්ති සමාදියිත්වා කතානං කුසලාකුසලකම්මානං. කම්මමෙව වා කම්මසමාදානං. **ඨානසො හෙතුසොති** පච්චයතො චෙව හෙතුතො ච. තත්ථ ගතිඋපධිකාලපයොගා විපාකස්ස ඨානං, කම්මං හෙතු. ඉමස්ස පන ඤාණස්ස විත්ථාරකථා "අත්ථෙකච්චානි පාපකානි කම්මසමාදානානි ගතිසම්පත්තිපටිබාළ්හානි න විපච්චන්තී"ති ආදිනා නයෙන අභිධම්මෙ ආගතායෙව.

**සබ්බත්ථගාමිනි**න්ති සබ්බගතිගාමිනිඤ්ච අගතිගාමිනිඤ්ච. **පටිපද**න්ති මග්ගං. **යථාභූතං පජානාතීති** බහූසුපි මනුස්සෙසු එකමෙව පාණං ඝාතෙන්තෙසු ඉමස්ස චෙතනා නිරයගාමිනී භවිස්සති, ඉමස්ස තිරච්ඡානයොනිගාමිනීති ඉමිනා නයෙන එකවත්ථුස්මිම්පි කුසලාකුසලචෙතනාසඞ්ඛාතානං පටිපත්තීනං අවිපරීතතො සභාවං ජානාති. ඉමස්සපි ච ඤාණස්ස විත්ථාරකථා "තත්ථ කතමං තථාගතස්ස සබ්බත්ථගාමිනීපටිපදං යථාභූතං ඤාණං? ඉධ තථාගතො, අයං මග්ගො අයං පටිපදා නිරයගාමිනීති පජානාතී"ති ආදිනා නයෙන අභිධම්මෙ ආගතායෙව.

**අනෙකධාතු**න්ති චක්ඛුධාතුආදීහි කාමධාතුආදීහි වා ධාතූහි බහුධාතුං. **නානාධාතු**න්ති තාසංයෙව ධාතූනං විලක්ඛණතාය නානප්පකාරධාතුං. **ලොක**න්ති ඛන්ධායතනධාතුලොකං. **යථාභූතං පජානාතීති** තාසං තාසං[1] ධාතූනං අවිපරීතතො සභාවං පටිවිජ්ඣති. ඉදම්පි ඤාණං "තත්ථ කතමං තථාගතස්ස අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං ඤාණං? ඉධ තථාගතො ඛන්ධනානත්තං පජානාතී"ති ආදිනා නයෙන අභිධම්මෙ විත්ථාරිතමෙව.

**නානාධිමුත්තිකත**න්ති හීනාදීහි අධිමුත්තීහි නානාධිමුත්තිකභාවං. ඉදම්පි ඤාණං, "තත්ථ කතමං තථාගතස්ස සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං ඤාණං? ඉධ තථාගතො පජානාති:[2] සන්ති සත්තා හීනාධිමුත්තිකා"ති ආදිනා නයෙන අභිධම්මෙ විත්ථාරිතමෙව.

**පරසත්තාන**න්ති පධානසත්තානං. **පරපුග්ගලාන**න්ති තතො පරෙසං හීනසත්තානං. එකත්ථමෙව වා එතං පදද්වයං වෙනෙය්‍යවසෙන ද්විධා වුත්තං. **ඉන්ද්‍රියපරොපරියත්ත**න්ති සද්ධාදීනං ඉන්ද්‍රියානං පරභාවඤ්ච අපරභාවඤ්ච; වුඩ්ඪිඤ්ච හානිඤ්චාති අත්ථො. ඉමස්සාපි ඤාණස්ස විත්ථාරකථා, "තත්ථ කතමං තථාගතස්ස පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං ඤාණං? ඉධ තථාගතො සත්තානං ආසයං ජානාති, අනුසයං ජානාතී"ති ආදිනා නයෙන අභිධම්මෙ ආගතායෙව.[3]

**ඣානවිමොක්ඛසමාධිසමාපත්තීන**න්ති පඨමාදීනං චතුන්නං ඣානානං: "රූපී රූපානි පස්සතී"ති ආදීනං අට්ඨන්නං විමොක්ඛානං; සවිතක්කසවිචාරාදීනං තිණ්ණං සමාධීනං පඨමජ්ඣානසමාපත්ති

1. තාසංයෙව-B. S. 2. තථාගතො-B. S. E. 3. ආගතමෙව-B.

ආදීනඤ්ච ඣානානං අනුපුබ්බසමාපත්තීනං. **සඞ්කිලෙසන්ති** හානභාගියධම්මං[1]. **වොදානන්ති** විසෙසභාගියධම්මං. **වුට්ඨානන්ති** "වොදානම්පි වුට්ඨානං, තම්හා තම්හා සමාධිම්හා වුට්ඨානම්පි වුට්ඨාන"න්ති එවං වුත්තං පගුණජ්ඣානඤ්චෙව භවඞ්ගඵලසමාපත්තියො ච. හෙට්ඨිමං හෙට්ඨිමං හි පගුණජ්ඣානං උපරිමස්ස උපරිමස්ස පදට්ඨානං හොති, තස්මා වොදානම්පි වුට්ඨානන්ති වුත්තං. භවඞ්ගෙන පන[2] සබ්බජ්ඣානෙහි වුට්ඨානං හොති. ඵලසමාපත්තියා නිරොධසමාපත්තිතො වුට්ඨානං හොති. තමෙතං[3] සන්ධාය තම්හා තම්හා සමාධිම්හා වුට්ඨානම්පි වුට්ඨානන්ති වුත්තං. ඉදම්පි ඤාණං, "තත්ථ කතමං තථාගතස්ස ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණං? ඣායීති චත්තාරො ඣායී: අත්ථෙකච්චො ඣායී සම්පත්තිංයෙව සමානං විපත්තීති පච්චෙතී"ති ආදිනා නයෙන අභිධම්මෙ විත්ථාරිතං.

සබ්බඤ්ඤුතඤ්ඤාණඤ්ච විත්ථාරකථාය විනිච්ඡයො සම්මොහවිනොදනියා විභඞ්ගට්ඨකථාය වුත්තො. පුබ්බෙනිවාසානුස්සතිදිබ්බචක්ඛුඤාණකථා විසුද්ධිමග්ගෙ විත්ථාරිතා; ආසවක්ඛයකථා භයභෙරවෙ. **ඉමානි ඛො සාරිපුත්තාති** යානි පුබ්බෙ **දස ඛො පනිමානි සාරිපුත්ත තථාගතස්ස තථාගතබලානීති** අවොචං,[4] ඉමානි තානීති අප්පනං කරොති.

තත්ථ පරවාදීකථා හොති: දසබලඤාණං නාම පාටියෙක්කං නත්ථි; සබ්බඤ්ඤුතඤ්ඤාණස්සෙවායං පභෙදොති. තං න තථා දට්ඨබ්බං. අඤ්ඤදෙව හි[5] දසබලඤාණං, අඤ්ඤං සබ්බඤ්ඤුතඤ්ඤාණං දසබලඤාණං හි සකසකකිච්චමෙව ජානාති. සබ්බඤ්ඤුතඤ්ඤාණං තම්පි තතො අවසෙසම්පි ජානාති දසබලඤාණෙසු හි[6] පඨමං කාරණාකාරණමෙව ජානාති, දුතියං කම්මන්තරවිපාකන්තරමෙව, තතියං කම්මපරිච්ඡෙදමෙව, චතුත්ථං ධාතුනානත්තකාරණමෙව, පඤ්චමං සත්තානං අජ්ඣාසයාධිමුත්තිමෙව, ඡට්ඨං ඉන්ද්‍රියානං තික්ඛමුදුභාවමෙව, සත්තමං ඣානාදීහි සද්ධිං තෙසං සඞ්කිලෙසාදිමෙව, අට්ඨමං පුබ්බෙනිවුත්ථඛන්ධසන්තතිමෙව, නවමං සත්තානං චුතිපටිසන්ධිමෙව, දසමං සච්චපරිච්ඡෙදමෙව. සබ්බඤ්ඤුතඤ්ඤාණං පන එතෙහි ජානිතබ්බඤ්ච, තතො උත්තරිඤ්ච පජානාති. එතෙසං පන කිච්චං න සබ්බං කරොති. තං හි ඣානං හුත්වා අප්පෙතුං න සක්කොති; ඉද්ධි හුත්වා විකුබ්බිතුං න සක්කොති; මග්ගො හුත්වා කිලෙසෙ ඛෙපෙතුං න සක්කොති.

අපි ච පරවාදී එවං පුච්ඡිතබ්බො: දසබලඤාණං නාම එතං සවිතක්කසවිචාරං, අවිතක්කවිචාරමත්තං, අවිතක්කඅවිචාරං, කාමාවචරං, රූපාවචරං,[7] ලොකියං, ලොකුත්තරන්ති? ජානන්තො පටිපාටියා[8] සත්තඤාණානි සවිතක්කසවිචාරානීති වක්ඛති; තතො පරානි ද්වෙ

1. හානභාගියං-L.
2. භවඞ්ගෙන-B. S.
3. තං-B. S.
4. අවොච-E.
5. අඤ්ඤදෙව-L.
6. ඤාණෙසුපි හි-B. S.
7. රූපාවචරං අරූපාවචරං-A, M1, M2, P2, R, B.
8. පටිපාටියා-E.

අවිතක්කඅවිචාරන්ති වක්ඛති. ආසවක්ඛයඤාණං සියා සවිතක්කසවිචාරං, සියා අවිතක්කවිචාරමත්තං, සියා අවිතක්කඅවිචාරන්ති වක්ඛති. තථා පටිපාටියා සත්ත කාමාවචරානි, තතො පරානි ද්වෙ රූපාවචරානි අවසානෙ එකං ලොකුත්තරන්ති වක්ඛති. සබ්බඤ්ඤුතඤාණං පන සවිතක්කසවිචාරමෙව, කාමාවචරමෙව, ලොකියමෙවාති වක්ඛති.

එවමෙත්ථ අනුපදවණ්ණනං ඤත්වා ඉදානි යස්මා තථාගතො පඨමංයෙව ඨානාඨානඤාණෙන වෙනෙය්‍යසත්තානං ආසවක්ඛයාධිගමස්ස චෙව අනධිගමස්ස ච ඨානාඨානභූතං කිලෙසාවරණාභාවං පස්සති, ලොකියසම්මාදිට්ඨිට්ඨාන[1]දස්සනතො ච, නියතමිච්ඡාදිට්ඨිට්ඨානාභාවදස්සනතො ච; අථ නෙසං කම්මවිපාකඤාණෙන විපාකාවරණාභාවං පස්සති, තිහෙතුකපටිසන්ධිදස්සනතො; සබ්බත්ථගාමිනිපටිපදාඤාණෙන කම්මාවරණාභාවං පස්සති, ආනන්තරියකම්මාභාවදස්සනතො; එවං අනාවරණානං අනෙකධාතුනානාධාතුඤාණෙන අනුකූලධම්මදෙසනත්ථං චරියවිසෙසං පස්සති, ධාතුවෙමත්තදස්සනතො; අථ නෙසං නානාධිමුත්තිකතඤාණෙන අධිමුත්තිං පස්සති, පයොගං අනාදියිත්වාපි අධිමුත්තිවසෙන ධම්මදෙසනත්ථං; අථෙවං දිට්ඨාධිමුත්තීනං යථාසත්ති යථාබලං ධම්මං දෙසෙතුං ඉන්ද්‍රියපරොපරියත්තිඤාණෙන ඉන්ද්‍රියපරොපරියත්තං පස්සති, සද්ධාදීනං තික්ඛමුදුභාවදස්සනතො; එවං පරිඤ්ඤාතින්ද්‍රියපරොපරියත්තා පන තෙ සචෙ දූරෙ හොන්ති, පඨමජ්ඣානාදිසු[2] වසීභූතත්තා ඉද්ධිවිසෙසෙන තෙ ඛිප්පං උපගච්ඡති; උපගන්ත්වා ච නෙසං[3] පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන පුබ්බජාතිවිභාවනං, දිබ්බචක්ඛුඤාණානුභාවතො පත්තබ්බෙන චෙතොපරියඤාණෙන සම්පති චිත්තවිසෙසං පස්සන්තො, ආසවක්ඛයඤාණානුභාවෙන ආසවක්ඛයගාමිනියා පටිපදාය විගතසම්මොහත්තා ආසවක්ඛයාය ධම්මං දෙසෙති. තස්මා ඉමිනා අනුක්කමෙන ඉමානි දසබලානි වුත්තානීති වෙදිතබ්බානි.

**තං වාචං අප්පහායා**ති ආදිසු, පුන[4] එවරූපං වාචං න වක්ඛාමීති වදන්තො වාචං[5] පජහති නාම. පුන එවරූපං චිත්තං න උප්පාදෙස්සාමීති චින්තෙන්තො චිත්තං පජහති නාම. පුන එවරූපං දිට්ඨිං න ගණ්හිස්සාමීති පජහන්තො දිට්ඨිං පටිනිස්සජ්ජති[6] නාම. තථා අකරොන්තො නෙව පජහති, න පටිනිස්සජ්ජති. සො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ,[7] යථා නිරයපාලෙහි ආහරිත්වා නිරයෙ ඨපිතො එවං නිරයෙ ඨපිතො යෙවාති[8] වෙදිතබ්බො.

ඉදානස්ස[9] අත්ථසාධිකං උපමං දස්සෙන්තො, **සෙය්‍යථාපී**ති ආදිමාහ. **තත්ථ සීලසම්පන්නො**ති ආදිසු ලොකියලොකුත්තරා සීලසමාධිපඤ්ඤා

1. දිට්ඨිට්ඨිති. L. දිට්ඨිඨාන-S
2. අථ ඣානාදිඤාණෙන ඣානාදිසු-L.
3. උපගන්ත්වා පනෙස-B, S.
4. ආදිසු පන-B, S. පුරෙ-P1.
5. තං වාචං-B. S.
6. නිස්සජ්ජති-B. L.
7. නිරයෙති-B. S.
8. ආහරිත්වා නිරයෙ ඨපිතොයෙවාති-L
9. ඉදානිස්ස-B, S.

වෙදිතබ්බා. ලොකුත්තරවසෙනෙව විනිවෙටෙතුම්පි[1] වට්ටති. අයං හි සම්මාවාචාකම්මන්තාජීවෙහි **සීලසම්පන්නො**, සම්මාවායාමසතිසමාධීහි **සමාධිසම්පන්නො**, සම්මාදිට්ඨිසඞ්කප්පෙහි **පඤ්ඤාසම්පන්නො**. සො එවං සීලාදිසම්පන්නො භික්ඛු යථා **දිට්ඨෙව ධම්මෙ**, ඉමස්මිංයෙව අත්තභාවෙ; **අඤ්ඤං ආරාධෙති**, අරහත්තං පාපුණාති. **එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි**, ඉදම්පි කාරණං එවරූපමෙව. යථා හි මග්ගානන්තරං අවිරජ්ඣිත්වාව ඵලං නිබ්බත්තති, එවමෙව ඉමස්සාපි පුග්ගලස්ස චුතිඅනන්තරං අවිරජ්ඣිත්වාව නිරයෙ පටිසන්ධි හොතීති දස්සෙති. සකලස්මිං හි බුද්ධවචනෙ ඉමාය උපමාය ගාළ්හතරං කත්වා වුත්තා උපමා නාම නත්ථි.

**වෙසාරජ්ජානීති** එත්ථ සාරජ්ජපටිපක්ඛං වෙසාරජ්ජං. චතූසු ඨානෙසු සාරජ්ජාභාවං පච්චවෙක්ඛන්තස්ස උප්පන්නසොමනස්සමය ඤාණස්සෙතං නාමං. **සම්මාසම්බුද්ධස්ස තෙ පටිජානතොති** අහං සම්මාසම්බුද්ධො, සබ්බෙ ධම්මා මයා අභිසම්බුද්ධාති එවං පටිජානතො තව. **අනභිසම්බුද්ධාති** ඉමෙ නාම ධම්මා තයා න අභිසම්බුද්ධා. **තත්‍ර වතාති** තෙසු[2] අනභිසම්බුද්ධාති එවං දස්සිතධම්මෙසු. **සහධම්මෙනාති** සහෙතුනා, සකාරණෙන වචනෙන; සුනක්ඛත්තෙන විය විප්පලපන්තෙන අප්පමාණං. **නිමිත්තමෙතන්ති** එත්ථ පුග්ගලොපි ධම්මොපි නිමිත්තන්ති අධිප්පෙතො. තං පුග්ගලං න පස්සාමි, යො මං[3] පටිචොදෙස්සති; තං ධම්මම්පි න පස්සාමි, යං දස්සෙත්වා අයං නාම ධම්මො තයා අනභිසම්බුද්ධොති මං පටිචොදෙස්සතීති අයමෙත්ථ අත්ථො. **ඛෙමප්පත්තොති** ඛෙමං පත්තො. සෙසපදද්වයං ඉමස්සෙව වෙවචනං.

සබ්බමෙතං[4] වෙසාරජ්ජඤාණමෙව සන්ධාය වුත්තං. දසබලස්ස හි, අයං නාම ධම්මො තයා අනභිසම්බුද්ධොති චොදකං පුග්ගලං වා, චොදනාකාරණං අනභිසම්බුද්ධධම්මං වා අපස්සතො, සභාවබුද්ධොයෙව වත[5] සමානො අහං බුද්ධොස්මීති වදාමීති පච්චවෙක්ඛන්තස්ස බලවතරං සොමනස්සං උප්පජ්ජති; තෙන සම්පයුත්තං ඤාණං වෙසාරජ්ජං නාම. තං සන්ධාය **ඛෙමප්පත්තොති** ආදිමාහ. එවං සබ්බත්ථ අත්ථො වෙදිතබ්බො.

**අන්තරායිකා ධම්මාති** එත්ථ පන අන්තරායං කරොන්තීති අන්තරායිකා. තෙ අත්ථතො සඤ්චිච්ච වීතික්කන්තා සත්ත ආපත්තික්ඛන්ධා. සඤ්චිච්ච වීතික්කන්තං හි අන්තමසො දුක්කට[6]දුබ්භාසිතම්පි මග්ගඵලානං අන්තරායං කරොති. ඉධ පන මෙථුනධම්මො අධිප්පෙතො. මෙථුනං සෙවතො හි යස්ස කස්සචි නිස්සංසයමෙව මග්ගඵලානං අන්තරායො හොති. **යස්ස ඛො පන තෙ අත්ථායාති** රාගක්ඛයාදිසු

1. විනිවෙඨෙතුම්පි-B. S. 2. තෙසු වත- B. S.
3. යො මං එවං-A. P2. R. යො එවං-M1. P.. T. V. W1. 4. සබ්බං එතං-B. S.
5. චා-S. එව-E. 6. දුක්කටවසෙනච-A. M2. P2 R.

යස්ස යස්ස අත්ථාය[1]. **ධම්මො දෙසිතොති** අසුභභාවනාදිධම්මො කථිතො. **තත්‍ර වත්තමානති** තස්මිං අනිය්‍යානිකධම්මෙ මං. සෙසං වුත්තනයෙනෙව වෙදිතබ්බං.

**අට්ඨ ඛො ඉමා සාරිපුත්තාති** ඉදං කස්මා ආරද්ධං? වෙසාරජ්ජඤාණස්ස බලදස්සනත්ථං. යථා හි ව්‍යත්තං පරිසං අජ්ඣොගාහෙත්වා විඤ්ඤූනං චිත්තාරාධනසමත්ථාය කථාය ධම්මකථිකස්ස ඡෙකභාවො පඤ්ඤායති, එවං ඉමා අට්ඨ පරිසා පත්වා වෙසාරජ්ජඤාණස්ස වෙසාරජ්ජභාවො සක්කා ඤාතුන්ති වෙසාරජ්ජඤාණස්ස බලං දස්සෙන්තො **අට්ඨ ඛො ඉමා සාරිපුත්තාති** ආදිමාහ.

තත්ථ **ඛත්තියපරිසාති** ඛත්තියානං සන්නිපතිත්වා නිසින්නට්ඨානං. එස නයො සබ්බත්ථ. මාරකායිකානං පන සන්නිපතිත්වා නිසින්නට්ඨානං **මාරපරිසාති** වෙදිතබ්බා; න මාරානං. සබ්බාපි චෙතා පරිසා උග්ගට්ඨානදස්සනවසෙන ගහිතා. මනුස්සා හි, එත්ථ රාජා නිසින්නොති පකතිවචනම්පි වත්තුං න සක්කොන්ති, කච්ඡෙහි සෙදා මුච්චන්ති; එවං උග්ගා ඛත්තියපරිසා. බ්‍රාහ්මණා තීසු වෙදෙසු කුසලා හොන්ති; ගහපතයො නානා වොහාරෙසු චෙව අක්ඛරචින්තාය ච. සමණා සකවාදපරවාදෙසු[2] කුසලා හොන්ති. තෙසං මජ්ඣෙ ධම්මකථාකථනං නාම අතිවිය භාරො. අමනුස්සාපි උග්ගා හොන්ති; අමනුස්සොති හි වුත්තමත්තෙපි සකලසරීරං කම්පති.[3] තස්ස රූපං වා දිස්වා සද්දං වා සුත්වා සත්තා විසඤ්ඤිනො හොන්ති. එවං අමනුස්සපරිසා උග්ගා. තාසුපි ධම්මකථාකථනං නාම අතිවිය භාරො. ඉති උග්ගට්ඨානදස්සනවසෙන තා ගහිතාති වෙදිතබ්බා.

**අජ්ඣොගාහතීති** අනුපවිසති. **අනෙකසතං ඛත්තියපරිසන්ති** බිම්බිසාරසමාගම-ඤාතිසමාගම-ලිච්ඡවිසමාගමාදිසදිසං.[4] අඤ්ඤචක්කවාළෙසු පි උපලබ්භති[5] යෙව. කිං පන භගවා අඤ්ඤචක්කවාළානිපි[6] ගච්ඡතීති? ආම ගච්ඡති. කීදිසො හුත්වා? යාදිසා තෙ තාදිසොව. තෙනෙවාහ: "අභිජානාමි ඛො පනාහං ආනන්ද අනෙකසතං ඛත්තියපරිසං උපසඞ්කමිතා. තත්ථ යාදිසකො තෙසං වණ්ණො හොති තාදිසකො මය්හං වණ්ණො හොති, යාදිසකො තෙසං සරො හොති තාදිසකො මය්හං සරො හොති. ධම්මියා ච කථාය සන්දස්සෙමි-පෙ-සම්පහංසෙමි. භාසමානඤ්ච මං න ජානන්ති: කො නු ඛො අයං භාසති දෙවො වා මනුස්සො වාති. ධම්මියා ච කථාය සන්දස්සෙත්වා-පෙ-සම්පහංසෙත්වා අන්තරධායාමි අන්තරහිතඤ්ච මං න ජානන්ති: කො නු ඛො අයං අන්තරහිතො දෙවො වා මනුස්සො වා"ති.

ඛත්තියා කෙයූරඞ්ගදමාලාගන්ධාදිභූසිතා[7] නානාවිරාගවසනා ආමුත්තමණිකුණ්ඩලා මොලිධරා හොන්ති. කිං භගවාපි එවං අත්තානං මණ්ඩෙති? තෙ ච[8] ඔදාතාපි හොන්ති, කාළාපි, මඞ්ගුරච්ඡවීපි.

1. යස්ස අත්ථාය-B. S.
2. සකවාදෙසු-E.
3. සංකම්පති-B. S.
4. සමාගමසදිසං-B. S.
5. අඤ්ඤෙසුපි චක්කවාළෙසු ලබ්භති-B. S.
6. අඤ්ඤෙ හි චක්කවාළානි පි-B. S.
7. විභූසිතා-B. S.
8. කෙචි-B තෙපි-S.

කිං සත්ථාපි එවරූපො හොතීති? සත්ථා අත්තනො පබ්බජිතවෙසෙනෙව ගච්ඡති. තෙසං පන තාදිසො හුත්වා උපට්ඨාති. ගන්ත්වා රාජාසනෙ නිසින්නං අත්තානං දස්සෙති. තෙසං අජ්ජ අම්හාකං රාජා අතිවිය විරොචතීති හොති. තෙ ච ජින්නස්සරාපි[1] හොන්ති, බද්ධස්සරාපි,[2] කාකස්සරාපි. සත්ථා බ්‍රහ්මස්සරෙනෙව ධම්මං කථෙති. තාදිසකො මය්හං සරො හොතීති ඉදං පන භාසන්තරං සන්ධාය කථිතං. මනුස්සානං පන තං සුත්වා අජ්ජ රාජා මධුරෙන සරෙන කථෙතීති හොති කථෙත්වා පක්කන්තෙ ච භගවති පුන රාජානං ආගතං දිස්වා කො නු ඛො අයන්ති වීමංසා උප්පජ්ජති. ඉදං වුත්තං හොති : කො නු ඛො අයං ඉමස්මිං ඨානෙ ඉදානෙව මගධභාසාය සීහළභාසාය මධුරෙන සරෙන[3] කථෙන්තො අන්තරහිතො, කිං දෙවො උදාහු මනුස්සොති?. කිමත්ථං පනෙවං අජානන්තානං ධම්මං දෙසෙතීති? වාසනත්ථාය. එවං සුතොපි හි ධම්මො අනාගතෙ පච්චයො හොතියෙවාති අනාගතං පටිච්ච දෙසෙති.

**සන්නිසින්නපුබ්බන්ති** සඞ්ගම්ම නිසින්නපුබ්බං. **සල්ලපිතපුබ්බන්ති** අල්ලාප[4]සල්ලාපො කතපුබ්බො. **සාකච්ඡාති** ධම්මසාකච්ඡාපි සමාපජ්ජිතපුබ්බා. **අනෙකසතං බ්‍රාහ්මණපරිසන්ති** ආදීනම්පි සොණදණ්ඩසමාගමාදිවසෙන චෙව අඤ්ඤචක්කවාළවසෙන ච සම්භවො වෙදිතබ්බො.

**චතස්සො ඛො ඉමා සාරිපුත්ත යොනියොති**, එත්ථ යොනීති ඛන්ධකොට්ඨාසස්සපි කාරණස්සපි පස්සාවමග්ගස්සපි නාමං. 'චතස්සො නාගයොනියො චතස්සො සුපණ්ණයොනියො''ති එත්ථ හි ඛන්ධකොට්ඨාසො යොනි නාම. ''යොනි[5] හෙසා භූමිජඵලස්ස අධිගමායා''ති එත්ථ කාරණං; ''න චාහං බ්‍රාහ්මණං බ්‍රූමි යොනිජං මත්තිසම්භව''න්ති එත්ථ පස්සාවමග්ගො; ඉධ පන ඛන්ධකොට්ඨාසො **යොනීති** අධිප්පෙතො. තත්ථ අණ්ඩෙ ජාතා **අණ්ඩජා**. ජලාබුම්හි ජාතා **ජලාබුජා**. සංසෙදෙ ජාතා **සංසෙදජා**. විනා එතෙහි කාරණෙහි උප්පතිත්වා විය නිබ්බත්තාති[6] **ඔපපාතිකා**. **අභිනිබ්භිජ්ජ ජායන්තීති** භින්දිත්වා නික්ඛමනවසෙන ජායන්ති. **පූතිකුණපෙ වාති** ආදීනි හි අතිවට්ඨානෙව[7] දස්සිතානි. ඉවෙඨසුපි පන[8] සප්පිතෙලමධුඵාණිතාදීසු සත්තා ජායන්ති එව.

**දෙවාති** ආදීසු චාතුම්මහාරාජිකතො පට්ඨාය උපරි දෙවා ඔපපාතිකා හොන්ති. භුම්මදෙවා පන චතුයොනිකා. **එකච්චෙ ච මනුස්සාති** එත්ථ[9] මනුස්සෙසු කෙචිදෙව ඔපපාතිකා හොන්ති; යෙ භූයෙන පනෙතෙ ජලාබුජාව. අණ්ඩජාපි හොන්ති[10] කොන්තපුත්තා දෙවභාතියථෙරා විය; සංසෙදජාපි පදුමගබ්භෙ නිබ්බත්තපොක්ඛර

1. සින්නස්සරාපි-B. S.
2. ගම්භීරස්සරාපි-S.
3. මධුරෙනාකාරෙන L.
4. ආලාප-B. S. E
5. අයොනි-E.
6. නිබ්බත්තා අභිනිබ්බත්තාති-S.
7. අතිඋක්කට්ඨානෙව-B. S.
8. ඉවෙඨසු-B. S. ඉවෙඨසුපි-E.
9. මනුස්සාති-B. S. L.
10. අණ්ඩජාපි එත්ථ-B, L, S, E.

සාතිබ්‍රාහ්මණ-පදුමවතීදෙවීආදයො විය[1] විනිපාතිකෙසු නිජ්ඣාමතණ්හිකා පෙතා නෙරයිකා විය ඕපපාතිකායෙව. අවසෙසා චතුයොනිකාපි හොන්ති. යථා ච තෙ එවං යක්ඛාපි, සබ්බචතුප්පද-පක්ඛිජාති-දීඝජාතිආදයොපි සබ්බෙ චතුයොනිකායෙව.

**පඤ්ච ඛො ඉමා සාරිපුත්ත ගතියොති** එත්ථ සුකතදුක්කටකම්ම වසෙන ගන්තබ්බාති **ගතියො**. අපි ච ගතිගති, නිබ්බත්තිගති, අජ්ඣාසයගති, විභවගති, නිප්ඵත්තිගතීති බහුවිධා ගති නාම. තත්ථ "කං ගතිං පෙච්ච ගච්ඡාමී"ති ච "යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා"ති ච අයං ගතිගති නාම. "ඉමෙසං ඛො අහං භික්ඛූනං සීලවන්තානං නෙව ජානාමි ගතිං වා අගතිං වා"ති අයං නිබ්බත්තිගති නාම. "එවම්පි ඛො තෙ අහං බ්‍රහ්මෙ ගතිඤ්ච පජානාමි ජුතිඤ්ච[2] පජානාමී"ති අයං අජ්ඣාසයගති නාම. "විභවො ගති ධම්මානං නිබ්බානං අරහතො ගතී"ති අයං විභවගති නාම. "ද්වෙ එව ගතියො භවන්ති අනඤ්ඤා"ති අයං නිප්ඵත්තිගති නාම. තාසු ඉධ ගතිගති අධිප්පෙතා.

**නිරයොති** ආදීසු නිරත්ථියට්ඨෙන නිරස්සාදට්ඨෙන **නිරයො**. තිරියං අඤ්ඡිතා[3] තිරච්ඡානා; තෙසං යොනි **තිරච්ඡානයොනි**. පෙච්චභාවං පත්තානං විසයොති **පෙත්තිවිසයො**. මනසො උස්සන්නත්තා **මනුස්සා**. පඤ්චහි කාමගුණෙහි අත්තනො අත්තනො ආනුභාවෙහි ච දිබ්බන්තීති **දෙවා**. **නිරයඤ්චාහං සාරිපුත්තාති** ආදීසු නිරයොති සද්ධිං ඔකාසෙන ඛන්ධා; **තිරච්ඡානයොනිඤ්චාති** ආදීසුපි එසෙව නයො. **මග්ගං පටිපදන්ති** උභයෙනාපි තං තං[4] ගතිසංවත්තනිකං කම්මමෙව දසෙසති. **යථාපටිපන්නොති** යෙන මග්ගෙන යාය පටිපදාය පටිපන්නොති උභයම්පි එකතො කත්වා නිද්දිසති. **අපායන්ති** ආදීසු වඩ්ඪිසඞ්ඛාතා සුඛසඞ්ඛාතා වා අයා අපෙතත්තා අපායො; දුක්ඛස්ස ගති පටිසරණන්ති දුග්ගති; දුක්කටකාරිනො එත්ථ විනිපතන්තීති **විනිපාතො**. **නිබ්බානඤ්චාහන්ති** ඉදං පන න කෙවලං ගතිමෙව[5] ගතිනිස්සරණං නිබ්බානම්පි ජානාමීති දස්සනත්ථං ආහ. ඉධ **මග්ගා**[6] **පටිපදාති** උභයෙනාපි අරියමග්ගොව වුත්තො.

ඉදානි යථාවුත්තෙසු ඨානෙසු අත්තනො ඤාණප්පවත්තාකාරං දස්සෙන්තො **ඉධාහං සාරිපුත්තාති** ආදිමාහ. තත්ථ **එකන්තදුක්ඛාති** නිච්චදුක්ඛා, නිරන්තරදුක්ඛා. **තිබ්බාති** බහලා; **කටුකාති** ඛරා. **සෙය්‍යථාපීති** ආදීනි ඔපම්මදස්සනත්ථං වුත්තානි. තත්ථ **කාසූති** ආවාටොපි වුච්චති රාසිපි.

"කිංනු සන්තරමානොව කාසුං ඛණසි සාරථි,
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කිං කාසුයා කරිස්සසී"ති

එත්ථ හි ආවාටො කාසු නාම.

---

1. ආදයො හොන්තියෙව-B, S. I. විය හොන්තියෙව-E.
2. චුතිඤ්ච-B. S.
3. අඤ්ජන්තීති-S.
4. වුත්තං-B, S.
5. ගතිගතිමෙව-B, S.
6. මග්ගොති-B, S.

"අඞ්ගාරකාසුං අපරෙ ඵුණන්ති,
නරා රුදන්තා පරිදඩ්ඪගත්තා"ති

එත්ථ රාසි. ඉධ පන ආවාටො අධිප්පෙතො. තෙනෙවාහ: **සාධිකපොරිසං පූරඞ්ගාරාන**න්ති. යත්ථ සාධිකං පොරිසං පමාණං අස්සාති **සාධිකපොරිසා**; අතිරෙකපඤ්චරතනාති අත්ථො. **වීතච්චිකානං වීතධූමාන**න්ති එතං පරිළාහස්ස බලවභාවදීපනත්ථං වුත්තං. අච්චියා වා හි[1] ධූමෙ වා සති වාතො සමුට්ඨාති, තෙන පරිළාහො න බලවා හොති. **ඝම්මපරෙතොති** ඝම්මානුගතො; **තසිතොති** ජාතතණ්හො; **පිපාසිතොති** උදකං පාතුකාමො; **එකායනෙන මග්ගෙනාති** එකමග්ගෙනෙව[2] මග්ගෙන අනුක්කමන්තියෙන උභොසු පස්සෙසු තිරියන්තරකණ්ටකරුක්ඛගහනෙන; **පණිධායාති** අඞ්ගාරකාසුයං හි[3] පත්ථනා නාම නත්ථි; අඞ්ගාරකාසුං ආරබ්භ පන ඉරියාපථස්ස ඨපිතත්තා එවං වුත්තං.

**එවමෙව ඛොති** එත්ථ ඉදං ඔපම්මසංසන්දනං: අඞ්ගාරකාසු විය හි නිරයො දට්ඨබ්බො; අඞ්ගාරකාසුමග්ගො විය නිරයූපගං කම්මං; මග්ගාරුළ්හො විය කම්මසමඞ්ගීපුග්ගලො; චක්ඛුමා පුරිසො විය දිබ්බචක්ඛුකො භගවා. යථා සො පුරිසො මග්ගාරුළ්හං දිස්වාව ජානාති: අයං ඉමිනා මග්ගෙන ගන්ත්වා අඞ්ගාරකාසුයං පතිස්සතීති. එවමෙව භගවා පාණාතිපාතාදිසු යං කිඤ්චි කම්මං ආයූහන්තං එව ජානාති: අයං ඉමං කම්මං කත්වා නිරයෙ නිබ්බත්තිස්සතීති. යථා සො පුරිසො අපරභාගෙ තං අඞ්ගාරකාසුයා පතිතං පස්සති, එවමෙව භගවා අපරභාගෙ සො පුරිසො තං කම්මං කත්වා කුහිං නිබ්බත්තොති ආලොකං වඩ්ඪෙත්වා දිබ්බචක්ඛුනා ඔලොකෙන්තො නිරයෙ නිබ්බත්තං පස්සති, පඤ්චවිධබන්ධනාදිමහාදුක්ඛං අනුභවන්තං. තත්ථ කිඤ්චාපි තස්ස කම්මායූහනකාලෙ අඤ්ඤො වණ්ණො, නිරයෙ නිබ්බත්තස්ස අඤ්ඤො, අථ ඛො පන සො[4] සත්තො තං කම්මං කත්වා තත්ථ[5] නිබ්බත්තොති ඔලොකෙන්තස්ස අනෙකසහස්සානං සත්තානං මජ්ඣෙ ඨිතොපි අයං සොති සොයෙව සත්තො ආපාථං ආගච්ඡති. දිබ්බචක්ඛුබලං නාම එතන්ති වදන්ති.

දුතියඋපමායං යස්මා අඞ්ගාරකාසුයං විය ගූථකූපෙ පරිළාහො නත්ථි තස්මා **එකන්තදුක්ඛාති** අවත්වා **දුක්ඛාති** ආදිමාහ. එත්ථාපි පුරිම නයෙනෙව ඔපම්මසංසන්දනං වෙදිතබ්බං. ඉමම්පි[6] පුග්ගලං භගවා හත්ථියොනිආදිසු යත්ථ කත්ථචි නිබ්බත්තං වධබන්ධනආකඩ්ඪනවිකඩ්ඪනාදීහි මහාදුක්ඛං අනුභවමානං පස්සතියෙව.

තතියඋපමායං **තනුපත්තපලාසොති** න අබ්භපටලං විය තනු පණ්ණො, විරලපණ්ණත්තං පනස්ස[7] සන්ධාය ඉදං වුත්තං. **කබරච්ඡායොති** විරලච්ඡායො; **දුක්ඛබහුලාති** පෙත්තිවිසයස්මිං හි දුක්ඛමෙව

1. වා සති-B, S. 3. කාසූම්පි-B. S. L. 5. තත්ථ-B.
2. එකපථෙනෙව-B S. L. 4. අථ සො-S. 6. ඉමම්පි හි-B, S.
7. පන-B. S.

බහුලං, සුඛං පරිත්තං කත්වා අනුභවිතබ්බං හොති; තස්මා එවමාහ. ඉධාපි පුරිමනයෙනෙව ඔපම්මසංසන්දනං වෙදිතබ්බං.

චතුත්ථඋපමායං **බහලපත්තපලාසොති** නිරන්තරපණ්ණො, පත්තසඤ්ඡන්නො; **සන්දච්ඡායො**[1]ති පාසාණච්ඡත්තං විය ඝනච්ඡායො. **සුඛබහුලා වෙදනාති** මනුස්සලොකෙ ඛත්තියකුලාදීසු සුඛබහුලා වෙදනා වෙදයිතබ්බා හොන්ති; තා වෙදියමානං නිසින්නං වා නිපන්නං වා පස්සාමීති දස්සෙති. ඉධාපි ඔපම්මසංසන්දනං පුරිමනයෙනෙව වෙදිතබ්බං.

පඤ්චමඋපමායං **පාසාදොති** දීඝපාසාදො; **උල්ලිත්තාවලිත්තන්ති** අන්තො චෙව බහි ච ලිත්තං;[2] **ඵුස්සිතග්ගළන්ති** ද්වාරබාහාහි සද්ධිං සුපිහිතකවාටං; **ගොණකත්ථතොති** චතුරඞ්ගුලාධිකලොමෙන කාළකොජවෙන අත්ථතො; **පටිකත්ථතොති** උණ්ණාමයෙන සෙතත්ථරකෙන අත්ථතො; **පටලිකත්ථතොති** ඝනපුප්ඵෙන උණ්ණාමයෙන අත්ථරකෙන අත්ථතො; **කාදලි**[3]**මිගපවරපච්චත්ථරණොති** කදලිමිගචම්මමයෙන උත්තමපච්චත්ථරණෙන අත්ථතො. තං කිර පච්චත්ථරණං සෙතවත්ථස්ස උපරි කදලිමිගචම්මං අත්ථරිත්වා සිබ්බෙත්වා කරොන්ති. **සඋත්තරච්ඡදොති** සහඋත්තරච්ඡදෙන උපරි බද්ධෙන රත්තවිතානෙන සද්ධින්ති අත්ථො; **උභතොලොහිතකූපධානොති** සීසූපධානඤ්ච පාදූපධානඤ්චාති පල්ලඞ්කස්ස උභතො ඨපිතලොහිතකූපධානො. ඉධාපි උපමාසංසන්දනං පුරිමනයෙනෙව විභජිතබ්බං.[4]

අයං පනෙත්ථ අපරභාගෙ යොජනා: යථා සො පුරිසො මග්ගාරූළ්හමෙව ජානාති, අයං එතෙන මග්ගෙන ගන්ත්වා පාසාදං ආරුය්හ කූටාගාරං පවිසිත්වා පල්ලඞ්කෙ නිසීදිස්සති වා නිපජ්ජිස්සති වාති. එවමෙව භගවා දානාදීසු පුඤ්ඤකිරියවත්ථූසු යං කිඤ්චි කුසලකම්මං ආයූහන්තංයෙව පුග්ගලං දිස්වා අයං ඉමං කම්මං කත්වා දෙවලොකෙ නිබ්බත්තිස්සතීති ජානාති. යථා සො පුරිසො අපරභාගෙ තං පාසාදං ආරුය්හ කූටාගාරං පවිසිත්වා පල්ලඞ්කෙ නිසින්නං වා නිපන්නං වා එකන්තසුඛා නිරන්තරසුඛා වෙදනා වෙදියමානං පස්සති, එවමෙව භගවා අපරභාගෙ, සො පුරිසො තං කල්‍යාණකම්මං කත්වා කුහිං නිබ්බත්තොති ආලොකං වඩ්ඪෙත්වා දිබ්බචක්ඛුනා ඔලොකෙන්තො දෙවලොකෙ නිබ්බත්තං පස්සති, නන්දනවනාදීසු අච්ඡරාසඞ්ඝපරිවුතං, දිබ්බසම්පත්තිං අනුභවමානං.

ආසවක්ඛයවාරෙ දිබ්බෙන චක්ඛුනාති අවත්වා **තමෙනං පස්සාමීති** වුත්තං; තං කස්මාති චෙ? නියමාභාවා. ඉමං හි පුග්ගලං දිබ්බචක්ඛුනාපි පස්සිස්සති, චෙතොපරියඤාණෙනාපි ජානිස්සති, සබ්බඤ්ඤුතඤ්ඤාණෙනාපි ජානිස්සතියෙව. **එකන්තසුඛා වෙදනාති** ඉදං කිඤ්චාපි දෙවලොකසුඛෙන සද්ධිං බ්‍යඤ්ජනතො එකං, අත්ථතො පන නානා හොති. දෙව

1. සණ්ඩච්ඡායො-S. සණ්ටච්ඡායො-B
2. අන්තො චෙව උල්ලිත්තං බහි ච අවලිත්තං-B, S.
3. කද්දලි-S, කදලි-E.
4. වෙදිතබ්බං-E

ලොකසුඛං හි රාගපරිළාහාදීනං අජ්ඣිතාය න එකන්තෙනෙව එකන්තසුඛං. නිබ්බානසුඛං පන සබ්බපරිළාහානං වූපසමා සබ්බාකාරෙන එකන්තසුඛං. උපමායම්පි යං[1] පාසාදෙ එකන්තසුඛාති වුත්තං, තං මග්ගපරිළාහස්ස අවූපසන්තතාය ජිඝච්ඡිතත්තාය පිපාසාභිභූතතාය ච න එකන්තෙනෙවෙකන්තසුඛං[2]. වනසණ්ඩෙ පන පොක්ඛරණියං ඔරුය්හ රජොජල්ලස්ස පවාහිතත්තා මග්ගදරථස්ස වූපසන්තතාය භිසමුළාල[3]ඛාදනෙන චෙව මධුරොදකපානෙන ච ඛුප්පිපාසානං විනීතතාය උදකසාටකං පරිවත්තෙත්වා පට්ටදුකූලං[4] නිවාසෙත්වා තණ්ඩුලත්ථවිකං උස්සීසකෙ කත්වා උදකසාටිකං පිළන්ධිත්වා හදයෙ ඨපෙත්වා මන්දමන්දෙන[5] වාතෙන බීජියමානස්ස නිපන්නත්තා සබ්බාකාරෙන එකන්තසුඛං හොති.

එවමෙව ඛො ඉත්ථ ඉදං ඔපම්මසංසන්දනං: පොක්ඛරණී විය අරියමග්ගො දට්ඨබ්බො. පොක්ඛරණීමග්ගො විය පුබ්බභාගපටිපදා. මග්ගාරූළ්හො විය පටිපදාසමඞ්ගී පුග්ගලො. චක්ඛුමා පුරිසො විය විවටචක්ඛු[6] භගවා. වනසණ්ඩො විය නිබ්බානං. යථා සො පුරිසො මග්ගාරූළ්හං දිස්වාව ජානාති: අයං ඉමිනා මග්ගෙන ගන්ත්වා පොක්ඛරණියං න්හත්වා රමණීයෙ වනසණ්ඩෙ රුක්ඛමූලෙ නිසීදිස්සති වා නිපජ්ජිස්සති වාති. එවමෙව භගවා පටිපදං පූරෙන්තමෙව, නාමරූපං පරිච්ඡින්දන්තමෙව, පච්චයපරිග්ගහං කරොන්තමෙව, ලක්ඛණාරම්මණාය විපස්සනාය කම්මං කරොන්තමෙව ජානාති: අයං ඉමං පටිපදං පූරෙත්වා සබ්බාසවෙ ඛෙපෙත්වා, "අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං"න්ති එවං වුත්තං ඵලසමාපත්තිං උපසම්පජ්ජ විහරිස්සතීති. යථා සො පුරිසො අපරභාගෙ තං[7] පොක්ඛරණියං න්හත්වා වනසණ්ඩං පවිසිත්වා නිසින්නං වා නිපන්නං වා එකන්තසුඛා වෙදනා වෙදියමානං පස්සති, එවමෙව භගවා අපරභාගෙ තං පුග්ගලං පටිපදං පූරෙත්වා මග්ගං භාවෙත්වා ඵලං සච්ඡිකත්වා නිරොධසයනවරගතං නිබ්බානාරම්මණං ඵලසමාපත්තිං අප්පෙත්වා එකන්තසුඛා වෙදනා වෙදියමානං පස්සති.

අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත චතුරඞ්ගසමන්නාගතන්ති ඉදං කස්මා ආරද්ධං? පාටියෙක්කං අනුසන්ධිවසෙන ආරද්ධං. අයං කිර සුනක්ඛත්තො දුක්කරකාරිකාය සුද්ධි හොතීති එවං ලද්ධිකො. අථස්ස භගවා මයා ච[8] එකස්මිං අත්තභාවෙ ඨත්වා චතුරඞ්ගසමන්නාගතං දුක්කරං කතං, දුක්කරකාරකො නාම මයා සදිසො නත්ථි, දුක්කරකාරෙන සුද්ධියා සති අහමෙව සුද්ධො භවෙය්‍යන්ති දස්සෙතුං ඉමං දෙසනං ආරභි.

---

1. යථා-B. යෙන-E
2. පිපාසාභිභූතාය පන එකන්තමෙව සුඛං-S.
3. භිසමූලාල-S. භිසමූල-B.
4. මට්ටදුකූලං-B. S.
5. ච-B. S.
6. දිබ්බචක්ඛු-B, S
7. තාය-B, S.
8. මයා-E. S.

අපි ච අයං සුනක්ඛත්තො දුක්කරකාරිකාය පසන්නො, යථා චස්ස පසන්නභාවො “අද්දසා ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො අචෙලං කොරක්ඛත්තියං චතුකුණ්ඩිකං ඡමානිකිණ්ණං භක්ඛසං[1] මුඛෙනෙව ඛාදන්තං, මුඛෙන භුඤ්ජන්තං. දිස්වානස්ස එතදහොසි: සාධුරූපො වත භො අරහං[2] සමණො චතුකුණ්ඩිකො ඡමානිකිණ්ණං භක්ඛසං[1] මුඛෙනෙව ඛාදති, මුඛෙන භුඤ්ජතී”ති එවමාදිනා පාථිකසුත්තෙ ආගතනයෙන[3] වෙදිතබ්බො. අථ භගවා අයං දුක්කරකාරිකාය පසන්නො, මයා ච එකස්මිං අත්තභාවෙ ඨත්වා චතුරඞ්ගසමන්නාගතං දුක්කරං කතං, දුක්කරකාරකෙ පසීදන්තෙනාපි අනෙන මයි පසීදිතබ්බං සියා, සොපස්ස[4] පසාදො මයි නත්ථීති දස්සෙන්තොපි ඉමං[5] දෙසනං ආරභි.

තත්ථ බ්‍රහ්මචරියන්ති දානම්පි, වෙය්‍යාවච්චම්පි, සික්ඛාපදම්පි, බ්‍රහ්මවිහාරාපි,[6] ධම්මදෙසනාපි, මෙථුනවිරතිපි, සදාරසන්තොසොපි, උපොසථොපි,[7] අරියමග්ගොපි, සකලසාසනම්පි, අජ්ඣාසයොපි, විරියම්පි වුච්චති.[8]

“කිත්තෙ වතං කිං පන බ්‍රහ්මචරියං කිස්ස සුචිණ්ණස්ස
අයං විපාකො,
ඉද්ධී ජුතී බලවිරියූපපත්ති අක්ඛාහි මෙ නාග මහාවිමානං.
අහඤ්ච භරියා ච මනුස්සලොකෙ සද්ධා උභො දානපතී අහුම්හා,
ඔපානභූතං මෙ ඝරං තදාසි සන්තප්පිතා සමණබ්‍රාහ්මණා ච.
තම්මෙ වතං තං පන බ්‍රහ්මචරියං තස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
ඉද්ධී ජුතී බලවිරියූපපත්ති ඉදඤ්ච මෙ ධීර මහාවිමානං”ති

ඉමස්මිං හි පුණ්ණකජාතකෙ දානං බ්‍රහ්මචරියන්ති වුත්තං.

“කෙන පාණි කාමදදො කෙන පාණි මධුස්සවො,
කෙන තෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති.

තෙන පාණි කාමදදො තෙන පාණි මධුස්සවො,
තෙන මෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣතී”ති

ඉමස්මිං අඞ්කුරපෙතවත්ථුම්හි වෙය්‍යාවච්චං බ්‍රහ්මචරියන්ති වුත්තං.

“ඉදං ඛො තං” භික්ඛවෙ තිත්තිරියං නාම බ්‍රහ්මචරියං අහොසී”ති ඉමස්මිං තිත්තිරජාතකෙ පඤ්චසික්ඛාපදං බ්‍රහ්මචරියන්ති වුත්තං. “තං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචරියං නෙව නිබ්බිදාය න විරාගාය යාවදෙව බ්‍රහ්මලොකූපපත්තියා”ති ඉමස්මිං මහාගොවින්දසුත්තෙ බ්‍රහ්මවිහාරා

1. භක්ඛං සං-S.
2. අසං-B. S.
3. නයෙනෙව-L., E.
4. සොපිස්ස-E.
5. දස්සෙන්තො ඉදං-B. S.
6. බ්‍රහ්මවිහාරම්පි-L.
7. විරියම්පි උපොසථොපි-S.
8. අජ්ඣාසයොපි වුච්චති-S.
9. ඉදං ඛො-S.

බ්‍රහ්මචරියන්ති වුත්තා. "එකස්මිං[1] බ්‍රහ්මචරියස්මිං සහස්සං මච්චුහායිනො"ති එත්ථ ධම්මදෙසනා බ්‍රහ්මචරියන්ති වුත්තා. "පරෙ[2] අබ්‍රහ්මචාරී භවිස්සන්ති, මයමෙත්ථ බ්‍රහ්මචාරිනො[3] භවිස්සාමා"ති සල්ලෙඛසුත්තෙ මෙථුනවිරති බ්‍රහ්මචරියන්ති වුත්තා.

"මයඤ්ච භරියා නාතික්කමාම
අම්හෙ ච භරියා නාතික්කමන්ති;
අඤ්ඤත්‍ර තාහි බ්‍රහ්මචරියං චරාම
තස්මාති[4] අම්හං දහරා න මීයරෙ"ති

මහාධම්මපාලජාතකෙ සදාරසන්තොසො බ්‍රහ්මචරියන්ති වුත්තො.

"හීනෙන බ්‍රහ්මචරියෙන ඛත්තියෙ උපපජ්ජති,
මජ්ඣිමෙන ච දෙවත්තං[5] උත්තමෙන විසුජ්ඣතී"ති

එවං නිමිජාතකෙ අත්තදමනවසෙන කතො අට්ඨඞ්ගිකො උපොසථො බ්‍රහ්මචරියන්ති වුත්තො.

"ඉදං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචරියං එකන්තනිබ්බිදාය විරාගාය -පෙ- අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො"ති මහාගොවින්දසුත්තස්මිංයෙව අරියමග්ගො බ්‍රහ්මචරියන්ති වුත්තො. "තයිදං[6] බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං, යාවදෙව මනුස්සෙහි[7] සුප්පකාසිත"න්ති පාසාදිකසුත්තෙ සික්ඛාත්තයසඞ්ගහං සකලසාසනං බ්‍රහ්මචරියන්ති වුත්තං.

"අපි අතරමානානං ඵලාසාව සමිජ්ඣති,
විපක්කබ්‍රහ්මචරියොස්මි එවං ජානාහි ගාමණී"ති

එත්ථ අජ්ඣාසයො බ්‍රහ්මචරියන්ති වුත්තො.

ඉධ පන විරියං බ්‍රහ්මචරියන්ති අධිප්පෙතං. විරියබ්‍රහ්මචරියස්ස හි ඉදමෙව සුත්තං. තදෙතං එකස්මිං අත්තභාවෙ චතුබ්බිධස්ස දුක්කරස්ස කතත්තා චතුරඞ්ගසමන්නාගතන්ති වුත්තං.

තපස්සී සුදං හොමීති, සුදන්ති නිපාතමත්තං. තපනිස්සිතකො හොමීති අත්ථො. පරමතපස්සීති පරමො තපස්සී, තපනිස්සිතකානං උත්තමො. ලූඛස්සුදං[8] හොමීති ලූඛො හොමි. ජෙගුච්ඡීති පාපජෙගුච්ඡකො. පවිවිත්තස්සුදං[9] හොමීති පවිවිත්තො අහං හොමි.

තත්‍රාස්සු මෙ ඉදං සාරිපුත්තාති තත්‍ර චතුරඞ්ගබ්‍රහ්මචරියෙ ඉදං මම තපස්සිතාය හොති. තපනිස්සිතකභාවෙ මය්හං ඉදං අචෙලකාදිතපනිස්සිතකත්තං හොතීති දස්සෙති. තත්ථ අචෙලකොති

1. එකස්මිං-E.
2. අපරෙ-B. S.
3. බ්‍රහ්මචාරී-L.
4. තස්මා හි-L. B.
5. දෙවෙසු-B. S.
6. තං ඉදං-L.
7. දෙවමනුස්සෙහි-B. L.
8. ලූඛො සුදං-B. S.
9. පවිවිත්තො සුදං-B. S.

නිච්චෙලො[1] නග්ගො. **මුත්තාචාරොති** විස්සට්ඨාචාරො; උච්චාරකම්මාදීසු ලොකියකුලපුත්තාචාරෙන විරහිතො; ඨිතකොව උච්චාරං කරෙමි, පස්සාවං කරෙමි, ඛාදාමි, භුඤ්ජාමි. **හත්ථාපලෙඛනොති** හත්ථෙ පිණ්ඩම්හි නිට්ඨිතෙ[2] ජිව්හාය හත්ථං අපලිඛාමි; උච්චාරං වා කත්වා හත්ථස්මිංයෙව දණ්ඩකසඤ්ඤී හුත්වා හත්ථෙන අපලිඛාමීති දස්සෙති. තෙ කිර දණ්ඩකං සත්තොති පඤ්ඤපෙන්ති; තස්මා තෙසං පටිපදං පූරෙන්තො එවමකාසි. භික්ඛාගහණත්ථං එහි භද්දන්තෙති වුත්තො න එතීති **න එහිභද්දන්තිකො**. තෙන හි තිට්ඨ භද්දන්තෙති වුත්තොපි න තිට්ඨතීති **න තිට්ඨභද්දන්තිකො**. තදුභයම්පි **කිරෙසො** එතස්ස වචනං කතං භවිස්සතීති න කරොන්ති; අයම්පි එවං අකාසීති දස්සෙති. **අභිහටන්ති** පුරෙතරං ගහෙත්වා ආහටභික්ඛං. **උද්දිස්සකතන්ති**[3] ඉමං තුම්හෙ උද්දිස්ස කතන්ති එවං ආරොචිතභික්ඛං. **න නිමන්තනන්ති** අසුකං නාම කුලං වා වීථිං වා ගාමං වා පවිසෙය්‍යාථාති එවං නිමන්තිතභික්ඛම්පි න සාදියාමි, න ගණ්හාමි.

**න කුම්භිමුඛාති** කුම්භීතො උද්ධරිත්වා දීයමානං භික්ඛං න ගණ්හාමි. **න කළොපිමුඛාති** කළොපීති උක්ඛලි, පච්ඡි වා. තතොපි න ගණ්හාමි. කස්මා? කුම්භිකළොපියො මං නිස්සාය කටච්ඡුනා පහාරං ලභන්තීති. **න එළකමන්තරන්ති** උම්මාරං අන්තරං කත්වා දීයමානං න ගණ්හාමි කස්මා? අයං මං නිස්සාය අන්තරකරණං ලභතීති. දණ්ඩමුසලෙසුපි එසෙව නයො. **න ද්වින්නන්ති** ද්වීසු භුඤ්ජමානෙසු එකස්මිං උට්ඨාය දෙන්තෙ න ගණ්හාමි. කස්මා? කබළන්තරායො හොතීති. **න ගබ්භිනියාති** ආදීසු පන ගබ්භිනියා කුච්ඡියං දාරකො කිලමති; **පායන්තියා** දාරකස්ස ඛීරන්තරායො හොති; **පුරිසන්තරගතාය** රතිඅන්තරායො හොතීති න ගණ්හාමි. **න සංකිත්තීසූති** සංකිත්තෙත්වා කතභත්තෙසු, දුබ්භික්ඛසමයෙ කිර අචෙලකසාවකා අචෙලකානං අත්ථාය තතො තතො තණ්ඩුලාදීනි සමාදපෙත්වා භත්තං පචන්ති; උක්කට්ඨාචෙලකො තතො න පටිගණ්හාති.

**න යත්ථ සාති** යත්ථ සුනඛො පිණ්ඩං ලභිස්සාමීති උපට්ඨිතො හොති, තත්ථ තස්ස අදත්වා ආහටං න ගණ්හාමි. කස්මා? එතස්ස පිණ්ඩන්තරායො හොතීති. **සණ්ඩසණ්ඩචාරිනීති** සමූහසමූහචාරිනී. සචෙ හි අචෙලකං දිස්වා ඉමස්ස භික්ඛං දස්සාමාති මනුස්සා භත්තගෙහං පවිසන්ති, තෙසු ච පවිසන්තෙසු කළොපිමුඛාදීසු නිලීනා මක්ඛිකා උට්ඨාය උප්පතිත්වා[4] සණ්ඩසණ්ඩා චරන්ති,[5] තතො ආහටං භික්ඛං න ගණ්හාමි. කස්මා? මං නිස්සාය මක්ඛිකානං ගොචරන්තරායො ජාතොති. අහම්පි තථා අකාසිං. **ථුසොදකන්ති** සබ්බසස්ස සම්භාරෙහි කතං සුවීරකං.[6] එත්ථ ච සුරාපානමෙව සාවජ්ජං; අයං පන සබ්බෙසු[7] සාවජ්ජසඤ්ඤී.

---

1. නිච්චොළො-B.
2. ඨිතෙ-B.
3. උද්දිස්ස කතන්ති-B. S.
4. මක්ඛිකා උප්පතිත්වා-B. S.
5. විචරන්ති-S.
6. ලොණසොවීරකං-B. S.
7. අයං පන-L. S. සබ්බසපි-B.

**එකාගාරිකොති** යො එකස්මිං යෙව ගෙහෙ භික්ඛං ලභිත්වා නිවත්තති. **එකාලොපිකොති** යො එකෙනෙව ආලොපෙන යාපෙති. **ද්වාගාරිකාදීසුපි** එසෙව නයො. **එකිස්සාපි දත්තියාති** එකාය දත්තියා; දත්ති නාම එකා ඛුද්දකපාති හොති, යත්ථ **අග්ගභික්ඛං** පක්ඛිපිත්වා ඨපෙන්ති. **එකාහිකන්ති** එකදිවසන්තරිකං. **අඩ්ඪමාසිකන්ති** අඩ්ඪමාසන්තරිකං. **පරියායභත්තභොජනන්ති** වාරභත්තභොජනං; එකාහවාරෙන ද්වීහවාරෙන සත්තාහවාරෙන අඩ්ඪමාසවාරෙනාති එවං දිවසවාරෙන ආගතං[1] භත්තභොජනං.

**සාකභක්ඛොති** අල්ලසාකභක්ඛො. **සාමාකභක්ඛොති** සාමාකතණ්ඩුලභක්ඛො. **නීවාරාදීසු නීවාරා** නාම තාව අරඤ්ඤෙ සයඤ්ජාතා වීහිජාති. **දද්දුලන්ති** චම්මකාරෙහි චම්මං ලිඛිත්වා ඡඩ්ඩිතකසටං. **හටං** වුච්චති සිලෙසොපි, සෙවාලොපි, කණිකාරාදි[2]රුක්ඛනිය්‍යාසොපි. **කණන්ති** කුණ්ඩකං. **ආචාමොති** භත්තඋක්ඛලිකාය **ලග්ගො ඣාම** ඔදනො. තං ඡඩ්ඩිතට්ඨානෙ[3] ගහෙත්වා ඛාදති. **ඔදනකඤ්ජියන්තිපි** වදන්ති. පිඤ්ඤාකාදයො පාකටාව. **පවත්තඵලභොජීති** පතිතඵලභොජී.

**සාණානීති** සාණවාකානි;[4] **මසාණානීති** මිස්සකචොළානි. **ඡවදුස්සානීති** මතසරීරතො ඡඩ්ඩිතවත්ථානි; එරකතිණාදීනි වා ගන්ථෙත්වා කතනිවාසනානි. **පංසුකූලානීති** පඨවියං ඡඩ්ඩිතනන්තකානි. **තිරීටානීති** රුක්ඛතචවත්ථානි. **අජිනන්ති** අජිනමිගචම්මං. **අජිනක්ඛිපන්ති** තදෙව මජ්ඣෙ ඵාලිතං; සඛුරකන්තිපි[5] වදන්ති. **කුසචීරන්ති** කුසතිණානි[6] ගන්ථෙත්වා කතචීරකං. වාකචීරඵලකචීරෙසුපි එසෙව නයො. **කෙසකම්බලන්ති** මනුස්සකෙසෙහි කතකම්බලං; යං **සන්ධාය** වුත්තං: "යානි කානිචි භික්ඛවෙ තන්තාවුතානි වත්ථානි, **කෙසකම්බලං**[7] **තෙසං** පතිකිට්ඨං;[8] සීතකාලෙ **සීතං**, උණ්හකාලෙ **උණ්හං, අප්පග්ඝො** ච **දුක්ඛසම්ඵස්සො** ච **දුග්ගන්ධො ච වායතී**"ති. **වාලකම්බලන්ති** අස්සවාලාදීහි කතකම්බලං. **උලූකපක්ඛන්ති** උලූකපක්ඛානි[9] ගන්ථෙත්වා කත**නිවාසනං**.

**උබ්භට්ඨකොති** උද්ධං **ඨිතකො**. **උක්කුටිකප්පධානමනුයුත්තොති** උක්කුටිකවීරියං අනුයුත්තො; **ගච්ඡන්තොපි** උක්කුටිකොව හුත්වා උප්පතිත්වා උප්පතිත්වා ගච්ඡති. **කණ්ටකාපස්සයිකොති** අයකණ්ටකෙ වා පකතිකණ්ටකෙ වා භූමියං කොට්ටෙත්වා තත්ථ චම්මං අත්ථරිත්වා ඨානචඞ්කමාදීනි **කරොමීති** දස්සෙති. **සෙය්‍යන්ති** සයන්තොපි තත්ථෙව සෙය්‍යං කප්පෙමි. **සායං තතියමස්සාති සායතතියකං**. පාතො මජ්ඣන්හිකෙ සායන්ති දිව**සස්ස තික්ඛත්තුං** පාපං පවාහෙස්සාමීති **උදකොරොහනානුයොගං අනුයුත්තො** විහරතීති දස්සෙති.

---

1. ආභතං-B
2. කණ්ණිකා-B. S
3. ඡඩ්ඩිතට්ඨානෙසු-I
4. සාණවාකචොළානි-B, S.
5. සඛුරකන්තිපි-I
6. කුසතිණං-B, S
7. කෙසකම්බලො-B, S.
8. පතිකුට්ඨො-B, S.
9. පක්ඛානි-B, S.

**නෙකවස්සගණිකන්ති** නෙකවස්සගණසඤ්ජාතං; **රජොජල්ලන්ති** රජමලං; ඉදං අත්තනො රජොජල්ලවතසමාදානකාලං සන්ධාය වදති. **ජෙගුච්ඡිස්මින්ති** පාපජිගුච්ඡන[1]භාවෙ. **යාව උදකබින්දුම්හිපීති** යාව උදකථෙවකෙපි[2] මම දයා පච්චුපට්ඨිතා හොති; කො පන වාදො අඤ්ඤෙසු සක්ඛරකඨලදණ්ඩකවාලිකාදීසු?. සො කිර උදකබින්දූ ච[3] එතෙ ච සක්ඛරකඨලාදයො ඛුද්දකපාණාති පඤ්ඤපෙතාති[4]. තෙනාහ: **යාව උදකබින්දුම්හිපි මෙ දයා පච්චුපට්ඨිතා හොති,** උදකබින්දුම්පි න හනාමි, න විනාසෙමි. කිං කාරණා? **මාහං ඛුද්දකෙ පාණෙ විසමගතෙ සඞ්ඝාතං ආපාදෙසින්ති** නින්නථලතිණග්ගරුක්ඛසාඛාදීසු විසමට්ඨානෙසු ගතෙ උදකබින්දුසඞ්ඛාතෙ ඛුද්දකෙ පාණෙ සඞ්ඝාතං වධං මා ආපාදෙසින්ති[5] එතදත්ථං සතොව අභික්කමාමීති දස්සෙති. අචෙලකෙසු කිර භූමිං අක්කන්තකාලතො පට්ඨාය සීලවා නාම නත්ථි, භික්ඛාචාරං ගච්ඡන්තාපි දුස්සීලාව හුත්වා ගච්ඡන්ති; උපට්ඨාකානං ගෙහෙ භුඤ්ජන්තාපි දුස්සීලාව හුත්වා භුඤ්ජන්ති; ආගච්ඡන්තාපි දුස්සීලාව හුත්වා ආගච්ඡන්ති. යදා පන මොරපිඤ්ඡෙන ඵලකං සම්මජ්ජිත්වා සීලං අධිට්ඨාය නිසීදන්ති, තදා සීලවන්තා නාම හොන්ති.

**වනකම්මිකොති** කන්දමූලාදීනං[6] අත්ථාය වනෙ විචරන්තො. **වනෙනවනන්ති** වනතො වනං. එස නයො සබ්බත්ථ. **පපතාමීති** ගච්ඡාමි. **ආරඤ්ඤකොති** අරඤ්ඤෙ ජාතවඩ්ඪො. ඉදං අත්තනො ආජීවකකාලං සන්ධාය වදති. බොධිසත්තො කිර පාසණ්ඩපරිග්ගණ්හනත්ථාය තං පබ්බජ්ජං පබ්බජි; නිරත්ථකභාවං පන ඤත්වාපි න උප්පබ්බජිතො. බොධිසත්තා හි යං යං ඨානං උපෙන්ති, තතො අනිවත්තිධම්මා හොන්ති. පබ්බජිත්වා පන මා මං කොචි අද්දසාති තතොව අරඤ්ඤං පවිට්ඨො. තෙනෙවාහ: **මා මං තෙ අද්දසංසු අහඤ්ච මා තෙ අද්දසන්ති.**

**ගොට්ඨාති** ගොවජා. **පට්ඨිතගාවොති** නික්ඛන්තගාවො. **තත්ථ චතුකුණ්ඩිකොති**[7] වනතෙනයෙව ඨිතො ගොපාලකානං ගාවීහි සද්ධිං අපගතභාවං දිස්වා ද්වෙ හත්ථෙ ද්වෙ ච ජණ්ණුකානි භූමියං ඨපෙත්වා එවං චතුකුණ්ඩිකො උපසඞ්කමිත්වාති අත්ථො. **තානි සුදං ආහාරෙමීති** මහල්ලකවච්ඡානං[8] ගොමයානි කසටානි නිරොජානි හොන්ති; තස්මා තානි වජ්ජෙත්වා යානි තරුණකානං ඛීරපායකානංව වඩ්ඪන්තානං සඤ්ජාති ගොමයානි කුච්ඡිපූරං ඛාදිත්වා පුන වනසණ්ඩමෙව පවිසති. තං සන්ධායාහ: **තානි සුදං ආහාරෙමීති. යාවකීවඤ්ච මෙති** යත්තකං කාලං මම සකං මුත්තකරීසං අපරික්ඛීණං හොති, යාව මෙ ආරම්මලසඤ්ඤා පවත්තතිච, තාව තදෙව[9] ආහාරෙමීති අත්ථො. සාලෙ

---

1. ජිගුච්ඡන-E. S.
2. උදකසෙට්ඨෙව උදකෙසපි-A. M2. උදකසෙත්ථෙවපි-S.
3. නිබුඤ්ඤච-A. M2. P2. R. S
4. පඤ්ඤපෙතානීති-F.
5. ආපාදියාසි-A. M2. P2 R
6. කන්දමූලඵලාදීනං-B. S.
7. චතුගුණ්ඩිකො-T. V
8. වච්ඡකානං-B. S.
9. තාවංදෙව-I.

පන ගච්ඡන්තෙ ගච්ඡන්තෙ පරික්ඛීණමංසලොහිතො උපච්ඡින්නාහාර වලඤ්ජා වච්ඡකානං[1] ගොමයානි ආහාරෙසිං. **මහාවිකටභොජනස්මින්ති** මහන්තෙ විකටභොජනෙ, අපකතිභොජනෙති අත්ථො.

**තත්‍ර සුදං සාරිපුත්ත හිංසනකස්ස වනසණ්ඩස්ස හිංසනකතස්මිං හොතීති, තත්‍රාති** පුරිමවචනාපෙක්ඛනං; **සුදන්ති** පදපූරණමත්තෙ නිපාතො; **සාරිපුත්තාති** ආලපනං. අයං පනෙත්ථ අත්ථයොජනා: **තත්‍රාති** යං වුත්තං අඤ්ඤතරස්මිං හිංසනකෙ වනසණ්ඩෙති තත්‍ර. යො සො හිංසනකො වනසණ්ඩො වුත්තො, තස්ස **හිංසනකස්ස වනසණ්ඩස්ස, හිංසනකතස්මිං හොති**; හිංසනකකිරියාය[2] හොතීති අත්ථො. කිං හොති? ඉදං හොති: **යො කොචි අවීතරාගො තස්ස[3] ලොමානි හංසන්තීති.** අථ වා **තත්‍රාති** සාමිඅත්ථෙ භුම්මං. **සු** ඉති නිපාතො. "කිංසු නාම තෙ භොන්තො සමණබ්‍රාහ්මණා"ති ආදීසු විය. **ඉදන්ති** අධිප්පෙතමත්ථං පච්චක්ඛං විය කත්වා දස්සනවචනං. සු ඉදන්ති **සුදං.** සන්ධිවසෙන ඉකාරලොපො වෙදිතබ්බො. "චක්ඛුන්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං" "කිංසූධ විත්තන්"ති ආදීසු විය.

අයං පනෙත්ථ අත්ථයොජනා: තස්ස සාරිපුත්ත හිංසනකස්ස වනසණ්ඩස්ස හිංසනකතස්මිං ඉදං සු හොති. **හිංසනකතස්මින්ති** හිංසනකභාවෙති අත්ථො. එකස්ස තකාරස්ස ලොපො දට්ඨබ්බො. හිංසනකතායංයෙව වා පාඨො. හිංසනකතාය ඉති වා[4] වත්තබ්බෙ ලිඞ්ගවිපල්ලාසො කතො. නිමිත්තත්ථෙ චෙත්ථ භුම්මවචනං. තස්මා එවං සම්බන්ධො වෙදිතබ්බො: හිංසනකභාවෙ ඉදං සු හොති, හිංසනකභාවනිමිත්තං, හිංසනකභාවහෙතු, හිංසනකභාවපච්චයා ඉදං සු හොති. **යො කොචි අවීතරාගො තං වනසණ්ඩං පවිසති, යෙභුය්‍යෙන ලොමානි හංසන්තීති** බහුතරානි ලොමානි හංසන්ති, උද්ධග්ගානි, සූචිසදිසානි, කණ්ටකසදිසානි ච හුත්වා තිට්ඨන්ති; අප්පානි න හංසන්ති. බහුතරානං වා සත්තානං හංසන්ති, අප්පකානං අතිසූරපුරිසානං න හංසන්ති.

**අන්තරට්ඨකාති** මාඝමාසස්ස අවසානෙ චතස්සො, ඵග්ගුනමාසස්ස ආදිම්හි චතස්සොති එවං උභින්නමන්තරෙ අට්ඨරත්ති. **අබ්භොකාසෙති** මහාසත්තො හිමපාතසමයෙ රත්තිං අබ්භොකාසෙ විහරති. අථස්ස ලොමකූපෙසු ආවුතා මුත්තා විය හිමබින්දූනි තිට්ඨන්ති, සරීරං[5] සෙතදුකූලපාරුතං විය හොති. **දිවා වනසණ්ඩෙති** දිවා හිමබින්දූසු සූරියාතපසම්ඵස්සෙන විගතෙසු අස්සාසොපි භවෙය්‍ය; අයං පන සූරියෙ උග්ගච්ඡන්තෙයෙව වනසණ්ඩං පවිසති. තත්‍රාපිස්ස සූරියාතපෙන පග්ඝරන්තං[6] හිමං සරීරෙයෙව පතති. **දිවා අබ්භොකාසෙ විහරාමි, රත්තිං වනසණ්ඩෙති** ගිම්හකාලෙ කිරෙස දිවා අබ්භොකාසෙ වියාසි;[7]

1. වච්ඡකානං-L.
2. හිංසනකිරියාය-E. S.
3. අවිතරාගො-L. අවීතරාගො-පෙ-B. S.
4. ඉති-L.
5. සකලසරීරං-S.
6. පඝරිතං-L.
7. විහරති-L.

තෙනස්ස කායෙපි සෙදධාරා මුච්චිංසු, රත්තිං අස්සාසො භවෙය්‍ය; අයං පන සුරියෙ අත්ථං ගච්ඡන්තෙයෙව වනසණ්ඩං පවිසති. අථස්ස දිවා ගහිතඋස්මෙ වනසණ්ඩෙ අඞ්ගාරකාසුයං පක්ඛිත්තො විය අත්තභාවො පරිඩය්හිත්ථ.

**අනාවජ්ජිසාති** අනුආවජ්ජිසා; **පටිභාසීති** උපට්ඨහි.[1] **සො තත්තොති** දිවා ආතපෙන, රත්තිං වනඋස්මාය සුතත්තො. **සො සිනොති**[2] රත්තිං හිමෙන දිවා හිමොදකෙන සුතින්තො.[3] **භිංසනකෙති** භයජනකෙ. **නග්ගොති** නිච්චෙලො; නිවාසනපාරුපනෙ හි සති සීතං වා උණ්හං වා න අතිබාධෙය්‍ය; තම්පි මෙ නත්ථීති දස්සෙති. **න චග්ගිමාසිනොති** අග්ගිම්පි න උපගතො. **එසනාපසුතොති** සුද්ධිඑසනත්ථාය පසුතො, පයුත්තො. **මුනීති** තදා අත්තානං මුනීති කත්වා කථෙති.

**ඡවට්ඨිකානීති** උපඩ්ඪදඩ්ඪානි අට්ඨීනි; **උපධායාති**[4] යථා සීසූපධානකඤ්ච පාදූපධානකඤ්ච පඤ්ඤායති, එවං සන්ථරිත්වා තත්ථ සෙය්‍යං කප්පෙමීති දස්සෙති. **ගාමමණ්ඩලාති** ගොපාලදාරකා; තෙ කිර බොධිසත්තස්ස සන්තිකං ගන්ත්වා සුමෙධ ත්වං ඉමස්මිං ඨානෙ කස්මා නිසින්නො කථෙහීති වදන්ති. බොධිසත්තො අධොමුඛො නිසීදති, න කථෙති. අථ නං තෙ, අකථෙතුං න දස්සාමාති පරිවාරෙත්වා ඔට්ඨුභන්ති[5] සරීරෙ ඛෙළං පාතෙන්ති. බොධිසත්තො එවම්පි න කථෙති. අථ නං, ත්වං න කථෙසීති ඔමුත්තෙන්ති, පස්සාවමස්ස උපරි විස්සජ්ජෙන්ති. බොධිසත්තො එවම්පි න කථෙතියෙව. තතො නං කථෙහි කථෙහීති පංසුකෙන ඔකිරන්ති. බොධිසත්තො එවම්පි න කථෙතියෙව. අථස්ස, න කථෙසීති දණ්ඩකසලාකා ගහෙත්වා කණ්ණසොතෙසු පවෙසෙන්ති. බොධිසත්තො දුක්ඛා තිප්පා කටුකා වෙදනා අධිවාසෙන්තො කස්සචි කිඤ්චි න කථෙස්සාමීති මතකො විය අච්ඡති. තෙනාහ: **න ඛො පනාහං සාරිපුත්ත අභිජානාමි තෙසු පාපකං චිත්තං උප්පාදෙතාති** න මයා තෙසු පාපකං චිත්තං[6] උප්පාදිතන්ති අත්ථො.

**උපෙක්ඛාවිහාරස්මිං හොතීති** උපෙක්ඛාවිහාරෙ හොති. විහාරෙයෙව හි විහාරස්මින්ති වුත්තං. තෙනෙව ච ඉධ ඉදං සු මෙති එත්ථාපි අයං සු මෙති එවං අත්ථො වෙදිතබ්බො. ඉමිනා නයෙන අඤ්ඤානිපි එවරූපානි පදානි වෙදිතබ්බානි. ඉමිනා ඉතො එකනවුතෙ කප්පෙ පූරිතං උපෙක්ඛාවිහාරං දස්සෙති, යං සන්ධායාහ:

"සුඛෙ පත්තෙ න රජ්ජාමි දුක්ඛෙ හොමි න දුම්මනො,
සබ්බත්ථ තුලිතො හොමි එසා මෙ උපෙක්ඛාපාරමී"ති.

**ආහාරෙන සුද්ධීති** කොලාදිනා එකච්චෙන පරිත්තකආහාරෙන සත්තා සුජ්ඣන්තීති එවං දිට්ඨිනො හොන්ති. **එවමාහංසූති** එවං වදන්ති. **කොලෙහීති** බදරෙහි. **කොලොදකන්ති** කොලානි මද්දිත්වා

1. උපට්ඨාසි-B. S.
2. සොසීනොති-E S.
3. සුවසු තිනෙතො-B. S.
4. උපනිධායාති-B. S.
5. ඔට්ඨුභෙන්ති-B. S.
6. චිත්තම්පි-B. S.

සාතපානකං. කොලවිකතින්ති කොලසාළවකොලපූව[1]කොලගුළාදි කොලවිකාරං. එතපරමොති එතං පමාණං පරමං[2] අස්සාති එතපරමො. තදා එකනවුතිකප්පමත්ථකෙ පි[3] ත බෙලුවපක්කප්පමාණො කොලො හොති; යං එතරහි කොලස්ස පමාණං, එත්තකොව හොතීති අපරෙ.

අධිමත්තකසිමානන්ති අතිවිය කිසභාවං. ආසීතික[4]පබ්බානි වා කාළපබ්බානි වාති යථා ආසීතිකවල්ලියා වා කාළවල්ලියා වා සන්ධිට්ඨානෙසු මිලායිත්වා මජ්ඣෙ උන්නතුන්නතානි හොන්ති, එවං මය්හං අඞ්ගපච්චඞ්ගානි හොන්තීති දස්සෙති. ඔට්ඨපදන්ති යථා ඔට්ඨස්ස පදං මජ්ඣෙ ගම්භීරං හොති, එවමෙව බොධිසත්තස්ස මිලාතෙ මංසලොහිතෙ වච්චද්වාරස්ස අන්තො පවිට්ඨත්තා ආනිසදං මජ්ඣෙ ගම්භීරං හොති; අථස්ස භූමියං නිසින්නට්ඨානං සරභපාදෙන අක්කන්තං විය මජ්ඣෙ උන්නතං හොති. වට්ටනාවළීති යථා රජ්ජුයා[5] ආවුණිත්වා කතා වට්ටනාවළී වට්ටනානං අන්තරන්තරා නින්නා හොති, වට්ටනට්ඨානෙසු උන්නතා, එවං පිට්ඨිකණ්ටකො උන්නතාවනතො හොති. ජරසාලාය ගොපානසියොති ජිණ්ණසාලාය ගොපානසියො; තා වංසතො මුච්චිත්වා මණ්ඩලෙ පතිට්ඨන්ති, මණ්ඩලතො මුච්චිත්වා භූමියං තිට්ඨන්ති, එවං[6] එකා උපරි හොති, එකා හෙට්ඨාති ඔළුග්ගවිළුග්ගා[7] භවන්ති. බොධිසත්තස්ස ත[8] එවං ඵාසුළියො; තස්ස හි ලොහිතෙ ජිණ්ණෙ, මංසෙ මිලාතෙ ඵාසුළන්තරෙහි චම්මානි හෙට්ඨා ඔතිණ්ණානි. තං සන්ධායෙතං වුත්තං. ඔක්ඛායිකාති හෙට්ඨා අනුපවිට්ඨා; තස්ස කිර ලොහිතෙ ජිණ්ණෙ, මංසෙ මිලාතෙ අක්ඛිආවාටකා මත්ථලුඞ්ගං ආහච්ච අට්ඨංසු. තෙනස්ස එවරූපා අක්ඛිතාරකා අහෙසුං. ආමකච්ඡින්නොති අතිතරුණකාලෙ ඡින්නො; සො හි වාතාතපෙන සම්ඵුසති[9] චෙව මිලායති ච.

යාවස්සු මෙ සාරිපුත්තාති සාරිපුත්ත මය්හං උදරච්ඡවි යාව පිට්ඨිකණ්ටකං අල්ලීනා හොති; අථවා, යාවස්සු මෙ සාරිපුත්ත භාරියං අහොසි දුක්කරකාරිකා, මය්හං උදරච්ඡවි[10] පිට්ඨිකණ්ටකං අල්ලීනා අහොසීති එවමෙත්ථ සම්බන්ධො වෙදිතබ්බො. පිට්ඨිකණ්ටකංයෙව පරිමසාමීති සහඋදරච්ඡවිං ගණ්හාමි. උදරච්ඡවිංයෙව පරිමසාමීති සහපිට්ඨිකණ්ටකං ගණ්හාමි. අවකුජ්ජො පපතාමීති තස්ස හි උච්චාරපස්සාවත්ථාය නිසින්නස්ස පස්සාවො නෙව නික්ඛමති; වච්චං පන එකදෙව කතකට්ඨිමත්තං නික්ඛමති,[11] බලවදුක්ඛං උප්පාදෙති, සරීරතො සෙදා මුච්චන්ති; තත්ථෙව අවකුජ්ජො භූමියං පතති. තෙනාහ: අවකුජ්ජො පපතාමීති. තමෙව කායන්ති තං[12] එකනවුතිකප්පමත්ථකෙ කායං. මහාසච්චකසුත්තෙ පන පච්ඡිමභවිකකායං

1. කොලසාළව-L.
2. පරං-L S.
3. පි පන-B. S.
4. අසිත්කා-B. S.
5. සට්ඨි රජ්ජුයා-S.
6. භූමියන්ති එවං-B. S.
7. ඔලග්ගවිලග්ගා-S
8. පන ත-B S
9. සංඵුසති-B S.
10. උදරච්ඡවි යාව-B.S.
11. කතකට්ඨිමත්තං-B. S.
12. කායන්ති-B, S.

සඞ්ඛාය, "ඉමමෙව කාය"න්ති ආහ. පූතිමූලානීති මංසෙ වා ලොහිතෙ වා සති තිට්ඨන්ති; තස්ස පන අභාවෙ චම්මබද්ධෙ ලොමානි විය හත්ථෙයෙව ලග්ගන්ති. තං සන්ධායාහ: පූතිමූලානි ලොමානි කායස්මා පපතන්තීති.

අලමරියඤාණදස්සනවිසෙසන්ති අරියභාවං කාතුං සමත්ථං ලොකුත්තරමග්ගං.[1] ඉමිස්සායෙව අරියාය පඤ්ඤායාති විපස්සනා පඤ්ඤාය අනධිගමා. යායං අරියාති යා අයං මග්ගපඤ්ඤා අධිගතා. ඉදං වුත්තං හොති: යථා එතරහි විපස්සනාපඤ්ඤාය අධිගතත්තා මග්ගපඤ්ඤා අධිගතා, එවං එකනවුතිකප්පමත්ථකෙ විපස්සනාපඤ්ඤාය අනධිගතත්තා ලොකුත්තරමග්ගපඤ්ඤං නාධිගතොස්මීති. ථෙරො[2] පනාහ: ඉමිස්සායෙවාති වුත්තපඤ්ඤාපි යායං අරියාති වුත්තපඤ්ඤාපි මග්ගපඤ්ඤායෙව. අථ නං[3] භික්ඛූ ආහංසු: එවං සන්තෙ මග්ගස්ස අනධිගතත්තා මග්ගං නාධිගතොස්මීති ඉදං වුත්තං හොති භන්තෙති. ආවුසො කිඤ්චාපි දීපෙතුං න සක්කොමි ද්වෙපි පන මග්ගපඤ්ඤායෙවාති. එතදෙව චෙත්ථ යුත්තං. ඉතරථා හි යා අයන්ති නිද්දෙසො අනනුරූපො සියා.

සංසාරෙන සුද්ධීති බහුකං සංසරිත්වා සුජ්ඣන්තීති[4] වදන්ති. උපපත්තියා සුද්ධීති බහුකං උපපජ්ජිත්වා සුජ්ඣන්තීති වදන්ති. ආවාසෙන සුද්ධීති බහූසු ඨානෙසු වසිත්වා සුජ්ඣන්තීති වදන්ති. තීසුපි ඨානෙසු සංසරණකවසෙන සංසාරො, උපපජ්ජනකවසෙන උපපත්ති, වසනකවසෙන ආවාසොති ඛන්ධායෙව වුත්තා. යඤ්ඤෙනාති බහුයාගෙ යජිත්වා සුජ්ඣන්තීති වදන්ති. මුද්ධාවසිත්තෙනාති තීහි සඞ්ඛෙහි ඛත්තියාභිසෙකෙන මුද්ධනි[5] අභිසිත්තෙන. අග්ගිපරිචරියායාති බහුඅග්ගිපරිචරණෙන සුජ්ඣන්තීති වදන්ති.

දහරොති තරුණො. යුවාති යොබ්බඤ්ඤෙන[6] සමන්නාගතො. සුසුකාළකෙසොති සුට්ඨුකාළකෙසො. [භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතොති ඉමිනාස්ස යෙන යොබ්බනෙන සමන්නාගතො යුවා තං යොබ්බනං භද්දං ලද්ධකන්ති දස්සෙති. පඨමෙන වයසාති පඨමවයො නාම තෙත්තිංස වස්සානි, තෙන සමන්නාගතොති අත්ථො.*] පඤ්ඤාවෙය්‍යත්තියෙනාති පඤ්ඤාය ව්‍යත්තභාවෙන.[7] ජිණ්ණොති ජරාජිණ්ණො; වුඩ්ඪොති වඩ්ඪිත්වා ඨිතඅඞ්ගපච්චඞ්ගො; මහල්ලකොති ජාතිමහල්ලකො; අද්ධගතොති බහුං අද්ධානං ගතො, චිරකාලාතික්කන්තො; වයොඅනුප්පත්තොති වස්සසතස්ස තතියං කොට්ඨාසං පච්ඡිමවයං අනුප්පත්තො. අසීතිකො මෙ වයො වත්තතීති, ඉදං කිර සුත්තං භගවා පරිනිබ්බානසංවච්ඡරෙ කථෙසි තස්මා එවමාහ.

---

1. මග්ගපඤ්ඤං-A. 2. මජ්ඣිමභාණකථෙරො-S. භාණකථෙරො-B.
3. නෙ-B. 4. සුජ්ඣන්ති-L. 5. ඛත්තියාභිසෙකෙන-B.
6. යොබ්බනෙන-B. S. 7. පඤ්ඤාවෙය්‍යත්තිභාවෙන-B. S.
* ඉදං පොත්ථකෙසු ඌනවචනං ටීකාහි මනොරථපූරණියා පරිපූරිතං.

**පරමායාති** උත්තමාය. **ගතිමාති** ආදීසු පදසතම්පි, පදසහස්සම්පි වදන්තස්ස වදන්තස්සෙව[1] උග්ගණ්හනසමත්ථතා ගති නාම. තදෙව ආධාරණෙ උපනිබන්ධනසමත්ථතා සති නාම. එවං ගහිතං ධාරිතං සජ්ඣායං කාතුං සමත්ථවිරියං ධිති නාම. තස්ස අත්ථඤ්ච කාරණඤ්ච දස්සනසමත්ථතා පඤ්ඤාවෙය්‍යත්තියං නාම.

**දළ්හධම්මා ධනුග්ගහොති** දළ්හධනුං ගහෙත්වා ඨිතො ඉස්සාසො. දළ්හධනු නාම ද්විසහස්සථාමං වුච්චති; ද්විසහස්සථාමං නාම, යස්ස ආරොපිතස්ස ජියාබද්ධො ලොහසීසාදීනං භාරො දණ්ඩෙ ගහෙත්වා යාව කණ්ඩප්පමාණා[2] උක්ඛිත්තස්ස පථවිතො මුච්චති. **සික්ඛිතොති** දසද්වාදසවස්සානි ආචරියකුලෙ උග්ගහිතසිප්පො; **කතහත්ථොති**, කොචි සිප්පමෙව උග්ගණ්හාති, කතහත්ථො න හොති; අයං පන කතහත්ථො, චිණ්ණවසීභාවො; **කතූපාසනොති** රාජකුලාදීසු දස්සිතසිප්පො;[3] **ලහුකෙන අසනෙනාති** අන්තො සුසිරං කත්වා තූලාදීනි පූරෙත්වා කතලාඛාපරිකම්මෙන සල්ලහුකෙන කණ්ඩෙන; එවං කතං හි එකඋසභගාමී ද්වෙ උසභානි ගච්ඡති, අට්ඨඋසභගාමී සොළස උසභානි ගච්ඡති. **අප්පකසිරෙනාති** නිදුක්ඛෙන; **අතිපාතෙය්‍යාති** අතික්කමෙය්‍ය. **එවං අධිමත්තගතිමන්තානාති** යථා සො ධනුග්ගහො තං විදත්ථිචතුරඞ්ගුලං ඡායං සීඝමෙව අතික්කමෙති, එවං පදසතම්පි පදසහස්සම්පි උග්ගහෙතුං, උපධාරෙතුං, සජ්ඣායිතුං, අත්ථකාරණානි ච උපපරික්ඛිතුං සමත්ථාති අත්ථො. **අඤ්ඤත්‍ර අසිතපීතඛායිතසායිතාති** අසිතපීතාදීනි හි භගවතාපි කාතබ්බානි හොන්ති, භික්ඛූහිපි; තස්මා තෙසං කරණකාලෙ[4] ඨපෙත්වාති දස්සෙති.

**අපරියාදින්නායෙවාති** අපරික්ඛීණායෙව. සචෙ හි එකො භික්ඛු කායානුපස්සනං පුච්ඡති, අඤ්ඤො වෙදනානුපස්සනං-පෙ-ධම්මානුපස්සනං; ඉමිනා පුට්ඨෙ අහං පුච්ඡිස්සාමීති එකො එකං න ඔලොකෙති; එවං සන්තෙපි එතෙසං වාරො පඤ්ඤායති; එවං බුද්ධානං පන වාරො න පඤ්ඤායති. විදත්ථිචතුරඞ්ගුලං ඡායං අතික්කමන්තො පුරෙතරංයෙව භගවා චුද්දසවිධෙන කායානුපස්සනං, නවවිධෙන වෙදනානුපස්සනං, සොළසවිධෙන චිත්තානුපස්සනං, පඤ්චවිධෙන ධම්මානුපස්සනං කථෙති. තිට්ඨන්තු[5] තාව එතෙ චත්තාරො, සචෙ හි අඤ්ඤො චත්තාරො සම්මප්පධානෙසු, අඤ්ඤො ඉද්ධිපාදෙසු, අඤ්ඤො පඤ්ච ඉන්ද්‍රියෙසු, අඤ්ඤො පඤ්ච බලෙසු, අඤ්ඤො සත්ත බොජ්ඣඞ්ගෙසු අඤ්ඤො අට්ඨ මග්ගඞ්ගෙසු පඤ්හං[6] පුච්ඡෙය්‍යුං, තම්පි භගවා තාවදෙව කථෙය්‍ය. තිට්ඨන්තු වා එතෙ අට්ඨ, සචෙ අඤ්ඤො සත්තතිංස ජනා බොධිපක්ඛියෙසු පඤ්හං[6] පුච්ඡෙය්‍යුං, තම්පි භගවා තාවදෙව කථෙය්‍ය. කස්මා? යාවතා හි ලොකියමහාජනා එකං පදං කථෙන්ති, තාව ආනන්දත්ථෙරො අට්ඨපදානි කථෙති. ආනන්දත්ථෙරෙ පන එකං පදං

1. වදන්තස්සෙව-S.
2. කණ්ඩප්පමාණා-B, කරප්පමාණා-P1.
3. දස්සිතසිප්පකා-L
4. කාලං-B, S.
5. තිට්ඨන්තු වා-B, L.
6. පඤ්හං-L, S.

කථෙන්තෙනෙව භගවා සොළස පදානි කථෙති. කස්මා? භගවතො හි ජිව්හා මුදුකා, දන්තාවරණං සුඵුසිතං, වචනං අගලිතං, භවඞ්ගපරිවාසො ලහුකො. තෙනාහ: අපරියාදින්නායෙවස්ස සාරිපුත්ත තථාගතස්ස ධම්මදෙසනාති.

තත්ථ ධම්මදෙසනාති තන්තිඨපනා. ධම්මපදබ්‍යඤ්ජනන්ති පාළිගතං පදබ්‍යඤ්ජනං, තස්ස තස්ස අත්ථස්ස බ්‍යඤ්ජනකං අක්ඛරං. පඤ්හපටිභානන්ති පඤ්හාව්‍යාකරණං. ඉමිනා කිං දස්සෙති? තථාගතො පුබ්බෙ දහරකාලෙ අක්ඛරානි සම්පිණ්ඩෙත්වා පදං වත්තුං සක්කොති; පදානි සම්පිණ්ඩෙත්වා ගාථං වත්තුං සක්කොති; චතුඅක්ඛරෙහි වා අට්ඨඅක්ඛරෙහි වා සොළසඅක්ඛරෙහි වා පදෙහි යුත්තාය ගාථාය අත්ථං වත්තුං සක්කොති; ඉදානි පන මහල්ලකකාලෙ අක්ඛරානි සම්පිණ්ඩෙත්වා පදං වා, පදානි සම්පිණ්ඩෙත්වා ගාථං වා, ගාථාය අත්ථං වා වත්තුං න සක්කොතීති එවං නත්ථි. දහරකාලෙ ච මහල්ලකකාලෙ ච සබ්බමෙතං තථාගතස්ස අපරියාදින්නමෙවාති ඉදං දස්සෙති. මඤ්චකෙන චෙපි මන්ති ඉදං බුද්ධබලදීපනත්ථමෙව පරිකප්පෙත්වා ආහ; දසබලං පන මඤ්චකං ආරොපෙත්වා ගාමනිගමරාජධානීසු පරිහරණකාලො නාම නත්ථි. තථාගතා හි පච්ඡිමෙ ආයුකොට්ඨාසෙ ඛණ්ඩිච්චාදීහි අනභිභූතා සුවණ්ණවණ්ණස්ස සරීරස්ස වෙවණ්ණියෙ අනනුප්පත්තෙ දෙවමනුස්සානං පියමනාපකාලෙයෙව පරිනිබ්බායන්ති.

නාගසමාලොති තස්ස ථෙරස්ස නාමං. පඨමබොධියං හි වීසති වස්සබ්භන්තරෙ[1] උපවානනාගිතමෙඝියථෙරා විය අයම්පි භගවතො උපට්ඨාකො අහොසි. බීජයමානොති මන්දමන්දං[2] තාලවණ්ටෙන භගවතො උතුසුඛං සමුට්ඨාපයමානො. එතදවොචාති සකලසුත්තන්තං සුත්වා භගවතො පුබ්බචරිතං දුක්කරකාරිකං[3] ආගම්ම පසන්නො එතං අච්ඡරියං භන්තෙති ආදිවචනං අවොච. තත්ථ අච්ඡරං පහරිතුං යුත්තන්ති අච්ඡරියං; අභූතපුබ්බං භූතන්ති අබ්භුතං; උභයම්පි අත්ථතො විම්හයමෙව දීපෙති. කො නාමො අයං භන්තෙති ඉදං, භද්දකො වතායං ධම්මපරියායො, හන්දස්ස භගවන්තං ආයාචිත්වා නාමං ගණ්හාපෙමීති අධිප්පායෙන ආහ. අථස්ස භගවා නාමං ගණ්හන්තො, තස්මාතිහ ත්වන්ති ආදිමාහ. තස්සත්ථො: යස්මා ඉමං සුත්තං සුත්වා තව[4] ලොමානි හට්ඨානි, තස්මාතිහ ත්වං නාගසමාල ඉමං ධම්මපරියායං ලොමහංසනපරියායො ත්වෙව නං ධාරෙහීති.

මහාසීහනාදසුත්තවණ්ණනා නිට්ඨිතා.

---

## 1. 2. 3.

එවම්මෙ සුතන්ති මහාදුක්ඛක්ඛන්ධසුත්තං[5]. තත්ථ සම්බහුලාති විනයපරියායෙන[6] තයො ජනා සම්බහුලාති වුච්චන්ති, තතො පරං සඞ්ඝො. සුත්තන්තපරියායෙන තයො තයො එව, තතො උද්ධං

---

1. වස්සන්තරෙ-L.
2. මන්දන-B. S.
3. දුක්කරකාරං-B. S
4. ඉමං සුත්වාව-L.
5. මහාදුක්ඛක්ඛන්ධං-L.
6. තත්ථ විනයපරියායෙන-සී. ටී.

සම්බහුලා;[1] ඉධ සුත්තන්තපරියායෙන සම්බහුලා වෙදිතබ්බා. **පිණ්ඩාය පවිසිංසූති** පවිට්ඨා; තෙ පන න තාව පවිට්ඨා; පවිසිස්සාමාති නික්ඛන්තත්තා පන පවිසිංසූති වුත්තා. යථා කිං? යථා[2] ගාමං ගමිස්සාමීති නික්ඛන්තපුරිසො තං ගාමං අප්පත්තොපි, කුහිං ඉත්ථන්නාමොති වුත්තෙ, ගාමං ගතොති වුච්චති, එවං. **පරිබ්බාජකානං ආරාමොති** ජෙතවනතො අවිදූරෙ අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො අත්ථි, තං සන්ධාය එවමාහංසු. **සමණො ආවුසොති** ආවුසො තුම්හාකං සත්ථා සමණො ගොතමො. **කාමානං පරිඤ්ඤන්ති** කාමානං පහානං, සමතික්කමං පඤ්ඤපෙති. රූපවෙදනාදීසුපි එසෙව නයො.

තත්ථ තිත්ථියා සකසමයං ජානන්තා කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙය්‍යුං පඨමජ්ඣානං වදමානා; රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙය්‍යුං අරූපභවං වදමානා; වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙය්‍යුං අසඤ්ඤභවං වදමානා. තෙ පන ඉදං නාම පඨමජ්ඣානං, අයං අරූපභවො, අයං අසඤ්ඤභවොතිපි[3] න ජානන්ති. තෙ පඤ්ඤපෙතුං අසක්කොන්තාපි[4] කෙවලං පඤ්ඤපෙම පඤ්ඤපෙමාති[5] වදන්ති. තථාගතො පන කාමානං පරිඤ්ඤං අනාගාමිමග්ගෙන පඤ්ඤපෙති; රූපවෙදනානං අරහත්තමග්ගෙන. තෙ එවං මහන්තෙ විසෙසෙ විජ්ජමානෙපි, **ඉධ නො ආවුසො කො විසෙසොති** ආදිමාහංසු. තත්ථ **ඉධාති** ඉමස්මිං පඤ්ඤාපනෙ. **ධම්මදෙසනාය වා ධම්මදෙසනන්ති** යදිදං සමණස්ස වා ගොතමස්ස ධම්මදෙසනාය සද්ධිං අම්හාකං ධම්මදෙසනං, අම්හාකං වා ධම්මදෙසනාය සද්ධිං සමණස්ස ගොතමස්ස ධම්මදෙසනං ආරබ්භ නානාකරණං වුච්චෙථ, තං කින්නාමාති වදන්ති. දුතියපදෙපි එසෙව නයො. ඉති හෙ මජ්ඣෙ[6] භින්නසුවණ්ණං විය සාසනෙන සද්ධිං අත්තනො ලද්ධිං වචනමත්තෙන සමධුරං ඨපයිංසු.

**නෙව අභිනන්දිංසූති** එවමෙතන්ති න සම්පටිච්ඡිංසු; **න පටික්කොසිංසූති** නයිදං එවන්ති න පටිසෙධෙසුං. කස්මා? තෙ කිර තිත්ථියා නාම අන්ධජාතා[7] ජානිත්වා වා අජානිත්වා වා කථෙය්‍යුන්ති නාභිනන්දිංසු. **පරිඤ්ඤන්ති** වචනෙන ඊසකං සාසනගන්ධො අත්ථීති න පටික්කොසිංසු. ජනපදවාසිනො වා එතෙ සකසමයපරසමයෙසු න සුට්ඨු කුසලාතිපි උභයං නාකංසු.

**න චෙව සම්පායිස්සන්තීති** සම්පාදෙත්වා කථෙතුං න සක්ඛිස්සන්ති; **උත්තරිඤ්ච විඝාතන්ති** අසම්පායන්තො උත්තරිම්පි දුක්ඛං ආපජ්ජිස්සන්ති; සම්පාදෙත්වා කථෙතුං අසක්කොන්තානං හි[8] දුක්ඛං උප්පජ්ජති. **යථා තං භික්ඛවෙ අවිසයස්මින්ති** එත්ථ යථාති කාරණවචනං; තන්ති නිපාතමත්තං. යස්මා අවිසයෙ පඤ්හො පුච්ඡිතො හොතීති අත්ථො.

1. සම්බහුලාති වුච්චන්ති-B. S.
2. වුත්තා. යථා-B. S.
3. අයං රූපභවො අයං අරූපභවොතිපි-B. S.
4. අසක්කොන්තා.-B. S.
5. කෙවලං පඤ්ඤපෙමාති-E.
6. ඉති වෙ මජ්ඣෙ-B.
7. අන්ධසදිසා-B. S.
8. අසක්කොන්තානං නාම-B.

**සදෙවකස්සාති** සහ දෙවෙහි සදෙවකෙ; සමාරකාදීසුපි එසෙව නයො. එවං තීණි ඨානානි ලොකෙ පක්ඛිපිත්වා, ද්වෙ පජායාති පඤ්චහිපි සත්තලොකමෙව පරියාදියිත්වා එතස්මිං සදෙවකාදිභෙදෙ ලොකෙ තං දෙවං වා මනුස්සං වා න පස්සාමීති දීපෙති. **ඉතො වා පන සුත්වාති** ඉතො වා පන මම සාසනතො සුත්වා; ඉතො සුත්වා හි තථාගතොපි තථාගතසාවකොපි ආරාධෙය්‍ය, පරිතොසෙය්‍ය; අඤ්ඤථා ආරාධනා නාම නත්ථීති දස්සෙති.

ඉදානි අත්තනො තෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තාරාධනං දස්සෙන්තො, **කො ච භික්ඛවෙති** ආදිමාහ. **කාමගුණාති** කාමයිතබ්බට්ඨෙන කාමා[1] බන්ධනට්ඨෙන ගුණා. "අනුජානාමි භික්ඛවෙ අහතානං වත්ථානං ද්විගුණං සඞ්ඝාටි"න්ති එත්ථ හි පටලට්ඨො ගුණට්ඨො. "අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා අනුපුබ්බං ජහන්තී"ති එත්ථ රාසට්ඨො ගුණට්ඨො. "සතගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා"ති එත්ථ ආනිසංසට්ඨො ගුණට්ඨො. "අන්තං අන්තගුණං" "කයිරා මාලාගුණෙ බහූ"ති එත්ථ බන්ධනට්ඨො ගුණට්ඨො. ඉධාපි එසොව අධිප්පෙතො, තෙන වුත්තං: බන්ධනට්ඨෙන ගුණාති. **චක්ඛුවිඤ්ඤෙය්‍යාති** චක්ඛුවිඤ්ඤාණෙන පස්සිතබ්බා. එතෙනුපායෙන සොතවිඤ්ඤෙය්‍යාදීසුපි අත්ථො වෙදිතබ්බො. **ඉට්ඨාති** පරියිට්ඨා වා හොන්තු මා වා, ඉට්ඨාරම්මණභූතාති අත්ථො; **කන්තාති** කාමනීයා; **මනාපාති** මනවඩ්ඪනකා; **පියරූපාති** පියජාතිකා; **කාමූපසංහිතාති** ආරම්මණං කත්වා උප්පජ්ජමානෙන කාමෙන උපසංහිතා; **රජනීයාති** රජ්ජනියා, රාගුප්පත්තිකාරණභූතාති අත්ථො.

**යදි මුද්දායාති** ආදීසු මුද්දාති අඞ්ගුලිපබ්බෙසු සඤ්ඤං ඨපෙත්වා හත්ථමුද්දා; **ගණනාති** අච්ඡිද්ද[2]ගණනා; **සඞ්ඛානන්ති**[3] පිණ්ඩගණනා; යාය ඛෙත්තං ඔලොකෙත්වා ඉධ එත්තකා වීහි භවිස්සන්ති, රුක්ඛං ඔලොකෙත්වා ඉධ එත්තකානි ඵලානි භවිස්සන්ති, ආකාසං ඔලොකෙත්වා ඉමෙ ආකාසෙ සකුණා එත්තකා නාම භවිස්සන්තීති ජානන්ති. **කසීති** කසිකම්මං; **වණිජ්ජාති** ජලවණිජ්ජාථලවණිජ්ජාදි වණිප්පථො;[4] **ගොරක්ඛන්ති** අත්තනො වා පරෙසං වා ගාවො රක්ඛිත්වා පඤ්චගොරසවික්කයෙන ජීවනකම්මං. **ඉස්සත්ථං** වුච්චති ආවුධං ගහෙත්වා උපට්ඨානකම්මං; **රාජපොරිසන්ති** විනා ආවුධෙන රාජකම්මං කත්වා උපට්ඨානං;[5] **සිප්පඤ්ඤතරන්ති** ගහිතාවසෙසං හත්ථිඅස්සසිප්පාදි. **සීතස්ස පුරක්ඛතොති** ලක්ඛං විය සරස්ස සීතස්ස පුරතො සීතො; සීතෙන බාධියමානොති අත්ථො. **උණ්හෙපි** එසෙව නයො. ඩංසාදීසු **ඩංසාති** පිඞ්ගලමක්ඛිකා; **මකසාති** සබ්බමක්ඛිකා; **සිරිංසපාති** යෙ කෙචි සරිත්වා ගච්ඡන්ති. **රිස්සමානොති** රුප්පමානො[6], ඝට්ටියමානො; **මීයමානොති** මරමානො.

---

1. කාමා-B. S.
2. වෙච්ඡාන-E.
3. සඞ්ඛාති-B. S.
4. වණිජ්ජපථො-S.
5. කත්වා රජ්ජුපට්ඨානං-L.
6. කම්පමානො--B. S.

**අයං භික්ඛවෙති** භික්ඛවෙ අයං මුද්දාදීහි ජීවිකාකප්පනං ආගම්ම සීතාදිපච්චයො අබාධො, **කාමානං ආදීනවොති** කාමෙසු උපද්දවො උපසග්ගොති අත්ථො. **සන්දිට්ඨිකොති** පච්චක්ඛො, සාමං පස්සිතබ්බො; **දුක්ඛක්ඛන්ධොති** දුක්ඛරාසි; **කාමහෙතූති** ආදීසු පච්චයට්ඨෙන කාමා අස්ස හෙතූති **කාමහෙතු**; මූලට්ඨෙන කාමා නිදානමස්සාති **කාමනිදානො**; ලිඞ්ගවිපල්ලාසෙන පන **කාමනිදාන**න්ති වුත්තං. කාරණට්ඨෙන කාමා අධිකරණං අස්සාති **කාමාධිකරණො**; ලිඞ්ගවිපල්ලාසෙනෙව පන **කාමාධිකරණ**න්ති වුත්තං. **කාමානමෙව හෙතූති** ඉදං නියමවචනං; කාමපච්චයා උප්පජ්ජතියෙවාති අත්ථො.

**උට්ඨහතොති** ආජීවසමුට්ඨාපකවීරියෙන උට්ඨහන්තස්ස; **ඝටතොති** තං වීරියං පුබ්බෙනාපරං ඝටෙන්තස්ස; **වායමතොති** වායාමං, පරක්කමං, පයොගං කරොන්තස්ස; **නාභිනිප්ඵජ්ජන්තීති** න නිප්ඵජ්ජන්ති, හත්ථං නාභිරුහන්ති. **සොචතීති** චිත්තෙ උප්පන්නබලවසොකෙන සොචති. **කිලමතීති** කායෙ උප්පන්නදුක්ඛෙන කිලමති; **පරිදෙවතීති** වාචාය පරිදෙවති. **උරත්තාළින්ති** උරං තාළෙත්වා; **කන්දතීති** රොදති. **සම්මොහං ආපජ්ජතීති** විසඤ්ඤී විය සම්මූළ්හො හොති. **මොඝන්ති** තුච්ඡං; **අඵලොති** නිප්ඵලො. **ආරක්ඛාධිකරණන්ති** ආරක්ඛකාරණා. **කින්තීති**[1] කෙන නු ඛො උපායෙන; **යම්පි මෙති** යම්පි මය්හං කසිකම්මාදීනි කත්වා උප්පාදිතං ධනං අහොසි; **තම්පි නො නත්ථීති** තම්පි අම්හාකං ඉදානි නත්ථි.

**පුන ච පරං භික්ඛවෙ කාමහෙතූති** ආදිනාපි කාරණං දස්සෙත්වාව ආදීනවං දීපෙති. තත්ථ **කාමහෙතූති** කාමපච්චයා; **රාජානොපි රාජූහි විවදන්ති**. **කාමනිදාන**න්ති භාවනපුංසකං; කාමෙ නිදානං කත්වා විවදන්තීති අත්ථො. **කාමාධිකරණ**න්තිපි භාවනපුංසකමෙව; කාමෙ අධිකරණං කත්වා විවදන්තීති අත්ථො. **කාමානමෙව හෙතූති** ගාමනිගම[2]සෙනාපතිපුරොහිතට්ඨානන්තරාදීනං කාමානංයෙව[3] හෙතු විවදන්තීති අත්ථො. **උපක්කමන්තීති** පහරන්ති;

**අසිචම්මන්ති** අසිඤ්චෙව ඛෙටකඵලකාදීනි ච. **ධනුකලාපං සන්නය්හිත්වාති** ධනුං ගහෙත්වා සරකලාපං සන්නය්හිත්වා; **උභතොබ්‍යූළ්හන්ති** උභතො රාසිභූතං. **පක්ඛන්දන්තීති** පවිසන්ති. **උසූසූති** කණ්ඩෙසු; **විජ්ජොතලන්තෙසූති** විපරිවත්තමානෙසු.[4] **තෙ තත්ථාති** තෙ තස්මිං සඞ්ගාමෙ. **අද්දූවලෙපනා**[5] **උපකාරියොති** එත්ථ[6] මනුස්සා පාකාරපාදං අස්සඛුරසණ්ඨානෙන ඉට්ඨකාහි චිනිත්වා උපරි සුධාය ලෙපෙන්ති;[7] එවං කතා පාකාරපාදා **උපකාරියොති** වුච්චන්ති. තා තින්තෙන[8] කලලෙන සිත්තා අද්දූවලෙපනා[5] නාම හොන්ති. **පක්ඛන්දන්තීති** තාසං හෙට්ඨා තිඛිණඅයසූලකණ්ටකසූලාදීහි[9] විජ්ඣියමානාපි පාකාරස්ස පිච්ඡිලභාවෙන ආරොහිතුං අසක්කොන්තාපි උපධාවන්ති

1. කිං නු ඛො-B. L. S. E. 2. ගාමනිගමනගර-B. 3. හෙව-E.
4. විපරිවත්තමානෙසු-B. S. 5. අච්චාවලෙපනා-B. S. 6. එවං-B. S.
7. ලිම්පෙන්ති-B. ලිම්පන්ති-S. 8. සන්තෙන-B. L. E. 9. තිණ්හඅයසූලාදීහි-B. S.

යෙව. **පක්කට්ඨියාති**[1] කථිත[2]ගොමයෙන, **අභිවග්ගෙනාති** සත දන්තෙන; තං අට්ඨදන්තාකාරෙන කත්වා, නගරද්වාරං භින්දිත්වා පවිසිස්සාමාති ආගතෙ උපරිද්වාරෙ ඨිතා තස්ස බන්ධනයොත්තානි ඡින්දිත්වා තෙන **අභිවග්ගෙන** ඔමද්දන්ති.

**සන්ධිම්පි ඡින්දන්තීති** ඝරසන්ධිං ඡින්දන්ති. **නිල්ලොපන්ති** ගාමෙ පහරිත්වා මහාවිලොපං කරොන්ති. **එකාගාරිකන්ති** පණ්ණාසමත්තාපි සට්ඨිමත්තාපි පරිවාරෙත්වා ජීවග්ගාහං ගහෙත්වා ධනං[3] ආහරාපෙන්ති. **පරිපන්ථෙපි තිට්ඨන්තීති** පන්ථදූහනකම්මං කරොන්ති.

**අද්ධදණ්ඩකෙහීති** මුග්ගරෙහි; පහාරසාධනත්ථං වා චතුහත්ථං දණ්ඩං ද්වෙධා ඡෙත්වා ගහිතදණ්ඩකෙහි. **බිලඞ්ගථාලිකන්ති** කඤ්ජියඋක්ඛලිකම්මකාරණං; තං කරොන්තා සීසකපාලං උප්පාටෙත්වා තත්තං අයොගුළං සණ්ඩාසෙන ගහෙත්වා තත්ථ පක්ඛිපන්ති; තෙන මත්ථලුඞ්ගං පක්කට්ඨිත්වා උපරි උත්තරති. **සඞ්ඛමුණ්ඩිකන්ති** සඞ්ඛමුණ්ඩකකම්මකාරණං; තං කරොන්තා උත්තරොට්ඨඋභතොකණ්ණචූළිකගලවාටකපරිච්ඡෙදෙන චම්මං ඡින්දිත්වා සබ්බකෙසෙ එකතො ගණ්ඨිං කත්වා දණ්ඩකෙන වාලෙත්වා[4] උප්පාටෙන්ති; සහ කෙසෙහි චම්මං උට්ඨහති. තතො සීසකටාහං ථූලසක්ඛරාහි ඝංසිත්වා ධොවන්තා සඞ්ඛවණ්ණං කරොන්ති.

**රාහුමුඛන්ති** රාහුමුඛකම්මකාරණං; තං කරොන්තා සඞ්කුනා මුඛං විවරිත්වා අන්තොමුඛෙ දීපං ජාලෙන්ති. කණ්ණචූළිකාහි වා පට්ඨාය මුඛං නිඛාදනෙන ඛණන්ති; ලොහිතං පග්ඝරිත්වා මුඛං පූරෙති **ජොතිමාලිකන්ති** සකලසරීරං තෙලපිලොතිකාය වෙඨෙත්වා ආලිම්පෙන්ති. **හත්ථපජ්ජොතිකන්ති** හත්ථෙ තෙලපිලොතිකාය වෙඨෙත්වා දීපං විය පජ්ජාලෙන්ති. **එරකවත්තිකන්ති** එරකවත්තකම්මකාරණං; තං කරොන්තා හෙට්ඨා[5] ගීවතො[6] පට්ඨාය චම්මවට්ටෙ කන්තිත්වා ගොප්ඵකෙ පාතෙන්ති. අථ නං යොත්තෙහි බන්ධිත්වා කඩ්ඪන්ති. සො අත්තනොව චම්මවට්ටෙ අක්කමිත්වා අක්කමිත්වා පතති **චීරකවාසිකන්ති** චීරකවාසික කම්මකාරණං; තං කරොන්තා තථෙව චම්මවට්ටෙ කන්තිත්වා කටියං ඨපෙන්ති; කටිතො පට්ඨාය කන්තිත්වා ගොප්ඵකෙසු ඨපෙන්ති; උපරිමෙහි හෙට්ඨිමසරීරං චීරකනිවාසනනිවත්ථං විය හොති.

**එණෙය්‍යකන්ති** එණෙය්‍යකකම්මකාරණං; තං කරොන්තා උභොසු කප්පරෙසු ච ජණ්ණුකෙසු ච අයසලාකානි දත්වා අයසූලානි කොට්ටෙන්ති. සො චතූහි අයසූලෙහි භූමියං පතිට්ඨහති. අථ නං පරිවාරෙත්වා අග්ගිං කරොන්ති. **"එණෙය්‍යකො ජොතිපරියාහතො යථා"ති** ආගතට්ඨානෙපි ඉදමෙව වුත්තං. තං සන්ධිසන්ධිතො[7] සූලානි

---

1. ඡකණකායාති-B, ඡකණිටිකාති-S. 2. කුථිත-B, E. කුට්ඨිත-S.
3. ගහෙත්වා-B, S. 4. වෙල්ලිත්වා-B, වලිත්වා-S. 5. කරොන්තා-B, S.
6. ගීවාතො-E. 7. ආ. කාලෙන කාලං-B, S, [මනොරථපූරණියාපි අයමෙව පාඨො]

අපනෙත්වා වත්ථීහි අට්ඨිකොටීහියෙව ගමෙන්ති; එවරූපා කාරණා නාම නත්ථි. **බළිසමංසිකන්ති** උභතොමුඛෙහි බළිසෙහි පහරිත්වා චම්මමංසනහාරූනි උප්පාටෙන්ති. **කහාපණකන්ති**[1] සකලසරීරං තිණ්හාහි වාසීහි කොටිතො පට්ඨාය කහාපණමත්තං කහාපණමත්තං පාතෙන්තා කොට්ටෙන්ති. **ඛාරාපතච්ඡිකන්ති**[2] සරීරං තත්ථ තත්ථ ආවුධෙහි පහරිත්වා කොච්ඡෙහි ඛාරං ඝංසන්ති;[3] චම්මමංසනහාරූනි පග්ඝරිත්වා[4] අට්ඨිකසඞ්ඛලිකාව තිට්ඨති.

**පලිඝපරිවත්තිකන්ති** එකෙන පස්සෙන නිපජ්ජාපෙත්වා කණ්ණච්ඡිද්දෙ[5] අයසූලං කොට්ටෙත්වා පථවියා එකාබද්ධං කරොන්ති. අථ නං පාදෙ ගහෙත්වා ආවිඤ්ඡන්ති. **පලාලපීඨකන්ති** ඡෙකො කාරණිකො ඡවිචම්මං අච්ඡින්දිත්වා නිසදපොතකෙහි[6] අට්ඨීනි භින්දිත්වා කෙසෙසු ගහෙත්වා උක්ඛිපති, මංසරාසියෙව හොති; අථ නං කෙසෙහෙව පරියොනන්ධිත්වා ගණ්හන්ති; පලාලවට්ටිං විය කත්වා පලිවෙඨෙන්ති. **සුනඛෙහිපීති** කතිපයානි දිවසානි ආහාරං අදත්වා ඡාත[7]සුනඛෙහි ඛාදාපෙන්ති; තෙ මුහුත්තෙනෙව අට්ඨිකසඞ්ඛලිකමෙව කරොන්ති. **සම්පරායිකොති** සම්පරායෙ දුග්ගතිභාවෙ විපාකොති අත්ථො.

**ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානන්ති** නිබ්බානං; නිබ්බානං හි ආගම්ම කාමෙසු ඡන්දරාගො විනයති[8] චෙව පහීයති ච, තස්මා නිබ්බානං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානන්ති වුත්තං. **සාමං වා කාමෙ පරිජානිස්සන්තීති** සයං වා කාමෙ තීහි පරිඤ්ඤාහි පරිජානිස්සන්ති. **තථත්තායාති** තථාභාවාය. **යථාපටිපන්නොති** යාය පටිපදාය පටිපන්නො.

**ඛත්තියකඤ්ඤා වා**ති ආදි අපරිමිතෙන විපුලෙන කුසලෙන ගහිතපටිසන්ධිකං වණ්ණාලඞ්කාරාදීහි ලද්ධට්ඨානෙ නිබ්බත්තං දස්සෙතුං වුත්තං. **පන්නරසවස්සුද්දෙසිකාති** පන්නරසවස්සවයා. දුතියපදෙපි එසෙව නයො. වයපදෙසං කස්මා ගණ්හාතීති? වණ්ණසම්පත්තිදස්සනත්ථං; මාතුගාමස්ස හි දුග්ගතකුලෙ නිබ්බත්තස්සාපි එතස්මිං කාලෙ ථොකථොකං වණ්ණායතනං පසීදති; පුරිසානං පන වීසතිවස්ස පඤ්චවීසතිවස්සකාලෙ පසන්නං හොති. **නාතිදීඝාති** ආදීහි ඡදොසවිරහිතං සරීරසම්පත්තිං දීපෙති. **වණ්ණනිභාති** වණ්ණොයෙව.

**ජිණ්ණන්ති** ජරාජිණ්ණං; **ගොපානසිවඞ්කන්ති** ගොපානසී විය වඞ්කං; **භොග්ගන්ති** භග්ගං; ඉමිනාපිස්ස වඞ්කභාවමෙව දීපෙති. **දණ්ඩපරායනන්ති** දණ්ඩපටිසරණං, දණ්ඩදුතියං; **පවෙධමානන්ති** කම්පමානං; **ආතුරන්ති** ජරාතුරං; **ඛණ්ඩදන්තන්ති** ජරානුභාවෙන ඛණ්ඩිතදන්තං; **පලිතකෙසන්ති** පණ්ඩරකෙසං; **විලූනන්ති** ලුඤ්චිත්වා ගහිතකෙසං විය ඛල්ලාටං; **ඛලිතසිරන්ති**[9] මහාඛල්ලාටසීසං; **වලිනන්ති**[10]

1. කහාපණිකන්ති-B. 2. ඛාරාපටිච්ඡකං-B, පටච්ඡිකං-S.
3. ඝංසන්ති B., S. 4. පග්ඝරිත්වා සවන්ති-B. S.
5. කණ්ණච්ඡිද්දෙන-L. 6. නිසදපොතෙහි-L. 7. ඡාතකෙහි-B, S.
8. විනයති-E. විනියති-S. 9. ඛලිතංසිරස්-L. 10. වලිතන්ති-J.

සඤ්ජාතවලිං. **තිලකාහතගත්තන්ති** සෙතතිලකකාළතිලකෙහි විකිණ්ණසරීරං. **ආබාධිකන්ති** බ්‍යාධිතං; **දුක්ඛිතන්ති** දුක්ඛප්පත්තං; **බාළ්හගිලානන්ති** අධිමත්තගිලානං. **සිවථිකාය ඡඩ්ඩිතන්ති** ආමකසුසානෙ පාතිතං; සෙසමෙත්ථ සතිපට්ඨානෙ වුත්තමෙව. ඉධාපි නිබ්බානංයෙව ඡන්දරාගවිනයො.

**නෙව තස්මිං සමයෙ අත්තබ්‍යාබාධායාති** තස්මිං සමයෙ අත්තනොපි දුක්ඛත්ථාය න චෙතෙති. **අබ්‍යාපජ්ඣංයෙවාති** නිද්දුක්ඛමෙව. **යං භික්ඛවෙ වෙදනා අනිච්චාති** භික්ඛවෙ යස්මා වෙදනා අනිච්චා, තස්මා. අයං අනිච්චාදිආකාරො[1] වෙදනාය ආදීනවොති අත්ථො. නිස්සරණං වුත්තප්පකාරමෙවාති.

**මහාදුක්ඛක්ඛන්ධසුත්තවණ්ණනා නිට්ඨිතා.**

---

## 1. 2. 4.

**එවං මෙ සුතන්ති** චූළදුක්ඛක්ඛන්ධසුත්තං.[2] තත්ථ **සක්කෙසූති** එවංනාමකෙ ජනපදෙ; සො හි ජනපදො සක්‍යානං රාජකුමාරානං වාසට්ඨානත්තා[3] සක්කාත්වෙව සඞ්ඛං ගතො. සක්‍යානං පන උප්පත්ති අම්බට්ඨසුත්තෙ ආගතාව. **කපිලවත්ථුස්මින්ති** එවංනාමකෙ නගරෙ. තං හි කපිලස්ස ඉසිනො නිවාසට්ඨානෙ[4] කතත්තා කපිලවත්ථූති වුත්තං. තං ගොචරගාමං කත්වා. **නිග්‍රොධාරාමෙති** නිග්‍රොධො නාම සක්කො, සො ඤාතිසමාගමකාලෙ කපිලවත්ථුං ආගතෙ භගවති අත්තනො ආරාමෙ විහාරං කාරෙත්වා භගවතො නිය්‍යාදෙසි;[5] තස්මිං විහරතීති අත්ථො.

**මහානාමොති** අනුරුද්ධත්ථෙරස්ස භාතා, භගවතො චූළපිතු පුත්තො. සුද්ධොදනො, සුක්කොදනො, සක්කොදනො[6] ධොතොදනො, අමිතොදනොති ඉමෙ පඤ්ච ජනා භාතරො. අමිතා[7] නාම දෙවී තෙසං භගිනී. තිස්සත්ථෙරො තස්සා පුත්තො. තථාගතො ච නන්දත්ථෙරො ච සුද්ධොදනස්ස පුත්තා. මහානාමො ච අනුරුද්ධත්ථෙරො ච සුක්කොදනස්ස; ආනන්දත්ථෙරො අමිතොදනස්ස. සො භගවතො කණිට්ඨො, මහානාමො මහල්ලකතරො, සකදාගාමී අරියසාවකො.

**දීඝරත්තන්ති** මය්හං සකදාගාමිඵලප්පත්තිතො[8] පට්ඨාය චිරරත්තං ජානාමීති දස්සෙති. **ලොභධම්මාති** ලොභසඞ්ඛාතා ධම්මා; නානප්පකාරකං ලොභංයෙව සඞ්ගය්හ වදති. ඉතරෙසුපි ද්වීසු එසෙව නයො. **පරියාදාය තිට්ඨන්තීති** ඛෙපෙත්වා තිට්ඨන්ති. ඉදං හි පරියාදානං නාම, "සබ්බං හත්ථිකායං පරියාදියිත්වා, සබ්බං අස්සකායං, සබ්බං රථකායං, සබ්බං පත්තිකායං පරියාදියිත්වා ජීවන්තංයෙව නං අග්ගහෙසී"ති එත්ථ

---

1. ආකාරෙව - B. ව. S.
2. චූළදුක්ඛක්ඛන්ධං - L.
3. වසනට්ඨානත්තා - B. S.
4. නිවාසනට්ඨානෙ - B. S.
5. නිය්‍යාතෙසි - K.
6. අසුක්කොදනො L.
7. අමිතාවී - L. E.
8. ඵලුප්පත්තිතො - B. S.

ගහණෙ ආගතං. "අනිච්චසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියතී"ති එත්ථ ඛෙපනෙ. ඉධාපි ඛෙපනෙ අධිප්පෙතං[1]; තෙන වුත්තං පරියාදියිත්වාති ඛෙපෙත්වාති.

**යෙන මෙ එකදා ලොභධම්මාපීති** යෙන මය්හං එකස්මිං[2] කාලෙ ලොභධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්තීති පුච්ඡති. අයං කිර රාජා සකදාගාමිමග්ගෙන ලොභදොසමොහා[3] නිරවසෙසා පහීයන්තීති සඤ්ඤී අහොසි. අයං පහීනං[4] මෙ අත්ථීතිපි ජානාති, අප්පහීනකං උපාදාය පහීනකම්පි පුන පච්ඡතො ආවත්තතීති[5] සඤ්ඤී හොති. අරියසාවකස්ස එවං සන්දෙහො උප්පජ්ජතීති? ආම උප්පජ්ජති. කස්මා? පණ්ණත්තියා අකොවිදත්තා; අයං කිලෙසො අසුකමග්ගවජ්ඣොති ඉමිස්සා පණ්ණත්තියා අකොවිදස්ස හි අරියසාවකස්සපි එවං හොති. කිං තස්ස පච්චවෙක්ඛණා නත්ථීති? අත්ථි. සා පන න සබ්බෙසං පරිපුණ්ණා හොති. එකො හි පහීනකිලෙසමෙව පච්චවෙක්ඛති, එකො අවසිට්ඨකිලෙසමෙව, එකො මග්ගමෙව, එකො ඵලමෙව, එකො නිබ්බානමෙව. ඉමාසු පන පඤ්චසු පච්චවෙක්ඛණාසු එකං වා ද්වෙ වා නො ලද්ධුං න වට්ටති. ඉති යස්ස පච්චවෙක්ඛණා න පරිපුණ්ණා, තස්ස මග්ගවජ්ඣකිලෙසපණ්ණත්තියං අකොවිදත්තා එවං හොති.

**සො එව ඛො තෙති** සොයෙව ලොභො දොසො මොහො ච තව සන්තානෙ අප්පහීනො; ත්වං පන පහීනසඤ්ඤී අහොසීති දස්සෙති. **සො ච හි තෙති** සො තුය්හං ලොභදොසමොහධම්මො. **කාමෙති** දුවිධෙපි කාමෙ න පරිභුඤ්ජෙය්‍යාසි[6] මය්හං විය පබ්බජෙය්‍යාසීති දස්සෙති. **අප්පස්සාදාති** පරිත්තසුඛා. **බහුදුක්ඛාති** දිට්ඨධම්මිකසම්පරායිකදුක්ඛමෙවෙත්ථ බහුකං. **බහුපායාසාති** දිට්ඨධම්මිකසම්පරායිකො උපායාසකිලෙසොයෙවෙත්ථ බහු. **ආදීනවොති** දිට්ඨධම්මිකසම්පරායිකො උපද්දවො; **එත්ථ භිය්‍යොති** එතෙසු කාමෙසු අයං ආදීනවොයෙව බහු; අස්සාදො පන හිමවන්තං උපනිධාය සාසපො විය අප්පො, පරිත්තකො. **ඉති චෙපි මහානාමාති** මහානාම එවඤ්චෙපි අරියසාවකස්ස **යථාභූතං**[7] යථාසභාවං **සම්මා** නයෙන කාරණෙන **පඤ්ඤාය** සුදිට්ඨං හොතීති දස්සෙති. තත්ථ **පඤ්ඤායාති** විපස්සනාපඤ්ඤාය. හෙට්ඨාමග්ගද්වයඤාණෙනාති අත්ථො.

**සො චාති** සො එස[8] මග්ගද්වයෙන[9] දිට්ඨකාමාදීනවො අරියසාවකො. **පීතිසුඛන්ති** ඉමිනා සප්පීතිකානි ද්වෙ ඣානානි දස්සෙති. **අඤ්ඤං වා තතො සන්තතරන්ති** තතො වා ඣානද්වයතො සන්තතරං අඤ්ඤං උපරි ඣානද්වයඤ්චෙව මග්ගද්වයඤ්ච. **නෙව තාව අනාවට්ටී කාමෙසු හොතීති** අථ ඛො සො ද්වෙ මග්ගෙ පටිවිජ්ඣිත්වා ඨිතොපි අරියසාවකො උපරි ඣානානං වා මග්ගානං වා අනධිගතත්තා

1. අධිප්පෙතො-B. L. S.
2. එකෙකස්මිං-B. S.
3. ලොභධම්මා-E
4. අප්පහීනං-L.
5. පුච්ඡතො වට්ටතීති-B.
6. න පරිභුඤ්ජෙය්‍යාසීති-B. S.
7. යථාභූතන්ති-B. S.
8. සො චාති සො එව-S.
9. මග්ගවසෙන B

නෙව තාව කාමෙසු අනාවට්ටී හොති; අනාවට්ටන්තො[1] අනාභොගො න හොති; සාවට්ටන්තො[2] සාභොගොයෙව හොති. කස්මා? චතූහි ඣානෙහි වික්ඛම්භනප්පහානස්ස, ද්වීහි මග්ගෙහි සමුච්ඡෙදප්පහානස්ස අභාවා.

**මය්හම්පි ඛොති** න කෙවලං තුය්හෙව අථ ඛො මය්හම්පි; **පුබ්බෙව සම්බොධාති** මග්ගසම්බොධතො පඨමතරමෙව; **පඤ්ඤාය සුදිට්ඨං අහොසීති** එත්ථ ඔරොධනාටකපජහනපඤ්ඤා අධිප්පෙතා. **පීතිසුඛං නාජ්ඣගමන්ති** සප්පීතිකානි ද්වෙ ඣානානි න පටිලභිං; **අඤ්ඤං වා තතො සන්තතරන්ති** ඉධ උපරි ඣානද්වයඤ්චෙව චත්තාරො ච මග්ගා අධිප්පෙතා. **පච්චඤ්ඤාසින්ති** පටිඤ්ඤං අකාසිං.[3]

**එකමිදාහං මහානාම සමයන්ති** කස්මා ආරද්ධං? අයං පාටියෙක්කා අනුසන්ධි. හෙට්ඨා කාමානං අස්සාදොපි ආදීනවොපි කථිතො; නිස්සරණං න කථිතං; තං කථෙතුං අයං දෙසනා ආරද්ධා. කාමසුඛල්ලිකානුයොගො වා[4] එකො අන්තො, අත්තකිලමථානුයොගො එකො; ඉමෙහි අන්තෙහි මුත්තං මම සාසනන්ති උපරි ඵලසමාපත්තිසීසෙන සකලසාසනං දස්සෙතුම්පි අයං දෙසනා ආරද්ධා.

**ගිජ්ඣකූටෙ පබ්බතෙති** තස්ස පබ්බතස්ස ගිජ්ඣසදිසං කූටං අත්ථි, තස්මා ගිජ්ඣකූටොති වුච්චති; ගිජ්ඣා වා තස්ස කූටෙසු නිවසන්තීතිපි ගිජ්ඣකූටොති වුච්චති. **ඉසිගිලිපස්සෙති** ඉසිගිලිපබ්බතස්ස පස්සෙ. **කාළසිලායන්ති** කාළවණ්ණපිට්ඨිපාසාණෙ. **උබ්භට්ඨකා හොන්තීති** උබ්භංයෙව[5] ඨිතකා හොන්ති, අනිසින්නා. **ඔපක්කමිකාති** උබ්භට්ඨකාදිනා අත්තනො උපක්කමෙන නිබ්බත්තිතා. **නිගණ්ඨා ආවුසොති** අඤ්ඤං කාරණං වත්තුං අසක්කොන්තා නිගණ්ඨස්ස උපරි ඛිපිංසු.[6] **සබ්බඤ්ඤූ සබ්බදස්සාවීති** සො අම්හාකං සත්ථා අතීතානාගතපච්චුප්පන්නං සබ්බං ජානාති, පස්සතීති දස්සෙන්ති. **අපරිසෙසං ඤාණදස්සනං පටිජානාතීති** සො අම්හාකං සත්ථා අපරිසෙසං ධම්මං ජානන්තො[7] අපරිසෙසසඞ්ඛාතං[8] ඤාණදස්සනං පටිජානාති. පටිජානන්තො ච එවං[9] පටිජානාති : **චරතො ච මෙ තිට්ඨතො ච-පෙ-පච්චුපට්ඨිතන්ති.** තත්ථ **සතතන්ති** නිච්චං. **සමිතන්ති** තස්සෙව වෙවචනං.

**කිං පන තුම්හෙ ආවුසො නිගණ්ඨා ජානාථ, එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණන්ති** ඉදං භගවා, පුරිසො නාම යං කරොති, තං ජානාති; වීසති කහාපණෙ ඉණං ගහෙත්වා දස දත්වා දස මෙ දින්නා, දස ඨිතාති[10] ජානාති; තෙපි දත්වා, සබ්බං දින්නන්ති ජානාති;

---

1. අනාවට්ටිතො-B. S. 2 සාවට්ටිතො-S. ආවට්ටිතො-B.
3. පටිඤ්ඤාසිං-S. E. 4. යොගොසි-B. S. 5. උබ්භායෙව-L S. උද්ධංයෙව-B.
6. පක්ඛිපිංසු-B.S. 7. ජානන්තො-B, S. 8. අපරිසෙසං වා න-L.
9. එව ච-B. එවඤ්ච-S. 10 අවසිට්ඨානි-B.

ඛෙත්තස්ස තතියභාගං ලායිත්වා, එත්තකො භාගො ලායිතො, ද්වෙ අවසිට්ඨාති ජානාති; පුන එකං ලායිත්වා, ද්වෙ ලායිතා, එකො අවසිට්ඨොති ජානාති;[1] තස්මිම්පි ලායිතෙ සබ්බං නිට්ඨිතන්ති ජානාති; එවං සබ්බකිලෙසෙසු කතඤ්ච අකතඤ්ච ජානාති; තුම්හෙහිපි තථා ඤාතබ්බං සියාති දස්සෙති. **අකුසලානං ධම්මානං පහානන්ති** ඉමිනා අකුසලං පහාය කුසලං භාවෙත්වා සුද්ධත්තං පත්තා නිගණ්ඨා නාම තුම්හාකං සාසනෙ අත්ථීති පුච්ඡති. **එවං සන්තෙති** තුම්හාකං එවං අජානනභාවෙ සති; **ලුද්දාති** ලුද්දාචාරා; **ලොහිතපාණිනොති** පාණෙ ජීවිතා වොරොපෙන්තා[2] ලොහිතෙන මක්ඛිතපාණිනො; පාණං හිංසන්තස්සාපි[3] ලොහිතෙන පාණි මක්ඛීයති, සොපි ලොහිතපාණීත්වෙව වුච්චති. **කුරූරකම්මන්තාති** දාරුණකම්මා, මාතරි පිතරි ධම්මිකසමණබ්‍රාහ්මණාදීසු ච කතාපරාධා; මාගවිකාදයො වා කක්ඛළකම්මා.

**න ඛො ආවුසො ගොතමාති** ඉදං නිගණ්ඨා, අයං අම්හාකං වාදෙ දොසං දෙති, මයම්පිස්ස දොසං ආරොපෙමාති මඤ්ඤමානා ආරභිංසු. තස්සත්ථො: ආවුසො ගොතම යථා තුම්හෙ පණීතචීවරානි ධාරෙන්තා, සාලිමංසොදනං භුඤ්ජන්තා, දෙවවිමානවණ්ණාය ගන්ධකුටියා වසමානා සුඛෙන සුඛං අධිගච්ඡථ, න එවං සුඛෙන සුඛං අධිගන්තබ්බං. යථා පන මයං උක්කුටිකප්පධානාදීහි නානප්පකාරකං දුක්ඛං අනුභවාම, එවං දුක්ඛෙන සුඛං අධිගන්තබ්බන්ති. **සුඛෙන ච හාවුසොති** ඉදං, සචෙ සුඛෙන සුඛං අධිගන්තබ්බං සියා, රාජා අධිගච්ඡෙය්‍යාති දස්සනත්ථං වුත්තං. තත්ථ **මාගධොති** මගධරට්ඨස්ස ඉස්සරො; **සෙනියොති** තස්ස නාමං; **බිම්බීති** අත්තභාවස්ස නාමං; සො තස්ස සාරභූතො දස්සනීයො පාසාදිකොති අත්තභාවසමිද්ධියා **බිම්බිසාරොති** වුච්චති. **සුඛවිහාරිතරොති** ඉදං තෙ රඤ්ඤො තීසු පාසාදෙසු තිවිධවයෙහි නාටකෙහි සද්ධිං සම්පත්තිං අනුභවන්තං සන්ධාය වදන්ති.

**අද්ධාති** එකංසෙන; **සහසා අප්පටිසඞ්ඛාති** සාහසං කත්වා, අපච්චවෙක්ඛිත්වා; යථා රත්තා රාගවසෙන, දුට්ඨා දොසවසෙන, මූළ්හා මොහවසෙන භාසන්ති, එවමෙව වාචා[4] භාසිතාති දස්සෙති. තත්ථ **පටිපුච්ඡිස්සාමීති** තස්මිං අත්ථෙ පුච්ඡිස්සාමි. **යථා වො ඛමෙය්‍යාති** යථා තුම්හාකං රුච්චෙය්‍ය. **පහොතීති** සක්කොති. **අනිඤ්ජමානොති** අචලමානො. **එකන්තසුඛපටිසංවෙදීති** නිරන්තරසුඛපටිසංවෙදී. **අහං ඛො ආවුසො නිගණ්ඨා පහොමි එකන්තසුඛපටිසංවෙදීති** ඉදං අත්තනො ඵලසමාපත්තිසුඛං දස්සෙන්තො ආහ. එත්ථ ච කථාපතිට්ඨාපනත්ථං රාජවාරෙ **සත්ත** ආදිං කත්වා පුච්ඡා කතා. සත්ත රත්තින්දිවානි නප්පහොතීති වුත්තෙ, ඡප්පඤ්ච චත්තාරීති සුඛං පුච්ඡිතුං හොති. බුද්ධවාරෙ පන, **සත්තාති** වුත්තෙ පුන ඡප්පඤ්ච චත්තාරීති වුච්චමානං

1. අවසිට්ඨොති-E.
2. ඔරොපෙන්තා-E.
3. පාණං හි හනන්තස්ස යස්සපි-B. S.
4. එවමෙවං-L.

අනච්ඡරියං හොති; තස්මා එකං ආදිං කත්වා දෙසනා කතා. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

## චූළදුක්ඛක්ඛන්ධසුත්තවණ්ණනා නිට්ඨිතා.

---

## 1. 2. 5.

**එවං මෙ සුතන්ති** අනුමානසුත්තං. තත්ථ **භග්ගෙසූති** එවංනාමකෙ ජනපදෙ. වචනත්ථො පනෙත්ථ වුත්තානුසාරෙනෙව වෙදිතබ්බො. **සුංසුමාරගිරෙති** එවංනාමකෙ නගරෙ; තස්ස කිර නගරස්ස වත්ථු පරිග්ගහදිවසෙ අවිදූරෙ උදකරහදෙ සුංසුමාරො **සද්දමකාසි,** ගිරං නිච්ඡාරෙසි. අථ නගරෙ නිම්මිතෙ සුංසුමාරගිරන්තෙව්වස්ස නාමං අකංසු. **භෙසකළාවනෙති** භෙසකළානාමකෙ වනෙ; **භෙසකල**[1] වනෙතිපි පාඨො. **මිගදායෙති** තං වනං මිගපක්ඛීනං අභයං දින්නට්ඨානෙ ඨිතං;[2] තස්මා **මිගදායොති** වුච්චති.

**පවාරෙතීති** ඉච්ඡාපෙති; **වදන්තූති** ඔවාදානුසාසනවසෙන වදන්තු; ඔවදන්තු, අනුසාසන්තූති අත්ථො. **වචනීයොම්හීති** අහං තුම්හෙහි වත්තබ්බො; ඔවදිතබ්බො, අනුසාසිතබ්බොති අත්ථො. **සො ච හොති දුබ්බචොති** සො ච දුක්ඛෙන වත්තබ්බො හොති; වුත්තො න සහති. **දොවචස්සකරණෙහීති** දුබ්බචභාවකාරකෙහි[3] උපරි ආගතෙහි සොළසහි ධම්මෙහි. **අප්පදක්ඛිණග්ගාහී අනුසාසනින්ති** යො හි වුච්චමානො, තුම්හෙ මං කස්මා වදථ, අහං අත්තනො කප්පියාකප්පියං, සාවජ්ජානවජ්ජං, අත්ථානත්ථං ජානාමීති වදති, අයං අනුසාසනිං පදක්ඛිණතො න ගණ්හාති,වාමතොව ගණ්හාති[4],තස්මා **අප්පදක්ඛිණග්ගාහීති** වුච්චති.

**පාපිකානං ඉච්ඡානන්ති** ලාමකානං අසන්තසම්භාවනපත්ථනානං. **පටිප්ඵරතීති** පටිවිරුද්ධො පච්චනීකො හුත්වා තිට්ඨති. **අපසාදෙතීති** කිං නු ඛො[5] තුය්හං බාලස්ස අබ්‍යත්තස්ස භණිතෙන, ත්වම්පි නාම භණිතබ්බං මඤ්ඤිස්සසීති එවං ඝට්ටෙති. **පච්චාරොපෙතීති** ත්වම්පි ඛොසි ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො, තං තාව පටිකරොහීති එවං පටිආරොපෙති. **අඤ්ඤෙනඤ්ඤං පටිචරතීති** අඤ්ඤෙන කාරණෙන වචනෙන වා අඤ්ඤං කාරණං වචනං වා පටිච්ඡාදෙති. **ආපත්තිං ආපන්නොසීති** වුත්තො, කො ආපන්නො, කිං ආපන්නො, කිස්මිං ආපන්නො, කං භණථ, කිං භණථාති ච වදති. එවරූපං කිඤ්චි තයා දිට්ඨන්ති වුත්තෙ න සුණාමීති සොතං වා උපනෙති. **බහිද්ධා කථං අපනාමෙතීති** ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නොසීති පුට්ඨො පාටලිපුත්තං ගතොම්හීති වත්වා පුන න තව පාටලිපුත්තගමනං පුච්ඡාම, ආපත්තිං පුච්ඡාමාති වුත්තො,[6] තතො රාජගෙහං[7] ගතොම්හීති, රාජගෙහං වා යාහි බ්‍රාහ්මණගෙහං වා,[8] ආපත්තිං ආපන්නොසීති, තත්ථ සූකරමංසං

---

1. භෙසකා-S. භෙසගල-B.
2. ඨානං-B. S.
3. දුබ්බචකාරකෙහි-S, කරණෙහි-B.
4. වාමතො ගණ්හාති-B, S.
5. කිං ඛො-L.
6. වුත්තෙ-B. S.
7. රාජගහං-L, E.
8. රාජගහං වා යාහි බ්‍රාහ්මණගහං වා-L, E.

ලද්ධන්ති ආදීනි වදන්තො කථං බහිද්ධා වික්ඛිපති. **අපදානෙති** අත්තනො චරියාය; **න සම්පායතීති** ආවුසො ත්වං කුහිං වසසි, කං නිස්සාය වසසීති වා, යං ත්වං වදෙසි: මයා එස ආපත්තිං ආපජ්ජන්තො[1] දිට්ඨොති, ත්වං තස්මිං සමයෙ කිං කරොසි, අයං කිං කරොතී,[2] කත්ථ ච ත්වං අහොසි කත්ථ ච අයන්ති[3] ආදිනා නයෙන චරියං පුට්ඨො සම්පාදෙත්වා කථෙතුං න සක්කොති.

**තත්‍රාවුසොති** ආවුසො තෙසු සොළසසු ධම්මෙසු. **අත්තනාව අත්තානං එවං අනුමිනිතබ්බන්ති**[4] එවං අත්තනාව අත්තා අනුමෙතබ්බො, තුලිතබ්බො,[5] තීරෙතබ්බො. **පච්චවෙක්ඛිතබ්බන්ති** පච්චවෙක්ඛිතබ්බො.[6] **අහොරත්තානුසික්ඛිනාති** දිවාපි රත්තිම්පි සික්ඛන්තෙන; රත්තිඤ්ච දිවා ච කුසලෙසු ධම්මෙසු සික්ඛන්තෙන පීතිපාමොජ්ජමෙව උප්පාදෙතබ්බන්ති අත්ථො.

**ආදාසෙ වා උදපත්තෙති** පසන්නෙ වා උදකභාජනෙ; **මුඛනිමිත්තන්ති** මුඛපටිබිම්බං. **රජන්ති** ආගන්තුකරජං; **අඞ්ගණන්ති** තත්ථ ජාතකං තිලකං වා පිළකං වා. **සබ්බෙපිමෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙති** ඉමිනා සබ්බං පහානං කථෙසි. කථං? එත්තකා අකුසලා ධම්මා පබ්බජිතස්ස නානුච්ඡවිකාති පටිසඞ්ඛානං උප්පාදයතො හි පටිසඞ්ඛානපහානං[7] කථිතං හොති. සීලපදට්ඨානං කත්වා කසිණපරිකම්මං ආරභිත්වා අට්ඨසමාපත්තියො නිබ්බත්තෙන්තස්ස වික්ඛම්භනප්පහානං කථිතං. සමාපත්තිපදට්ඨානං කත්වා විපස්සනං වඩ්ඪෙන්තස්ස තදඞ්ගප්පහානං කථිතං. විපස්සනං වඩ්ඪෙත්වා මග්ගං භාවෙන්තස්ස සමුච්ඡෙදප්පහානං කථිතං. ඵලෙ ආගතෙ පටිප්පස්සද්ධිප්පහානං, නිබ්බානෙ ආගතෙ නිස්සරණප්පහානන්ති එවං ඉමස්මිං සුත්තෙ සබ්බං පහානං කථිතං හොති.

ඉදං හි සුත්තං භික්ඛුපාතිමොක්ඛං නාමාති පොරාණා වදන්ති. ඉදං දිවසස්ස තික්ඛත්තුං පච්චවෙක්ඛිතබ්බං; පාතො වසනට්ඨානං පවිසිත්වා නිසින්නෙන, ඉමෙ එත්තකා කිලෙසා අත්ථි නු ඛො මය්හං, නත්ථීති පච්චවෙක්ඛිතබ්බා. සචෙ අත්ථීති පස්සති, තෙසං පහානාය වායමිතබ්බං; නො චෙ පස්සති, සුපබ්බජිතොම්හීති අත්තමනෙන භවිතබ්බං. භත්තකිච්චං කත්වා රත්තිට්ඨානෙ දිවාට්ඨානෙ වා නිසීදිත්වාපි පච්චවෙක්ඛිතබ්බං. සායං වසනට්ඨානෙ නිසීදිත්වාපි පච්චවෙක්ඛිතබ්බං. තික්ඛත්තුං අසක්කොන්තෙන ද්වෙ වාරෙ පච්චවෙක්ඛිතබ්බං. ද්වෙ වාරෙ අසක්කොන්තෙන පන අවස්සං එකවාරං පච්චවෙක්ඛිතබ්බං. අපච්චවෙක්ඛිතුං න වට්ටතීති වදන්ති. සෙසං සබ්බත්ථ උත්තානමෙවාති.[8]

අනුමානසුත්තවණ්ණනා නිට්ඨිතා.

---

1. ආපන්නො-B. S.
2. අහං කිං කරෙමි-S.
3. කත්ථ වා ත්වං අවජසි කත්ථ වා අගන්ති-S.
4. අනුමාහිතබ්බන්ති-B. S.
5. තුලෙතබ්බා-S. E.
6. තීරෙතබ්බා පච්චවෙක්ඛිතබ්බා, [illegible]
7. පටිසඞ්ඛානපහානං-S.
8. උත්තානත්ථමෙවාති-B, S.

## 1. 2. 6.

**එවම්මෙ සුතන්ති** චෙතොඛිලසුත්තං. තත්ථ **චෙතොඛිලාති** චිත්තස්ස ථද්ධභාවා, කචවරභාවා, ඛාණුකභාවා. **චෙතසො විනිබද්ධා**[1]ති චිත්තං බන්ධිත්වා මුට්ඨියං කත්වා විය ගණ්හන්තීති චෙතසො විනිබද්ධා.[1] වුඩ්ඪින්ති ආදීසු සීලෙන වුඩ්ඪිං, මග්ගෙන **විරූළ්හිං**, නිබ්බානෙන **වෙපුල්ලං**. සීලසමාධීහි වා වුඩ්ඪිං, විපස්සනාමග්ගෙහි **විරූළ්හිං**, ඵලනිබ්බානෙහි **වෙපුල්ලං**.

**සත්ථරි කඞ්ඛතීති** සත්ථු සරීරෙ වා ගුණෙ වා කඞ්ඛති. සරීරෙ කඞ්ඛමානො, ද්වත්තිංසවරලක්ඛණපතිමණ්ඩිතං නාම සරීරං අත්ථි නු ඛො නත්ථීති කඞ්ඛති; ගුණෙ කඞ්ඛමානො, අතීතානාගතපච්චුප්පන්න ජානනසමත්ථං සබ්බඤ්ඤුතඤ්ඤාණං අත්ථි නු ඛො නත්ථීති කඞ්ඛති. **විචිකිච්ඡතීති** විචිනන්තො කිච්ඡති, දුක්ඛං ආපජ්ජති, විනිච්ඡෙතුං න සක්කොති. **නාධිමුච්චතීති** එවමෙතන්ති අධිමොක්ඛං න පටිලභති. **න සම්පසීදතීති** ගුණෙසු[2] ඔතරිත්වා නිබ්බිචිකිච්ඡභාවෙන පසීදිතුං, අනාවිලො භවිතුං න සක්කොති. **ආතප්පායාති** කිලෙසසන්තාපක[3] විරියකරණත්ථාය; **අනුයොගායාති** පුනප්පුනයොගාය; **සාතච්චායාති** සතතක්‍රියාය; **පධානායාති** පදහනත්ථාය. **අයං පඨමො චෙතොඛිලොති** අයං සත්ථරි විචිකිච්ඡාසඞ්ඛාතො පඨමො චිත්තස්ස ථද්ධභාවො, එවමෙතස්ස භික්ඛුනො අප්පහීනො හොති.

**ධම්මෙති** පරියත්තිධම්මෙ ච පටිවෙධධම්මෙ ච. පරියත්තිධම්මෙ කඞ්ඛමානො, තෙපිටකං බුද්ධවචනං චතුරාසීති ධම්මක්ඛන්ධසහස්සානීති වදන්ති, අත්ථි නු ඛො එතං නත්ථීති කඞ්ඛති. පටිවෙධධම්මෙ කඞ්ඛමානො, විපස්සනානිස්සන්දො මග්ගො නාම, මග්ගනිස්සන්දො ඵලං නාම, සබ්බසඞ්ඛාරපටිනිස්සග්ගො නිබ්බානං නාමාති වදන්ති, තං අත්ථි නු ඛො නත්ථීති කඞ්ඛති. **සඞ්ඝෙ කඞ්ඛතීති** සුප්පටිපන්නොති ආදීනං පදානං වසෙන එවරූපං පටිපදං පටිපන්නා, චත්තාරො මග්ගට්ඨා, චත්තාරො ඵලට්ඨාති අට්ඨන්නං පුග්ගලානං සමූහභූතො සඞ්ඝො නාම අත්ථි නු ඛො නත්ථීති කඞ්ඛති. සික්ඛාය කඞ්ඛමානො, අධිසීලසික්ඛා නාම, අධිචිත්ත-අධිපඤ්ඤාසික්ඛා නාමාති වදන්ති, සා අත්ථි නු ඛො නත්ථීති කඞ්ඛති. **අයං පඤ්චමොති** අයං සබ්‍රහ්මචාරීසු කොපසඞ්ඛාතො පඤ්චමො චිත්තස්ස ථද්ධභාවො, කචවරභාවො, ඛාණුකභාවො.

**විනිබද්ධෙසු**[4] **කාමෙති** වත්ථුකාමෙපි කිලෙසකාමෙපි. **කායෙති** අත්තනො කායෙ. **රූපෙති** බහිද්ධා රූපෙ. **යාවදත්ථන්ති** යත්තකං ඉච්ඡති තත්තකං. **උදරාවදෙහකන්ති** උදරපූරං; තං හි උදරං අවදෙහනතො උදරාවදෙහකන්ති වුච්චති. **සෙය්‍යසුඛන්ති** මඤ්චපීඨසුඛං, උතුසුඛං වා; **පස්සසුඛන්ති** යථා සම්පරිවත්තකං සයන්තස්ස දක්ඛිණපස්ස වාමපස්සානං[5] සුඛං හොති, එවං උප්පන්නසුඛං; **මිද්ධසුඛන්ති** නිද්දාසුඛං;

1. විනිබන්ධා-S. E. 2. ගුණෙසි-L. 3. සන්තාප-L. 4. විනිබන්ධෙසු-S. E.
5. දක්ඛිණපස්සෙන වාමපස්සෙන-A. M1. M2. P2. R. T. V. W1.

**අනුයුත්තොති** යුත්තපයුත්තො විහරති. **පණිධායාති** පත්ථයිත්වා. **සීලෙනාති** ආදිසු **සීල**න්ති චතුපාරිසුද්ධිසීලං; **වත**න්ති වතසමාදානං; **තපො**ති තපචරණං; **බ්‍රහ්මචරිය**න්ති මෙථුනවිරති. **දෙවො වා භවිස්සාමීති** මහෙසක්ඛදෙවො වා භවිස්සාමි; **දෙවඤ්ඤතරො වාති** අප්පෙසක්ඛදෙවෙසු වා අඤ්ඤතරො.

ඉද්ධිපාදෙසු ඡන්දං නිස්සාය පවත්තො සමාධි ඡන්දසමාධි; පධානභූතා සඞ්ඛාරා **පධානසඞ්ඛාරා**; **සමන්නාගත**න්ති තෙහි ධම්මෙහි උපෙතං; ඉද්ධියා පාදං, ඉද්ධිභූතං වා පාදන්ති **ඉද්ධිපාදං**; සෙසෙසුපි එසෙව නයො. අයමෙත්ථ සඞ්ඛෙපො. විත්ථාරො පන ඉද්ධිපාදවිභඞ්ගෙ ආගතොයෙව. විසුද්ධිමග්ගෙ පනස්ස අත්ථො දීපිතො. ඉති ඉමෙහි චතූහි ඉද්ධිපාදෙහි වික්ඛම්භනප්පහානං කථිතං. **උස්සොළ්හීයෙව පඤ්චමීති** එත්ථ **උස්සොළ්හීති** සබ්බත්ථ කත්තබ්බවිරියං දස්සෙති.

**උස්සොළ්හීපන්නරසඞ්ගසමන්නාගතොති** පඤ්චචෙතොඛිලප්පහානානි, පඤ්චවිනිබන්ධප්පහානානි, චත්තාරො ඉද්ධිපාදා, උස්සොළ්හීති එවං උස්සොළ්හියා සද්ධිං පන්නරසහි අඞ්ගෙහි[1] සමන්නාගතො. **භබ්බොති** අනුරූපො, අනුච්ඡවිකො; **අභිනිබ්බිදායාති** ඤාණෙන කිලෙසභෙදාය; **සම්බොධායාති** චතුමග්ගසම්බොධාය; **අනුත්තරස්සාති** සෙට්ඨස්ස; **යොගක්ඛෙමස්සාති** චතූහි යොගෙහි ඛෙමස්ස අරහත්තස්ස; **අධිගමායාති** පටිලාභාය

**සෙය්‍යථාති** ඔපම්මත්ථෙ නිපාතො; **පී**ති සම්භාවනත්ථෙ; උභයෙනාපි සෙය්‍යථාපි නාම භික්ඛවෙති දස්සෙති. **කුක්කුටියා අණ්ඩානීති අට්ඨ වා දස වා ද්වාදස වාති** එත්ථ[2] කිඤ්චාපි කුක්කුටියා වුත්තප්පකාරතො ඌනාධිකානිපි **අණ්ඩානි** හොන්ති, වචනසිලිට්ඨතාය පන එතං වුත්තං. එවං හි ලොකෙ සිලිට්ඨං වචනං හොති. **තානස්සූති** තානි අස්සු, භවෙය්‍යුන්ති අත්ථො. **කුක්කුටියා සම්මා අධිසයිතානීති** තාය ජනෙත්තියා කුක්කුටියා පක්ඛෙ පසාරෙත්වා තෙසං උපරි සයන්තියා සම්මා අධිසයිතානි; **සම්මා පරිසෙදිතානීති** කාලෙන කාලං උතුං ගණ්හාපෙන්තියා[3] සුට්ඨු සමන්තතො සෙදිතානි, උස්මීකතානි; **සම්මා පරිභාවිතානීති** කාලෙන කාලං සුට්ඨු සමන්තතො භාවිතානි; කුක්කුටගන්ධං ගාහාපිතානීති අත්ථො. **කිඤ්චාපි තස්සා කුක්කුටියාති** තස්සා කුක්කුටියා ඉධ[4] තිවිධකිරියාකරණෙන අප්පමාදං කත්වා කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය. **අථ ඛො භබ්බාව තෙති** අථ ඛො තෙ කුක්කුටපොතකා වුත්තනයෙන සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං භබ්බාව. **තෙ** හි යස්මා තාය කුක්කුටියා එවං තීහාකාරෙහි තානි **අණ්ඩානි** පරිපාලියමානානි න පූතීනි හොන්ති, යොපි නෙසං අල්ලසිනෙහො සො පරියාදානං ගච්ඡති, කපාලං තනුකං හොති, පාදනඛසිඛා ච මුඛතුණ්ඩකඤ්ච ඛරං හොති, සයම්පි පරිපාකං ගච්ඡන්ති,

1. පණ්ණරසහි-B. S.
2. එත්ථ පන-B. S.
3. ගාහාපෙන්තියා-B. S.
4. ඉමං-B. S.

කපාලස්ස තනුකත්තා බහි ආලොකො අන්තො පඤ්ඤායති; තස්මා චිරං වත මයං සඞ්කුචිත[1]හත්ථපාදා සම්බාධෙ සයිම්හ, අයඤ්ච බහි ආලොකො දිස්සති, එත්ථදානි නො සුඛවිහාරො භවිස්සතීති නික්ඛමිතුකාමා හුත්වා කපාලං පාදෙන පහරන්ති, ගීවං පසාරෙන්ති. තතො තං කපාලං ද්වෙධා භිජ්ජති. අථ තෙ[2] පක්ඛෙ විධුනන්තා තඞ්ඛණානුරූපං විරවන්තා නික්ඛමන්තියෙව; නික්ඛමිත්වා ච ගාමක්ඛෙත්තං උපසොභයමානා විචරන්ති.

**එවමෙව ඛො**ති ඉදං ඔපම්මසම්පටිපාදනං. තං එවං අත්ථෙන සංසන්දෙත්වා වෙදිතබ්බං: තස්සා කුක්කුටියා අණ්ඩෙසු තිවිධකිරියාකරණං විය හි ඉමස්ස භික්ඛුනො උස්සොළ්හිපන්නරසෙහි අඞ්ගෙහි සමන්නාගතභාවො; කුක්කුටියා තිවිධකිරියාසම්පාදනෙන අණ්ඩානං අපූතිභාවො විය පන්නරසඞ්ගසමන්නාගතස්ස භික්ඛුනො තිවිධානුපස්සනාසම්පාදනෙන විපස්සනාඤාණස්ස අපරිහානි; තස්සා තිවිධකිරියාකරණෙන අණ්ඩානං අල්ලසිනෙහපරියාදානං විය තස්ස භික්ඛුනො තිවිධානුපස්සනාසම්පාදනෙන භවත්තයානුගතනිකන්තිසිනෙහපරියාදානං; අණ්ඩකපාලානං තනුභාවො විය භික්ඛුනො අවිජ්ජණ්ඩකොසස්ස තනුභාවො; කුක්කුටපොතකානං පාදනඛතුණ්ඩකානං[3] ථද්ධඛරභාවො විය භික්ඛුනො විපස්සනාඤාණස්ස තික්ඛඛරවිප්පසන්නභාවො;[4] කුක්කුටපොතකානං පරිණාමකාලො විය භික්ඛුනො විපස්සනාඤාණස්ස පරිණාමකාලො, වඩ්ඪිතකාලො, ගබ්භග්ගහණකාලො; කුක්කුටපොතකානං පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා පක්ඛෙ පප්ඵොටෙත්වා සොත්ථිනා අභිනිබ්භිදාකාලො විය තස්ස භික්ඛුනො විපස්සනාඤාණං ගබ්භං ගණ්හාපෙත්වා විචරන්තස්ස තජ්ජාතිකං[5] උතුසප්පායං වා භොජනසප්පායං වා පුග්ගලසප්පායං වා ධම්මසවනසප්පායං වා ලභිත්වා එකාසනෙ නිසින්නස්සෙව විපස්සනං වඩ්ඪෙන්තස්ස අනුපුබ්බාධිගතෙන අරහත්තමග්ගෙන අවිජ්ජණ්ඩකොසං පදාලෙත්වා අභිඤ්ඤාපක්ඛෙ පසාරෙත්වා පප්ඵොටෙත්වා සොත්ථිනා අරහත්තප්පත්තකාලො වෙදිතබ්බො.

යථා පන කුක්කුටපොතකානං පරිණතභාවං ඤත්වා මාතාපි අණ්ඩකොසං භින්දති, එවං තථාරූපස්ස භික්ඛුනො ඤාණපරිපාකං ඤත්වා සත්ථාපි,

"උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකංව පාණිනා,
සන්තිමග්ගමෙව බ්‍රූහය නිබ්බානං සුගතෙන දෙසිත"න්ති

ආදිනා නයෙන ඔභාසඵරණගාථාය[6] අවිජ්ජණ්ඩකොසං පහරති. සො ගාථාපරියොසානෙ අවිජ්ජණ්ඩකොසං භින්දිත්වා අරහත්තං පාපුණාති. තතො පට්ඨාය යථා තෙ කුක්කුටපොතකා ගාමක්ඛෙත්තං උපසොභය

1. සංකුචිත-B. S. 2. අථ තෙ-B. අථ ඛො-S.
3. පාදනඛමුඛතුණ්ඩකානං-B. පාදනඛසිඛමුඛතුණ්ඩකානං-S.
4. විප්පසන්නසූරභාවො-B. S. 5. තජ්ජකං-P1.
6. ඔභාසං ඵරිත්වා ගාථාය-S, ඵරෙත්වා-B.

ගාහා තත්ථ තත්ථ චරති[1], එවං අයම්පි මහාඛීණාසවො නිබ්බානාරම්මණං ඵලසමාපත්තිං අප්පෙත්වා සඞ්ඝාරාමං උපසොභයමානො විචරති. ඉති ඉමස්මිං සුත්තෙ චත්තාරි පහානානි කථිතානි. කථං? චෙතොඛිලානං හි චෙතොවිනිබන්ධානඤ්ච පහානෙන පටිසඞ්ඛාපහානං කථිතං; ඉද්ධිපාදෙහි වික්ඛම්භනප්පහානං[2]; මග්ගෙ ආගතෙ සමුච්ඡෙදප්පහානං;[2] ඵලෙ ආගතෙ පටිප්පස්සද්ධිප්පහානං[2] සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

**චෙතොඛිලසුත්තවණ්ණනා නිට්ඨිතා.**

---

**1. 2. 7.**

**එවමෙම සුතන්ති** වනපත්ථපරියායං. තත්ථ **වනපත්ථපරියායන්ති** වනපත්ථකාරණං, වනපත්ථදෙසනං වා. **වනපත්ථං උපනිස්සාය විහරතීති** මනුස්සූපචාරං අතික්කන්තං වනසණ්ඩසෙනාසනං නිස්සාය සමණධම්මං කරොන්තො විහරති. **අනුපට්ඨිතාති** ආදිසු[3] පුබ්බෙ **අනුපට්ඨිතා සති**, තං උපනිස්සාය විහරතොපි **න උපට්ඨාති**; පුබ්බෙ **අසමාහිතං චිත්තං න සමාධියති**; පුබ්බෙ **අපරික්ඛීණා ආසවා න පරික්ඛයං ගච්ඡන්ති**; පුබ්බෙ **අනනුප්පත්තං අනුත්තරං යොගක්ඛෙම**සඞ්ඛාතං අරහත්තඤ්ච න පාපුණාතීති අත්ථො. **ජීවිතපරික්ඛාරාති** ජීවිතසම්භාරා; **සමුදානෙතබ්බාති** සමාහරිතබ්බා. **කසිරෙන සමුදාගච්ඡන්තීති** දුක්ඛෙන උප්පජ්ජන්ති. **රත්තිභාගං වා දිවසභාගං වාති** රත්තිකොට්ඨාසෙ වා දිවසකොට්ඨාසෙ වා. එත්ථ ච රත්තිභාගෙ පටිසඤ්චික්ඛමානෙන ඤත්වා රත්තිංයෙව පක්කමිතබ්බං; රත්තිං චණ්ඩවාළාදීනං පරිපන්ථෙ[4] සති අරුණුග්ගමනං ආගමෙතබ්බං. දිවසභාගෙ ඤත්වා දිවා පක්කමිතබ්බං; දිවා පරිපන්ථෙ සති සූරියත්ථඞ්ගමනං ආගමෙතබ්බං. **සඞ්ඛාපීති** එවං සමණධම්මස්ස අනිප්ඵජ්ජනභාවං ජානිත්වා. අනන්තරවාරෙ පන[5] **සඞ්ඛාපීති** එවං සමණධම්මස්ස නිප්ඵජ්ජනභාවං ජානිත්වා. **යාවජීවන්ති** යාව ජීවිතං පවත්තති, තාව වත්ථබ්බමෙව.

**සො පුග්ගලොති** පදස්ස **නානුබන්ධිතබ්බොති** ඉමිනා සම්බන්ධො. **අනාපුච්ඡාති** ඉධ පන තං පුග්ගලං අනාපුච්ඡා පක්කමිතබ්බන්ති අත්ථො. **සඞ්ඛාපීති** එවං සමණධම්මස්ස අනිප්ඵජ්ජනභාවං ඤත්වා **සො පුග්ගලො නානුබන්ධිතබ්බො**. තං **අනාපුච්ඡා පක්කමිතබ්බං**. **අපි පනුජ්ජමානෙනපීති** අපි නික්කඩ්ඪියමානෙනපි. එවරූපො හි පුග්ගලො සචෙපි දාරුකලාපසතං,[6] උදකඝටසතං,[6] වාලිකම්බණසතං වා දණ්ඩං ආහරාපෙති, මා ඉධ වසීති නික්කඩ්ඪාපෙති වා, තං ඛමාපෙත්වා යාවජීවං වත්ථබ්බමෙවාති.

**වනපත්ථ[7]සුත්තවණ්ණනා නිට්ඨිතා.**

---

1. විචරති-B
2. පහානං කථිතං-B. S.
3. ආදිසු පන-A. M1, M2. P2, R. T V, W1.
4. පරිබන්ධෙ-B.
5. අනන්තරවාරෙ-L.
6. සතං වා-B.
7. වනපත්ථපරියාය-B, S.

## 1. 2. 8.

**එවමෙම සුතන්ති** මධුපිණ්ඩිකසුත්තං. තත්ථ **මහාවනන්ති** හිමවන්තෙන සද්ධිං එකාබද්ධං අරොපිමං[1] ජාතිවනං; න යථා වෙසාලියං රොපිතාරොපිතමිස්සකං. **දිවාවිහාරායාති** දිවා පතිසල්ලානත්ථාය. **බෙලුවලට්ඨිකායාති** තරුණබෙලුවරුක්ඛස්ස. **දණ්ඩපාණීති** න ජරාදුබ්බලතාය දණ්ඩහත්ථො; අයං හි තරුණො පඨමවයෙ ඨිතො; දණ්ඩවිත්තතාය[2] පන සුවණ්ණදණ්ඩං ගහෙත්වා විචරති; තස්මා **දණ්ඩපාණීති** වුත්තො. **ජඞ්ඝාවිහාරන්ති** ජඞ්ඝාකිලමථවිනොදනත්ථං ජඞ්ඝාචාරං; **අනුචඞ්කමමානො අනුවිචරමානොති** ආරාමදස්සනවනදස්සනපබ්බතදස්සනාදීනං අත්ථාය ඉතො චිතො ච චරමානො. අධිච්චනික්ඛමනො[3] කිරෙස කදාචිදෙව නික්ඛමිත්වා එවං විචරති. **දණ්ඩමොලුබ්භාති** දණ්ඩං ඔලුම්බිත්වා[4] ගොපාලදාරකො විය දණ්ඩං පුරතො ඨපෙත්වා දණ්ඩමත්ථකෙ ද්වෙ හත්ථෙ පතිට්ඨපෙත්වා පිට්ඨිපාණිං හනුකෙන උප්පීළෙත්වා එකමන්තං අට්ඨාසි.

**කිංවාදීති** කිංදිට්ඨිකො; **කිමක්ඛායීති** කිං කථෙති. අයං රාජා භගවන්තං අවන්දිත්වා පටිසන්ථාරමත්තකමෙව කත්වා පඤ්හං පුච්ඡති; තම්පි න අඤ්ඤාතුකාමතාය; අචිත්තිකාරෙනෙව පුච්ඡති. කස්මා? දෙවදත්තපක්ඛිකො කිරෙස. දෙවදත්තො අත්තනො සන්තිකං ආගච්ඡමානෙ තථාගතෙ භින්දති. සො කිර එවං වදෙති: සමණො ගොතමො අම්හාකං කුලෙන සද්ධිං වෙරී, න නො කුලස්ස වඩ්ඪිං[5] ඉච්ඡති. භගිනීපි මෙ චක්කවත්තිපරිභොගා, තං පහාය, තස්සෙසාති නික්ඛමිත්වා පබ්බජි. භාගිනෙය්‍යොපි මෙ චක්කවත්තිබීජන්ති ඤත්වා අම්හාකං කුලස්ස වඩ්ඪියා අතුස්සන්තො, තස්සතෙතනාති තම්පි දහරකාලෙයෙව පබ්බාජෙසි. අහං පනෙතෙන විනා වත්තිතුං අසක්කොන්තො අනුපබ්බජිතො. එවං පබ්බජිතම්පි මං පබ්බජිතදිවසතො පට්ඨාය න උජුකෙහි අක්ඛීහි ඔලොකෙති. පරිසමජ්ඣෙ භාසන්තො ච[6] මහාඵරසුනා පහරන්තො විය, ආපායිකො දෙවදත්තොති ආදීනි භාසතීති. එවං අයම්පි රාජා දෙවදත්තෙන භින්නො; තස්මා එවමකාසි.

අථ භගවා, යථා අයං රාජා මයා පඤ්හෙ පුච්ඡිතෙ න කථෙතීති වත්තුං න ලභති, යථා ච භාසිතස්ස අත්ථං න ආජානාති, එවමස්ස කථෙස්සාමීති තස්සානුච්ඡවිකං කථෙන්තො, **යථාවාදී ඛො**ති ආදිමාහ. තත්ථ **න කෙනචි ලොකෙ විග්ගය්හ තිට්ඨතීති** ලොකෙ කෙනචි සද්ධිං විග්ගාහිකකථං න කරොති, න විවදති. තථාගතො හි ලොකෙන සද්ධිං න විවදති. ලොකො පන තථාගතෙන සද්ධිං, අනිච්චන්ති වුත්තෙ නිච්චන්ති වදමානො, දුක්ඛං...අනත්තා...අසුභන්ති වුත්තෙ සුභන්ති වදමානො විවදති. **තෙනෙවාහ**: "නාහං භික්ඛවෙ ලොකෙන විවදාමි,

1. අරොපිතං-B. S.
2. විත්තතාය-L. S. E.
3. නික්ඛමනො--L. E. අභිනික්ඛමනො-S.
4. ඔලුම්භිත්වා-B. ඔලම්බිත්වා-E.
5. වුද්ධිං-B.
6. භාසන්තොපි-B. S

ලොකො ච ඛො භික්ඛවෙ මයා විවදතී"ති. තථා, "න භික්ඛවෙ ධම්මවාදී කෙනචි විවදති, අධම්මවාදී ච ඛො භික්ඛවෙ විවදතී"ති. **යථාති** යෙන කාරණෙන. **කාමෙහීති** වත්ථුකාමෙහිපි කිලෙසකාමෙහිපි. **තං බ්‍රාහ්මණන්ති** තං ඛීණාසවබ්‍රාහ්මණං; **අකථංකථින්ති** නිබ්බිචිකිච්ඡං; **ඡින්නකුක්කුච්චන්ති** විප්පටිසාරකුක්කුච්චස්ස චෙව හත්ථපාදකුක්කුච්චස්ස ච ඡින්නත්තා ඡින්නකුක්කුච්චං; **භවාභවෙති** පුනප්පුනභවෙ, හීනපණීතෙ වා භවෙ; පණීතො හි භවො වුද්ධිප්පත්තත්තා අභවොති වුච්චති. **සඤ්ඤාති** කිලෙසසඤ්ඤා; කිලෙසායෙව වා ඉධ සඤ්ඤානාමෙන වුත්තා. තස්මා යෙන කාරණෙන කාමෙහි විසංයුත්තං විහරන්තං තං ලොකෙ නිබ්බිවාදං[1] ඛීණාසවබ්‍රාහ්මණං කිලෙසසඤ්ඤා නානුසෙන්ති, තඤ්ච කාරණං අහං වදාමීති අයමෙත්ථ අත්ථො. ඉති භගවා අත්තනො ඛීණාසවභාවං දීපෙති.

**නිල්ලාළෙත්වාති** නීහරිත්වා, කීළාපෙත්වා; **තිවිසාඛන්ති** තිසාඛං; **නලාටිකන්ති** වලිභඞ්ගං;[2] නලාටෙ තිස්සො රාජියො දස්සෙන්තො වලිභඞ්ගං[2] වුට්ඨාපෙත්වාති අත්ථො; **දණ්ඩමොලුබ්භාති** දණ්ඩං උප්පීළෙත්වා; දණ්ඩමාලුබ්භාතිපි පාඨො; ගහෙත්වා පක්කාමීති අත්ථො.

**අඤ්ඤතරොති** නාමෙන අපාකටො එකො භික්ඛු; සො කිර අනුසන්ධිකුසලො; භගවතා යථා දණ්ඩපාණි න ජානාති තථා මයා කථිතන්ති වුත්තෙ කින්ති නු ඛො[3] භගවතා අවිඤ්ඤෙය්‍යං කත්වා පඤ්හො කථිතොති අනුසන්ධිං ගහෙත්වා දසබලං යාචිත්වා ඉමං පඤ්හං භික්ඛුසඞ්ඝස්ස පාකටං කරිස්සාමීති උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කත්වා දසනඛසමුජ්ජලං අඤ්ජලිං පග්ගය්හ, **කිංවාදී පන භන්තෙ භගවාති** ආදිමාහ.

**යතොනිදානන්ති** භාවනපුංසකං එතං යෙන කාරණෙන, යස්මිං කාරණෙ සතීති අත්ථො. **පපඤ්චසඤ්ඤාසඞ්ඛාති** එත්ථ සඞ්ඛාති කොට්ඨාසා; **පපඤ්චසඤ්ඤාති** තණ්හාදිට්ඨිපපඤ්චසම්පයුත්තා සඤ්ඤා; සඤ්ඤානාමෙන වා පපඤ්චායෙව වුත්තා; තස්මා පපඤ්චකොට්ඨාසාති අයමෙත්ථ අත්ථො. **සමුදාචරන්තීති** පවත්තන්ති. **එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බන්ති** යස්මිං[4] ද්වාදසායතනසඞ්ඛාතෙ කාරණෙ සති පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති, එත්ථ එකායතනම්පි චෙ අභිනන්දිතබ්බං, අභිවදිතබ්බං, අජ්ඣොසෙතබ්බං නත්ථීති අත්ථො. තත්ථ **අභිනන්දිතබ්බන්ති** අහං මමාති[5] අභිනන්දිතබ්බං; **අභිවදිතබ්බන්ති** අහං මමාති[5] වත්තබ්බං; **අජ්ඣොසෙතබ්බන්ති** අජ්ඣොසෙත්වා ගිලිත්වා පරිනිට්ඨාපෙත්වා ගහෙතබ්බයුත්තකං. එතෙනෙත්ථ තණ්හාදීනංයෙව අප්පවත්තිං කථෙති.

**එසෙවන්තොති** අයං අභිනන්දනාදීනං නත්ථිභාවොව රාගානුසයානං අන්තො. එසෙව නයො සබ්බත්ථ. දණ්ඩාදානාදීසු පන යාය චෙතනාය දණ්ඩං ආදියති, සා දණ්ඩාදානං; යාය සත්ථං ආදියති,

1. නිබ්බිවාදිං-E  2. වලිභඞ්ගක-B.  3. කින්නු ඛො-L.
4 තස්මිං-I.  5 මමන්ති-B. S.

පරාමසති, සො **සත්ථාදානං**; මත්තප්පත්තං **කලහං**; නානාගාහප්පත්තං **විග්ගහං**; නානාවාදප්පත්තං **විවාදං**; ත්වං ත්වන්ති[1] එවං පවත්තං **තුවංතුවං**;[2] පියසුඤ්ඤකරණං **පෙසුඤ්ඤං**; අයථාසභාවං මුසාවාදං කරොති සො **මුසාවාදො**ති වෙදිතබ්බො.

**එත්ථෙතෙ**ති එත්ථ ද්වාදසසු ආයතනෙසු එතෙ. කිලෙසා හි උප්පජ්ජමානාපි ද්වාදස ආයතනානි නිස්සාය උප්පජ්ජන්ති; නිරුජ්ඣමානාපි ද්වාදසසු ආයතනෙසුයෙව නිරුජ්ඣන්ති. එවං යත්ථුප්පන්නා තත්ථෙව නිරුද්ධා හොන්ති. ස්වායමත්ථො සමුදයසච්චපඤ්හෙන දීපෙතබ්බො. "සා ඛො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති, කත්ථ නිවිසමානා නිවිසතී"ති හි වත්වා, "යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං? චක්ඛුං ලොකෙ පියරූපං සාතරූප"න්ති ආදිනා නයෙන ද්වාදසසුයෙව ආයතනෙසු තණ්හාය උප්පත්ති ච නිරොධො ච වුත්තො. යථෙව ච තණ්හා ද්වාදසසු ආයතනෙසු උප්පජ්ජිත්වා නිබ්බානං ආගම්ම නිරුද්ධාපි ආයතනෙසු පුන සමුදාචාරස්ස අභාවතො ආයතනෙසු යෙව[3] නිරුද්ධාති වුත්තා, එවමිමෙපි පාපකා අකුසලා ධම්මා ආයතනෙසු නිරුජ්ඣන්තීති වෙදිතබ්බා.

අථ වා ය්වායං අභිනන්දනාදීනං අභාවොව රාගානුසයාදීනං අන්තොති වුත්තො, එත්ථෙතෙ රාගානුසයාදීනං අන්තොති ලද්ධවොහාරෙ නිබ්බානෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. යං හි යත්ථ නත්ථි, තං තත්ථ නිරුද්ධං නාම හොති. ස්වායමත්ථො නිරොධපඤ්හෙන දීපෙතබ්බො. වුත්තඤ්හෙතං: "දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා, වචීසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්තී"ති ආදි.

**සත්ථු චෙව සංවණ්ණිතො**ති සත්ථාරා ච පසත්ථො. **විඤ්ඤූන**න්ති ඉදම්පි කරණත්ථෙ සාමිවචනං; පණ්ඩිතෙහි **සබ්‍රහ්මචාරීහි** ච **සම්භාවිතො**ති අත්ථො. **පහොතී**ති සක්කොති. **අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධ**න්ති සාරෙන නාම මූලෙ වා ඛන්ධෙ වා භවෙය්‍ය, තම්පි අතික්කමිත්වාති අත්ථො. **එවංසම්පදමිද**න්ති එවංසම්පත්තිකං[4], ඊදිසන්ති අත්ථො. **අතිසිත්වා**ති අතික්කමිත්වා. **ජානං ජානාතී**ති ජානිතබ්බමෙව ජානාති; **පස්සං පස්සතී**ති පස්සිතබ්බමෙව පස්සති. යථා වා එකච්චො විපරීතං ගණ්හන්තො, ජානන්තො[5]පි න ජානාති; පස්සන්තොපි න පස්සති. න එවං භගවා. භගවා පන ජානන්තො ජානාති,[6] පස්සන්තො පස්සතියෙව. ස්වායං දස්සනපරිණායකට්ඨෙන **චක්ඛුභූතො**; විදිතකරණට්ඨෙන **ඤාණභූතො**; අවිපරීතසභාවට්ඨෙන පරියත්තිධම්මප්පවත්තනතො වා හදයෙන චින්තෙත්වා වාචාය නිච්ඡාරිතධම්මමයොති **ධම්මභූතො**; සෙට්ඨට්ඨෙන **බ්‍රහ්මභූතො**. අථ වා චක්ඛු විය භූතොති **චක්ඛුභූතො**. එවමෙතෙසු පදෙසු අත්ථො වෙදිතබ්බො. ස්වායං ධම්මස්ස

1. තුවං තුවන්ති-B, S.
2. තවංතවං වාචංපි-B. S.
3. ආයතනෙසු-L. E.
4. එවං පවත්තිකං-L.
5. ගණ්හන්තො-E.
6. ජානාතියෙව-R.

වත්තනතො **වත්තා**; පවත්තනතො **පවත්තා**; අත්ථං නීහරිත්වා නීහරිත්වා දස්සනසමත්ථතාය **අත්ථස්ස නින්නෙතා**; අමතාධිගමාය පටිපත්තිං දස්සතීති[1] **අමතස්ස දාතා**.

**අගරුකත්වාති**[2] පුනප්පුනං යාචාපෙන්තොපි[3] හි ගරුං කරොති නාම; අථවා සාවකපාරමිඤාණෙ ඨත්වා සිනෙරුපාදතො වාලිකං[4] උද්ධරමානො විය දුවිඤ්ඤෙය්‍යං කත්වා කථෙන්තොපි ගරුං කරොති යෙව නාම; එවං අකත්වා, අම්හෙ පුනප්පුනං අයාචාපෙත්වා, සුවිඤ්ඤෙය්‍යම්පි නො කත්වා කථෙහීති වුත්තං හොති.

**යං ඛො නො ආවුසොති** එත්ථ කිඤ්චාපි යං ඛො වොති වත්තබ්බං සියා, තෙ පන භික්ඛූ අත්තනා සද්ධිං සඞ්ගණ්හන්තා, **යං ඛො නොති** ආහංසු. යස්මා වා උද්දෙසො ච තෙසං උද්දිට්ඨො, භගවා පන ථෙරස්සාපි තෙසම්පි භගවා ව, තස්මා භගවාති පදං සන්ධායාපි එවමාහංසු. යං ඛො අම්හාකං භගවා තුම්හාකං සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වාති අත්ථො.

**චක්ඛුඤ්චාවුසොති** ආදීසු අයමත්ථො: ආවුසො නිස්සයභාවෙන චක්ඛුප්පසාදඤ්ච, ආරම්මණභාවෙන චතුසමුට්ඨානිකරූපෙ ච පටිච්ච චක්ඛුවිඤ්ඤාණං නාම උප්පජ්ජති. **තිණ්ණං සඞ්ගති ඵස්සොති** තෙසං තිණ්ණං සඞ්ගතියා ඵස්සො නාම උප්පජ්ජති; තං ඵස්සං පටිච්ච සහජාතාදිවසෙන **ඵස්සපච්චයා වෙදනා** උප්පජ්ජති; තාය වෙදනාය **යං** ආරම්මණං **වෙදෙති, තදෙව** සඤ්ඤා **සඤ්ජානාති**; **යං** සඤ්ඤා **සඤ්ජානාති, තදෙව** ආරම්මණං විතක්කො **විතක්කෙති**; **යං** විතක්කො **විතක්කෙති, තදෙවාරම්මණං** පපඤ්චො **පපඤ්චෙති. තතොනිදානන්ති** එතෙහි චක්ඛුරූපාදීහි කාරණෙහි. **පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්තීති** තං අපරිඤ්ඤාතකාරණං පුරිසං පපඤ්චකොට්ඨාසා අභිභවන්ති; තස්ස[5] පවත්තන්තීති අත්ථො.

තත්ථ ඵස්සවෙදනාසඤ්ඤා චක්ඛුවිඤ්ඤාණෙන සහජාතා හොන්ති; විතක්කො චක්ඛුවිඤ්ඤාණානන්තරාදීසු සවිතක්කචිත්තෙසු දට්ඨබ්බො; පපඤ්චසඞ්ඛා ජවනෙන සහජාතා හොන්ති. යදි එවං, කස්මා අතීතානාගතගහණං කතන්ති? තථා උප්පජ්ජනතො. යථෙව හි එතරහි චක්ඛුද්වාරිකො පපඤ්චො චක්ඛුඤ්ච රූපෙ ච ඵස්සවෙදනාසඤ්ඤාවිතක්කෙ ච පටිච්ච උප්පන්නො, එවමෙව අතීතානාගතෙසුපි චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු තස්සුප්පත්තිං දස්සෙන්තො එවමාහ. **සොතඤ්චාවුසොති** ආදීසුපි එසෙව නයො.

ඡට්ඨද්වාරෙ පන **මනන්ති** භවඞ්ගචිත්තං. **ධම්මෙති** තෙභූමකධම්මාරම්මණං. **මනොවිඤ්ඤාණන්ති** ආවජ්ජනං වා ජවනං වා. ආවජ්ජනෙ ගහිතෙ ඵස්සවෙදනාසඤ්ඤාවිතක්කා ආවජ්ජනසහජාතා හොන්ති;

1. දදාතීති-S, E, දෙසෙතීති-B, L. 2. අගරුං කත්වාති-B, S. කරිත්වාති-L, E. 3. ආයාචාපෙන්තොපි-B, S. 4. වාලුකං-B, S. 5. තස්ස වා-L.

පපඤ්චා ජවනසහජාතො.[1] ජවනෙ ගහිතෙ සහාවජ්ජනකං භවඞ්ගං මනො නාම හොති; තතො ඵස්සාදයො සබ්බෙපි ජවනසහජාතාව.[2] මනොද්වාරෙ පන යස්මා අතීතාදිභෙදං සබ්බම්පි ආරම්මණං හොති, තස්මා **අතීතානාගතපච්චුප්පන්නෙසූ**ති ඉදං යුත්තමෙව.

ඉදානි වට්ටං දස්සෙන්තො, **සො වතාවුසො**ති දෙසනං ආරභි. **ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤපෙස්සතී**ති ඵස්සො නාම එකො ධම්මො උප්පජ්ජතීති එවං ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤපෙස්සති; දස්සෙස්සතීති[3] අත්ථො. එස නයො සබ්බත්ථ.

එවං **ඉමස්මිං සති ඉදං හොතී**ති ද්වාදසායතනවසෙන සකලං වට්ටං දස්සෙත්වා ඉදානි ද්වාදසායතනපටික්ඛෙපවසෙන විවට්ටං දස්සෙන්තො, **සො වතාවුසො චක්ඛුස්මිං අසතී**ති දෙසනං ආරභි. තත්ථ වුත්තනයෙනෙව අත්ථො වෙදිතබ්බො.

එවං පඤ්හං විස්සජ්ජෙත්වා ඉදානි, සාවකෙන පඤ්හො කථිතොති මා නික්කඞ්ඛා[4] අහුවත්ථ, අයං භගවා සබ්බඤ්ඤුතඤ්ඤාණතුලං ගහෙත්වා නිසින්නො, ඉච්ඡමානා තමෙව උපසඞ්කමිත්වා නික්කඞ්ඛා හොථාති උය්‍යොජෙන්තො **ආකඞ්ඛමානා ච පනා**ති ආදිමාහ.

**ඉමෙහි ආකාරෙහී**ති ඉමෙහි කාරණෙහි, පපඤ්චුප්පත්තියා පාටියෙක්කකාරණෙහි චෙව වට්ටවිවට්ටකාරණෙහි ච; **ඉමෙහි පදෙහී**ති ඉමෙහි අක්ඛරසම්පිණ්ඩනෙහි; **බ්‍යඤ්ජනෙහී**ති පාටියෙක්කඅක්ඛරෙහි. **පණ්ඩිතො**ති පණ්ඩිච්චෙන සමන්නාගතො. චතූහි වා කාරණෙහි පණ්ඩිතො: ධාතුකුසලො, ආයතනකුසලො, පච්චයාකාරකුසලො, කාරණාකාරණකුසලොති. **මහාපඤ්ඤො**ති මහන්තෙ අත්ථෙ, මහන්තෙ ධම්මෙ, මහන්තා නිරුත්තියො, මහන්තානි පටිභානානි පරිග්ගණ්හනසමත්ථාය මහාපඤ්ඤාය සමන්නාගතො. **යථා තං මහාකච්චානෙනා**ති යථා මහාකච්චානෙන බ්‍යාකතං, තං සන්ධාය **ත**න්ති වුත්තං, යථා මහාකච්චානෙන තං බ්‍යාකතං, අහම්පි තං[5] එවමෙව බ්‍යාකරෙය්‍යන්ති අත්ථො.

**මධුපිණ්ඩිකා**ති මහන්තං ගුළපූවං; බද්ධසත්තුගුළකං වා; **අසෙචනක**න්ති අසෙචිතබ්බකං. සප්පිඵාණිතමධුසක්ඛරාදීසු ඉදං නාමෙත්ථ මන්දං, ඉදං බහුකන්ති න වත්තබ්බං, සමයොජිතරසං. **චෙතසො**ති චිත්තකජාතිකො. **දබ්බජාතිකො**ති පණ්ඩිතසභාවො. **කො නාමො අය**න්ති ඉදං ථෙරො, අතිභද්දකො[6] අයං ධම්මපරියායො, දසබලස්ස සබ්බඤ්ඤුතඤ්ඤාණෙනෙවස්ස නාමං ගණ්හාපෙස්සාමීති චින්තෙත්වා ආහ. **තස්මා**ති යස්මා මධුපිණ්ඩිකං[7] විය මධුරො, තස්මා **මධුපිණ්ඩිකපරියායොත්වෙව නං ධාරෙහී**ති වදති. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති

**මධුපිණ්ඩිකසුත්තවණ්ණනා නිට්ඨිතා.**

---

1. සහජාතා හොන්ති - I.
2. ජවනගත සහජාතාව - B, S.
3. දස්සෙස්සතීති - A, B, P2.
4. මා කඞ්ඛා - B, S.
5. අහම්පි B, S.
6. අතිගරුකො - S.
7. මධුපිණ්ඩිකො - P1, B, S.

## 1. 2. 9.

**එවම්මෙ සුතන්ති** ද්වෙධාවිතක්කසුත්තං. තත්ථ **ද්වෙධා[1] කත්වා ද්වෙධා[1] කත්වාති** ද්වෙ ද්වෙ භාගෙ කත්වා. **කාමවිතක්කොති** කාමපටිසංයුත්තො විතක්කො; **බ්‍යාපාදවිතක්කොති** බ්‍යාපාදපටිසංයුත්තො විතක්කො; **විහිංසාවිතක්කොති** විහිංසාපටිසංයුත්තො විතක්කො. **එකං භාගන්ති** අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, සබ්බොපායං විතක්කොයෙව, අකුසලපක්ඛිකොයෙවාති තයොපි කාමබ්‍යාපාදවිහිංසාවිතක්කෙ එකං කොට්ඨාසමකාසිං. කාමෙහි නිස්සටො නෙක්ඛම්මපටිසංයුත්තො විතක්කො **නෙක්ඛම්මවිතක්කො** නාම; සො යාව පඨමජ්ඣානා වට්ටති. අබ්‍යාපාදපටිසංයුත්තො විතක්කො **අබ්‍යාපාදවිතක්කො**; සො මෙත්තාපුබ්බභාගතො පට්ඨාය යාව පඨමජ්ඣානා වට්ටති. අවිහිංසාපටිසංයුත්තො විතක්කො **අවිහිංසාවිතක්කො**; සො කරුණාපුබ්බභාගතො පට්ඨාය යාව පඨමජ්ඣානා වට්ටති. **දුතියං භාගන්ති** සබ්බොපායං කුසලපක්ඛිකොයෙවාති දුතියං කොට්ඨාසමකාසිං. ඉමිනා බොධිසත්තස්ස විතක්කනිග්ගණ්හනකාලො කථිතො.

බොධිසත්තස්ස හි ඡබ්බස්සානි පධානං පදහන්තස්ස නෙක්ඛම්මවිතක්කාදයො පුඤ්ජපුඤ්ජා මහානදියං[2] ඔඝා විය පවත්තිංසු; සතිසම්මොසෙන පන සහසා කාමවිතක්කාදයො උප්පජ්ජිත්වා කුසලවාරං පච්ඡින්දිත්වා සයං අකුසලජවනවාරා හුත්වා තිට්ඨන්ති. තතො බොධිසත්තො චින්තෙසි: මය්හං ඉමෙ කාමවිතක්කාදයො කුසලවාරං පච්ඡින්දිත්වා තිට්ඨන්ති, හන්දාහං ඉමෙ විතක්කෙ ද්වෙභාගෙ කත්වා විහරාමි: කාමවිතක්කාදයො අකුසලපක්ඛිකාති එකං භාගං කරොමි, නෙක්ඛම්මවිතක්කාදයො කුසලපක්ඛිකාති එකං. අථ අකුසලපක්ඛතො ආගතවිතක්කං, මත්තෙන කණ්හසප්පං උප්පීළෙත්වා ගණ්හන්තො විය, අමිත්තං ගීවාය අක්කමන්තො විය ච නිග්ගණ්හිස්සාමි; නාස්ස වඩ්ඪිතුං දස්සාමි. කුසලපක්ඛතො ආගතවිතක්කං, මෙඝසමයෙ මෙඝං විය, සුඛෙත්තෙ[3] සාලකල්‍යාණිපොතකං විය ච සීඝසීඝං වඩ්ඪෙස්සාමීති. සො තථා කත්වා අකුසලවිතක්කෙ නිග්ගණ්හි, කුසලවිතක්කෙ වඩ්ඪෙසි. එවං ඉමිනා බොධිසත්තස්ස විතක්කනිග්ගණ්හනකාලො කථිතොති වෙදිතබ්බො.

ඉදානි යථාස්ස තෙ විතක්කා උප්පජ්ජිංසු, යථා ච තෙ නිග්ගහෙසි, තං දස්සෙන්තො, **තස්ස මය්හං භික්ඛවෙති** ආදිමාහ. තත්ථ **අප්පමත්තස්සාති** සතියා අවිප්පවාසෙ ඨිතස්ස; **ආතාපිනොති** ආතාපවීරියවන්තස්ස; **පහිතත්තස්සාති** පෙසිතත්තස්ස;[4] **උප්පජ්ජති කාමවිතක්කොති** බොධිසත්තස්ස ඡබ්බස්සානි පධානං පදහතො රජ්ජසුඛං වා[5], පාසාදෙ වා, නාටකානි වා, ඔරොධෙ වා, කඤ්චිදෙව වා සම්පත්තිං ආරබ්භ කාමවිතක්කො නාම න උප්පන්නපුබ්බො. දුක්කරකාරිකාය

---

1. විධා-E. 2. මහානදී-S. මහානදි-B. 3. සුඛෙත්ත-B. S.
4. පෙසිතචිත්තස්ස-B. S. 5. රජ්ජසුඛං වා ආරබ්භ-B. S.

පනස්ස ආහාරූපච්ඡෙදෙන අධිමත්තකසිමානං පත්තස්ස එතදහොසි: න සක්කා ආහාරූපච්ඡෙදෙන විසෙසං නිබ්බත්තෙතුං; යංනූනාහං ඔළාරිකං ආහාරං ආහාරෙය්‍යන්ති. සො උරුවෙලං පිණ්ඩාය පාවිසි. මනුස්සා, මහාපුරිසො පුබ්බෙ ආහරිත්වා දින්නම්පි න ගණ්හි, අද්ධාස්ස ඉදානි මනොරථො මත්ථකං පත්තො, තස්මා සයමෙව ආගතොති පණීතපණීතාහාරං උපහරිංසු. බොධිසත්තස්ස අත්තභාවො න චිරස්සෙව පාකතිකො අහොසි. ජරජිණ්ණත්තභාවො හි සප්පාය භොජනං ලභිත්වාපි පාකතිකො න හොති. බොධිසත්තො පන දහරො. තෙනස්ස සප්පායභොජනං භුඤ්ජතො අත්තභාවො න චිරස්සෙව පාකතිකො ජාතො; විප්පසන්නානි ඉන්ද්‍රියානි; පරිසුද්ධො ඡවිවණ්ණො; සමුග්ගතතාරාගණං විය නභං පරිපුණ්ණද්වත්තිංසමහාපුරිසලක්ඛණපතිමණ්ඩිතං සරීරං අහොසි. සො තං ඔලොකෙත්වා, තාවකිලන්තො නාම අත්තභාවො එවං පටිපාකතිකො ජාතොති චින්තෙත්වා අත්තනො පඤ්ඤාමහන්තතාය එවං පරිත්තකම්පි විතක්කං ගහෙත්වා **කාමවිතක්කොති** අකාසි.

පණ්ණසාලාය පුරතො නිසින්නො වාපි[1] රුරුපසදගවයරොහිතමිගාදිකෙ මිගගණෙ, මනුඤ්ඤපත්ත[2]රවනෙ මොරවනකුක්කුටාදිකෙ පක්ඛිගණෙ, නීලුප්පලකුමුදකමලාදිසඤ්ඡන්නානි පල්ලලානි, නානාකුසුමසඤ්ඡන්නවිටපවනරාජියො, මණික්ඛන්ධසදිසනිම්මලජලාවහඤ්ච[3] නදිං නෙරඤ්ජරං පස්සති. තස්ස එවං හොති: සොභනා වතිමෙ මිගජාතා, පක්ඛිගණා, පල්ලලානි, වනරාජියො, නදී නෙරඤ්ජරාති. සො තම්පි එවං පරිත්තකං විතක්කං ගහෙත්වා කාමවිතක්කං අකාසි. තෙනාහ: **උප්පජ්ජති කාමවිතක්කොති.**

**අනත්තව්‍යාබාධායපීති** අත්තදුක්ඛායපි. එස නයො සබ්බත්ථ. කිම්පන මහාසත්තස්ස උභයදුක්ඛාය සංවත්තනිකාවිතක්කා නාම අත්ථීති? නත්ථි. අපරිඤ්ඤාය ඨිතස්ස පන විතක්කා යාව උභයව්‍යාබාධාය සංවත්තතීති එතානි තීණි නාමානි ලභති; තස්මා එවමාහ. **පඤ්ඤානිරොධිකොති** අනුප්පන්නාය ලොකියලොකුත්තරාය පඤ්ඤාය උප්පජ්ජිතුං න දෙති. ලොකියපඤ්ඤං පන අට්ඨසමාපත්තිපඤ්චාභිඤ්ඤාවසෙන උප්පන්නම්පි සමුච්ඡින්දිත්වා ඛිපතීති පඤ්ඤානිරොධිකො. **විඝාතපක්ඛිකොති** දුක්ඛකොට්ඨාසිකො. අසඞ්ඛතං නිබ්බානාමතං[4] පච්චක්ඛං කාතුං න දෙතීති අනිබ්බානසංවත්තනිකො. **අබ්භත්ථං ගච්ඡතීති** ඛයං නත්ථිභාවං ගච්ඡති, උදකබුබ්බුලකො විය නිරුජ්ඣති. **පජහාමෙවාති** පජහිමෙව;[5] **විනොදමෙවාති** නීහරිමෙව.[6] **ව්‍යන්තෙව නං අකාසින්ති** විගතන්තං නිස්සෙසං පරිවටුමං පරිච්ඡින්නමෙව නං අකාසිං.

---

1. නිසින්නො චමර-S, චාමර-B.
2. මනුඤ්ඤසද්ද-B, S. මනුඤ්ඤපත්ත E.
3. මණික්ඛන්ධනිම්මලජලවහං-B. S.
4. අසඞ්ඛතනිබ්බානං නාම තං-B, S.
5. ජහිතමෙව-B. S.
6. නීහරිතමෙව-B. S.

**බ්‍යාපාදවිතක්කොති** න බොධිසත්තස්ස පරූපඝාතපටිසංයුත්තො විතක්කො නාම චිත්තෙ උප්පජ්ජති. අථස්ස අතිවස්සඅච්චුණ්හඅතිසීතාදීනි පන පටිච්ච චිත්තවිපරිණාමභාවො හොති. තං සන්ධාය බ්‍යාපාදවිතක්කොති ආහ.

**විහිංසාවිතක්කොති** න මහාසත්තස්ස පරෙසං දුක්ඛුප්පාදනපටිසංයුත්තො විතක්කො උප්පජ්ජති. චිත්තස්ස පන උද්ධතාකාරෙ අනෙකග්ගතාකාරො හොති. තං ගහෙත්වා විහිංසාවිතක්කං අකාසි. පණ්ණසාලාද්වාරෙ නිසින්නො හි සීහබ්‍යග්ඝාදිකෙ වාළමිගෙ, සූකරාදයො ඛුද්දකමිගෙ විහිංසන්තෙ පස්සති. අථ බොධිසත්තො, ඉමස්මිම්පි නාම[1] අකුතොභයෙ අරඤ්ඤෙ ඉමෙසං තිරච්ඡානගතානං පච්චත්ථිකා උප්පජ්ජන්ති; බලවන්තො දුබ්බලෙ ඛාදන්ති; දුබ්බලඛාදකා වත්තන්තීති කාරුඤ්ඤං උප්පාදෙති. අඤ්ඤෙපි බිළාලාදයො කුක්කුටමූසිකාදීනි ඛාදන්තෙ පස්සති; ගාමං පිණ්ඩාය පවිට්ඨො මනුස්සෙ රාජකම්මිකෙහි උපද්දුතෙ වධබන්ධනාදීනි අනුභවන්තෙ, අත්තනො කසිවණිජ්ජාදීනි කම්මානි කත්වා ජීවිතුං න ලභන්තීති[2] කාරුඤ්ඤං උප්පාදෙති. තං සන්ධාය **උප්පජ්ජති විහිංසාවිතක්කොති** ආහ.

**තථා තථාති** තෙන තෙන ආකාරෙන. ඉදං වුත්තං හොති: කාමවිතක්කාදිසු යං යං **විතක්කෙති**, යං යං විතක්කං පවත්තෙති, තෙන තෙනෙවස්සාකාරෙන[3] කාමවිතක්කාදිභාවෙන[4] **චෙතසො නති හොති. පහාසි නෙක්ඛම්මවිතක්කන්ති** නෙක්ඛම්මවිතක්කං පජහති. **බහුලමකාසීති** බහුලං කරෙති. **තස්ස තං කාමවිතක්කාය චිත්තන්ති** තස්ස තං චිත්තං කාමවිතක්කත්ථාය. යථා කාමවිතක්කසම්පයුත්තං හොති එවමෙව නමතීති අත්ථො. සෙසපදෙසුපි එසෙව නයො.

ඉදානි අත්ථදීපිකං[5] උපමං **දස්සෙන්තො, සෙය්‍යථාපීති** ආදිමාහ. තත්ථ **කිට්ඨසම්බාධෙති** සස්සසම්බාධෙ. **ආකොටෙය්‍යාති** උජුකං පිට්ඨියං පහරෙය්‍ය; **පටිකොටෙය්‍යාති** තිරියං ඵාසුකාසු පහරෙය්‍ය; **සන්නිරුන්ධෙය්‍යාති** ආවරිත්වා තිට්ඨෙය්‍ය; **සන්නිවාරෙය්‍යාති** ඉතො චිතො ච ගන්තුං න දදෙය්‍ය. **තතොනිදානන්ති** තෙන කාරණෙන; එවං අරක්ඛිතානං ගුන්නං පරෙසං සස්සඛාදනකාරණාති අත්ථො. බාලො හි ගොපාලකො එවං ගාවො[6] අරක්ඛමානො, අයං අම්හාකං හත්ථවෙතනං ඛාදති, උජුං ගාවො රක්ඛිතුම්පි න සක්කොති, කුලෙහි සද්ධිං වෙරං **ගණ්හාපෙතීති ගොසාමිකානම්පි** සන්තිකා වධාදීනි පාපුණාති; කිට්ඨසාමිකානම්පි. **පණ්ඩිතො** පන ඉමානි චත්තාරි භයානි සම්පස්සන්තො ගාවො සාධුකං රක්ඛති. තං සන්ධායෙතං වුත්තං. **ආදීනවන්ති** උපද්දවං; **ඔකාරන්ති** ලාමකභාවං; ඛෙඩ්සු වා ඔකාරං. **සඞ්කිලෙසන්ති** කිලිට්ඨභාවං.[7] **නෙක්ඛම්මෙති** නෙක්ඛම්මම්හි; **ආනිසංසන්ති** විසුද්ධිපක්ඛං; **වොදානපක්ඛන්ති** ඉමස්සෙව[8] වෙවචනං.

1. ඉමස්මිං නාම-L. 2. අලභන්තානි-L. 3. තෙනාත්තනාවස්සාකාරෙන-B. S.
4. කාමවිතක්කාව-B. S. 5. අත්ථදීපකං-B. S. 6. ගාවියො- , M2. P2. B.
7 සංකිලිට්ඨභාවං-B L 8. දෙමෙස්සෙව-S ඉදං තස්සෙව-B

කුසලානං ධම්මානං නෙක්ඛම්මම්හි විසුද්ධිපක්ඛං අද්දසන්ති අත්ථො. **නෙක්ඛම්මං** නාම කාමෙහි නිස්සටං සබ්බං කුසලං; එකධම්මෙන ගය්හමානෙ නිබ්බානමෙව.

තත්‍රිදං ඔපම්මසංසන්දනං: කිට්ඨසම්බාධං[1] විය හි රූපාදිආරම්මණං; කූටගාවො විය කූටචිත්තං; පණ්ඩිතගොපාලකො විය බොධිසත්තො; චතුබ්බිධං භයං විය අත්තපරූභයබ්‍යාබාධාය සංවත්තනකවිතක්කා;[2] පණ්ඩිතගොපාලකස්ස චතුබ්බිධං භයං දිස්වා කිට්ඨසම්බාධෙ අප්පමාදෙන ගොරක්ඛනං විය බොධිසත්තස්ස ඡබ්බස්සානි පධානං පදහතො අත්තබ්‍යාබාධාදිභයං දිස්වා රූපාදිආරම්මණෙසු යථා කාමවිතක්කාදයො න උප්පජ්ජන්ති, එවං චිත්තරක්ඛනං.

**පඤ්ඤාවුද්ධිකො**ති ආදීසු අනුප්පන්නාය ලොකියලොකුත්තරපඤ්ඤාය උප්පාදාය, උප්පන්නාය ච වුද්ධියා සංවත්තතීති **පඤ්ඤාවුද්ධිකො**; න දුක්ඛකොට්ඨාසාය සංවත්තතීති **අවිඝාතපක්ඛිකො**; නිබ්බානධාතුසච්ඡිකිරියාය සංවත්තතීති **නිබ්බානසංවත්තනිකො**. **රත්තිඤ්චෙපි නං භික්ඛවෙ අනුවිතක්කෙය්‍ය**න්ති සකලරත්තිඤ්චෙපි තං විතක්කං පවත්තෙය්‍යං. **තතොනිදාන**න්ති තම්මූලකං. **ඔහඤ්ඤෙය්‍යා**ති උග්ඝාතියෙථ;[3] උද්ධච්චාය සංවත්තෙය්‍යාති අත්ථො. **ආරා**ති දූරෙ. **සමාධිම්හා**ති උපචාරසමාධිතොපි අප්පනාසමාධිතොපි.

**සො ඛො අහං භික්ඛවෙ අජ්ඣත්තමෙව චිත්ත**න්ති සො අහං භික්ඛවෙ මා මෙ චිත්තං සමාධිම්හා දූරෙ හොතූති අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙමි; ගොචරජ්ඣත්තෙ ඨපෙමීති අත්ථො. **සන්නිසාදෙමී**ති[4] තත්ථෙව තං සන්නිසීදාපෙමි. **එකොදිං කරොමී**ති එකග්ගං කරොමි. **සමාදහාමී**ති සම්මා ආදහාමි; සුට්ඨු ආරොපෙමීති අත්ථො. **මා මෙ චිත්තං ඔහඤ්ඤී**ති[5] මා මය්හං චිත්තං උග්ඝාතීයිත්ථ; මා උද්ධච්චාය සංවත්තතූති අත්ථො.

**උප්පජ්ජති අබ්‍යාපාදවිතක්කො අවිහිංසාවිතක්කො**ති.[6] එත්ථ යො සො ඉමාය හෙට්ඨා වුත්තතරුණවිපස්සනාය සද්ධිං උප්පන්නවිතක්කො කාමපච්චනීකට්ඨෙන නෙක්ඛම්මවිතක්කොති වුත්තො, සො යෙව බ්‍යාපාදපච්චනීකට්ඨෙන අබ්‍යාපාදවිතක්කොති ච විහිංසාපච්චනීකට්ඨෙන අවිහිංසාවිතක්කොති ච වුත්තො.

එත්තාවතා බොධිසත්තස්ස සමාපත්තිං නිස්සාය විපස්සනාපට්ඨපනකාලො කථිතො. තස්ස හි සමාධිපි තරුණො, විපස්සනාපි. තස්ස විපස්සනං පට්ඨපෙත්වා අතිචිරං නිසින්නස්ස කායො කිලමති, අන්තො අග්ගි විය උට්ඨහති,[7] කච්ඡෙහි සෙදා මුච්චන්ති, මත්ථකතො උසුමවට්ටි විය උට්ඨහති,[8] චිත්තං හඤ්ඤති, විහඤ්ඤති විප්ඵන්දති, උද්ධතං

1 සම්බධං-L  2. විතක්කා-B.
3 ඔහඤ්ඤෙය්‍යාති උග්ඝාටියෙය්‍ය-B. S උග්ඝාතියෙත්ථ-E. උග්ඝාතියෙථ-L.
4. සන්නිසීදෙමීති-B. S.  5. උග්ඝාපීති-B. S. උද්ඝතීති-L.
6. [illegible]-E  7. [illegible]-B. S. L.  8. [illegible]-B. S. E.

හොති. සො පුන සමාපත්තිං සමාපජ්ජිත්වා තං පරිදමෙත්වා මුදුකං කත්වා සමස්සාසෙත්වා පුන විපස්සනං පට්ඨපෙති. තස්ස පුන අතිචිරං නිසින්නස්ස ච තථෙව හොති. සො පුන සමාපත්තිං සමාපජ්ජිත්වා තථෙව කරොති.

විපස්සනාය හි බහුකාරා[1] සමාපත්ති. යථා යොධස්ස ඵලකකොට්ඨකො නාම බහුකාරො[1] හොති. සො තං නිස්සාය සඞ්ගාමං පවිසති. තත්ථ හත්ථීහිපි, අස්සෙහිපි, යොධෙහිපි සද්ධිං කම්මං කත්වා ආවුධෙසු වා ඛීණෙසු, භුඤ්ජිතුකාමාදිභාවෙ[2] වා සති නිවත්තිත්වා ඵලකකොට්ඨකං පවිසිත්වා ආවුධානිපි ගණ්හාති, විස්සමතිපි, භුඤ්ජතිපි, පානීයං පිවතිපි, සන්නාහම්පි පටිසන්නය්හති. තං තං කත්වා[3] පුන සඞ්ගාමං පවිසති. තත්ථ කම්මං කත්වා පුන උච්චාරාදිපීළිතො වා කෙනචි දෙව වා කරණීයෙන ඵලකකොට්ඨකං පවිසති. තත්ථ සන්ථම්භිත්වා පුන සඞ්ගාමං පවිසති. එවං යොධස්ස ඵලකකොට්ඨකො විය විපස්සනාය බහුකාරා සමාපත්ති. සමාපත්තියා පන, සඞ්ගාමනිත්ථරණකයොධස්ස ඵලකකොට්ඨකතොපි විපස්සනා බහුකාරතරා.

කිඤ්චාපි හි[4] සමාපත්තිං නිස්සාය විපස්සනා පවත්තති,[5] විපස්සනා පන ථාමජාතා සමාපත්තිම්පි රක්ඛති, ථාමජාතං කරොති. යථා හි ථලෙ නාවම්පි, නාවාය භණ්ඩම්පි සකටභාරං කරොන්ති. උදකං පත්වා පන සකටම්පි, සකටෙ භණ්ඩම්පි, යුත්තගොණෙපි නාවාභාරං කරොන්ති; නාවා තිරියං සොතං ඡින්දිත්වා සොත්ථිනා සුපට්ටනං ගච්ඡති. එවමෙව කිඤ්චාපි සමාපත්තිං නිස්සාය විපස්සනා පවත්තති, විපස්සනා පන ථාමජාතා සමාපත්තිම්පි රක්ඛති, ථාමජාතං කරොති. ථලං පත්වා සකටං විය හි සමාපත්ති. උදකං පත්වා නාවා විය විපස්සනා. ඉති බොධිසත්තස්ස එත්තාවතා සමාපත්තිං නිස්සාය විපස්සනාපට්ඨපනකාලො කථිතොති වෙදිතබ්බො.

**යඤ්ඤදෙවාති** ආදි කණ්හපක්ඛෙ වුත්තානුසාරෙනෙව වෙදිතබ්බං. ඉධාපි අත්ථදීපිකං උපමං දස්සෙතුං, **සෙය්‍යථාපීති** ආදිමාහ. තත්ථ **ගාමන්තසම්භතෙසූති** ගාමන්තං ආහටෙසු. **සතිකරණීයමෙව හොතීති එතා ගාවොති** සති උප්පාදනමත්තමෙව කාතබ්බං හොති; ඉතො චිතො ච ගන්ත්වා ආකොටනාදිකිච්චං නත්ථි. **එතෙ ධම්මාති** එතෙ සමථවිපස්සනාධම්මාති සතුප්පාදමත්තමෙව කාතබ්බං හොති. ඉමිනා බොධිසත්තස්ස සමථවිපස්සනානං ථාමජාතකාලො කථිතො. තදා කිරස්ස සමාපත්තිං අප්පනත්ථාය නිසින්නස්ස අට්ඨ සමාපත්තියො එකාවජ්ජනෙන[6] ආපාථං ආගච්ඡන්ති. විපස්සනං පට්ඨපෙත්වා නිසින්නො සත්ත අනුපස්සනා එකප්පහාරෙන ආරුළ්හො හොති.

**සෙය්‍යථාපීති** ඉධ කිං දස්සෙති? අයං පාටියෙක්කො අනුසන්ධි. සත්ථා හි හිතූපචාරං, අත්තනො සත්ථුභාවසම්පදඤ්ච දස්සෙන්තො

1. බහූපකාරා-B. S. 2. කාමතාදිභාවෙ-B. S. 3. සං. කත්වා-L. 4. කිඤ්චාපි හි සත්ථ-S. 5. විපස්සනං පට්ඨපෙති-B. S. L. 6. එකාවජ්ජනෙ-L.

භගවා ඉමං දෙසනං ආරභි. තත්‍ථ **අරඤ්ඤෙති** අටවියං; **පවනෙති** වනසණ්ඩෙ; අත්‍ථතො හි ඉදං පදද්වයං එකමෙව. පඨමස්ස පන දුතියං වෙවචනං. **අයොගක්ඛෙමකාමොති** චතූහි යොගෙහි ඛෙමං නිබ්භයට්ඨානං අනිච්ඡන්තො, භයමෙව ඉච්ඡන්තො. **සොවත්‍ථිකොති** සොත්‍ථිභාවාවහො; **පීතිගමනීයොති** තුට්ඨිං ගමනීයො. පීහගමනීයොතිපි[1] වා පාඨො. **පිදහෙය්‍යාති** සාඛාදීහි ථකෙය්‍ය. **විවරෙය්‍යාති** විසදං මුඛං කත්‍වා විවටං කරෙය්‍ය. **කුම්මග්ග**න්ති උදකවනපබ්බතාදීහි සන්නිරුද්ධං අමග්ගං. **ඔදහෙය්‍ය ඔකචර**න්ති තෙසං ඔකෙ චරමානං විය **එකං** දීපකමිගං **එකස්මිං** ඨානෙ ඨපෙය්‍ය. **ඔකචාරිකා**න්ති දීඝරජ්ජුබද්ධං තස්සෙව[2] මිගිං.

මිගලුද්දකො[3] හි අරඤ්ඤෙ මිගානං වසනට්ඨානං ගන්ත්‍වා, ඉධ වසන්ති, ඉමිනා මග්ගෙන නික්ඛමන්ති, එත්‍ථ චරන්ති, එත්‍ථ පිවන්ති, ඉමිනා පවිසන්තීති සල්ලක්ඛෙත්‍වා මග්ගං පිධාය කුම්මග්ගං විවරිත්‍වා ඔකචරඤ්ච ඔකචාරිකඤ්ච ඨපෙත්‍වා සයං පටිච්ඡන්නෙ ඨානෙ සත්තිං ගහෙත්‍වා තිට්ඨති. අථ සායන්හසමයෙ මිගා අකුතොභයෙ අරඤ්ඤෙ චරිත්‍වා පානීයං පිවිත්‍වා මිගපොතකෙහි සද්ධිං කීළමානා වසනට්ඨානසන්තිකං ආගන්ත්‍වා ඔකචරඤ්ච ඔකචාරිකඤ්ච දිස්‍වා, සහායකා නො ආගතා භවිස්සන්තීති නිරාසඞ්කා පවිසන්ති. තෙ මග්ගං පිහිතං දිස්‍වා නායං මග්ගො, අයං මග්ගො භවිස්සතීති කුම්මග්ගං පටිපජ්ජන්ති. මිගලුද්දකො න තාව කිඤ්චි කරොති; පච්ඡිමෙසු පන සබ්බපච්ඡිමං සණ්ඨිකං පහරති. සො උත්තසති. තතො සබ්බෙ උත්තසිත්‍වා භයං උප්පන්නන්ති පුරතො ඔලොකෙන්තා උදකෙන වා වනෙන වා පබ්බතෙන වා සන්නිරුද්ධං මග්ගං දිස්‍වා උභොහි පස්සෙහි අඞ්ගුලිසඞ්ඛලිකං විය ගහනවනං පවිසිතුං අසක්කොන්තා පවිට්ඨමග්ගෙනෙව නික්ඛමිතුං ආරභන්ති. ලුද්දකො තෙසං නිවත්තනභාවං ඤත්‍වා ආදිතො පට්ඨාය තිංසම්පි චත්තාලීසම්පි මිගෙ ඝාතෙති. ඉදං සන්ධාය, **එවං හි සො භික්ඛවෙ මහාමිගසඞ්ඝො අපරෙන සමයෙන අනයව්‍යසනං තනුත්තං ආපජ්ජෙය්‍යාති** වුත්තං.

**නන්දිරාගස්සෙතං අධිවචනං, අවිජ්ජායෙතං අධිවචනන්ති** එත්‍ථ යස්මා ඉමෙ සත්තා අවිජ්ජාය අඤ්ඤාණා හුත්‍වා නන්දිරාගෙන ආබන්ධිත්‍වා රූපාරම්මණාදීනි උපනීතා වට්ටදුක්ඛසත්තිඝාතං[4] ලභන්ති, තස්මා භගවා ඔකචරං නන්දිරාගොති, ඔකචාරිකං අවිජ්ජාති කත්‍වා දස්සෙසි.

මිගලුද්දකො හි එකදා තෙසං සාඛාභඞ්ගෙන සරීරං පුඤ්ඡිත්‍වා මනුස්සගන්ධං අපනෙත්‍වා ඔකචරං එකස්මිං[5] ඨානෙ ඨපෙත්‍වා ඔකචාරිකං සහ රජ්ජුයා විස්සජ්ජෙත්‍වා අත්තානං පටිච්ඡාදෙත්‍වා සත්තිං ආදාය ඔකචරස්ස සන්තිකෙ තිට්ඨති. ඔකචාරිකා මිගගණස්ස චරණට්ඨානාභිමුඛී ගච්ඡති. තං දිස්‍වා මිගා සීසානි උක්ඛිපිත්‍වා තිට්ඨන්ති. සාපි සීසං

1. පීතිගමනීයොති-B. L. S.
2. දීඝරජ්ජුයා බද්ධං තස්සෙව-B. S.
3. ලුද්දකො-L.
4. සත්තියා ඝාතං-B. S.
5. ඔකචරං-E.

උක්ඛිපිත්වා තිට්ඨන්ති. තෙ අම්හාකං සජාතිකා අයන්ති ගොචරං ගණ්හන්ති. සාපි තිණානි ඛාදන්තී විය සණිකං උපගච්ඡති. ආරඤ්ඤකො යූථපතිමිගො තස්සා වාතං ලභිත්වා සකපරිසං විස්සජ්ජෙත්වා තදභිමුඛො හොති. සත්තානං හි නවනවමෙව පියං හොති. ඔකචාරිකා ආරඤ්ඤකස්ස මිගස්ස අච්චාසන්නභාවං අදත්වා තදභිමුඛීව පච්ඡතො පටික්කමිත්වා ඔකචරස්ස සන්තිකං ගච්ඡති. යත්ථ යත්ථස්සා රජ්ජු ලග්ගති තත්ථ තත්ථ ඛුරෙන පහරිත්වා මොචෙති. ආරඤ්ඤකො මිගො ඔකචරං දිස්වා ඔකචාරිකාය සම්මත්තො හුත්වා ඔකචරෙ උස්සූයං කත්වා පිට්ඨිං නාමෙත්වා සීසං කම්පෙන්තො තිට්ඨති. තස්මිං ඛණෙ සත්තිං ජිව්හාය ලෙහන්තොපි කිං එතන්ති න ජානාති. ඔකචරෙපි සචස්ස උපරිභාගෙන තං මිගං පහරිතුං සුඛං හොති, පිට්ඨිං නාමෙති; සචස්ස හෙට්ඨාභාගෙන පහරිතුං සුඛං හොති, හදයං උන්නාමෙති. අථ ලුද්දකො ආරඤ්ඤකං මිගං මිගසත්තියා[1] පහරිත්වා තත්ථෙව පාතෙත්වා[2] මංසං ආදාය ගච්ඡති. එවමෙව යථා සො මිගො ඔකචාරිකාය සම්මත්තො ඔකචරෙ උස්සූයං කත්වා සත්තිං ජිව්හාය ලෙහන්තොපි කිඤ්චි න ජානාති, තථා ඉමෙ සත්තා අවිජ්ජාය සම්මත්තා අන්ධභූතා කිඤ්චි අජානන්තා රූපාදීසු නන්දිරාගං උපගම්ම වට්ටදුක්ඛසත්තියා භයං[3] ලභන්තීති භගවා ඔකචරං නන්දිරාගොති, ඔකචාරිකං අවිජ්ජාති කත්වා දස්සෙසි.

**ඉති ඛො භික්ඛවෙ විවටො මයා ඛෙමො මග්ගොති,** ඉති ඛො භික්ඛවෙ මයා ඉමෙසං සත්තානං හිතචරෙන[4] සම්මාසම්බොධිං පත්වා, අහං බුද්ධොස්මීති තුණ්හීභූතෙන අනිසීදිත්වා ධම්මචක්කප්පවත්තනතො පට්ඨාය ධම්මං දෙසෙන්තෙන විවටො ඛෙමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො, **පිහිතො කුම්මග්ගො** අඤ්ඤාසිකොණ්ඩඤ්ඤාදීනං භබ්බපුග්ගලානං; **ඌහතො ඔකචරො** නන්දිරාගො ද්වෙධා ඡෙත්වා පාතිතො; **නාසිතා ඔකචාරිකා** අවිජ්ජා සබ්බෙන සබ්බං සමුග්ඝාතිතාති අත්තනො හිතූපචාරං දස්සෙසි. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

**ද්වෙධාවිතක්කසුත්තවණ්ණනා නිට්ඨිතා.**

---

## 1. 2. 10.

**එවම්මෙ සුතන්ති** විතක්කසණ්ඨානසුත්තං. තත්ථ **අධිචිත්තමනුයුත්තෙනාති,** දසකුසලකම්මපථවසෙන උප්පන්නං චිත්තං චිත්තමෙව; විපස්සනාපාදකං අට්ඨසමාපත්තිචිත්තං තතො චිත්තතො අධිකං චිත්තන්ති **අධිචිත්තං. අනුයුත්තෙනාති** තං අධිචිත්තං අනුයුත්තෙන; තත්ථ යුත්තපයුත්තෙනාති අත්ථො. තත්‍රායං භික්ඛු පුරෙභත්තං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො, නිසීදනං ආදාය අසු

---

1. මිගං සත්තියා-B, S.
2. ඝාතෙත්වා-B, S.
3. වධං--B. S.
4. හිතචරණෙන-B. S.

තස්මිං රුක්ඛමූලෙ වා වනසණ්ඩෙ වා පබ්බතපාදෙ වා පබ්භාරෙ වා[1] සමණධම්මං කරිස්සාමීති නික්ඛමන්තොපි තත්ථ ගන්ත්වා හත්ථෙහි වා පාදෙහි වා නිසජ්ජට්ඨානතො තිණපණ්ණානි අපනෙන්තොපි අධිචිත්තං අනුයුත්තොයෙව[2]; නිසීදිත්වා පන හත්ථපාදෙ ධොවිත්වා පල්ලඞ්කං ආභුජිත්වා මූලකම්මට්ඨානං ගහෙත්වා විහරන්තො අධිචිත්තං අනුයුත්තොයෙව.

**නිමිත්තානීති** කාරණානි. **කාලෙන කාලන්ති** සමයෙ සමයෙ.[3] නනු ච කම්මට්ඨානං නාම මුහුත්තම්පි අඡඩ්ඩෙත්වා නිරන්තරං මනසිකාතබ්බං? කස්මා භගවා **කාලෙන කාලන්ති** ආහාති? පාළියං හි අට්ඨතිංස කම්මට්ඨානානි විභත්තානි; තෙසු භික්ඛුනා අත්තනො චිත්තරුචිතං කම්මට්ඨානං ගහෙත්වා නිසින්නෙන යාව කොචිදෙව උපක්කිලෙසො නුප්පජ්ජති තාව ඉමෙසං නිමිත්තානං මනසිකාරකිච්චං නත්ථි. යදා පන උප්පජ්ජති, තදා ඉමානි ගහෙත්වා චිත්තෙන උප්පන්නං අබ්බුදං නීහරිතබ්බන්ති දස්සෙන්තො එවමාහ.

**ඡන්දූපසංහිතාති** ඡන්දසහගතා, රාගසම්පයුත්තා. ඉමෙසං පන තිණ්ණං විතක්කානං ඛෙත්තඤ්ච ආරම්මණඤ්ච ජානිතබ්බං. තත්ථ ඡන්දූපසංහිතානං අට්ඨ ලොභසහගතචිත්තානි ඛෙත්තං; දොසූපසංහිතානං ද්වෙ දොමනස්සසහගතානි; මොහූපසංහිතානං ද්වාදසපි අකුසලචිත්තානි. විචිකිච්ඡුද්ධච්චසම්පයුත්තානි පන ද්වෙ එතෙසං පාටිපුග්ගලිකං ඛෙත්තං. සබ්බෙසම්පි සත්තා චෙව සඞ්ඛාරා ච ආරම්මණං. ඉට්ඨානිට්ඨඅසමපෙක්ඛිතෙසු හි සත්තෙසු ච සඞ්ඛාරෙසු ච තෙ උප්පජ්ජන්ති.

**අඤ්ඤං නිමිත්තං මනසිකාතබ්බං කුසලූපසංහිතන්ති** තතො නිමිත්තතො අඤ්ඤං කුසලනිමිත්තං[4] මනසිකාතබ්බං. තත්ථ අඤ්ඤං නිමිත්තං නාම ඡන්දූපසංහිතෙ විතක්කෙ සත්තෙසු උප්පන්නෙ අසුභභාවනා අඤ්ඤං නිමිත්තං නාම; සඞ්ඛාරෙසු උප්පන්නෙ අනිච්චමනසිකාරො අඤ්ඤං නිමිත්තං නාම. දොසූපසංහිතෙ සත්තෙසු උප්පන්නෙ මෙත්තාභාවනා අඤ්ඤං නිමිත්තං නාම; සඞ්ඛාරෙසු උප්පන්නෙ ධාතුමනසිකාරො අඤ්ඤං නිමිත්තං නාම. මොහූපසංහිතෙ යත්ථ කත්ථචි උප්පන්නෙ පඤ්චධම්මූපනිස්සයො අඤ්ඤං නිමිත්තං නාම.

ඉමස්ස හත්ථා වා සොභනා, පාදා වාති ආදිනා නයෙන හි[5] සත්තෙසු ලොභෙ උප්පන්නෙ අසුභතො උපසංහරිතබ්බං. කම්හි[6] සාරත්තො'සි? කෙසෙසු සාරත්තො'සි, ලොමෙසු—පෙ—මුත්තෙ සාරත්තො'සි? අයං අත්තභාවො නාම තීහි අට්ඨිසතෙහි උස්සාපිතො, නවහි නහාරුසතෙහි ආබද්ධො, නවහි මංසපෙසිසතෙහි අනුලිත්තො, අල්ලචම්මෙන පරියොනද්ධො, ඡවිරාගෙන පටිච්ඡන්නො, නවහි

1. පබ්භාරෙ වා විහාරෙපි-B.
2. අනුයුත්තොයෙව-B, S. L.
3. සමයෙ සමයෙ-L, S.
4. කුසලනිස්සිතං නිමිත්තං-B, S.
5. නයෙන-B, S.
6. කිම්හි-B, S.

වණමුඛෙහි නවනවුතිලොමකූපසහස්සෙහි ච අසුචි පග්ඝරති; කඩ්ඩලපූරිතො[1]*, දුග්ගන්ධො, ජෙගුච්ඡො, පටික්කූලො, ද්වත්තිංසකුණපසඤ්චයො; නත්ථෙත්ථ සාරං වා වරං වාති එවං අසුභතො උපසංහරන්තස්ස සත්තෙසු උප්පන්නො ලොභො පහීයති. තෙනස්ස අසුභතො උපසංහරණං අඤ්ඤං නිමිත්තං නාම හොති. පත්තචීවරාදීසු සඞ්ඛාරෙසු ලොභෙ උප්පන්නෙ, ද්වීහාකාරෙහි සඞ්ඛාරමජ්ඣත්තතං සමුට්ඨාපෙතීති සතිපට්ඨානවණ්ණනායං වුත්තනයෙන අස්සාමිකතාවකාලිකභාවවසෙන මනසිකරොතො සො පහීයති. තෙනස්ස අනිච්චතො මනසිකාරො අඤ්ඤං නිමිත්තං නාම හොති.

සත්තෙසු දොසෙ උප්පන්නෙ[2] ආඝාතවිනය-කකචොපමොවාදාදීනං වසෙන මෙත්තා භාවෙතබ්බා. තං භාවයතො සො පහීයති. තෙනස්ස මෙත්තාභාවනා අඤ්ඤං නිමිත්තං නාම හොති. ඛාණුකණ්ටකතිණපණ්ණාදීසු පන දොසෙ උප්පන්නෙ, ත්වං කස්ස කුප්පසි, කිං පථවීධාතුයා, උදාහු ආපොධාතුයා, කො වා පනායං කුප්පති නාම, කිං පථවීධාතු, උදාහු ආපොධාතූති ආදිනා නයෙන ධාතුමනසිකාරං කරොන්තස්ස සො පහීයති. තෙනස්ස ධාතුමනසිකාරො අඤ්ඤං නිමිත්තං නාම හොති. මොහෙ පන යත්ථ කත්ථචි උප්පන්නෙ,

ගරූපවාසො[3] උද්දෙසො උද්දිට්ඨපරිපුච්ඡනං
කාලෙන ධම්මසවනං ඨානාඨානවිනිච්ඡයො[4]
පඤ්චධම්මූපනිස්සාය මොහධාතු[5] පහීයතීති,

ඉමෙ පඤ්චධම්මා උපනිස්සාතබ්බා.[6] ගරුං උපනිස්සාය විහරන්තො හි භික්ඛු, ආචරියො ගාමප්පවෙසනං අනාපුච්ඡන්තස්ස, පාදධොවනට්ඨානං අනාගච්ඡන්තස්ස,[7] වත්තකාලෙ වත්තං අකරොන්තස්ස ඝටසතඋදකහරණාදිදණ්ඩකම්මං කරොතීති යුත්තපටියත්තො[8] හොති. අථස්ස මොහො පහීයති. උද්දෙසං ගණ්හන්තොපි, ආචරියො උද්දෙසකාලෙ උද්දෙසං අගණ්හන්තස්ස, න සාධුකං සජ්ඣායන්තස්ස, අසජ්ඣායන්තස්ස ච දණ්ඩකම්මං කරොතීති යුත්තපටියත්තො[8] හොති. එවම්පිස්ස මොහො පහීයති. ගරු භාවනීයෙ භික්ඛූ උපසඞ්කමිත්වා, ඉදං භන්තෙ කථං, ඉමස්ස කො අත්ථොති පරිපුච්ඡන්තො කඞ්ඛං විනොදෙති. එවම්පිස්ස මොහො පහීයති. කාලෙන ධම්මසවනට්ඨානං ගන්ත්වා සක්කච්චං ධම්මං සුණන්තොපි තෙසු තෙසු ඨානෙසු අත්ථො පාකටො හොති. එවම්පිස්ස මොහො පහීයති. ඉදමස්ස කාරණං,

1. කලිමලපූරිතො-L. කුණපපූරිතො-S.
* "කලිමලපූරිතොති පාඨො" ඉති ටීකා.
2. උප්පන්නෙ පන-B. S. 3. ගරුසංවාසො-B. S. 4. විනිච්ඡයොති-B. S.
5. පඤ්ච ධම්මෙ උපනිස්සාය මොහො-B. S.
6. "උපනිස්සාතබ්බාති උපනිස්සිතබ්බා; අයමෙව වා පාඨො" ඉති ටීකා.
7. ගාමප්පවෙසනං අනාපුච්ඡන්තස්ස-B. S.
8. යුත්තපටියත්තො-B. S. යුත්තපටියත්තා-L.

ඉදං න කාරණන්ති ඨානාඨානවිනිච්ඡයෙ ඡෙකො හොති. එවම්පිස්ස මොහො පහීයති. තෙනස්ස පඤ්චධම්මූපනිස්සයො අඤ්ඤං නිමිත්තං නාම හොති.

අපි ච අට්ඨතිංසාය ආරම්මණෙසු යං කිඤ්චි භාවෙන්තස්සපි ඉමෙ විතක්කා පහීයන්ති එව; ඉමානි පන නිමිත්තානි උජුවිපච්චනීකානි පටිපක්ඛභූතානි. ඉමෙහි පහීනා රාගාදයො සුප්පහීනා හොන්ති. යථා හි අග්ගිං කට්ඨෙහිපි[1] පංසූහිපි සාඛාහිපි පොථෙත්වා නිබ්බාපෙන්තියෙව. උදකං පන අග්ගිස්ස උජුවිපච්චනීකං. තෙන නිබ්බුතො සුනිබ්බුතො හොති. එවං ඉමෙහි නිමිත්තෙහි පහීනා රාගාදයො සුප්පහීනා හොන්ති. තස්මා එතානි කථිතානීති වෙදිතබ්බානි.

**කුසලූපසංහිතන්ති** කුසලනිස්සිතං, කුසලස්ස පච්චයභූතං. **අජ්ඣත්තමෙවාති** ගොචරජ්ඣත්තංයෙව. **පලගණ්ඩොති** වඩ්ඪකී; **සුඛුමාය ආණියාති** යං ආණිං නීහරිතුකාමො හොති, තතො සුඛුමතරාය සාරදාරුආණියා; **ඔළාරිකං ආණින්ති** චන්දනඵලකෙ වා සාරඵලකෙ වා ආකොටිතං විසමාණිං; **අභිනිහනෙය්‍යාති** මුග්ගරෙන ආකොටෙන්තො හනෙය්‍ය; **අභිනීහරෙය්‍යාති** එවං අභිනිහනන්තො[2] ඵලකතො නීහරෙය්‍ය; **අභිනිවජ්ජෙය්‍යාති** ඉදානි[3] බහු නික්ඛන්තාති ඤත්වා හත්ථෙන චාලෙත්වා නික්කඩ්ඪෙය්‍ය. තත්ථ ඵලකං විය චිත්තං; ඵලකෙ විසමාණි විය අකුසලවිතක්කා; සුඛුමාණි විය අඤ්ඤං අසුභභාවනාදි කුසලනිමිත්තං; සුඛුමාණියා ඔළාරිකාණිනීහරණං විය අසුභභාවනාදීහි කුසලනිමිත්තෙහි තෙසං විතක්කානං නීහරණං.

**අහිකුණපෙනාති** ආදි අතිජෙගුච්ඡපටික්කූලකුණපදස්සනත්ථං වුත්තං. **කණ්ඨෙ ආසත්තෙනාති** කෙනචිදෙව[4] පච්චත්ථිකෙන ආනෙත්වා කණ්ඨෙ බද්ධෙන, පටිමුක්කෙන. **අට්ටියෙය්‍යාති** අට්ටො දුක්ඛිතො භවෙය්‍ය; **හරායෙය්‍යාති** ලජ්ජෙය්‍ය; **ජිගුච්ඡෙය්‍යාති** සඤ්ජාතජිගුච්ඡො භවෙය්‍ය. **පහීයන්තීති** එවං ඉමිනාපි ඉමිනාපි කාරණෙන එතෙ අකුසලා ධම්මා සාවජ්ජා දුක්ඛවිපාකාති අත්තනො පඤ්ඤාබලෙන උපපරික්ඛතො අහිකුණපාදීනි විය ජිගුච්ඡන්තස්ස පහීයන්ති. යො පන අත්තනො පඤ්ඤාබලෙන උපපරික්ඛිතුං න සක්කොති, තෙන ආචරියං වා උපජ්ඣායං වා අඤ්ඤතරං වා ගරුට්ඨානිකං සබ්‍රහ්මචාරිං, සඞ්ඝත්ථෙරං වා උපසඞ්කමිත්වා, ගණ්ඩිං[5] පහරිත්වා භික්ඛුසඞ්ඝමෙව වා සන්නිපාතෙත්වා ආරොචෙතබ්බං. බහූනං හි සන්නිපාතෙ භවිස්සතෙව එකො පණ්ඩිතමනුස්සො යවාස්ස[6] එවං එතෙසු ආදීනවො දට්ඨබ්බොති කථෙස්සති, කායවිච්ඡන්දනීයකථාදීහි[7] වා පන තෙ විතක්කෙ නිග්ගණ්හිස්සතීති.

1. අලඞ්කතකට්ඨෙහිපි-B, S. 2. අභිනීහනෙය්‍යාති එවං අභිහනන්තො-S.
3. අභිනිවජ්ජෙය්‍යාති ඉදානි ඉමෙ-B. අභිනිවට්ටෙය්‍යාති-S. 4. කස්චිදෙව-S.
5. ඝණ්ඩිං-B. 6. සවායං-B, S. 7. කායවිච්ඡින්දනීයකථාදීහි-B, S.

**අසති අමනසිකාරං ආපජ්ජිතබ්බන්ති** නෙව තෙ විතක්කා සරිතබ්බා මනසි කාතබ්බා අසඤ්ඤවිහිතකෙන[2] භවිතබ්බං. යථා හි රූපං අපස්සිතුකාමො පුරිසො අක්ඛීනි නිමීලෙය්‍ය, එවමෙව මූලකම්මට්ඨානං ගහෙත්වා නිසින්නභික්ඛුනා චිත්තම්හි විතක්කෙ උප්පන්නෙ අසඤ්ඤවිහිතකෙන භවිතබ්බං. එවමස්ස සො විතක්කො පහීයති. තස්මිං පහීනෙ පුන කම්මට්ඨානං ගහෙත්වා නිසීදිතබ්බං. සචෙ න පහීයති, උග්ගහිතො ධම්මකථාපබන්ධො[3] හොති, සො මහාසද්දෙන සජ්ඣායිතබ්බො. එවම්පි චෙ අසඤ්ඤවිහිතස්ස සතො සො[4] න පහීයති, ථවිකාය මුට්ඨිපොත්ථකො හොති, යත්ථ බුද්ධවණ්ණාපි ධම්මවණ්ණාපි ලිඛිතා හොන්ති, තං නීහරිත්වා වාචෙන්තෙන අසඤ්ඤවිහිතකෙන භවිතබ්බං. එවම්පි චෙ නප්පහීයති, ථවිකතො අරණිසහිතාදීනි නීහරිත්වා, අයං උත්තරාරණී, අයං අධරාරණීති ආවජ්ජෙන්තෙන අසඤ්ඤවිහිතකෙන භවිතබ්බං. එවම්පි චෙ නප්පහීයති, සිපාටිකං නීහරිත්වා, ඉදං ආරකණ්ටකං නාම, අයං පිප්ඵලකො නාම, ඉදං නඛච්ඡෙදනං නාම, අයං සූචි නාමාති පරික්ඛාරං සමන්නාහරන්තෙන අසඤ්ඤවිහිතකෙන භවිතබ්බං. එවම්පි චෙ නප්පහීයති, සූචිං ගහෙත්වා චීවරෙ ජිණ්ණට්ඨානං[5] සිබ්බන්තෙන අසඤ්ඤවිහිතකෙන භවිතබ්බං. එවං යාව නප්පහීයති, තාව තං තං කුසලකම්මං කරොන්තෙන අසඤ්ඤවිහිතකෙන භවිතබ්බං. පහීනෙ පුන මූලකම්මට්ඨානං ගහෙත්වා නිසීදිතබ්බං. නවකම්මං පන න පට්ඨපෙතබ්බං. කස්මා? විතක්කෙ පච්ඡින්නෙ[6] කම්මට්ඨානමනසිකාරස්ස ඔකාසො න හොති. පොරාණකපණ්ඩිතා පන නවකම්මං කත්වාපි විතක්කං පච්ඡින්දිංසු.

තත්‍රිදං වත්ථු: තිස්සසාමණෙරස්ස කිර උපජ්ඣායො තිස්සමහාවිහාරෙ පටිවසති. තස්ස සාමණෙරො, භන්තෙ උක්කණ්ඨිතොම්හීති ආහ. අථ නං ථෙරො, ඉමස්මිං විහාරෙ නහානොදකං දුල්ලභං, මං ගහෙත්වා චිත්තලපබ්බතං ගච්ඡාහීති ආහ. සො තථා අකාසි. තත්ථ නං ථෙරො ආහ: අයං විහාරො අච්චන්තසඞ්ඝිකො, එකං පුග්ගලිකට්ඨානං කරොහීති. සො සාධු භන්තෙති ආදිතො පට්ඨාය සංයුත්තනිකායං, පබ්භාරසොධනං, තෙජො[7] කසිණපරිකම්මන්ති තීණිපි එකතො ආරභිත්වා කම්මට්ඨානං අප්පනං පාපෙසි; සංයුත්තනිකායං පරියොසාපෙසි; ලෙණකම්මං නිට්ඨාපෙසි; සබ්බං කත්වා උපජ්ඣායස්ස සඤ්ඤං අදාසි. උපජ්ඣායො, දුක්ඛෙන තෙ සාමණෙර කතං, අජ්ජ තාව ත්වංයෙව වසාහීති. සො තං රත්තිං ලෙණෙ වසන්තො උතුසප්පායං ලභිත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පත්වා තත්ථෙව පරිනිබ්බායි. තස්ස ධාතුයො ගහෙත්වා චෙතියං අකංසු; අජ්ජාපි තිස්සථෙරචෙතියන්ති පඤ්ඤායති.

1. සො විතක්කො-B. S. 2. අසඤ්ඤවිහිතතාව-B. S. 3. ධම්මකථාපාඨො-S. 4. සතො-B. S. 5. ඡින්නට්ඨානං-E. 6. අපච්ඡින්නෙ-S, E. 7. තෙජොධාතු-B S.

ඉදං පබ්බං අසනිපබ්බං නාම. ඉමස්මිං ඨත්වා විතක්කෙ නිග්ගණ්හිතුං අසක්කොන්තො ඉධ ඨත්වා නිග්ගණ්හිස්සතීති විතක්කමූලභෙද[1] පබ්බං දසෙසන්තො පුන **තස්ස** චෙ **භික්ඛවෙ**ති ආදිමාහ. තත්ථ **විතක්කසඞ්ඛාරසණ්ඨානං** **මනසිකාතබ්බ**න්ති, සඞ්ඛරොතීති සඞ්ඛාරො; **පච්චයො**, කාරණං, මූලන්ති අත්ථො. සන්තිට්ඨති එත්ථාති සණ්ඨානං; විතක්කසඞ්ඛාරස්ස සණ්ඨානං විතක්කසඞ්ඛාරසණ්ඨානං. තං මනසිකාතබ්බං. ඉදං වුත්තං හොති: අයං විතක්කො කිංහෙතු, කිම්පච්චයො, කිංකාරණා උප්පන්නොති විතක්කානං මූලඤ්ච මූලා මූලඤ්ච මනසිකාතබ්බං. **කින්නු ඛො අහං සීඝං ගච්ඡාමී**ති කෙන නු ඛො කාරණෙන අහං සීඝං ගච්ඡාමි? **යන්නූනාහං සණිකං ගච්ඡෙය්‍ය**න්ති, කිං මෙ ඉමිනා සීඝගමනෙන, සණිකං ගමිස්සාමීති චින්තෙති. **සො සණිකං ගච්ඡෙය්‍යා**ති සො එවං චින්තෙත්වා සණිකං ගච්ඡෙය්‍ය. එස නයො සබ්බත්ථ.

තත්ථ තස්ස පුරිසස්ස සීඝගමනකාලො විය ඉමස්ස භික්ඛුනො විතක්කසමාරූළ්හකාලො. තස්ස සණිකං ගමනකාලො විය ඉමස්ස විතක්කචාර පච්ඡෙදන[2]කාලො. තස්ස ඨිතකාලො විය ඉමස්ස විතක්කචාරෙ පච්ඡින්නෙ මූලකම්මට්ඨානං චිත්තාහරණ[4]කාලො. තස්ස නිසින්නකාලො විය ඉමස්ස විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පත්තකාලො. තස්ස නිපන්නකාලො විය ඉමස්ස නිබ්බානාරම්මණාය ඵලසමාපත්තියා දිවසං වීතිවත්තනකාලො. තත්ථ ඉමෙ විතක්කා කිංහෙතුකා, කිම්පච්චයාති විතක්කානං මූලා මූලං ගච්ඡන්තස්ස විතක්කචාරො සිථිලො හොති. තස්මිං සිථිලීභූතෙ මත්ථකං ගච්ඡන්තෙ විතක්කා සබ්බසො නිරුජ්ඣන්ති. අයමත්ථො දද්දභ[5] ජාතකෙනපි දීපෙතබ්බො.

සසකස්ස කිර බෙලුවරුක්ඛමූලෙ නිපන්නස්ස බෙලුවපක්කං වණ්ටතො ඡිජ්ජිත්වා කණ්ණමූලෙ පති.[6] සො තස්ස සද්දෙන, පථවී භිජ්ජතීති සඤ්ඤාය උට්ඨහිත්වා වෙගෙන පලායි. තං දිස්වා පුරතො අඤ්ඤෙපි චතුප්පදා පලායිංසු. තදා බොධිසත්තො සීහො හොති. සො චින්තෙසි: අයං පථවී නාම කප්පවිනාසෙ භිජ්ජති, අන්තරා පථවිභෙදො නාම නත්ථි; යන්නූනාහං මූලා මූලං ගන්ත්වා අනුවිජ්ජෙය්‍යන්ති.[7] සො හත්ථිනාගතො පට්ඨාය යාව සසකා පුච්ඡි: තයා තාත[8] පථවී භිජ්ජමානා දිට්ඨාති. සසො ආම දෙවාති ආහ. සීහො එහි භො දස්සෙහීති. සසො න සක්කොමි සාමීති. එහි රෙ මා භායීති ඛන්ධමුද්ධනෙන[9] ගහෙත්වා ගතො. සසො රුක්ඛස්ස අවිදූරෙ ඨත්වා,[10]

"දද්දභායති[11] භද්දන්තෙ යස්මිං දෙසෙ වසාමහං,
අහමෙතං[12] න ජානාමි කිමෙතං දද්දභායතී[13]ති"

ගාථමාහ.

---

1. විතක්කමූල-E. 2. සණ්ඨානං-B. S. 3. පරිච්ඡෙදන-S. 4. විතක්කාහරණ-B. S. 5. දුද්දුභ-B. S. 6. පතිතං-B. L. S. 7. මූලමූලං ගන්ත්වා අනුවිජ්ජෙය්‍යන්ති B. S. 8. තාව-B. S. 9. සණිගමුද්ධනෙන-B. S. 10. ඨිතො-A, P2. 11. දුද්දුභායති-B. S. T2. 12. අහං එතං-B. S.

බොධිසත්තො ත්වං එත්ථෙව තිට්ඨාති රුක්ඛමූලං ගන්ත්වා සසකස්ස නිපන්නට්ඨානං අද්දස; බෙලුවපක්කං අද්දස; උද්ධං ඔලොකෙත්වා වණ්ටං අද්දස. දිස්වා අයං සසො එත්ථ නිපන්නො නිද්දායමානො ඉමස්ස ඝණ්ණමූලෙ පතිතස්ස සද්දෙන පථවී භිජ්ජතීති එවංසඤ්ඤී හුත්වා පලායීති ඤත්වා තං කාරණං සසං පුච්ඡි. සසො ආම දෙවාති ආහ. බොධිසත්තො ඉමං ගාථමාහ:

"බෙල්ලං නිපතිතං[1] සුත්වා දද්දභන්ති[2] සසො ජවි,
සසස්ස වචනං සුත්වා සන්තත්තා මිගවාහිනී"ති.

තතො බොධිසත්තො මා භායථාති මිගගණෙ අස්සාසෙසි. එවං විතක්කානං මූලා මූලං ගච්ඡන්තස්ස විතක්කා පහීයන්ති.

ඉමස්මිං විතක්කමූලභෙදපබ්බෙ ඨත්වා විතක්කෙ නිග්ගණ්හිතුං අසක්කොන්තෙන පන එවං නිග්ගණ්හිතබ්බාති අපරම්පි කාරණං දස්සෙන්තො, පුන තස්ස චෙ භික්ඛවෙති ආදිමාහ. **දන්තෙභි[3] දන්තමාධායාති** හෙට්ඨාදන්තෙ උපරිදන්තං ඨපෙත්වා. **චෙතසා චිත්තන්ති** කුසලචිත්තෙන අකුසලචිත්තං අභිනිග්ගණ්හිතබ්බං. **බලවා පුරිසොති** යථා ථාමසම්පන්නො මහාබලො පුරිසො දුබ්බලං පුරිසං සීසෙ වා ඛන්ධෙ වා ගහෙත්වා අභිනිග්ගණ්හෙය්‍ය, අභිනිප්පීළෙය්‍ය, අභිසන්තාපෙය්‍ය, සන්තත්තං කිලන්තං මුච්ඡාපරෙතං විය කරෙය්‍ය; එවමෙව භික්ඛුනා විතක්කෙහි සද්ධිං පටිමල්ලෙන හුත්වා, කො ච තුම්හෙ, කො චාහන්ති **අභිභවිත්වා** "කාමං තචො ච න්හාරු ච අට්ඨි ච අවසුස්සතු[4] උපසුස්සතු සරීරෙ මංසලොහිතන්ති"[5] එවං මහාවිරියං පග්ගය්හ විතක්කා නිග්ගණ්හිතබ්බාති දස්සෙන්තො ඉමං අත්ථදීපිකං[6] උපමං ආහ.[7]

**යතො ඛො[8] භික්ඛවෙති** ඉදං මරියාදභාජනියං නාම තං උත්තානත්ථමෙව. යථා පන සත්ථාචරියො තිරොරට්ඨා ආගතං රාජපුත්තං පඤ්චාවුධසිප්පං උග්ගණ්හාපෙත්වා, ගච්ඡ අත්තනො රට්ඨෙ රජ්ජං ගණ්හ; සචෙ තෙ අන්තරාමග්ගෙ චොරා උට්ඨහන්ති, ධනුනා කම්මං කත්වා ගච්ඡ; සචෙ තෙ ධනු නස්සති වා භිජ්ජති වා, සත්තියා, අසිනාති එවං පඤ්චහිපි ආවුධෙහි කත්තබ්බං දස්සෙත්වා උය්‍යොජෙති. සො තථා කත්වා සකරට්ඨං ගන්ත්වා රජ්ජං ගහෙත්වා රජ්ජසිරිං අනුභොති. එවමෙව භගවා අධිචිත්තමනුයුත්තං භික්ඛුං අරහත්තගහණත්ථාය උය්‍යොජෙන්තො, සචස්ස අන්තරා අකුසලවිතක්කා උප්පජ්ජන්ති, අසුභනිමිත්තපබ්බෙ ඨත්වා තෙ විතක්කෙ නිග්ගණ්හිත්වා[9] විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණිස්සති; තත්ථ අසක්කොන්තො ආදීනව

1. බෙලුවං පතිතං-S. 2. දුද්දුභන්ති-B. S. 3 දන්තෙහි-E. 4. අවසිස්සතු-E.
5. උපසුස්සතු මෙ ගත්තෙ සබ්බන්තං මංසලොහිතන්ති-A. M2. P2. R. (එවං සෙසුපි පොත්ථකෙසු ගාථාබන්ධවසෙන පූරෙත්වා ලිඛිතං. තථාපි අඞ්. දුකඞ්ගුත්තර පාළිතො උද්ධටො පාඨොයෙව න ගාථාති සල්ලක්ඛෙම.)
6. අත්ථදීපකං-E. 7. ආහරි-B. 8. යතො ච ඛො-B. S.
9. [illegible]-P1. S.

පබ්බෙ ඨත්වා; තත්‍රාපි අසක්කොන්තො අසතිපබ්බෙ ඨත්වා; තත්‍රාපි අසක්කොන්තො විතක්කමූලභෙදපබ්බෙ ඨත්වා; තත්‍රාපි අසක්කොන්තො අභිනිග්ගණ්හනපබ්බෙ ඨත්වා විතක්කෙ නිග්ගණ්හිත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණිස්සතීති ඉමානි පඤ්ච පබ්බානි දෙසෙසි.

**වසී විතක්කපරියායපථෙසූති** විතක්කචාරපථෙසු[1] චිණ්ණවසී පගුණවසීති වුච්චති. **යං විතක්කං ආකඞ්ඛිස්සතීති** ඉදමස්ස වසීභාවාකාරදස්සනත්ථං වුත්තං. අයං හි පුබ්බෙ යං විතක්කං විතක්කෙතුකාමො හොති, තං න විතක්කෙති, යං න විතක්කෙතුකාමො හොති, තං විතක්කෙති. ඉදානි පන වසීභූතත්තා යං විතක්කං විතක්කෙතුකාමො හොති, තංයෙව විතක්කෙති, යං න විතක්කෙතුකාමො, න තං විතක්කෙති. තෙන වුත්තං: **යං විතක්කං ආකඞ්ඛිස්සති, තං විතක්කං විතක්කෙස්සති, යං විතක්කං නාකඞ්ඛිස්සති, න තං විතක්කං විතක්කෙස්සතීති. අච්ඡෙච්ඡි තණ්හන්ති** ආදි සබ්බාසව සුත්තෙ වුත්තමෙවාති.

**විතක්කසණ්ඨානසුත්තවණ්ණනා.**

## දුතියවග්ගවණ්ණනා නිට්ඨිතා.

---

**1. 3. 1.**

**එවමෙම සුත්තන්ති** කකචූපමසුත්තං. තත්ථ **මොළියඵග්ගුනොති** මොළීති චූළා වුච්චති. යථාහ:—

"ඡෙත්වාන මොළිං වරගන්ධවාසිතං
වෙහායසං උක්ඛිපි සක්‍යපුඞ්ගවො,
රතනස්ස[2] චඞ්ගොටවරෙන වාසවො
සහස්සනෙත්තො සිරසා පටිග්ගහී"ති.[3]

සා තස්ස ගිහිකාලෙ මහන්තී[4] අහොසි; තෙනස්ස මොළියඵග්ගුනොති සඞ්ඛා උදපාදි. පබ්බජිතම්පි නං තෙනෙව නාමෙන සඤ්ජානන්ති.

**අතිවෙලන්ති** වෙලං අතික්කමිත්වා. තත්ථ කාලවෙලා, සීමවෙලා, සීලවෙලාති තිවිධා වෙලා. "තායං වෙලායං ඉමං උදානං උදානෙසී"ති හි අයං කාලවෙලා නාම. "ඨිතධම්මො වෙලං නාතිවත්තතී"ති අයං සීමවෙලා නාම. "වෙලාඅනතික්කමො සෙතුඝාතො"ති ච, "වෙලා වෙසා අවීතික්කමනට්ඨෙනා"ති ච අයං සීලවෙලා නාම. තං තිවිධම්පි සො අතික්කමියෙව[5] භික්ඛුනියො හි ඔවදිතුං කාලො නාම අත්ථි; සො අත්ථඞ්ගතෙපි සූරියෙ ඔවදන්තො තං කාලවෙලම්පි අතික්කමි. භික්ඛු

1. විතක්කචාරපථෙසු-B. S. L  2. සුවණ්ණ-A. M2 P2. R. රතන-B. S.
3. "සහස්සනෙත්තො සිරසා පටිග්ගහී සුවණ්ණචඞ්ගොටවරෙන වාසවොතිපි පාඨො" ඉති ටීකා
4. මහතී-E.  5. අතික්කමෙති යෙව-B. S.

නීතං ඔවාදෙ පමාණං නාම අත්‍ථි, සීමා මරියාදා; සො උත්තරිං ජප්පඤ්ච වාචාහි ඔවදන්තො තං සීමවෙලම්පි අතික්කමි. කථෙන්තා පන දිවසඞ්ගතං කත්වා දුට්ඨුල්ලාපත්තිප්පහොනකං කථෙති; එවං සීලවෙලම්පි අතික්කමි. **සංසට්ඨොති** මිස්සීභූතො, සමානසුඛදුක්ඛො හුත්වා.

**සම්මුඛාති** පුරතො; **අවණ්ණං භාසතීති** තා පන[1] කොට්ටනාදීනි කාරෙන්තියො දිස්වා නත්ථිමාසං අනාපත්ති[2] නාම; ඉමා භික්ඛුනියො අනාචාරා දුබ්බචා[3] පගබ්භාති අගුණං කථෙති. **අධිකරණම්පි කරෙය්‍යාතීති** ඉමෙසං භික්ඛූනං ඉමා භික්ඛුනියො දිට්ඨකාලතො පට්ඨාය අක්ඛීනි ඩය්හන්ති, ඉමස්මිං විහාරෙ පුප්ඵපූජා වා[4] ආසනධොවනපරිභණ්ඩකරණාදීනි වා ඉමාසං වසෙන පවත්තන්ති;[5] කුලධීතරො[6] එතා ලජ්ජිනියො; තුම්හෙ ඉමා ඉදඤ්චිදඤ්ච වදථ; අයං නාම තුම්හාකං ආපත්ති හොති; විනයධරානං සන්තිකං ආගන්ත්වා විනිච්ඡයං මෙ දෙථාති අධිකරණං ආකඩ්ඪති.

**මොලියඵග්ගුනස්ස අවණ්ණං භාසතීති** නත්ථිමස්ස භික්ඛුනො අනාපත්ති[2] නාම, නිච්චකාලං ඉමස්ස පරිවෙණද්වාරං අසුඤ්ඤං භික්ඛුනීහීති අගුණං කථෙති. **අධිකරණම්පි කරෙය්‍යාතීති** ඉමෙසං භික්ඛූනං මොලියඵග්ගුනත්ථෙරස්ස දිට්ඨකාලතො පට්ඨාය අක්ඛීනි ඩය්හන්ති; ඉමස්මිං විහාරෙ අඤ්ඤෙසං වසනට්ඨානං ඔලොකෙතුම්පි න සක්කා; විහාරං ආගතභික්ඛුනියො ඔවාදං වා පටිසන්ථාරං වා උද්දෙසපදං වා ථෙරමෙව නිස්සාය ලභන්ති; කුලපුත්තකො, ලජ්ජී, කුක්කුච්චකො; එවරූපං නාම තුම්හෙ ඉදඤ්චිදඤ්ච වදථ; එථ විනයධරානං සන්තිකෙ විනිච්ඡයං දෙථාති අධිකරණං ආකඩ්ඪන්ති.

**සො භික්ඛු භගවන්තං එතදවොචාති** නෙව පියකම්‍යතාය, න භෙදාධිප්පායෙන; අත්ථකාමතාය අවොච. එවං කිරස්ස අහොසි: ඉමස්ස භික්ඛුස්ස එවං සංසට්ඨස්ස විහරතො අයසො උප්පජ්ජිස්සති. සො සාසනස්සපි අවණ්ණොයෙව. අඤ්ඤෙන පන කථිතො අයං න ඔරමිස්සති. භගවතා ධම්මං දෙසෙත්වා ඔවදිතොව ඔරමිස්සතීති තස්ස අත්ථකාමතාය භගවන්තං එතං, **ආයස්මා භන්තෙති** ආදිවචනං අවොච. **ආමන්තෙහීති** ජානාපෙහි. **ආමන්තෙතීති** පක්කොසති.

**සද්ධාති** සද්ධාය. **තස්මාති** යස්මා ත්වං කුලපුත්තො චෙව සද්ධා පබ්බජිතො ච; යස්මා වා තෙ එතාහි සද්ධිං සංසට්ඨස්ස විහරතො යෙ තා[7] අක්කොසිස්සන්ති වා පහරිස්සන්ති වා තෙසු දොමනස්සං උප්පජ්ජිස්සති; සංසග්ගෙ පහීනෙ නුප්පජ්ජිස්සති; තස්මා. **තත්‍රාති** තස්මිං අවණ්ණභාසනෙ. **ගෙහසිතාති** පඤ්චකාමගුණනිස්සිතා. **ඡන්දාති** තණ්හාඡන්දාපි පටිඝඡන්දාපි. **විපරිණතන්ති** රත්තම්පි චිත්තං විපරිණතං

1. තා පන-B. S. 2. ආපත්ති-L. 3. දුබ්බචා-B. S.
4 ඉමස්මිං පුප්ඵ පූජා වා-M1, P1. T. 5. වත්තන්ති-B. S.
6. කුලධීතා-B. S. L. E. 7. යෙව-B. S.

හොති, දුට්ඨම්පි, මූළ්හම්පි විතතං විපරිණතං ඉධ පන තණ්හාපක්ඛවසෙන රත්තං,[1] පටිඝපක්ඛවසෙන දුට්ඨම්පි වට්ටති. **හිතානුකම්පීති** හිතෙන අනුකම්පමානො; හිතෙන ඵරමානො. **න දොසන්තරො**ති දොසචිත්තො න භවිස්සාමි.

**අථ ඛො භගවා**ති කස්මා ආරභි? ඵග්ගුනස්ස කිර එත්තකං ඔවාදං සුත්වා[2]පි, භික්ඛුනීසංසග්ගතො ඔරමිස්සාම, විරමිස්සාමීති චිත්තම්පි න උප්පන්නං. භගවතා පන සද්ධිං පටාණි විය පටිවිරුද්ධො අට්ඨාසි. අථ භගවතො, යථා නාම ජිඝච්ඡිතස්ස භොජනෙ, පිපාසිතස්ස පානීයෙ, සීතෙන ඵුට්ඨස්ස උණ්හෙ, දුක්ඛිතස්ස සුඛෙ පත්ථනා උප්පජ්ජති, එවමෙව ඉමං දුබ්බචං භික්ඛුං දිස්වා පඨමබොධියං සුබ්බචාපි[3] භික්ඛූ ආපාථං ආගමිංසු. අථ තෙසං වණ්ණං කථෙතුකාමො හුත්වා ඉමං දෙසනං ආරභි. තත්ථ **ආරාධයිංසූ**ති ගණ්හිංසු පූරයිංසු.[4] **එකං සමය**න්ති එකස්මිං සමයෙ. **එකාසනභොජන**න්ති එකං පුරෙභත්තභොජනං. සූරියුග්ගමනතො හි යාව මජ්ඣන්හිකා සත්තක්ඛත්තුං[5] භුත්තභොජනම්පි ඉධ එකාසනභොජනන්තෙව අධිප්පෙතං. **අප්පාබාධත**න්ති නිරාබාධතං; **අප්පාතඞ්කත**න්ති නිද්දුක්ඛතං; **ලහුට්ඨාන**න්ති සරීරස්ස සල්ලහුකවුට්ඨානං; **බල**න්ති කායබලං; **ඵාසුවිහාර**න්ති කායස්ස සුඛවිහාරං.

ඉමිනා කිං කථිතං? දිවා විකාලභොජනං පජහාපිතකාලො කථිතො. භද්දාලිසුත්තෙන පන රත්තිං විකාලභොජනං පජහාපිතකාලො කථිතො. ඉමානි හි ද්වෙ භොජනානි භගවා න එකප්පහාරෙන පජහාපෙසි. කස්මා? ඉමානෙව හි[6] ද්වෙ භොජනානි වට්ටෙ වසන්තානං[7] ආචිණ්ණානි. සන්ති කුලපුත්තා සුඛුමාලා; තෙ එකතො ද්වෙපි භොජනානි පජහන්තා කිලමන්ති. තස්මා එකතො අපජහාපෙත්වා එකස්මිං කාලෙ දිවාවිකාලභොජනං, එකස්මිං රත්ති[8]භොජනන්ති විසුං පජහාපෙසි; තෙසු ඉධ දිවාවිකාලභොජනං පජහාපිතකාලො කථිතො. තත්ථ යස්මා බුද්ධා න භයං දස්සෙත්වා තජ්ජෙත්වා පජහාපෙන්ති; ආනිසංසං පන දස්සෙත්වා පජහාපෙන්ති; එවං හි සත්තා සුඛෙන පජහන්ති; තස්මා ආනිසංසං දස්සෙන්තො ඉමෙ පඤ්ච ගුණෙ දස්සෙසි.

**න අනුසාසනී කරණීයා**ති පුනප්පුනං සාසනෙන කත්තබ්බං නාහොසි; ඉදං කරොථ, ඉදං මා කරොථාති සතුප්පාදකරණීයමත්තමෙව අහොසි. තාවතකෙනෙව තෙ කත්තබ්බං අකංසු, පහාතබ්බං පජහිංසු. පඨමබොධියං භික්ඛවෙ සුබ්බචා භික්ඛූ අහෙසුං, අස්සවා ඔවාදපතිකරාති.

1. රත්තම්පි වට්ටති-B, S
2. කත්වා-B. S.
3. සුබ්බචා-L. සුබ්බචාපි-S.
4. ආරාධයිංසූති ආරාධයිංසු ගණ්හිංසු-B. S.
5. සත්තක්ඛත්තුං-A. P2 E. දසක්ඛත්තුං-S.
6. ඉමානි-B. S. ඉමානි ජහා-P2.
7. වට්ටෙ සන්තානං-S.
8. රත්තිං විකාල-B. S.

ඉදානි තෙසං සුබ්බචභාවදීපිකං උපමං ආහරන්තො, **සෙය්‍යථාපීති** ආදිමාහ. තත්ථ **සුභූමියන්ති** සමභූමියං. "සුභූමෙ[1] සුඛෙත්තෙ විහත ඛාණුකෙ බීජානි පතිට්ඨාපෙය්‍යා"ති එත්ථ පන මණ්ඩභූමි සුභූමීති ආගතා. **චාතුම්මහාපථෙති**[2] ද්වින්නං මහාමග්ගානං විනිවිජ්ඣිත්වා ගතට්ඨානෙ. **ආජඤ්ඤරථොති** විනීතඅස්සරථො. **ඔධස්තපතොදොති** යථා රථං අභිරුහිත්වා ඨිතෙන සක්කා හොති ගණ්හිතුං එවං ආලම්බනං නිස්සාය තිරියතො ඨපිතපතොදො. **යොග්ගාචරියොති** අස්සාචරියො; ස්වෙව අස්සදම්මෙ සාරෙතීති **අස්සදම්මසාරථි**. **යෙනිච්ඡකන්ති** යෙන යෙන මග්ගෙන ඉච්ඡති; **යදිච්ඡකන්ති** යං යං ගතිං ඉච්ඡති. **සාරෙය්‍යාති** උජුකං පුරතො පෙසෙය්‍ය. **පච්චාසාරෙය්‍යාති** පටිනිවත්තෙය්‍ය.

**එවමෙව ඛොති** යථා සො[3] යොග්ගාචරියො යෙන යෙන මග්ගෙන ගමනං ඉච්ඡති, තං තං අස්සා ආරූළ්හාව හොන්ති, යාය යාය ච ගතියා ඉච්ඡති, සා සා ගති ගහිතාව හොති. රථං පෙසෙත්වා අස්සා නෙව වාරෙතබ්බා, න විජ්ඣිතබ්බා හොන්ති, කෙවලං තෙසං සමෙ භූමිභාගෙ ඛුරෙසු නිමිත්තං ඨපෙත්වා ගමනමෙව පස්සිතබ්බං හොති. එවං මය්හම්පි තෙසු භික්ඛූසු පුනප්පුනං වත්තබ්බං නාහොසි. ඉදං කරෙථ, ඉදං මා කරෙථාති සතුප්පාදනමත්තමෙව කත්තබ්බං හොති. තෙහිපි තාවදෙව කත්තබ්බං කතමෙව හොති, අකත්තබ්බං ජහිතමෙව. **තස්මාති** යස්මා සුබ්බචා යුත්තයානපටිභාගා හුත්වා සතුප්පාදනමත්තෙනෙව පජහිංසු, තස්මා තුම්හෙපි පජහථාති අත්ථො.

**එලණ්ඩෙහීති** එලණ්ඩා කිර සාලදූසනා හොන්ති; තස්මා එවමාහ. **විසොධෙය්‍යාති** එලණ්ඩෙ චෙව අඤ්ඤා ච වල්ලියො ඡින්දිත්වා බහි නීහරණෙන සොධෙය්‍ය. **සුජාතාති** සුසණ්ඨිතා. **සම්මා පරිහරෙය්‍යාති** මරියාදං බන්ධිත්වා උදකාසිඤ්චනෙනපි, කාලෙන කාලං මූලපලිබන්ධනෙනපි[4] වල්ලිගුම්බාදිච්ඡෙදනෙනපි කිපිල්ලපුටක[5]මක්කටකජාල සුක්ඛදණ්ඩකහරණෙනපි සම්මා වඩ්ඪෙය්‍ය, පොසෙය්‍ය. වුද්ධි ආදීනි වුත්තත්ථානෙව.

ඉදානි අක්ඛන්තියා දොසං දස්සෙන්තො, **භූතපුබ්බන්ති** ආදිමාහ. තත්ථ **වෙදෙහිකාති** විදෙහරට්ඨවාසිකස්ස[6] කුලස්ස ධීතා. අථවා, වෙදොති පඤ්ඤා වුච්චති; වෙදෙන ඊහති, ඉරියතීති වෙදෙහිකා; **පණ්ඩිතාති** අත්ථො. **ගහපතානීති** ඝරසාමිනී. **කිත්තිසද්දොති** කිත්තිඝොසො. **සොරතාති** සොරච්චෙන සමන්නාගතා; **නිවාතාති** නිවාතවුත්ති; **උපසන්තාති** නිබ්බුතා; **දක්ඛාති** භත්තපචනසයනත්ථරණ දීපුජ්ජලනාදිකම්මෙසු ඡෙකා; **අනලසාති** උට්ඨාහිකා; **සුසංවිහිතකම්මන්තාති** සුට්ඨපිතා[7] කම්මන්තා. එකා අනලසා හොති, යං යං පන

1. සුභූමියං-S. 2 චතුම්මහාපථෙ-B S. 3. යථා හි සො-B. S.
4. මූලමූල බන්ධනෙනපි-B. S. 5. කිපිල්ලපූටකහරණෙනපි-B.-S.
6. විදෙහරට්ඨවාසිනො කස්සචි-A. P2. 7. සුට්ඨු ඨපිතා-S. සුට්ඨු සංවිහිතා-B.

භාජනං ගණ්හාති, තං තං භින්දති වා ඡිද්දං වා කරොති. අයං පන න තාදිසාති දස්සෙති.

**දිවා උට්ඨාසීති** පාතො කාතබ්බානි ධෙනුදොහනාදිකම්මානි අකත්වා උස්සූරෙ උට්ඨිතා. **හෙ ජෙ කාළීති** අරෙ කාළි. **කිං ජෙ දිවා උට්ඨාසි කිං තෙ කිඤ්චි අඵාසුකං අත්ථීති.** **නො වතරෙ කිඤ්චීති** අරෙ යදි තෙ න කිඤ්චි අඵාසුකං අත්ථි, නෙව සීසං රුජති, න පිට්ඨි, අථ කස්මා පාපි දාසි[1] දිවා උට්ඨාසීති කුපිතා අනත්තමනා භකුටිං අකාසි. **දිවාතරං උට්ඨාසීති** පුන දිවසෙ උස්සූරතරං උට්ඨාසි. **අනත්තමනවාචන්ති** අරෙ පාපදාසි අත්තනො පමාණං ජාන;[2] කිං අග්ගිං සීතොසි මඤ්ඤසි, ඉදානි තං සික්ඛාපෙස්සාමීති ආදීනි වදමානා කුපිතවචනං නිච්ඡාරෙසි. **පටිවිස්සකානන්ති** සාමන්තගෙහවාසීනං; **උජ්ඣාපෙසීති** අවජානාපෙසි. **චණ්ඩීති** අසොරතා, කිබ්බිසා. **ඉති** යත්තකා ගුණා තතො ද්විගුණා දොසා උප්පජ්ජිංසු. ගුණා නාම සණිකං සණිකං ආගච්ඡන්ති; දොසා එකදිවසෙනෙව පත්ථටා හොන්ති.

**සොරතසොරතොති** අතිවිය සොරතො; සොතාපන්නො නු ඛො, සකදාගාමී, අනාගාමී, අරහා නු ඛොති වත්තබ්බතං ආපජ්ජති. **ඵුසන්තීති** ඵුසන්ති ඝට්ටෙන්ති ආපාථං ආගච්ඡන්ති. **අථ භික්ඛු සොරතොති වෙදිතබ්බොති** අථ අධිවාසනක්ඛන්තියං ඨිතො භික්ඛු සොරතොති වෙදිතබ්බො. **යො චීවර-පෙ-පරික්ඛාරහෙතූති** යො එතානි චීවරාදීනි පණීතපණීතානි ලභන්තො පාදපරිකම්මපිට්ඨිපරිකම්මාදීනි එතකවචනෙනෙව කරොති. **අලභමානොති** යථා පුබ්බෙ ලභති, එවං අලභන්තො. **ධම්මංයෙව සක්කරොන්තොති** ධම්මංයෙව සක්කාරං සුකතකාරං කරොන්තො; **ගරුං කරොන්තොති** ගරුං භාරියං කරොන්තො.[3] **අපචායමානොති** ධම්මංයෙව[4] අපචිතිං නීචවුත්තිං දස්සෙන්තො.

එවං අක්ඛන්තියා දොසං දස්සෙත්වා ඉදානි යෙ අධිවාසෙන්ති, තෙ එවං අධිවාසෙන්තීති පඤ්චවචනපථෙ දස්සෙන්තො, **පඤ්චිමෙ භික්ඛවෙති** ආදිමාහ. තත්ථ **කාලෙනාති** යුත්තපත්තකාලෙන; **භූතෙනාති** සතා, විජ්ජමානෙන; **සණ්හෙනාති** මට්ඨෙන; **අත්ථසංහිතෙනාති** අත්ථනිස්සිතෙන, කාරණනිස්සිතෙන. **අකාලෙනාති** ආදීනි තෙසංයෙව පටිපක්ඛවසෙන වෙදිතබ්බානි. **මෙත්තචිත්තාති** උප්පන්නමෙත්තචිත්තා හුත්වා; **දොසන්තරාති** දුට්ඨචිත්තා, අබ්භන්තරෙ උප්පන්නදොසා හුත්වා. **තත්‍රාති**[5] තෙසු වචනපථෙසු. **ඵරිත්වාති** අධිමුච්චිත්වා,

1. පාපදාසි-S. E. 2. න ජානාසි-B. S. 3. "මානෙන්තොති මනෙන පියං කරොන්තො; පූජෙන්තොති පච්චයපූජාය පූජෙන්තො-B. S. (අයං පන ලද්ධෙසු පාළිඅට්ඨකථාපොත්ථකෙසු න ඉධ ආගතො.)
4. ධම්මංයෙව අපචායමානො-B. S. 5. තත්‍රාපීති-B. S.

**තදාරම්මණඤ්චාති**, කථං තදාරම්මණං සබ්බාවන්තං ලොකං කරොති? පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතං පුග්ගලං මෙත්තචිත්තස්ස ආරම්මණං කත්වා පුන තස්සෙව මෙත්තචිත්තස්ස[1] අවසෙසෙ සත්තෙ ආරම්මණං කරොන්තො සබ්බාවන්තං ලොකං තදාරම්මණං කරොති නාම.

තත්‍රායං වචනත්ථො: **තදාරම්මණඤ්චාති** තස්සෙව[2] මෙත්තචිත්තස්ස ආරම්මණං කත්වා. **සබ්බාවන්තන්ති** සබ්බසත්තවන්තං; **ලොකන්ති** සත්තලොකං; **විපුලෙනාති** අනෙකසත්තාරම්මණෙන; **මහග්ගතෙනාති** මහග්ගතභූමිකෙන; **අප්පමාණෙනාති** සුභාවිතෙන; **අවෙරෙනාති** නිද්දොසෙන; **අබ්‍යාපජ්ඣෙනාති** නිදුක්ඛෙන; **ඵරිත්වා විහරිස්සාමාති** එවරූපෙන මෙත්තාසහගතෙන චෙතසා තඤ්ච පුග්ගලං සබ්බඤ්ච ලොකං තස්ස චිත්තස්ස ආරම්මණං කත්වා අධිමුච්චිත්වා විහරිස්සාම.

ඉදානි තදත්ථදීපිකා උපමා[3] ආහරන්තො **සෙය්‍යථාපීති** ආදිමාහ. තත්ථ **අපථවිං**ති නිප්පථවිං කරිස්සාමි; අභාවං ගමෙස්සාමීති අත්ථො. **තත්‍ර තත්‍රාති** තස්මිං තස්මිං ඨානෙ; **විකිරෙය්‍යාති** පවිජ්ජියා පංසුං උද්ධරිත්වා . ති විය විකිරෙය්‍ය. **ඔමුත්තෙය්‍යාති** ඛෙළං පාතෙය්‍ය **අපථවිං කරෙය්‍යාති** එවං කායෙන ච වාචාය ච පයොගං කත්වාපි[4] සක්කුණෙය්‍ය අපථවිං කාතුන්ති? **ගම්භීරාති** බහලත්තෙන ද්වියොජන සතසහස්සානි චත්තාරි ච නහුතානි ගම්භීරා. **අප්පමෙය්‍යාති** තිරියං පන අපරිච්ඡින්නා. **එවමෙව ඛොති** එත්ථ ඉදං ඔපම්මසංසන්දනං: පථවී විය හි මෙත්තචිත්තං දට්ඨබ්බං; කුද්දාලපිටකං ගහෙත්වා ආගතපුරිසො විය පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො. යථා සො කුද්දාලපිටකෙන මහාපථවිං අපථවිං කාතුං න සක්කොති, එවං වො පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො මෙත්තචිත්තස්ස අඤ්ඤථත්තං කාතුං න සක්ඛිස්සතීති.

දුතියඋපමායං **හලිද්දින්ති** යං කිඤ්චි පීතකවණ්ණං; **නීලන්ති** කංසනීලං වා පලාසනීලං වා. **අරූපීති** අරූපො. තත්‍ර ච, "ද්වින්නං කට්ඨානං වා රුක්ඛානං වා සෙය්‍යානං වා සෙලානං වා. අන්තරං පරිච්ඡින්නාකාසරූප"න්ති ආගතං? කස්මා ඉධ අරූපීති වුත්තොති? සනිදස්සනභාවපටික්ඛෙපතො. තෙනෙවාහ: **අනිදස්සනොති**. තස්මිං හි රූපං ලිඛිතුං, රූපපාතුභාවං දස්සෙතුං න සක්කා; තස්මා අරූපීති වුත්තො. **අනිදස්සනොති** දස්සනස්ස චක්ඛුවිඤ්ඤාණස්ස අනාපාථො. උපමාසංසන්දනෙ පනෙත්ථ ආකාසො විය මෙත්තචිත්තං; තුලිකපඤ්චමා චත්තාරො රඞ්ගජාතා විය පඤ්ච වචනපථා; තුලිකපඤ්චමෙ රඞ්ගෙ ගහෙත්වා ආගතපුරිසො විය පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො. යථා සො තුලිකපඤ්චමෙහි රඞ්ගෙහි ආකාසෙ රූපපාතු

1. මෙත්තස්ස-L.
2. තස්සෙව ච-A. P2. B. S.
3. තදත්ථදීපකා උපමා-B. S.
4. කත්වාපි න-B. S.

භාවං කාතුං න සක්කොති, එවං වො පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො මෙත්තචිත්තස්ස අඤ්ඤථත්තං කත්වා දොසුප්පත්තිං දස්සෙතුං න සක්ඛිස්සතීති.

තතියඋපමායං **ආදිත්තායාති** පජ්ජලිතං. **ගම්භීරා අප්පමෙය්‍යාති** ඉමිස්සා ගඞ්ගාය ගම්භීරට්ඨානං ගාවුතම්පි අත්ථි, අඩ්ඪයොජනම්පි.[1] පුථුලත්තං පනස්සා එවරූපංයෙව; දීඝතො පන පඤ්ච යොජනසතානි. සා කථං ගම්භීරා අප්පමෙය්‍යාති? එතෙන පයොගෙන පරිවත්තෙත්වා උද්ධනෙ උදකං විය තාපෙතුං අසක්කුණෙය්‍යතො. සීතොදකං පන කෙනචි උපායෙන අඞ්ගුලමත්තං, අඩ්ඪඞ්ගුලමත්තං වා එවං[2] තාපෙතුං සක්කා භවෙය්‍ය. අයං පන න සක්කා. තස්මා එවං වුත්තං. උපමාසංසන්දනෙ **පනෙත්ථ** ගඞ්ගා විය මෙත්තචිත්තං; **තිණුක්කං** ආදාය ආගතපුරිසො විය පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො. යථා සො[3] තිණුක්කාය ගඞ්ගං තාපෙතුං න සක්කොති, එවං වො පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො මෙත්තචිත්තස්ස අඤ්ඤථත්තං කාතුං න සක්ඛිස්සතීති.

චතුත්ථඋපමායං **බිළාරභස්තාති** බිළාරචම්මපසිබ්බකො; **සුමද්දිතාති** සුට්ඨු මද්දිතා; **සුපරිමද්දිතාති** අන්තො ච බහි ච සමන්තතො සුසම්මද්දිතා. **තූලිනීති** සිම්බලිතූලලතාතූලසමානා. **ඡින්නසස්සරාති** ඡින්නසස්සරසද්දා; **ඡින්නභබ්භරාති**[4] ඡින්නභබ්භරසද්දා[5]. උපමාසංසන්දනෙ පනෙත්ථ බිළාරභස්තා විය මෙත්තචිත්තං; කට්ඨකඨලං ආදාය ආගතපුරිසො විය පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො. යථා සො කට්ඨෙන වා කඨලෙන වා බිළාරභස්තං සරසරං, භරභරං කාතුං න සක්කොති, එවං වො පඤ්ච වචනපථෙ ගහෙත්වා ආගතපුග්ගලො මෙත්තචිත්තස්ස අඤ්ඤථත්තං කත්වා දොසානුගතභාවං කාතුං න සක්ඛිස්සතීති.

**ඔචරකාති** අවචරකා, හෙට්ඨාචරකා; නීචකම්මකාරකාති අත්ථො. **යො මනො පදූසෙය්‍යාති** යො භික්ඛු වා භික්ඛුනී වා චිත්තං පදූසෙය්‍ය, තං කකචෙන ඔකන්තන්තං නාධිවාසෙය්‍ය. **න මෙ සො තෙන සාසනකරොති** සො තෙන අනධිවාසනෙන මය්හං ඔවාදකරො න හොති. ආපත්ති පනෙත්ථ නත්ථි. **අණුං වා ථූලං වාති** අප්පසාවජ්ජං වා මහාසාවජ්ජං වා. **යං තුම්හෙ නාධිවාසෙය්‍යාථාති** යො තුම්හෙහි අධිවාසෙතබ්බො න භවෙය්‍යාති අත්ථො. **නො හෙතං භන්තෙති** භන්තෙ අනධිවාසෙතබ්බං නාම වචනපථං න පස්සාමාති අධිප්පායො. **දීඝරත්තං හිතාය සුඛායාති**, ඉති භගවා අරහත්තෙන කූටං ගණ්හන්තො යථානුසන්ධිනා දෙසනං නිට්ඨපෙසීති.

**කකචූපමසුත්තං පඨමං.**

---

1. අඩ්ඪයොජනම්පි යොජනම්පි-S. E. 2. එතං-B. S. 3. සො ආදිත්තාය-B.
4. ඛබ්භරන්ති-B. L. පබ්භරාති-S. 5. ඛබ්භරසද්දා-B. L. පබ්භරසද්දා-S.

## 1. 3. 2.

**එවමෙම සුත**න්ති අලගද්ද[1]සුත්තං. තත්ථ ගද්ධෙ බාධයිංසූති ගද්ධබාධිනො; ගද්ධබාධිනො පුබ්බපුරිසා අස්සාති ගද්ධබාධිපුබ්බො; තස්ස **ගද්ධබාධිපුබ්බස්ස**; ගිජ්ඣඝාතකකුලප්පසුතස්සාති[2] අත්ථො. සග්ග මොක්ඛානං අන්තරායං කරොන්තීති **අන්තරායිකා**. තෙ කම්මකිලෙස විපාක උපවාද ආණාවීතික්කමවසෙන පඤ්චවිධා. තත්ථ පඤ්චානන්තරියධම්මා[3] කම්මන්තරායිකා නාම; තථා භික්ඛුනීදූසකකම්මං. තං පන මොක්ඛස්සෙව අන්තරායං කරොති, න සග්ගස්ස. නියතමිච්ඡාදිට්ඨිධම්මා කිලෙසන්තරායිකා නාම. පණ්ඩකතිරච්ඡානගතඋභතොබ්‍යඤ්ජනකානං පටිසන්ධිධම්මා විපාකන්තරායිකා නාම. අරියූපවාදධම්මා උපවාදන්තරායිකා නාම. තෙ පන යාව අරියෙ න ඛමාපෙන්ති, තාවදෙව, න තතො පරං. සඤ්චිච්ච වීතික්කන්තා සත්ත ආපත්තික්ඛන්ධා ආණාවීතික්කමන්තරායිකා නාම. තෙපි යාව භික්ඛුභාවං වා පටිජානාති, න වුට්ඨාති වා, න දෙසෙති වා, තාවදෙව, න තතො පරං.

තත්‍රායං භික්ඛු බහුස්සුතො ධම්මකථිකො සෙසන්තරායිකෙ ජානාති; විනයෙ පන අකොවිදත්තා පණ්ණත්තිවීතික්කමන්තරායිකෙ න ජානාති; තස්මා රහොගතො එවං චින්තෙසි: ඉමෙ අගාරිකා[4] පඤ්ච කාමගුණෙ පරිභුඤ්ජන්තා සොතාපන්නාපි සකදාගාමිනොපි හොන්ති. භික්ඛූපි මනාපිකානි චක්ඛුවිඤ්ඤෙය්‍යානි රූපානි පස්සන්ති, කායවිඤ්ඤෙය්‍යෙ ඵොට්ඨබ්බෙ ඵුසන්ති, මුදුකානි අත්ථරණපාපුරණාදීනි[5] පරිභුඤ්ජන්ති, එතං සබ්බං වට්ටති. කස්මා ඉත්ථීනංයෙව රූපසද්දගන්ධරසඵොට්ඨබ්බා න වට්ටන්ති? එතෙපි වට්ටන්තීති.

එවං රසෙන රසං සංසන්දෙත්වා සච්ඡන්දරාගපරිභොගඤ්ච නිච්ඡන්දරාගපරිභොගඤ්ච එකං කත්වා ථූලවාකෙහි සද්ධිං අතිසුඛුමසුත්තං ඝටෙන්තො විය,[6] සාසපෙන සද්ධිං සිනෙරුං උපසංහරන්තො විය, පාපකං දිට්ඨිගතං උප්පාදෙත්වා, කිං භගවතා මහාසමුද්දං බන්ධන්තෙන විය මහතා උස්සාහෙන පඨමපාරාජිකං පඤ්ඤත්තං, නත්ථි එත්ථ දොසොති සබ්බඤ්ඤුතඤ්ඤාණෙන සද්ධිං පටිවිරුජ්ඣන්තො වෙසාරජ්ජඤාණං පටිබාහන්තො අරියමග්ගෙ ඛාණුකණ්ටකාදීනි පක්ඛිපන්තො, මෙථුනධම්මෙ දොසො නත්ථීති ජිනස්ස ආණාචක්කෙ පහාරමදාසි. තෙනාහ: **තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමීති** ආදිං.[7]

**එවං ව්‍යා ඛො**ති එවං විය ඛො. **සමනුයුඤ්ජන්තීති** ආදීසු, කිං ලද්ධිකො ත්වං, ලද්ධිං වදෙහීති පුච්ඡමානා **සමනුයුඤ්ජන්ති** නාම. ලද්ධිං පතිට්ඨාපෙන්තා[8] **සමනුගාහන්ති** නාම. කෙන කාරණෙන එවං වදෙසීති කාරණං පුච්ඡන්තා **සමනුභාසන්ති** නාම. **අට්ඨි**

---

1. අලගද්දූපම-B. S. 2. කුලප්පසූතස්සාති-S. E. 3. කම්මා-B. S.
4. ආගාරිකා-B. S. අගාරිනො-E. 5. පාපුරණානි-S.
6. "උපඝටෙන්තො වියාති" ටීකා. "ඝටෙන්තො වියාති පාඨො" ඉති ටීකා
7. ආදි-S. E. 8. දිට්ඨිං පට්ඨපෙන්තා-S.

**කඞ්කලූපමා කාමාති** ආදිසු, අට්ඨිකඞ්කලූපමා **අප්පස්සාදට්ඨෙන. මංසපෙසූපමා** බහුසාධාරණට්ඨෙන. **තිණුක්කූපමා** අනුදහනට්ඨෙන. **අඞ්ගාරකාසූපමා** මහාභිතාපට්ඨෙන. **සුපිනකූපමා** ඉත්තරපච්චුපට්ඨානට්ඨෙන. **යාචිතකූපමා** තාවකාලිකට්ඨෙන. **රුක්ඛඵලූපමා** සබ්බඞ්ගපච්චඞ්ගපලිභඤ්ජනට්ඨෙන. **අසිසූනූපමා** අධිකුට්ටනට්ඨෙන. **සත්තිසූලූපමා** විනිවිජ්ඣනට්ඨෙන. **සප්පසිරූපමා** සාසඞ්කසප්පටිභයට්ඨෙන. **ථාමසාති** දිට්ඨිථාමෙන. **පරාමාසාති**[1] දිට්ඨිපරාමාසෙන. **අභිනිවිස්ස වොහරතීති** අධිට්ඨහිත්වා[2] වොහරති, දීපෙති ච. **යතො ඛො තෙ භික්ඛූති** යදා තෙ භික්ඛූ.

**එවං ව්‍යා ඛො අහං භන්තෙ භගවතාති** ඉදං එස අත්තනො අජ්ඣාසයෙන[3] නාපීති වත්තුකාමොපි භගවතො ආනුභාවෙන සම්පටිච්ඡති. බුද්ධානං කිර සම්මුඛා ද්වෙ කථා කථෙතුං සමත්ථො නාම නත්ථි. **කස්ස ඛො නාම ත්වං මොඝපුරිසාති** ත්වං මොඝපුරිස, ඛත්තියස්ස වා, බ්‍රාහ්මණස්ස වා, වෙස්සස්ස වා, සුද්දස්ස වා, ගහට්ඨස්ස වා, පබ්බජිතස්ස වා, දෙවස්ස වා, මනුස්සස්ස වා මයා එවං ධම්මං දෙසිතං ආජානාසි?.

**අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසීති** පාටියෙක්කො අනුසන්ධි. අරිට්ඨො කිර චින්තෙසි: භගවා මං මොඝපුරිසොති වදෙති; න ඛො පන මොඝපුරිසොති වුත්තමත්තකෙන මග්ගඵලානං උපනිස්සයො න හොති. උපසෙනම්පි හි වඞ්ගන්තපුත්තං, "අතිලහුං ඛො ත්වං මොඝපුරිස බාහුල්ලාය ආවත්තො"ති භගවා මොඝපුරිසවාදෙන ඔවදි, ථෙරො අපරභාගෙ ඝටෙන්තො වායමන්තො ඡ අභිඤ්ඤා සච්ඡාකාසි. අහම්පි තථාරූපං විරියං පග්ගණ්හිත්වා මග්ගඵලානි නිබ්බත්තෙස්සාමීති. අථස්ස භගවා බන්ධනාමුත්තපණ්ඩුපලාසස්ස විය අවිරූළ්හිභාවං දස්සෙන්තො ඉමං දෙසනං ආරභි.

**උස්මීකතොපීති** භික්ඛවෙ තුම්හෙ කින්ති මඤ්ඤථ, අයං අරිට්ඨො එවංලද්ධිකො සබ්බඤ්ඤුතඤ්ඤාණෙන පටිවිරුජ්ඣිත්වා වෙසාරජ්ජඤාණං පටිබාහිත්වා තථාගතස්ස ආණාචක්කෙ පහාරං දදමානො, අපි නු ඉමස්මිං ධම්මවිනයෙ උස්මීකතොපි?[4] යථා නිබ්බුතෙපි මහන්තෙ අග්ගික්ඛන්ධෙ ඛජ්ජූපනකමත්තාපි අග්ගිපපටිකා හොතියෙව, යං නිස්සාය පුන මහා අග්ගික්ඛන්ධො භවෙය්‍ය; කින්නු ඛො එවං ඉමස්ස අප්පමත්තිකාපි ඤාණුස්මා අත්ථි, යං නිස්සාය වායමන්තො මග්ගඵලානි නිබ්බත්තෙය්‍යාති? **නො හෙතං භන්තෙති** භන්තෙ එවංලද්ධිකස්ස කුතො එවරූපා ඤාණුස්මා? මග්ගඵලානං පච්චයසමත්ථාය ඤාණුස්මාය උස්මීකතභාවං පටික්ඛිපන්තා වදන්ති. **මඞ්කුභූතොති** නිත්තෙජභූතො; **පත්තක්ඛන්ධොති** පතිතක්ඛන්ධො; **අප්පටිභානොති** කිඤ්චි පටිභානං අපස්සන්තො, ඡින්නපටිභානො; එවරූපම්පි නාම නිය්‍යානිකසාසනං

1. "පරාමසස" ඉති පාළියං,
2. අධිට්ඨහිත්වා-L,
3. අජ්ඣාසයං නෙව-L.
4. උස්මීකතොපීති-L.

ලභිත්වා අචිරෑළ්හධම්මො කිරම්හි, සමුග්ඝාතිතපච්චයො ජාතොති අත්තනො අභබ්බතං පච්චවෙක්ඛන්තො පාදඞ්ගුට්ඨෙන[1] භූමිං ඛණමානො නිසීදි.

**පඤ්ඤායිස්සසි ඛොති** අයම්පි පාටියෙක්කො අනුසන්ධි. අරිට්ඨො කිර චින්තෙසි: භගවා මය්හං මග්ගඵලානං උපනිස්සයො පච්ඡින්නොති වදෙති. න ඛො පන බුද්ධා සඋපනිස්සයානංයෙව ධම්මං දෙසෙන්ති, අනුපනිස්සයානම්පි දෙසෙන්ති. අහං සත්ථු සන්තිකා සුගතොවාදං ලභිත්වා අත්තනො සම්පත්තූපගං කුසලං කරිස්සාමීති. අථස්ස සත්ථා[2] ඔවාදං පටිප්පස්සම්භෙන්තො, **පඤ්ඤායිස්සසීති** ආදිමාහ. තස්සත්ථො: ත්වංයෙව මොඝපුරිස ඉමිනා **පාපකෙන දිට්ඨිගතෙන** නිරයාදීසු පඤ්ඤායිස්සසි; මම සන්තිකා තුය්හං සුගතොවාදො නාම නත්ථි; න මෙ තයා අත්ථො; **ඉධාහං භික්ඛූ පටිපුච්ඡිස්සාමීති.**

**අථ ඛො භගවාති** අයම්පි පාටියෙක්කො අනුසන්ධි. ඉමස්මිං[3] ඨානෙ භගවා පරිසං සොධෙති; අරිට්ඨං ගණතො නිස්සාරෙති. සචෙ හි පරිසගතානං කස්සචි එවං භවෙය්‍ය: අයං අරිට්ඨො භගවතා අකථිතං කථෙතුං කිං සක්ඛිස්සති, කච්චි නු ඛො පරිසමජ්ඣෙ භගවතා කථාය සමාරද්ධාය සහසා කථිතන්ති? එවං කථිතං පන න අරිට්ඨොයෙව සුණාති අඤ්ඤෙනපි සුතං භවිස්සති. අථාපිස්ස සියා: යථා සත්ථා අරිට්ඨං නිග්ගණ්හාති මම්පි එවං නිග්ගණ්හෙය්‍යාති සුත්වාපි තුණ්හීභාවං ආපජ්ජෙය්‍යාති. තං සබ්බං න කරිස්සන්ති,[4] මයාපි න කථිතං, අඤ්ඤෙනපි සුතං නත්ථීති **තුම්හෙපි මෙ භික්ඛවෙති** ආදිනා පරිසාය ලද්ධිං සොධෙති. පරිසාය පන ලද්ධිසොධනෙනෙව අරිට්ඨො ගණතො නිස්සාරිතො නාම හොති.

ඉදානි අරිට්ඨස්ස ලද්ධිං පකාසෙන්තො, **සො වත භික්ඛවෙති** ආදිමාහ. තත්ථ **අඤ්ඤත්‍රෙව කාමෙහීති** ආදිසු යො සො භික්ඛවෙ භික්ඛු තෙ පටිසෙවතො නාලං අන්තරායායාති එවං ලද්ධිකො, සො වත කිලෙසකාමෙහි චෙව කිලෙසකාමසම්පයුත්තෙහි සඤ්ඤාවිතක්කෙහි ච අඤ්ඤත්‍ර එතෙ ධම්මෙ පහාය, විනා එතෙහි ධම්මෙහි වත්ථුකාමෙ පටිසෙවිස්සති මෙථුනසමාචාරං සමාචරිස්සතීති, නෙතං ඨානං විජ්ජති, ඉදං කාරණං නාම නත්ථි, අට්ඨානමෙතං අනවකාසොති.

එවං භගවා, අයං අරිට්ඨො යථා නාම රජකො සුගන්ධානිපි, දුග්ගන්ධානිපි, ජිණ්ණානිපි, නවානිපි, සුද්ධානිපි, අසුද්ධානිපි වත්ථානි එකතො භණ්ඩිකං කරොති, එවමෙව භික්ඛූනං නිච්ඡන්දරාගං පණීතචීවරාදිපරිභොගඤ්ච අනිබද්ධසීලානං[5] අනන්තරායකරං සච්ඡන්දරාගපරිභොගඤ්ච නිබද්ධසීලානං භික්ඛූනං ආවරණකරං සච්ඡන්දරාගපරිභොගඤ්ච සබ්බං එකසදිසං කරොතීති අරිට්ඨස්ස ලද්ධිං පකාසෙත්වා, ඉදානි දුග්ගහිතාය පරියත්තියා දොසං දස්සෙන්තො, **ඉධ භික්ඛවෙ එකච්චෙති** ආදිමාහ.

1. පාදඞ්ගුට්ඨකෙන-B S. 2. අථ භගවා-S. 3. ඉමස්මිං හි-S, E.
4. න කරිස්සති-S. 5. අනිබද්ධසීලානං ගහට්ඨානං-B.

තත්‍ථ **පරියාපුණන්තී**ති උග්ගණ්හන්ති. **සුත්තන්ති** ආදීසු උභතොවිභඞ්ගනිද්දෙසඛන්ධකපරිවාරා, සුත්තනිපාතෙ මඞ්ගලසුත්තරතනසුත්තනාලකසුත්තතුවටකසුත්තානි, අඤ්ඤම්පි ච සුත්තනාමකං තථාගතවචනං **සුත්තන්ති** වෙදිතබ්බං. සබ්බම්පි සගාථකං සුත්තං **ගෙය්‍යන්ති** වෙදිතබ්බං; විසෙසෙන සංයුත්තකෙ සකලොපි සගාථකවග්ගො. **සකලං**[1] අභිධම්මපිටකං, නිග්ගාථකං සුත්තං, යඤ්ච අඤ්ඤම්පි අට්ඨහි අඞ්ගෙහි අසඞ්ගහිතං බුද්ධවචනං, තං **වෙය්‍යාකරණන්ති** වෙදිතබ්බං. ධම්මපදථෙරගාථාථෙරීගාථා, සුත්තනිපාතෙ නොසුත්තනාමිකා සුද්ධිකගාථා ච **ගාථා**ති වෙදිතබ්බා. සොමනස්සඤාණමයිකගාථාපටිසංයුත්තා ද්වෙඅසීති සුත්තන්තා **උදාන**න්ති වෙදිතබ්බා.[2] වුත්තමිදං භගවතාති ආදිනයප්පවත්තා දසුත්තරසතසුත්තන්තා **ඉතිවුත්තක**න්ති වෙදිතබ්බා;[2] අපණ්ණකජාතකාදීනි පඤ්ඤාසාධිකානි පඤ්චජාතකසතානි **ජාතක**න්ති වෙදිතබ්බානි.[2] "චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ"ති ආදිනයප්පවත්තා සබ්බෙපි අච්ඡරියබ්භුතධම්මපටිසංයුත්තා සුත්තන්තා **අබ්භුතධම්ම**න්ති වෙදිතබ්බා,[2] චූළවෙදල්ල-මහාවෙදල්ල-සම්මාදිට්ඨි-සක්කපඤ්හ-සඞ්ඛාරභාජනිය-මහාපුණ්ණම සුත්තාදයො සබ්බෙපි වෙදඤ්ච තුට්ඨිඤ්ච ලද්ධා ලද්ධා පුච්ඡිතසුත්තන්තා **වෙදල්ල**න්ති වෙදිතබ්බා.[2]

**අත්‍ථං න උපපරික්ඛන්තී**ති අත්‍ථත්‍ථං කාරණත්‍ථං න තුලයන්ති,[3] න පරිගණ්හන්ති. **අනුපපරික්ඛත**න්ති අනුපපරික්ඛන්තානං. **න නිජ්ඣානං ඛමන්තී**ති න උපට්ඨහන්ති, න ආපාථං ආගච්ඡන්ති. ඉමස්මිං ඨානෙ සීලං, සමාධි, විපස්සනා, මග්ගො, ඵලං, වට්ටං, විවට්ටං වා[4] කථිතන්ති එවං ජානිතුං න සක්කා හොන්තීති අත්‍ථො. **තෙ උපාරම්භානිසංසා චෙවා**ති තෙ පරෙසං වාදෙ දොසාරොපනානිසංසා හුත්වා පරියාපුණන්තීති අත්‍ථො. **ඉතිවාදප්පමොක්ඛානිසංසා චා**ති එවං වාදප්පමොක්ඛානිසංසා. පරෙහි සකවාදෙ දොසෙ ආරොපිතෙ, තං දොසං එවඤ්ච එවඤ්ච[5] මොචෙස්සාමාති ඉමිනා ච[6] කාරණෙන පරියාපුණන්තීති අත්‍ථො. **තඤ්චස්ස අත්‍ථං නානුභොන්තී**ති යස්ස ච මග්ගස්ස වා ඵලස්ස වා අත්‍ථාය කුලපුත්තා ධම්මං පරියාපුණන්ති, තඤ්ච අස්ස ධම්මස්ස අත්‍ථං එතෙ දුග්ගහිතගාහිනො නානුභොන්ති. අපි ච පරස්ස වාදෙ උපාරම්භං ආරොපෙතුං, අත්තනො වාද තං[7] මොචෙතුං අසක්කොන්තාපි තඤ්ච[8] අත්‍ථං නානුභොන්තියෙව. **අලගද්දත්‍ථිකො**ති ආසිවිසත්‍ථිකො. ගදොති හි විසස්ස නාමං; තං තස්ස අලං පරිපුණ්ණං අත්‍ථීති **අලගද්දො**. **භොගෙ**ති සරීරෙ.

**ඉධ පන භික්ඛවෙ එකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්තී**ති නිත්‍ථරණපරියත්තිවසෙන උග්ගණ්හන්ති. තිස්සො හි පරියත්තියො අලගද්දපරියත්ති, නිත්‍ථරණපරියත්ති, භණ්ඩාගාරිකපරියත්තීති.

---

1 සකලම්පි-A. M2. 2. වෙදිතබ්බං-L.
3. සුත්තත්‍ථං කාරණත්‍ථං න පස්සන්ති-B. S. 4. විවට්ටං-B, L.
5. දොසං එවං-B. S. 6. ඉමිනා වා-L. 7. වාදං-B, S. 8. චෙතං-L.

තත්ථ යො බුද්ධවචනං, එවං චීවරාදීනි වා ලභිස්සාමි, චතුපරිසමජ්ඣෙ වා මං ජානිස්සන්තීති ලාභසක්කාරහෙතු පරියාපුණාති, තස්ස සා පරියත්ති අලගද්දපරියත්ති නාම. එවං පරියාපුණතො හි බුද්ධවචනං අපරියාපුණිත්වා නිද්දොක්කමනං වරතරං.

යො පන බුද්ධවචනං උග්ගණ්හිත්වා සීලස්ස ආගතට්ඨානෙ සීලං පූරෙත්වා, සමාධිනො[1] ආගතට්ඨානෙ සමාධිං ගබ්භං ගණ්හාපෙත්වා, විපස්සනාය ආගතට්ඨානෙ විපස්සනං පට්ඨපෙත්වා, මග්ගඵලානං ආගතට්ඨානෙ මග්ගං භාවෙස්සාමි, ඵලං සච්ඡිකරිස්සාමීති උග්ගණ්හාති, තස්සෙව[2] සා පරියත්ති නිත්ථරණපරියත්ති නාම හොති. ඛීණාසවස්ස පන පරියත්ති භණ්ඩාගාරිකපරියත්ති නාම. තස්ස හි අපරිඤ්ඤාතං, අප්පහීනං, අභාවිතං, අසච්ඡිකතං වා නත්ථි. සො හි පරිඤ්ඤාතක්ඛන්ධො, පහීනකිලෙසො, භාවිතමග්ගො, සච්ඡිකතඵලො; තස්මා බුද්ධවචනං පරියාපුණන්තො තන්තිධාරකො, පවෙණිපාලකො, වංසානුරක්ඛකොව හුත්වා උග්ගණ්හාති. ඉතිස්ස සා පරියත්ති භණ්ඩාගාරිකපරියත්ති නාම හොති.[3]

යො පන පුථුජ්ජනො ඡාතභයාදිසු ගන්ථධරෙසු එකස්මිං ඨානෙ වසිතුං අසක්කොන්තෙසු සයං භික්ඛාචාරෙන අකිලමමානො[4] අතිමධුරං බුද්ධවචනං මා නස්සතු, තන්තිං ධාරෙස්සාමි, වංසං ඨපෙස්සාමි, පවෙණිං පාලෙස්සාමීති පරියාපුණාති, තස්ස පරියත්ති භණ්ඩාගාරිකපරියත්ති හොති න හොතීති? න හොති.[5] කස්මා? න අත්තනො ඨානෙ ඨත්වා පරියාපුතත්තා.[6] පුථුජ්ජනස්ස හි පරියත්ති නාම අලගද්දා වා හොති, නිත්ථරණා වා. සත්තන්නං සෙඛානං නිත්ථරණාව. ඛීණාසවස්ස භණ්ඩාගාරිකපරියත්තියෙව. ඉමස්මිං පන ඨානෙ නිත්ථරණපරියත්ති අධිප්පෙතා.

**නිජ්ඣානං ඛමන්තීති** සීලාදීනං ආගතට්ඨානෙසු ඉධ සීලං කථිතං, ඉධ සමාධි, ඉධ විපස්සනා, ඉධ මග්ගො, ඉධ ඵලං, ඉධ වට්ටං, ඉධ විවට්ටන්ති ආපාථං ආගච්ඡන්ති. **තඤ්චස්ස අත්ථං අනුභොන්තීති** යෙසං මග්ගඵලානං අත්ථාය පරියාපුණන්ති, සුග්ගහීතං පරියත්තිං නිස්සාය මග්ගං භාවෙත්වා ඵලං සච්ඡිකරොන්තා තඤ්චස්ස ධම්මස්ස අත්ථං අනුභවන්ති. පරවාදෙ උපාරම්භං ආරොපෙතුං සක්කොන්තාපි, සකවාදෙ ආරොපිතදොසං ඉච්ඡිතිච්ඡිතට්ඨානං ගහෙත්වා මොචෙතුං සක්කොන්තාපි අනුභොන්තියෙව. **දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්තීති** සීලාදීනං ආගතට්ඨානෙ සීලාදීනි පූරෙන්තානම්පි, පරෙසං වාදෙ සහධම්මෙන උපාරම්භං ආරොපෙන්තානම්පි, සකවාදතො දොසං හරන්තානම්පි, අරහත්තං පත්වා පරිසමජ්ඣෙ ධම්මං දෙසෙත්වා ධම්මදෙසනාය පසන්නෙහි උපනීතෙ චත්තාරො පච්චයෙ පරිභුඤ්ජන්තානම්පි දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්ති.

---

1. සමාධිස්ස-S. E. 2. තස්ස-S. E. 3. නාම-B, S.
4. අකිලමානො-S. අතිකිලමමානො- අතිකීලමානො-L.
5. පරියත්ති හොතීති න හොති-L. 6. පරියාපුණනතො-B, S.

එවං සුග්ගහිතෙ බුද්ධවචනෙ ආනිසංසං දස්සෙත්වා, ඉදානි තත්ථෙව නියොජෙන්තො, **තස්මාතිහ භික්ඛවෙ**ති ආදිමාහ. තත්ථ **තස්මා**ති යස්මා දුග්ගහිතා පරියත්ති දුග්ගහිතඅලගද්දො විය දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තති, සුග්ගහිතා පරියත්ති සුග්ගහිතඅලගද්දො විය හිතාය සුඛාය සංවත්තති, තස්මාති අත්ථො. **තථා නං ධාරෙය්‍යාථා**ති තත්ථෙව නං ධාරෙය්‍යාථ, තෙනෙව අත්ථෙන ගණ්හෙය්‍යාථ. **යෙ වා පනාස්සු ව්‍යත්තා භික්ඛූ**ති යෙ වා පන අඤ්ඤෙ සාරිපුත්තමොග්ගල්ලානමහාකස්සපමහාකච්චානාදිකා ව්‍යත්තා පණ්ඩිතා භික්ඛූ අස්සු, තෙ පුච්ඡිතබ්බා; න අරිට්ඨෙන විය මම සාසනෙ කලලං වා කචවරං වා පක්ඛිපිතබ්බං.

**කුල්ලූපම**න්ති කුල්ලසදිසං. **නිත්ථරණත්ථායා**ති චතුරොඝනිත්ථරණත්ථාය. **උදකණ්ණව**න්ති යං හි උදකං ගම්භීරං න පුථුලං, පුථුලං වා පන න ගම්භීරං, න තං **අණ්ණවො**ති වුච්චති. යං පන ගම්භීරඤ්චෙව පුථුලඤ්ච තං **අණ්ණවො**ති වුච්චති. තස්මා **මහන්තං උදකණ්ණව**න්ති මහන්තං පුථුලං ගම්භීරං උදකන්ති එවමෙත්ථ අත්ථො. **සාසඞ්කං** නාම යත්ථ චොරානං වුට්ඨොකාසො දිස්සති, ඨිතොකාසො, නිසින්නොකාසො, නිපන්නොකාසො දිස්සති. **සප්පටිභයං** නාම යත්ථ චොරෙහි මනුස්සා හතා දිස්සන්ති, විලුත්තා දිස්සන්ති, ආකොටිතා දිස්සන්ති. **උත්තරසෙතූ**ති උදකණ්ණවස්ස උපරිබද්ධො සෙතු. **කුල්ලං බන්ධිත්වා**ති කුල්ලො නාම නිත්ථරණත්ථාය[1] කලාපං කත්වා බද්ධො; පත්ථරිත්වා බද්ධො[2] පන පතරචාටිආදි, යො[3] උළුම්පොති වුච්චති. **උස්සාදෙත්වා**ති[4] උට්ඨපෙත්වා.[5] **කිච්චකාරී**ති කත්තබ්බකාරී;[6] යුත්තකාරී, පතිරූපකාරීති අත්ථො.

**ධම්මාපි වො පහාතබ්බා**ති එත්ථ **ධම්මා**ති සමථවිපස්සනා. භගවා හි සමථෙපි ඡන්දරාගං පජහාපෙති, විපස්සනායපි. සමථෙ ඡන්දරාගං කත්ථ පජහාපෙසි? "ඉති ඛො උදායි නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්සපි පහානං වදාමි. පස්සසි නො ත්වං උදායි තං සංයොජනං අණුං වා ථූලං වා යස්සාහං නො පහානං වදාමී"ති එත්ථ සමථෙ ඡන්දරාගං පජහාපෙසි. "ඉමඤ්චෙ තුම්හෙ භික්ඛවෙ දිට්ඨිං එවං පරිසුද්ධං පරියොදාතං න අල්ලීයෙථ, න කෙලායෙථ, න ධනායෙථා"ති එත්ථ විපස්සනාය ඡන්දරාගං පජහාපෙසි. ඉධ පන උභයත්ථ පජහාපෙන්තො **ධම්මාපි වො පහාතබ්බා පගෙව අධම්මා**ති ආහ.

තත්‍රායං අධිප්පායො: භික්ඛවෙ අහං එවරූපෙසුපි[7] සන්තපණීතෙසු ධම්මෙසු ඡන්දරාගප්පහානං වදාමි, කිං පන ඉමස්මිං අසද්ධම්මෙ ගාමධම්මෙ වසලධම්මෙ දුට්ඨුල්ලෙ ඔදකන්තිකෙ, යත්ථ අයං අරිට්ඨො

---

1. තීරණත්ථාය-B. S.
2. බද්ධා-B. S.
3. පදරචාටිආදයො-B, දුරුචාටිආදයො-S, පතරෙ චාටිආදයො-L.
4. උච්චාපෙත්වාති-B, උස්සාපෙත්වාති-S.
5. ඨපෙත්වා-B. S.
6. පත්තකාරී-B, S.
7. එවරූපෙසු-B. S.

මොඝපුරිසො නිද්දොසසඤ්ඤී පඤ්චසු කාමගුණෙසු ඡන්දරාගං නාලං අන්තරායායාති වදති. අරිට්ඨෙන විය න තුම්හෙහි මය්හං සාසනෙ කලලං වා කචවරෙ වා පක්ඛිපිතබ්බොති[1] එවං භගවා ඉමිනාපි ඔවාදෙන අරිට්ඨංයෙව නිග්ගණ්හාති.

භගවා පඨමබොධියං වීසති වස්සානි අනිබද්ධවාසො අහොසි; පච්ඡා පඤ්චවීසති වස්සානි අබ්බොකිණ්ණං සාවත්ථිංයෙව උපනිස්සාය වසන්තො එකදිවසං ද්වෙ ඨානානි පරිභුඤ්ජති: ජෙතවනෙ රත්තිං වසිත්වා පුන දිවසෙ භික්ඛුසඞ්ඝපරිවුතො දක්ඛිණද්වාරෙන සාවත්ථිං පිණ්ඩාය පවිසිත්වා පාචීනද්වාරෙන නික්ඛමිත්වා පුබ්බාරාමෙ දිවාවිහාරං කරොති. පුබ්බාරාමෙ රත්තිං වසිත්වා පුනදිවසෙ පාචීනද්වාරෙන සාවත්ථිං පිණ්ඩාය පවිසිත්වා දක්ඛිණද්වාරෙන නික්ඛමිත්වා ජෙතවනෙ දිවාවිහාරං කරොති. කස්මා? ද්වින්නං කුලානං අනුකම්පාය. මනුස්සත්තභාවෙ ඨිතෙන හි අනාථපිණ්ඩිකෙන විය අඤ්ඤෙන කෙනචි, මාතුගාමත්තභාවෙ ඨිතාය ච විසාඛාය විය අඤ්ඤාය[3] ඉත්ථියා තථාගතං උද්දිස්ස ධනපරිච්චාගො කතො නාම නත්ථි. තස්මා භගවා තෙසං අනුකම්පාය එකදිවසෙ ඉමානි ද්වෙ ඨානානි පරිභුඤ්ජති. තස්මිං පන දිවසෙ ජෙතවනෙ වසි. තස්මා ථෙරො, අජ්ජ භගවා සාවත්ථියං පිණ්ඩාය චරිත්වා සායන්හකාලෙ ගත්තානි පරිසිඤ්චනත්ථාය පුබ්බකොට්ඨකං ගමිස්සති, අථාහං ගත්තානි පරිසිඤ්චිත්වා ඨිතං භගවන්තං යාචිත්වා රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමං ගහෙත්වා ගමිස්සාමි, එවමිමෙ භික්ඛූ භගවතො සම්මුඛා ලභිස්සන්ති ධම්මිං කථං සවනායාති චින්තෙත්වා තෙ භික්ඛූ එවමාහ.

**මිගාරමාතු පාසාදොති** විසාඛාය පාසාදෙ. සා හි මිගාරෙන සෙට්ඨිනා මාතුට්ඨානෙ ඨපිතත්තා මිගාරමාතාති වුච්චති. **පටිසල්ලානා වුට්ඨිතොති** තස්මිං කිර පාසාදෙ ද්වින්නං මහාසාවකානං සිරිගබ්භානං මජ්ඣෙ භගවතො සිරිගබ්භො අහොසි. ථෙරො ද්වාරං විවරිත්වා අන්තොගබ්භං සම්මජ්ජිත්වා මාලාකචවරං නීහරිත්වා මඤ්චපීඨං පඤ්ඤපෙත්වා සත්ථු සඤ්ඤං අදාසි. සත්ථා සිරිගබ්භං පවිසිත්වා දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො සීහසෙය්‍යං උපගම්ම දරථං පටිප්පස්සම්භෙත්වා උට්ඨාය ඵලසමාපත්තිං අප්පෙත්වා නිසීදිත්වා සායන්හසමයෙ තතො

1. සරීරපටිජග්ගනං කත්වා-B, S. 2. චාරුය්හ-B, S. 3. අඤ්ඤාය ච-L.

වුට්ඨාසි. තං සන්ධාය වුත්තං: **පටිසල්ලාණා වුට්ඨිතොති. පරිසිඤ්චි-තුන්ති** යො හි චුණ්ණමත්තිකාදීහි ගත්තානි උබ්බට්ටෙත්වා මල්ලක[1] මූලාදීහි වා ඝංසන්තො න්හායති, සො න්හායතීති වුච්චති. යො තථා අකත්වා පකතියාව න්හායති, සො පරිසිඤ්චතීති වුච්චති. භගවතො ච[2] සරීරෙ තථා හරිතබ්බං රජොජල්ලං නාම නූපලිප්පති.[3] උතුග්ගහ-ණත්ථං පන භගවා කෙවලං උදකං[4] ඔතරති. තෙනාහ: **ගත්තානි පරිසිඤ්චිතුන්ති.**

**පුබ්බකොට්ඨකොති** පාචීනකොට්ඨකො. **සාවත්ථියං** කිර විහාරො කදාචි මහා හොති, කදාචි ඛුද්දකො. තථා හි, සො විපස්සිස්ස භගවතො කාලෙ යොජනිකො අහොසි; සිඛිස්ස තිගාවුතො;[5] වෙස්සභුස්ස අඩ්ඪයොජනිකො; කකුසන්ධස්ස ගාවුතප්පමාණො; කොණාගමනස්ස අඩ්ඪගාවුතප්පමාණො; කස්සපස්ස වීසතිඋසභප්පමාණො; අම්හාකං භගවතො කාලෙ අට්ඨකරීසප්පමාණො ජාතො. තම්පි නගරං තස්ස විහාරස්ස කදාචි පාචීනතො හොති, කදාචි දක්ඛිණතො, කදාචි පච්ඡිමතො, කදාචි උත්තරතො. ජෙතවන-ගන්ධකුටියං පන චතුන්නං මඤ්ච-පාදානං පතිට්ඨිතට්ඨානං අචලමෙව. චත්තාරි හි අචලචෙතියට්ඨානානි නාම: මහාබොධිපල්ලඞ්කට්ඨානං, ඉසිපතනෙ ධම්මචක්කප්පවත්ත-නට්ඨානං, සංකස්සනගරද්වාරෙ[6] දෙවොරොහනකාලෙ සොපානස්ස පතිට්ඨානට්ඨානං[7] මඤ්චපාදට්ඨානන්ති.

අයං පන පුබ්බකොට්ඨකො කස්සපදසබලස්ස වීසතිඋසභිය[8] විහාරකාලෙ පාචීනද්වාරෙ[9] අහොසි. සො ඉදානිපි පුබ්බකොට්ඨකොත්වෙව පඤ්ඤායති. කස්සපදසබලස්ස කාලෙ අචිරවතී නගරං පරික්ඛිපිත්වා සන්දමානා පුබ්බකොට්ඨකං පත්වා උදකෙන භින්දිත්වා මහන්තං උදකදහං මාපෙසි, සමතිත්ථං අනුපුබ්බගම්භීරං. තත්ථ එකං රඤ්ඤො න්හානතිත්ථං, එකං නාගරානං, එකං භික්ඛුසඞ්ඝස්ස, එකං බුද්ධානන්ති එවං පාටිඑක්කානි[10] න්හානතිත්ථානි හොන්ති, රමණීයානි විප්පකිණ්ණරජතපට්ටසදිසවාලිකානි.[11]

ඉති භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන අයං එවරූපො පුබ්බකොට්ඨකො තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. අථායස්මා ආනන්දො උදකසාටිකං උපනෙසි.[12] භගවා රත්තදුපට්ටං අපනෙත්වා උදකසාටිකං නිවාසෙසි. ථෙරො දුපට්ටෙන සද්ධිං මහාචීවරං අත්තනො හත්ථගතං අකාසි. භගවා උදකං ඔතරි. සහොතරණෙනෙවස්ස[13] උදකෙ මච්ඡකච්ඡපා සබ්බෙ සුවණ්ණවණ්ණා අහෙසුං. යන්තනාළිකාහි

1. ඛල්ලක-M2 2. පි-B. S. 3. නූපලිම්පති-S. E. 4. උදකෙ-L. 5. තිගාවුතප්පමාණො-A. M2 P2. E. 6. නගරෙ-B, S. 7. පතිට්ඨිතට්ඨානං-M2. P2. 8. උසභ-B. S. 9. පාචීනතො කොට්ඨකො-S. පාචීනද්වාරකො-P1. T1. 10. පටිපාටියා-B. 11. වාලුකානි-L. 12. උපනාමෙසි-L. E. 13. සහොතරණෙන වස්ස-P1. T1.

සුවණ්ණරසධාරාවිස්සජ්ජනකාලො[1] විය, සුවණ්ණපට[2]පසාරණකාලො විය ච අහොසි. අථ භගවතො නහානවත්තං දස්සෙත්වා නහාත්වා පච්චුත්තිණ්ණස්ස ථෙරො රත්තදුපට්ටං උපනෙසි. භගවා තං නිවාසෙත්වා විජ්ජුල්ලතාසදිසං කායබන්ධනං බන්ධිත්වා මහාචීවරං අන්තන්තෙන සංහරිත්වා පදුමගබ්භසදිසං කත්වා උපනීතං ද්වීසු කණ්ණෙසු ගහෙත්වා අට්ඨාසි. තෙන වුත්තං: **පුබ්බකොට්ඨකෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා[3] එකචීවරො අට්ඨාසී**ති.

එවං ඨිතස්ස පන භගවතො සරීරං විකසිතකමලුප්පලසරං,[4] සබ්බපාලි[5]ඵුල්ලපාරිච්ඡත්තකං, තාරාමරීචිවිකච[6]ගගනතලං, සිරියා අවහසමානං විය විරොචිත්ථ. බ්‍යාමප්පභාපරික්ඛෙපවිලාසිනී චස්ස ද්වත්තිංසවරලක්ඛණමාලා, ගන්ථෙත්වා ඨපිතද්වත්තිංසචන්දමාලා විය, ද්වත්තිංස සුරියමාලා විය, පටිපාටියා ඨපිතා ද්වත්තිංස චක්කවත්තී, ද්වත්තිංස දෙවරාජා, ද්වත්තිංස මහාබ්‍රහ්මානො විය ච අතිවිය විරොචිත්ථ. වණ්ණනාභූමි නාමෙසා. එවරූපෙසු ඨානෙසු බුද්ධානං සරීරවණ්ණං වා ගුණවණ්ණං වා චුණ්ණියපදෙහි වා ගාථාහි වා[7] අත්ථඤ්ච උපමායො ච කාරණානි ච ආහරිත්වා පටිබලෙන ධම්මකථිකෙන පූරෙත්වා කථෙතුං වට්ටති. එවරූපෙසු හි ඨානෙසු ධම්මකථිකස්ස ථාමො වෙදිතබ්බො.

**ගත්තානි පුබ්බාපයමානො**ති පකතිභාවං[8] ගමයමානො. නිරුදකානි කුරුමානො, සුක්ඛාපයමානොති අත්ථො. සොදකෙ ගත්තෙ[9] චීවරං පාරුපන්තස්ස හි චීවරෙ කණ්ණිකා උට්ඨහන්ති, පරික්ඛාරභණ්ඩං දුස්සති. බුද්ධානං පන සරීරෙ රජොජල්ලං න උපලිප්පති; පදුමපත්තෙ පක්ඛිත්තඋදබින්දු[10] විය උදකං විනිවට්ටිත්වා ගච්ඡති. එවං සන්තෙපි සික්ඛාගාරවතාය භගවා, පබ්බජිතවත්තං නාමෙතන්ති මහාචීවරං උභොසු කණ්ණෙසු ගහෙත්වා පුරතො කායං පටිච්ඡාදෙත්වා අට්ඨාසි.

තස්මිං ඛණෙ ථෙරො චින්තෙසි: භගවා මහාචීවරං පාරුපිත්වා මිගාරමාතුපාසාදං ආරබ්භ ගමනාභිනීහාරතො පට්ඨාය දුන්නිවත්තියො භවිස්සති. බුද්ධානං හි අධිප්පායකොපනං නාම එකචාරික සීහස්ස ගහණත්ථං හත්ථප්පසාරණං විය, පභින්නවරවාරණස්ස සොණ්ඩාය පරාමසනං විය, උග්ගතෙජස්ස ආසිවිසස්ස ගීවාය ගහණං විය ච භාරියං හොති. ඉධෙව රම්මකස්ස බ්‍රාහ්මණස්ස අස්සමස්ස වණ්ණං කථෙත්වා තත්ථ ගමනත්ථාය භගවන්තං යාචිස්සාමීති. සො තථා අකාසි. තෙන වුත්තං: **අථ ඛො ආයස්මා ආනන්දො-පෙ-අනුකම්පං උපාදායා**ති. තත්ථ **අනුකම්පං උපාදායා**ති භගවතො සම්මුඛා ධම්මිං කථං[11] සොස්සාමාති තං අස්සමං ගතානං පඤ්චන්නං භික්ඛුසතානං අනුකම්පං පටිච්ච. තෙසු කාරුඤ්ඤං කත්වාති අත්ථො.

1. ධාරාභිසිඤ්චමානකාලො-B. S. 2. සුවණ්ණපට්ට-M. 3. පරිසිඤ්චිත්වා-L. S.
4. කමලුප්පලවනං-S. 5. සබ්බඵාලි-S. E. 6. විකසිතම්ච-S.
7. ගාථාපදෙහි වා-A. M2. P2. 8. පුබ්බභාවං-P1. T1. පුබ්බභාවං පකතිභාවං-E.
9. සොදකෙන ගත්තෙන-S. 10. උදකබින්දු-P1. T1. S. E. 11. ධම්මකථං-L.

**ධම්මියා කථායාති** දසසු පාරමිතාසු අඤ්ඤතරාය පාරමිතාය චෙව මහාභිනික්ඛමනස්ස ච වණ්ණං කථයමානා සන්නිසින්නා **හොන්ති. ආගමයමානොති** ඔලොකයමානො. අහං බුද්ධොති සහසා අපවිසිත්වා යාව සා කථා නිට්ඨාති[1] තාව අට්ඨාසීති අත්ථො. **අග්ගළං ආකොටෙසීති** අග්ගනඛෙන කවාටෙ සඤ්ඤං අදාසි. **විවරිංසූති** සොතං ඔදහිත්වාව නිසින්නත්තා තං ඛණංයෙව[2] ආගන්ත්වා විවරිංසු. **පඤ්ඤත්තෙ ආසනෙති** බුද්ධකාලෙ කිර යත්ථ යත්ථ එකොපි භික්ඛු විහරති, සබ්බත්ථ[3] බුද්ධාසනං පඤ්ඤත්තමෙව හොති.

කස්මා? භගවා කිර අත්තනො සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා ඵාසුකට්ඨානෙ විහරන්තෙ මනසිකරොති: **අසුකො** මය්හං සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා ගතො; අසක්ඛි නු ඛො විසෙසං නිබ්බත්තෙතුං, නොති. අථ නං පස්සති, කම්මට්ඨානං විස්සජ්ජෙත්වා අකුසලවිතක්කං විතක්කයමානං. තතො, කථං හි නාම මාදිසස්ස සත්ථු සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා විහරන්තං ඉමං කුලපුත්තං අකුසලවිතක්කා අභිභවිත්වා[4] අනමතග්ගෙ වට්ටදුක්ඛෙ සංසාදෙස්සන්තීති[5] තස්ස අනුග්ගහත්ථං තත්ථෙව අත්තානං දස්සෙත්වා තං කුලපුත්තං ඔවදිත්වා ආකාසං උප්පතිත්වා පුන අත්තනො වසනට්ඨානමෙව ගච්ඡති. අථෙවං ඔවදියමානා තෙ භික්ඛූ චින්තයිංසු: සත්ථා අම්හාකං මනං ජානිත්වා ආගන්ත්වා අම්හාකං සමීපෙ ඨිතංයෙව අත්තානං දස්සෙති; තස්මිං ඛණෙ[6] භන්තෙ ඉධ නිසීදථ, ඉධ නිසීදථාති[7] ආසනපරියෙසනං නාම භාරොති තෙ ආසනං[8] පඤ්ඤපෙත්වාව විහරන්ති. යස්ස පීඨං අත්ථි, සො තං පඤ්ඤපෙති. යස්ස නත්ථි, සො මඤ්චං වා ඵලකං වා කට්ඨං වා පාසාණං වා වාලිකපුඤ්ජං වා පඤ්ඤපෙති. තං අලභමානා[9] පුරාණපණ්ණානිපි සඞ්කඩ්ඪිත්වා තත්ථ පංසුකූලං පත්ථරිත්වා ඨපෙන්ති.[10] ඉධ පන පකතිපඤ්ඤත්තමෙව ආසනං අහොසි. තං සන්ධාය වුත්තං: **පඤ්ඤත්තෙ ආසනෙ නිසීදීති.**

**කාය නුත්ථාති** කතමාය නු කථාය සන්නිසින්නා භවථාති අත්ථො. කාය චෙත්ථාතිපි පාළි. තස්සා කතමාය නු එත්ථාති අත්ථො. කාය නොත්ථාතිපි පාළි. තස්සා පුරිමොයෙවත්ථො. **අන්තරා කථාති** කම්මට්ඨානමනසිකාර-උද්දෙස-පරිපුච්ඡාදීනං අන්තරා අඤ්ඤා එකා කථා. **විප්පකතාති** මම ආගමනපච්චයා අපරිනිට්ඨිතා සිඛං අප්පත්තා. **අථ භගවා අනුප්පත්තොති** අථ එතස්මිං කාලෙ භගවා ආගතො. **ධම්මී වා කථාති** දසකථාවත්ථුනිස්සිතා වා ධම්මකථා[11]. **අරියො වා තුණ්හීභාවොති** එත්ථ පන දුතියජ්ඣානම්පි අරියො තුණ්හීභාවො, මූල

1. න නිට්ඨාසි-A, M2, P2, E. 2. තං ඛණෙයෙව-L. 3. තත්ථ තත්ථ-S.
4. අභිභවිත්වා කාලං කරිත්වා-P1, T1. 5. සංසාදෙන්තීති-L, සංසීදෙන්තීති-B, S.
6. ඛණෙ ච-S. 7. භන්තෙ ඉධ නිසීදථාති-P1, T1. 8. භාරොති ආසනං-B, S.
9. අලභමානා-L. B. S. 10. ඨපෙසීති-L. 11. ධම්මීකථා-B, S.

කම්මට්ඨානම්පි. තස්මා යං ඣානං අප්පෙත්වා නිසින්නොපි මූලකම්මට්ඨානං ගහෙත්වා නිසින්නොපි භික්ඛු අරියෙන තුණ්හීභාවෙන නිසින්නොති වෙදිතබ්බො.

**ද්වෙමා භික්ඛවෙ පරියෙසනා**ති කො[1] අනුසන්ධි? තෙ භික්ඛූ සම්මුඛා ධම්මකථං[2] සොස්සාමාති ථෙරස්ස භාරං අකංසු. ථෙරො තෙසං අස්සමගමනං අකාසි. තෙ තත්ථ නිසීදිත්වා අතිරච්ඡානකථිකා හුත්වා ධම්මියා කථාය නිසීදිංසු. අථ භගවා අයං තුම්හාකං පරියෙසනා අරියපරියෙසනා නාමාති දස්සෙතුං ඉමං දෙසනං ආරභි. තත්ථ **කතමා ච භික්ඛවෙ අනරියා පරියෙසනා**ති එත්ථ යථා මග්ගකුසලො පුරිසො පඨමං වජ්ජෙතබ්බං අපායමග්ගං දස්සෙන්තො, වාමං මුඤ්චිත්වා දක්ඛිණං ගණ්හාති වදති, එවං භගවා දෙසනාකුසලතාය පඨමං වජ්ජෙතබ්බං අනරියපරියෙසනං ආචික්ඛිත්වා පච්ඡා ඉතරං ආචික්ඛිස්සාමීති උද්දෙසානුක්කමං භින්දිත්වා එවමාහ.

**ජාතිධම්මො**ති ජායනසභාවො; **ජරාධම්මො**ති ජීරණසභාවො; **බ්‍යාධිධම්මො**ති බ්‍යාධිසභාවො; **මරණධම්මො**ති මරණසභාවො; **සොකධම්මො**ති සොචනකසභාවො; **සංකිලෙසධම්මො**ති සංකිලිස්සනසභාවො. **පුත්තභරිය**න්ති පුත්තා ච භරියා ච. එස නයො සබ්බත්ථ. **ජාතරූපරජත**න්ති එත්ථ පන **ජාතරූප**න්ති සුවණ්ණං; **රජත**න්ති යං කිඤ්චි වොහාරූපගං ලොහමාසකාදි. **ජාතිධම්මා හෙතෙ භික්ඛවෙ උපධයො**ති එතෙ පඤ්ච කාමගුණා උපධයො[3] නාම හොන්ති; තෙ සබ්බෙපි ජාතිධම්මාති දස්සෙති. බ්‍යාධිධම්මවාරාදිසු ජාතරූපරජතං න ගහිතං. න හෙතස්ස සීසරොගාදයො බ්‍යාධයො නාම හොන්ති; න සත්තානං විය චුතිසඞ්ඛාතං මරණං, න සොකො උප්පජ්ජති. අයාදීහි[4] පන සඞ්කිලෙසෙහි සඞ්කිලිස්සතීති සඞ්කිලෙස[5]ධම්මවාරෙ ගහිතං; තථා උතුසමුට්ඨානත්තා ජාතිධම්මවාරෙ; මලං ගහෙත්වා ජීරණතො ජරාධම්මවාරෙ ච. **අයං භික්ඛවෙ අරියා පරියෙසනා**ති භික්ඛවෙ අයං සයං නිද්දොසතායපි, අරියෙහි පරියෙසිතබ්බතායපි **අරියපරියෙසනා**ති වෙදිතබ්බා.

**අහම්පි සුදං භික්ඛවෙ**ති කස්මා ආරභි? මූලතො පට්ඨාය මහාභිනික්ඛමනං දස්සෙතුං. එවං කිරස්ස අහොසි: භික්ඛවෙ අහම්පි පුබ්බෙ අනරියපරියෙසනං පරියෙසිං. ස්වාහං තං පහාය අරියපරියෙසනං පරියෙසිත්වා සබ්බඤ්ඤුතං පත්තො. පඤ්චවග්ගියාපි අනරියපරියෙසනං පරියෙසිංසු. තෙ තං පහාය අරියපරියෙසනං පරියෙසිත්වා ඛීණාසවභූමිං පත්තා. තුම්හෙපි මමඤ්චෙව පඤ්චවග්ගියානඤ්ච මග්ගං[6] ආරූළ්හා. අරියපරියෙසනා තුම්හාකං පරියෙසනාති මූලතො පට්ඨාය අත්තනො මහාභිනික්ඛමනං දස්සෙතුං ඉමං දෙසනං ආරභි.

---

1. එකො-S. 2. ධම්මිං කථං-B. S. 3. කාමගුණූපධයො-L.
4. ජරාදීහි-S. 5. සංකිලෙසිකා-B. S. 6. තුම්හෙපි තථෙව මග්ගං-A M2. P2.

**තත්ථ දහරොව සමානොති** තරුණොව සමානො; **සුසුකාළකෙසොති** සුට්ඨුකාළකෙසො, අඤ්ජනවණ්ණකෙසොව හුත්වාති අත්ථො; **භද්‍රෙනාති**[1] ලද්ධකෙන[2]; **පඨමෙන වයසාති** තිණ්ණං වයානං පඨමවයෙන. **අකාමකානන්ති** අනිච්ඡමානානං; අනාදරත්ථෙ සාමිවචනං. **අස්සූනි මුඛෙ එතෙසන්ති** අස්සුමුඛා, තෙසං **අස්සුමුඛානං**; අස්සුකිලින්නමුඛානන්ති අත්ථො; **රුදන්තානන්ති** කන්දිත්වා රොදමානානං.[3]

**කිංකුසලගවෙසීති** කිං කුසලන්ති ගවෙසමානො. **අනුත්තරං සන්තිවරපදන්ති** උත්තමං සන්තිසඞ්ඛාතං වරපදං; නිබ්බානං පරියෙසමානොති අත්ථො. **යෙන ආළාරොති** එත්ථ ආළාරොති තස්ස නාමං; දීඝපිඞ්ගලො කිර සො; තෙනස්ස ආළාරොති නාමං අහොසි. **කාලාමොති** ගොත්තං. **විහරතායස්මාති** විහරතු ආයස්මා. **යත්ථ විඤ්ඤූ පුරිසොති** යස්මිං ධම්මෙ පණ්ඩිතො පුරිසො. **සකං ආචරියකන්ති** අත්තනො ආචරියසමයං. **උපසම්පජ්ජ විහරෙය්‍යාති** පටිලභිත්වා විහරෙය්‍ය. එත්තාවතා තෙන ඔකාසො කතො හොති.

**තං ධම්මන්ති** තං තෙසං සමයතන්තිං. **පරියාපුණින්ති** සුත්වාව[4] උග්ගණ්හිං. **ඔට්ඨපහතමත්තෙනාති** තෙන වුත්තස්ස පටිග්ගහණත්ථං ඔට්ඨපහරණමත්තෙන; අපරාපරං කත්වා ඔට්ඨසඤ්චාර[5]මත්තෙනාති අත්ථො. **ලපිතලාපනමත්තෙනාති** තෙන ලපිතස්ස පටිලාපනමත්තකෙන. **ඤාණවාදන්ති** ජානාමීති වාදං; **ථෙරවාදන්ති** ථිරභාවවාදං; ථෙරො අහමෙත්ථාති එතං වචනං. **අහඤ්චෙව අඤ්ඤෙ චාති** න කෙවලං අහං, අඤ්ඤෙපි බහූ එවං වදන්ති. **කෙවලං සද්ධාමත්තකෙනාති** පඤ්ඤාය අසච්ඡිකත්වා සුද්ධෙන සද්ධාමත්තකෙනෙව. බොධිසත්තො කිර වාචාය ධම්මං උග්ගණ්හන්තොයෙව න කාලාමස්ස වාචාය පරියත්ති[6]මත්තමෙව අස්මිං ධම්මෙ, අද්ධා එස සත්තන්නං සමාපත්තීනං ලාභීති අඤ්ඤාසි. තෙනස්ස එතදහොසි. **ආකිඤ්චඤ්ඤායතනං පවෙදෙසීති** ආකිඤ්චඤ්ඤායතනපරියොසානා සත්ත සමාපත්තියො මං ජානාපෙසි. **සද්ධාති** ඉමාසං සත්තන්නං සමාපත්තීනං නිබ්බත්තනත්ථාය සද්ධා. විරියාදීසුපි එසෙව නයො. **පදහෙය්‍යන්ති** පයොගං කරෙය්‍යං.

**න චිරෙනෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසින්ති** බොධිසත්තො[7] විරියං පග්ගහෙත්වා කතිපාහෙනෙව සත්ත සුවණ්ණනිස්සෙණියො සඞ්ඝාටෙන්තො[8] විය සත්ත සමාපත්තියො නිබ්බත්තෙසි. තස්මා එවමාහ. **ලාභා නො ආවුසොති** අනුසූය්‍යකො කිරෙස කාලාමො. තස්මා අයං අධුනාගතො, කින්ති කත්වා ඉමං ධම්මං නිබ්බත්තෙසීති උසූයං අකත්වා පසන්නො පසාදං පවෙදෙන්තො එවමාහ. **උභොව සන්තා ඉමං ගණං පරිහරාමාති** මහා අයං ගණො, ද්වෙපි ජනා පරිහරාමාති වත්වා ගණස්ස සඤ්ඤං අදාසි; අහම්පි සත්තන්නං

---

1. භද්දෙනාති-L, E.
2. භද්දකෙන-B. S.
3. රුදමානානං-B. S.
4. සුත්වා-L.
5. ඔට්ඨසඤ්චරණ-S. සඤ්චරණ-E
6. පරියත්ති-B, S.
7. බොධිසත්තො කිර-B, S.
8. සම්පාදෙන්තො-S.

සමාපත්තීනං ලාභී, මහාපුරිසොපි සත්තන්නමෙව; එත්තකා නාම[1] මහාපුරිසස්ස සත්තිකො පරිකම්මං උග්ගණ්හාතු, එත්තකා මඤ්ඤන්ති මජ්ඣෙ භින්දිත්වා අදාසි.

**උළාරායාති** උත්තමාය; **පූජායාති**, කාලාමස්ස කිර උපට්ඨාකා ඉත්ථියොපි පුරිසාපි ගන්ධමාලාදීනි ගහෙත්වා ආගච්ඡන්ති. කාලාමො, ගච්ඡථ මහාපුරිසං පූජෙථාති වදති. තෙ තං[2] පූජෙත්වා යං අවසිට්ඨං හොති, තෙන කාලාමං පූජෙන්ති; මහග්ඝානි මඤ්චපීඨානි ආහරන්ති; තානිපි මහාපුරිසස්ස දාපෙත්වා යදි අවසිට්ඨං හොති, අත්තනා[3] ගණ්හාති. ගතගතට්ඨානෙ වරසෙනාසනං බොධිසත්තස්ස ජග්ගාපෙත්වා සෙසකං අත්තනා[3] ගණ්හාති. එවං උළාරාය පූජාය පූජෙසි.

**නායං ධම්මො නිබ්බිදායාති** ආදිසු අයං සත්තසමාපත්තිධම්මො-නෙව වට්ටෙ නිබ්බින්දනත්ථාය, න විරජ්ජනත්ථාය, න රාගාදීනං නිරොධනත්ථාය, න උපසමත්ථාය, න අභිඤ්ඤෙය්‍යධම්මං අභිජානනත්ථාය, න චතුමග්ගසම්බොධාය, න නිබ්බානසච්ඡිකිරියාය සංවත්තතීති අත්ථො. **යාවදෙව ආකිඤ්චඤ්ඤායතනූපපත්තියාති** යාව සට්ඨිකප්පසහස්සායුපරිමාණෙ ආකිඤ්චඤ්ඤායතනභවෙ උපපත්ති, තාවදෙව සංවත්තති, න තතො උද්ධං. එවමයං පුනරාවත්තනකධම්මො එව; යඤ්ච ඨානං පාපෙති තං ජාතිජරාමරණෙහි අපරිමුත්තමෙව, මච්චුපාසපරික්ඛිත්තමෙවාති.

තතො පට්ඨාය ච පන මහාසත්තො යථා නාම ඡාතජ්ඣත්ත පුරිසො මනුඤ්ඤං භොජනං ලභිත්වා සම්පියායමානොපි භුඤ්ජිත්වා පිත්තවසෙන වා සෙම්හවසෙන වා මක්ඛිකාවසෙන වා[4] ඡඩ්ඩෙත්වා පුන එකපිණ්ඩම්පි භුඤ්ජිස්සාමීති චිත්තං න උප්පාදෙති; එවමෙව ඉමා සත්ත සමාපත්තියො මහන්තෙන උස්සාහෙන නිබ්බත්තෙත්වාපි, තාසු ඉමං පුනරාවත්තනකාදිභෙදං ආදීනවං දිස්වා, පුන ඉමං ධම්මං ආවජ්ජිස්සාමි වා සමාපජ්ජිස්සාමි වා අධිට්ඨහිස්සාමි වා වුට්ඨහිස්සාමි වා පච්චවෙක්ඛිස්සාමි වාති චිත්තමෙව න උප්පාදෙසි. **අනලං කරිත්වාති** අලං ඉමිනා, අලං ඉමිනාති[5] පුනප්පුනං අලං[6] කරිත්වා. **නිබ්බිජ්ජාති** නිබ්බින්දිත්වා; **අපක්කමින්ති** අගමාසිං.[7]

**න ඛො රාමො ඉමං ධම්මන්ති** ඉධාපි බොධිසත්තො තං ධම්මං උග්ගණ්හන්තොයෙව **අඤ්ඤාසි**: අයං අට්ඨසමාපත්තිධම්මො න උදකස්ස[8] වාචාය උග්ගහිතමත්තොව,[9] අද්ධා පනෙස අට්ඨසමාපත්තිලාභීති. තෙනස්ස එතදහොසි: **න ඛො රාමො—පෙ—ජානං පස්සං විහාසීති.** සෙසමෙත්ථ පුරිමවාරෙ වුත්තනයෙනෙව වෙදිතබ්බං.

---

1. ඡත්තා-B. S. 2. එතං-P1. T1. තෙ මං-B. 3. අත්තනො-L.
4. මුච්ඡනාව[illegible]-S. මච්ජකාවසෙන වා-M2. P2. මක්ඛිකාවසෙන වා-P1. T1.
5. කරිත්වාති අලං ඉමිනාති-L. 6. අනලං-L. B. S. 7. නිබ්බින්දිත්වා අගමාසි-L.
8. ධම්මො උදකස්ස-S. 9. මත්තොව ඨපිතො-S. මත්තො ඨපිතො-B.

**යෙන**[1] **උරුවෙලා සෙනානිගමොති** එත්ථ **උරුවෙලාති** මහාවෙලා, මහාවාලිකරාසීති අත්ථො. අථවා, උරූති වාලිකා වුච්චති; වෙලාති මරියාදා; වෙලාතික්කමනහෙතු ආභතා උරු **උරුවෙලාති** එවමෙත්ථ අත්ථො දට්ඨබ්බො. අතීතෙ කිර අනුප්පන්නෙ බුද්ධෙ දස සහස්සා කුලපුත්තා තාපසපබ්බජ්ජං පබ්බජිත්වා තස්මිං පදෙසෙ විහරන්තා එකදිවසං සන්නිපතිත්වා කතිකවත්තං අකංසු: කායකම්ම වචීකම්මානි නාම පරෙසම්පි පාකටානි හොන්ති; මනොකම්මං පන අපාකටං; තස්මා යො කාමවිතක්කං වා බ්‍යාපාදවිතක්කං වා විහිංසාවිතක්කං වා විතක්කෙති, තස්ස අඤ්ඤො චොදකො නාම නත්ථි; සො අත්තනාව අත්තානං චොදෙත්වා පත්තපුටෙන[2] වාලිකං ආහරිත්වා ඉමස්මිං ඨානෙ ආකිරතු; ඉදමස්ස දණ්ඩකම්මන්ති. තතො පට්ඨාය යො තාදිසං විතක්කං විතක්කෙති, සො තත්ථ පත්තපුටෙන[2] වාලිකං ආකිරති. එවං තත්ථ අනුක්කමෙන මහාවාලිකරාසි ජාතො. තතො තං[3] පච්ඡිමා ජනතා පරික්ඛිපිත්වා චෙතියට්ඨානමකාසි. තං සන්ධාය වුත්තං: **උරුවෙලාති** මහාවෙලා, මහාවාලිකරාසීති අත්ථොති. තමෙව සන්ධාය වුත්තං: අථවා, උරූති වාලිකා වුච්චති; වෙලාති මරියාදා; වෙලාතික්කමනහෙතු ආභතා උරු උරුවෙලාති එවමෙත්ථ අත්ථො දට්ඨබ්බොති.

**සෙනා-නිගමොති** සෙනාය නිගමො; පඨමකප්පිකානං කිර තස්මිං ඨානෙ සෙනානිවෙසො[4] අහොසි; තස්මා සො පදෙසො සෙනානිගමොති වුච්චති.[5] සෙනානි-ගාමොතිපි පාඨො. සෙනානී නාම සුජාතාය පිතා, තස්ස ගාමොති අත්ථො. **තදවසරින්ති** තත්ථ ඔසරිං. **රමණීයං භූමිභාගන්ති** සුපුප්ඵිතනානප්පකාරථලජ[6]පුප්ඵවිචිත්තං මනොරමං භූමිභාගං. **පාසාදිකඤ්ච වනසණ්ඩන්ති** මොරපිඤ්ඡකලාප[7]සදිසං පසාදජනනං වනසණ්ඩඤ්ච අද්දසං; **නදිඤ්ච සන්දන්තින්ති** සන්දමානඤ්ච මණික්ඛන්ධසදිසවිමලනීලසීතලසලිලං නෙරඤ්ජරං නදිං අද්දසං. **සෙතකන්ති** පරිසුද්ධං, නික්කද්දමං; **සුපතිත්ථන්ති** අනුපුබ්බගම්භීරෙහි සුන්දරෙහි තිත්ථෙහි උපෙතං; **රමණීයන්ති** රජතපට්ටසදිසවිප්පකිණ්ණ වාලිකං පහූතමච්ඡකච්ඡපං අභිරමදස්සනං. **සමන්තා ච ගොචරගාමන්ති** තස්ස පදෙසස්ස සමන්තා අවිදූරෙ ගමනාගමනසම්පන්නං සම්පන්නපබ්බජිතානං සුලභපිණ්ඩං ගොචරගාමඤ්ච අද්දසං. **අලං වතාති** සමත්ථං වත. **තත්ථෙව නිසීදින්ති** බොධිපල්ලඞ්කෙ නිසජ්ජං සන්ධායාහ. උපරිසුත්තස්මිං හි තත්ථෙවාති දුක්කරකාරිකට්ඨානං අධිප්පෙතං; ඉධ පන බොධිපල්ලඞ්කො. තෙනාහ · තත්ථෙව නිසීදින්ති. **අලමිදං පධානායාති** ඉදං ඨානං පධානත්ථාය සමත්ථන්ති එවං චින්තෙත්වා නිසීදින්ති අත්ථො.

1. යෙනාසස-S. 2. පට්ටපුටෙන-S. 3. තං තතො-I.
4. නිවෙසා-S. නිවාසො-E 5. වුච්චති තමෙව සන්ධාය වුත්තං-L.
6. ජලජථලජ-B, S. 7. මොරකලාප-B, S.

**අජ්ඣගම**න්ති අධිගච්ඡිං, පටිලභිං. **ඤාණඤ්ච පන මෙ දස්සන**න්ති සබ්බධම්මදස්සනසමත්ථඤ්ච මෙ සබ්බඤ්ඤුතඤ්ඤාණං උදපාදි. **අකුප්පා මෙ විමුත්තී**ති මය්හං අරහත්තඵලවිමුත්ති අකුප්පතාය ච අකුප්පාරම්මණතාය ච අකුප්පා. සා හි රාගාදීහි න කුප්පතීති අකුප්පතායපි අකුප්පා; අකුප්පං නිබ්බානමස්සා ආරම්මණන්ති අකුප්පාරම්මණතායපි අකුප්පා. **අයමන්තිමා ජාතී**ති අයං සබ්බපච්ඡිමා ජාති; **නත්ථිදානි පුනබ්භවො**ති ඉදානි මෙ පුන පටිසන්ධි නාම නත්ථීති එවං පච්චවෙක්ඛනාඤාණම්පි මෙ උප්පන්නන්ති දස්සෙති.

**අධිගතො**ති පටිවිද්ධො. **ධම්මො**ති චතුසච්චධම්මො. **ගම්භීරො**ති උත්තානභාවපටික්ඛෙපවචනමෙතං. **දුද්දසො**ති ගම්භීරත්තාව දුද්දසො, දුක්ඛෙන දට්ඨබ්බො, න සක්කා සුඛෙන දට්ඨුං. දුද්දසත්තාව **දුරනුබොධො**, දුක්ඛෙන අවබුජ්ඣිතබ්බො, න සක්කා සුඛෙන අවබුජ්ඣිතුං. **සන්තො**ති නිබ්බුතො. **පණීතො**ති අතප්පකො. ඉදං ද්වයං ලොකුත්තරමෙව සන්ධාය වුත්තං. **අතක්කාවචරො**ති තක්කෙන අවචරිතබ්බො, ඔගාහිතබ්බො න හොති; ඤාණෙනෙව අවචරිතබ්බො. **නිපුණො**ති සණ්හො; **පණ්ඩිතවෙදනීයො**ති සම්මාපටිපදං පටිපන්නෙහි පණ්ඩිතෙහි වෙදිතබ්බො.

**ආලයරාමා**ති සත්තා පඤ්චසු කාමගුණෙසු[1] ආලීයන්ති[2]; තස්මා තෙ ආලයාති වුච්චන්ති; අට්ඨසතතණ්හාවිචරිතානි ආලයන්ති[3]; තස්මා ආලයාති වුච්චන්ති; තෙහි ආලයෙහි රමන්තීති ආලයරාමා. ආලයෙසු රතාති **ආලයරතා**. ආලයෙසු සුට්ඨු මුදිතාති **ආලයසම්මුදිතා**. යථෙව හි සුසජ්ජිතං පුප්ඵඵලභරිතරුක්ඛාදිසම්පන්නං උය්යානං පවිට්ඨො රාජා තාය තාය සම්පත්තියා රමති, සම්මුදිතො ආමොදිතපමොදිතො හොති, න උක්කණ්ඨති, සායම්පි නික්ඛමිතුං න ඉච්ඡති; එවමිමෙහිපි[4] කාමාලයතණ්හාලයෙහි සත්තා රමන්ති, සංසාරවට්ටෙ සම්මුදිතා අනුක්කණ්ඨිතා වසන්ති; තෙන තෙසං භගවා දුවිධම්පි ආලයං උය්යානභූමිං විය දස්සෙන්තො **ආලයරාමා**ති ආදිමාහ.

**යදිද**න්ති නිපාතො. තස්ස, ඨානං සන්ධාය යං ඉදන්ති, පටිච්ච සමුප්පාදං සන්ධාය යො අයන්ති අයමත්ථො[5] දට්ඨබ්බො. **ඉදප්පච්චයතා-පටිච්චසමුප්පාදො**ති ඉමෙසං පච්චයා ඉදප්පච්චයා; ඉදප්පච්චයා එව ඉදප්පච්චයතා; ඉදප්පච්චයතා ච සා, පටිච්චසමුප්පාදො චාති ඉදප්පච්චයතා-පටිච්චසමුප්පාදො. සඞ්ඛාරාදිපච්චයානං (අවිජ්ජාදීනං) එතං[6] අධිවචනං. **සබ්බසඞ්ඛාරසමථො**ති ආදි සබ්බං නිබ්බානමෙව[7]. යස්මා හි තං ආගම්ම සබ්බසඞ්ඛාරවිප්ඵන්දිතානි සම්මන්ති, වූපසම්මන්ති,[8] තස්මා

1. පඤ්චකාමගුණෙ-L. B. S. පඤ්චකාමගුණෙසු-D1.
2. අල්ලීයන්ති-P1. T1. ආලයන්ති-S. E. 3. අල්ලීයන්ති-P1: T1.
4. එවමිමෙසි-L. B. S. 5. එවමත්ථො-B. S.
6. සංඛාරාදිපච්චයානං එතං-L. S. T2. E. 7. නිබ්බානවෙවචනමෙව-S.
8. වූපසමන්ති-S. උපසම්මන්ති-E.

**සබ්බසඞ්ඛාරසමථො**ති වුච්චති. යස්මා ච තං ආගම්ම සබ්බෙ උපධයො පටිනිස්සට්ඨා හොන්ති, සබ්බා තණ්හා ඛීයන්ති,[1] සබ්බෙ කිලෙසරාගා විරජ්ජන්ති, සබ්බං දුක්ඛං නිරුජ්ඣති, තස්මා **සබ්බූපධිපටිනිස්සග්ගො, තණ්හක්ඛයො, විරාගො, නිරොධො**ති වුච්චති. සා[2] පනෙසා තණ්හා භවෙන භවං, ඵලෙන වා සද්ධිං කම්මං විනති,[3] සංසිබ්බතීති කත්වා වානන්ති වුච්චති. තතො නික්ඛන්තං වානතොති **නිබ්බානං**.

**සො මමස්ස කිලමථො**ති යා අජානන්තානං දෙසනා නාම, සො මම කිලමථො අස්ස. සා මම විහෙසා අස්සාති **අත්ථො**. කායකිලමථො චෙව කායවිහෙසා ච අස්සාති වුත්තං හොති. චිත්තෙ පන උභයම්පෙතං බුද්ධානං නත්ථි. **අපිස්සූ**ති අනුබ්‍රූහනත්ථෙ නිපාතො. සො, න කෙවලං එතදහොසි, ඉමාපි ගාථා පටිභංසූති දීපෙති. **මන්ති** මම; **අනච්ඡරියා**ති අනු අච්ඡරියා; **පටිභංසූ**ති පටිභානසඞ්ඛාතස්ස **ඤාණස්ස** ගොචරා අහෙසුං; පරිවිතක්කයිතබ්බතං පාපුණිංසු.

**කිච්ඡෙනා**ති දුක්ඛෙන; න[4] දුක්ඛාය පටිපදාය. බුද්ධානං හි චත්තාරොපි මග්ගා සුඛා පටිපදාව හොන්ති. පාරමීපූරණකාලෙ පන සරාග-සදොස-සමොහස්සෙව සතො ආගතාගතානං යාචකානං, අලඞ්කත පටියත්තං සීසං කන්තිත්වා,[5] ගලලොහිතං නීහරිත්වා, සුඅඤ්ජිතානි අක්ඛීනි උප්පාටෙත්වා, කුලවංසප්පදීපං[6] පුත්තං, මනාපචාරිනිං භරියන්ති එවමාදීනි දෙන්තස්ස, අඤ්ඤානි ච ඛන්තිවාදිසදිසෙසු අත්තභාවෙසු ඡෙජ්ජභෙජ්ජාදීනි[7] පාපුණන්තස්ස ආගමනීය[8]පටිපදං සන්ධායෙතං වුත්තං. **හලන්ති** එත්ථ හකාරො නිපාතමත්තො. අලන්ති **අත්ථො**. **පකාසිතුන්ති** දෙසිතුං එවං කිච්ඡෙන අධිගතස්ස ධම්මස්ස අලං දෙසිතුං[9], පරියත්තං දෙසිතුං; කො අත්ථො දෙසිතෙනාති වුත්තං හොති. **රාගදොසපරෙතෙහී**ති රාගදොසඵුට්ඨෙහි, රාගදොසානුගතෙහි වා.

**පටිසොතගාමින්ති** නිච්චාදීනං පටිසොතං අනිච්චං, දුක්ඛමනත්තා අසුභන්ති එවං ගතං චතුසච්චධම්මං. **රාගරත්තා**ති කාමරාගෙන භවරාගෙන දිට්ඨිරාගෙන ච රත්තා. **න දක්ඛන්තී**ති අනිච්චං දුක්ඛමනත්තා අසුභන්ති ඉමිනා සභාවෙන න පස්සිස්සන්ති. තෙ අපස්සන්තෙ කො සක්ඛිස්සති එවං[10] ගාහාපෙතුං? තමොක්ඛන්ධෙන **ආවටා**ති[11] **අවිජ්ජා**රාසිනා අජ්ඣොත්ථටා.

**අප්පොස්සුක්කතායා**ති නිරුස්සුක්කභාවෙන; **අදෙසෙතුකාමතා**යාති **අත්ථො**. කස්මා පනස්ස එවං **චිත්තං නමි**? නනු එස, **මුත්තො** මොචෙස්සාමි, **තිණ්ණො** තාරෙස්සාමි,

1. ඛීයති-L. 2. සා-S. 3. විනාති-L.
4. කිච්ඡෙනාති දු-D1. L. B. S. 5. කත්තිත්වා-L.
6. කුලවංසප්පතිට්ඨාපකං-D2. 7. ඡෙජ්ජභෙජ්ජාදීනි වා-P1, T1
8. ආගමනීය-B. S. E. 9. විභජිතුං-B. S.
10. එවම්භාවං-P1, T1. 11. ආවුතාති-D2

> ''කිමෙම් අඤ්ඤාතවෙසෙන ධම්මං සච්ඡිකතෙනිධ
> සබ්බඤ්ඤුතං පාපුණිත්වා තාරයිස්සං සදෙවක''න්ති

පත්ථනං කත්වා පාරමියො පූරෙත්වා සබ්බඤ්ඤුතං පත්තොති? සච්චමෙතං.[1] පච්චවෙක්ඛණානුභාවෙන පනස්ස එවං චිත්තං නමි. තස්ස හි සබ්බඤ්ඤුතං පත්වා සත්තානං කිලෙසගහනතං, ධම්මස්ස ගම්භීරතං පච්චවෙක්ඛන්තස්ස සත්තානං කිලෙසගහනතා ච ධම්මගම්භීරතා ච සබ්බාකාරෙන පාකටා ජාතා. අථස්ස, ඉමෙ සත්තා කඤ්ජියපුණ්ණාලාබු විය, තක්කභරිතචාටි විය, වසාතෙලපීත[2]පිලොතිකා විය, අඤ්ජනමක්ඛිතහත්ථා විය[3] කිලෙසභරිතා අතිසංකිලිට්ඨා රාගරත්තා දොසදුට්ඨා මොහමූළ්හා, තෙ කිං නාම පටිවිජ්ඣිස්සන්තීති චින්තයතො කිලෙසගහනපච්චවෙක්ඛණානුභාවෙනාපි එවං චිත්තං නමි.

අයඤ්ච[4] ධම්මො පථවිසන්ධාරකඋදකක්ඛන්ධො විය ගම්භීරො, පබ්බතෙන පටිච්ඡාදෙත්වා ඨපිතසාසපො විය[5] දුද්දසො, සතධා භින්නස්ස වාලස්ස කොටියා කොටිපටිපාදනං විය[6] දුරනුබොධො. නනු[7] මයා හි ඉමං ධම්මං පටිවිජ්ඣිතුං වායමන්තෙන අදින්නං දානං නාම නත්ථි, අරක්ඛිතං සීලං නාම...අපූරිතා කාචි පාරමී නාම නත්ථි? තස්ස මෙ නිරුස්සාහං විය මාරබලං විධමන්තස්සාපි පථවී න කම්පිත්ථ; පඨමයාමෙ[8] පුබ්බෙනිවාසං අනුස්සරන්තස්සාපි න කම්පිත්ථ; මජ්ඣිමයාමෙ දිබ්බචක්ඛුං විසොධෙන්තස්සාපි න කම්පිත්ථ; පච්ඡිමයාමෙ පටිච්චසමුප්පාදං පටිවිජ්ඣන්තස්සෙව මෙ දසසහස්සී ලොකධාතු කම්පිත්ථ. ඉති මාදිසෙනාපි තික්ඛඤාණෙන කිච්ඡෙනෙවායං ධම්මො පටිවිද්ධො. තං ලොකියමහාජනා කථං පටිවිජ්ඣිස්සන්තීති ධම්මගම්භීරතා[9]පච්චවෙක්ඛණානුභාවෙනාපි එවං චිත්තං නමීති වෙදිතබ්බං. අපි ච බ්‍රහ්මුනා යාචිතෙ දෙසෙතුකාමතායපිස්ස එවං චිත්තං නමි. ජානාති හි භගවා: මම අප්පොස්සුක්කතාය චිත්තෙ නමමානෙ මහාබ්‍රහ්මා ධම්මදෙසනං යාචිස්සති;[10] ඉමෙ ච සත්තා බ්‍රහ්මගරුකා, තෙ, සත්ථා කිර ධම්මං න දෙසෙතුකාමො අහොසි, අථ නං මහාබ්‍රහ්මා යාචිත්වා[11] දෙසාපෙසි; සන්තො වත භො ධම්මො පණීතොති මඤ්ඤමානා සුස්සූසිස්සන්තීති. ඉදම්පිස්ස කාරණං පටිච්ච අප්පොස්සුක්කතාය චිත්තං නමි; නො ධම්මදෙසනායාති වෙදිතබ්බං.

**සහම්පතිස්සාති** සො කිර කස්සපස්ස භගවතො සාසනෙ සහකො නාම ථෙරො පඨමජ්ඣානං නිබ්බත්තෙත්වා පඨමජ්ඣානභූමියං කප්පායුකමහාබ්‍රහ්මා[12] හුත්වා නිබ්බත්තො. තත්‍ර නං සහම්පති බ්‍රහ්මාති සඤ්ජානන්ති. තං සන්ධායාහ: **බ්‍රහ්මුනො සහම්පතිස්සාති.** නස්සති

1. සච්චමෙව තදෙවං-L. S. 2. වසාතෙලතෙමිතපට-D2 වසාතෙමිත-S.
3. හත්ථා විය-L. E. 4. අයං-L. B S. 5. ඨපිතො විය-L. S.
6. කොටි විය-B. S. 7. වාලස්ස කොටි විය අනු-L.
8. යාමෙ-P1. T1. 9. ගම්භීරතාය-L. B. S. 10. යාචිස්සතීති-B. S
11. යාචිත්වා ධම්මං-I. 12. කප්පායුකබ්‍රහ්මා-B. S.

ඛතාති සො කිර ඉමං සද්දං තථා **නිච්ඡාරෙසි**, යථා දසසහස්සිලොකධාතුබ්‍රහ්මානො සුත්වා සබ්බෙ සන්නිපතිංසු. **යත්‍ර හි නාමාති** යස්මිං නාම ලොකෙ. **පුරතො පාතුරහොසීති** තෙහි දසහි බ්‍රහ්මසහස්සෙහි සද්ධිං පාතුරහොසි. **අප්පරජක්ඛජාතිකාති** පඤ්ඤාමයෙ අක්ඛිම්හි අප්පං පරිත්තං රාගදොසමොහරජං එතෙසං, එවංසභාවාති අප්පරජක්ඛජාතිකා. **අස්සවනතාති** අස්සවනතාය. **භවිස්සන්තීති** පුරිමබුද්ධෙසු දසපුඤ්ඤකිරියවසෙන කතාධිකාරා පරිපාකගතපදුමානි විය සුරියරස්මිසම්ඵස්සං ධම්මදෙසනංයෙව ආකඞ්ඛමානා චතුප්පදිකගාථාවසානෙ අරියභූමිං ඔක්කමනාරහා න එකො, න ද්වෙ, අනෙකසතසහස්සා ධම්මස්ස අඤ්ඤාතාරො භවිස්සන්තීති දස්සෙති.

**පාතුරහොසීති** පාතුභවි. **සමලෙහි චින්තිතොති** සමලෙහි ඡහි සත්ථාරෙහි චින්තිතො. තෙ හි පුරෙතරං උප්පජ්ජිත්වා සකලජම්බුදීපෙ කණ්ටකෙ පත්ථරමානා විය, විසං සිඤ්චමානා විය ච සමලං මිච්ඡාදිට්ඨිධම්මං දෙසයිංසු. **අවාපුරෙතන්ති**[1] විවර එතං; **අමතස්ස ද්වාරන්ති** අමතස්ස නිබ්බානස්ස ද්වාරභූතං අරියමග්ගං. **සුණන්තු ධම්මං විමලෙනානුබුද්ධන්ති** ඉමෙ සත්තා, රාගාදිමලානං අභාවතො විමලෙන සම්මාසම්බුද්ධෙන අනුබුද්ධං චතුසච්චධම්මං සුණන්තු තාව භගවාති යාචති. **සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතොති** සෙලමයෙ එකඝනෙ පබ්බතමුද්ධනි යථා ඨිතොව; නහි තත්ථ ඨිතස්ස දස්සනත්ථං ගීවුක්ඛිපන පසාරණාදිකිච්චං අත්ථි. **තථූපමන්ති** තප්පටිභාගං, සෙලපබ්බතූපමං.

අයං පනෙත්ථ සඞ්ඛෙපත්ථො: යථා සෙලපබ්බතමුද්ධනි ඨිතොව චක්ඛුමා පුරිසො සමන්තතො ජනතං පස්සෙය්‍ය, තථා ත්වම්පි[2] සුමෙධ සුන්දරපඤ්ඤ, සබ්බඤ්ඤුතඤ්ඤාණෙන සමන්තචක්ඛු භගවා ධම්මමයං පඤ්ඤාමයං පාසාදමාරුය්හ සයං අපෙතසොකො සොකාවතිණ්ණං ජාතිජරාභිභූතං[3] ජනතං අවෙක්ඛස්සු, උපධාරය, උපපරික්ඛ.

අයං පනෙත්ථ අධිප්පායො: යථා හි පබ්බතපාදෙ සමන්තා මහන්තං ඛෙත්තං කත්වා තත්ථ කෙදාරපාළීසු කුටිකායො කත්වා රත්තිං අග්ගිං ජාලෙය්‍යුං. චතුරඞ්ගසමන්නාගතඤ්ච අන්ධකාරං අස්ස. අථ තස්ස[4] පබ්බතස්ස මත්ථකෙ ඨත්වා චක්ඛුමතො පුරිසස්ස භූමිං ඔලොකයතො නෙව ඛෙත්තං, න කෙදාරපාළියො, න කුටියො, න තත්ථ සයිතමනුස්සා පඤ්ඤායෙය්‍යුං; කුටිකාසු පන අග්ගිජාලමත්තකමෙව පඤ්ඤායෙය්‍ය. එවං ධම්මපාසාදං ආරුය්හ සත්තකායං[5] ඔලොකයතො තථාගතස්ස, යෙ තෙ අකතකල්‍යාණා සත්තා, තෙ එකවිහාරෙ දක්ඛිණජාණුපස්සෙ නිසින්නාපි බුද්ධචක්ඛුස්ස ආපාථං නාගච්ඡන්ති; රත්තිඛිත්තසරා විය හොන්ති. යෙ පන කතකල්‍යාණා වෙනෙය්‍යපුග්ගලා, තෙ එවස්ස දූරෙපි[6] ඨිතා ආපාථං ආගච්ඡන්ති, සො[7] අග්ගි විය, හිමවන්තපබ්බතො විය ච. වුත්තම්පි චෙතං:-

1. අපාපුරෙතන්ති-S, E,    2. පස්සෙය්‍ය ත්වම්පි-D, L, B, S
3. ජරාභිභූතඤ්ච-P1, S, T1. E.    4. අථස්ස-A. M2, P2.
5. සත්තනිකායං-D2, B, S.    6. තෙ එවං දූරෙ-L.    7. සො-L.

"දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තොව පබ්බතො
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථා සරා"ති.

**උට්ඨෙහීති**[1] භගවතො ධම්මදෙසනත්ථං චාරිකාචරණං[2] යාචන්තො භණති. **වීරාති** ආදීසු භගවා විරියවන්තතාය වීරො; දෙවපුත්තමච්චුකිලෙසමාරානං විජිතත්තා **විජිතසඞ්ගාමො**; ජාතිකන්තාරාදිනිත්ථරණත්ථාය වෙනෙය්‍යසත්ථවාහනසමත්ථතාය **සත්ථවාහො**; කාමච්ඡන්දඉණස්ස අභාවතො **අනණොති** වෙදිතබ්බො.

**අජ්ඣෙසනන්ති** යාචනං. **බුද්ධචක්ඛුනාති** ඉන්ද්‍රියපරොපරියත්ත[3]ඤාණෙන ච ආසයානුසයඤාණෙන ච. ඉමෙසං හි ද්වින්නං ඤාණානං බුද්ධචක්ඛූති නාමං; සබ්බඤ්ඤුතඤාණස්ස සමන්තචක්ඛූති; තිණ්ණං මග්ගඤාණානං ධම්මචක්ඛූති. **අප්පරජක්ඛාති** ආදීසු යෙසං වුත්තනයෙනෙව පඤ්ඤාචක්ඛුම්හි රාගාදිරජං අප්පං තෙ **අප්පරජක්ඛා**. යෙසං තං මහන්තං තෙ **මහාරජක්ඛා**. යෙසං සද්ධාදීනි ඉන්ද්‍රියානි තික්ඛානි තෙ **තික්ඛින්ද්‍රියා**. යෙසං තානි මුදූනි තෙ **මුදින්ද්‍රියා**. යෙසං තෙයෙව සද්ධාදයො ආකාරා සුන්දරා තෙ **ස්වාකාරා**. යෙ කථිතකාරණං සල්ලක්ඛෙන්ති, සුඛෙන සක්කා හොන්ති විඤ්ඤාපෙතුං, තෙ **සුවිඤ්ඤාපයා**. යෙ පරලොකඤ්චෙව වජ්ජඤ්ච භයතො පස්සන්ති, තෙ **පරලොකවජ්ජභයදස්සාවිනො** නාම.

අයං පනෙත්ථ පාළි: "සද්ධො පුග්ගලො අප්පරජක්ඛො, අස්සද්ධො පුග්ගලො මහාරජක්ඛො. ආරද්ධවීරියො...කුසීතො...උපට්ඨිතස්සති... මුට්ඨස්සති... සමාහිතො... අසමාහිතො... පඤ්ඤවා... දුප්පඤ්ඤො පුග්ගලො මහාරජක්ඛො". තථා, "සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො-පෙ-පඤ්ඤවා පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, දුප්පඤ්ඤො පුග්ගලො න පරලොක[4]වජ්ජභයදස්සාවී. ලොකොති ඛන්ධලොකො, ධාතුලොකො, ආයතනලොකො, සම්පත්තිභවලොකො, සම්පත්තිසම්භවලොකො, විපත්තිභවලොකො, විපත්තිසම්භවලොකො. එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා; ද්වෙ ලොකා: නාමඤ්ච රූපඤ්ච; තයො ලොකා: තිස්සො වෙදනා; චත්තාරො ලොකා: චත්තාරො ආහාරා; පඤ්ච ලොකා: පඤ්චුපාදානක්ඛන්ධා; ඡ ලොකා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි; සත්ත ලොකා: සත්ත විඤ්ඤාණට්ඨිතියො; අට්ඨ ලොකා: අට්ඨ ලොකධම්මා; නව ලොකා: නව සත්තාවාසා; දස ලොකා: දසායතනානි; ද්වාදස ලොකා: ද්වාදසායතනානි; අට්ඨාරස ලොකා: අට්ඨාරස ධාතුයො. වජ්ජන්ති සබ්බෙ කිලෙසා වජ්ජා, සබ්බෙ දුච්චරිතා වජ්ජා, සබ්බෙ අභිසඞ්ඛාරා වජ්ජා, සබ්බෙ භවගාමිකම්මා වජ්ජා. ඉති ඉමස්මිඤ්ච ලොකෙ ඉමස්මිඤ්ච වජ්ජෙ තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ. ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි ජානාති, පස්සති, අඤ්ඤාති, පටිවිජ්ඣති. ඉදං තථාගතස්ස ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණ"න්ති.

1. උට්ඨාහීති-I.
2. චාරිකං චරණං-A. D1. D2. M2. P2. S.
3. ඉන්ද්‍රියපරොපරියත්ති-B. S.
4. පුග්ගලො ඉහලොක-A. M2.

**උප්පලිනියන්ති** උප්පලවනෙ; ඉතරෙසුපි එසෙව නයො. **අන්තොනිමුග්ගපොසීනීති** යානි අන්තො නිමුග්ගානෙව පොසියන්ති. **උදකා අච්චුග්ගම්ම තිට්ඨන්තීති** උදකං අතික්කමිත්වා තිට්ඨන්ති. තත්‍ර යානි අච්චුග්ගම්ම ඨිතානි, තානි සූරියරස්මිසම්ඵස්සං ආගමයමානා ඨිතානි අජ්ජ පුප්ඵනකානි. යානි සමොදකං ඨිතානි, තානි සෙව පුප්ඵනකානි. යානි උදකා අනුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, තානි තතියදිවසෙ පුප්ඵනකානි. උදකා පන අනුග්ගතානි අඤ්ඤානිපි සරොගඋප්පලානි[1] නාම අත්ථි, යානි නෙව පුප්ඵිස්සන්ති, මච්ඡකච්ඡපභක්ඛානෙව භවිස්සන්ති, තානි පාළිං නාරුළ්හානි; ආහරිත්වා පන දීපෙතබ්බානීති දීපිතානි.

යථෙව හි තානි චතුබ්බිධානි පුප්ඵානි එවමෙව උග්ඝටිතඤ්ඤූ, විපඤ්චිතඤ්ඤූ, නෙය්‍යො, පදපරමොති චත්තාරො පුග්ගලා. තත්‍ථ යස්ස පුග්ගලස්ස සහඋදාහටවෙලාය ධම්මාභිසමයො හොති, අයං වුච්චති පුග්ගලො උග්ඝටිතඤ්ඤූ. යස්ස පුග්ගලස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථෙ විභජියමානෙ ධම්මාභිසමයො හොති, අයං වුච්චති පුග්ගලො විපඤ්චිතඤ්ඤූ. යස්ස පුග්ගලස්ස උද්දෙසතො පරිපුච්ඡතො[2] යොනිසො මනසිකරොතො කල්‍යාණමිත්තෙ සෙවතො භජතො පයිරුපාසතො ධම්මාභිසමයො හොති, අයං වුච්චති පුග්ගලො නෙය්‍යො. යස්ස පුග්ගලස්ස බහුම්පි සුණතො බහුම්පි භණතො[3] බහුම්පි ධාරයතො බහුම්පි වාචයතො න තාය ජාතියා ධම්මාභිසමයො හොති, අයං වුච්චති පුග්ගලො පදපරමො.

තත්‍ථ භගවා උප්පලවනාදිසදිසං දසසහස්සිලොකධාතුං ඔලොකෙන්තො අජ්ජ පුප්ඵනකානි විය උග්ඝටිතඤ්ඤූ, සෙව පුප්ඵනකානි විය විපඤ්චිතඤ්ඤූ, තතියදිවසෙ පුප්ඵනකානි විය නෙය්‍යෙ[4] මච්ඡකච්ඡපභක්ඛානි පුප්ඵානි විය පදපරමෙ ච[5] අද්දස. පස්සන්තො ච, එත්තකා අප්පරජක්ඛා, එත්තකා මහාරජක්ඛා, තත්‍රාපි එත්තකා උග්ඝටිතඤ්ඤූති එවං සබ්බාකාරතොව අද්දස. තත්‍ථ තිණ්ණං පුග්ගලානං ඉමස්මිංයෙව අත්තභාවෙ භගවතො ධම්මදෙසනා අත්ථං සාධෙති; පදපරමානං අනාගතත්ථාය වාසනා හොති.

අථ භගවා ඉමෙසං චතුන්නං පුග්ගලානං අත්ථාවහං ධම්මදෙසනං විදිත්වා දෙසෙතුකම්‍යතං උප්පාදෙත්වා පුන සබ්බෙපි තීසු භවෙසු සත්තෙ භබ්බාභබ්බවසෙන ද්වෙ කොට්ඨාසෙ අකාසි, යෙ සන්ධාය වුත්තං: “යෙ තෙ සත්තා කම්මාවරණෙන සමන්නාගතා, විපාකාවරණෙන සමන්නාගතා, කිලෙසාවරණෙන සමන්නාගතා, අස්සද්ධා, අච්ඡන්දිකා, දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං, ඉමෙ තෙ සත්තා අභබ්බා. කතමෙ තෙ සත්තා භබ්බා? යෙ තෙ සත්තා න කම්මාවරණෙන—පෙ—ඉමෙ තෙ සත්තා භබ්බා”ති. තත්‍ථ සබ්බෙපි

1. උප්පලාදීනි-L. B. S  2. උද්දෙසතොපි පරිපුච්ඡතොපි-B. S.
3. භණන්තො-D2.  4. නෙය්‍යා-B. S.  5. පදපරමෙති-B. S.

අභබ්බපුග්ගලෙ පහාය භබ්බපුග්ගලෙයෙව ඤාණෙන පරිග්ගහෙත්වා එත්තකා[1] රාගචරිතා, එත්තකා දොස—පෙ—මොහ...විතක්ක...සද්ධා... බුද්ධිචරිතාති ඡ කොට්ඨාසෙ අකාසි; එවං කත්වා ධම්මං දෙසෙස්සාමීති චින්තෙසි.

**පච්චභාසින්ති** පටිඅභාසිං. **අපාරුතාති** විවටා; **අමතස්ස ද්වාරාති** අරියමග්ගො. සො හි අමතසඞ්ඛාතස්ස නිබ්බානස්ස ද්වාරං; සො මයා විවරිත්වා ඨපිතොති දස්සෙති. **පමුඤ්චන්තු සද්ධන්ති** සබ්බෙ අත්තනො සද්ධං පමුඤ්චන්තු, විස්සජ්ජෙන්තු[2]. පච්ඡිමපාදද්වයෙ[3] අයමත්ථො: අහං හි අත්තනො පගුණං සුප්පවත්තිතම්පි[4] ඉමං පණීතං උත්තමධම්මං කායවාචාකිලමථසඤ්ඤී හුත්වා න භාසිං; ඉදානි පන සබ්බො ජනො සද්ධාභාජනං උපනෙතු: පූරෙස්සාමි තෙසං සඞ්කප්පන්ති.

**තස්ස මය්හං භික්ඛවෙ එතදහොසීති** එතං අහොසි: **කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යන්ති** අයං ධම්මදෙසනාපටිසංයුත්තො විතක්කො උදපාදීති අත්ථො. කදා පනෙස උදපාදීති? බුද්ධභූතස්ස අට්ඨමෙ සත්තාහෙ. තත්‍රායං අනුපුබ්බිකථා: බොධිසත්තො කිර මහාභිනික්ඛමනදිවසෙ විවටං ඉත්ථාගාරං දිස්වා සංවිග්ගහදයො, කණ්ඨකං[5] ආහරාති ඡන්නං ආමන්තෙත්වා ඡන්නසහායො අස්සරාජපිට්ඨිගතො නගරතො නික්ඛමිත්වා කණ්ඨකනිවත්තනචෙතියට්ඨානං නාම දස්සෙත්වා තීණි රජ්ජානි අතික්කම්ම අනොමානදීතීරෙ පබ්බජිත්වා අනුපුබ්බෙන[6] චාරිකං චරමානො රාජගහෙ පිණ්ඩාය චරිත්වා පණ්ඩවපබ්බතෙ නිසින්නො, මගධිස්සරෙන[7] නාමගොත්තං පුච්ඡිත්වා, ඉමං රජ්ජං පටිච්ඡාහීති වුත්තො, අලං මහාරාජ, න මය්හං රජ්ජෙනත්ථො, අහං රජ්ජං පහාය ලොකහිතත්ථාය පධානමනුයුඤ්ජිත්වා ලොකෙ විවත්තච්ඡදො[8] බුද්ධො භවිස්සාමීති නික්ඛන්තොති වත්වා, තෙන හි බුද්ධො හුත්වා පඨමං මය්හං විජිතං ඔසරෙය්‍යාසීති පටිඤ්ඤං ගහිතො කාලාමඤ්ච උද්දකඤ්ච උපසඞ්කමිත්වා තෙසං ධම්මදෙසනාය සාරං අවින්දන්තො තතො පක්කමිත්වා උරුවෙලායං ඡබ්බස්සානි දුක්කරකාරිකං කරොන්තොපි අමතං පටිවිජ්ඣිතුං අසක්කොන්තො ඔළාරිකාහාරපටිසෙවනෙන කායං සන්තප්පෙසි.

තදා ච උරුවෙලගාමෙ සුජාතා නාම කුටුම්බියධීතා එකස්මිං නිග්‍රොධරුක්ඛෙ පත්ථනං අකාසි: සචාහං[9] සමජාතිකං කුලඝරං ගන්ත්වා පඨමගබ්භෙ පුත්තං ලභිස්සාමි, බලිකම්මං කරිස්සාමීති. තස්සා සා පත්ථනා සමිජ්ඣි. විසාඛපුණ්ණමදිවසෙ පාතොව බලිකම්මං කරිස්සාමීති රත්තියා පච්චූසසමයෙ එව[10] පායාසං පටියාදෙසි. තස්මිං පායාසෙ පච්චමානෙ මහන්තමහන්තා බුබ්බුළා උට්ඨහිත්වා දක්ඛිණාවත්තා හුත්වා

1. එත්තකා එත්ථ-L. 2. මුඤ්චන්තු විස්සජ්ජෙන්තු-B. S.
3. පදද්වයෙ-A. D1. D2. M2. P2. B.S. 4. සුප්පවත්තිතම්පි-E සුප්පවත්තිංපි-S.
5. කණ්ඨකං-S. කණ්ටකං-B. 6. අනුක්කමෙන-P1. T1.
7. බිම්බිසාරෙන-S. 8. විවටච්ඡදො-B. විවටුච්ඡදො-S. විවත්තච්ඡදො-E.
9. සචෙ-L. 10. එවරූපං-B. එවං-S.

සඤ්චරන්ති; එකඵුසිතම්පි බහි න ගච්ඡති; මහාබ්‍රහ්මා ඡත්තං ධාරෙසි චත්තාරො ලොකපාලා ඛග්ගහත්ථා ආරක්ඛං ගණ්හිංසු; සක්කො අලාතානි සමානෙන්තො අග්ගිං ජාලෙසි; දෙවතා චතූසු දීපෙසු ඔජා සංහරිත්වා තත්ථ පක්ඛිපිංසු.

බොධිසත්තො භික්ඛාචාරකාලං ආගමයමානො පාතොව ගන්ත්වා රුක්ඛමූලෙ නිසීදි. රුක්ඛමූල[1] සොධනත්ථාය ගතා ධාතී ආගන්ත්වා සුජාතාය ආරොචෙසි: දෙවතා රුක්ඛමූලෙ නිසින්නාති. සුජාතා සබ්බං පසාධනං පසාධෙත්වා සතසහස්සග්ඝනකෙ සුවණ්ණථාලෙ පායාසං වඩ්ඪෙත්වා අපරාය සුවණ්ණපාතියා[2] පිදහිත්වා උක්ඛිපිත්වා ගතා මහාපුරිසං දිස්වා සහෙව පාතියා හත්ථෙ ඨපෙත්වා වන්දිත්වා, යථා මය්හං මනොරථො නිප්ඵන්නො, එවං තුම්හාකම්පි නිප්ඵජ්ජතූති වත්වා පක්කාමි.

බොධිසත්තො නෙරඤ්ජරාය තීරං ගන්ත්වා සුවණ්ණථාලං තීරෙ ඨපෙත්වා නහාත්වා පච්චුත්තරිත්වා එකූනපණ්ණාස පිණ්ඩෙ කරොන්තො පායාසං පරිභුඤ්ජිත්වා සචාහං අජ්ජ බුද්ධො භවාමි ථාලං පටිසොතං ගච්ඡතූති ඛිපි. ථාලං පටිසොතං ගන්ත්වා ථොකං ඨත්වා කාළනාගරාජස්ස භවනං පවිසිත්වා තිණ්ණං බුද්ධානං ථාලානි උක්ඛිපිත්වා අට්ඨාසි.

මහාසත්තො වනසණ්ඩෙ දිවාවිහාරං කත්වා සායන්හසමයෙ සොත්ථිකෙන[3] දින්නා අට්ඨ තිණමුට්ඨියො ගහෙත්වා බොධිමණ්ඩං ආරුය්හ දක්ඛිණදිසාභාගෙ අට්ඨාසි. සො පදෙසො පදුමිනිපත්තෙ උදකබින්දු විය කම්පිත්ථ.[4] මහාසත්තො, අයං මම ගුණං ධාරෙතුං න සක්කොතීති පච්ඡිමදිසාභාගං අගමාසි. සොපි තථෙව කම්පිත්ථ.[1] උත්තරදිසාභාගං අගමාසි. සොපි තථෙව කම්පිත්ථ[4]. පුරත්ථිමදිසාභාගං අගමාසි. තත්ථ පල්ලඞ්කප්පමාණට්ඨානං සුනිඛාතඉන්දඛීලො විය නිච්චලමහොසි. මහාසත්තො, ඉදං ඨානං[5] සබ්බබුද්ධානං කිලෙසපඤ්ජර[6]විද්ධංසනට්ඨානන්ති තානි තිණානි අග්ගෙ ගහෙත්වා චාලෙසි. තානි චිත්තකාරෙන තුලිකාග්ගෙන පරිච්ඡින්නානි විය අහෙසුං. බොධිසත්තො, බොධිං අප්පත්වා ඉමං පල්ලඞ්කං න භින්දිස්සාමීති චතුරඞ්ගවිරියං අධිට්ඨහිත්වා පල්ලඞ්කං ආභුජිත්වා නිසීදි.

තං ඛණංයෙව මාරො බාහුසහස්සං මාපෙත්වා දියඩ්ඪයොජනසතිකං ගිරිමෙඛලං නාම හත්ථිං ආරුය්හ නවයොජනං මාරබලං ගහෙත්වා අඩ්ඪක්ඛිකෙන ඔලොකයමානො පබ්බතො විය අජ්ඣොත්ථරන්තො උපසඞ්කමි. මහාසත්තො, මය්හං දස පාරමියො පූරෙන්තස්ස අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා සක්ඛී නත්ථි; වෙස්සන්තරත්තභාවෙ පන මය්හං සත්තසු ඨානෙසු මහාපථවී සක්ඛී අහොසි; ඉදානිපි මෙ අයමෙව අචෙතනා කට්ඨ

1. රුක්ඛමූලං-S. මූලෙ-B. 2. අඤ්ඤාය සුවණ්ණචාටියා-S. 3. සොත්ථියෙන-S. 4. අකම්පිත්ථ-S. 5. ඉදං-S. 6. පුබ්බබුද්ධානං කිලෙසමාර-A, M2, P2.

කලිඞ්ගරූපමං මහා පඨවිං සක්ඛිං හත්ථං පසාරෙසි. මහාපඨවී තාවදෙව අයදණ්ඩෙන පහත[1]කංසථාලං විය රව[2]සතං රව[2]සහස්සං මුඤ්චමානා විරවිත්වා පරිවත්තමානා මාරබලං චක්කවාළමුඛවට්ටියං පුඤ්ජමකාසි.

මහාසත්තො සූරියෙ ධරමානෙයෙව මාරබලං විධමිත්වා පඨම යාමෙ පුබ්බෙනිවාසඤාණං මජ්ඣිමයාමෙ දිබ්බචක්ඛුං විසොධෙත්වා පච්ඡිමයාමෙ පටිච්චසමුප්පාදෙ ඤාණං ඔතාරෙත්වා වට්ටවිවට්ටං[3] සම්මසන්තො අරුණොදයෙ බුද්ධො හුත්වා, මයා අනෙකකප්පකොටිසතසහස්සං අද්ධානං ඉමස්ස පල්ලඞ්කස්ස අත්ථාය වායාමො කතොති සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි.

අථ එකච්චානං දෙවතානං, කිත්තු ඛො අඤ්ඤෙපි බුද්ධත්තකරා ධම්මා අත්ථීති කඞ්ඛා උදපාදි. අථ භගවා අට්ඨමෙ දිවසෙ සමාපත්තිතො වුට්ඨාය, දෙවතානං කඞ්ඛං ඤත්වා කඞ්ඛාවිධමනත්ථං ආකාසෙ උප්පතිත්වා යමකපාටිහාරියං දස්සෙත්වා තාසං කඞ්ඛං විධමිත්වා පල්ලඞ්කතො ඊසකං පාචීනනිස්සිතෙ උත්තරදිසාභාගෙ ඨත්වා චත්තාරි අසඞ්ඛෙය්‍යානි කප්පසතසහස්සඤ්ච පූරිතානං පාරමීනං ඵලාධිගමට්ඨානං පල්ලඞ්කඤ්චෙව බොධිරුක්ඛඤ්ච අනිමිසෙහි අක්ඛීහි ඔලොකයමානො සත්තාහං වීතිනාමෙසි. තං ඨානං අනිමිසචෙතියං නාම ජාතං.

අථ පල්ලඞ්කස්ස ච ඨිතට්ඨානස්ස ච අන්තරා පුරත්ථිමපච්ඡිමතො ආයතෙ[4] රතනචඞ්කමෙ චඞ්කමන්තො සත්තාහං වීතිනාමෙසි. තං ඨානං රතනචඞ්කමචෙතියං නාම ජාතං. තතො පච්ඡිමදිසාභාගෙ දෙවතා රතනඝරං මාපයිංසු. තත්ථ පල්ලඞ්කෙන නිසීදිත්වා අභිධම්මපිටකං විසෙසතො චෙත්ථ අනන්තනයං සමන්තපට්ඨානං විචිනන්තො සත්තාහං වීතිනාමෙසි. තං ඨානං රතනඝරචෙතියං නාම ජාතං.

එවං බොධිසමීපෙයෙව චත්තාරි සත්තාහානි වීතිනාමෙත්වා පඤ්චමෙ සත්තාහෙ බොධිරුක්ඛමූලා යෙන අජපාලනිග්‍රොධො තෙනුපසඞ්කමි. තත්‍රාපි ධම්මං විචිනන්තොයෙව විමුත්තිසුඛඤ්ච පටිසංවෙදෙන්තො නිසීදි. ධම්මං විචිනන්තො චෙත්ථ එවං අභිධම්මෙ නයමග්ගං සම්මසි: පඨමං ධම්මසඞ්ගණිප්පකරණං නාම; තතො විභඞ්ගප්පකරණං, ධාතුකථාපකරණං, පුග්ගලපඤ්ඤත්තිපකරණං, කථාවත්ථුප්පකරණං නාම, යමකං නාම, තතො මහාපකරණං පට්ඨානං නාමාති.

තත්ථස්ස සණ්හසුඛුමපට්ඨානම්හි[5] චිත්තෙන ඔතිණ්ණෙ පීති උප්පජ්ජි; පීතියා උප්පන්නාය ලොහිතං පසීදි; ලොහිතෙ පසන්නෙ ඡවි පසීදි; ඡවියා පසන්නාය පුරත්ථිමකායතො කූටාගාරාදිප්පමාණා රස්මියො උට්ඨහිත්වා ආකාසෙ පක්ඛන්ත-ඡද්දන්තනාගකුලං විය පාචීනදිසාය අනන්තානි චක්කවාළානි පක්ඛන්තා[6]. පච්ඡිමකායතො උට්ඨහිත්වා පච්ඡිමදිසාය, දක්ඛිණංසකූටතො උට්ඨහිත්වා දක්ඛිණදිසාය, වාමංසකූටතො උට්ඨහිත්වා උත්තරදිසාය අනන්තානි චක්කවාළානි පක්ඛන්තා.[6]

1. හත-L, පහට-E. 2. රව-S, E. 3. වට්ටවිවට්ටධම්මෙ-A, M2, P2.
4. අන්තරෙ-A, M2, P2. 5. සුඛුමපට්ඨානං සි-L. 6. පක්ඛන්තා-L.

පාදතලෙහි පවාළඞ්කුරවණ්ණා රස්මියො නික්ඛමිත්වා මහාපඨවිං විනිබ්භිජ්ජ[1] උදකං ද්විධා භින්දිත්වා වාතක්ඛන්ධං පදාලෙත්වා අජටාකාසං පක්ඛන්තා. සීසතො සම්පරිවත්තියමානං මණිදාමං[2] විය නීලවණ්ණා රස්මිවට්ටි උට්ඨහිත්වා ඡ දෙවලොකෙ විනිවිජ්ඣිත්වා නව බ්‍රහ්මලොකෙ අතික්කම්ම අජටාකාසං පක්ඛන්තා. තස්මිං දිවසෙ අපරිමාණෙසු චක්කවාළෙසු අපරිමාණා සත්තා සබ්බෙ සුවණ්ණවණ්ණාව අහෙසුං. තං දිවසඤ්ච පන භගවතො සරීරා නික්ඛන්තා යාවජ්ජදිවසාපි[3] තා රස්මියො අනන්තලොකධාතුයො[4] ගච්ඡන්තියෙව.

එවං භගවා[5] අජපාලනිග්‍රොධෙ සත්තාහං වීතිනාමෙත්වා තතො අපරං[6] සත්තාහං මුචලින්දෙ නිසීදි. නිසින්නමත්තස්සෙව වස්ස සකලං චක්කවාළගබ්භං පූරෙන්තො මහා අකාලමෙඝො උදපාදි. එවරූපො කිර මහාමෙඝො ද්වීසුයෙව කාලෙසු වස්සති: චක්කවත්තිම්හි වා උප්පන්නෙ, බුද්ධෙ වා. ඉධ බුද්ධකාලෙ[7] උදපාදි.

තස්මිඤ්ච[8] පන උප්පන්නෙ මුචලින්දො නාම නාගරාජා චින්තෙසි අයං මෙඝො සත්ථරි මය්හං භවනං පවිට්ඨමත්තෙ[9] උප්පන්නො, වාසාගාරමස්ස ලද්ධුං වට්ටතීති. සො සත්තරතනමයං පාසාදං නිම්මිනිතුං[10] සක්කොන්තොපි, එවං කතෙ මය්හං මහප්ඵලං න භවිස්සති, දසබලස්ස කායවෙය්‍යාවච්චං කරිස්සාමීති මහන්තං අත්තභාවං කත්වා සත්ථාරං සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා උපරි ඵණං ධාරෙසි. පරික්ඛෙපස්ස අන්තො ඔකාසො හෙට්ඨාලොහපාසාදප්පමාණො අහොසි. ඉච්ඡිතිච්ඡිතෙන ඉරියාපථෙන සත්ථා විහරිස්සතීති හි[11] නාගරාජස්ස[12] අජ්ඣාසයො අහොසි. තස්මා එවං මහන්තං ඔකාසං පරික්ඛිපි. මජ්ඣෙ රතනපල්ලඞ්කො පඤ්ඤත්තො හොති. උපරි සුවණ්ණතාරකවිචිත්තං සමොසරිතකුසුමගන්ධදාමං චෙලවිතානං අහොසි. චතුසු කොණෙසු ගන්ධතෙලෙන දීපා ජාලිතා. චතුසු දිසාසු විවරිත්වා චන්දනකරණ්ඩකා ඨපිතා.

එවං භගවා තං සත්තාහං තත්ථ වීතිනාමෙත්වා, තතො අපරං සත්තාහං රාජායතනෙ නිසීදි. රාජායතනතො අට්ඨමෙ සත්තාහෙ සක්කෙන දෙවානමින්දෙන ආභතං දන්තකට්ඨඤ්ච ඔසධ[13]හරීතකඤ්ච ඛාදිත්වා මුඛං ධොවිත්වා චතුහි ලොකපාලෙහි උපනීතෙ පච්චග්ඝෙ සෙලමයෙ පත්තෙ තපුස්ස[14]භල්ලිකානං පිණ්ඩපාතං පරිභුඤ්ජිත්වා පුන පච්චාගන්ත්වා අජපාලනිග්‍රොධෙ නිසින්නස්ස සබ්බබුද්ධානං ආචිණ්ණො අයං වීතක්කො උදපාදි.

---

1 විනිවිජ්ඣිත්වා-B. S, 2. මණිජාලං-P1, T1. 3. යාවජ්ජදිවසාපි කිර-I.,
4. අනන්තාය ලොකධාතුයා-A. M2, P2. 5. එවං-I
6. අජපාලනිග්‍රොධෙ සත්තාහං-L,
7. ඉදං බුද්ධකාලෙ-A, M2. P2, ඉධ පුබ්බකාලෙ-P1, T1. 8. තස්මිං-B. S.
9. මත්තෙව-B, S, 10. නිම්මිතුං-P1, T1. S, 11. විහරිස්සතීති-M2, P2. B.S.
12. නාගස්ස-L, 13. ඔසධං-B, ඔසථං-S, 14. තපුස්ස-B, S, E.

තත්ථ **පණ්ඩිතොති** පණ්ඩිච්චෙන සමන්නාගතො; **බ්‍යත්තොති** වෙය්‍යත්තියෙන සමන්නාගතො; **මෙධාවීති** ඨානුප්පත්තියා[1] පඤ්ඤාය සමන්නාගතො. **අප්පරජක්ඛජාතිකොති** සමාපත්තියා වික්ඛම්භිතත්තා නික්කිලෙසජාතිකො විසුද්ධසත්තො.[2] **ආජානිස්සතීති** සල්ලක්ඛෙස්සති, පටිවිජ්ඣිස්සති.[3] **ඤාණඤ්ච පන මෙති** මය්හම්පි සබ්බඤ්ඤුතඤ්ඤාණං උප්පජ්ජි. භගවා කිර දෙවතාය කථිතෙනෙව නිට්ඨං අගන්ත්වා සයම්පි සබ්බඤ්ඤුතඤ්ඤාණෙන ඔලොකෙන්තො, ඉතො සත්තදිවසමත්ථකෙ කාලං කත්වා ආකිඤ්චඤ්ඤායතනෙ නිබ්බත්තොති අද්දස. තං සන්ධායාහ: **ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදීති. මහාජානියොති** සත්තදිවසබ්භන්තරෙ පත්තබ්බමග්ගඵලතො පරිහීනත්තා මහතී ජානි අස්සාති මහාජානියො. අක්ඛණෙ නිබ්බත්තො. ගන්ත්වා දෙසියමානම්පිස්ස සොතුං සොතප්පසාදො නත්ථි; ඉධ[4] ධම්මදෙසනට්ඨානං ආගමනපාදොපි[5] නත්ථි. එවං මහාජානියො ජාතොති දස්සෙති. **අභිදොසකාලඞ්කතොති** අඩ්ඪරත්තෙ කාලඞ්කතො. **ඤාණඤ්ච පන මෙති** මය්හම්පි[6] සබ්බඤ්ඤුතඤ්ඤාණං උදපාදි. ඉධාපි කිර භගවා දෙවතාය වචනෙන සන්නිට්ඨානං අකත්වා සබ්බඤ්ඤුතඤ්ඤාණෙන ඔලොකෙන්තො හිය්‍යො අඩ්ඪරත්තෙ කාලං කත්වා උදකො රාමපුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නිබ්බත්තොති අද්දස; තස්මා එවමාහ. සෙසං පුරිමනයසදිසමෙව.

**බහුකාරාති** බහූපකාරා. **පධානපහිතත්තං උපට්ඨහිංසූති** පධානත්ථාය පෙසිතත්තභාවං වසනට්ඨානෙ පරිවෙණසම්මජ්ජනෙන පත්තචීවරං ගහෙත්වා අනුබන්ධනෙන මුඛොදක-දන්තකට්ඨදානාදිනා ච උපට්ඨහිංසු. කෙ පනෙතෙ[7] පඤ්චවග්ගියා නාම? යෙ තෙ,

"රාමො ධජො ලක්ඛණො චාපි මන්තී[8]
යඤ්ඤො ච භොජො[9] සුයාමො සුදත්තො
එතෙ තදා අට්ඨ අහෙසුං බ්‍රාහ්මණා
ඡළඞ්ගවා මන්තං වියාකරිංසූ"ති.

බොධිසත්තස්ස ජාතකාලෙ සුපිනපටිග්ගාහකා චෙව ලක්ඛණපටිග්ගාහකා ච අට්ඨ බ්‍රාහ්මණා, තෙසු තයො ද්වෙධා බ්‍යාකරිංසු: ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො අගාරං අජ්ඣාවසමානො රාජා හොති චක්කවත්තී, පබ්බජමානො[10] බුද්ධොති. පඤ්ච බ්‍රාහ්මණා එකබ්‍යාකරණා[11] අහෙසුං: ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො අගාරෙ න තිට්ඨති, බුද්ධො ච[12] හොතීති. තෙසු පුරිමා තයො යථාමන්තපදං ගතා. ඉමෙ පන පඤ්ච මන්තපදං අතික්කන්තා. තෙ අත්තනා ලද්ධං

1. ඨානුප්පත්තිකාය-B, S. 2. විසුද්ධසත්තාතො-P2, T1.
3. පටිවෙච්ඡිස්සති-A, M2, P2 4. ඉදං-S. 5. පදමෙපි-L, S.
6. මය්හං-L, E. 7. පන තෙ-B, S. 8. ජොතිමන්තී-B, S.
9. යඤ්ඤො සුභොජො-B, S. 10. පබ්බජමානො-L.
11. එකංසබ්‍යාකරණා-B, S. 12. බුද්ධො-L.

පුණ්ණපත්තං ඤාතකානං විස්සජ්ජෙත්වා, අයං මහාපුරිසො අගාරං නාජ්ඣාවසිස්සති, එකන්තෙන බුද්ධො භවිස්සතීති නික්ඛිත්තකා බොධිසත්තං උද්දිස්ස සමණපබ්බජ්ජං පබ්බජිතා. තෙසං පුත්තාතිපි වදන්ති. තං අට්ඨකථාය පටික්ඛිත්තං.

එතෙ කිර දහරකාලෙයෙව බහූ මන්තෙ ජානිංසු. තස්මා තෙ බ්‍රාහ්මණා ආචරියට්ඨානෙ ඨපයිංසු. තෙ, පච්ඡා අම්හෙහි පුත්තදාරජටං ඡින්දිත්වා[1] න සක්කා භවිස්සති පබ්බජිතුන්ති[2] දහරකාලෙයෙව පබ්බජිත්වා රමණීයානි සෙනාසනානි පරිභුඤ්ජන්තා විචරිංසු. කාලෙන කාලං පන, කිං භො මහාපුරිසො මහාභිනික්ඛමනං නික්ඛන්තොති පුච්ඡන්ති. මනුස්සා, කුහිං තුම්හෙ මහාපුරිසං පස්සිස්සථ, තීසු පාසාදෙසු තිවිධනාටකමජ්ඣෙ දෙවො විය සම්පත්තිං අනුභොතීති වදන්ති. තෙ සුත්වා, න තාව මහාපුරිසස්ස ඤාණං පරිපාකං ගච්ඡතීති අප්පොස්සුක්කා විහරිංසුයෙව.

කස්මා පනෙත්ථ භගවා, **බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියාති** ආහ? කිං උපකාරකානංයෙව එස ධම්මං දෙසෙති, අනුපකාරකානං න දෙසෙතීති? නො න දෙසෙති. පරිචයවසෙන හෙස ආළාරඤ්චෙව කාලාමං, උදකඤ්ච රාමපුත්තං ඔලොකෙසි. එතස්මිං[3] පන බුද්ධක්ඛෙත්තෙ ඨපෙත්වා අඤ්ඤාකොණ්ඩඤ්ඤං[4] ධම්මං පඨමං සච්ඡිකාතුං සමත්ථො නාම නත්ථි. කස්මා? තථාවිධ-උපනිස්සයත්තා.

පුබ්බෙ කිර පුඤ්ඤකරණකාලෙ ද්වෙ භාතරො අහෙසුං; තෙ එකතො සස්සං අකංසු. තත්ථ[5] ජෙට්ඨස්ස එකස්මිං සස්සෙ නවවාරෙ අග්ගසස්සදානං මයා දාතබ්බන්ති අහොසි. සො වප්පකාලෙ බීජග්ගං නාම දත්වා ගබ්භකාලෙ කනිට්ඨෙන සද්ධිං මන්තෙසි. කනිට්ඨො ගබ්භකාලෙ ගබ්භං ඵාලෙත්වා දස්සාමීති තරුණසස්සං නාසෙතුකාමොසීති ආහ. ජෙට්ඨො කනිට්ඨස්ස අනනුවත්තනභාවං ඤත්වා ඛෙත්තං විභජිත්වා අත්තනො කොට්ඨාසතො ගබ්භං ඵාලෙත්වා ඛීරං නීහරිත්වා සප්පිඵාණිතෙන[6] යොජෙත්වා අදාසි. පුථුකකාලෙ පුථුකං[7] කාරෙත්වා අදාසි. ලායනෙ ලායනග්ගං[8], වෙණිකරණෙ වෙණග්ගං, කලාපාදිසු කලාපග්ගං, ඛලග්ගං, ඛලභණ්ඩග්ගං,[9] කොට්ඨග්ගන්ති එවං එකසස්සෙ නවවාරෙ අග්ගදානං අදාසි. කනිට්ඨො පන[10] උද්ධරිත්වා අදාසි. තෙසු ජෙට්ඨකො අඤ්ඤාකොණ්ඩඤ්ඤත්ථෙරො ජාතො; කනිට්ඨො සුභද්දපරිබ්බාජකො. ඉති එකස්මිං සස්සෙ නවන්නං අග්ගදානානං දින්නත්තා, ඨපෙත්වා ථෙරං අඤ්ඤො පඨමං ධම්මං සච්ඡිකාතුං සමත්ථො නාම නත්ථි. **බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියාති** ඉදං පන උපකාරානුස්සරණමත්තකෙනෙව වුත්තං.

1. පුත්තදාරජටං ඡින්දිත්වා-S. ජටං ඡින්දිත්වා-B. 2. න සක්කා පබ්බජිතුන්ති-S.
3. එකස්මිං-L. 4. අඤ්ඤාතකොණ්ඩඤ්ඤං-B.
5. භාතරො අහෙසුං; තත්ථ-B, S. 6. සප්පිඵාණිතෙහි-B, S.
7. පුථුකග්ගං-S. පුථුකං-B. 8 ලායනකාලෙ ලායනග්ගං-S; ලායනෙ ලායනග්ගං-B.
9. ඛණ්ඩග්ගං-B. මද්දග්ගං-S. 10. පනස්ස-B, S.

**ඉසිපතනෙ මිගදායෙති** තස්මිං කිර පදෙසෙ අනුප්පන්නෙ බුද්ධුප්පාදෙ[1] පච්චෙකසම්බුද්ධා ගන්ධමාදනපබ්බතෙ සත්තාහං නිරොධසමාපත්තියා වීතිනාමෙත්වා නිරොධා වුට්ඨාය නාගලතාදන්තකට්ඨං ඛාදිත්වා අනොතත්තදහෙ මුඛං ධොවිත්වා පත්තචීවරං ආදාය ආකාසෙනාගන්ත්වා නිපතන්ති. තත්ථ චීවරං පාරුපිත්වා නගරෙ පිණ්ඩාය චරිත්වා කතභත්තකිච්චා ගමනකාලෙපි තතොයෙව උප්පතිත්වා ගච්ඡන්ති. ඉති ඉසයො එත්ථ නිපතන්ති, උප්පතන්ති චාති තං ඨානං ඉසිපතනන්ති සඞ්ඛං ගතං. මිගානං පන අභයත්ථාය දින්නත්තා මිගදායොති වුච්චති. තෙන වුත්තං: **ඉසිපතනෙ මිගදායෙති. අන්තරා ච ගයං අන්තරා ච බොධින්ති** ගයාය ච බොධිස්ස ච විවරෙ තිගාවුතන්තරෙ ඨානෙ. බොධිමණ්ඩතො හි ගයා තීණි ගාවුතානි; බාරාණසී අට්ඨාරස යොජනානි. උපකො බොධිමණ්ඩස්ස ච ගයාය ච අන්තරෙ භගවන්තං අද්දස. අන්තරාසද්දෙන පන යුත්තත්තා උපයොගවචනං කතං. ඊදිසෙසු හි[2] ඨානෙසු අක්ඛරචින්තකා, "අන්තරා ගාමඤ්ච නදිඤ්ච යාතී"ති එවං එකමෙව අන්තරාසද්දං පයුඤ්ජන්ති. සො දුතියපදෙනපි යොජෙතබ්බො හොති. අයොජියමානෙ උපයොගවචනං න පාපුණාති. ඉධ පන යොජෙත්වා එව වුත්තොති. **අද්ධානමග්ගපටිපන්නන්ති** අද්ධානසඞ්ඛාතං මග්ගං පටිපන්නං. දීඝමග්ගන්ති අත්ථො. අද්ධානගමනසමයස්ස හි විභඞ්ගෙ, "අඩ්ඪයොජනං ගච්ඡිස්සාමීති භුඤ්ජිතබ්බ"න්ති ආදිවචනතො අඩ්ඪයොජනම්පි අද්ධානමග්ගො හොති. බොධිමණ්ඩතො පන ගයා තිගාවුතං.

**සබ්බාභිභූති** සබ්බං තෙභූමකධම්මං අභිභවිත්වා ඨිතො; **සබ්බවිදූති** සබ්බං චතුභූමකධම්මං අවෙදිං, අඤ්ඤාසිං;[3] **සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තොති** සබ්බෙසු තෙභූමකධම්මෙසු කිලෙසලෙපනෙන අලිත්තො;[4] **සබ්බඤ්ජහොති** සබ්බං තෙභූමකධම්මං ජහිත්වා ඨිතො; **තණ්හක්ඛයෙ විමුත්තොති** තණ්හක්ඛයෙ නිබ්බානෙ ආරම්මණතො විමුත්තො; **සයං අභිඤ්ඤායාති** සබ්බං චතුභූමකධම්මං අත්තනාව ජානිත්වා; **කමුද්දිසෙය්‍යන්ති** කං අඤ්ඤං, අයං මෙ ආචරියොති උද්දිසෙය්‍යං. **න මෙ ආචරියො අත්ථීති** ලොකුත්තරධම්මෙ මය්හං ආචරියො නාම නත්ථි. **නත්ථි මෙ පටිපුග්ගලොති** මය්හං පාටිභාගපුග්ගලො නාම නත්ථි. **සම්මාසම්බුද්ධොති** සම්මා හෙතුනා[5] නයෙන[6] චත්තාරි සච්චානි සයං බුද්ධො. **සීතිභූතොති** සබ්බකිලෙසග්ගිනිබ්බාපනෙන සීතිභූතො; කිලෙසානංයෙව නිබ්බුතත්තා **නිබ්බුතො. කාසිනං පුරන්ති** කාසිරට්ඨෙ නගරං. **ආහඤ්ඡං[7] අමතදුන්දුභින්ති** ධම්මචක්කපටිලාභාය අමතභෙරිං පහරිස්සාමීති ගච්ඡාමි.

---

1. බුද්ධෙ-B, 2. ඊදිසෙසු-A. M2, P2, ඊදිසෙසු පන-S. 3. අවෙදි, අඤ්ඤාසි-B, S.
4. කිලෙසෙන අනුපලිත්තො-B, කිලෙසලෙපනෙන අනුපලිත්තො-S.
5. සම්මාසම්බුද්ධොති හෙතුනා-L, 6. නයෙනෙව-S, 7. අහඤ්ඤිං-B, S.

අරහසි අනන්තජිනොති අනන්තජිනො ති[1] භවිතුං යුත්තො. හුවෙය්‍යපාවුසොති ආවුසො එවම්පි නාම භවෙය්‍ය. පක්කාමීති වඞ්ගහාර[2]ජනපදං නාම අගමාසි.

තත්ථෙකං මිගලුද්දකගාමකං නිස්සාය වාසං කප්පෙසි. ජෙට්ඨකලුද්දකො තං උපට්ඨාසි. තස්මිං ජනපදෙ චණ්ඩා මක්ඛිකා හොන්ති. අථ නං එකාය චාටියා වසාපෙසුං[3]. මිගලුද්දකො දූරෙ මිගවං ගච්ඡන්තො, අම්හාකං අරහන්තෙ මා පමජ්ජීති ජවං[4] නාම ධීතරං ආණාපෙත්වා අගමාසි, සද්ධිං පුත්තභාතුකෙහි. සා චස්ස ධීතා දස්සනීයා හොති, කොට්ඨාසසම්පන්නා. දුතියදිවසෙ උපකො ඝරං ආගතො තං දාරිකං සබ්බං උපචාරං කත්වා පරිවිසිතුං උපගතං දිස්වා රාගෙන අභිභූතො භුඤ්ජිතුම්පි අසක්කොන්තො භාජනෙන භත්තං ආදාය වසනට්ඨානං ගන්ත්වා භත්තං එකමන්තෙ නික්ඛිපිත්වා, ජවං[5] ලභාමි ජීවාමි, නො චෙ මරාමීති නිරාහාරො සයි. සත්තමෙ දිවසෙ මාගවිකො ආගන්ත්වා ධීතරං උපකස්ස පවත්තිං පුච්ඡි. සා, එකදිවසමෙව ආගන්ත්වා පුන නාගතපුබ්බොති ආහ.

මාගවිකො ආගතවෙසෙනෙව, තං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාමීති තං ඛණංයෙව ගන්ත්වා, කිං භන්තෙ අඵාසුකන්ති පාදෙ පරාමසන්තො පුච්ඡි. උපකො නිත්ථුනන්තො[6] පරිවත්තතියෙව. සො, වද භන්තෙ, යං මයා සක්කා කාතුං, සබ්බං කරිස්සාමීති ආහ. උපකො, සචෙ ජවං[4] ලභාමි ජීවාමි, නො චෙ ඉධෙව මරණං සෙය්‍යොති ආහ. 'ජානාසි පන භන්තෙ කිඤ්චි සිප්ප'න්ති? 'න ජානාමී'ති. 'න භන්තෙ කිඤ්චි සිප්පං අජානන්තෙන සක්කා ඝරාවාසං අධිට්ඨාතු'න්ති. සො ආහ : නාහං කිඤ්චි සිප්පං ජානාමි, අපි ච තුම්හාකං මංසහාරකො භවිස්සාමි, මංසඤ්ච වික්කිණිස්සාමීති. මාගවිකො, අම්හාකම්පි එතදෙව රුච්චතීති උත්තරිසාටකං දත්වා ඝරං ආනෙත්වා ධීතරං අදාසි.

තෙසං සංවාසමන්වාය පුත්තො විජායි. සුභද්දොතිස්ස නාමං අකංසු. ජවා[7] තස්ස රොදනකාලෙ මංසහාරකස්ස පුත්ත, මිගලුද්දකස්ස පුත්ත, මා රොදි,[8] මා රොදීති ආදීනි වදමානා පුත්තතොසනගීතෙන උපකං උප්පණ්ඩෙසි. භද්දෙ ත්වං මං අනාථොති මඤ්ඤසි, අත්ථි මෙ අනන්තජිනො නාම සහායො, තස්සාහං සන්තිකං ගමිස්සාමීති ආහ. ජවා[7] එවමයං අට්ටීයතීති ඤත්වා පුනප්පුනං කථෙති. සො එකදිවසං අනාරොචෙත්වාව මජ්ඣිමදෙසාභිමුඛො පක්කාමි.

භගවා ච තෙන සමයෙන සාවත්ථියං විහරති. ජෙතවනමහාවිහාරෙ. අථ ඛො භගවා පටිගච්චෙව භික්ඛූ ආණාපෙසි : යො භික්ඛවෙ අනන්තජිනොති පුච්ඡමානො ආගච්ඡති, තස්ස මං දස්සෙය්‍යාථාති.

---

1. අනන්තජිනොපි-E. 2. වඞ්කහාර-S. B. 3. පාතියා වසාපෙසුං-S.
4. ජාවා-P1. T1. නාවා-S. ජවං-E. 5. සචෙ නාවං-S. සචෙ ජවං-E.
6. නිත්ථුනන්තො-S. E. 7. නාවා-S. ජවා-E. 8. පුත්ත,-B. S.

උපකො පි ඛො, කුහිං අනන්තජිනො වසතීති පුච්ඡන්තො අනුපුබ්බෙන සාවත්ථිං ආගන්ත්වා විහාරමජ්ඣෙ ඨත්වා, කුහිං අනන්තජිනොති පුච්ඡි. තං භික්ඛූ භගවතො සන්තිකං නයිංසු. සො ච[1] භගවන්තං දිස්වා, සඤ්ජානාථ[2] මං භගවාති ආහ. 'ආම උපක, සඤ්ජානාමි, කුහිං පන ත්වං වසිත්ථා'ති. 'වඞ්කහාරජනපදෙ භන්තෙ'ති. 'උපක මහල්ලකොසි ජාතො, පබ්බජිතුං සක්ඛිස්සසී'ති? 'පබ්බජිස්සාමි භන්තෙ'ති. භගවා පබ්බාජෙත්වා තස්ස කම්මට්ඨානං අදාසි. සො කම්මට්ඨානෙ කම්මං කරොන්තො අනාගාමිඵලෙ පතිට්ඨාය කාලං කත්වා අවිහෙසු නිබ්බත්තො; නිබ්බත්තක්ඛණෙයෙව ච අරහත්තං පාපුණි.

අවිහෙසු නිබ්බත්තමත්තා හි සත්ත ජනා අරහත්තං පාපුණිංසු. තෙසං සො අඤ්ඤතරො. වුත්තං හෙතං :-

"අවිහං උපපන්නාසෙ විමුත්තා සත්ත භික්ඛවො
රාගදොසපරික්ඛීණා තිණ්ණා ලොකෙ විසත්තිකං.

උපකො ඵලගණ්ඩො ච[3] පුක්කුසාති ච තෙ තයො
භද්දියො ඛණ්ඩදෙවො ච බාහුදන්ති[4] ච පිඞ්ගියො
තෙ හිත්වා මානුසං දෙහං දිබ්බං යොගං උපච්චගු"න්ති.[5]

**සණ්ඨපෙසුන්ති** කතිකං අකංසු. **බාහුලිකොති**[6] චීවරබාහුල්ලාදීනං අත්ථාය පටිපන්නො. **පධානවිබ්භන්තොති** පධානතො විබ්භන්තො, භට්ඨො, පරිහීනො. **ආවත්තො බාහුල්ලායාති** චීවරාදීනං බහුලභාවත්ථාය[7] ආවත්තො. **අපි ච ඛො ආසනං ඨපෙතබ්බන්ති** අපි ච ඛො පනස්ස උච්චාකුලෙ නිබ්බත්තස්ස ආසනමත්තං ඨපෙතබ්බන්ති වදිංසු. **නාසක්ඛිංසූති** බුද්ධානුභාවෙන බුද්ධතෙජෙන අභිභූතා අත්තනො කතිකාය ඨාතුං න සක්ඛිංසු. **නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්තීති** ගොතමාති වදන්ති, ආවුසොති වදන්ති. ආවුසො ගොතම, මයං උරුවෙලායං පධානකාලෙ තුම්හාකං පත්තචීවරං ගහෙත්වා විචරිම්හ; මුඛොදකං දන්තකට්ඨං අදම්හ; වුත්ථපරිවෙණං සම්මජ්ජිම්හ. පච්ඡා තෙ කො[8] වත්තපටිවත්තං අකාසි, කච්චි අම්හෙසු අපක්කන්තෙසු[9] න විහායිත්ථාති එවරූපිං කථං කථෙන්තීති අත්ථො.

**ඉරියායාති** දුක්කර-ඉරියාය. **පටිපදායාති** දුක්කරපටිපත්තියා. **දුක්කරකාරිකායාති** පසතං පසතං මුග්ගයූසාදි-ආහරණාදිනා[10] දුක්කරකරණෙන. **අභිජානාථ මෙ නොති** අභිජානාථ නු මම[11] **එවරූපං වබ්භාවිතමෙතන්ති**[12] එතං එවරූපං වාක්‍යභෙදන්ති අත්ථො.

---

1. සො-S, E. 2. ජානාථ-L. 3. පලගණ්ඩො-S. E. පලභණ්ඩො-B.
4. බාහුදන්ති-A M2, බහුරග්ගි B. 5. උපජ්ඣගුන්ති-B, S.
6. බාහුල්ලිකො-B. S. 7. චීවරාදිබහුභාවත්ථාය-L.
8. පච්ඡා ච කො තෙ-S. 9. අපක්කන්තෙසු-S.
10. පසත අඩ්ඪපසතමුග්ගයූසාදිආහාරකරණාදිනා-S. 11. නු මං-L, B.
12. භාවිතමෙතන්ති A, M2, P2, පභාවිතමෙතන්ති-B, ච භාසිතමෙතං-S, වබ්භාවිතමෙතන්ති-E. භාසිතමෙතං (සං.නි.)

අපි නු අහං උරුවෙලාපධානෙ තුම්හාකං සඞ්ගණ්හනත්ථං අනුක්කණ්ඨනත්ථං[1] රත්තිං වා දිවා වා ආගන්ත්වා, ආවුසො මා විතක්කයිත්ථ, මය්හං ඔභාසො වා නිමිත්තං වා පඤ්ඤායතීති එවරූපං කඤ්චි වචනභෙදං අකාසින්ති අධිප්පායො. තෙ එකපදෙනෙව සතිං ලභිත්වා උප්පන්නගාරවා අද්ධා[2] එස බුද්ධො ජාතොති සද්දහිත්වා, **නො හෙතං භන්තෙති** ආහංසු.

**අසක්ඛිං ඛො අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ සඤ්ඤාපෙතුන්ති** අහං භික්ඛවෙ පඤ්චවග්ගියෙ භික්ඛූ, බුද්ධො අහන්ති ජානාපෙතුං අසක්ඛිං. තදා පන භගවා උපොසථදිවසෙයෙව ආගඤ්ඡි.[3] අථත්තනො බුද්ධභාවං ජානාපෙත්වා කොණ්ඩඤ්ඤත්ථෙරං කායසක්ඛිං කත්වා ධම්මචක්කප්පවත්තනසුත්තන්තං කථෙසි. සුත්තන්තපරියොසානෙ ථෙරො අට්ඨාරසහි බ්‍රහ්මකොටීහි සද්ධිං සොතාපත්තිඵලෙ පතිට්ඨාසි. සුරියෙ ධරමානෙයෙව දෙසනා නිට්ඨාසි. භගවා තත්ථෙව වස්සං උපගඤ්ඡි.[4] **ද්වෙපි සුදං භික්ඛවෙ භික්ඛූ ඔවදාමීති** ආදි පාටිපදදිවසතො පට්ඨාය පිණ්ඩපාතත්ථායපි ගාමං අපවිසනදීපනත්ථං වුත්තං. තෙසං[5] භික්ඛූනං කම්මට්ඨානෙසු උප්පන්නමලවිසොධනත්ථං භගවා අන්තොවිහාරෙයෙව අහොසි. උප්පන්නෙ උප්පන්නෙ කම්මට්ඨානමලෙ තෙපි භික්ඛූ භගවතො සන්තිකං ගන්ත්වා පුච්ඡන්ති. භගවාපි තෙසං නිසින්නට්ඨානං ගන්ත්වා මලං විනොදෙති.

**අථ** තෙසං භගවතා එවං නීහටභත්තෙන ඔවදියමානානං වප්පත්ථෙරො පාටිපදදිවසෙ සොතාපන්නො අහොසි, භද්දියත්ථෙරො දුතියායං, මහානාමත්ථෙරො තතියායං, අස්සජිත්ථෙරො චතුත්ථියං. පක්ඛස්ස පන පඤ්චමියං සබ්බෙව තෙ එකතො සන්නිපාතෙත්වා අනත්තලක්ඛණසුත්තන්තං කථෙසි. සුත්තන්තපරියොසානෙ සබ්බෙපි අරහත්තඵලෙ පතිට්ඨහිංසු. තෙනාහ: **අථ ඛො භික්ඛවෙ පඤ්චවග්ගියා භික්ඛූ මයා එවං ඔවදියමානා-පෙ-අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං අජ්ඣගමංසු-පෙ-නත්ථිදානි පුනබ්භවොති.** එත්තකං කථාමග්ගං භගවා, යං පුබ්බෙ අවච: තුම්හෙපි මමඤ්ඤෙව පඤ්චවග්ගියානඤ්ඤෙව මග්ගං ආරූළ්හා, අරියපරියෙසනා තුම්හාකං පරියෙසනාති ඉමං එකමෙව අනුසන්ධිං දස්සෙන්තො ආහරි.

**ඉදානි යස්මා න[6] අගාරියානංයෙව පඤ්චකාමගුණපරියෙසනා හොති, අනගාරියානම්පි චත්තාරො පච්චයෙ අපච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජන්තානං පඤ්චකාමගුණවසෙන අනරියපරියෙසනා හොති, තස්මා තං දස්සෙතුං, පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණාති ආදිමාහ.** තත්ථ නවරත්තෙසු පට්ට[7]චීවරාදිසු, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපාති ආදයො චත්තාරො කාමගුණා ලබ්භන්ති. රසො පනෙත්ථ පරිභොගරසො හොති. මනුඤ්ඤෙ පිණ්ඩපාතෙ භෙසජ්ජෙ ච පඤ්චපි ලබ්භන්ති. සෙනාසනම්හි[8]

1. අනුග්ගණ්හනත්ථං සඞ්ගණ්හනත්ථං-S. 2. හන්ද අද්ධා-B, S. 3. ආගච්ඡි-B, S. 4. උපගච්ඡි-B. S. 5. තෙසං භි-B, S. 6. යස්මා පන-A, M2, P2, S. 7. පත්ත-S. E. 8. සෙනාසනම්පි පරික්ඛාරෙ-S.

චීවරෙ විය චත්තාරො. රසො පන එත්ථාපි පරිභොගරසොව. **යෙ හි කෙචි භික්ඛවෙති** කස්මා ආරභි? එවං පඤ්ච කාමගුණෙ දස්සෙත්වා ඉදානි යෙ එවං වදෙය්‍යුං, පබ්බජිතකාලතො පට්ඨාය අනරියපරියෙසනා නාම කුතො, අරියපරියෙසනාව[1] පබ්බජිතානන්ති, තෙසං පටිසෙධනත්ථං[2] පබ්බජිතානම්පි චතූසු පච්චයෙසු අපච්චවෙක්ඛිතපරිභොගො අනරියපරියෙසනා එවාති දස්සෙතුං ඉමං දෙසනං ආරභි. තත්ථ **ගථිතාති** තණ්හාගෙධෙන ගථිතා;[3] **මුච්ඡිතාති** තණ්හාමුච්ඡාය මුච්ඡිතා; **අජ්ඣොපන්නාති** තණ්හාය අජ්ඣොගාළ්හා; **අනාදීනවදස්සාවිනොති** ආදීනවං අපස්සන්තා; **අනිස්සරණපඤ්ඤාති**, නිස්සරණං වුච්චති පච්චවෙක්ඛණඤාණං;[4] තෙන විරහිතා.

ඉදානි තස්සත්ථස්ස සාධකං උපමං දස්සෙන්තො, **සෙය්‍යථාපි භික්ඛවෙති** ආදිමාහ. තත්‍රෙවං ඔපම්මසංසන්දනං වෙදිතබ්බං: ආරඤ්ඤකමිගො විය හි සමණබ්‍රාහ්මණා. ලුද්දකෙන අරඤ්ඤෙ ඨපිතපාසො විය චත්තාරො පච්චයා. තස්ස ලුද්දස්ස පාසරාසිං අජ්ඣොත්ථරිත්වා සයනකාලො විය තෙසං චත්තාරො පච්චයෙ අපච්චවෙක්ඛිත්වා පරිභොගකාලො. ලුද්දෙ ආගච්ඡන්තෙ මිගස්ස යෙනකාමං අගමනකාලො විය සමණබ්‍රාහ්මණානං මාරස්ස යථාකාමකරණීයකාලො. මාරවසං උපගතභාවොති අත්ථො. මිගස්ස පන අබද්ධස්ස[5] පාසරාසිං අධිසයිතකාලො විය සමණබ්‍රාහ්මණානං චතූසු පච්චයෙසු පච්චවෙක්ඛිතපරිභොගො. ලුද්දෙ ආගච්ඡන්තෙ මිගස්ස යෙනකාමං ගමනං විය සමණබ්‍රාහ්මණානං මාරවසං අනුපගමනං වෙදිතබ්බං. **විස්සත්ථොති** නිබ්භයො, නිරාසඞ්කො. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

**පාසරාසිසුත්තං ඡට්ඨං.**

**අරියපරියෙසනන්තිපි[6] එතස්සෙව නාමං.**

---

## 1. 3. 7.

**එවමෙම සුතන්ති** චූළහත්ථිපදොපමං.[7] තත්ථ **සබ්බසෙතෙන වළභිරථෙනාති**[8], "සෙතා සුදං අස්සා යුත්තා හොන්ති, සෙතාලඞ්කාරා, සෙතො රථො, සෙතපරිවාරො, සෙතා රස්මියො, සෙතා පතොදලට්ඨි, සෙතං ඡත්තං, සෙතං උණ්හීසං, සෙතානි වත්ථානි, සෙතා උපාහනා, සෙතාය සුදං වාලබීජනියා බීජියතී"ති එවං වුත්තෙන සකලසෙතෙන චතූහි වළවාහි යුත්තරථෙන.

රථො ච නාමෙසො දුවිධො හොති: යොධරථො, අලඞ්කාරරථොති. තත්ථ යොධරථො චතුරස්සසණ්ඨානො හොති, නාතිමහා, ද්වින්නං තිණ්ණං වා ජනානං ගහණසමත්ථො. අලඞ්කාරරථො මහා

1. පරියෙසනා ච -P1. T1. S.
2. පටිසෙධනත්ථාය-B, S.
3. ගථිතාති තණ්හාගෙධෙන ගථිතා-B, S.
4. පච්චවෙක්ඛණඤාණං-S, F.
5. අබන්ධස්ස-S.
6. පරියෙසනන්තිපි-B, S.
7. චූළහත්ථිපදොපමසුත්තං-S.
8. වළවාභිරථෙනාති-B, S.

හොති, දීඝතො ච[1] දීඝො, පුථුලතො ච[2] පුථුලො. තත්‍ථ ජඞ්ඝාගාහකො, වාලබීජනිගාහකො, තාලවණ්ටගාහකොති එවං අට්ඨ වා දස වා සුඛෙනෙව ඨාතුං වා නිසීදිතුං වා නිපජ්ජිතුං වා සක්කොන්ති. අයම්පි අලඞ්කාරරථොයෙව. සො සබ්බො සචක්කපඤ්ජරකුබ්බරො රජතපරික්ඛිත්තො[3] අහොසි. වළවා පකතියා සෙතවණ්ණාව. පසාධනම්පි තාසං රජතමයං අහොසි. රස්මියොපි රජතපනාළීසු පක්ඛිත්තා. පතොදලට්ඨිපි රජතපරික්ඛිත්තා[3]. බ්‍රාහ්මණොපි සෙතවත්‍ථං නිවාසෙත්වා සෙතංයෙව උත්තරාසඞ්ගං අකාසි; සෙතවිලෙපනං විලිම්පි; සෙතං මාලං පිළන්ධි; දසසු අඞ්ගුලීසු අඞ්ගුලිමුද්දිකා කණ්ණෙසු කුණ්ඩලානීති එවමාදි-අලඞ්කාරොපිස්ස රජතමයොව අහොසි. පරිවාරබ්‍රාහ්මණාපිස්ස දසසහස්සමත්තා තථෙව සෙතවත්‍ථවිලෙපනමාලාලඞ්කාරා අහෙසුං. තෙන වුත්තං: **සබ්බසෙතෙන වළවාභිරථෙන සාවත්‍ථියා නිය්‍යාතීති**, සො කිර ඡන්නං ඡන්නං මාසානං එකවාරං නගරං පදක්ඛිණං කරොති. ඉතො එත්තකෙහි දිවසෙහි නගරං පදක්ඛිණං කරිස්සතීති පුරෙතරමෙව ඝොසනා කයිරති[4]. තං සුත්වා යෙ නගරතො න පක්කන්තා තෙ න පක්කමන්ති; යෙ පක්කන්තා, තෙපි පුඤ්ඤවන්තො සිරිසම්පත්තිං පස්සිස්සාමාති ආගච්ඡන්ති. යං දිවසං බ්‍රාහ්මණො නගරං අනුවිචරති, තදා පාතොව නගරවීථියො සම්මජ්ජිත්වා වාලිකං ඔකිරිත්වා ලාජපඤ්චමෙහි පුප්ඵෙහි අභිප්පකිරිත්වා[5] පුණ්ණඝටෙ ඨපෙත්වා කදලියො ච ධජෙ ච උස්සාපෙත්වා සකලනගරං ධූපිතවාසිතං කරොන්ති. බ්‍රාහ්මණො පාතොව සීසං නහායිත්වා පුරෙභත්තං භුඤ්ජිත්වා වුත්තනයෙනෙව සෙතවත්‍ථාදීහි අත්තානං අලඞ්කරිත්වා පාසාදා ඔරුය්හ රථං අභිරුහති. අථ නං තෙ බ්‍රාහ්මණා සබ්බසෙතවත්‍ථ-විලෙපනමාලාලඞ්කාරා සෙතච්ඡත්තානි ගහෙත්වා පරිවාරෙන්ති. තතො මහාජනස්ස සන්නිපාතනත්‍ථං පඨමංයෙව තරුණදාරකානං ඵලාඵලානි විකිරන්ති[6]; තදනන්තරං මාසකානි[7]; තදනන්තරං කහාපණෙ විකිරන්ති. මහාජනො සන්නිපතති[8]. උක්කුට්ඨියො චෙව චෙලුක්ඛෙපා ච වත්තන්ති[9]. අථ බ්‍රාහ්මණො මඞ්ගලික-සොවත්‍ථිකාදීසු මඞ්ගලානි චෙව සුවත්‍ථියො ච කරොන්තෙසු මහාසම්පත්තියා නගරං අනුවිචරති. පුඤ්ඤවන්තා මනුස්සා එකභූමකාදි පාසාදෙ ආරුය්හ සුකපත්ත[10]සදිසානි වාතපාන-කවාටානි විවරිත්වා ඔලොකෙන්ති. බ්‍රාහ්මණොපි අත්තනො යසසිරිසම්පත්තියා නගරං අජ්ඣොත්‍ථරන්තො විය දක්ඛිණද්වාරාභිමුඛො හොති. තෙන වුත්තං: **සාවත්‍ථියා නිය්‍යාතීති**.

**දිවා දිවස්සාති** දිවසස්සපි දිවා. මජ්ඣන්හිකකාලෙති[11] අත්‍ථො. **පිලොතිකං පරිබ්බාජකන්ති** පිලොතිකොති එවං ඉත්‍ථිලිඞ්ගවොහාරවසෙන ලද්ධනාමං පරිබ්බාජකං. සො කිර පරිබ්බාජකො දහරො පඨම-

1. දීඝසො-P1, T1, B, S. 2. පුථුලසො-P1, T1, B, S.
3. පරික්ඛිත්තං-B, S. 4. කරියති-B, S. 5. අභිකිරිත්වා-S.
6. විකිරිත්වා-B, S. 7. මාසකරූපානි-B, S. 8. මහාජනා සන්නිපතන්ති-B, S.
9. පවත්තන්ති-B, S. 10. සුකකපත්ත-S. 11. මජ්ඣන්තිකකාලෙති-S.

වයෙ ඨිතො සුවණ්ණවණ්ණො බ්‍රහ්මුපට්ඨාකො, පාතොව තථාගතස්ස චෙව මහාථෙරානඤ්ච උපට්ඨානං කත්වා තිදණ්ඩකුණ්ඩිකාදිපරික්ඛාරං ආදාය ජෙතවනා නික්ඛමිත්වා නගරාභිමුඛො පායාසි. තං එස දූරතොව ආගච්ඡන්තං අද්දස.

**එතදවොචාති** අනුක්කමෙන සන්තිකං ආගතං සඤ්ජානිත්වා එතං, හන්ද කුතො නු භවං වච්ඡායනො ආගච්ඡතීති ගොත්තං කිත්තෙන්තො වචනං අවොච. **පණ්ඩිතො මඤ්ඤෙති** භවං වච්ඡායනො සමණං ගොතමං පණ්ඩිතොති මඤ්ඤති, උදාහු නොති, අයමෙත්ථ අත්ථො.

**කො චාහං භොති** භො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං[1] ජානනෙ අහං කො නාම? **කො ච සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානිස්සාමීති** කුතො චාහං සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානිස්සාමි; කෙන කාරණෙන ජානිස්සාමීති? එවං සබ්බථාපි අත්තනො අජානනභාවං දීපෙති. **සොපි නූනස්ස තාදිසො වාති** යො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානෙය්‍ය, සොපි නූන දසපාරමියො පූරෙත්වා සබ්බඤ්ඤුතං පත්තො තාදිසො බුද්ධො යෙව භවෙය්‍ය. සිනෙරුං වා හිමවන්තං වා පථවිං වා ආකාසං වා මෙතුකාමෙන[2] තප්පමාණොව දණ්ඩො වා රජ්ජු වා ලද්ධුං වට්ටති. සමණස්ස ගොතමස්ස පඤ්ඤං ජානන්තෙනාපි තස්ස ඤාණසදිසමෙව සබ්බඤ්ඤුතඤ්ඤාණං ලද්ධුං වට්ටතීති දීපෙති. ආදරවසෙන පනෙත්ථ ආමෙණ්ඩිතං කතං.

**උළාරායාති** උත්තමාය, සෙට්ඨාය. **කො චාහං භොති** භො අහං සමණස්ස ගොතමස්ස පසංසනෙ කො නාම? **කො ච සමණං ගොතමං පසංසිස්සාමීති** කෙන කාරණෙන පසංසිස්සාමි? **පසත්ථපසත්ථොති**[3] සබ්බගුණානං උපරිවරෙහි[4] සබ්බලොකපසත්ථෙහි අත්තනො ගුණෙහෙව පසත්ථො, න තස්ස අඤ්ඤෙහි පසංසනකිච්චං අත්ථි. යථා හි චම්පකපුප්ඵං වා නීලුප්පලං වා පදුමං වා ලොහිතචන්දනං වා අත්තනො වණ්ණගන්ධසිරියාව[5] පාසාදිකඤ්චෙව සුගන්ධඤ්ච, න තස්ස ආගන්තුකෙහි වණ්ණගන්ධෙහි ථොමනකිච්චං අත්ථි. යථා ච මණිරතනං වා චන්දමණ්ඩලං වා අත්තනො ආලොකෙනෙව ඔභාසති, න තස්ස අඤ්ඤෙන ඔභාසනකිච්චං අත්ථි. එවං සමණො ගොතමො සබ්බලොකපසත්ථෙහි අත්තනො ගුණෙහෙව පසත්ථො ථොමිතො සබ්බලොකස්ස සෙට්ඨතං පාපිතො, න තස්ස අඤ්ඤෙන පසංසනකිච්චං අත්ථි.

පසත්ථෙහි පසත්ථොතිපි වා **පසත්ථපසත්ථො**. කෙ පන පසත්ථා නාම? රාජා පසෙනදිකොසලො කාසිකොසලවාසීහි පසත්ථො; බිම්බිසාරො අඞ්ගමගධවාසීහි. වෙසාලිකා ලිච්ඡවී වජ්ජිරට්ඨවාසීහි පසත්ථා. පාවෙය්‍යකා මල්ලා, කොසිනාරකා මල්ලා, අඤ්ඤෙපි තෙ තෙ

1. වෙය්‍යත්තිය-L. 2. මිනන්තස්ස-A, M2, P2. පමෙතුකාමෙන-B S.
3. පසට්ඨපසට්ඨොති-B. S. 4. උත්තරීතරෙහි-B. උපරිපරෙහි-S.
5. සිරීයා-A, M2, P2, S.

ඛත්තියා තෙහි තෙහි ජානපදෙහි[1] පසන්නා. චඞ්කිආදයො බ්‍රාහ්මණා බ්‍රාහ්මණගණෙහි, අනාථපිණ්ඩිකාදයො උපාසකා උපාසකගණෙහි, විසාඛාදයො උපාසිකා අනෙකසතාහි උපාසිකාහි, සකුලුදායිආදයො පරිබ්බාජකා අනෙකෙහි පරිබ්බාජකසතෙහි, උප්පලවණ්ණාථෙරී-ආදිකා මහාසාවිකා අනෙකෙහි භික්ඛුණිසතෙහි, සාරිපුත්තත්ථෙරාදයො මහාථෙරා අනෙකසතෙහි භික්ඛූහි, සක්කාදයො දෙවා අනෙක-සහස්සෙහි දෙවෙහි, මහාබ්‍රහ්මාදයො බ්‍රහ්මානො අනෙකසහස්සෙහි බ්‍රහ්මෙහි පසන්නා. තෙ සබ්බෙපි දසබලං ථොමෙන්ති, වණ්ණෙන්ති, පසංසන්තීති භගවා **පසන්නපසන්නො**ති වුච්චති.

**අත්ථවසන්ති** අත්ථානිසංසං. අථස්ස පරිබ්බාජකො අත්තනො පසාදකාරණං[2] ආචික්ඛන්තො, **සෙය්‍යථාපි භො කුසලො නාගවනිකො**ති ආදිමාහ. තත්ථ **නාගවනිකො**ති නාගවනවාසිකො[3] අනුග්ගහිතසිප්පො පුරිසො. පරතො පන උග්ගහිතසිප්පො පුරිසො නාගවනිකොති ආගතො. **චත්තාරි පදානී**ති චත්තාරි ඤාණපදානි, ඤාණවලඤ්ජානි;[4] ඤාණෙන අක්කන්තට්ඨානානීති අත්ථො.

**ඛත්තියපණ්ඩිතෙ**ති ආදීසු **පණ්ඩිතෙ**ති පණ්ඩිච්චෙන සමන්නාගතෙ. **නිපුණෙ**ති සණ්හෙ, සුඛුමබුද්ධිනො, සුඛුමඅත්ථන්තරපටිවිජ්ඣනසමත්ථෙ. **කතපරප්පවාදෙ**ති විඤ්ඤාතපරප්පවාදෙ චෙව පරෙහි සද්ධිං කතවාදපරිචයෙ ච. **වාලවෙධිරූපෙ**ති වාලවෙධිධනුග්ගහසදිසෙ. **වොභින්දන්තා[5] මඤ්ඤෙ චරන්තී**ති වාලවෙධි විය වාලං, සුඛුමානිපි පරෙසං දිට්ඨිගතානි අත්තනො පඤ්ඤාගතෙන භින්දන්තා විය චරන්තීති අත්ථො. **පඤ්හං අභිසඞ්ඛරොන්තී**ති දුපදම්පි තිපදම්පි චතුප්පදම්පි පඤ්හං[6] කරොන්ති. **වාදං ආරොපෙස්සාමා**ති දොසං ආරොපෙස්සාම.

**න චෙව සමණං ගොතමං පඤ්හං පුච්ඡන්තී**ති, කස්මා න පුච්ඡන්ති? භගවා කිර පරිසමජ්ඣෙ ධම්මං දෙසෙන්තො පරිසාය අජ්ඣාසයං ඔලොකෙති; තතො පස්සති: ඉමෙ ඛත්තියපණ්ඩිතා ගුළ්හං රහස්සං පඤ්හං ඔවට්ටිකසාරං කත්වා ආගතාති. සො තෙහි අපුට්ඨොයෙව, එවරූපෙ පඤ්හෙ පුච්ඡාය එත්තකා දොසා, විස්සජ්ජනෙ එත්තකා අත්ථෙ, පදෙ, අක්ඛරෙ එත්තකාති, ඉමෙ පඤ්හෙ පුච්ඡන්තො එවං පුච්ඡෙය්‍ය, විස්සජ්ජෙන්තො එවං විස්සජ්ජෙය්‍යාති, ඉති ඔවට්ටිකසාරං කත්වා ආනීතෙ පඤ්හෙ ධම්මකථාය අන්තරෙ පක්ඛිපිත්වා විද්ධංසෙති;[7] ඛත්තියපණ්ඩිතා, සෙය්‍යො වත නො, යෙ මයං ඉමෙ පඤ්හෙ න පුච්ඡිම්හ, සචෙ හි මයං පුච්ඡෙය්‍යාම අප්පතිට්ඨෙව නො කත්වා සමණො ගොතමො ඛිපෙය්‍යාති අත්තමනා භවන්ති.

1. ජනපදෙහි-L, S. E.
2. අත්තනො දිට්ඨකාරණං-P1, T1, E.
3. නිවාසිකො-L.
4. ඤාණපදානි ඤාණවලඤ්ජානි-S.
5. තෙ භින්දන්තා-S.
6. පඤ්හෙ-L.
7. විද්ධංසෙති-L, S, E.

අපි ච බුද්ධා නාම ධම්මං දෙසෙන්තා පරිසං මෙත්තාය ඵරන්ති: මෙත්තාඵරණෙන දසබලෙ මහාජනස්ස චිත්තං පසීදති. බුද්ධා ච නාම රූපග්ගප්පත්තා හොන්ති, දස්සනසම්පන්නා, මධුරස්සරා, මුදුජිව්හා, සුඵුසිත[1]දන්තාවරණා, අමතෙන හදයං සිඤ්චන්තා විය ධම්මං කථෙන්ති. තත්‍ර තෙසං[2] මෙත්තාඵරණෙන පසන්නචිත්තානං එවං හොති: එවරූපං අද්වෙජ්ඣකථං, අමොඝකථං, නිය්‍යානිකකථං කථෙන්තෙන භගවතා සද්ධිං න සක්ඛිස්සාම පච්චනීකගාහං ගණ්හිතුන්ති අත්තනො පසන්නභාවෙනෙව න පුච්ඡන්ති. **අඤ්ඤදත්ථූති** එකංසෙන. **සාවකා සම්පජ්ජන්තීති** සරණගමනවසෙන සාවකා හොන්ති.

**තදනුත්තරන්ති** තං අනුත්තරං; **බ්‍රහ්මචරියපරියොසානන්ති**[3] මග්ගබ්‍රහ්මචරියස්ස පරියොසානභූතං අරහත්තඵලං. තදත්ථාය හි තෙ පබ්බජන්ති. **මනං වත භො අනස්සාමාති** භො සචෙ මයං න උපසඞ්කමෙය්‍යාම, ඉමිනා ථොකෙන අනුපසඞ්කමනමත්තෙන අපයිරුපාසනමත්තෙනෙව නට්ඨා භවෙය්‍යාම. උපසඞ්කමනමත්තකෙන පනම්හ න නට්ඨාති අත්ථො. දුතියපදං පුරිමස්සෙව වෙවචනං. **අස්සමණාව සමානාති** ආදීසු පාපානං අසමිතත්තා **අස්සමණාව**; අබාහිතත්තා ච[4] පන **අබ්‍රාහ්මණාව**; කිලෙසාරීනං අහතත්තා **අනරහන්තායෙව ච සමානාති** අත්ථො.

**උදානං උදානෙසීති** උදාහාරං උදාහරි. යථා හි යං තෙලං මානං ගහෙතුං න සක්කොති, විස්සන්දිත්වා ගච්ඡති, තං අවසෙකොති වුච්චති; යඤ්ච ජලං තළාකං ගහෙතුං න සක්කොති, අජ්ඣොත්ථරිත්වා ගච්ඡති, තං ඔඝොති වුච්චති, එවමෙව යං පීතිමයවචනං හදයං ගහෙතුං න සක්කොති, අධිකං හුත්වා අන්තො අසණ්ඨහිත්වා බහි නික්ඛමති, තං උදානන්ති වුච්චති. එවරූපං පීතිමයවචනං නිච්ඡාරෙසීති අත්ථො.

**හත්ථිපදොපමොති** හත්ථිපදං උපමා අස්ස ධම්මස්සාති **හත්ථිපදොපමො**. සො න **එත්තාවතා විත්ථාරෙන පරිපූරො හොතීති** දස්සෙති **නාගවනිකොති** උග්ගහිතහත්ථිසිප්පො, හත්ථිවනචාරිකො. අථ කස්මා කුසලොති න වුත්තොති? පරතො **සො හොති කුසලොති**. විභාගදස්සනත්ථං. යො හි කොචි පවිසති; යො පන කුසලො හොති, සො නෙව තාව නිට්ඨං ගච්ඡති; තස්මා ඉධ කුසලොති අවත්වා පරතො වුත්තො. **වාමනිකාති** රස්සා, ආයාමතොපි න දීඝා මහාකුච්ඡිහත්ථිනියො. **උච්චා ච නිසෙවිතන්ති** සත්තට්ඨරතනුබ්බෙධෙ වටරුක්ඛාදීනං ඛන්ධපදෙසෙ ඝංසිතට්ඨානං. **උච්චා කාළාරිකා**[5]ති උච්චා ච යට්ඨිසදිසපාදා හුත්වා කාළාරිකා[5] ච දන්තානං කළාරතාය. තාසං කිර එකො දන්තො උන්නතො[6] හොති; එකො ඔනතො;[7] උභොපි ච විරළා හොන්ති න ආසන්නා.

---

1. සුඵුස්සිත-B සුඵුසිත-S. 2, තෙසං-L,
3 තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානන්ති-L, 4. අවාහිතත්තා-B. S,
5. කළාරිකා-S, E. 6, උණ්ණතො-L. 7. ඔණතො-L,

**උච්චා ච දන්තෙහි ආරඤ්ජිතානීති** සත්තට්ඨරතනුබ්බෙධෙ වෙරුක්ඛාදීනං ඛන්ධපදෙසෙ ඵරසුනා පහතට්ඨානං[1] විය දාඨාහි ඡින්නට්ඨානං. **උච්චා කණෙරුකා නාමාති** උච්චා ච යට්ඨිසදිසපාදා හුත්වා කණෙරුකා ච දන්තානං කණෙරුතාය. තා කිර මකුලදාඨා හොන්ති; තස්මා කණෙරුකාති වුච්චන්ති.

**සො නිට්ඨං ගච්ඡතීති** සො නාගවනිකො, යස්ස වනාහං[2] නාගස්ස අනුපදං ආගතො, අයංව සො, අයමෙව[3] සො, න අඤ්ඤො; යං හි අහං පඨමං පදං[4] දිස්වා වාමනිකානං පදං භවිස්සතීති නිට්ඨං න ගතො, යම්පි තතො ඔරභාගෙ දිස්වා කාළාරිකානං[5] භවිස්සති, කණෙරුකානං භවිස්සතීති නිට්ඨං න ගතො, සබ්බං තං ඉමස්සෙව මහාහත්ථිනො පදන්ති මහාහත්ථිං දිස්වාව නිට්ඨං ගච්ඡති.

**එවමෙව ඛොති** එත්ථ ඉදං ඔපම්මසංසන්දනං : නාගවනං විය හි ආදිතො පට්ඨාය යාව නීවරණප්පහානා ධම්මදෙසනා වෙදිතබ්බා. කුසලො නාගවනිකො විය යොගාවචරො; මහානාගො විය සම්මාසම්බුද්ධො; මහන්තං හත්ථිපදං විය ඣානාභිඤ්ඤා; නාගවනිකස්ස තත්ථ තත්ථ හත්ථිපදං දිස්වාපි වාමනිකානං පදං භවිස්සති, කාළාරිකානං[5] කණෙරුකානං පදං භවිස්සතීති අනිට්ඨා[6]ගතභාවො විය යොගිනො, ඉමා ඣානාභිඤ්ඤා නාම බාහිරකපරිබ්බාජකානම්පි සන්තීති අනිට්ඨා[6]ගතභාවො. නාගවනිකස්ස, තත්ථ තත්ථ මයා දිට්ඨං පදං ඉමස්සෙව මහාහත්ථිනො, න අඤ්ඤස්සාති මහාහත්ථිං දිස්වා නිට්ඨා[7]ගමනං විය අරියසාවකස්ස අරහත්තං පත්වාව නිට්ඨා[7]ගමනං. ඉදඤ්ච පන ඔපම්ම-සංසන්දනං මත්ථකෙ ඨත්වාපි කාතුං වට්ටති; ඉමස්මිම්පි ඨානෙ වට්ටතියෙව. අනුක්කමාගතං පන තං[8] පාළිපදං ගහෙත්වා ඉධෙව කතං.

තත්ථ ඉධාති දෙසාපදෙසෙ නිපාතො. ස්වායං කත්ථචි ලොකං උපාදාය වුච්චති. යථාහ : "ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජතී"ති.[9] කත්ථචි සාසනං. යථාහ : "ඉධෙව භික්ඛවෙ සමණො[10], ඉධ දුතියො සමණො"ති. කත්ථචි ඔකාසං. යථාහ :

"ඉධෙව තිට්ඨමානස්ස දෙවභූතස්ස මෙ සතො,
පුනරායු ච මෙ ලද්ධො එවං ජානාහි මාරිසා"ති.

කත්ථචි පදපූරණමත්තමෙව. යථාහ : "ඉධාහං භික්ඛවෙ භුත්තාවී අස්සං පවාරිතො"ති. ඉධ පන ලොකං උපාදාය වුත්තොති වෙදිතබ්බො. ඉදං වුත්තං හොති ; බ්‍රාහ්මණ, ඉමස්මිං ලොකෙ තථාගතො උප්පජ්ජති[9] අරහං-පෙ-බුද්ධො භගවාති.

තත්ථ තථාගතසද්දො මූලපරියායෙ, අරහන්ති ආදයො විසුද්ධිමග්ගෙ විත්ථාරිතා. **ලොකෙ උප්පජ්ජතීති**[9] එත්ථ පන **ලොකොති**,

1. පහටට්ඨානං-E. 2. පනාහං-S. 3. ආගතො, අයමෙව-S. ආගතො, අයංව-E.
4. අහං ආදිතො පට්ඨාය පදං-P1. T1. 5. කලාරිකානං-S. E.
6. අනිට්ඨං-S. E. 7. නිට්ඨං-S. E. 8. පන-S.
9. උප්පජ්ජතීති-S. E. 10. පඨමො සමණො-S.

ඔකාසලොකො, සත්තලොකො, සඞ්ඛාරලොකොති තිවිධො. ඉධ පන සත්තලොකො අධිප්පෙතො. සත්තලොකෙ උප්පජ්ජමානොපි ච තථාගතො න දෙවලොකෙ, න බ්‍රහ්මලොකෙ, මනුස්සලොකෙයෙව උප්පජ්ජති.[1] මනුස්සලොකෙපි න අඤ්ඤස්මිං චක්කවාළෙ, ඉමස්මිංයෙව චක්කවාළෙ. තත්‍රාපි න සබ්බට්ඨානෙසු. "පුරත්ථිමාය දිසාය කජඞ්ගලං නාම නිගමො; තස්සාපරෙන මහාසාලා; තතො පරං පච්චන්තිමා ජනපදා; ඔරතො මජ්ඣෙ. පුරත්ථිමදක්ඛිණාය දිසාය සලළවතී[2] නාම නදී; තතො පරං පච්චන්තිමා ජනපදා; ඔරතො මජ්ඣෙ. දක්ඛිණාය දිසාය සෙතකණ්ණිකං නාම නිගමො; තතො පරං පච්චන්තිමා ජනපදා; ඔරතො මජ්ඣෙ. පච්ඡිමාය දිසාය ථූණං[3] නාම බ්‍රාහ්මණගාමො; තතො පරං පච්චන්තිමා ජනපදා; ඔරතො මජ්ඣෙ. උත්තරාය දිසාය උසීරද්ධජො නාම පබ්බතො; තතො පරං පච්චන්තිමා ජනපදා; ඔරතො මජ්ඣෙ"ති එවං පරිච්ඡින්නෙ ආයාමතො තියොජනසතෙ, විත්ථාරතො අඩ්ඪතියයොජනසතෙ, පරික්ඛෙපතො නවයොජනසතෙ මජ්ඣිමපදෙසෙ උප්පජ්ජති.[1] න කෙවලඤ්ච තථාගතො, පච්චෙකබුද්ධා, අග්ගසාවකා, අසීතිමහාථෙරා, බුද්ධමාතා, බුද්ධපිතා, චක්කවත්තිරාජා, අඤ්ඤෙ ච සාරප්පත්තා බ්‍රාහ්මණගහපතිකා එත්ථෙව[4] උප්පජ්ජන්ති.[1]

තත්ථ තථාගතො සුජාතාය දින්නමධුපායාසභොජනතො පට්ඨාය[5] යාව අරහත්තමග්ගා[6], තාව උප්පජ්ජති[1] නාම; අරහත්තඵලෙ උප්පන්නො[7] නාම. මහාභිනික්ඛමනතො වා යාව අරහත්තමග්ගා[6], තුසිතභවනතො වා යාව අරහත්තමග්ගා[6], දීපඞ්කරපාදමූලතො වා යාව අරහත්තමග්ගා[6], තාව උප්පජ්ජති[1] නාම; අරහත්තඵලෙ උප්පන්නො[7] නාම. ඉධ සබ්බපඨමං උප්පන්නභාවං සන්ධාය උප්පජ්ජතීති[1] වුත්තං. තථාගතො ලොකෙ උප්පන්නො[7] හොතීති අයං හි එත්ථ අත්ථො.

**සො ඉමං ලොකන්ති** සො භගවා ඉමං ලොකං. ඉදානි වත්තබ්බං නිදස්සෙති.[8] **සදෙවකන්ති** සහ දෙවෙහි සදෙවකං; එවං සහ මාරෙන **සමාරකං**; සහ බ්‍රහ්මුනා **සබ්‍රහ්මකං**; සහ සමණබ්‍රාහ්මණෙහි **සස්සමණබ්‍රාහ්මණිං**. පජාතත්තා පජා; තං[9] **පජං**; සහ දෙවමනුස්සෙහි **සදෙවමනුස්සං**. තත්ථ සදෙවකවචනෙන පඤ්චකාමාවචරදෙවග්ගහණං වෙදිතබ්බං. සමාරකවචනෙන ඡට්ඨකාමාවචරදෙවග්ගහණං. සබ්‍රහ්මකවචනෙන බ්‍රහ්මකායිකාදිබ්‍රහ්මග්ගහණං. සස්සමණබ්‍රාහ්මණිවචනෙන සාසනස්ස පච්චත්ථික-පච්චාමිත්ත-සමණබ්‍රාහ්මණග්ගහණං, සමිතපාප-බාහිතපාප-සමණබ්‍රාහ්මණග්ගහණඤ්ච. පජාවචනෙන සත්තලොකග්ගහණං. සදෙවමනුස්සවචනෙන සම්මුතිදෙව-අවසෙසමනුස්සග්ගහණං. එවමෙත්ථ තීහි පදෙහි ඔකාසලොකෙන සද්ධිං සත්තලොකො, ද්වීහි පජාවසෙන සත්තලොකොව ගහිතොති වෙදිතබ්බො.

1. උප්පජජති-L. S. E. 2. සලලවතී-B. S. 3. ථුනං-B. ථූනං-S.
4. තත්ථෙව-L. 5. භොජනතො-L. 6. මග්ගො-L. S. E.
7. උප්පන්නො-S. E. 8. වත්තබ්බන්ති දස්සෙති-S නිදස්සෙති-E.
9. පජාතත්තා-S.

අපරො නයො: සදෙවකග්ගහණෙන අරූපාවචරලොකො ගහිතො; සමාරකග්ගහණෙන ඡකාමාවචරදෙවලොකො; සබ්‍රහ්මකග්ගහණෙන රූපී බ්‍රහ්මලොකො; සස්සමණබ්‍රාහ්මණාදිග්ගහණෙන චතුපරිසවසෙන සම්මුතිදෙවෙහි වා සහ මනුස්සලොකො, අවසෙසසබ්බසත්තලොකො වා. අපි චෙත්ථ සදෙවකවචනෙන උක්කට්ඨපරිච්ඡෙදතො සබ්බස්ස ලොකස්ස සච්ඡිකතභාවමාහ. තතො යෙසං අහොසි: මාරො මහානුභාවො ඡකාමාවචරිස්සරො වසවත්තීති සොපි[1] එතෙන සච්ඡිකතොති? තෙසං විමතිං විධමන්තො **සමාරකන්ති** ආහ. යෙසං පන අහොසි: බ්‍රහ්මා මහානුභාවො එකඞ්ගුලියා එකස්මිං චක්කවාළසහස්සෙ ආලොකං ඵරති; ද්වීහි -පෙ- දසහි අඞ්ගුලීහි දසසු චක්කවාළසහස්සෙසු ආලොකං ඵරති; අනුත්තරඤ්ච ඣානසමාපත්තිසුඛං පටිසංවෙදෙති; කිං සොපි සච්ඡිකතොති? තෙසං විමතිං විධමන්තො **සබ්‍රහ්මකන්ති** ආහ. තතො යෙ[2] චින්තෙසුං: පුථූ සමණබ්‍රාහ්මණා සාසනස්ස පච්චත්ථිකා; කිං තෙපි සච්ඡිකතාති? තෙසං විමතිං විධමන්තො **සස්සමණබ්‍රාහ්මණිං පජන්ති** ආහ. එවං උක්කට්ඨානං[3] සච්ඡිකතභාවං පකාසෙත්වා, අථ සම්මුතිදෙවෙ අවසෙසමනුස්සෙ ච උපාදාය උක්කට්ඨපරිච්ඡෙදවසෙන සෙසසත්තලොකස්ස සච්ඡිකතභාවං පකාසෙන්තො **සදෙවමනුස්සන්ති** ආහ. අයමෙත්ථ භාවානුක්කමො.[4]

පොරාණා පනාහු: **සදෙවකන්ති** දෙවතාහි සද්ධිං අවසෙසලොකං; **සමාරකන්ති** මාරෙන සද්ධිං අවසෙසලොකං; **සබ්‍රහ්මකන්ති** බ්‍රහ්මෙහි සද්ධිං අවසෙසලොකං. එවං සබ්බෙපි තිභවූපගෙ සත්තෙ තීහාකාරෙහි තීසු පදෙසු පක්ඛිපිත්වා පුන ද්වීහි පදෙහි[5] පරියාදියන්තො **සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සන්ති** ආහ. එවං පඤ්චහි පදෙහි තෙන තෙනාකාරෙන තෙධාතුකමෙව පරියාදින්නන්ති.

**සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙතීති සයන්ති** සාමං, අපරනෙය්‍යො හුත්වා;[6] **අභිඤ්ඤාති** අභිඤ්ඤාය; අධිකෙන ඤාණෙන ඤත්වාති අත්ථො. **සච්ඡිකත්වාති** පච්චක්ඛං කත්වා. එතෙන අනුමානාදිපටික්ඛෙපො කතො හොති. **පවෙදෙතීති** බොධෙති, ඤාපෙති, පකාසෙති.

**සො ධම්මං දෙසෙති ආදි -පෙ- පරියොසාන[7]කල්‍යාණන්ති** සො භගවා සත්තෙසු කාරුඤ්ඤතං පටිච්ච, හිත්වාපි[8] අනුත්තරං විවෙකසුඛං ධම්මං දෙසෙති. තඤ්ච ඛො අප්පං වා බහුං වා දෙසෙන්තො ආදිකල්‍යාණාදිප්පකාරමෙව දෙසෙති. ආදිම්හිපි[9] කල්‍යාණං භද්දකං අනවජ්ජමෙව කත්වා දෙසෙති. මජ්ඣෙපි -පෙ- පරියොසානෙපි කල්‍යාණං භද්දකං අනවජ්ජමෙව කත්වා දෙසෙතීති වුත්තං හොති.

---

1. කිං සොපි-S. 2. යෙ එවං-P1. T1. B.
3. උක්කට්ඨට්ඨානං-I., උක්කට්ඨානඤ්ච-S. උක්කට්ඨුක්කට්ඨානං-B.
4. භාවානුක්කමො-B, S. 5. ද්වීහි-A. M2. P2.
6. සයන්ති සාමං-S. 7. ආදිමජ්ඣපරියොසාන S.
8. පටිච්ච-S. ඨිත්වා-A. M2. P2. ඨිත්වාති-P1. T1.
9. ආදිම්හි පි-A, M2, P2. ආදිම්හි-S.

තත්ථ අත්ථි දෙසනාය ආදි, මජ්ඣං, පරියොසානං; අත්ථි සාසනස්ස. දෙසනාය තාව චතුප්පදිකායපි ගාථාය පඨමපාදො ආදි නාම, තතො ද්වෙ මජ්ඣං නාම, අන්තෙ[1] එකො පරියොසානං නාම. එකානුසන්ධිකස්ස සුත්තස්ස නිදානං ආදි, ඉදමවොචාති පරියොසානං, උභින්නමන්තරා මජ්ඣං. අනෙකානුසන්ධිකස්ස සුත්තස්ස පඨමානුසන්ධි ආදි, අන්තෙ අනුසන්ධි පරියොසානං, මජ්ඣෙ එකො වා ද්වෙ වා බහූ වා මජ්ඣමෙව. සාසනස්ස පන සීලසමාධිවිපස්සනා ආදි නාම. වුත්තම්පි චෙතං: "කො චාදි කුසලානං ධම්මානං? සීලඤ්ච විසුද්ධං, දිට්ඨි ච උජුකා"ති. "අත්ථි භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා"ති එවං වුත්තො පන අරියමග්ගො මජ්ඣං නාම. ඵලඤ්චෙව නිබ්බානඤ්ච පරියොසානං නාම. "තස්මාතිහ ත්වං බ්‍රාහ්මණ බ්‍රහ්මචරියං එතං සාරං, එතං[2] පරියොසාන"න්ති එත්ථ[3] ඵලං පරියොසානන්ති වුත්තං. "නිබ්බානොගධං හි ආවුසො විසාඛ බ්‍රහ්මචරියං වුස්සති, නිබ්බානපරායනං නිබ්බානපරියොසාන"න්ති එත්ථ නිබ්බානං පරියොසානන්ති වුත්තං.

ඉධ දෙසනාය ආදි-මජ්ඣ-පරියොසානං අධිප්පෙතං. භගවා හි ධම්මං දෙසෙන්තො ආදිම්හි සීලං දස්සෙත්වා මජ්ඣෙ මග්ගං පරියොසානෙ නිබ්බානං දස්සෙති. තෙන වුත්තං: **සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං, මජ්ඣෙකල්‍යාණං, පරියොසානකල්‍යාණ**න්ති. තස්මා අඤ්ඤොපි ධම්මකථිකො ධම්මං කථෙන්තො,

ආදිම්හි සීලං දස්සෙය්‍ය මජ්ඣෙ මග්ගං විභාවයෙ,
පරියොසානම්හි[4] නිබ්බානං එසා කථිකසණ්ඨිතීති.

**සාත්ථං සබ්‍යඤ්ජන**න්ති යස්ස හි යාගුභත්ත-ඉත්ථිපුරිසාදි වණ්ණනා නිස්සිතා දෙසනා හොති, න සො සාත්ථං දෙසෙති. භගවා පන තථාරූපං දෙසනං පහාය චතුසතිපට්ඨානාදිනිස්සිතං දෙසනං දෙසෙති, තස්මා සාත්ථං දෙසෙතීති වුච්චති. යස්ස පන දෙසනා එකබ්‍යඤ්ජනාදියුත්තා වා සබ්බනිරොට්ඨබ්‍යඤ්ජනා වා සබ්බවිස්සට්ඨ-සබ්බනිග්ගහීත[5]බ්‍යඤ්ජනා වා, තස්ස දමිළ-කිරාත-යවනාදිමිලක්ඛානං[6] භාසා විය බ්‍යඤ්ජනපාරිපූරියා අභාවතො අබ්‍යඤ්ජනා නාම දෙසනා හොති. භගවා පන[7]

"සිථිලධනිතඤ්ච දීඝරස්සං ගරුකලහුකඤ්ච නිග්ගහීතං
සම්බන්ධං වවත්ථිතං විමුත්තං දසධා බ්‍යඤ්ජනබුද්ධියා පභෙදො"ති

එවං වුත්තං දසවිධබ්‍යඤ්ජනං අමක්ඛෙත්වා පරිපුණ්ණබ්‍යඤ්ජනමෙව කත්වා ධම්මං දෙසෙති; තස්මා සබ්‍යඤ්ජනං දෙසෙතීති වුච්චති.

**කෙවලපරිපුණ්ණ**න්ති එත්ථ කෙවලන්ති සකලාධිවචනං; පරිපුණ්ණන්ති අනූනාධිකවචනං. ඉදං වුත්තං හොති: සකලපරිපුණ්ණමෙව දෙසෙති, එකා දෙසනාපි අපරිපුණ්ණා නත්ථීති. **පරිසුද්ධ**න්ති

1. අන්තා-S. 2. එතං සාරං-S. 3. හි එත්ථ-S. 4. පරියොසානෙ ච-S. 5. නිග්ගහිත-S, E. 6. කිරාචසවනාදිමිලක්ඛූනං-S, කිරාතසවරමිලක්ඛූනං-B. 7. පන තථාරූපං දෙසනං පහාය-B, S.

නිරුපක්කිලෙසං. යො හි ඉමං ධම්මදෙසනං නිස්සාය ලාභං වා සක්කාරං වා ලභිස්සාමීති දෙසෙති, තස්ස අපරිසුද්ධා දෙසනා හොති. භගවා පන ලොකාමිසනිරපෙක්ඛො[1] හිතඵරණෙන මෙත්තාභාවනාය මුදුහදයො උල්ලුම්පනසභාවසණ්ඨිතෙන චිත්තෙන දෙසෙති; තස්මා පරිසුද්ධං දෙසෙතීති වුච්චති.

**බ්‍රහ්මචරියං පකාසෙතීති** එත්ථ **බ්‍රහ්මචරියන්ති** සික්ඛාත්තයසඞ්ගහං සකලසාසනං. තස්මා **බ්‍රහ්මචරියං පකාසෙතීති**, සො ධම්මං දෙසෙති, ආදිකල්‍යාණං-පෙ-පරිසුද්ධං, එවං දෙසෙන්තො ච සික්ඛාත්තයසඞ්ගහිතං සකලසාසනබ්‍රහ්මචරියං පකාසෙතීති එවමෙත්ථ අත්ථො දට්ඨබ්බො. **බ්‍රහ්මචරියන්ති** සෙට්ඨට්ඨෙන බ්‍රහ්මභූතං චරියං. බ්‍රහ්මභූතානං වා බුද්ධාදීනං චරියන්ති වුත්තං හොති.

**තං ධම්මන්ති** තං වුත්තප්පකාරසම්පදං ධම්මං. **සුණාති ගහපති වාති** කස්මා පඨමං ගහපතිං නිද්දිසති? නිහතමානත්තා, උස්සන්නත්තා ච. යෙභුය්‍යෙන හි ඛත්තියකුලතො පබ්බජිතා ජාතිං නිස්සාය මානං කරොන්ති; බ්‍රාහ්මණකුලා පබ්බජිතා මන්තෙ නිස්සාය මානං කරොන්ති; හීනජච්චකුලා පබ්බජිතා අත්තනො විජාතිතාය පතිට්ඨාතුං න සක්කොන්ති. ගහපතිදාරකා පන කච්ඡෙහි සෙදං මුච්චන්තෙහි පිට්ඨියා ලොණං පුප්ඵමානාය භූමිං කසිත්වා නිහතමානදප්පා හොන්ති. තෙ පබ්බජිත්වා මානං වා දප්පං වා අකත්වා යථාබලං බුද්ධවචනං උග්ගණ්හිත්වා විපස්සනාය කම්මං කරොන්තා සක්කොන්ති අරහත්තෙ පතිට්ඨාතුං. ඉතරෙහි ච කුලෙහි නික්ඛමිත්වා පබ්බජිතා නාම න බහුකා ගහපතිකාව බහුකා. ඉති නිහතමානත්තා උස්සන්නත්තා ච පඨමං ගහපතිං නිද්දිසතීති.[2] **අඤ්ඤතරස්මිං වාති** ඉතරෙසං වා කුලානං අඤ්ඤතරස්මිං. **පච්චාජාතොති** ජාතො.[3]

**තථාගතෙ සද්ධං පටිලභතීති** පරිසුද්ධං ධම්මං සුත්වා ධම්මස්සාමිම්හි තථාගතෙ, සම්මාසම්බුද්ධො වත භගවාති සද්ධං පටිලභති. **ඉති පටිසඤ්චික්ඛතීති** එවං පච්චවෙක්ඛති. **සම්බාධො ඝරාවාසොති** සචෙපි සට්ඨිහත්ථෙ ඝරෙ යොජනසතන්තරෙපි වා ද්වෙ ජයම්පතිකා වසන්ති, තථාපි නෙසං සකිඤ්චන-සපලිබොධට්ඨෙන ඝරාවාසො සම්බාධොව. **රජාපථොති** රාගරජාදීනං උට්ඨානට්ඨානන්ති මහාඅට්ඨකථායං වුත්තං. ආගමනපථොතිපි වදන්ති, අලග්ගනට්ඨෙන අබ්භොකාසො වියාති **අබ්භොකාසො**. පබ්බජිතො හි කූටාගාර-රතනපාසාද-දෙවවිමානාදීසු පිහිතද්වාරවාතපානෙසු පටිච්ඡන්නෙසු වසන්තොපි නෙව ලග්ගති, න සජ්ජති, න බජ්ඣති. තෙන වුත්තං: **අබ්භොකාසො පබ්බජ්ජාති**. අපි ච **සම්බාධො ඝරාවාසො** කුසලකිරියාය ඔකාසාභාවතො; **රජාපථො**, අසංවුතං සඞ්කාරධානං[4] විය

1. නිරපෙක්ඛො ධම්මං දෙසෙති-S.
2. නිද්දිසති-E.
3. පච්චාජාතො-B S.
4. සඞ්කාරට්ඨානං-S.

රජානං, කිලෙසරජානං සන්නිපාතට්ඨානතො; **අබ්භොකාසො පබ්බජ්ජා** කුසලකිරියාය යථාසුඛං ඔකාසසබ්භාවතො.[1]

නයිදං **සුකරං—පෙ—පබ්බජෙය්‍යන්ති** එත්ථ අයං සඞ්ඛෙපකථා: යදෙතං සික්ඛාත්තයං බ්‍රහ්මචරියං එකම්පි දිවසං අඛණ්ඩං කත්වා චරිමකචිත්තං පාපෙතබ්බතාය **එකන්තපරිපුණ්ණං**, එකදිවසම්පි ච සඞ්කිලෙසමලෙන[2] අමලිනං කත්වා චරිමකචිත්තං පාපෙතබ්බතාය **එකන්තපරිසුද්ධං, සඞ්ඛලිඛිතං**[3] ලිඛිතසඞ්ඛසදිසං ධොතසඞ්ඛසප්පටිභාගං චරිතබ්බං ඉදං **න සුකරං අගාරං අජ්ඣාවසතා** අගාරමජ්ඣෙ වසන්තෙන[4] **එකන්තපරිපුණ්ණං—පෙ—චරිතුං**; යන්නූනාහං කෙසෙ ච මස්සුඤ්ච[5] ඔහාරෙත්වා කාසාය[6]රසපීතතාය **කාසායානි**, බ්‍රහ්මචරියං චරන්තානං අනුච්ඡවිකානි **වත්ථානි, අච්ඡාදෙත්වා** පරිදහිත්වා, **අගාරස්මා** නික්ඛමිත්වා **අනගාරියං පබ්බජෙය්‍යං**. එත්ථ ච යස්මා අගාරස්ස හිතං කසිවණිජ්ජාදිකම්මං අගාරියන්ති වුච්චති, තඤ්ච පබ්බජ්ජාය නත්ථි, තස්මා පබ්බජ්ජා අනගාරියාති ඤාතබ්බාති[7] තං **අනගාරියං. පබ්බජෙය්‍යන්ති** පටිපජ්ජෙය්‍යං. **අප්පං වාති** සහස්සතො හෙට්ඨා භොගක්ඛන්ධො අප්පො නාම හොති; සහස්සතො පට්ඨාය මහා. ආබන්ධනට්ඨෙන ඤාති එව **ඤාතිපරිවට්ටො.** සො වීසතියා හෙට්ඨා අප්පො හොති; වීසතියා පට්ඨාය මහා.

**භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නොති** යා භික්ඛූනං අධිසීලසඞ්ඛාතා සික්ඛා, තඤ්ච; යත්ථ චෙතෙ සහ ජීවන්ති, එකජීවිකා සභාගවුත්තිනො හොන්ති, තං භගවතා පඤ්ඤත්තසික්ඛාපදසඞ්ඛාතං සාජීවඤ්ච; තත්ථ සික්ඛනභාවෙන සමාපන්නොති **භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො. සමාපන්නොති** සික්ඛං පරිපූරෙන්තො සාජීවඤ්ච අවීතික්කමන්තො හුත්වා තදුභයං උපගතොති අත්ථො.

**පාණාතිපාතං පහායාති** ආදිසු පාණාතිපාතාදිකථා හෙට්ඨා විත්ථාරිතා එව. **පහායාති** ඉමං පාණාතිපාතචෙතනාසඞ්ඛාතං දුස්සිල්‍යං පජහිත්වා. **පටිවිරතො හොතීති** පහීනකාලතො[8] පට්ඨාය තතො දුස්සිල්‍යතො ඔරතො විරතොව හොති. **නිහිතදණ්ඩො නිහිතසත්ථොති** පරූපඝාතත්ථාය දණ්ඩං වා සත්ථං වා ආදාය අවත්තනතො නික්ඛිත්තදණ්ඩො චෙව නික්ඛිත්තසත්ථො චාති අත්ථො. එත්ථ ච ඨපෙත්වා දණ්ඩං සබ්බම්පි අවසෙසං උපකරණං සත්තානං විහෙසනභාවතො[9] **සත්ථන්ති** වෙදිතබ්බං. යම්පන භික්ඛු කත්තරදණ්ඩං වා දන්තකට්ඨවාසිං වා පිප්ඵලකං වා ගහෙත්වා විචරති, න තං පරූපඝාතත්ථාය; තස්මා **නිහිතදණ්ඩො නිහිතසත්ථොත්වෙව** සඞ්ඛං ගච්ඡති. **ලජ්ජීති** පාපජිගුච්ඡනලක්ඛණාය ලජ්ජාය සමන්නාගතො. **දයාපන්නොති** දයං

1. ඔකාසසභාවතො-S. E. 2. කිලෙසමලෙන-B. S. 3. සඞ්ඛලිඛිතන්ති-S.
4. අගාරං අජ්ඣාවසන්තෙන-S. 5. කෙසමස්සුඤ්ච-S. 6. කසාය-E.
7. ඤාතබ්බා-B. S. 8. විප්පහීනකාලතො-L. 9. විහිංසනභාවතො-B. S.

මෙත්තචිත්තතං ආපන්නා. **සබ්බපාණභූතහිතානුකම්පීති** සබ්බෙ පාණභූතෙ හිතෙන අනුකම්පකො. තාය දයාපන්නතාය[1] සබ්බෙසං පාණභූතානං හිතචිත්තකොති[2] අත්ථො. **විහරතීති** ඉරියති, පාලෙති.

දින්නමෙව ආදියතීති **දින්නාදායී**. චිත්තෙනපි දින්නමෙව පටිකඞ්ඛතීති **දින්නපාටිකඞ්ඛී**. ථෙනෙතීති ථෙනො; න ථෙනෙන **අථෙනෙන**.[3] අථෙනත්තායෙව **සුචිභූතෙන**. **අත්තනාති** අත්තභාවෙන. අථෙනං සුචිභූතං අත්තභාවං කත්වා විහරතීති වුත්තං හොති.

**අබ්‍රහ්මචරියන්ති** අසෙට්ඨචරියං. බ්‍රහ්මං සෙට්ඨං ආචාරං චරතීති **බ්‍රහ්මචාරී**. **ආරාචාරීති** අබ්‍රහ්මචරියතො දූරචාරී.[4] **මෙථුනාති** රාගපරියුට්ඨානවසෙන සදිසත්තා මෙථුනකාති ලද්ධවොහාරෙහි පටිසෙවිතබ්බතො මෙථුනොති සඞ්ඛං ගතා අසද්ධම්මා. **ගාමධම්මාති** ගාමවාසීනං ධම්මා.

සච්චං වදතීති **සච්චවාදී**. සච්චෙන සච්චං සන්දහති ඝටෙතීති **සච්චසන්ධො**; න අන්තරන්තරා මුසා වදතීති අත්ථො. යො හි පුරිසො කදාචි මුසා වදති, කදාචි සච්චං, තස්ස මුසාවාදෙන අන්තරිතත්තා සච්චං සච්චෙන න ඝටීයති. තස්මා න සො සච්චසන්ධො. අයං පන න තාදිසො, ජීවිතහෙතුපි මුසා අවත්වා සච්චෙන සච්චං සන්දහතියෙවාති **සච්චසන්ධො**. **ථෙතොති** ථිරො; ථිරකථොති අත්ථො. එකො හි[5] පුග්ගලො හලිද්දිරාගො විය, ථුසරාසිම්හි නිඛාතඛාණු විය, අස්සපිට්ඨෙ ඨපිතකුම්භණ්ඩමිව ච න ඨිතකථො හොති. එකො පාසාණලෙඛා විය ඉන්දඛීලො විය ච ඨිතකථො හොති, අසිනා සීසෙ ඡිජ්ජන්තෙපි[6] ද්වෙ කථා න කථෙති. අයං වුච්චති **ථෙතො**. **පච්චයිකොති** පත්තියායිතබ්බකො; සද්ධායිකොති අත්ථො. එකච්චො හි පුග්ගලො න පච්චයිකො හොති, ඉදං කෙන වුත්තං, අසුකෙනාති වුත්තෙ, මා තස්ස වචනං සද්දහථාති වත්තබ්බතං ආපජ්ජති. එකො පච්චයිකො හොති, ඉදං කෙන වුත්තං, අසුකෙනාති වුත්තෙ, යදි තෙන වුත්තං, ඉදමෙව පමාණං, ඉදානි පරික්ඛිතබ්බං[7] නත්ථි, එවමෙව ඉදන්ති වත්තබ්බතං ආපජ්ජති; අයං වුච්චති **පච්චයිකො**. **අවිසංවාදකො ලොකස්සාති** තාය සච්චවාදිතාය ලොකං න විසංවාදෙතීති අත්ථො.

**ඉමෙසං භෙදායාති** යෙසං ඉතොති[8] වුත්තානං සන්තිකෙ සුතං තෙසං භෙදාය. **භින්නානං වා සන්ධාතාති** ද්වින්නං[9] මිත්තානං වා සමානුපජ්ඣායකාදීනං වා කෙනචිදෙව කාරණෙන භින්නානං එකමෙකං උපසඞ්කමිත්වා, තුම්හාකං ඊදිසෙ කුලෙ ජාතානං, එවං බහුස්සුතානං වා[10] ඉදං න යුත්තන්ති ආදීනි වත්වා සන්ධානං කත්තා. **අනුප්පදාතාති** සන්ධානානුප්පදාතා. ද්වෙ ජනෙ සමග්ගෙ දිස්වා[11] තුම්හාකං

1. දයාය සම්පන්නතාය-S. 2. හිතචිත්තකොති-A. M2, P2. B S.
3. න ථෙනෙන-L. 4. දූරචාරී-E 5 එකො-L. B. 6. ඡෙජ්ජන්තෙපි-L.
7. උපපරික්ඛිතබ්බං-S, E. පච්චෙක්ඛිතබ්බං-B. 8. ඉතො සුත්වාති-B, S
9. ද්වින්නංපි-B, S. 10. බහුස්සුතානං-L, B, S. 11. දිස්වාපි-S.

එවරූපෙ කුලෙ ජාතානං[1] එවරූපෙහි ගුණෙහි සමන්නාගතානං අනුච්ඡවිකමෙතන්ති ආදීනි වත්වා දළ්හකම්මං[2] කරොන්තීති අත්ථො. සමග්ගො[3] ආරාමො අස්සාති සමග්ගාරාමො; යත්ථ සමග්ගා නත්ථි, තත්ථ වසිතුම්පි න ඉච්ඡතීති අත්ථො. සමග්ගරාමොතිපි පාළි. අයමෙවත්ථො. සමග්ගරතොති සමග්ගෙසු රතො; තෙ පහාය අඤ්ඤත්‍ර ගන්තුම්පි න ඉච්ඡතීති අත්ථො. සමග්ගෙ දිස්වාපි සුත්වාපි නන්දතීති සමග්ගනන්දී, සමග්ගකරණිං වාචං භාසිතාති යා වාචා සත්තෙ සමග්ගෙයෙව කරොති, තං සාමග්ගිගුණපරිදීපකමෙව වාචං භාසති, න ඉතරන්ති.

නෙලාති එලං වුච්චති දොසො, නාස්සා එලන්ති නෙලා; නිද්දොසාති අත්ථො. "නෙලඞ්ගො සෙතපච්ඡාදො"ති එත්ථ වුත්තසීලං[4] විය. කණ්ණසුඛාති බ්‍යඤ්ජනමධුරතාය කණ්ණානං සුඛා; සූචිවිජ්ඣනං විය කණ්ණසූලං න ජනෙති. අත්ථමධුරතාය සකලසරීරෙ කොපං අජනෙත්වා පෙමං ජනෙතීති පෙමනීයා. හදයං ගච්ඡති, අප්පටිහඤ්ඤමානා සුඛෙන චිත්තං පවිසතීති හදයඞ්ගමා. ගුණපරිපුණ්ණතාය පුරෙ භවාති පොරී. පුරෙ සංවඩ්ඪනාරී විය සුකුමාරාතිපි පොරී. පුරස්ස එසාතිපි පොරී. පුරස්ස එසාති නගරවාසීනං කථාති අත්ථො. නගරවාසිනො හි යුත්තකථා හොන්ති, පිතිමත්තං පිතාති[5] භාතිමත්තං භාතාති වදන්ති. එවරූපී කථා බහුනො ජනස්ස කන්තා හොතීති බහුජනකන්තා. කන්තභාවෙනෙව බහුනො ජනස්ස මනාපා, චිත්තවුඩ්ඪිකරාති බහුජනමනාපා.

කාලෙ වදතීති කාලවාදී. වත්තබ්බයුත්තං කාලං සල්ලක්ඛෙත්වා වදතීති අත්ථො. භූතං තච්ඡං සභාවමෙව වදතීති භූතවාදී. දිට්ඨධම්මිකසම්පරායික-අත්ථසන්නිස්සිතමෙව කත්වා වදතීති අත්ථවාදී. නවලොකුත්තරධම්මසන්නිස්සිතං කත්වා වදතීති ධම්මවාදී. සංවරවිනය-පහානවිනය-සන්නිස්සිතං කත්වා වදතීති විනයවාදී. නිධානං වුච්චති ඨපනොකාසො; නිධානමස්සා අත්ථීති නිධානවතී. හදයෙ නිධෙතබ්බයුත්තං වාචං භාසිතාති අත්ථො. කාලෙනාති එවරූපිං භාසමානොපි ච අහං නිධානවතිං වාචං භාසාමීති[6] න අකාලෙන භාසති, යුත්තකාලං පන අවෙක්ඛිත්වා භාසතීති අත්ථො. සාපදෙසන්ති සඋපමං, සකාරණන්ති අත්ථො. පරියන්තවතින්ති පරිච්ඡෙදං දස්සෙත්වා, යථාස්සා පරිච්ඡෙදො[7] පඤ්ඤායති එවං භාසතීති අත්ථො. අත්ථසංහිතන්ති අනෙකෙහිපි නයෙහි විභජන්තෙන පරියාදාතුං අසක්කුණෙය්‍යතාය අත්ථසම්පන්නං. යං වා සො අත්ථවාදී අත්ථං වදති, තෙන අත්ථෙන සංහිතත්තා අත්ථසංහිතං වාචං භාසති. න අඤ්ඤං නික්ඛිපිත්වා අඤ්ඤං භාසතීති වුත්තං හොති.

---

1. පච්චාජාතානං-A. T2. 2 දළ්හී කම්මං-S, E. 3. සම්මෙග-T1, B.
4. වුත්තනෙලං-B, S. 5. පිතාති භාතිමත්තං භාතාති-B, S.
6. භාසිස්සාමීති-B, S. 7. යථා සපරිච්ඡෙදා-S, යථාස්ස පරිච්ඡෙදා-E.

**බීජගාමභූතගාමසමාරම්භා**[1]ති මූලබීජං, ඛන්ධබීජං, ඵළුබීජං, අග්ගබීජං, බීජබීජන්ති පඤ්චවිධස්ස බීජගාමස්ස චෙව යස්ස කස්සචි නීලතිණ-රුක්ඛාදිකස්ස භූතගාමස්ස ච **සමාරම්භා**[1]; ඡෙදනපචනාදිභාවෙන විකොපනා පටිවිරතොති අත්ථො.

**එකභත්තිකො**ති, පාතරාසභත්තං සායමාසභත්තන්ති ද්වෙ භත්තානි. තෙසු පාතරාසභත්තං අන්තොමජ්ඣන්හිකෙන පරිච්ඡින්නං, ඉතරං මජ්ඣන්හිකතො උද්ධං අන්තො-අරුණෙන. තස්මා අන්තොමජ්ඣන්හිකෙ දසක්ඛත්තුං භුඤ්ජමානොපි එකභත්තිකො හොති. තං සන්ධාය වුත්තං: **එකභත්තිකො**ති. රත්තිභොජනං රත්ති; තතො උපරතොති **රත්තූපරතො**. අතික්කන්තෙ මජ්ඣන්හිකෙ යාව සූරියත්ථඞ්ගමනා භොජනං විකාලභොජනං නාම; තතො විරතත්තා **විරතො විකාලභොජනා**.

සාසනස්ස අනනුලොමත්තා විසූකං පටාණිභූතං දස්සනන්ති විසූකදස්සනං; අත්තනා නච්චන-නච්චාපනාදිවසෙන නච්චා ච ගීතා ච වාදිතා ච, අන්තමසො මයූරනච්චනාදිවසෙනාපි පවත්තානං නච්චාදීනං විසූකභූතා දස්සනා චාති **නච්ච-ගීත-වාදිත-විසූකදස්සනා**. නච්චාදීනි හි අත්තනා පයොජෙතුං වා පරෙහි පයොජාපෙතුං වා, පයුත්තානි[2] පස්සිතුං වා නෙව භික්ඛූනං න භික්ඛුනීනං වට්ටන්ති.

මාලාදීසු **මාලා**ති යං කිඤ්චි පුප්ඵං. **ගන්ධ**න්ති යං කිඤ්චි ගන්ධජාතං. **විලෙපන**න්ති ඡවිරාගකරණං. තත්ථ පිළන්ධන්තො ධාරෙති නාම; ඌනට්ඨානං පූරෙන්තො මණ්ඩෙති නාම; ගන්ධවසෙන ඡවිරාගවසෙන ච සාදියන්තො විභූසෙති නාම; ඨානං වුච්චති කාරණං, තස්මා; යාය දුස්සීල්‍යචෙතනාය තානි මාලාධාරණාදීනි මහාජනො කරොති, තතො පටිවිරතොති අත්ථො.

**උච්චාසයනං** වුච්චති පමාණාතික්කන්තං. **මහාසයනං** අකප්පියත්ථතං.[3] තතො පටිවිරතොති අත්ථො. **ජාතරූප**න්ති සුවණ්ණං; **රජත**න්ති කහාපණො, ලොහමාසකො, ජතුමාසකො, දාරුමාසකොති යෙ වොහාරං ගච්ඡන්ති. තස්ස උභයස්සාපි පටිග්ගහණා පටිවිරතො. නෙව නං උග්ගණ්හාති, න උග්ගණ්හාපෙති, න[4] උපනික්ඛිත්තං සාදියතීති අත්ථො.

**ආමකධඤ්ඤපටිග්ගහණා**ති සාලි-වීහි-යව-ගොධූම-කඞ්ගු-වරක-කුද්‍රූසකසඞ්ඛාතස්ස සත්තවිධස්සාපි ආමකධඤ්ඤස්ස පටිග්ගහණා. න කෙවලඤ්ච එතෙසං පටිග්ගහණමෙව ආමසනම්පි භික්ඛූනං න වට්ටති යෙව. **ආමකමංසපටිග්ගහණා**ති එත්ථ අඤ්ඤත්‍ර ඔදිස්ස අනුඤ්ඤාතා, ආමකමංසමච්ඡානං පටිග්ගහණමෙව භික්ඛූනං න වට්ටති, නො ආමසනං.

1. සාරම්භා-S. 2. පරෙහි පයුත්තානි-S.
3. මහාසයනං නාම අකප්පියත්ථරණං-S. 4. න පරෙහි-S.

**ඉත්ථිකුමාරිකපටිග්ගහණාති** එත්ථ **ඉත්ථීති** පුරිසන්තරගතා; ඉතරා **කුමාරිකා** නාම. තාසං පටිග්ගහණම්පි ආමසනම්පි අකප්පියමෙව. **දාසිදාසපටිග්ගහණාති** එත්ථ දාසිදාසවසෙනෙව තෙසං පටිග්ගහණං න වට්ටති; කප්පියකාරකං දම්මි, ආරාමිකං දම්මීති එවං වුත්තෙ පන වට්ටති. අජෙළකාදීසුපි ඛෙත්තවත්ථුපරියොසානෙසු කප්පියාකප්පියභාවො විනයවසෙන උපපරික්ඛිතබ්බො. තත්ථ **ඛෙත්තං** නාම යස්මිං පුබ්බණ්ණං රුහති. **වත්ථු** නාම යස්මිං අපරණ්ණං රුහති. යත්ථ වා උභයම්පි[1] රුහති, තං **ඛෙත්තං**. තදත්ථාය අකතභූමිභාගො **වත්ථු**. ඛෙත්තවත්ථුසීසෙන චෙත්ථ[2] වාපිතළාකාදීනි සඞ්ගහිතානෙව.

**දූතෙය්‍යං** වුච්චති දූතකම්මං, ගිහීනං පණ්ණං වා සාසනං වා ගහෙත්වා තත්ථ තත්ථ ගමනං. **පහිණගමනං** වුච්චති ඝරා ඝරං පෙසිතස්ස ඛුද්දකගමනං. **අනුයොගො** නාම තදුභයකරණං. තස්මා දූතෙය්‍ය-පහිණගමනානං අනුයොගොති එවමෙත්ථ අත්ථො වෙදිතබ්බො[3]. **කයවික්කයාති** කයා ච වික්කයා ච.

තුලාකූටාදීසු **කූටන්ති** වඤ්චනං. තත්ථ **තුලාකූටං** තාව රූපකූටං, අඞ්ගකූටං, ගහණකූටං, පටිච්ඡන්නකූටන්ති චතුබ්බිධං හොති. තත්ථ රූපකූටං නාම ද්වෙ තුලා සරූපා[4] කත්වා ගණ්හන්තො මහතියා ගණ්හාති, දදන්තො ඛුද්දිකාය දෙති. අඞ්ගකූටං නාම ගණ්හන්තො පච්ඡාභාගෙ හත්ථෙන තුලං අක්කමති, දදන්තො පුබ්බභාගෙ. ගහණකූටං නාම ගණ්හන්තො මූලෙ රජ්ජුං ගණ්හාති, දදන්තො අග්ගෙ. පටිච්ඡන්නකූටං නාම තුලං සුසිරං කත්වා අන්තො අයචුණ්ණං පක්ඛිපිත්වා ගණ්හන්තො තං පච්ඡාභාගෙ කරොති, දදන්තො අග්ගභාගෙ.

**කංසො** වුච්චති සුවණ්ණපාති. තාය වඤ්චනං **කංසකූටං**. කථං? එකං සුවණ්ණපාතිං කත්වා අඤ්ඤා ද්වෙ තිස්සො ලොහපාතියො සුවණ්ණවණ්ණා කරොන්ති. තතො ජනපදං ගන්ත්වා කිඤ්චිදෙව අඩ්ඪකුලං පවිසිත්වා සුවණ්ණභාජනානි කිණථාති වත්වා අග්ඝෙ පුච්ඡිතෙ සමග්ඝතරං[5] දාතුකාමා හොන්ති. තතො තෙහි කථං ඉමෙසං සුවණ්ණභාවො ජානිතබ්බොති වුත්තෙ, වීමංසිත්වා ගණ්හථාති සුවණ්ණපාතිං පාසාණෙ ඝංසිත්වා සබ්බා පාතියො දත්වා ගච්ඡන්ති.

**මානකූටං** හදයභෙද-සිඛාභෙද-රජ්ජුභෙදවසෙන තිවිධං හොති. තත්ථ හදයභෙදො සප්පිතෙලාදිමිනනකාලෙ ලබ්භති. තානි හි ගණ්හන්තො හෙට්ඨාඡිද්දෙන මානෙන, සණිකං ආසිඤ්චාති වත්වා අන්තොභාජනෙ බහුං පග්ඝරාපෙත්වා ගණ්හාති. දදන්තො ඡිද්දං පිධාය සීඝං පූරෙත්වා දෙති. සිඛාභෙදො තිලතණ්ඩුලාදිමිනනකාලෙ ලබ්භති. තානි හි ගණ්හන්තො සණිකං සිඛං උස්සාපෙත්වා ගණ්හාති. දෙන්තො

1. තදුභයං-P1. T1. උභයං-A, M2, P2. 2. සීසෙන-L.
3. දට්ඨබ්බො-S. 4. සමරූපා-S. 5. මහග්ඝතරං-P1, T1.

වෙගෙන පූරෙත්වා සිඛං ඡින්දන්තො[1] දෙති. රජ්ජුභෙදෙ, ඛෙත්තවත්ථු මිනනකාලෙ ලබ්භති. ලඤ්ජං අලභන්තා හි, ඛෙත්තං අමහන්තම්පි මහන්තං කත්වා මිනන්ති.

උක්කොටනාදිසු **උක්කොටන**න්ති සාමිකෙ අස්සාමිකෙ කාතුං ලඤ්ජග්ගහණං. **වඤ්චන**න්ති තෙහි තෙහි උපායෙහි පරෙසං වඤ්චනං. තත්‍රිදමෙකං වත්ථු: එකො කිර ලුද්දකො මිගඤ්ච මිගපොතකඤ්ච ගහෙත්වා ආගච්ඡති. තමෙකො ධුත්තො, කිං භො මිගො අග්ඝති, කිං මිගපොතකොති ආහ. මිගො ද්වෙ කහාපණෙ, මිගපොතකො එකන්ති ච වුත්තෙ, කහාපණං දත්වා මිගපොතකං ගහෙත්වා ථොකං ගන්ත්වා නිවත්තො, න මෙ භො මිගපොතකෙන අත්ථො, මිගං මෙ දෙහීති ආහ. ‘තෙන හි ද්වෙ කහාපණෙ දෙහී’ති. සො ආහ : නනු භො මයා පඨමං එකො කහාපණො දින්නොති. ‘ආම දින්නො’ති. ‘ඉමම්පි මිගපොතකං ගණ්හ, එවං සො ච කහාපණො, අයඤ්ච කහාපණග්ඝනකො මිගපොතකොති ද්වෙ කහාපණා භවිස්සන්තී’ති. සො, කාරණං වදතීති සල්ලක්ඛෙත්වා[2] මිගපොතකං ගහෙත්වා මිගං අදාසීති.[3]

**නිකතී**ති යොගවසෙන වා මායාවසෙන වා අපාමඞ්ගං පාමඞ්ගන්ති අමණිං මණින්ති අසුවණ්ණං සුවණ්ණන්ති කත්වා පතිරූපකෙන වඤ්චනං. **සාචියොගො**ති[4] කුටිලයොගො. එතෙසං යෙව උක්කොට-නාදීනමෙතං නාමං. තස්මා උක්කොටනසාචියොගො, වඤ්චනසාචියොගො, නිකතිසාචියොගොති එවමෙත්ථ අත්ථො දට්ඨබ්බො. කෙචි, අඤ්ඤං දස්සෙත්වා අඤ්ඤස්ස පරිවත්තනං **සාචියොගො**ති වදන්ති. තං පන වඤ්චනෙනෙව සඞ්ගහිතං.

ඡෙදනාදිසු **ඡෙදන**න්ති හත්ථච්ඡෙදනාදි. **වධො**ති මාරණං.[5] **බන්ධො**ති රජ්ජුබන්ධනාදීහි බන්ධනං. **විපරාමොසො**ති හිමවිපරා-මොසො, ගුම්බවිපරාමොසොති දුවිධො. යං[6] හිමපාතසමයෙ හිමෙන පටිච්ඡන්නා හුත්වා මග්ගපටිපන්නං ජනං මුසන්ති, අයං හිමවිපරාමොසො. යං ගුම්බාදීහි පටිච්ඡන්නා මුසන්ති, අයං ගුම්බවිපරාමොසො. **ආලොපො**ති ගාමනිගමාදීනං විලොපකාරණං. **සහසාකාරො**ති සාහස-කිරියා[7]. ගෙහං පවිසිත්වා මනුස්සානං උරෙ සත්ථං ඨපෙත්වා ඉච්ඡිතභණ්ඩග්ගහණං. එවමෙතස්මා **ඡෙදන-පෙ-සහසාකාරා පටිවිරතො හොති**.

**සො සන්තුට්ඨො හොතී**ති ස්වායං භික්ඛු හෙට්ඨාවුත්තෙන චතූසු පච්චයෙසු ද්වාදසවිධෙන ඉතරීතරපච්චයසන්තොසෙන සමන්නාගතො හොති. ඉමිනා පන ද්වාදසවිධෙන ඉතරීතරපච්චයසන්තොසෙන සමන්නාගතස්ස භික්ඛුනො අට්ඨපරික්ඛාරා වට්ටන්ති : තීණි චීවරානි, පත්තො, දන්තකට්ඨච්ඡෙදනවාසි, එකා සූචි, කායබන්ධනං, පරිස්සා-වනන්ති. . වුත්තම්පි චෙතං :-

---

1. ඡිඳන්තො-B, S. 2. අසල්ලක්ඛෙත්වා-I 3. අදාසි-L,
4. සාචියොගොහි-B, S, 5. මරණං-S. E, 6. තත්ථ යං-S,
7. සාහසිකකිරියා-B. S.

"තිචීවරඤ්ච පත්තො ච වාසි සූචි ච බන්ධනං
පරිස්සාවනෙන අට්ඨෙතෙ යුත්තයොගස්ස භික්ඛුනො"ති.

තෙ සබ්බෙ කායපරිහාරියාපි හොන්ති, කුච්ඡිපරිහාරියාපි. කථං? තිචීවරං තාව නිවාසෙත්වා පාරුපිත්වා ච විචරණකාලෙ කායං පරිහරති, පොසෙතීති කායපරිහාරියං හොති; චීවරකණ්ණෙන උදකං පරිස්සාවෙත්වා පිවනකාලෙ, ඛාදිතබ්බඵලාඵලගහණකාලෙ ච කුච්ඡිං පරිහරති, පොසෙතීති කුච්ඡිපරිහාරියං හොති. පත්තොපි තෙන උදකං උද්ධරිත්වා නහානකාලෙ, කුටිපරිභණ්ඩකරණකාලෙ ච කායපරිහාරියො හොති; ආහාරං ගහෙත්වා වලඤ්ජනකාලෙ[1] කුච්ඡිපරිහාරියො. වාසිපි තාය දන්තකට්ඨච්ඡෙදනකාලෙ, මඤ්චපීඨානං අටනි[2]පාද- චීවර- කුටිදණ්ඩක- සජ්ජනකාලෙ ච[3] කායපරිහාරියා හොති; උච්ඡුච්ඡෙදන-නාළිකෙරාදිතච්ඡනකාලෙ කුච්ඡිපරිහාරියා. සූචි චීවරසිබ්බනකාලෙ කායපරිහාරියා හොති; පූවං වා ඵලං වා විජ්ඣිත්වා ඛාදනකාලෙ කුච්ඡිපරිහාරියා. කායබන්ධනං බන්ධිත්වා විචරණකාලෙ කායපරිහාරියං; උච්ඡු-ආදීනි බන්ධිත්වා ගහණකාලෙ කුච්ඡිපරිහාරියං. පරිස්සාවනං තෙන උදකං පරිස්සාවෙත්වා නහානකාලෙ, සෙනාසනපරිභණ්ඩකරණකාලෙ ච කායපරිහාරියං; පානීයපානක පරිස්සාවනකාලෙ, තෙනෙව තිලතණ්ඩුලපුථුකාදීනි ගහෙත්වා ඛාදනකාලෙ ච කුච්ඡිපරිහාරියං. අයං තාව අට්ඨපරික්ඛාරිකස්ස පරික්ඛාරමත්තා.

නවපරික්ඛාරිකස්ස පන සෙය්‍යං පවිසන්තස්ස තත්‍රට්ඨකපච්චත්ථරණං වා කුණ්ඩිකා[4] වා වට්ටති. දසපරික්ඛාරිකස්ස නිසීදනචම්මඛණ්ඩං වට්ටති. එකාදසපරික්ඛාරිකස්ස කත්තරයට්ඨි වා තෙලනාළි වා වට්ටති. ද්වාදසපරික්ඛාරිකස්ස ඡත්තං වා උපාහනා වා වට්ටති. එතෙසු ච[5] අට්ඨපරික්ඛාරිකොව සන්තුට්ඨො, ඉතරෙ අසන්තුට්ඨා, මහිච්ඡා මහා-එජාති[6] න වත්තබ්බා. එතෙපි අප්පිච්ඡාව, සන්තුට්ඨාව, සුභරාව, සල්ලහුකවුත්තිනොව. භගවා පන නයිමං සුත්තං තෙසං වසෙන කථෙසි; අට්ඨපරික්ඛාරිකස්ස වසෙන කථෙසි. සො හි ඛුද්දකවාසිඤ්ච සූචිඤ්ච පරිස්සාවනෙ පක්ඛිපිත්වා පත්තස්ස අන්තො ඨපෙත්වා පත්තං අංසකූටෙ ලග්ගෙත්වා තිචීවරං කායබද්ධං[7] කත්වා යෙනිච්ඡකං සුඛං පක්කමති. පටිනිවත්තිත්වා ගහෙතබ්බං නාමස්ස න හොති.

ඉති ඉමස්ස භික්ඛුනො සල්ලහුකවුත්තිතං දස්සෙන්තො භගවා, **සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙනාති** ආදිමාහ. තත්ථ **කායපරිහාරිකෙනාති** කායපරිහරණමත්තකෙන. **කුච්ඡිපරිහාරිකෙනාති** කුච්ඡිපරිහරණමත්තකෙන. **සමාදායෙව පක්කමතීති** තං

---

1. භුඤ්ජනකාලෙ-D1, S.
2. අටට-L, අඞ්ග-B, S.
3. ඡෙදනකාලෙ ච-B, S.
4. කුඤ්චිකා-B, S.
5. එතෙසු පන-S.
6. මහාරගාහි-S, මහාභාරති-B
7. කායබන්ධනං-L, කායපටිබන්ධං-S, E.

අට්ඨපරික්ඛාරමත්තකං සබ්බං ගහෙත්වා[1] කායපටිබද්ධං කත්වාව ගච්ඡති; මම විහාරො, පරිවෙණං[2], උපට්ඨාකොති'ස්ස සඞ්ගො වා බන්ධො වා න හොති. සො ජියාමුත්තො සරො විය, යූථා අපක්කන්තො[3] මත්තහත්ථී විය ඉච්ඡිතිච්ඡිතං සෙනාසනං, වනසණ්ඩං, රුක්ඛමූලං, නවං පබ්භාරං[4] පරිභුඤ්ජන්තො එකො තිට්ඨති, එකො නිසීදති, සබ්බිරියාපථෙසු එකො අදුතියො.

"චාතුද්දිසො අප්පටිඝො ච හොති
සන්තුස්සමානො ඉතරීතරෙන
පරිස්සයානං සහිතා අඡම්භී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති

එවං වණ්ණිතං ඛග්ගවිසාණකප්පතං ආපජ්ජති. ඉදානි තමත්ථං උපමාය සාධෙන්තො, **සෙය්‍යථාපීති** ආදිමාහ. තත්ථ **පක්ඛී සකුණොති** පක්ඛයුත්තො සකුණො. **ඩෙතීති** උප්පතති. අයං පනෙත්ථ සඞ්ඛෙපත්ථො: සකුණා නාම අසුකස්මිං පදෙසෙ රුක්ඛො පරිපක්කඵලොති ඤත්වා නානාදිසාහි ආගන්ත්වා නඛපක්ඛතුණ්ඩාදීහි තස්ස ඵලානි විජ්ඣන්තා විධුනන්තා ඛාදන්ති. ඉදං අජ්ජතනාය, ඉදං ස්වාතනාය භවිස්සතීති නෙසං න හොති. ඵලෙ පන ඛීණෙ[5] නෙව රුක්ඛස්ස ආරක්ඛං ඨපෙන්ති, න තත්ථ පක්ඛං වා පත්තං වා නඛං වා තුණ්ඩං වා ඨපෙන්ති; අථ ඛො තස්මිං රුක්ඛෙ අනපෙක්ඛා[6] හුත්වා යො යං දිසාභාගං ඉච්ඡති, සො තෙන සපත්තභාරොව උප්පතිත්වා ගච්ඡති. එවමෙව අයං භික්ඛු නිස්සඞ්ගො නිරපෙක්ඛොයෙව පක්කමති, සමාදායෙව පක්කමතීති.

**අරියෙනාති** නිද්දොසෙන. **අජ්ඣත්තන්ති** සකෙ අත්තභාවෙ. **අනවජ්ජසුඛන්ති** නිද්දොසසුඛං. **සො චක්ඛුනා රූපං දිස්වාති** සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො භික්ඛු චක්ඛුවිඤ්ඤාණෙන රූපං පස්සිත්වාති අත්ථො. සෙසපදෙසු යං වත්තබ්බං සියා, තං සබ්බං විසුද්ධිමග්ගෙ වුත්තං. **අබ්‍යාසෙකසුඛන්ති** කිලෙසෙහි අනවසිත්තසුඛං; අවිකිණ්ණසුඛන්තිපි වුත්තං. ඉන්ද්‍රියසංවරසුඛං හි දිට්ඨාදිසු දිට්ඨමත්තාදිවසෙන පවත්තතාය අවිකිණ්ණං හොති. **සො අභික්කන්තෙ පටික්කන්තෙති** සො මනච්ඡට්ඨානං ඉන්ද්‍රියානං සංවරෙන සමන්නාගතො භික්ඛු ඉමෙසු අභික්කන්ත-පටික්කන්තාදිසු සත්තසු ඨානෙසු සතිසම්පජඤ්ඤවසෙන[7] **සම්පජානකාරී හොති**. තත්ථ යං වත්තබ්බං සියා, තං සතිපට්ඨානෙ වුත්තමෙව.

**සො ඉමිනා චාති** ආදිනා කිං දස්සෙති? අරඤ්ඤවාසස්ස පච්චයසම්පත්තිං දස්සෙති. යස්ස හි ඉමෙ චත්තාරො පච්චයා නත්ථි, තස්ස අරඤ්ඤවාසො න ඉජ්ඣති; තිරච්ඡානගතෙහි වා වනචරකෙහි වා සද්ධිං

1. ගහෙත්වාව-S.
2. මම පරිවෙණං-A, M2, P.
3. යූථාපක්කන්තො-A, M2 P2.
4. වනපත්ථං-B, වනපබ්භාරං-S.
5. පරික්ඛීණෙ-B, S.
6. අනපෙක්ඛො-A, M2, P2, B, S.
7. චතුසම්පජඤ්ඤවසෙන-T.

වත්තබ්බතං ආපජ්ජති. අරඤ්ඤෙ අධිවත්ථා දෙවතා, කිං එවරූපස්ස පාපභික්ඛුනො අරඤ්ඤවාසෙනාති භෙරවසද්දං සාවෙන්ති; හත්ථෙහි සීසං පහරිත්වා පලායනාකාරං කරොන්ති. අසුකො භික්ඛු අරඤ්ඤං පවිසිත්වා ඉදඤ්චිදඤ්ච පාපකම්මං අකාසීති අයසො පත්ථරති. යස්ස පනෙතෙ චත්තාරො පච්චයා අත්ථි, තස්ස අරඤ්ඤවාසො ඉජ්ඣති. සො හි අත්තනො සීලං පච්චවෙක්ඛන්තො කිඤ්චි කාළකං වා තිලකං වා අපස්සන්තො පීතිං උප්පාදෙත්වා තං ඛයතො වයතො සම්මසන්තො අරියභූමිං ඔක්කමති. අරඤ්ඤෙ අධිවත්ථා දෙවතා අත්තමනා වණ්ණං භාසන්ති. ඉති තස්ස[1] උදකෙ පක්ඛිත්තතෙලබින්දු විය යසො විත්ථාරිකො හොති.

තත්ථ **විවිත්ත**න්ති සුඤ්ඤං; අප්පසද්දං අප්පනිග්ඝොසන්ති අත්ථො. එතදෙව හි සන්ධාය විභඞ්ගෙ, "විවිත්තන්ති සන්තිකෙ චෙපි සෙනාසනං හොති, තඤ්ච අනාකිණ්ණං ගහට්ඨෙහි, පබ්බජිතෙහි, තෙන තං විවිත්ත"න්ති වුත්තං. සෙති චෙව ආසති ච එත්ථාති සෙනාසනං; මඤ්චපීඨාදීනමෙතං අධිවචනං. තෙනාහ: "සෙනාසනන්ති මඤ්චොපි සෙනාසනං පීඨම්පි භිසිපි බිම්බොහනම්පි විහාරොපි අඩ්ඪයොගොපි පාසාදොපි හම්මියම්පි ගුහාපි අට්ටොපි මාළොපි ලෙණම්පි වෙළුගුම්බොපි රුක්ඛමූලම්පි මණ්ඩපොපි සෙනාසනං; යත්ථ වා පන භික්ඛූ පටික්කමන්ති, සබ්බමෙතං සෙනාසන"න්ති. අපි ච විහාරො, අඩ්ඪයොගො, පාසාදො, හම්මියං, ගුහාති ඉදං විහාරසෙනාසනං නාම. මඤ්චො, පීඨං, භිසි, බිම්බොහනන්ති ඉදං මඤ්චපීඨසෙනාසනං නාම. චිලිමිකා, චම්මඛණ්ඩො, තිණසන්ථාරො, පණ්ණසන්ථාරොති ඉදං සන්ථතසෙනාසනං නාම. යත්ථ වා පන භික්ඛූ පටික්කමන්තීති ඉදං ඔකාසසෙනාසනං නාමාති එවං චතුබ්බිධං සෙනාසනං හොති. තං සබ්බම්පි සෙනාසනග්ගහණෙන ගහිතමෙව.

ඉමස්ස පන සකුණසදිසස්ස චාතුද්දිසස්ස භික්ඛුනො[2] අනුච්ඡවිකං දස්සෙන්තො, **අරඤ්ඤං රුක්ඛමූල**න්ති ආදිමාහ. තත්ථ, "අරඤ්ඤන්ති නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤ"න්ති ඉදං භික්ඛුනීනං වසෙන ආගතං අරඤ්ඤං. "ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිම"න්ති ඉදං පන ඉමස්ස භික්ඛුනො අනුරූපං. තස්ස ලක්ඛණං විසුද්ධිමග්ගෙ ධුතඞ්ගනිද්දෙසෙ වුත්තං.

**රුක්ඛමූල**න්ති යං කිඤ්චි සන්දච්ඡායං[3] විවිත්තං රක්ඛමූලං. **පබ්බත**න්ති සෙලං. තත්ථ හි උදකසොණ්ඩීසු උදකකිච්චං කත්වා සීතාය රුක්ඛච්ඡායාය නිසින්නස්ස නානාදිසාසු ඛායමානාසු සීතෙන වාතෙන වීජියමානස්ස චිත්තං එකග්ගං හොති. **කන්දර**න්ති කං වුච්චති උදකං, තෙන දරිතං; උදකෙන භින්නං පබ්බතපදෙසං; යං නිතම්බන්තිපි නදීකුඤ්ජන්තිපි වදන්ති. තත්ථ හි රජතපට්ටසදිසා වාලිකා හොන්ති,

1, භාසන්ති තස්ස-L, ඉතිස්ස-B, S. 2, සකුණසදිසස්ස භික්ඛුනො-L, 3, සන්තච්ඡායං-B, S

මජ්ඣෙ මණිවිතානං විය වනගහනං, මණික්ඛන්ධසදිසං උදකං සන්දති. එවරූපං කන්දරං ඔරුය්හ පානීයං පිවිත්වා ගත්තානි සීතිකත්වා වාලිකං උස්සාපෙත්වා පංසුකූලචීවරං පඤ්ඤපෙත්වා නිසින්නස්ස සමණධම්මං කරොතො චිත්තං එකග්ගං හොති. **ගිරිගුහ**න්ති ද්වින්නං පබ්බතානං අන්තරං, එකස්මිංයෙව වා උම්මඞ්ගසදිසං මහාවිවරං. සුසානලක්ඛණං විසුද්ධිමග්ගෙ වුත්තං. **වනපත්ථ**න්ති අතික්කමිත්වා මනුස්සානං උපචාරට්ඨානං, යත්ථ න කසන්ති, න වපන්ති. තෙනෙවාහ: "වනපත්ථන්ති දූරානමෙතං සෙනාසනානං අධිවචන"න්ති ආදිං. **අබ්භොකාස**න්ති අච්ඡන්නං. ආකඞ්ඛමානො පනෙත්ථ චීවරකුටිං කත්වා වසති. **පලාලපුඤ්ජ**න්ති පලාලරාසිං. මහාපලාලපුඤ්ජතො හි පලාලං නික්කඩ්ඪිත්වා පබ්භාරලෙණසදිසෙ ආලයෙ කරොන්ති. ගච්ඡගුම්බාදීනම්පි උපරි පලාලං පක්ඛිපිත්වා හෙට්ඨා නිසින්නා සමණධම්මං කරොන්ති. තං සන්ධායෙතං වුත්තං.

**පච්ඡාභත්ත**න්ති භත්තස්ස පච්ඡතො. **පිණ්ඩපාතපටික්කන්තො**ති පිණ්ඩපාතපරියෙසනතො පටික්කන්තො. **පල්ලඞ්ක**න්ති සමන්තතො ඌරුබද්ධාසනං. **ආභුජිත්වා**ති බන්ධිත්වා. **උජුං කායං පණිධායා**ති උපරිමං සරීරං උජුකං ඨපෙත්වා; අට්ඨාරසපිට්ඨිකණ්ටකෙ කොටියා කොටිං පටිපාදෙත්වා. එවං හි නිසින්නස්ස චම්මමංසන්හාරූනි න පණමන්ති. අථස්ස යා තෙසං පණමනපච්චයා ඛණෙ ඛණෙ වෙදනා උප්පජ්ජෙය්‍යුං තා න උප්පජ්ජන්ති; තාසු අනුප්පජ්ජමානාසු[1] චිත්තං එකග්ගං හොති, කම්මට්ඨානං න පරිපතති,[2] වුඩ්ඪිං ඵාතිං උපගච්ඡති.

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වා**ති කම්මට්ඨානාභිමුඛං සතිං ඨපයිත්වා. මුඛසමීපෙ වා කත්වාති අත්ථො. තෙනෙව විභඞ්ගෙ වුත්තං: "අයං සති උපට්ඨිතා හොති, සූපට්ඨිතා, නාසිකග්ගෙ වා මුඛනිමිත්තෙ වා, තෙන වුච්චති පරිමුඛං සතිං උපට්ඨපෙත්වා"ති. අථවා, "පරීති පරිග්ගහට්ඨො; මුඛන්ති නිය්‍යානට්ඨො; සතීති උපට්ඨානට්ඨො; තෙන වුච්චති පරිමුඛං සති"න්ති එවං පටිසම්භිදාය වුත්තනයෙනපෙත්ථ අත්ථො දට්ඨබ්බො. තත්‍රායං සඞ්ඛෙපො: පරිග්ගහිතනිය්‍යානං සතිං කත්වාති.

**අභිජ්ඣං ලොකෙ**ති එත්ථ ලුජ්ජනට්ඨෙන[3] පඤ්චුපාදානක්ඛන්ධා ලොකො. තස්මා පඤ්චසු උපාදානක්ඛන්ධෙසු[4] රාගං පහාය, කාමච්ඡන්දං වික්ඛම්භෙත්වාති අයමෙත්ථ අත්ථො. **විගතාභිජ්ඣෙනා**ති වික්ඛම්භනවසෙන පහීනත්තා විගතාභිජ්ඣෙන. න චක්ඛුවිඤ්ඤාණසදිසෙනාති අත්ථො. **අභිජ්ඣාය චිත්තං පරිසොධෙතී**ති අභිජ්ඣාතො චිත්තං පරිමොචෙති. යථා තං සා මුඤ්චති චෙව, මුඤ්චිත්වා ච න පුන ගණ්හාති, එවං කරොතීති අත්ථො. **බ්‍යාපාදපදොසං පහායා**ති ආදීසුපි එසෙව නයො.

---

1. න උප්පජ්ජමානාසු-L.
2. පරිපතති-S, E.
3. ලුජ්ජනපලුජ්ජනට්ඨෙන-B, S.
4. පඤ්චුපාදානක්ඛන්ධෙසු-I.

බ්‍යාපජ්ජති ඉමිනා චිත්තං පූතිකුම්මාසාදයො'ව පුරිමපකතිං ජහතීති **බ්‍යාපාදො**. විකාරපත්තියා පදුස්සති, පරං වා පදූසෙති විනාසෙතීති **පදොසො**. උභයමෙතං කොධස්සෙවාධිවචනං. ථිනං චිත්තගෙලඤ්ඤං; මිද්ධං චෙතසිකගෙලඤ්ඤං. ථිනඤ්ච මිද්ධඤ්ච **ථිනමිද්ධං**. **ආලොකසඤ්ඤීති** රත්තිම්පි දිවාදිට්ඨ-ආලොකසඤ්ජානනසමත්ථාය විගතනීවරණාය පරිසුද්ධාය සඤ්ඤාය සමන්නාගතො. **සතො සම්පජානොති** සතියා ච ඤාණෙන ච සමන්නාගතො. ඉදං උභයං ආලොකසඤ්ඤාය උපකාරකත්තා වුත්තං. උද්ධච්චඤ්ච කුක්කුච්චඤ්ච **උද්ධච්චකුක්කුච්චං**. **තිණ්ණවිචිකිච්ඡොති** විචිකිච්ඡං තරිත්වා අතික්කමිත්වා ඨිතො. කථමිදං, කථමිදන්ති එවං නප්පවත්තතීති **අකථංකථී**. **කුසලෙසු ධම්මෙසූති** අනවජ්ජෙසු ධම්මෙසු. ඉමෙ නු ඛො කුසලා, කථමිමෙ කුසලාති එවං න විචිකිච්ඡති, න කඞ්ඛතීති අත්ථො. අයමෙත්ථ සඞ්ඛෙපො. ඉමෙසු පන නීවරණෙසු වචනත්ථලක්ඛණාදිභෙදතො යං වත්තබ්බං සියා, තං සබ්බං විසුද්ධිමග්ගෙ වුත්තං.

**පඤ්ඤාය දුබ්බලීකරණෙති** ඉමෙ පඤ්ච නීවරණා උප්පජ්ජමානා අනුප්පන්නාය ලොකිය-ලොකුත්තරාය පඤ්ඤාය උප්පජ්ජිතුං න දෙන්ති; උප්පන්නාපි අට්ඨසමාපත්තියො, පඤ්ච වා අභිඤ්ඤා උපච්ඡින්දිත්වා පාතෙන්ති; තස්මා පඤ්ඤාය දුබ්බලීකරණාති වුච්චන්ති.

**තථාගතපදං ඉතිපීති** ඉදම්පි තථාගතස්ස ඤාණපදං, ඤාණවළඤ්ජං, ඤාණෙන අක්කන්තට්ඨානන්ති වුච්චති. **තථාගතනිසෙවිතන්ති** තථාගතස්ස ඤාණඵාසුකාය නිඝංසිතට්ඨානං. **තථාගතාරඤ්ජිතන්ති** තථාගතස්ස ඤාණදාඨාය ආරඤ්ජිතට්ඨානං.

**යථාභූතං පජානාතීති** යථාසභාවං පජානාති. **න ත්වෙව තාව අරියසාවකො නිට්ඨං ගතො හොතීති** ඉමා ඣානාභිඤ්ඤා බාහිරකෙහිපි **සාධාරණාති** න තාව නිට්ඨං ගතො හොති; මග්ගක්ඛණෙපි අපරියොසිතකිච්චත්තාය න තාව නිට්ඨං ගතො හොති. **අපි ච ඛො නිට්ඨං ගච්ඡතීති** අපි ච ඛො පන මග්ගක්ඛණෙ, මහානාගං පස්සන්තො නාගවනිකො විය, සම්මාසම්බුද්ධො භගවාති ඉමිනා ආකාරෙන තීසු රතනෙසු නිට්ඨං ගච්ඡති. **නිට්ඨං ගතො හොතීති** එවං මග්ගක්ඛණෙ නිට්ඨං ගච්ඡන්තො අරහත්තඵලක්ඛණෙ පරියොසිතසබ්බකිච්චත්තාය සබ්බාකාරෙන තීසු රතනෙසු[1] නිට්ඨං ගතො[2] හොති. **සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.**

**චූළහත්ථිපදොපමං සත්තමං.**

---

1. සබ්බාකාරෙන-A, M2, P2. 2. නිට්ඨාගතො-A, M2 P2 S.

## 1. 3. 8.

**එවමෙව සුත්තන්ති** මහාහත්ථිපදොපමං. තත්ථ **ජඞ්ගලානන්ති**[1] පඨවීතලචාරීනං[2]; **පාණානන්ති** සපාදකානං පාණානං; **පදජාතානීති** පදානි. **සමොධානං ගච්ඡන්තීති** ඔධානං, පක්ඛෙපං ගච්ඡන්ති. **අග්ගමක්ඛායතීති** සෙට්ඨං අක්ඛායති. **යදිදං මහන්තත්තෙනාති**[3] මහන්තභාවෙන අග්ගං අක්ඛායති. න ගුණවසෙනාති අත්ථො. **යෙ කෙචි කුසලා ධම්මාති** යෙ කෙචි ලොකියා වා ලොකුත්තරා වා කුසලා ධම්මා.

**සඞ්ගහං ගච්ඡන්තීති** එත්ථ චතුබ්බිධො සඞ්ගහො: සජාතිසඞ්ගහො, සඤ්ජාතිසඞ්ගහො, කිරියසඞ්ගහො, ගහණ[4]සඞ්ගහොති. තත්ථ, "සබ්බෙ ඛත්තියා ආගච්ඡන්තු, සබ්බෙ බ්‍රාහ්මණා"ති එවං සමානජාතිවසෙන සඞ්ගහො සජාතිසඞ්ගහො නාම. "සබ්බෙ කොසලකා, සබ්බෙ මාගධකා"ති එවං සඤ්ජාතදෙසවසෙන[5] සඞ්ගහො සඤ්ජාතිසඞ්ගහො නාම. "සබ්බෙ රථිකා, සබ්බෙ ධනුග්ගහා"ති එවං[6] කිරියවසෙන සඞ්ගහො කිරියසඞ්ගහො නාම. "චක්ඛායතනං කතමං ඛන්ධගහණං ගච්ඡතීති? චක්ඛායතනං රූපක්ඛන්ධගහණං ගච්ඡති. හඤ්චි චක්ඛායතනං රූපක්ඛන්ධගහණං ගච්ඡති, තෙන වත රෙ වත්තබ්බෙ චක්ඛායතනං රූපක්ඛන්ධෙන සඞ්ගහිත"න්ති අයං ගහණ[4]සඞ්ගහො නාම. ඉමස්මිම්පි ඨානෙ අයමෙව අධිප්පෙතො.

නනු ච[7] "චතුන්නං අරියසච්චානං කති කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා"ති පඤ්හස්ස විස්සජ්ජනෙ, "සමුදයසච්චං අකුසලං, මග්ගසච්චං කුසලං, නිරොධසච්චං අබ්‍යාකතං, දුක්ඛසච්චං සියා කුසලං, සියා අකුසලං, සියා අබ්‍යාකත"න්ති ආගතත්තා චතුභූමකම්පි කුසලං දියඩ්ඪමෙව සච්චං භජති, අථ කස්මා මහාථෙරො, චතූසු අරියසච්චෙසු ගහණං[8] ගච්ඡන්තීති ආහාති? සච්චානං අන්තොගධත්තා.

යථා හි, "සාධිකමිදං භික්ඛවෙ දියඩ්ඪං සික්ඛාපදසතං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, යත්ථ අත්තකාමා කුලපුත්තා සික්ඛන්ති. තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා... අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා"ති එත්ථ සාධිකං දියඩ්ඪසික්ඛාපදසතං එකා අධිසීලසික්ඛාව හොති. තං සික්ඛන්තොපි තිස්සො සික්ඛා සික්ඛතීති දස්සිතො, සික්ඛානං අන්තොගධත්තා. යථා ච එකස්ස හත්ථිපදස්ස චතූසු කොට්ඨාසෙසු එකස්මිං කොට්ඨාසෙ ඔතිණ්ණානිපි ද්වීසු තීසු චතූසු කොට්ඨාසෙසු ඔතිණ්ණානිපි සිගාල-සස-මිගාදීනං පදානි හත්ථිපදෙ සමොධානං ගතානෙව හොන්ති, හත්ථිපදතො අමුඤ්චිත්වා තස්සෙව අන්තොගධත්තා. එවමෙව එකස්මිම්පි ද්වීසුපි තීසුපි චතූසුපි සච්චෙසු ගහණං ගතා ධම්මා

1. ජඞ්ගමානන්ති-E. 2. පඨවිතලවාසීනං-S.
3. මහන්තෙනාති-L, මහන්තත්තෙනාති-B, S, E, මහත්තතෙනාති-T2.
4. ගණන L, B, S. 5. ජාතදෙසවසෙන-L, සංජාතිදෙසවසෙන-S.
6. එවඤ්ච-L. 7. තනු-L, B. 8. ගණනං-B, සංගහං-S.

චතූසු සච්චෙසු ගහණං ගතාව හොන්ති, සච්චානං අන්තොගධත්තාති. දියඩ්ඪසච්චගහණං ගතෙපි කුසලධම්මෙ, **සබ්බෙ තෙ චතූසු අරියසච්චෙසු සඞ්ගහං ගච්ඡන්තීති** ආහ.

**දුක්ඛ අරියසච්චන්ති** ආදිසු උද්දෙසපදෙසු චෙව, **ජාතිපි දුක්ඛාති** ආදිසු නිද්දෙසපදෙසු ච යං වත්තබ්බං. තං සබ්බං විසුද්ධිමග්ගෙ වුත්තමෙව. කෙවලං පනෙත්ථ දෙසනානුක්කමො වෙදිතබ්බො.

යථාහි ඡෙකො විලිවකාරො[1] සුජාතං වෙළුං[2] ලභිත්වා චතුධා ඡෙත්වා, තතො තයො කොට්ඨාසෙ ඨපෙත්වා එකං ගණ්හිත්වා පඤ්චධා ඡින්දෙය්‍ය; තතොපි චත්තාරො ඨපෙත්වා එකං ගණ්හිත්වා ඵාලෙන්තො පඤ්ච පෙසියො කරෙය්‍ය; තතො චතස්සො ඨපෙත්වා එකං ගණ්හිත්වා, කුච්ඡිභාගං පිට්ඨිභාගන්ති ද්වෙධා ඵාලෙත්වා පිට්ඨිභාගං ඨපෙත්වා කුච්ඡිභාගං ආදාය, තතො සමුග්ග-වීජනි-තාලවණ්ටාදිනානප්පකාරං වෙළුවිකතිං කරෙය්‍ය. සො පිට්ඨිභාගඤ්ච ඉතරා ච චතස්සො පෙසියො ඉතරෙ ච චත්තාරො කොට්ඨාසෙ, ඉතරෙ ච තයො කොට්ඨාසෙ කම්මාය න උපනෙස්සතීති[3] න වත්තබ්බො. එකප්පහාරෙන[4] පන උපනෙතුං න සක්කා. අනුපුබ්බෙන උපනෙස්සති.

එවමෙව අයං මහාථෙරොපි, විලිවකාරො සුජාතං වෙළුං[2] ලභිත්වා චත්තාරො කොට්ඨාසෙ විය, ඉමං මහන්තං සුත්තන්තං ආරභිත්වා චතු-අරියසච්චවසෙන මාතිකං ඨපෙසි. විලිවකාරස්ස තයො කොට්ඨාසෙ ඨපෙත්වා එකං ගහෙත්වා තස්ස පඤ්චධාකරණං විය ථෙරස්ස තීණි අරියසච්චානි ඨපෙත්වා එකං දුක්ඛසච්චං ගහෙත්වා භාජෙන්තස්ස ඛන්ධවසෙන පඤ්චධාකරණං. තතො, යථා සො විලිවකාරො චත්තාරො කොට්ඨාසෙ ඨපෙත්වා එකං භාගං ගහෙත්වා පඤ්චධා[5] ඵාලෙසි, එවං ථෙරො චත්තාරො අරූපක්ඛන්ධෙ ඨපෙත්වා රූපක්ඛන්ධං විභජන්තො, **චත්තාරො ච මහාභූතා, චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපන්ති** පඤ්චධා අකාසි. තතො, යථා සො විලිවකාරො චතස්සො පෙසියො ඨපෙත්වා එකං ගහෙත්වා, කුච්ඡිභාගං පිට්ඨිභාගන්ති ද්වෙධා ඵාලෙසි, එවං ථෙරො උපාදාරූපඤ්ච තිස්සො ච ධාතුයො ඨපෙත්වා එකං පථවිධාතුං විභජන්තො, අජ්ඣත්තිකබාහිරවසෙන ද්වෙධා දස්සෙසි.

යථා සො[6] විලිවකාරො පිට්ඨිභාගං ඨපෙත්වා කුච්ඡිභාගං ආදාය නානප්පකාරං විලිවවිකතිං අකාසි;[7] එවං ථෙරො බාහිරං පථවීධාතුං ඨපෙත්වා අජ්ඣත්තිකං පථවීධාතුං වීසතියා ආකාරෙහි විභජිත්වා දස්සෙතුං, **කතමා චාවුසො අජ්ඣත්තිකා පථවීධාතූති** ආදිමාහ.

යථා පන විලිවකාරො පිට්ඨිභාගඤ්ච ඉතරෙ ච චත්තාරො කොට්ඨාසෙ, ඉතරෙ ච තයො කොට්ඨාසෙ අනුපුබ්බෙන කම්මාය උපනෙස්සති, න හි සක්කා එකප්පහාරෙන උපනෙතුං, එවං ථෙරො[8]

1. විලිබ්බකාරො-S. 2. වෙළු-S, E. 3. උපනෙතීති-S.
4. එකප්පහාරෙනෙව-L. 5. එකං පඤ්චධා-S. 6. යථා පන-L, යථා ච සො-E.
7. කරොති-B, S. 8. ථෙරො ච-A, M2, P2. ථෙරොපි-B, S.

බාහිරඤ්ච පඨවීධාතුං, ඉතරා ච තිස්සො ධාතුයො, උපාදාරූපඤ්ච, ඉතරෙ ච චත්තාරො අරූපිනො ඛන්ධෙ, ඉතරානි ච තීණි අරියසච්චානි අනුපුබ්බෙන විභජිත්වා දස්සෙස්සති.[1] න හි සක්කා එකප්පහාරෙන දස්සෙතුං.

අපි ච රාජපුත්තූපමායපි අයං කමො විභාවෙතබ්බො. එකො කිර මහාරාජා. තස්ස පරොසහස්සං පුත්තා. සො තෙසං පිළන්ධනපරික්ඛාරං චතූසු පෙළාසු ඨපෙත්වා ජෙට්ඨපුත්තස්ස අප්පෙසි:[2] තාත ඉදං තෙ භාතිකානං පිළන්ධනභණ්ඩං, තථාරූපෙ ඡණෙ සම්පත්තෙ[3] පිළන්ධනං නො දෙහීති යාචන්තානං දදෙය්‍යාසීති. සො සාධු දෙවාති සාරගබ්භෙ පටිසාමෙසි.

තථාරූපෙ ඡණදිවසෙ රාජපුත්තා රඤ්ඤො සන්තිකං ගන්ත්වා, තාත පිළන්ධනං නො දෙථ, නක්ඛත්තං කීළිස්සාමාති ආහංසු. 'තාතා ජෙට්ඨභාතිකස්ස වො හත්ථෙ මයා පිළන්ධනං ඨපිතං, තං ආහරාපෙත්වා පිළන්ධථා'ති. තෙ සාධූති පටිස්සුණිත්වා තස්ස සන්තිකං ගන්ත්වා, තුම්හාකං කිර නො හත්ථෙ පිළන්ධනභණ්ඩං, තං දෙථාති ආහංසු.

සො, එවං කරිස්සාමීති ගබ්භං විවරිත්වා[4] චතස්සො පෙළා[5] නීහරිත්වා තිස්සො ඨපෙත්වා එකං විවරිත්වා, තතො පඤ්ච සමුග්ගෙ නීහරිත්වා චත්තාරො ඨපෙත්වා එකං විවරිත්වා, තතො පඤ්ච කරණ්ඩෙ නීහරිත්වා තෙසුපි[6] චත්තාරො ඨපෙත්වා එකං විවරිත්වා පිධානං පස්සෙ ඨපෙත්වා තතො හත්ථූපගපාදූපගානි[7] නානප්පකාරානි පිළන්ධනානි නීහරිත්වා අදාසි. සො කිඤ්චාපි ඉතරෙහි චතූහි කරණ්ඩකෙහි, ඉතරෙහි චතූහි සමුග්ගෙහි, ඉතරාහි ච තීහි පෙළාහි න තාව භාජෙත්වා දෙති; අනුපුබ්බෙන පන දස්සති. න හි සක්කා එකප්පහාරෙන දාතුං.

තත්ථ මහාරාජා විය භගවා දට්ඨබ්බො. වුත්තම්පි චෙතං: "රාජාහමස්මි සෙලාති භගවා ධම්මරාජා අනුත්තරො"ති. ජෙට්ඨපුත්තො විය සාරිපුත්තත්ථෙරො. වුත්තම්පි චෙතං: "යං ඛො තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය, භගවතො පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො, ධම්මදායාදො, නො ආමිසදායාදොති, සාරිපුත්තමෙව තං සම්මා වදමානො වදෙය්‍ය, භගවතො පුත්තො-පෙ-නො ආමිසදායාදො"ති. පරොසහස්සං රාජපුත්තා විය භික්ඛුසඞ්ඝො දට්ඨබ්බො. වුත්තම්පි චෙතං:-

"පරොසහස්සං භික්ඛූනං සුගතං පයිරුපාසති
දෙසෙන්තං විරජං ධම්මං නිබ්බානං අකුතොභය"න්ති.

රඤ්ඤො තෙසං පුත්තානං පිළන්ධනං චතූසු පෙළාසු පක්ඛිපිත්වා ජෙට්ඨපුත්තස්ස හත්ථෙ ඨපිතකාලො විය භගවතා ධම්මසෙනාපතිස්ස හත්ථෙ චතුසච්චප්පකාසනාය ඨපිතකාලො. තෙනෙවාහ: "සාරිපුත්තො

1. භාජෙත්වා දස්සිස්සති-L, දස්සෙති-B, S. 2. දස්සෙසි-L.
3. පත්තෙ-L. 4. පවිසිත්වා-S. 5. පෙළායො-S.
6. පඤ්චසු කරණ්ඩෙසු නීහරිතෙසුපි-S. 7. හත්ථූපගපාදූපගාදීනි-E.

භික්ඛවෙ පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං, දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතු''න්ති.

තථාරූපෙ ඛණෙ තෙසං රාජපුත්තානං රාජානං උපසඞ්කමිත්වා පිළන්ධනයාචනකාලො විය භික්ඛුසඞ්ඝස්ස වස්සූපනායිකසමයෙ ආගන්ත්වා ධම්මදෙසනාය ආයාචිතකාලො. උපකට්ඨාය කිර වස්සූපනායිකාය ඉදං සුත්තං දෙසිතං. රඤ්ඤා[1], තාතා ජෙට්ඨභාතිකස්ස වො හත්ථෙ මයා පිළන්ධනං ඨපිතං, තං ආහරාපෙත්වා පිළන්ධථාති වුත්තකාලො විය සම්මාසම්බුද්ධෙනාපි, "සෙවෙථ භික්ඛවෙ සාරිපුත්ත-මොග්ගල්ලානෙ, භජථ භික්ඛවෙ සාරිපුත්තමොග්ගල්ලානෙ, පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා සබ්‍රහ්මචාරීන''න්ති එවං ධම්මසෙනාපතිනො සන්තිකං භික්ඛූනං පෙසිතකාලො. රාජපුත්තෙහි රඤ්ඤො කථං සුත්වා ජෙට්ඨභාතිකස්ස සන්තිකං ගන්ත්වා පිළන්ධනං[2] යාචිතකාලො විය භික්ඛූහි සත්ථු කථං සුත්වා ධම්මසෙනාපතිං උපසඞ්කමිත්වා ධම්මදෙසනං ආයාචිතකාලො.

ජෙට්ඨභාතිකස්ස ගබ්භං විවරිත්වා චතස්සො පෙළා නීහරිත්වා ඨපනං විය ධම්මසෙනාපතිස්ස ඉමං සුත්තන්තං ආරභිත්වා චතුන්නං අරියසච්චානං වසෙන මාතිකාය ඨපනං; තිස්සො පෙළා ඨපෙත්වා එකං විවරිත්වා, තතො පඤ්චසමුග්ගනීහරණං විය තීණි අරියසච්චානි ඨපෙත්වා දුක්ඛං අරියසච්චං විභජතො පඤ්චක්ඛන්ධදස්සනං; චත්තාරො සමුග්ගෙ ඨපෙත්වා එකං විවරිත්වා තතො පඤ්චකරණ්ඩ[3]නීහරණං විය චත්තාරො අරූපක්ඛන්ධෙ ඨපෙත්වා එකං රූපක්ඛන්ධං විභජන්තස්ස චතුමහාභූත-උපාදාරූපවසෙන පඤ්චකොට්ඨාසදස්සනං; චත්තාරො කරණ්ඩෙ ඨපෙත්වා එකං විවරිත්වා පිධානං පනස්ස ඨපෙත්වා හත්ථූපග-පාදූපගාදිපිළන්ධනදානං විය තීණි මහාභූතානි උපාදාරූපඤ්ච ඨපෙත්වා එකං පථවීධාතුං විභජන්තස්ස බාහිරං තාව පිධානං විය ඨපෙත්වා අජ්ඣත්තිකාය පථවීධාතුයා නානාසභාවතො වීසතියා ආකාරෙහි දස්සනත්ථං, **කතමා චාවුසො අජ්ඣත්තිකා පථවීධාතූති** ආදිවචනං.

තස්ස පන රාජපුත්තස්ස තෙහි චතූහි කරණ්ඩෙහි චතූහි සමුග්ගෙහි තීහි ච පෙළාහි පච්ඡා අනුපුබ්බෙන නීහරිත්වා පිළන්ධනදානං විය ථෙරස්සාපි ඉතරෙසඤ්ච තිණ්ණං මහාභූතානං උපාදාරූපානඤ්ච, චතුන්නං අරූපක්ඛන්ධානඤ්ච, තිණ්ණං අරියසච්චානඤ්ච පච්ඡා අනුපුබ්බෙන භාජෙත්වා දස්සනං වෙදිතබ්බං.

යමෙතං, **කතමා චාවුසො අජ්ඣත්තිකා පථවීධාතූති** ආදි වුත්තං, තත්ථ **අජ්ඣත්තං පච්චත්තන්ති** උභයමෙතං නියකාධිවචනමෙව. **කක්ඛළන්ති** ථද්ධං; **ඛරිගතන්ති** ඵරුසං. **උපාදින්නන්ති** න කම්මසමුට්ඨානමෙව, අවිසෙසෙන පන සරීරට්ඨකස්සෙතං ගහණං.

1. රඤ්ඤො-S, E. 2. පිළන්ධනස්ස-E. 3. පඤ්ච කරණ්ඩ-S, T1.

සරීරට්ඨකං හි උපාදිණ්ණං වා හොතු, අනුපාදිණ්ණං වා, ආදිණ්ණගහිතපරාමට්ඨවසෙන සබ්බං උපාදිණ්ණමෙව නාම. **සෙය්‍යථීදං:- කෙසා, ලොමා-පෙ-උදරියං, කරීසන්ති** ඉදං ධාතුකම්මට්ඨානිකස්ස කුලපුත්තස්ස අජ්ඣත්තිකපඨවීධාතුවසෙන තාව කම්මට්ඨානං විභත්තං. එත්ථ පන මනසිකාරං ආරභිත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං ගණ්හිතුකාමෙන යං කාතබ්බං තං සබ්බං විසුද්ධිමග්ගෙ විත්ථාරිතමෙව. මත්ථලුඞ්ගං පන න ඉධ පාළි[1]ආරූළ්හං. තම්පි ආහරිත්වා, විසුද්ධිමග්ගෙ වුත්තනයෙනෙව වණ්ණසණ්ඨානාදිවසෙන වවත්ථපෙත්වා, අයම්පි අචෙතනා අබ්‍යාකතා සුඤ්ඤා ථද්ධා පඨවීධාතු එවාති මනසිකාතබ්බං. **යං වා පනඤ්ඤම්පීති** ඉදං ඉතරෙසු තීසු කොට්ඨාසෙසු අනුගතාය පඨවීධාතුයා ගහණත්ථං වුත්තං.

**යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවීධාතූති** යා ච අයං වුත්තප්පකාරා අජ්ඣත්තිකා පඨවීධාතු; **යා ච බාහිරාති** යා ච විභඞ්ගෙ, "අයො ලොහං තිපු සීස"න්ති ආදිනා නයෙන ආගතා බාහිරා පඨවීධාතු. එත්තාවතා ථෙරෙන අජ්ඣත්තිකා පඨවීධාතු නානාසභාවතො වීසතියා ආකාරෙහි විත්ථාරෙන දස්සිතා; බාහිරා සඞ්ඛෙපෙන.

කස්මා? යස්මිං හි ඨානෙ සත්තානං ආලයො නිකන්ති පත්ථනා පරියුට්ඨානං ගහණං පරාමාසො බලවා හොති, තත්ථ තෙසං ආලයාදීනං උද්ධරණත්ථං බුද්ධා වා බුද්ධසාවකා වා විත්ථාරකථං කථෙන්ති; යත්ථ පන න බලවා, තත්ථ කත්තබ්බකිච්චාභාවතො, සඞ්ඛෙපෙන කථෙන්ති. යථා හි කස්සකො ඛෙත්තං කසන්තො[2] යත්ථ මූලසන්තානකානං බලවතාය නඞ්ගලං ලග්ගති, තත්ථ ගොණෙ ඨපෙත්වා පංසුං විබූහිත්වා[3] මූලසන්තානකානි ඡෙත්වා ඡෙත්වා[4] උද්ධරන්තො බහුං වායාමං කරොති; යත්ථ නත්ථි තත්ථ, තත්ථ බලව[5]පයොගං අකත්වා ගොණෙ පිට්ඨියං පහරමානො කසතියෙව. එවංසම්පදමිදං වෙදිතබ්බං.

**පඨවීධාතුරෙවෙසාති** දුවිධාපෙසා ථද්ධට්ඨෙන කක්ඛළට්ඨෙන ඵරුසට්ඨෙන එකලක්ඛණා පඨවීධාතුයෙව ආවුසොති අජ්ඣත්තිකං බාහිරාය සද්ධිං යොජෙත්වා දස්සෙති. කස්මා?[6] බාහිරාය හි පඨවීධාතුයා, අචෙතනාභාවො පාකටො, න අජ්ඣත්තිකාය. තස්මා සා බාහිරාය සද්ධිං එකසදිසා අචෙතනායෙවාති ගණ්හන්තස්ස සුඛපරිග්ගහො හොති. යථා කිං? යථා දන්තෙන ගොණෙන සද්ධිං යොජිතො[7] අදන්තො කතිපාහමෙව විසූකායති, විප්ඵන්දති, අථ නචිරස්සෙව දමථං උපෙති. එවං අජ්ඣත්තිකාපි බාහිරාය සද්ධිං එකසදිසාති ගණ්හන්තස්ස කතිපාහමෙව අචෙතනාභාවෙන න උපට්ඨාති, අථ න චිරස්සෙවස්සා අචෙතනාභාවො පාකටො හොති.

---

1. පාළිං-E. S. 2. කසමානො-B. S. 3. විබූහිත්වා-T1.
4. මූලසන්තානකානි ඡෙත්වා-S, E. 5. බලවං-B, S.
6. යස්මා-B, S. 7. යොජෙත්වා-B, S.

**තං නෙතං** මමාති තං උභයම්පි න එතං මම, **නෙසොහමස්මි, න එසො මෙ අත්තාති එවං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යථාභූතන්ති** යථාසභාවං. තං හි අනිච්චාදිසභාවං; තස්මා අනිච්චං දුක්ඛමනත්තාති එවං දට්ඨබ්බන්ති අත්ථො.

**හොති ඛො සො ආවුසොති** කස්මා ආරභි? බාහිරආපොධාතුවසෙන බාහිරාය පඨවීධාතුයා විනාසං දස්සෙත්වා තතො විසෙසතරෙන උපාදිණ්ණාය සරීරට්ඨක-පඨවීධාතුයා විනාසදස්සනත්ථං. **පකුප්පතීති** ආපොසංවට්ටවසෙන වඩ්ඪමානා කුප්පති. **අන්තරහිතා තස්මිං සමයෙ බාහිරා පඨවීධාතු හොතීති** තස්මිං සමයෙ කොටිසතසහස්සචක්කවාළෙ ඛාරොදකෙන විලීයමානා උදකානුගතා හුත්වා සබ්බා පබ්බතාදිවසෙන සණ්ඨිතා පඨවීධාතු අන්තරහිතා හොති, විලීයිත්වා උදකමෙව හොති.

**තාව මහල්ලිකායාති** තාව මහන්තියා;[1]

"ද්වෙ[2] සතසහස්සානි චත්තාරි නහුතානි ච
එත්තකං බහලත්තෙන සඞ්ඛාතායං වසුන්ධරා"ති

එවං බහලත්තෙන මහන්තියා[1]; විත්ථාරතො පන කොටිසතසහස්සචක්කවාළපරිමාණාය[3]. **අනිච්චතාති** හුත්වා අභාවතා; **ඛයධම්මතාති** ඛයං ගමනසභාවතා; **වයධම්මතාති** වයං ගමනසභාවතා; **විපරිණාමධම්මතාති** පකතිවිජහනසභාවතා. ඉති සබ්බෙහිපි ඉමෙහි පදෙහි අනිච්චලක්ඛණමෙව වුත්තං. යම්පන අනිච්චං, තං දුක්ඛං, යං දුක්ඛං, තං අනත්තාති තීණිපි ලක්ඛණානි ආගතානෙව හොන්ති.

**මත්තට්ඨකස්සාති** පරිත්තට්ඨිතිකස්ස. තත්ථ ද්වීහාකාරෙහි ඉමස්ස කායස්ස පරිත්තට්ඨිතිතා වෙදිතබ්බා: ඨිතිපරිත්තතාය ච සරසපරිත්තතාය ච. අයං හි, "අතීතෙ චිත්තක්ඛණෙ ජීවිත්ථ, න ජීවති, න ජීවිස්සති; අනාගතෙ චිත්තක්ඛණෙ ජීවිස්සති, න ජීවති, න ජීවිත්ථ; පච්චුප්පන්නෙ චිත්තක්ඛණෙ ජීවති, න ජීවිත්ථ, න ජීවිස්සතී"ති වුච්චති.

"ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා
එකචිත්තසමායුත්තා ලහු සො වත්තතෙ ඛණො"ති

ඉදම්පි එතස්සෙව පරිත්තට්ඨිතිදස්සනත්ථං වුත්තං. එවං ඨිතිපරිත්තතාය පරිත්තට්ඨිතිතා වෙදිතබ්බා. අස්සාසූපනිබද්ධාදිභාවෙන[4] පනස්ස සරසපරිත්තතා වෙදිතබ්බා. සත්තානං හි අස්සාසූපනිබද්ධං[5] ජීවිතං, පස්සාසූපනිබද්ධං[5] ජීවිතං, අස්සාසපස්සාසූපනිබද්ධං[5] ජීවිතං, මහාභූතූපනිබද්ධං[5] ජීවිතං, කබළිඞ්කාරාහාරූපනිබද්ධං[5] ජීවිතං, විඤ්ඤාණූපනිබද්ධං[5] ජීවිතන්ති විසුද්ධිමග්ගෙ විත්ථාරිතං එතං.[6]

---

1. මහන්තාය-L. B. S. 2. ද්වෙ ච-S. 3. පමාණාය-B. S.
4. අස්සාසපස්සාසූපනිබන්ධාදිභාවෙන-B. S. 5. නිබන්ධං-B. S. E.
6. විත්ථාරිතං-B. S.

**තණ්හුපාදින්නස්සාති** තණ්හාය ආදින්න-ගහිත-පරාමට්ඨස්ස. **අහන්ති වා මමන්ති වා අස්මීති වා, අථ ඛ්වස්ස නො තෙවෙත්ථ[1] හොතීති** අථ ඛො අස්ස භික්ඛුනො එවං තීණි ලක්ඛණානි ආරොපෙත්වා පස්සන්තස්ස එත්ථ අජ්ඣත්තිකාය පථවීධාතුයා අයං අහන්ති වාති ආදි තිවිධො තණ්හා-මාන-දිට්ඨිග්ගාහො න ත්වෙව[2] හොති; න හොතියෙවාති අත්ථො. යථා ච ආපොධාතුවසෙන, එවං තෙජොධාතු-වායොධාතුවසෙනාපි බාහිරාය පථවීධාතුයා අන්තරධානං හොති. ඉධ පන එකංයෙව ආගතං. ඉතරානිපි අත්ථතො වෙදිතබ්බානි.

**තඤ්චෙ ආවුසොති** ඉධ තස්ස ධාතුකම්මට්ඨානිකස්ස භික්ඛුනො සොතද්වාරෙ[3] පරිග්ගහං පට්ඨපෙන්තො බලං දස්සෙති. **අක්කොසන්තීති** දසහි අක්කොසවත්ථූහි අක්කොසන්ති. **පරිභාසන්තීති**, තයා ඉදඤ්චිදඤ්ච කතං, එවඤ්ච[4] තං කරිස්සාමාති වාචාය පරිභවන්ති. **රොසෙන්තීති** ඝට්ටෙන්ති. **විහෙසෙන්තීති** දුක්ඛාපෙන්ති. සබ්බං වාචාය ඝට්ටනමෙව වුත්තං. **සො එවන්ති** සො ධාතුකම්මට්ඨානිකො එවං පජානාති. **උප්පන්නා ඛො මෙ අයන්ති** සම්පති වත්තමානුප්පන්නභාවෙන ච සමුදාචාරුප්පන්නභාවෙන ච උප්පන්නා. **සොතසම්ඵස්සජාති** උපනිස්සයවසෙන සොතසම්ඵස්සතො ජාතා සොතද්වාරජවනවෙදනා. **එසො අනිච්චොති** සොතසම්ඵස්සො, හුත්වා අභාවට්ඨෙන අනිච්චොති පස්සති. වෙදනාදයොපි සොතසම්ඵස්සසම්පයුත්තාව වෙදිතබ්බා.

**ධාතාරම්මණමෙවාති** ධාතුසඞ්ඛාතමෙව ආරම්මණං. **පක්ඛන්දතීති** ඔතරති. **පසීදතීති** තස්මිං ආරම්මණෙ පසීදති. භුම්මවචනමෙව වා එතං බ්‍යඤ්ජනසන්ධිවසෙන **ධාතාරම්මණමෙවාති** වුත්තං; ධාතාරම්මණෙයෙවාති අයමෙත්ථ අත්ථො. **විමුච්චතීති[5]** ධාතුවසෙන එවන්ති[6] අධිමොක්ඛං ලභති; න රජ්ජති, න දුස්සති. අයං හි සොතද්වාරම්හි ආරම්මණෙ ආපාථගතෙ මූලපරිඤ්ඤා-ආගන්තුක-තාවකාලිකවසෙන පරිග්ගහං කරොති. තස්ස විත්ථාරකථා සතිපට්ඨානෙ චතුසම්පජඤ්ඤෙ[7] පබ්බෙ වුත්තා. සා පන තත්ථ චක්ඛුද්වාරවසෙන වුත්තා, ඉධ සොතද්වාරවසෙන වෙදිතබ්බා.

එවං කතපරිග්ගහස්ස හි ධාතුකම්මට්ඨානිකස්ස බලවවිපස්සකස්ස සචෙපි චක්ඛුද්වාරාදීසු ආරම්මණෙ ආපාථගතෙ **අයොනිසො ආවජ්ජනං උප්පජ්ජති, වොත්ථපනං[8] ආපජ්ජති, වොත්ථපනං[9] පත්වා එකද්වෙවාරෙ ආසෙවනං ලභිත්වා චිත්තං භවඞ්ගමෙව ඔතරති, න රාගාදිවසෙන උප්පජ්ජති. අයං කොටිප්පත්තො තික්ඛවිපස්සකො. අපරස්ස රාගාදිවසෙන එකවාරං ජවනං ජවති,[10] ජවනපරියොසානෙ පන, රාගාදිවසෙන මෙ ජවනං ජවිතන්ති ආවජ්ජතො ආරම්මණං**

1. තොඃ වෙවෙත්ථ-L. 2. තොතෙව-B. S. 3. සොතද්වාරෙන-L. 4. එවඤ්ච එවඤ්ච-S. E. 5. අධිමුච්චතීති-L. E. 6. එතං-S, එතන්ති-B. 7. සතිසම්පජඤ්ඤෙ-L. B. S. 8. වොට්ඨබ්බනං-B. S. 9. ආවජ්ජනං උප්පජ්ජති වොත්ථපනං පත්වා-L. 10. එකවාරං ජවති-L.

පරිග්ගහිතමෙව හොති, පුන වාරං තථා න ජවති. අපරස්ස එකවාරං ආවජ්ජතො[1] පුන දුතියවාරං රාගාදිවසෙන ජවතියෙව. දුතියවාරවසානෙ පන[2] එවං මෙ ජවනං ජවිතන්ති ආවජ්ජතො ආරම්මණං පරිග්ගහිතමෙව හොති, තතියවාරෙ තථා න උප්පජ්ජති. එත්ථ පන පඨමො අතිතික්ඛො; තතියො අතිමන්දො. දුතියස්ස පන වසෙන ඉමස්මිං සුත්තෙ, ලටුකිකොපමෙ, ඉන්ද්‍රියභාවනෙ ච[3] අයමත්ථො වෙදිතබ්බො.

එවං සොතද්වාරෙ පරිග්ගහවසෙන ධාතුකම්මට්ඨානිකස්ස බලං දීපෙත්වා[4] ඉදානි කායද්වාරෙ දීපෙන්තො, **තඤ්චෙ ආවුසොති** ආදිමාහ. අනිට්ඨාරම්මණං හි පත්වා ද්වීසු ද්වාරෙසු කිලමති: සොතද්වාරෙ ච කායද්වාරෙ ච. තස්මා යථා නාම ඛෙත්තසාමිපුරිසො කුද්දාලං ගහෙත්වා ඛෙත්තං අනුසඤ්චරන්තො යත්ථ[5] තත්ථ වා මත්තිකපිණ්ඩං අදත්වා දුබ්බලට්ඨානෙසුයෙව කුද්දාලෙන භූමිං භින්දිත්වා සතිණමත්තිකපිණ්ඩං දෙති. එවමෙව මහාථෙරො අනාගතෙ සික්ඛාකාමා පධානකම්මිකා කුලපුත්තා ඉමෙසු ද්වීසු[6] ද්වාරෙසු සංවරං පට්ඨපෙත්වා ඛිප්පමෙව ජාතිජරාමරණස්ස අන්තං කරිස්සන්තීති[7] ඉමෙසුයෙව ද්වීසු ද්වාරෙසු ගාළ්හං කත්වා සංවරං දෙසෙන්තො ඉමං දෙසනං ආරභි. තත්ථ **සමුදාචරන්තීති** උපක්කමන්ති. **පාණිසම්ඵස්සෙනාති** පාණිප්පහාරෙන. ඉතරෙසුපි එසෙව නයො. **තථාභූතොති** තථාසභාවො. **යථාභූතස්මින්ති** යථාසභාවෙ. **කමන්තීති** පවත්තන්ති.

**එවං බුද්ධං අනුස්සරතොති** ආදීසු "ඉතිපි සො භගවා"ති ආදිනා නයෙන අනුස්සරන්තොපි බුද්ධං අනුස්සරති; **වුත්තං ඛො පනෙතං භගවතාති** අනුස්සරන්තොපි අනුස්සරතියෙව. "ස්වාක්ඛාතො භගවතා ධම්මො"ති ආදිනා නයෙන අනුස්සරන්තොපි ධම්මං අනුස්සරති; කකචූපමොවාදං අනුස්සරන්තොපි අනුස්සරතියෙව. "සුප්පටිපන්නො"ති ආදිනා නයෙන අනුස්සරන්තොපි සඞ්ඝං අනුස්සරති; කකචොකන්තනං අධිවාසයමානස්ස භික්ඛුනො ගුණං අනුස්සරමානොපි අනුස්සරතියෙව.

**උපෙක්ඛා කුසලනිස්සිතා න සණ්ඨාතීති** ඉධ විපස්සනුපෙක්ඛා අධිප්පෙතා; **උපෙක්ඛා කුසලනිස්සිතා සණ්ඨාතීති** ඉධ ඡළඞ්ගුපෙක්ඛා. සා පනෙසා කිඤ්චාපි ඛීණාසවස්ස ඉට්ඨානිට්ඨෙසු ආරම්මණෙසු අරජ්ජනාදිවසෙන පවත්තති, අයං පන භික්ඛු විරියබලෙන භාවනාසිද්ධියා අත්තනො විපස්සනං ඛීණාසවස්ස ඡළඞ්ගුපෙක්ඛාට්ඨානෙ ඨපෙතීති විපස්සනා ඡළඞ්ගුපෙක්ඛා නාම ජාතා.

ආපොධාතුනිද්දෙසෙ **ආපොගතන්ති** සබ්බං ආපෙසු ගතං අල්ලයූසභාවලක්ඛණං. **පිත්තං සෙම්හන්ති** ආදීසු පන යං වත්තබ්බං තං සබ්බං සද්ධිං භාවනානයෙන විසුද්ධිමග්ගෙ වුත්තං. **පකුප්පතීති** ඔස

1. එකවාරං එවං ආවජ්ජනම්පි-L. 2. දුතියවාරවසෙන-L.
3. ඉන්ද්‍රියභාවෙනෙව-S. 4. දස්සෙත්වා-B. ඕ. 5. යත්ථ වා-L, B, Ṣ.
6. ඉමෙසු-M2, P2. 7. කරිස්සන්තීති-L.

වසෙන වඩ්ඪන්ති; සමුද්දතො වා උදකං උත්තරති. අයමස්ස පාකතිකො පකොපො. ආපොසංවට්ටකාලෙ පන කොටිසතසහස්සචක්කවාළං උදකපූරමෙව හොති. **ඔගච්ඡන්තීති** හෙට්ඨා ගච්ඡන්ති; උද්ධනෙ ආරොපිතඋදකං විය ඛයං විනාසං පාපුණාති. සෙසං පුරිමනයෙනෙව වෙදිතබ්බං.

තෙජොධාතුනිද්දෙසෙ **තෙජොගතන්ති** සබ්බං තෙජෙසු ගතං උණ්හත්තලක්ඛණං; තෙජො එව වා. තෙජභාවං ගතන්ති තෙජොගතං. පුරිමෙ ආපොගතෙපි පච්ඡිමෙ වායොගතෙපි එසෙව නයො. **යෙන චාති** යෙන තෙජොගතෙන කුපිතෙන[1] අයං කායො සන්තප්පති, එකාහිකජරාදිභාවෙන උසුමජාතො හොති. **යෙන ච ජීරීයතීති**[2] යෙන අයං කායො ජීරති, ඉන්ද්‍රියවෙකල්ලතං බලපරික්ඛයං වලිතපලිතාදිභාවඤ්ච පාපුණාති. **යෙන ච පරිඩය්හතීති** යෙන කුපිතෙන අයං කායො ඩය්හති; සො ච පුග්ගලො, ඩය්හාමි, ඩය්හාමීති කන්දන්තො සතධොතසප්පි-ගොසීස-චන්දනාදිලෙපඤ්චෙව තාලවණ්ට වාතඤ්ච පච්චාසිංසති. **යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡතීති** යෙනෙතං අසිතං වා ඔදනාදි, පීතං වා පානකාදි, ඛායිතං වා පිට්ඨඛජ්ජකාදි, සායිතං වා අපක්ක[3]මධුඵාණිතාදි සම්මා පරිපාකං ගච්ඡති. රසාදිභාවෙන විවෙකං ගච්ඡතීති අත්ථො. අයමෙත්ථ සංඛෙපො. විත්ථාරතො පන යං වත්තබ්බං සියා, තං සබ්බං සද්ධිං භාවනානයෙන විසුද්ධිමග්ගෙ වුත්තං.

**හරිතන්තන්ති** හරිතමෙව. අල්ලතිණාති[4] ආගම්ම නිබ්බායතීති අත්ථො. **පන්ථන්තන්ති** මහාමග්ගං.[5] **සෙලන්තන්ති** පබ්බතං. **උදකන්තන්ති** උදකං. **රමණීයං වා භූමිභාගන්ති** තිණගුම්බාදිරහිතං විවිත්තං අජ්ඣොකාසං භූමිභාගං. **අනාහාරාති** අප්පච්චයා,[6] නිරුපාදානා. අයම්පි පකතියාව තෙජොවිකාරො වුත්තො. තෙජොසංවට්ටකාලෙ පන කොටිසතසහස්සචක්කවාළං ඣාපෙත්වා ඡාරිකාමත්තම්පි න තිට්ඨති. **නහාරුදද්දුලෙනාති**[7] චම්මනිල්ලෙඛනෙන. **අග්ගිං ගවෙසන්තීති** එවරූපං සුඛුමං උපාදානං ගහෙත්වා[8] පරියෙසන්ති, යං අප්පමත්තකම්පි උසුමං ලභිත්වා පජ්ජලති. සෙසමිධාපි පුරිමනයෙනෙව වෙදිතබ්බං.

වායොධාතුනිද්දෙසෙ **උද්ධඞ්ගමා වාතාති** උග්ගාරහික්කාදි පවත්තකා උද්ධං ආරොහනා වාතා. **අධොගමා වාතාති** උච්චාරපස්සාවාදිනීහරණකා අධො ඔරොහනා වාතා. **කුච්ඡිසයා වාතාති** අන්තානං බහි වාතා. **කොට්ඨසයා**[9] **වාතාති** අන්තානං අන්තො වාතා. **අඞ්ගමඞ්ගානුසාරිනොති** ධමනිජාලානුසාරෙන සකලසරීරෙ අඞ්ගමඞ්ගානි

1. තෙජොගතෙන තස්මිං කුපිතෙ-B, S.
2. ජීරියතීති-S, E.
3. අම්බපක්ක-B, S, E.
4. අල්ලතිණාදිං-B, S.
5. මහාමග්ගමෙව-B, S.
6. අනාහාරාති නිරාහාරා-B, S.
7. නහාරුදද්දලෙලකාති-S.
8. ගහෙත්වා අග්ගිං-B, S.
9. කොට්ඨාසයා-S, E.

අනුසටා සම්මිඤ්ජනපසාරණාදිනිබ්බත්තකා වාතා. **අස්සාසොති** අන්තොපවිසනනාසිකවාතො. **පස්සාසොති** බහිනික්ඛමනනාසිකවාතො. අයමෙත්ථ සඞ්ඛෙපො. විත්ථාරතො පන යං වත්තබ්බං සියා, තං සබ්බං සද්ධිං භාවනානයෙන විසුද්ධිමග්ගෙ වුත්තං.

**ගාමම්පි වහතීති** සකලගාමම්පි චුණ්ණවිචුණ්ණං කුරුමානා ආදාය ගච්ඡති. නිගමාදීසුපි එසෙව නයො. ඉධ වායොසංවට්ටකාලෙ කොටිසතසහස්සචක්කවාළවිද්ධංසනවසෙන වායොධාතුවිකාරො දස්සිතො. **විධූපනෙනාති** අග්ගිබීජනකෙන. **ඔස්සාවනෙනාති**[1] ඡදනග්ගෙන. තෙන හි උදකං සවති, තස්මා තං ඔස්සාවනන්ති[2] වුච්චති. සෙසමිධාපි පුරිමනයෙනෙව වෙදිතබ්බං.

**සෙය්‍යථාපි ආවුසොති** ඉධ කිං දස්සෙති? හෙට්ඨාකථිතානං මහාභූතානං නිස්සත්තභාවං. **කට්ඨන්ති** දබ්බසම්භාරං. **වල්ලින්ති** ආබන්ධනවල්ලිං. **තිණන්ති** ඡදනතිණං.[3] **මත්තිකන්ති** අනුලෙපනමත්තිකං. **ආකාසො පරිවාරිතොති** එතානි කට්ඨාදීනි අන්තො ච බහි ච පරිවාරෙත්වා ආකාසො ඨිතොති[4] අත්ථො. **අගාරන්ත්වෙව සඞ්ඛං ගච්ඡතීති** අගාරන්ති පණ්ණත්තිමත්තං හොති. කට්ඨාදීසු පන විසුං විසුං රාසිකතෙසු, කට්ඨරාසි වල්ලිරාසීත්වෙව වුච්චති. **එවමෙව ඛොති** එවමෙව අට්ඨිආදීනි අන්තො ච බහි ච පරිවාරෙත්වා ඨිතො ආකාසො, තානෙව අට්ඨිආදීනි පටිච්ච රූපන්ත්වෙව සඞ්ඛං ගච්ඡති; සරීරන්ති වොහාරං ගච්ඡති. යථා කට්ඨාදීනි පටිච්ච ගෙහන්ති සඞ්ඛං ගතං අගාරං ඛත්තියගෙහං, බ්‍රාහ්මණගෙහන්ති වුච්චති, එවමිදම්පි ඛත්තියසරීරං, බ්‍රාහ්මණසරීරන්ති වුච්චති. න පනෙත්ථ[5] කොචි සත්තො වා ජීවො වාති.[6]

**අජ්ඣත්තිකඤ්චෙව ආවුසො චක්ඛුන්ති** ඉදං කස්මා ආරද්ධං? හෙට්ඨා උපාදාරූපං, චත්තාරො ච අරූපිනො ඛන්ධා, තීණි ච අරියසච්චානි න කථිතානි, ඉදානි තානි කථෙතුං අයං දෙසනා ආරද්ධා. තත්ථ **චක්ඛුං අපරිභින්නන්ති** චක්ඛුප්පසාදෙ නිරුද්ධෙපි උපහතෙපි පිත්තසෙම්හලොහිතෙහි පලිබුද්ධෙපි චක්ඛුං චක්ඛුවිඤ්ඤාණස්ස පච්චයො භවිතුං න සක්කොතීති පරිභින්නමෙව හොති. චක්ඛුවිඤ්ඤාණස්ස පන පච්චයො භවිතුං සමත්ථං අපරිභින්නං නාම. **බාහිරා ච රූපාති** බාහිරා චතුසමුට්ඨානිකා රූපා. **තජ්ජො සමන්නාහාරොති** චක්ඛුඤ්ච රූපෙ ච පටිච්ච භවඞ්ගං ආවට්ටෙත්වා[7] උප්පජ්ජනමනසිකාරො. භවඞ්ගාවට්ටන[8]සමත්ථං චක්ඛුද්වාරෙ කිරියමනොධාතුචිත්තන්ති අත්ථො. තං රූපානං අනාපාථගතත්තාපි අඤ්ඤවිහිතස්සාපි න හොති. **තජ්ජස්සාති** තදනුරූපස්ස. **විඤ්ඤාණභාගස්සාති** විඤ්ඤාණකොට්ඨාසස්ස.

---

1. ඔස්සවනෙනාති-S. ඔසවනෙනාති-B. 2. ඔස්සවනන්ති-S. ඔසවනන්ති-B
3. ඡදනතිණං-B, S. 4. ඨිතො ආකාසොති-S. 5. නපෙත්ථ-S.
6. ජීවො වා විජ්ජති-S. 7. ආවජ්ජෙත්වා-S. 8. භවඞ්ගාවජ්ජන-L, S.

**තථාභූතස්සාති** ආදිසුපි[1] ද්වාරවසෙන චත්තාරි **සච්චානි දස්සෙති.** තත්ථ **තථාභූතස්සාති** චක්ඛුවිඤ්ඤාණෙන සහභූතස්ස; චක්ඛුවිඤ්ඤාණසමඞ්ගිනොති අත්ථො. **රූපන්ති** චක්ඛුවිඤ්ඤාණස්ස න[2] රූපජනකත්තා චක්ඛුවිඤ්ඤාණක්ඛණෙ තිසමුට්ඨානරූපං. තදනන්තරචිත්තක්ඛණෙ චතුසමුට්ඨානම්පි ලබ්භති. **සඞ්ගහං ගච්ඡතීති** ගණනං ගච්ඡති. වෙදනාදයො[3] චක්ඛුවිඤ්ඤාණසම්පයුත්තාව. විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණමෙව. එත්ථ ච **සඞ්ඛාරාති** චෙතනාව වුත්තා.

**සඞ්ගහොති** එකතො සඞ්ගහො. **සන්නිපාතොති** සමාගමො. **සමවායොති** රාසි. **යො පටිච්චසමුප්පාදං පස්සතීති** යො පච්චයෙ පස්සති. **සො ධම්මං පස්සතීති** සො පටිච්චසමුප්පන්නෙ ධම්මෙ පස්සති. **ඡන්දොති ආදි** සබ්බං තණ්හාය[4] වෙවචනමෙව. තණ්හා හි ඡන්දකරණවසෙන **ඡන්දො,** ආලයකරණවසෙන **ආලයො,** අනුනයකරණවසෙන **අනුනයො,** අජ්ඣොගාහිත්වා ගිලිත්වා ගහණවසෙන **අජ්ඣොසානන්ති** වුච්චති. **ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානන්ති** නිබ්බානස්සෙව අධිවචනං. ඉති තීණි සච්චානි පාළියං ආගතානෙව. මග්ගසච්චං ආහරිත්වා ගහෙතබ්බං. යා ඉමෙසු තීසු ඨානෙසු දිට්ඨි, සඞ්කප්පො, වාචා, කම්මන්තො, ආජීවො, වායාමො, සති, සමාධි, භාවනාපටිවෙධො, අයං මග්ගොති. **බහුකතං හොතීති** එත්තාවතාපි බහුං භගවතො සාසනං කතං හොති. **අජ්ඣත්තිකඤ්චෙ ආවුසො සොතන්ති** ආදිවාරෙසුපි එසෙව නයො.

මනොද්වාරෙ පන **අජ්ඣත්තිකො මනො** නාම භවඞ්ගචිත්තං. තං නිරුද්ධම්පි ආවජ්ජනචිත්තස්ස පච්චයො භවිතුං අසමත්ථං මන්දං තමඞ්ගතමෙව **පවත්තමානම්පි පරිභින්නං** නාම හොති. ආවජ්ජනස්ස පච්චයො භවිතුං සමත්ථං **අපරිභින්නං** නාම. **බාහිරා ච ධම්මාති** ධම්මාරම්මණං.[5] **නෙව තාව තජ්ජස්සාති**[6] ඉදං භවඞ්ගසමයෙනෙව කථිතං. දුතියවාරෙ පගුණජ්ඣානපච්චවෙක්ඛනෙන වා, පගුණකම්මට්ඨානමනසිකාරෙන වා, පගුණබුද්ධවචනසජ්ඣායකරණාදිනා වා අඤ්ඤවිහිතකං[7] සන්ධාය වුත්තො. ඉමස්මිං වාරෙ **රූපන්ති** චතුසමුට්ඨානම්පි ලබ්භති. මනොවිඤ්ඤාණං හි රූපං සමුට්ඨාපෙති. **වෙදනාදයො** මනොවිඤ්ඤාණසම්පයුත්තා. විඤ්ඤාණං මනොවිඤ්ඤාණමෙව. **සඞ්ඛාරා** පනෙත්ථ ඵස්සචෙතනාවසෙනෙව ගහිතා. සෙසං වුත්තනයෙනෙව වෙදිතබ්බං.

**ඉති මහාථෙරො හෙට්ඨා එකදෙසමෙව සම්මසන්තො ආගන්ත්වා ඉමස්මිං ඨානෙ ඨත්වා හෙට්ඨා පරිහීනදෙසනං සබ්බං තං තං ද්වාරවසෙන භාජෙත්වා දස්සෙන්තො[8] යථානුසන්ධිනාව සුත්තන්තං නිට්ඨාපෙසීති.**

**මහාහත්ථිපදොපම[9]සුත්තං අට්ඨමං.**

---

1. යථාභූතස්සාති ආදිසු-S. 2. චක්ඛුවිඤ්ඤාණදස්සන-L. චක්ඛුවිඤ්ඤාණස්ස-S.
3. චෙතනාදයො-L. 4. තණ්හා-L. B. S. 5. බාහිරා ච ධම්මා-පෙ- B. S.
6. තස්සාති-L. 7. අඤ්ඤවිහිතකං-E. 8. දස්සෙසි-L. 9. මහාහත්ථිපද-L.

9

**එවං මෙ සුතන්ති** මහාසාරොපමං.[1] තත්‍ථ **අචිරපක්කන්තෙති** සඞ්ඝං භින්දිත්වා රුහිරුප්පාද[2]කම්මං කත්වා න චිරපක්කන්තෙ, සලිඞ්ගෙනෙව පාටියෙක්කෙ ජාතෙ. **ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තොති** කිඤ්චාපි අමුකකුලපුත්තොති න නියාමිතො, දෙවදත්තංයෙව පන සන්ධාය ඉදං වුත්තන්ති වෙදිතබ්බං. සො හි අසම්භින්නාය මහාසම්මතපවෙණියා ඔක්කාකවංසෙ ජාතත්තා ජාතිකුලපුත්තො. **ඔතිණ්ණොති** යස්ස ජාති අන්තො පවිට්ඨා, සො ජාතියා ඔතිණ්ණො නාම. ජරාදීසුපි එසෙව නයො.

ලාභසක්කාරාදීසු **ලාභොති** චත්තාරො පච්චයා. **සක්කාරොති**[3] තෙසංයෙව සුකතභාවො. **සිලොකොති** වණ්ණභණනං. **අභිනිබ්බත්තෙතීති** උප්පාදෙති. **අප්පඤ්ඤාතාති** ද්වින්නං ජනානං සීතට්ඨානෙ න පඤ්ඤායන්ති; ඝාසච්ඡාදනමත්තම්පි න ලභන්ති. **අප්පෙසක්ඛාති** අප්පපරිවාරා; පුරතො පච්ඡතො වා ගච්ඡන්තං න ලභන්ති. **සාරෙන සාරකරණීයන්ති** රුක්ඛසාරෙන කත්තබ්බං අක්ඛචක්කයුගනඞ්ගලාදිකං යං කිඤ්චි. **සාඛාපලාසං අග්ගහෙසි බ්‍රහ්මචරියස්සාති** මග්ගඵලසාරස්ස සාසනබ්‍රහ්මචරියස්ස චත්තාරො පච්චයා සාඛාපලාසං නාම; තං අග්ගහෙසි. **තෙන ච වොසානං ආපාදීති** තෙනෙව ච, අලමෙත්තාවතා සාරො මෙ පත්තොති වොසානං ආපන්නො.

**ඤාණදස්සනං ආරාධෙතීති** දෙවදත්තො පඤ්චාභිඤ්ඤො; දිබ්බචක්ඛු ච පඤ්චන්නං අභිඤ්ඤානං මත්‍ථකෙ ඨිතං; තං ඉමස්මිං සුත්තෙ ඤාණදස්සනන්ති වුත්තං. **අජානං අපස්සං විහරන්තීති** කිඤ්චි සුඛුමරූපං අජානන්තා, අන්තමසො පංසුපිසාචකම්පි අපස්සන්තා විහරන්ති.

**අසමයවිමොක්ඛං ආරාධෙතීති**, "කතමො අසමයවිමොක්ඛො? චත්තාරො අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච, අයං අසමයවිමොක්ඛො"ති එවං වුත්තෙ නව ලොකුත්තරධම්මෙ ආරාධෙති, සම්පාදෙති, පටිලභති. ලොකියසමාපත්තියො හි අප්පිතප්පිතක්ඛණෙයෙව පච්චනීකධම්මෙහි විමුච්චන්ති, තස්මා, "කතමො සමයවිමොක්ඛො? චත්තාරි ඣානානි[4], චතස්සො ච අරූප[5]සමාපත්තියො, අයං සමයවිමොක්ඛො"ති එවං සමයවිමොක්ඛොති වුත්තා.[6] ලොකුත්තරධම්මා පන න කාලෙන කාලං විමුච්චන්ති. සකිං විමුත්තානි හි මග්ගඵලානි විමුත්තානෙව හොන්ති. නිබ්බානං සබ්බකිලෙසෙහි අච්චන්තවිමුත්තමෙවාති ඉමෙ නව ධම්මා අසමයවිමොක්ඛොති වුත්තා

1. මහාසාරොපමසුත්තං-B. S.
2. රුහිරුප්පාදක-S.
3. සක්කාරොති ච-L.
4. චතස්සො රූපාවචරසමාපත්තියො-B. S.
5. අරූපාවචර-B. S.
6. සමයවිමොක්ඛො වුත්තො-L.

**අකුප්පා චෙතොවිමුත්තීති** අරහත්තඵලවිමුත්ති. අයමත්ථො එතස්සාති **එතදත්ථං**. අරහත්තඵලත්ථං ඉදං බ්‍රහ්මචරියං; අයං හි එතස්ස අත්ථොති වුත්තං හොති. **එතං සාරන්ති** එතං අරහත්තඵලං බ්‍රහ්මචරියස්ස සාරං. **එතං පරියොසානන්ති** එතං අරහත්තඵලං බ්‍රහ්මචරියස්ස පරියොසානං, එසා කොටි, න ඉතො පරං පත්තබ්බං අත්ථීති යථානුසන්ධිනාව දෙසනං නිට්ඨාපෙසීති.

මහාසාරොපමසුත්තං නවමං.

## 10.

**එවමෙව සුත්තන්ති** චූළ[1]සාරොපමං[2]. තත්ථ **පිඞ්ගලකොච්ඡොති** සො බ්‍රාහ්මණො පිඞ්ගලධාතුකො. **කොච්ඡොති** පනස්ස නාමං; තස්මා පිඞ්ගලකොච්ඡොති වුච්චති. **සඞ්ඝිනොති** ආදීසු පබ්බජිතසමූහසඞ්ඛාතො සඞ්ඝො එතෙසං අත්ථීති **සඞ්ඝිනො**. සොව ගණො එතෙසං අත්ථීති **ගණිනො**. ආචාරසික්ඛාපනවසෙන තස්ස ගණස්ස ආචරියාති **ගණාචරියා**. **ඤාතාති** පඤ්ඤාතා පාකටා. අප්පිච්ඡා, සන්තුට්ඨා, අප්පිච්ඡතාය වත්ථම්පි න නිවාසෙන්තීති ආදිනා නයෙන සමුග්ගතො **යසො** එතෙසං අත්ථීති **යසස්සිනො**. **තිත්ථකරාති** ලද්ධිකරා. **සාධුසම්මතාති**, ඉමෙ සාධු, සුන්දරා, සප්පුරිසාති එවං සම්මතා. **බහුජනස්සාති** අස්සුතවතො අන්ධබාලපුථුජ්ජනස්ස.

ඉදානි තෙ දස්සෙන්තො, **සෙය්‍යථීදං**: **පූරණොති** ආදිමාහ. තත්ථ **පූරණොති** තස්ස සත්ථුපටිඤ්ඤස්ස නාමං; **කස්සපොති** ගොත්තං. සො කිර අඤ්ඤතරස්ස කුලස්ස එකූනදාසසතං පූරයමානො ජාතො; තෙනස්ස **පූරණොති** නාමං අකංසු. මඞ්ගලදාසත්තා චස්ස දුක්කතන්ති වත්තා නත්ථි, අකතං වා[3] න කතන්ති. සො, කිමහං එත්ථ වසාමීති[4] පලායි. අථස්ස චොරා වත්ථානි අච්ඡින්දිංසු. සො පණ්ණෙන වා තිණෙන වා පටිච්ඡාදෙතුම්පි[5] අජානන්තො ජාතරූපෙනෙව[6] එකං ගාමං පාවිසි. මනුස්සා තං දිස්වා, අයං සමණො අරහා, අප්පිච්ඡො, නත්ථි ඉමිනා සදිසොති පූවභත්තාදීනි[7] ගහෙත්වා උපසඞ්කන්තා.[8] සො, මය්හං සාටකං අනිවත්ථභාවෙන ඉදං උප්පන්නන්ති තතො පට්ඨාය සාටකං ලභිත්වාපි න නිවාසෙසි; තදෙව පබ්බජ්ජං අග්ගහෙසි. තස්ස සන්තිකෙ අඤ්ඤෙපි, අඤ්ඤෙපීති පඤ්චසතා මනුස්සා පබ්බජිංසු. තං සන්ධායාහ: **පූරණො කස්සපොති**.

**මක්ඛලීති** තස්ස නාමං ගොසාලාය ජාතත්තා **ගොසාලොති** දුතියං නාමං තං කිර සකද්දමාය භූමියා තෙලඝටං ගහෙත්වා ගච්ඡන්තං, තාත මා ඛලීති සාමිකො ආහ. සො පමාදෙන ඛලිත්වා

1. චුල්ල-L. S
2. සාරොපමසුත්තං-B, S.
3. අකතං පන-M2. P2. T
4. වසිස්සාමීති-B. S.
5. පටිච්ඡාදෙතුං-S.
6. නග්ගරූපෙනෙව-S.
7. පුවභත්තාදීනි-L. S.
8. උපසඞ්කමන්ති-B, උපසඞ්කමන්තා-L. S.

පතිත්වා සාමිකස්ස භයෙන පලායිතුං ආරද්ධො. සාමිකො උපධාවිත්වා දණ්ඩකණ්ණෙ[1] අග්ගහෙසි. සො සාටකං ජහිත්වා අචෙලකො හුත්වා පලායි. සෙසං පූරණසදිසමෙව.

**අජිතො**ති තස්ස නාමං. කෙසකම්බලං ධාරෙතීති කෙසකම්බලී ඉති[2] නාමද්වයං සංසන්දෙත්වා **අජිතො කෙසකම්බලී**ති[2] වුච්චති. තත්ථ කෙසකම්බලො නාම මනුස්සකෙසෙහි කතකම්බලො. තතො පටිකිට්ඨතරං වත්ථං නාම නත්ථි. යථාහ: "සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි තන්තාවුතානං වත්ථානං, කෙසකම්බලො තෙසං පටිකිට්ඨො අක්ඛායති. කෙසකම්බලො භික්ඛවෙ සීතෙ සීතො, උණ්හෙ උණ්හො, දුබ්බණ්ණො, දුග්ගන්ධො, දුක්ඛසම්ඵස්සො"ති.

**පකුධො**ති තස්ස නාමං. **කච්චායනො**ති ගොත්තං. ඉති නාම ගොත්තං සංසන්දෙත්වා **පකුධො කච්චායනො**ති වුච්චති. සීතුදකපටික්ඛිත්තකො එස; වච්චං කත්වාපි උදකකිච්චං න කරොති; උණ්හොදකං වා කඤ්ජියං වා ලභිත්වා කරොති; නදිං වා මග්ගොදකං වා අතික්කම්ම, සීලං මෙ භින්නන්ති වාලිකථූපං කත්වා සීලං අධිට්ඨාය ගච්ඡති. එවරූප[3]නිස්සිරීකලද්ධිකො එස.

**සඤ්ජයො**ති තස්ස නාමං. බෙලට්ඨස්ස පුත්තොති **බෙලට්ඨපුත්තො**. අම්හාකං ගන්ථනකිලෙසො, පලිබුජ්ඣන[4]කිලෙසො නත්ථි, කිලෙසගණ්ඨිරහිතා මයන්ති එවංවාදිතාය ලද්ධනාමවසෙන **නිගණ්ඨො**. නාටස්ස පුත්තොති **නාටපුත්තො**. **අබ්භඤ්ඤංසූ**ති යථා තෙසං පටිඤ්ඤා, තථෙව ජානිංසු, න ජානිංසු. ඉදං වුත්තං හොති: සචෙ තෙසං සා පටිඤ්ඤා නිය්‍යානිකා, සබ්බෙ අබ්භඤ්ඤංසු; නො චෙ න අබ්භඤ්ඤංසු. තස්මා, කිං තෙසං පටිඤ්ඤා නිය්‍යානිකා න නිය්‍යානිකාති අයමෙතස්ස පඤ්හස්ස අත්ථො.

අථ භගවා, තෙසං අනිය්‍යානිකභාවකථනෙන අත්ථාභාවතො අලන්ති පටික්ඛිපිත්වා උපමාය අත්ථං පරිවාරෙන්තො[5] ධම්මමෙව දෙසෙතුං **ධම්මං තෙ බ්‍රාහ්මණ දෙසෙස්සාමී**ති ආදිමාහ. තත්ථ **සච්ඡිකිරියායා**ති සච්ඡිකරණත්ථං. **න ඡන්දං ජනෙතී**ති කත්තුකම්‍යතාඡන්දං න ජනෙති. **න වායමතී**ති වායාමං, පරක්කමං[6] න කරොති. **ඔලීනවුත්තිකො ච හොතී**ති ලීනජ්ඣාසයො[7] හොති. **සාථලිකො**ති[8] සිථිලගාහී; සාසනං සිථිලං කත්වා ගණ්හාති, දළ්හං න ගණ්හාති.

**ඉධ බ්‍රාහ්මණ භික්ඛු විවිච්චෙව කාමෙහී**ති කස්මා ඉමෙ පඨමජ්ඣානාදිධම්මා **ඤාණදස්සනෙන උත්තරිතරා** ජාතාති? නිරොධපාදකත්තා. හෙට්ඨා පඨමජ්ඣානාදිධම්මා හි විපස්සනාපාදකා, ඉමෙ නිරොධපාදකා,

---

1. සාටකකණ්ණෙ-B. S.
2. කෙසකම්බලෙන්ති-B. S.
3. එවරූපෙ-B. S.
4. පලිබුද්ධන-L, පලිබන්ධන-S.
5. අත්ථපදං පවෙදෙන්තො-S.
6. පයොගං පරක්කමං-L.
7. ලීනජ්ඣාසයො-B, S.
8. සාථිලිකොති-S.

තස්මා **උත්තරිතරා**ති වෙදිතබ්බා. ඉති භගවා ඉමම්පි සුත්තං යථානුසන්ධිනාව නිට්ඨාපෙසි. දෙසනාවසානෙ බ්‍රාහ්මණො සරණෙසු පතිට්ඨිතොති.

**චූළසාරොපමසුත්තං දසමං.**

## තතියවග්ගවණ්ණනා නිට්ඨිතා.

---

### 1.

**එවං මෙ සුත**න්ති චූළගොසිඞ්ගසුත්තං. තත්ථ **නාදිකෙ විහරතී**ති නාදිකා නාම එකං තළාකං නිස්සාය ද්වින්නං චූළපිතිමහාපිතිපුත්තානං ද්වෙ ගාමා, තෙසු එකස්මිං ගාමෙ. **ගිඤ්ජකාවසථෙ**ති ඉට්ඨකාමයෙ ආවසථෙ. එකස්මිං කිර සමයෙ භගවා මහාජනසඞ්ගහං කරොන්තො වජ්ජිරට්ඨෙ චාරිකං චරමානො නාදිකං අනුප්පත්තො. නාදිකවාසිනො මනුස්සා භගවතො මහාදානං දත්වා ධම්මකථං සුත්වා පසන්නහදයා, සත්ථු වසනට්ඨානං කරිස්සාමාති මන්තෙත්වා ඉට්ඨකාහෙව භිත්තිසොපානත්ථම්භවාළරූපාදීනි දස්සෙන්තා පාසාදං කත්වා සුධාය ලිම්පිත්වා මාලාකම්මලතාකම්මාදීනි නිට්ඨපෙත්වා භුම්මත්ථරණමඤ්චපීඨාදීනි පඤ්ඤපෙත්වා සත්ථු නිය්‍යාතෙසුං. අපරාපරං පනෙත්ථ මනුස්සා භික්ඛුසඞ්ඝස්ස රත්තිට්ඨාන-දිවාට්ඨාන-මණ්ඩප-චඞ්කමාදීනි කාරයිංසු. ඉති සො විහාරො මහා අහොසි. තං සන්ධාය වුත්තං: **ගිඤ්ජකාවසථෙ**ති. **ගොසිඞ්ගසාලවනදායෙ**ති, තත්ථ කිර[1] එකස්ස ජෙට්ඨකරුක්ඛස්ස ඛන්ධතො ගොසිඞ්ගසණ්ඨානං හුත්වා විටපං උට්ඨහි. තං රුක්ඛං උපාදාය සබ්බම්පි තං වනං **ගොසිඞ්ගසාලවන**න්ති සඞ්ඛං ගතං. **දායො**ති අවිසෙසෙන අරඤ්ඤස්සෙතං නාමං. තස්මා **ගොසිඞ්ගසාලවනදායෙ**ති ගොසිඞ්ගසාලවනඅරඤ්ඤෙති අත්ථො. **විහරන්තී**ති සාමග්ගිරසං අනුභවමානා විහරන්ති. ඉමෙසං හි කුලපුත්තානං උපරිපණ්ණාසකෙ පුථුජ්ජනකාලො කථිතො; ඉධ ඛීණාසවකාලො. තදා හි තෙ ලද්ධස්සාදා ලද්ධපතිට්ඨා අධිගතපටිසම්භිදා ඛීණාසවා හුත්වා සාමග්ගිරසං අනුභවමානා තත්ථ විහරිංසු. තං සන්ධායෙතං වුත්තං.

**යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුපසඞ්කමී**ති, ධම්මසෙනාපතිමහාමොග්ගල්ලානත්ථෙරෙසු වා අසීතිමහාසාවකෙසු වා අඤ්ඤතරම්පි ධම්මභණ්ඩාගාරිකං ආනන්දත්ථෙරම්පි කඤ්චි අනාමන්තෙත්වා සයමෙව පත්තචීවරං ආදාය අනීකා නිස්සටො හත්ථී විය, යූථා නිස්සටො කාළසීහො[2] විය, වාතච්ඡින්නො වලාහකො විය ච එකකොව උපසඞ්කමි.

කස්මා පනෙත්ථ භගවා සයං අගමාසීති? තයො කුලපුත්තා සාමග්ගිරසං අනුභවන්තා විහරන්ති, තෙසං පග්ගණ්හනතො, පච්ඡිමං ජනතං අනුකම්පනතො, ධම්මගරුභාවතො ච. එවං කිරස්ස අහොසි: අහං

---

1. තත්‍ර-B. S. 2. කෙසරසීහො-B.

ඉමෙ කුලපුත්තෙ පග්ගණ්හිත්වා උක්කංසිත්වා පටිසන්ථාරං කත්වා ධම්මං[1] දෙසෙස්සාමීති. එවං තාව පග්ගණ්හන්තො අගමාසි. අපරම්පිස්ස අහොසි: අනාගතෙ කුලපුත්තා, සම්මාසම්බුද්ධො සමග්ගවාසං වසන්තානං සන්තිකං සයං ගන්ත්වා පටිසන්ථාරං කත්වා ධම්මං කථෙත්වා තයො කුලපුත්තෙ[2] පග්ගණ්හි, සො නාම සමග්ගවාසං න වසෙය්‍යාති සමග්ගවාසං වසිතබ්බං මඤ්ඤමානා ඛිප්පමෙව දුක්ඛස්සන්තං කරිස්සන්තීති. එවං පච්ඡිමං ජනතං අනුකම්පන්තොපි අගමාසි. බුද්ධා ච නාම ධම්මගරුනො හොන්ති. සො ච තෙසං ධම්මගරුභාවො රථවිනීතෙ ආවිකතොව[3]. ඉති ඉමස්මා ධම්මගරුභාවතොපි ධම්මං පග්ගණ්හිස්සාමීති අගමාසි.

**දායපාලො**ති අරඤ්ඤපාලො. සො තං අරඤ්ඤං යථා ඉච්ඡිතිච්ඡිත පදෙසෙන මනුස්සා පවිසිත්වා තත්ථ පුප්ඵං වා ඵලං වා නිය්‍යාසං වා දබ්බසම්භාරං වා න හරන්ති, එවං වතියා පරික්ඛිත්තස්ස තස්ස අරඤ්ඤස්ස යොජිතෙ ද්වාරෙ නිසීදිත්වා තං අරඤ්ඤං රක්ඛති, පාලෙති, තස්මා **දායපාලො**ති වුත්තො.

**අත්තකාමරූපා**ති අත්තනො හිතං කාමයමානසභාවා හුත්වා විහරන්ති. යො හි ඉමස්මිං සාසනෙ පබ්බජිත්වාපි වෙජ්ජකම්මදූතකම්ම පහිණගමනාදීනං වසෙන එකවීසතිඅනෙසනාහි ජීවිකං කප්පෙති, අයං න අත්තකාමරූපො නාම. යො පන ඉමස්මිං සාසනෙ පබ්බජිත්වා එකවීසතිඅනෙසනා[4] පහාය චතුපාරිසුද්ධිසීලෙ පතිට්ඨාය බුද්ධවචනං උග්ගණ්හිත්වා සප්පායධුතඞ්ගං අධිට්ඨාය අට්ඨතිංසාය ආරම්මණෙසු චිත්තරුචියං කම්මට්ඨානං ගහෙත්වා ගාමන්තං පහාය අරඤ්ඤං පවිසිත්වා සමාපත්තියො නිබ්බත්තෙත්වා විපස්සනාය කම්මං කුරුමානො විහරති,[5] අයං අත්තකාමරූපො[6] නාම. තෙපි තයො කුලපුත්තා එවරූපා අහෙසුං. තෙන වුත්තං: **අත්තකාමරූපා විහරන්තී**ති.

**මා තෙසං අඵාසුමකාසී**ති තෙසං මා අඵාසුකං අකාසීති භග
වන්තං වාරෙසි. එවං කිරස්ස අහොසි: ඉමෙ කුලපුත්තා සමග්ගා විහරන්ති. එකච්චස්ස ච ගතට්ඨානෙ භණ්ඩනකලහවිවාදා වත්තන්ති; තිඛිණසිඞ්ගො චණ්ඩගොණො විය ඔවිජ්ඣන්තො විචරති. අථෙකමග්ගෙන ද්වින්නං ගමනං න හොති. කදාචි අයම්පි එවං කරොන්තො ඉමෙසං කුලපුත්තානං සමග්ගවාසං[7] භින්දෙය්‍ය. පාසාදිකො ච පනෙස සුවණ්ණවණ්ණො. රසගිද්ධො මඤ්ඤෙ. ගතකාලතො පට්ඨාය පණීතදායකානං අත්තනො උපට්ඨාකානඤ්ච වණ්ණකථනාදීහි ඉමෙසං කුල පුත්තානං අප්පමාදවිහාරං භින්දෙය්‍ය. වසනට්ඨානානි චාපි[8] එතෙසං කුලපුත්තානං නිබද්ධානි, පරිච්ඡින්නානි; තිස්සො ච පණ්ණසාලා,

1. ධම්මං තෙසං-B. S. 2. තයො පුග්ගලෙ-L 3. ආගතොව-B. S.
4. අනෙසනං-L. B. S. 5. විචරති-B. S. 6. අත්තකාමො-L. B. S.
7. සමග්ගභාවං-L. 8. වසනට්ඨානානිපි-S.

තයො චඞ්කමා, තීණි දිවාට්ඨානානි, තීණි මඤ්චපීඨානි. අයම්පන සමණො මහාකායො, බුද්ධන්තරෙ මෙ සෙදකො භවිස්සති. සො අකාලෙ ඉමෙ කුලපුත්තෙ සෙනාසනා වුට්ඨාපෙස්සති. එවං සබ්බථාපි එතෙසං අඵාසු භවිස්සතීති. තං අනිච්ඡන්තො, මා තෙසං අඵාසුමකාසීති භගවන්තං වාරෙසි.

කිං පනෙස ජානන්තො වාරෙසි, අජානන්තොති? අජානන්තො. කිඤ්චාපි හි තථාගතස්ස පටිසන්ධිගහණතො පට්ඨාය දසසහස්සචක්කවාළකම්පනාදීනි පාටිහාරියානි පවත්තිංසු, අරඤ්ඤවාසිනො පන දුබ්බලමනුස්සා කම්මපසුතා තානි සල්ලක්ඛෙතුං න සක්කොන්ති. සම්මාසම්බුද්ධො ච නාම යදා අනෙකභික්ඛුසහස්සපරිවාරො බ්‍යාමප්පභාය, අසීති-අනුබ්‍යඤ්ජනෙහි, ද්වත්තිංසමහාපුරිසලක්ඛණසිරියා ච බුද්ධානුභාවං දස්සෙන්තො විචරති, තදා කො එසොති අපුච්ඡිත්වාව[1] ජානිතබ්බො හොති. තදා පන භගවා සබ්බම්පි තං බුද්ධානුභාවං විවරගබ්භෙන[2] පටිච්ඡාදෙත්වා වලාහකගබ්භෙන[2] පටිච්ඡන්නො චන්දො[3] විය සයමෙව පත්තචීවරමාදාය අඤ්ඤාතකවෙසෙන අගමාසි. ඉති තං අජානන්තොව දායපාලො නිවාරෙසි.

එතදවොචාති ථෙරො කිර, මා සමණාති දායපාලස්ස කථං සුත්වාව චින්තෙසි: මයං තයො ජනා ඉධ විහරාම; අඤ්ඤො පබ්බජිතො නාම නත්ථි; අයඤ්ච දායපාලො පබ්බජිතෙන විය සද්ධිං කථෙති;[4] කො නු ඛො භවිස්සතීති දිවාට්ඨානතො උට්ඨාය ද්වාරෙ ඨත්වා මග්ගං ඔලොකෙන්තො භගවන්තං අද්දස. භගවාපි ථෙරස්ස සහ දස්සනෙනෙව සරීරොභාසං මුඤ්චි; අසීති-අනුබ්‍යඤ්ජනවිරාජිතා බ්‍යාමප්පභා පසාරිත සුවණ්ණපටො විය විරොචිත්ථ. ථෙරො, අයං දායපාලො එකකං ආසිවිසං ගීවාය[5] ගහෙතුං හත්ථං පසාරෙන්තො විය ලොකෙ අග්ගපුග්ගලෙන සද්ධිං කථෙන්තොව න ජානාති, අඤ්ඤතරභික්ඛුනා විය සද්ධිං කථෙතීති නිවාරෙන්තො එතං, මා ආවුසො දායපාලාති ආදි වචනං අවොච.

තෙනුපසඞ්කමීති කස්මා භගවතො පච්චුග්ගමනං අකත්වාව උපසඞ්කමි? එවං කිරස්ස අහොසි: මයං තයො ජනා සමග්ගවාසං වසාම; සචාහං එකකොව පච්චුග්ගමනං කරිස්සාමි, සමග්ගවාසො නාම න භවිස්සති; පියමිත්තෙ ගහෙත්වාව පච්චුග්ගමනං කරිස්සාමි; යථා ච භගවා මය්හං පියො එවං සහායානම්පි මෙ පියොති තෙහි සද්ධිං පච්චුග්ගමනං කාතුකාමො සයං අකත්වාව උපසඞ්කමි. කෙචි පන, තෙසං ථෙරානං පණ්ණසාලාද්වාරෙ චඞ්කම[6]කොටියා භගවතො ආගමනමග්ගො හොති, තස්මා ථෙරො තෙසං සන්තිකං දදමානොව ගතොති.

---

1. පුච්ඡිත්වාව-S. 2. ගබ්භෙ-S. 3. පුණ්ණචන්දො-S. E.
4. කථෙසි-L. 5. එකකත ආසිවිසං-S 6. චඞ්කමන්ත-L, B, S.

**අභික්කමථාති** ඉතො ආගච්ඡථ. **පාදෙ පක්ඛාලෙසීති** විකසිතපදුමසන්නිභෙහි ජාලහත්ථෙහි මණිවණ්ණං උදකං ගහෙත්වා සුවණ්ණවණ්ණෙසු පිට්ඨිපාදෙසු උදකං ආසිඤ්චිත්වා[1] පාදෙන පාදං සංඝංසන්තො පක්ඛාලෙසි. බුද්ධානං කායෙ රජොජල්ලං නාම න උපලිම්පති, කස්මා පක්ඛාලෙසීති? සරීරස්ස උතුග්ගහණත්ථං, තෙසඤ්ච චිත්තසම්පහංසනත්ථං. අම්හෙහි අභිහටෙන උදකෙන භගවා පාදෙ පක්ඛාලෙසි, පරිභොගං අකාසීති හි තෙසං භික්ඛූනං බලවසොමනස්සවසෙන චිත්තං පීණිතං[2] හොති; තස්මා පක්ඛාලෙසි.

**ආයස්මන්තං අනුරුද්ධං භගවා එතදවොචාති** සො කිර තෙසං බුඩ්ඪතරො; තස්ස සඞ්ගහෙ කතෙ සෙසානං කතොව හොතීති ථෙරස්සෙව එතං, **කච්චි වො අනුරුද්ධාති** ආදිවචනං අවොච. තත්ථ **කච්චීති** පුච්ඡනත්ථෙ නිපාතො; **වොති** සාමිවචනං. ඉදං වුත්තං හොති: කච්චි අනුරුද්ධා තුම්හාකං **ඛමනීයං**, ඉරියාපථො වො ඛමති? **කච්චි යාපනීයං**, කච්චි වො ජීවිතං යාපෙති, ඝටියති? **කච්චි පිණ්ඩකෙන න කිලමථ**, කච්චි තුම්හාකං පිණ්ඩො සුලභො? සම්පත්තෙ වො දිස්වා මනුස්සා උළුඞ්කයාගුං වා කටච්ඡුභික්ඛං වා දාතබ්බං මඤ්ඤන්තීති භික්ඛාචාරවත්තං පුච්ඡති. කස්මා? පච්චයෙන අකිලමන්තෙන හි[3] සක්කා සමණධම්මො කාතුං; වත්තමෙව[4] වා එතං පබ්බජිතානං.

අථ තෙන පටිවචනෙ දින්නෙ, අනුරුද්ධා තුම්හෙ රාජපබ්බජිතා, මහාපුඤ්ඤා, මනුස්සා තුම්හාකං අරඤ්ඤෙ වසන්තානං අදත්වා කස්සඤ්ඤස්ස දාතබ්බං මඤ්ඤිස්සන්ති, තුම්හෙ පන එතං[5] භුඤ්ජිත්වා කින්නු ඛො මිගපොතකා විය අඤ්ඤමඤ්ඤං සඞ්ඝට්ටෙන්තා[6] විහරථ, උදාහු සාමග්ගියං[7] වො අත්ථීති සාමග්ගිරසං පුච්ඡන්තො, **කච්චි පන වො අනුරුද්ධා සමග්ගාති** ආදිමාහ. තත්ථ **ඛීරොදකීභූතාති** යථා ඛීරඤ්ච උදකඤ්ච අඤ්ඤමඤ්ඤං සංසන්දති, විසුං න හොති, එකත්තං විය උපෙති, කච්චි එවං සාමග්ගිවසෙන එකත්තූපගතචිත්තුප්පාදා විය විහරථාති පුච්ඡති. **පියචක්ඛූහීති** මෙත්තචිත්තං පච්චුපට්ඨපෙත්වා[8] ඔලොකනචක්ඛූහි පියචක්ඛූහි නාම. කච්චි තථාරූපෙහි චක්ඛූහි අඤ්ඤමඤ්ඤං සම්පස්සන්තා විහරථාති පුච්ඡති. **තග්ඝාති** එකංසෙන නිපාතො. එකංසෙන මයං භන්තෙති වුත්තං හොති.

**යථා කථං පනාති** එත්ථ **යථාති** නිපාතමත්තං. **කථන්ති** කාරණපුච්ඡා. කථං පන තුම්හෙ එවං විහරථ, කෙන කාරණෙන විහරථ, තං මෙ කාරණං බ්‍රූථාති වුත්තං හොති. **මෙත්තං කායකම්මන්ති** මෙත්තචිත්තවසෙන පවත්තං කායකම්මං. **ආවි චෙව රහො චාති** සම්මුඛා චෙව පරම්මුඛා ච. **ඉතරෙසුපි** එසෙව නයො.

තත්ථ සම්මුඛා කායවචීකම්මානි සහවාසෙ ලබ්භන්ති; ඉතරානි විප්පවාසෙ. මනොකම්මං සබ්බත්ථ ලබ්භති. යං හි සහවසන්තෙසු එකො

1. උදකම්හි සිඤ්චිත්වා-S. 2. පණීතං-L. 3. අකිලමන්තෙනාපි-L.
4. වත්තබ්බමෙව-L. 5. එවරූපං-A. M2. P2; එවං-T. 6. ඝට්ටෙන්තා-B. S.
7. සාමග්ගිභාවො-L B. 8. පච්චුපට්ඨාපෙත්වා-L.

මඤ්චපීඨං වා දාරුභණ්ඩං වා මත්තිකාභණ්ඩං වා බහි දුන්නික්ඛිත්තං හොති, තං දිස්වා, කෙනිදං වළඤ්ජිතන්ති අවත්වා අත්තනා දුන්නික්ඛිත්තං විය ගහෙත්වා පටිසාමෙන්තස්ස, පටිජග්ගිතබ්බයුත්තං වා පන ඨානං පටිජග්ගන්තස්ස සම්මුඛා මෙත්තං කායකම්මං නාම හොති. එකස්මිං පක්කන්තෙ තෙන දුන්නික්ඛිත්තං සෙනාසනපරික්ඛාරං තථෙව නික්ඛිපන්තස්ස ජග්ගිතබ්බයුත්තට්ඨානං වා පන ජග්ගන්තස්ස පරම්මුඛා මෙත්තං කායකම්මං නාම හොති.

සහවසන්තස්ස පන ථෙරෙහි සද්ධිං මධුරං සම්මොදනීයකථං පටිසන්ථාරං සාරණීයකථං[1] ධම්මකථං සරභඤ්ඤං පඤ්හ[2]පුච්ඡනං පඤ්හ[2]විස්සජ්ජනන්ති එවමාදිකරණෙ සම්මුඛා මෙත්තං වචීකම්මං නාම හොති. ථෙරෙසු පන පක්කන්තෙසු, මය්හං පියසහායො නන්දියත්ථෙරො කිම්බිලත්ථෙරො එවං සීලසම්පන්නො, එවං ආචාරසම්පන්නොති ආදිගුණකථනං[3] පරම්මුඛා මෙත්තං වචීකම්මං නාම හොති. මය්හං පියමිත්තො නන්දියත්ථෙරො කිම්බිලත්ථෙරො අවෙරො හොතු අබ්‍යාපජ්ජො සුඛීති[4] එවං සමන්නාහරතො පන සම්මුඛාපි පරම්මුඛාපි මෙත්තං මනොකම්මං හොතියෙව.

**නානා හි ඛො නො භන්තෙ කායා**ති කායං හි පිට්ඨං විය මත්තිකා විය ච ඔමද්දිත්වා එකතො කාතුං න සක්කා. **එකඤ්ච පන මඤ්ඤෙ චිත්ත**න්ති චිත්තං පන නො සහිතට්ඨෙන නිරන්තරට්ඨෙන අවිග්ගහිතට්ඨෙන[5] සමග්ගට්ඨෙන එකමෙවාති දස්සෙති. කථං පනෙතෙ සකං චිත්තං නික්ඛිපිත්වා ඉතරෙසං චිත්තවසෙන වත්තිංසූති? එකස්ස පත්තෙ මලං උට්ඨහති, එකස්ස චීවරං කිලිට්ඨං හොති, එකස්ස පරිභණ්ඩකම්මං හොති. තත්ථ යස්ස පත්තෙ මලං උට්ඨිතං තෙන මමාවුසො පත්තෙ මලං උට්ඨිතං, පචිතුං වට්ටතීති වුත්තෙ, ඉතරෙ මය්හං චීවරං කිලිට්ඨං. තං ධොවිතබ්බං, මය්හං පරිභණ්ඩං කාතබ්බන්ති අවත්වා අරඤ්ඤං පවිසිත්වා දාරූනි ආහරිත්වා ඡින්දිත්වා[6] පත්තකටාහෙ පරිභණ්ඩං කත්වා පත්තං පචිත්වා තතො පරං චීවරං වා ධොවන්ති, පරිභණ්ඩං වා කරොන්ති. මමාවුසො චීවරං කිලිට්ඨං, ධොවිතුං වට්ටති, මම පණ්ණසාලා උක්ලාපා, පරිභණ්ඩං කාතුං වට්ටතීති පඨමතරං ආරොචිතෙපි එසෙව නයො. **සාධු සාධු අනුරුද්ධා**ති, භගවා හෙට්ඨා, න ච මයං භන්තෙ පිණ්ඩකෙන කිලමාමාති වුත්තෙ, න සාධුකාරමදාසි. කස්මා? අයං හි කබළීකාරාහාරො නාම ඉමෙසං සත්තානං අපායලොකෙපි දෙවමනුස්සලොකෙපි ආචිණ්ණසමාචිණ්ණොව. අයම්පන ලොකසන්නිවාසො යෙභුය්‍යෙන විවාදපක්ඛන්නො. අපායලොකෙපි හි[7] දෙවමනුස්සලොකෙපි ඉමෙ සත්තා පටිවිරුද්ධා එව. එතෙසං සාමග්ගිකාලො දුල්ලභො; කදාචිදෙව හොතීති සමග්ගවාසස්ස දුල්ලභත්තා ඉධ භගවා සාධුකාරමදාසි.

1. සාරණීයං කථං-S. 2. පඤ්හා-B. P. E. 3. ගුණකථනෙ-L, ගුණකථං-S.
4. සුඛී හොන්තූති-B. S. 5. අවිගතට්ඨෙන-S. අවිග්ගහණට්ඨෙන-B.
6. භින්දිත්වා-L. 7. අපායලොකෙපි-S.

ඉඞ්ඝති තෙසං අප්පමාදලක්ඛණං පුච්ඡන්තො, **කච්චි පන වො අනුරුද්ධාති** ආදිමාහ. තත්ථ **වොති** නිපාතමත්තං; පච්චත්තවචනං වා. කච්චි තුම්හෙති අත්ථො. **අම්හාකන්ති** අම්හෙසු තීසු ජනෙසු. **පිණ්ඩාය පටික්කමතීති** ගාමෙ පිණ්ඩාය චරිත්වා පච්චාගච්ඡති. **අවක්කාරපාතින්ති** අතිරෙකපිණ්ඩපාතං අපනෙත්වා ඨපනත්ථාය එකං සමුග්ගපාතිං ධොවිත්වා ඨපෙති.

**යො පච්ඡාති**, තෙ කිර ථෙරා න එකතොව භික්ඛාචාරං පවිසන්ති. ඵලසමාපත්තිරතා හෙතෙ. පාතොව සරීරපටිජග්ගනං කත්වා වත්තපටිපත්තිං[1] පූරෙත්වා සෙනාසනං පවිසිත්වා කාලපරිච්ඡෙදං කත්වා ඵලසමාපත්තිං අප්පෙත්වා නිසීදන්ති. තෙසු යො පඨමතරං නිසින්නො අත්තනො කාලපරිච්ඡෙදවසෙන පඨමතරං උට්ඨාති, සො පිණ්ඩාය චරිත්වා පටිනිවත්තෙත්වා භත්තකිච්චට්ඨානං ආගන්ත්වා ජානාති: ද්වෙ භික්ඛූ පච්ඡතො,[2] අහං පඨමතරං ආගතොති. අථ පත්තං පිදහිත්වා[3] ආසනපඤ්ඤපනාදීනි කත්වා, යදි පත්තෙ පටිවිංස[4]මත්තමෙව හොති, නිසීදිත්වා භුඤ්ජති; යදි අතිරෙකං හොති, අවක්කාරපාතියං පක්ඛිපිත්වා පාතිං පිධාය භුඤ්ජති. කතභත්තකිච්චො පත්තං ධොවිත්වා වොදකං[5] කත්වා ථවිකාය ඔසාපෙත්වා ආසනානි උක්ඛිපිත්වා පත්තචීවරං ගහෙත්වා අත්තනො වසනට්ඨානං පවිසති. දුතියොපි ආගන්ත්වාව ජානාති: එකො පඨමං ආගතො, එකො පච්ඡතොති. සො, සචෙ පත්තෙ භත්තං පමාණමෙව හොති, භුඤ්ජති; සචෙ මන්දං අවක්කාරපාතිතො ගහෙත්වා භුඤ්ජති; සචෙ අතිරෙකං හොති, අවක්කාරපාතියං පක්ඛිපිත්වා පමාණමෙව භුඤ්ජිත්වා පුරිමථෙරො විය වසනට්ඨානං පවිසති. තතියොපි ආගන්ත්වාව ජානාති: ද්වෙ පඨමං ආගතා, අහං පච්ඡතොති.[6] සොපි දුතියථෙරො විය භුඤ්ජිත්වා කතභත්තකිච්චො පත්තං ධොවිත්වා වොදකං[5] කත්වා ථවිකාය ඔසාපෙත්වා ආසනානි උක්ඛිපිත්වා පටිසාමෙති. පානීයඝටෙ වා පරිභොජනීයඝටෙ වා අවසෙසං උදකං ඡඩ්ඩෙත්වා ඝටෙ නික්කුජ්ජිත්වා[7] අවක්කාරපාතියං සචෙ අවසෙසභත්තං හොති, තං වුත්තනයෙන හරිත්වා පාතිං ධොවිත්වා පටිසාමෙති; භත්තග්ගං සම්මජ්ජති. තතො කචවරං ඡඩ්ඩෙත්වා සම්මජ්ජනිං උක්ඛිපිත්වා උපචිකාහි මුත්තට්ඨානෙ ඨපෙත්වා පත්තචීවරං ආදාය වසනට්ඨානං පවිසති. ඉදං ථෙරානං බහිවිහාරෙ අරඤ්ඤෙ භත්තකිච්චකරණට්ඨානෙ භොජනසාලාය වත්තං. ඉදං සන්ධාය **යො පච්ඡාති** ආදි වුත්තං.

**යො පස්සතීති** ආදි පන නෙසං අන්තොවිහාරෙ වත්තන්ති වෙදිතබ්බං. තත්ථ **වච්චඝටන්ති** ආචමනකුම්භිං. **රිත්තන්ති** රිත්තකං; **තුච්ඡන්ති** තස්සෙව වෙවචනං. **අවිසය්හන්ති** උක්ඛිපිතුං අසක්කුණෙය්‍යං, අතිභාරියං. **හත්ථවිකාරෙනාති** හත්ථසඤ්ඤාය. තෙ කිර

1. වත්තපටිවත්තං-L. කත්වා පටිපත්තිං-S. 2. පච්ඡා-B. S.
3. සංපිදහිත්වා-B. S. 4. පටිවිස-E. S. 5. නිරොදකං-S.
6. පච්ඡිමොති-L. B. 7. නික්කුජ්ජිත්වා-T1. S. E.

පානීයඝටාදීසු යං කිඤ්චි තුච්ඡං, තං ගහෙත්වා පොක්ඛරණිං ගන්ත්වා අන්තො ච බහි ච ධොවිත්වා උදකං පරිස්සාවෙත්වා තීරෙ ඨපෙත්වා අඤ්ඤං භික්ඛුං හත්ථවිකාරෙන ආමන්තෙන්ති; ඔදිස්ස වා අනොදිස්ස වා සද්දං න කරොන්ති. කස්මා ඔදිස්ස[1] න කරොන්ති? තං භික්ඛුං සද්දො බාධෙය්‍යාති. කස්මා අනොදිස්ස[2] න කරොන්ති? අනොදිස්ස සද්දෙ දින්නෙ, අහං පුරෙ, අහං පුරෙති ද්වෙපි නික්ඛමෙය්‍යුං; තතො ද්වීහි කාතබ්බකම්මෙ තතියස්ස කම්මවෙජ්ජෙ භවෙය්‍ය. සංයතපදසද්දො පන හුත්වා අපරස්ස භික්ඛුනො දිවාට්ඨානසන්තිකං ගන්ත්වා තෙන දිට්ඨභාවං ඤත්වා හත්ථසඤ්ඤං කරොති. තාය සඤ්ඤාය ඉතරො ආගච්ඡති. තතො ද්වෙ ජනා හත්ථෙන හත්ථං සංසිබ්බන්තා ද්වීසු හත්ථෙසු ඨපෙත්වා උපට්ඨපෙන්ති. තං සන්ධායාහ: **හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨපෙමාති.**

**පඤ්චාහිකං ඛො පනාති,** චාතුද්දසෙ පන්නරසෙ අට්ඨමියන්ති ඉදං තාව පකතිධම්මස්සවනමෙව. තං අඛණ්ඩං කත්වා පඤ්චමෙ පඤ්චමෙ දිවසෙ ද්වෙ ථෙරා නාතිවිකාලෙ නහායිත්වා අනුරුද්ධත්ථෙරස්ස වසනට්ඨානං ගච්ඡන්ති. තත්ථ තයොපි නිසීදිත්වා තිණ්ණං පිටකානං අඤ්ඤතරස්මිං අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති; අඤ්ඤමඤ්ඤං විස්සජ්ජෙන්ති. තෙසං එවං කරොන්තානංයෙව අරුණං උග්ගච්ඡති. තං සන්ධායෙතං වුත්තං.

එත්තාවතා ථෙරෙන භගවතා අප්පමාදලක්ඛණං පුච්ඡිතෙන පමාදට්ඨානෙසුයෙව අප්පමාදලක්ඛණං විස්සජ්ජිතං හොති. අඤ්ඤෙසඤ්හි භික්ඛූනං භික්ඛාචාරං පවිසනකාලො, නික්ඛමනකාලො, නිවාසනපරිවත්තනං, චීවරපාරුපනං, අන්තොගාමෙ පිණ්ඩාය චරණං, ධම්මකථනං, අනුමොදනං, අන්තොගාමතො[3] නික්ඛමිත්වා භත්තකිච්චකරණං, පත්තධොවනං, පත්තඔසාපනං, පත්තචීවරපටිසාමනන්ති පපඤ්චකරට්ඨානානි එතානි. තස්මා ථෙරා, අම්හාකං එත්තකං ඨානං මුඤ්චිත්වා පමාදකාලො නාම නත්ථීති දස්සෙන්තා පමාදට්ඨානෙසුයෙව අප්පමාදලක්ඛණං විස්සජ්ජෙසි.

අථස්ස භගවා සාධුකාරං දත්වා පඨමජ්ඣානං පුච්ඡන්තො පුන, **අත්ථි පන වොති** ආදිමාහ. තත්ථ **උත්තරිමනුස්සධම්මාති** මනුස්සධම්මතො උත්තරි. **අලමරියවිසෙසොති**[4] අරියභාවකරණසමත්ථො විසෙසො[5]. **කිං හි නො සියා** භන්තෙති, භන්තෙ කස්මා නාධිගතො භවිස්සති; අධිගතොයෙවාති. **යාවදෙවාති** යාවදෙ එව.[6]

එවං පඨමජ්ඣානාධිගමෙ බ්‍යාකතෙ දුතියජ්ඣානාදීනි පුච්ඡන්තො, **එතස්ස පන වොති** ආදිමාහ. තත්ථ **සමතික්කමායාති** සමතික්කමත්ථාය. **පටිප්පස්සද්ධියාති** පටිප්පස්සද්ධත්ථාය. සෙසං සබ්බත්ථ වුත්තන

1. ඔදිස්ස සද්දං-S. E, 2. අනොදිස්ස සද්දං-S. E. 3. ගාමතො-S. E
4. අලමරියඤාණදස්සනවිසෙසොති-S, E, 5. ඤාණදස්සනවිසෙසො-S.
6. යාවදෙව-L, යාව එව-S, E.

නයෙනෙව වෙදිතබ්බං. පච්ඡිමපක්ඛෙ පන ලොකුත්තරඤාණදස්සනවසෙන අධිගතං නිරොධසමාපත්තිං පුච්ඡන්තො, **අලමරියඤාණදස්සනවිසෙසොති** ආහ.[1] ථෙරොපි[2] පුච්ඡානුරූපෙනෙව බ්‍යාකාසි. තත්ථ යස්මා වෙදයිතසුඛතො අවෙදයිතසුඛං සන්තතරං හොති,[3] තස්මා, **අඤ්ඤං ඵාසුවිහාරං උත්තරිතරං වා පණීතතරං වා න සමනුපස්සාමාති** ආහ.

**ධම්මියා කථායාති** සාමග්ගිරසානිසංසපටිසංයුත්තාය ධම්මකථාය. සබ්බෙපි තෙ[4] චතූසු සච්චෙසු පරිනිට්ඨිතකිච්චා, තෙන තෙසං පටිවෙධත්ථාය කිඤ්චි කථෙතබ්බං නත්ථි. සාමග්ගිවාසෙන[5] පන, අයඤ්ච අයඤ්ච ආනිසංසොති සාමග්ගිරසානිසංසමෙව තෙසං භගවා කථෙසි.

**භගවන්තං අනුසංසාවෙත්වාති**[6] අනුගන්ත්වා. තෙ කිර භගවතො පත්තචීවරං ගහෙත්වා ථොකං අගමංසු. අථ භගවා විහාරූපචාර[7] පරියන්තං ගතකාලෙ, ආහරථ මෙ පත්තචීවරං, තුම්හෙ ඉධෙව තිට්ඨථාති[8] පක්කාමි. **තතො පටිනිවත්තිත්වාති** තතො ඨිතට්ඨානතො නිවත්තිත්වා. **කිං නු මයං**[9] **ආයස්මන්තොති** භගවන්තං නිස්සාය පබ්බජ්ජාදීනි අධිගතත්තාපි අත්තනො ගුණකථාය අට්ටියමානා අධිගමප්පිච්ඡතාය ආහංසු. **ඉමාසඤ්ච ඉමාසඤ්චාති** පඨමජ්ඣානාදීනං ලොකියලොකුත්තරානං.

**චෙතසා චෙතො පරිච්ච විදිතොති** අජ්ජෙමෙ ආයස්මන්තො ලොකියසමාපත්තියා වීතිනාමෙසුං, අජ්ජ ලොකුත්තරායාති එවං චිත්තෙන චිත්තං පරිච්ඡින්දිත්වා විදිතං. **දෙවතාපි මෙති**, භන්තෙ අනුරුද්ධ අජ්ජ අය්‍යො නන්දියත්ථෙරො, අජ්ජ අය්‍යො කිම්බිලත්ථෙරො ඉමාය ච ඉමාය ච සමාපත්තියා වීතිනාමෙසීති එවමාරොචෙසුන්ති අත්ථො. **පඤ්හාභිපුට්ඨෙනාති**, තම්පි මයා සයං විදිතන්ති වා දෙවතාහි ආරොචිතන්ති වා එත්තකෙනෙව මුඛං මෙ සජ්ජන්ති කථං සමුට්ඨාපෙත්වා අපුට්ඨෙනෙව මෙ න කථිතං; භගවතා පන පඤ්හාභිපුට්ඨෙන පඤ්හං අභිපුච්ඡිතෙන සතා බ්‍යාකතං; තත්‍ර මෙ කිං න රොචථාති[10] ආහ.

**දීඝොති**, "මණි මාණිචරෙ දීඝො අථො සෙරීස්සකො සහා"ති එවං ආගතො[11] අට්ඨවීසතියා යක්ඛසෙනාපතීනං අබ්භන්තරෙ එකො දෙවරාජා. **පරජනොති** තස්සෙව යක්ඛස්ස නාමං. **යෙන භගවා තෙනුපසඞ්කමීති** සො කිර වෙස්සවණෙන පෙසිතො එකං ඨානං ගච්ඡන්තො භගවන්තං සයං පත්තචීවරං ගහෙත්වා ගිඤ්ජකාවසථා ගොසිඞ්ගසාලවනස්ස අන්තරෙ දිස්වා, භගවා අත්තනා[12] පත්තචීවරං ගහෙත්වා

1. ආදිමාහ-A, M2, P2.
2. ථෙරො-S.
3. සන්තතරං ච හොති පණීතතරං හොති-S.
4. සබ්බෙපි-S; සබ්බෙපි හි-L.
5. රසෙන-S; රසෙ-E.
6. "අනුසංසාවෙත්වාති වා පාඨො"-T2. අනුසාරෙත්වාති-S.
7. විහාරපරිවෙණ-S; විහාරස්ස පරිවෙණ-B.
8. ඉධ වසථාති-S.
9. කින්නු ඛො මයං-S, E.
10. කිං නරොචථාති-L; තත්‍ර කිං න රොචථාති-S
11. ආගතානං පඤ්හාභිපුච්ඡානං-S.
12. අත්තනො-A. W2

ගොසිඞ්ගසාලවනෙ තිණ්ණං කුලපුත්තානං සන්තිකං ගච්ඡති, අජ්ජ මහතී ධම්මදෙසනා භවිස්සති, මයාපි තස්සා දෙසනාය භාගිනා භවිතබ්බන්ති දිස්සමානෙන[1] කායෙන සද්ධිං පදානුපදිකො ගන්ත්වා අවිදූරෙ ඨත්වා ධම්මං සුත්වා සත්ථරි ගච්ඡන්තෙපි න ගතො; ඉමෙ ථෙරා කිං කරිස්සන්තීති දස්සනත්ථං පන තත්ථෙව ඨිතො. අථ තෙ ද්වෙ ථෙරෙ අනුරුද්ධත්ථෙරං පලිවෙඨෙන්තෙ[2] දිස්වා, ඉමෙ ද්වෙ ථෙරා භගවන්තං නිස්සාය පබ්බජ්ජාදයො සබ්බගුණෙ අධිගන්ත්වාපි භගවතොව මච්ඡරායන්ති, න සහන්ති, අතිවිය නිලීයන්ති, පටිච්ඡාදෙන්ති, හන්ද නෙසං පටිච්ඡාදෙතුං දස්සාමි, පඨවිතො යාව බ්‍රහ්මලොකා එතෙසං ගුණෙ පකාසෙස්සාමීති චින්තෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි.

**ලාභා භණන්ති** යෙ භන්තෙ වජ්ජිරට්ඨවාසිනො භගවන්තඤ්ච ඉමෙ ච තයො කුලපුත්තෙ පස්සිතුං ලභන්ති, වන්දිතුං ලභන්ති, දෙය්‍යධම්මං දාතුං ලභන්ති, ධම්මං සොතුං ලභන්ති, තෙසං ලාභා භන්තෙ වජ්ජීනන්ති අත්ථො. **සද්දං සුත්වාති** සො කිර අත්තනො යක්ඛානුභාවෙන මහන්තං සද්දං කත්වා සකලං වජ්ජිරට්ඨං අජ්ඣොත්ථරන්තො තං වාචං නිච්ඡාරෙසි. තෙනස්ස තෙසු තෙසු රුක්ඛපබ්බතාදීසු අධිවත්ථා භුම්මා දෙවතා සද්දං අස්සොසුං. තං සන්ධාය වුත්තං: **සද්දං සුත්වාති. අනුස්සාවෙසුන්ති** මහන්තං සද්දං කත්වා සාවෙසුං. එස නයො සබ්බත්ථ. **යාව බ්‍රහ්මලොකාති** යාව අකනිට්ඨබ්‍රහ්මලොකා.

**තඤ්චෙපි කුලන්ති** අම්හාකං කුලතො නික්ඛමිත්වා ඉමෙ කුලපුත්තා පබ්බජිතා එවං සීලවන්තො ගුණවන්තො ආචාරසම්පන්නා කල්‍යාණධම්මාති එවං **තඤ්චෙපි කුලං එතෙ තයො කුලපුත්තෙ පසන්නචිත්තං අනුස්සරෙය්‍යාති** එවං සබ්බත්ථ අත්ථො දට්ඨබ්බො. ඉති භගවා යථානුසන්ධිනාව දෙසනං නිට්ඨාපෙසීති.

**චූලගොසිඞ්ගසුත්තං පඨමං.**

---

## 1. 4. 2.

**එවම්මෙ සුතන්ති** මහාගොසිඞ්ගසුත්තං. තත්ථ ගොසිඞ්ගසාලවනදායෙති ඉදං වසනට්ඨානදස්සනත්ථං වුත්තං. අඤ්ඤෙසු හි සුත්තෙසු, සාවත්ථියං විහරති, ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙති එවං පඨමං ගොචරගාමං දස්සෙත්වා පච්ඡා වසනට්ඨානං දස්සෙති.[3] ඉමස්මිං පන මහාගොසිඞ්ගසුත්තෙ භගවතො ගොචරගාමො අනිබද්ධො; නොචිදෙව ගොචරගාමො භවිස්සති; තස්මා වසනට්ඨානමෙව පරිදීපිතං.[4] අරඤ්ඤනිදානකං නාමෙතං සුත්තන්ති.

**සම්බහුලෙහීති** බහුකෙහි. **අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහීති** සබ්බත්ථ විස්සුතෙහි පාකටෙහි. **ථෙරෙහි සාවකෙහි සද්ධින්ති** පාතිමොක්ඛසංවරාදීහි පිරකාරකෙහි ධම්මෙහි සමන්නාගතත්තා ථෙරෙහි, සවනන්තෙ ජාතත්තා සාවකෙහි සද්ධිං[5] එකතො.

---

1. අදස්සමානෙන-E. 2. පලිබොධෙන්තෙ-S. 3. දස්සෙසි-S.
4. වසනට්ඨානමෙව දීපිතං-L. 5. සද්ධින්ති-L, B, S.

ඉදානි තෙ ථෙරෙ සරූපතො දස්සෙන්තො, ආයස්මතා ච සාරිපුත්තෙනාති ආදිමාහ. තත්ථ ආයස්මා සාරිපුත්තො අත්තනො සීලාදීහි ගුණෙහි බුද්ධසාසනෙ අභිඤ්ඤාතො, චක්ඛුමන්තානං ගගනමජ්ඣෙ ඨිතො සූරියො විය චන්දො විය, සමුද්දතීරෙ ඨිතානං සාගරො විය ච පාකටො පඤ්ඤාතො. න කෙවලඤ්චස්ස ඉමස්මිං සුත්තෙ ආගතගුණවසෙනෙව මහන්තතා වෙදිතබ්බා; ඉතො අඤ්ඤෙසං ධම්මදායාදං[1], අනඞ්ගණං, සම්මාදිට්ඨිං, සීහනාදසුත්තං, මහාසීහනාදං, රථවිනීතං, මහාහත්ථිපදූපමං, මහාවෙදල්ලං, චාතුමසුත්තං[2], දීඝනඛං, අනුපදසුත්තං, සෙවිතබ්බාසෙවිතබ්බං, සච්චවිභඞ්ගසුත්තං, පිණ්ඩපාතපාරිසුද්ධිං, සම්පසාදනීයං, සඞ්ගීතිං, දසුත්තරං, පවාරණාසුත්තං, සුසිමසුත්තං, ථෙරපඤ්හසුත්තං, මහානිද්දෙසො, පටිසම්භිදාමග්ගො, ථෙරසීහනාදසුත්තං, අභිනික්ඛමනං, එතදග්ගන්ති ඉමෙසම්පි සුත්තානං වසෙන ථෙරස්ස මහන්තතා වෙදිතබ්බා. එතදග්ගස්මිං හි, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මහාපඤ්ඤානං යදිදං සාරිපුත්තො"ති වුත්තං.

මහාමොග්ගල්ලානොපි සීලාදිගුණෙහි චෙව ඉමස්මිං සුත්තෙ ආගතගුණෙහි ච ථෙරො විය අභිඤ්ඤාතො පාකටො මහා. අපි චස්ස අනුමානසුත්තං, චූළතණ්හාසඞ්ඛයසුත්තං, මාරතජ්ජනීයං, පාසාදකම්පනං, සකලං ඉද්ධිපාදසංයුත්තං, නන්දොපනන්දදමනං, යමකපාටිහාරියකාලෙ දෙවලොකගමනං, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරස්ස අභිනික්ඛමනං, එතදග්ගන්ති ඉමෙසම්පි වසෙන මහන්තතා වෙදිතබ්බා. එතදග්ගස්මිං හි, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහාමොග්ගල්ලානො"ති වුත්තං.

මහාකස්සපොපි සීලාදිගුණෙහි චෙව ඉමස්මිං සුත්තෙ ආගතගුණෙහි ච ථෙරො විය අභිඤ්ඤාතො පාකටො මහා. අපි චස්ස චීවරපරිවත්තනසුත්තං, ජිණ්ණචීවරසුත්තං, චන්දූපමං, සකලං කස්සපසංයුත්තං, මහාඅරියවංසසුත්තං, ථෙරස්ස අභිනික්ඛමනං, එතදග්ගන්ති ඉමෙසම්පි වසෙන මහන්තභාවො වෙදිතබ්බො. එතදග්ගස්මිං හි, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ධුතවාදානං යදිදං මහාකස්සපො"ති වුත්තං.

අනුරුද්ධත්ථෙරොපි සීලාදිගුණෙහි චෙව ඉමස්මිං සුත්තෙ ආගතගුණෙහි ච ථෙරො විය අභිඤ්ඤාතො පාකටො මහා. අපි චස්ස චූළගොසිඞ්ගසුත්තං, නළකපානසුත්තං, අනුත්තරියසුත්තං,[3] උපක්කිලෙසසුත්තං, අනුරුද්ධසංයුත්තං,[4] මහාපුරිසවිතක්කසුත්තං, ථෙරස්ස අභිනික්ඛමනං, එතදග්ගන්ති ඉමෙසම්පි වසෙන මහන්තභාවො වෙදිතබ්බො. එතදග්ගස්මිං හි, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං දිබ්බචක්ඛුකානං යදිදං අනුරුද්ධො"ති වුත්තං.

---

1. ධම්මදායාදසුත්තං-B. S.
2. චන්දූපමසුත්තං.-S. තුමවං.-B.
3. අරියපත්තං.-I.
4. අනුරුද්ධසුත්තං.-E.

**ආයස්මතා ච රෙවතෙනා**ති එත්ථ පන ද්වෙ රෙවතා: ඛදිරවනියරෙවතො ච කඞ්ඛාරෙවතො ච. තත්ථ ඛදිරවනියරෙවතො ධම්මසෙනාපතිත්ථෙරස්ස කනිට්ඨභාතිකො; න සො ඉධ අධිප්පෙතො. අකප්පියො ගුළො, අකප්පියා මුග්ගාති එවං කඞ්ඛාබහුලො පන ථෙරො ඉධ රෙවතොති අධිප්පෙතො. සො පි සීලාදිගුණෙහි චෙව ඉමස්මිං සුත්තෙ ආගතගුණෙහි ච ථෙරො විය අභිඤ්ඤාතො පාකටො මහා. අපි චස්ස අභිනික්ඛමනෙනපි එතදග්ගෙනපි මහන්තභාවො වෙදිතබ්බො. එතදග්ගස්මිං හි, “එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඣායීනං යදිදං කඞ්ඛාරෙවතො”ති වුත්තං.

ආනන්දත්ථෙරොපි සීලාදිගුණෙහි චෙව ඉමස්මිං සුත්තෙ ආගතගුණෙහි ච ථෙරො විය අභිඤ්ඤාතො පාකටො මහා. අපි චස්ස සෙඛසුත්තං, බාහිතියසුත්තං, ආනඤ්ජසප්පායං, ගොපකමොග්ගල්ලානං, බහුධාතුකං, චූළසුඤ්ඤතං, මහාසුඤ්ඤතං, අච්ඡරියබ්භුතසුත්තං, භද්දෙකරත්තං, මහානිදානං, මහාපරිනිබ්බානං, සුභසුත්තං, චූළනියලොකධාතුසුත්තං, අභිනික්ඛමනං, එතදග්ගන්ති ඉමෙසම්පි වසෙන මහන්තභාවො වෙදිතබ්බො. එතදග්ගස්මිං හි, “එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො”ති වුත්තං.

**අඤ්ඤෙහි ච අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහී**ති න කෙවලං එතෙහෙව අඤ්ඤෙහි ච මහාගුණතාය පාකටෙහි අභිඤ්ඤාතෙහි බහූහි ථෙරෙහි සාවකෙහි සද්ධිං භගවා ගොසිඞ්ගසාලවනදායෙ විහරතීති අත්ථො. ආයස්මා හි සාරිපුත්තො සයං මහාපඤ්ඤො අඤ්ඤෙපි බහූ මහාපඤ්ඤෙ භික්ඛූ ගහෙත්වා තදා දසබලං පරිවාරෙත්වා විහාසි. ආයස්මා මහාමොග්ගල්ලානො සයං ඉද්ධිමා... ආයස්මා මහාකස්සපො සයං ධුතවාදො ආයස්මා අනුරුද්ධො සයං දිබ්බචක්ඛුකො... ආයස්මා රෙවතො සයං ඣානාභිරතො... ආයස්මා ආනන්දො සයං බහුස්සුතො අඤ්ඤෙපි බහූ බහුස්සුතෙ භික්ඛූ ගහෙත්වා තදා දසබලං පරිවාරෙත්වා විහාසි. එවං තදා එතෙ ච අඤ්ඤෙ ච අභිඤ්ඤාතා මහාථෙරා තිංසසහස්සමත්තා භික්ඛූ දසබලං පරිවාරෙත්වා විහරිංසූති වෙදිතබ්බං.

**පටිසල්ලාණා**[1] වුට්ඨිතොති ඵලසමාපත්තිවිවෙකතො වුට්ඨිතො. **යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමී**ති ථෙරො කිර පටිසල්ලාණා[1] වුට්ඨිතො පච්ඡිමං ලොකධාතුං ඔලොකෙන්තො, වනන්තෙ කිළන්තස්ස[2] මත්තඛත්තියස්ස කණ්ණතො පතමානං කුණ්ඩලං විය, සංහරිත්වා සමුග්ගෙ පක්ඛිපමානං රත්තකම්බලං විය, මණිනාගදන්තතො පතමානං සතසහස්සග්ඝනිකං සුවණ්ණපාතිං විය ච අත්ථං ගච්ඡමානං පරිපුණ්ණපණ්ණාසයොජනං සූරියමණ්ඩලං අද්දස. තදනන්තරං පාචීනලොකධාතුං ඔලොකෙන්තො නෙමියං ගහෙත්වා පරිවත්තයමානං රජතචක්කං විය, රජතකූටතො නික්ඛමන්තං

---

1. පටිසල්ලානා-E, 2. කිලන්තස්ස-S.

**අච්ඡරියබ්භුතචිත්තජාතාති**[5] අහො අච්ඡරියං, අහො අබ්භුතන්ති එවං සඤ්ජාත-අච්ඡරියබ්භුතා චෙව සඤ්ජාතතුට්ඨිනො ච අහෙසුං, උප්පන්නබලවසොමනස්සා. **සංවිග්ගාති** උබ්බිග්ගා; චලිතා. **ලොමහට්ඨජාතාති** ජාතලොමහංසා. කඤ්චනභිත්තියං ඨපිතමණිනාගදන්තෙහි විය උද්ධග්ගෙහි ලොමෙහි ආකිණ්ණසරීරාති අත්ථො. ලොමහංසො ච නාමෙස සොමනස්සෙනපි හොති, දොමනස්සෙනපි; ඉධ පන සොමනස්සෙන ජාතො. ථෙරො හි සක්කං සොමනස්සසංවෙගෙන සංවෙජෙතුං තං පාටිහාරියමකාසි. තස්මා සොමනස්සසංවෙගෙන සංවිග්ගලොමහට්ඨං විදිත්වාති අත්ථො. **ඉධාහං මාරිසාති** ඉදානිස්ස යස්මා ථෙරෙන සොමනස්සසංවෙගං ජනයිත්වා තමං විනොදිතං, තස්මා සල්ලක්ඛෙත්වා එවමාහ.

**එසො නු තෙ මාරිස සො භගවා සත්ථාති** මාරිස ත්වං කුහිං ගතොසීති වුත්තෙ, මය්හං සත්ථු සන්තිකන්ති වදෙසි; ඉමස්මිං දෙවලොකෙ එකපාදකෙන විය තිට්ඨසි; යං ත්වං එවං වදෙසි; එසො නු තෙ

1. දස්සෙන්තා එවමාහ-S. E. 2. පාසාදෙන-B. S.
3. සම්පත්තියාව යසෙන-S. 4. වාලසඞ්ඝාට-L; පිට්ඨිසඞ්ඝාට-S.
5. අච්ඡරියබ්භුත ජාතාති-E; (අච්ඡරියබ්භුත චිත්තා-පාළි)

මාරිස සො භගවා සත්ථාති පුච්ඡිංසු. **සබ්‍රහ්මචාරී මෙ එසොති** එත්ථ කිඤ්චාපි ථෙරො අනගාරියො අභිනීහාරසම්පන්නො අග්ගසාවකො, සක්කො අගාරිකො[1], මග්ගබ්‍රහ්මචරියවසෙන පනෙතෙ සබ්‍රහ්මචාරිනො හොන්ති. තස්මා එවමාහ. **අහො නූන තෙ භගවා සත්ථාති** සබ්‍රහ්මචාරී තාව තෙ එවං මහිද්ධිකො, සො පන තෙ භගවා සත්ථා අහො නූන මහිද්ධිකොති සත්ථු ඉද්ධිපාටිහාරියදස්සනෙ ජාතාභිලාසා හුත්වා එවමාහංසු.

**අඤ්ඤාතඤ්ඤතරස්සාති**[2] පඤ්ඤාතඤ්ඤතරස්ස. සක්කො හි පඤ්ඤාතානං අඤ්ඤතරො. සෙසං සබ්බත්ථ පාකටමෙව. දෙසනං පන භගවා යථානුසන්ධිනාව නිට්ඨාපෙසීති.

චූළතණ්හාසඞ්ඛයසුත්තං සත්තමං.

---

## 1. 4. 8.

**එවමෙම සුත්තන්ති** මහාතණ්හාසඞ්ඛයසුත්තං. තත්ථ **දිට්ඨිගතන්ති** අලගද්දසුත්තෙ ලද්ධිමත්තං දිට්ඨිගතන්ති වුත්තං; ඉධ සස්සතදිට්ඨි. සො ච භික්ඛු බහුස්සුතො; අයං අප්පස්සුතො, ජාතකභාණකො, භගවන්තං ජාතකං[3] කථෙත්වා, අහං භික්ඛවෙ තෙන සමයෙන වෙස්සන්තරො අහොසිං, මහොසධො, විධුරපණ්ඩිතො, සෙනකපණ්ඩිතො, මහාජනකො රාජා අහොසින්ති සමොධානෙන්තං සුණාති. අථස්ස එතදහොසි: ඉමෙ රූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරා තත්ථ තත්ථෙව නිරුජ්ඣන්ති, විඤ්ඤාණං පන ඉධලොකතො පරලොකං, පරලොකතො ඉධලොකං[4] සන්ධාවති, සංසරතීති සස්සතදස්සනං උප්පන්නං. තෙනාහ: **තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති, සංසරති, අනඤ්ඤන්ති.**

සම්මාසම්බුද්ධෙන පන, විඤ්ඤාණං පච්චයසම්භවං[5] සති පච්චයෙ උප්පජ්ජති, විනා පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති වුත්තං. තස්මා අයං භික්ඛු බුද්ධෙන අකථිතං කථෙති, ජිනචක්කෙ පහාරං දෙති, වෙසාරජ්ජඤාණං පටිබාහති, සොතුකාමජනං විසංවාදෙති, අරියපථෙ තිරියං පතිත්වා මහාජනස්ස අහිතාය දුක්ඛාය පටිපන්නො. යථා නාම රඤ්ඤො රජ්ජෙ මහාචොරෙ උප්පජ්ජමානො මහාජනස්ස අහිතාය දුක්ඛාය උප්පජ්ජති, එවං ජිනසාසනෙ චොරෙ හුත්වා මහාජනස්ස අහිතාය දුක්ඛාය උප්පන්නොති වෙදිතබ්බො.

**සම්බහුලා භික්ඛූති** ජනපදවාසිනො පිණ්ඩපාතිකභික්ඛූ. **තෙනුපසඞ්කමිංසූති** අයං පරිසං ලභිත්වා සාසනම්පි[6] අන්තරධාපෙය්‍ය, යාව පක්ඛං න ලභති, තාවදෙව නං දිට්ඨිගතා විවෙචෙමාති සුත්තපුතට්ඨානතොයෙව[7] අට්ඨත්වා අනිසීදිත්වා උපසඞ්කමිංසු.

---

1. ආගාරියො-S; අගාරියො-E. 2. අඤ්ඤතරස්සාති-L; ඤාතඤ්ඤතරස්සාති-B. S. 3. ජාතකකථං-B S. 4. ඉමං ලොකං-B. S. 5. විඤ්ඤාණසම්භවො-B, E. 6. සාසනං-S. 7. සුතවත්ථානතොයෙව-L.

**කතමං තං සාති විඤ්ඤාණන්ති** සාති යං ත්වං විඤ්ඤාණං සන්ධාය වදෙසි, කතමං තං විඤ්ඤාණන්ති? **ය්වායං භන්තෙ වදො වෙදෙය්‍යො තත්‍ර තත්‍ර කල්‍යාණපාපකානං කම්මානං විපාකං පටිසංවෙදෙතීති** භණන්තො යො අයං වදති, වෙදියති, යො වායං තහිං තහිං කුසලාකුසල-කම්මානං විපාකං පච්චනුභොති, ඉදං තං භන්තෙ විඤ්ඤාණං, යමහං සන්ධාය වදෙමීති. **කස්ස නු ඛො නාමාති** කස්ස ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සසුද්දගහට්ඨපබ්බජිතදෙවමනුස්සානං වා අඤ්ඤතරස්ස.

**අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසීති** කස්මා ආමන්තෙසි? සාතිස්ස හි කිර එවං අහොසි: සත්ථා මං මොඝපුරිසොති වදති; න ච මොඝපුරිසොති වුත්තමත්තෙනෙව මග්ගඵලානං උපනිස්සයො න හොති. "අතිලහුං ඛො ත්වං මොඝපුරිස බාහුල්ලාය ආවත්තො"ති එවං වුත්තො උපසෙනත්ථෙරොපි හි අපරභාගෙ ඝටෙන්තො වායමන්තො[1] අභිඤ්ඤා සච්ඡාකාසි. අහම්පි විරියං පග්ගණ්හිත්වා මග්ගඵලානි සච්ඡි කරිස්සාමීති. අථස්ස භගවා ඡින්නපච්චයො අයං සාසනෙ අවිරූළ්හි ධම්මොති දස්සෙන්තො භික්ඛූ ආමන්තෙසි. **උස්මීකතොති ආදි** හෙට්ඨා වුත්තාධිප්පායමෙව.

**අථ ඛො භගවාති** අයම්පි පාටියෙක්කො අනුසන්ධි. සාතිස්ස කිර එතදහොසි: භගවා මය්හං මග්ගඵලානං උපනිස්සයො නත්ථීති වදති, කිං සක්කා උපනිස්සයෙ අසති කාතුං?[2] නහි තථාගතා සඋපනිස්සයස්සෙව ධම්මං දෙසෙන්ති; යස්ස කස්සචි දෙසෙන්ති යෙව. අහං බුද්ධස්ස සන්තිකා සුගතොවාදං ලභිත්වා සම්පත්තූපගං[3] කුසලං කරිස්සාමීති. අථස්ස භගවා, නාහං මොඝපුරිස තුය්හං ඔවාදං වා අනුසාසනිං වා දෙමීති සුගතොවාදං පස්සම්භෙන්තො[4] ඉමං දෙසනං ආරභි. තස්සත්ථො හෙට්ඨා වුත්තනයෙනෙව වෙදිතබ්බො. ඉධාති පරිසාය ලද්ධිං සොධෙන්තො **ඉධාහං භික්ඛූ පටිපුච්ඡිස්සාමීති** ආදිමාහ. තං[5] සබ්බම්පි හෙට්ඨා වුත්තනයෙනෙව වෙදිතබ්බං.

## සාතිකණ්ඩං නිට්ඨිතං.

ඉදානි විඤ්ඤාණස්ස සප්පච්චයභාවං දස්සෙතුං, යඤ්ඤදෙව භික්ඛවෙති ආදිමාහ. තත්ථ **මනඤ්ච පටිච්ච ධම්මෙ චාති** සහාවජ්ජනෙන භවඞ්ගමනඤ්ච තෙභූමකධම්මෙ ච පටිච්ච. **කට්ඨඤ්ච පටිච්චාති** ආදි ඔපම්මනිදස්සනත්ථං වුත්තං. තෙන කිං දීපෙති? ද්වාරසඞ්කන්තියා අභාවං. යථා හි කට්ඨං පටිච්ච ජලමානො අග්ගි උපාදානපච්චයෙ සතියෙව ජලති, තස්මිං අසති පච්චයවෙකල්ලෙන තත්ථෙව වූපසම්මති[6], න සකලිකාදීනි සඞ්කමිත්වා සකලිකග්ගීති ආදිසඞ්ඛං ගච්ඡති; එවමෙව චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පන්නං විඤ්ඤාණං තස්මිං ද්වාරෙ චක්ඛු-

1. වායමන්තො ච-B. S. 2. උපනිස්සයෙ පරිකාතුං--B. S.
3. සග්ගසම්පත්තූපගං-B., සග්ගසම්පත්තියා-S.
4. පටිප්පස්සම්භෙන්තො-L. B. 5. තං-හි-L. 6. වූපසමති-S; උපසමති-E.

රූප-ආලොකමනසිකාරසඞ්ඛාතෙ පච්චයම්හි සතියෙව උප්පජ්ජති, තස්මිං අසති පච්චයවෙකල්ලෙන තත්ථෙව නිරුජ්ඣති, න සොතාදීනි සඞ්කමිත්වා සොතවිඤ්ඤාණන්ති ආදිසඞ්ඛං ගච්ඡති. එස නයො සබ්බද්වාරෙසු. ඉති භගවා නායං විඤ්ඤාණප්පවත්තෙ ද්වාරසඞ්කන්තිමත්තම්පි වදාමි, අයං පන සාති මොඝපුරිසො භවසඞ්කන්තිං වදතීති සාතිං නිග්ගණ්හෙසි.

එවං විඤ්ඤාණස්ස සප්පච්චයභාවං දස්සෙත්වා ඉදානි පන පඤ්චන්නම්පි ඛන්ධානං සප්පච්චයභාවං දස්සෙන්තො, **භූතමිදන්ති** ආදිමාහ. තත්ථ **භූතමිදන්ති** ඉදං ඛන්ධපඤ්චකං ජාතං භූතං නිබ්බත්තං, තුම්හෙපි තං භූතමිදන්ති භික්ඛවෙ පස්සථාති. **තදාහාරසම්භව**න්ති තම්පනෙතං ඛන්ධපඤ්චකං ආහාරසම්භවං, පච්චයසම්භවං, තං සතිපච්චයෙ උප්පජ්ජතීති එවං පස්සථාති පුච්ඡති. **තදාහාරනිරොධා**ති තස්ස පච්චයස්ස නිරොධා.

**භූතමිදං නොස්සූ**ති භූතං නු ඛො ඉදං, න නු ඛො භූතන්ති? **තදාහාරසම්භවං නොස්සූ**ති තං පනෙතං භූතං ඛන්ධපඤ්චකං පච්චයසම්භවං නු ඛො, න නු ඛොති? **තදාහාරනිරොධා**ති තස්ස පච්චයස්ස නිරොධා. **නිරොධධම්මං නොස්සූ**ති නිරොධධම්මං නු ඛො, න නු ඛොති?.

**සම්මප්පඤ්ඤාය**[1] **පස්සතො**ති ඉදං ඛන්ධපඤ්චකං ජාතං භූතං නිබ්බත්තන්ති යාථාව-සරසලක්ඛණතො විපස්සනාපඤ්ඤාය සම්පස්සන්තස්ස[2]. **පඤ්ඤාය සුදිට්ඨ**න්ති වුත්තනයෙනෙව විපස්සනාපඤ්ඤාය සුට්ඨු දිට්ඨං. එවං යෙ යෙ තං පුච්ඡං සල්ලක්ඛෙසුං, තෙසං තෙසං පටිඤ්ඤං ගණ්හන්තො පඤ්චන්නං ඛන්ධානං සප්පච්චයභාවං දස්සෙසි.

ඉදානි යාය පඤ්ඤාය තෙහි තං සප්පච්චයං සනිරොධං ඛන්ධපඤ්චකං සුදිට්ඨං, තත්ථ නිත්තණ්හභාවං පුච්ඡන්තො, **ඉමං චෙ තුම්හෙ**ති ආදිමාහ. තත්ථ **දිට්ඨි**න්ති විපස්සනාසම්මාදිට්ඨිං. සභාවදස්සනෙන **පරිසුද්ධං**. පච්චයදස්සනෙන **පරියොදාතං**. **අල්ලීයෙථා**ති තණ්හාදිට්ඨීහි අල්ලීයිත්වා විහරෙය්‍යාථ. **කෙලායෙථා**ති තණ්හාදිට්ඨීහි කීළමානා විහරෙය්‍යාථ. **ධනායෙථා**ති[3] ධනං විය ඉච්ඡන්තා ගෙධං ආපජ්ජෙය්‍යාථ. **මමායෙථා**ති තණ්හාදිට්ඨිමමත්තං උප්පාදෙය්‍යාථ. **නිත්ථරණත්ථාය නො ගහණත්ථායා**ති යො සො මයා චතුරොඝනිත්ථරණත්ථාය කුල්ලූපමො ධම්මො දෙසිතො, නො නිකන්තිවසෙන ගහණත්ථාය, අපි නු තං තුම්හෙ ආජානෙය්‍යාථාති? විපරියයෙන[4] සුක්කපක්ඛො වෙදිතබ්බො.

ඉදානි තෙසං ඛන්ධානං පච්චයං දස්සෙන්තො, **චත්තාරොමෙ භික්ඛවෙ ආහාරා**ති ආදිමාහ. තං වුත්තත්ථමෙව. යථා පන එකො,

---

1. පඤ්ඤාය-L.
2. සම්මා පස්සන්තස්ස-B, S.
3. ධනායෙය්‍යාථාති-S.
4. විපරියායෙන-S, E.

ඉමං ජානාසීති වුත්තො, න කෙවලං ඉමං, මාතරම්පිස්ස ජානාමි, මාතු මාතරම්පීති එවං පවෙණිවසෙන ජානන්තො සුට්ඨු ජානාති නාම. එවමෙව භගවා න කෙවලං ඛන්ධමත්තමෙව ජානාති, ඛන්ධානං පච්චයම්පි, තෙසම්පි පච්චයානං පච්චයන්ති එවං සබ්බං පච්චයපරම්පරං ජානාති. සො තං බුද්ධබලං දීපෙන්තො ඉදානි පච්චයපරම්පරං දස්සෙතුං, **ඉමෙ ච භික්ඛවෙ චත්තාරො ආහාරාති** ආදිමාහ. තම්පි වුත්තත්ථමෙව.

**ඉති ඛො භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා**-පෙ-**දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතීති** එත්ථ පන පටිච්චසමුප්පාදකථා විත්ථාරෙතබ්බා භවෙය්‍ය, සා විසුද්ධිමග්ගෙ විත්ථාරිතාව. **ඉමස්මිං සති ඉදං හොතීති** ඉමස්මිං අවිජ්ජාදිකෙ පච්චයෙ සති ඉදං සංඛාරාදිකං ඵලං හොති. **ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජතීති** ඉමස්ස අවිජ්ජාදිකස්ස පච්චයස්ස උප්පාදා ඉදං සංඛාරාදිකං ඵලං උප්පජ්ජති. තෙනෙවාහ: **යදිදං අවිජ්ජාපච්චයා සංඛාරා-පෙ-සමුදයො හොතීති.**

එවං වට්ටං දස්සෙත්වා ඉදානි විවට්ටං දස්සෙන්තො, **අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධාති** ආදිමාහ. තත්ථ **අවිජ්ජාය ත්වෙවාති** අවිජ්ජාය එව තු. **අසෙසවිරාගනිරොධාති** විරාගසංඛාතෙන මග්ගෙන අසෙසනිරොධා. **සංඛාරනිරොධොති** සංඛාරානං අනුප්පාදනිරොධො හොති. එවං නිරුද්ධානං පන සංඛාරානං නිරොධා විඤ්ඤාණං; විඤ්ඤාණාදීනඤ්ච නිරොධා නාමරූපාදීනි නිරුද්ධානියෙව හොන්තීති දස්සෙතුං **සංඛාරනිරොධා විඤ්ඤාණනිරොධොති** ආදිං වත්වා **එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති** වුත්තං. තත්ථ **කෙවලස්සාති** සකලස්ස; සුද්ධස්ස වා. සත්තවිරහිතස්සාති අත්ථො. **දුක්ඛක්ඛන්ධස්සාති** දුක්ඛරාසිස්ස. **නිරොධො හොතීති** අනුප්පාදො හොති. **ඉමස්මිං අසතීති** ආදි වුත්තපටිපක්ඛනයෙන වෙදිතබ්බං.

එවං වට්ටවිවට්ටං කථෙත්වා ඉදානි ඉමං ද්වාදසඞ්ගපච්චයවට්ටං සහවිපස්සනාඤාණෙන මග්ගෙන[1] ජානන්තස්ස යා පටිධාවනා පහීයති, තස්සා අභාවං පුච්ඡන්තො, **අපි නු තුම්හෙ භික්ඛවෙති** ආදිමාහ. තත්ථ **එවං ජානන්තාති** එවං සහවිපස්සනෙන මග්ගෙන ජානන්තා. **එවං පස්සන්තාති** තස්සෙව වෙවචනං. **පුබ්බන්තන්ති** පුරිමකොට්ඨාසං. අතීතානි ඛන්ධ-ධාතු-ආයතනානීති අත්ථො. **පටිධාවෙය්‍යාථාති** තණ්හා දිට්ඨිවසෙන පටිධාවෙය්‍යාථ. සෙසං සබ්බාසවසුත්තෙ විත්ථාරිතමෙව.

ඉදානි තෙසං තත්ථ නිච්චලභාවං පුච්ඡන්තො, **අපි නු තුම්හෙ භික්ඛවෙ එවං ජානන්තා එවං පස්සන්තා එවං වදෙය්‍යාථ: සත්ථා නො ගරූති** ආදිමාහ. තත්ථ **ගරූති** භාරිකො, අකාමා අනුවත්තිතබ්බො. **සමණොති** බුද්ධසමණො. **අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍යාථාති** අයං සත්ථා අම්හාකං කිච්චං සාධෙතුං න සක්කොතීති අපි නු එවං

1. විපස්සනාඤාණමග්ගෙන-S; විපස්සනාය ඤාණමග්ගෙන-B.

සඤ්ඤද්දීතො හුත්වා අඤ්ඤං බාහිරං සත්ථාරං උද්දිසෙය්‍යාථ. **පුථුසමණබ්‍රාහ්මණානන්ති** පුථූනං තිත්ථියසමණානඤ්චෙව බ්‍රාහ්මණානඤ්ච. **වතකුතූහලමඞ්ගලානීති** වතසමාදානානි ච දිට්ඨිකුතූහලානි ච දිට්ඨසුතමුතමඞ්ගලානි ච. **තානි සාරතො පච්චාගච්ඡෙය්‍යාථාති** එතානි සාරන්ති එවං සඤ්ඤද්දීතො හුත්වා පටිආගච්ඡෙය්‍යාථ. එවං නිස්සට්ඨානිපි පුන ගණ්හෙය්‍යාථාති අත්ථො. **සාමං ඤාතන්ති** සයං ඤාණෙන ඤාතං. **සාමං දිට්ඨන්ති** සයං පඤ්ඤාචක්ඛුනා දිට්ඨං. **සාමං විදිතන්ති** සයං විභාවිතං, පාකටං කතං.

**උපනීතා ඛො මෙ තුම්හෙති** මයා භික්ඛවෙ තුම්හෙ ඉමිනා සන්දිට්ඨිකාදිසභාවෙන ධම්මෙන නිබ්බානං උපනීතා. පාපිතාති අත්ථො. **සන්දිට්ඨිකොති** ආදීනං අත්ථො විසුද්ධිමග්ගෙ විත්ථාරිතො. **ඉදමෙතං පටිච්ච වුත්තන්ති** එතං වචනං ඉදං තුම්හෙහි සාමං ඤාතාදිභාවං පටිච්ච වුත්තං.

**තිණ්ණං ඛො පන භික්ඛවෙති** කස්මා ආරභි? නනු හෙට්ඨා වට්ටවිවට්ටවසෙන දෙසනා මත්ථකං පාපිතාති? ආම පාපිතා. අයං පන පාටිඑක්කො අනුසන්ධි. අයං හි ලොකසන්නිවාසො පටිසන්ධිසම්මූළ්හො; තදස්ස සම්මොහට්ඨානං විද්ධංසෙත්වා පාකටං කරිස්සාමීති ඉමං දෙසනං ආරභි. අපි ච වට්ටමූලං අවිජ්ජා, විවට්ටමූලං බුද්ධුප්පාදො; ඉති වට්ටමූලං අවිජ්ජං විවට්ටමූලඤ්ච බුද්ධුප්පාදං දස්සෙත්වාපි පුන එකවාරං වට්ටවිවට්ටවසෙන දෙසනං මත්ථකං පාපෙස්සාමීතිපි ඉමං දෙසනං ආරභි.

තත්ථ **සන්නිපාතාති** සමොධානෙන, පිණ්ඩභාවෙන. **ගබ්භස්සාති** ගබ්භෙ නිබ්බත්තනකසත්තස්ස. **අවක්කන්ති හොතීති** නිබ්බත්ති හොති. කත්ථචි හි ගබ්භොති මාතුකුච්ඡි වුත්තා. යථාහ:

"යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මාණවො
අබ්භුට්ඨිතොව සො යාති ස ගච්ඡං න නිවත්තතී"ති.

කත්ථචි ගබ්භෙ නිබ්බත්තනකසත්තො. යථාහ: "යථා ඛො පනානන්ද අඤ්ඤා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායන්තී"ති. ඉධ සත්තො අධිප්පෙතො. තං සන්ධාය වුත්තං: **ගබ්භස්ස අවක්කන්ති හොතීති.**

**ඉධාති** ඉමස්මිං සත්තලොකෙ. **මාතා ච උතුනී හොතීති** ඉදං උතුසමයං සන්ධාය වුත්තං. මාතුගාමස්ස කිර යස්මිං ඔකාසෙ දාරකො නිබ්බත්තති, තත්ථ මහතී ලොහිතපිළකා සණ්ඨහිත්වා භිජ්ජිත්වා පග්ඝරති; වත්ථු සුද්ධං හොති. විසුද්ධෙ වත්ථුම්හි මාතාපිතූසු එකවාරං සන්නිපතිතෙසු යාව සත්ත දිවසානි ඛෙත්තමෙව හොති. තස්මිං සමයෙ හත්ථගාහ-වෙණිගාහාදිනා අඞ්ගපරාමසනෙනාපි දාරකො නිබ්බත්තතියෙව. **ගන්ධබ්බොති** තත්‍රූපගසත්තො. **පච්චුපට්ඨිතො හොතීති** න මාතාපිතූනං සන්නිපාතං ඔලොකයමානො සමීපෙ ඨිතො නාම හොති, කම්මයන්ත-යන්තිතො පන එකො සත්තො තස්මිං ඔකාසෙ නිබ්බත්තනකො හොතීති අයමෙත්ථ අධිප්පායො.

**සංසයෙනාති** අරොගා නු ඛො භවිස්සාමි අහං,[1] පුත්තො වා මෙති එවං මහන්තෙන ජීවිතසංසයෙන. **ලොහිතං හෙතං භික්ඛවෙති** තද කිර මාතුලොහිතං තං ඨානං සම්පත්තසම්පත්තං පුත්තසිනෙහෙන පණ්ඩරං හොති. තස්මා එවමාහ. **වඞ්කකන්ති** දාරකානං කීළනකං ඛුද්දකනඞ්ගලං. **ඝටිකා** වුච්චති දීඝදණ්ඩකෙන රස්සදණ්ඩකපහරණකීළා. **මොක්ඛචිකන්ති** සම්පරිවත්තිකකීළා. ආකාසෙ දණ්ඩකං ගහෙත්වා භූමියං වා සීසං ඨපෙත්වා හෙට්ඨුපරියභාවෙන පරිවත්තනකීළනන්ති වුත්තං හොති. **චිඞ්ගුලකං** වුච්චති තාලපණ්ණාදීහි කතං වාතප්පහාරෙන පරිබ්භමනචක්කං. **පත්තාළ්හකං** වුච්චති පණ්ණනාළිකා. තාය වාලිකාදීනි මිනන්තා කීළන්ති. **රථකන්ති** ඛුද්දකරථං.[2] **ධනුකම්පි** ඛුද්දකධනුමෙව[3].

**සාරජ්ජතීති** රාගං උප්පාදෙති. **බ්‍යාපජ්ජතීති** බ්‍යාපාදං උප්පාදෙති. **අනුපට්ඨිතකායසතීති** කායෙ සති කායසති; තං අනුපට්ඨපෙත්වාති අත්ථො. **පරිත්තචෙතසොති** අකුසලචිත්තො. **යත්ථස්ස තෙ පාපකාති** යස්සං[4] ඵලසමාපත්තියං එතෙ නිරුජ්ඣන්ති, තං න ජානාති. නාධිගච්ඡතීති අත්ථො. **අනුරොධවිරොධන්ති** රාගඤ්චෙව දොසඤ්ච. **අභිනන්දතීති** තණ්හාවසෙන අභිනන්දති. තණ්හාවසෙනෙව, අහො සුඛන්ති ආදීනි වදන්තො **අභිවදති. අජ්ඣොසාය තිට්ඨතීති** තණ්හාඅජ්ඣොසානෙන ගිලිත්වා පරිනිට්ඨපෙත්වා ගණ්හාති. සුඛං වා[5] අදුක්ඛමසුඛං වා අභිනන්දතු, දුක්ඛං කථං අභිනන්දතීති? අහං දුක්ඛිතො, මම දුක්ඛන්ති ගණ්හන්තො අභිනන්දති නාම. **උප්පජ්ජති නන්දීති** තණ්හා උප්පජ්ජති. **තදුපාදානන්ති** සාව තණ්හා ගහණට්ඨෙන උපාදානං නාම. **තස්සුපාදානපච්චයා භවො-පෙ-සමුදයො හොතීති** ඉදංපි[6] භගවතා පුන එකවාරං **ද්වීසන්ධි** තිසංඛෙපං පච්චයාකාරවට්ටං දස්සිතං.

ඉදානි විවට්ටං දස්සෙතුං, **ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජතීති** ආදිමාහ. තත්ථ **අප්පමාණචෙතසොති** අප්පමාණං ලොකුත්තරං චෙතො අස්සාති අප්පමාණචෙතසො. මග්ගචිත්තසමඞ්ගීති අත්ථො. **ඉමං ඛො මෙ තුම්හෙ භික්ඛවෙ සංඛිත්තෙන තණ්හාසංඛයවිමුත්තිං ධාරෙථාති** භික්ඛවෙ ඉමං සංඛිත්තෙන දෙසිතං **මය්හං** තණ්හාසංඛයවිමුත්තිදෙසනං තුම්හෙ නිච්චකාලං ධාරෙය්‍යාථ, මා පමුස්සෙය්‍යාථ[7]. දෙසනා හි එත්ථ විමුත්තිපටිලාභහෙතුතො **විමුත්තීති** වුත්තා.

මහාතණ්හාජාල-තණ්හාසංඝාට-පටිමුක්කන්ති තණ්හාව සංසිබ්බිතට්ඨෙන **මහාතණ්හාජාලං**, සංඝටිතට්ඨෙන **සංඝාටන්ති** වුච්චති; ඉති ඉමස්මිං **මහාතණ්හාජාල-තණ්හාසංඝාටෙ** ච ඉමං **සාතිං** භික්ඛුං කෙවට්ටපුත්තං පටිමුක්කං ධාරෙථ. අනුපවිට්ඨො, අන්තොගධොති නං ධාරෙය්‍යාථාති අත්ථො. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

**මහාතණ්හාසඞ්ඛයසුත්තං අට්ඨමං.**

---

1. අහං වා-B. S. 2. රථකං-L. S. 3. ධනුකමෙව-L. S. 4. පාපකාති-L.
5. සුඛං තාව-B. S. 6. ඉදම්පි-B, S. 7. පමජ්ජෙය්‍යාථ-B; පම්මුස්සෙය්‍යාථ-S.

## 1. 4. 9.

**එවමෙම සුත්තන්ති** මහාඅස්සපුරං. තත්ථ **අඞ්ගෙසූති** අඞ්ගා නාම ජානපදිනො රාජකුමාරා; තෙසං නිවාසො එකොපි ජනපදො රුළ්හීසද්දෙන අඞ්ගාති වුච්චති; තස්මිං අඞ්ගෙසු ජනපදෙ[1] **අස්සපුරං නාම අඞ්ගානං නිගමොති** අස්සපුරන්ති නගරනාමෙන ලද්ධවොහාරො අඞ්ගානං ජනපදස්ස එකො නිගමො. තං ගොචරගාමං කත්වා විහරතීති අත්ථො. **භගවා එතදවොචාති** එතං **සමණා සමණාති වො භික්ඛවෙ ජනො සඤ්ජානාතීති** ආදිවචනං අවොච.

කස්මා පන එවං අවොචාති? තස්මිං කිර නිගමෙ මනුස්සා සද්ධා පසන්නා බුද්ධමාමකා, ධම්මමාමකා, සඞ්ඝමාමකා, තදනු පබ්බජිතසාමණෙරම්පි වස්සසතිය[2]ථෙරසදිසං කත්වා පස්සන්ති; පුබ්බණ්හසමයෙ භික්ඛුසඞ්ඝං පිණ්ඩාය පවිසන්තං දිස්වා බීජනංගලාදීනි ගහෙත්වා ඛෙත්තං ගච්ඡන්තාපි, ඵරසු-ආදීනි ගහෙත්වා අරඤ්ඤං පවිසන්තාපි තානි උපකරණානි නික්ඛිපිත්වා භික්ඛුසඞ්ඝස්ස නිසීදනට්ඨානං ආසනසාලං වා මණ්ඩපං වා රුක්ඛමූලං වා සම්මජ්ජිත්වා ආසනානි පඤ්ඤපෙත්වා ආධාරකෙ ච[3] පානීයඤ්ච පච්චුපට්ඨපෙත්වා භික්ඛුසඞ්ඝං නිසීදපෙත්වා යාගුඛජ්ජකාදීනි දත්වා කතභත්තකිච්චං භික්ඛුසඞ්ඝං උය්‍යොජෙත්වා තතො තානි උපකරණානි ආදාය ඛෙත්තං වා අරඤ්ඤං වා ගන්ත්වා අත්තනො කම්මානි කරොන්ති.

කම්මන්තට්ඨානෙපි තෙසං අඤ්ඤා කථා නාම නත්ථි. චත්තාරො මග්ගට්ඨා, චත්තාරො ඵලට්ඨාති අට්ඨ පුග්ගලා අරියසඞ්ඝො නාම; තෙ එවරූපෙන සීලෙන, එවරූපෙන ආචාරෙන, එවරූපාය පටිපත්තියා සමන්නාගතා, ලජ්ජිනො, පෙසලා, උළාරගුණාති භික්ඛුසඞ්ඝස්සෙව වණ්ණං කථෙන්ති. කම්මන්තතො ආගන්ත්වා භුත්තසායමාසා ඝරද්වාරෙසු නිසින්නාපි, සයනිඝරං පවිසිත්වා නිසින්නාපි භික්ඛුසඞ්ඝස්සෙව වණ්ණං කථෙන්ති. භගවා තෙසං[4] මනුස්සානං නිපච්චාකාරං[5] දිස්වා භික්ඛුසඞ්ඝං පිණ්ඩපාතාපචායනෙ නියොජෙන්තො එවං අවොච.[6]

**යෙ ධම්මා සමණකරණා ච බ්‍රාහ්මණකරණා චාති** යෙ ධම්මා සමාදාය පරිපූරිතා සමිතපාප-සමණඤ්ච බාහිතපාප-බ්‍රාහ්මණඤ්ච කරොන්තීති අත්ථො. "තීණිමානි භික්ඛවෙ සමණස්ස සමණකරණීයානි. කතමානි තීණි? අධිසීලසික්ඛාසමාදානං, අධිචිත්තසික්ඛාසමාදානං, අධිපඤ්ඤාසික්ඛාසමාදාන"න්ති එත්ථ පන සමණෙන කත්තබ්බධම්මා වුත්තා. තෙපි ච සමණකරණා හොන්ති යෙව. ඉධ පන හිරොත්තප්පාදිවසෙන දෙසනා විත්ථාරිතා.

---

1. අඞ්ගෙසු ජනපදෙසු-L; අඞ්ග ජනපදෙ-S. 2. වස්සසතිකා-E. S.
3. ආචරකෙ ච-S; අරජ-B. 4. තෙසං ච-S.
5. නිපච්චකාරං-E. S. 6. එතදවොච-B. S.

**එවං නො අයං අම්හාකන්ති** එත්ථ නොති නිපාතමත්තං. එවං අයං අම්හාකන්ති අත්ථො. **මහප්ඵලා මහානිසංසාති** උභයම්පි අත්ථතො එකමෙව. **අවඤ්ඣාති** අමොඝා. **සඵලාති** අයං තස්සෙව අත්ථො. යස්සා හි ඵලං නත්ථි, සා වඤ්ඣා නාම හොති. **සඋද්‍රයාති** සවඩ්ඪි. ඉදං සඵලතාය වෙවචනං. **එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති** භික්ඛවෙ එවං තුම්හෙහි සික්ඛිතබ්බං. ඉති භගවා ඉමිනා එත්තකෙන ඨානෙන හිරොත්තප්පාදීනං ධම්මානං වණ්ණං කථෙසි.

කස්මා? වචනපථපච්ඡින්දනත්ථං. සචෙ හි කොචි අචිරපබ්බජිතො බාලභික්ඛු එවං වදෙය්‍ය: භගවා හිරොත්තප්පාදිධම්මෙ සමාදාය වත්තථාති වදති, කො නු ඛො තෙසං සමාදාය වත්තනෙ ආනිසංසොති? තස්ස වචනපථපච්ඡින්දනත්ථං අයඤ්ච අයඤ්ච ආනිසංසො, ඉමෙ ධම්මා සමාදාය පූරිතා සමිතපාපසමණං නාම බාහිතපාපබ්‍රාහ්මණං නාම කරොන්ති, චතුපච්චයලාභං උප්පාදෙන්ති, පච්චයදායකානං මහප්ඵලතං සම්පාදෙන්ති, පබ්බජ්ජං අවඤ්ඣං සඵලං සඋද්‍රයං කරොන්තීති වණ්ණං අභාසි. අයමෙත්ථ සඞ්ඛෙපො. විත්ථාරෙන පන වණ්ණකථා සතිපට්ඨානෙ වුත්තනයෙනෙව වෙදිතබ්බා.

**හිරොත්තප්පෙනාති** "යං හිරියති හිරියිතබ්බෙන, ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙනා"ති එවං විත්ථාරිතාය හිරියා චෙව ඔත්තප්පෙන ච, අපි චෙත්ථ අජ්ඣත්තසමුට්ඨානා හිරී; බහිද්ධාසමුට්ඨානං ඔත්තප්පං. අත්තාධිපතෙය්‍යා හිරී; ලොකාධිපතෙය්‍යං ඔත්තප්පං. ලජ්ජා[1]සභාවසණ්ඨිතා හිරී; භයසභාවසණ්ඨිතං ඔත්තප්පං. විත්ථාරකථා පනෙත්ථ සබ්බාකාරෙන විසුද්ධිමග්ගෙ වුත්තා.

අපි ච ඉමෙ ද්වෙ ධම්මා ලොකං පාලනතො ලොකපාලකධම්මා නාමාති කථිතා. යථාහ: "ද්වෙමෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති. කතමෙ ද්වෙ? හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති. ඉමෙ ච ඛො භික්ඛවෙ ද්වෙ සුක්කා ධම්මා ලොකං න පාලෙය්‍යුං, නයිධ පඤ්ඤායෙථ, මාතාති වා, මාතුච්ඡාති වා, මාතුලානීති වා, ආචරියභරියාති වා, ගරූනං දාරාති වා, සම්භෙදං ලොකො අගමිස්ස, යථා අජෙළකා, කුක්කුටසූකරා, සොණසිගාලා"ති.

ඉමෙයෙව ජාතකෙ දෙවධම්මාති කථිතා. යථාහ:

"හිරිඔත්තප්පසම්පන්නා සුක්කධම්මසමාහිතා
සන්තො සප්පුරිසා ලොකෙ දෙවධම්මාති වුච්චරෙ"ති.

මහාචුන්දත්ථෙරස්ස පන කිලෙසසල්ලෙඛනක-පටිපදාති කත්වා දස්සිතා. යථාහ: "පරෙ අහිරිකා භවිස්සන්ති, මයමෙත්ථ හිරිමනා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො. පරෙ අනොත්තාපී[2] භවිස්සන්ති, මයමෙත්ථ ඔත්තාපී[3] භවිස්සාමාති සල්ලෙඛො කරණීයො"ති.

---

1. ලජ්ජ්-B. S. 2. අනොත්තප්පී-E; අනොත්තප්පිකා-S. 3. ඔත්තප්පී-S. E.

ඉමෙ ච මහාකස්සපත්ථෙරස්ස ඔවාදූපසම්පදන්ති කත්වා දස්සිතා. වුත්තං හෙතං: "තස්මාතිහ තෙ කස්සප එවං සික්ඛිතබ්බං: තිබ්බං මෙ හිරොත්තප්පං පච්චුපට්ඨිතං භවිස්සති ථෙරෙසු නවෙසු මජ්ඣිමෙසූති. එවං හි තෙ කස්සප සික්ඛිතබ්බ"න්ති. ඉධ පනෙතෙ සමණධම්මා නාමාති දස්සිතා.

යස්මා පන න එත්තාවතා සාමඤ්ඤත්ථො මත්ථකං පත්තො නාම හොති, තස්මා අපරෙපි සමණකරණෙ ධම්මෙ දස්සෙතුං, **සියා ඛො පන භික්ඛවෙ තුම්හාකන්ති** ආදිමාහ. තත්ථ **සාමඤ්ඤත්ථොති** සංයුත්තකෙ තාව, "කතමඤ්ච භික්ඛවෙ සාමඤ්ඤං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථිදං? සම්මාදිට්ඨි-පෙ-සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ සාමඤ්ඤං. කතමො ච භික්ඛවෙ සාමඤ්ඤත්ථො? යො භික්ඛවෙ රාගක්ඛයො, දොසක්ඛයො, මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ සාමඤ්ඤත්ථො"ති මග්ගො සාමඤ්ඤන්ති, ඵලනිබ්බානානි සාමඤ්ඤත්ථොති වුත්තානි. ඉමස්මිං පන ඨානෙ මග්ගම්පි ඵලම්පි එකතො කත්වා සාමඤ්ඤත්ථො කථිතොති වෙදිතබ්බො.

**ආරොචයාමීති** කථෙමි. **පටිවෙදයාමීති** ජානාපෙමි. **පරිසුද්ධො නො කායසමාචාරොති** එත්ථ කායසමාචාරො පරිසුද්ධො, අපරිසුද්ධොති දුවිධො. යො හි භික්ඛු පාණං හනති, අදින්නං ආදියති, මිච්ඡා චරති, තස්ස කායසමාචාරො අපරිසුද්ධො නාම. අයං පන කම්මපථවසෙනෙව වාරිතො. යො පන පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා පරං හෙඨෙති[1], විහෙඨෙති, තස්ස කායසමාචාරො අපරිසුද්ධො නාම. අයම්පි සික්ඛාපදබන්ධෙනෙව[2] පටික්ඛිත්තො. ඉමස්මිං සුත්තෙ උභයමෙතං අකථෙත්වා පරමසල්ලෙඛො නාම කථිතො. යො හි භික්ඛු පානීයඝටෙ වා පානීයං පිවන්තානං, පත්තෙ වා භත්තං භුඤ්ජන්තානං කාකානං නිවාරණවසෙන හත්ථං වා ලෙඩ්ඩුං වා දණ්ඩං වා උග්ගිරති, තස්ස කායසමාචාරො අපරිසුද්ධො; විපරීතො පරිසුද්ධො නාම. **උත්තානොති** උග්ගතො පාකටො. **විවටොති** අනාවටො අච්ඡන්නො. උභයෙනාපි පරිසුද්ධතංයෙව දීපෙති. **න ච ඡිද්දවාති** සදා එකසදිසො, අන්තරන්තරෙ ඡිද්දරහිතො. **සංවුතොති** කිලෙසානං ද්වාරපිදහනෙන පිහිතො; න වජ්ජපටිච්ඡාදනත්ථාය.

වචීසමාචාරෙපි යො භික්ඛු මුසා වදති, පිසුණං කථෙති, ඵරුසං භාසති, සම්ඵං පලපති, තස්ස වචීසමාචාරො අපරිසුද්ධො නාම. අයං පන කම්මපථවසෙනෙව වාරිතො. යො පන, ගහපතිකාති වා, දාසාති වා, පෙස්සාති වා ආදීහි ඛුංසෙන්තො වදති, තස්ස වචීසමාචාරො අපරිසුද්ධො නාම. අයම්පි[3] සික්ඛාපදබන්ධෙනෙව[4] පටික්ඛිත්තො. ඉමස්මිං සුත්තෙ උභයමෙතං අකථෙත්වා පරමසල්ලෙඛො නාම කථිතො. යො හි භික්ඛු දහරෙන වා සාමණෙරෙන වා, කච්චි භන්තෙ අම්හාකං

---

1. පොඨෙති-B; පොථෙති-S. 2. බන්ධෙනෙව-B, S.
3. අයම්පන-B. S 4. සික්ඛාපදවසෙනෙව-A. P2; බන්ධෙනෙව-B, S.

උපජ්ඣායං පස්සථාති වුත්තො, ආවුසො සම්බහුලා භික්ඛු තියො එකස්මිං පදෙසෙ විචරිංසු, උපජ්ඣායො තෙ වික්කාසික-සාකභණ්ඩිකං උක්ඛිපිත්වා ගතො භවිස්සතීති ආදිනා නයෙන ගස්සාධිප්පායොපි එවරූපං කථං කථෙති, තස්ස වචීසමාචාරො අපරිසුද්ධො; විපරීතො පරිසුද්ධො නාම.

මනොසමාචාරෙ, යො භික්ඛු අභිජ්ඣාලු, බ්‍යාපන්නචිත්තො, මිච්ඡාදිට්ඨිකො හොති, තස්ස මනොසමාචාරො අපරිසුද්ධො නාම. අයං පන කම්මපථවසෙනෙව වාරිතො. යො පන උපනික්ඛිත්තං ජාතරූපරජතං සාදියති, තස්ස මනොසමාචාරො අපරිසුද්ධො නාම. අයම්පි සික්ඛාපදබන්ධෙනෙව[1] පටික්ඛිත්තො. ඉමස්මිං සුත්තෙ උභයමෙතං අකථෙත්වා පරමසල්ලෙඛො නාම කථිතො. යො භික්ඛු කාමවිතක්කං වා බ්‍යාපාදවිතක්කං වා විහිංසාවිතක්කං වා විතක්කෙති, තස්ස මනොසමාචාරො අපරිසුද්ධො; විපරීතො පරිසුද්ධො නාම.

ආජීවස්මිං[2], යො භික්ඛු ආජීවහෙතු වෙජ්ජකම්මං, පහිණගමනං, ගණ්ඩඵාලනං[3] කරොති, අරුමක්ඛනං දෙති, තෙලං පචතීති එකවීසති අනෙසනාවසෙන ජීවිකං කප්පෙති; යො වා පන විඤ්ඤාපෙත්වා භුඤ්ජති, තස්ස ආජීවො අපරිසුද්ධො නාම. අයං පන සික්ඛාපදබන්ධෙනෙව[1] පටික්ඛිත්තො. ඉමස්මිං සුත්තෙ එතං අකථෙත්වා පරමසල්ලෙඛො නාම කථිතො. යො හි භික්ඛු සප්පි-නවනීත-තෙල-මධු-ඵාණිතාදීනි ලභිත්වා, ස්වෙ වා පුන දිවසෙ වා භවිස්සතීති[4] සන්නිධිකාරකං පරිභුඤ්ජති; යො වා පන නිම්බඞ්කුරාදීනි දිස්වා සාමණෙරෙ වදති: ආවුසො අඞ්කුරං[5] ඛාදථාති; සාමණෙරා ථෙරො ඛාදිතුකාමොති කප්පියං කත්වා දෙන්ති; දහරෙ පන සාමණෙරෙ වා, පානීයං පිවථ ආවුසොති වදති; ථෙරො පානීයං පිවිතුකාමොති පානීයසඞ්ඛං ධොවිත්වා දෙන්ති; තම්පි පරිභුඤ්ජන්තස්ස ආජීවො අපරිසුද්ධො නාම හොති; විපරීතො පරිසුද්ධො නාම.

**මත්තඤ්ඤූති** පරියෙසන-පටිග්ගහණ-පරිභොගෙසු මත්තඤ්ඤූ, යුත්තඤ්ඤූ, පමාණඤ්ඤූ. **ජාගරියමනුයුත්තොති** රත්තින්දිවං ඡ කොට්ඨාසෙ කත්වා එකස්මිං කොට්ඨාසෙ නිද්දාය ඔකාසං දත්වා[6] පඤ්ච කොට්ඨාසෙ ජාගරියම්හි යුත්තප්පයුත්තො. **සීහසෙය්‍යන්ති** එත්ථ කාමභොගිසෙය්‍යා, පෙතසෙය්‍යා, සීහසෙය්‍යා, තථාගතසෙය්‍යාති චතස්සො සෙය්‍යා. තත්ථ "යෙභුය්‍යෙන භික්ඛවෙ කාමභොගී සත්තා වාමෙන පස්සෙන සෙන්තී"ති අයං කාමභොගිසෙය්‍යා. තෙසු හි යෙභුය්‍යෙන දක්ඛිණෙන පස්සෙන සයානො නාම නත්ථි, "යෙභුය්‍යෙන භික්ඛවෙ පෙතා උත්තානා සෙන්තී"ති අයං පෙතසෙය්‍යා. පෙතා හි අප්පමංසලොහිතත්තා අට්ඨිසඞ්ඝාටජටිතා[7] එකෙන පස්සෙන සයිතුං න සක්කොන්ති, උත්තානාව සෙන්ති. "යෙභුය්‍යෙන භික්ඛවෙ සීහො මිග-

1. බන්ධෙනෙව-B. S. 2. ආජීවස්මිං ති-L. 3. ගණ්ඩඵාලනං-S, E. 4. භවිස්සතීති-S, E. 5. අඞ්කුරෙ-S, E. 6. කත්වා-B, S. 7. ජටිතා-B, S.

රාජා නඞ්ගුට්ඨං අන්තරසත්ථිම්හි පක්ඛිපිත්වා දක්ඛිණෙන පස්සෙන සෙතී"ති අයං සීහසෙය්‍යා. තෙජුස්සදත්තා හි සීහො මිගරාජා ද්වෙ පුරිමපාදෙ එකස්මිං ඨානෙ ඨපෙත්වා නඞ්ගුට්ඨං අන්තරසත්ථිම්හි පක්ඛිපිත්වා පුරිමපාද-පච්ඡිමපාද-නඞ්ගුට්ඨානං ඨිතොකාසං සල්ලක්ඛෙත්වා ද්වින්නං පුරිමපාදානං මත්ථකෙ සීසං ඨපෙත්වා සයති. දිවසම්පි සයිත්වා පබුජ්ඣමානො න උත්‍රසන්තො පබුජ්ඣති. සීසං පන උක්ඛිපිත්වා පුරිමපාදාදීනං ඨිතොකාසං සල්ලක්ඛෙති. සචෙ කිඤ්චි ඨානං විජහිත්වා ඨිතං හොති, නයිදං තුය්හං[1] ජාතියා, න සූරභාවස්ස[2] අනුරූපන්ති අනත්තමනො හුත්වා තත්ථෙව සයති; න ගොචරාය පක්කමති. අවිජහිත්වා ඨිතෙ පන, තුය්හං ජාතියා සූරභාවස්ස ච අනුරූපමිදන්ති හට්ඨතුට්ඨො උට්ඨාය සීහවිජම්භිතං විජම්භිත්වා කෙසරභාරං විධුනිත්වා තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති. චතුත්ථජ්ඣානසෙය්‍යා පන තථාගතසෙය්‍යාති වුච්චති. තාසු ඉධ සීහසෙය්‍යා ආගතා. අයං හි තෙජුස්සද ඉරියාපථත්තා උත්තමසෙය්‍යා නාම.

**පාදෙ පාදන්ති** දක්ඛිණපාදෙ වාමපාදං. **අච්චාධායාති** අති-ආධාය; ඊසකං අතික්කම්ම ඨපෙත්වා. ගොප්ඵකෙන හි ගොප්ඵකෙ ජාණුනා වා ජාණුම්හි සංඝට්ටියමානෙ අභිණ්හං වෙදනා උප්පජ්ජති, චිත්තං එකග්ගං න හොති, සෙය්‍යා අඵාසුකා හොති. යථා පන න සංඝට්ටෙති, එවං අතික්කම්ම ඨපිතෙ[3] වෙදනා නුප්පජ්ජති, චිත්තං එකග්ගං හොති, සෙය්‍යා ඵාසු[4] හොති. තස්මා එවමාහ.

**අභිජ්ඣං ලොකෙති** ආදි චූළහත්ථිපදෙ විත්ථාරිතං. යා පනායං, **සෙය්‍යථාපි භික්ඛවෙති** උපමා වුත්තා, තත්ථ **ඉණං ආදායාති** වඩ්ඪියා ධනං ගහෙත්වා. **බ්‍යන්තිකරෙය්‍යාති** විගතන්තං[5] කරෙය්‍ය. යථා තෙසං කාකණිකමත්තොපි පරියන්තො නාවසිස්සති, එවං කරෙය්‍ය; සබ්බසො පටිනිය්‍යාතෙය්‍යාති අත්ථො. **තතො නිදානන්ති** ආනණ්‍යනිදානං. සො හි අනණොම්හීති ආවජ්ජන්තො බලවපාමොජ්ජං ලභති[6], බලවසොමනස්සං අධිගච්ඡති. තෙන වුත්තං: **ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය[7] සොමනස්සන්ති**.

විසභාගවෙදනුප්පත්තියා කකචෙනෙව චතුඉරියාපථං ඡින්දන්තො ආබාධෙතීති ආබාධො; ස්වාස්ස අත්ථීති **ආබාධිකො**. තංසමුට්ඨානෙන දුක්ඛෙන **දුක්ඛිතො**. **අධිමත්තගිලානොති** බාළ්හගිලානො. **නච්ඡාදෙය්‍යාති** අධිමත්තබ්‍යාධිපරෙතතාය න රුච්චෙය්‍ය. **බලමත්තාති** බලමෙව. බලඤ්චස්ස කායෙ න භවෙය්‍යාති අත්ථො. **තතො නිදානන්ති** ආරොග්‍යනිදානං. තස්ස හි, ආරොගොම්හීති ආවජ්ජයතො තදුභයං හොති. තෙන වුත්තං: **ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය[7] සොමනස්සන්ති**.

---

1. තුම්හාකං-A P2. 2. ජාතියා සූරභාවස්ස ච-S; ජාතියා න සූරභාවස්ස ච-E.
3. ඨිතෙ-L. 4. ඵාසුකා-B. S. 5. බ්‍යන්තීකරෙය්‍යාති විගතන්තාති-B. S.
6. පාමොජ්ජං-B, S. 7. පාමුජ්ජං, අධිගච්ඡ (පාලි)

**න චස්ස කිඤ්චි භොගානං වයොති** කාකණිකමත්තම්පි භොගානං වයො න භවෙය්‍ය. **තස්සො නිදානන්ති** බන්ධනමොක්ඛනිදානං. සෙසං වුත්තනයෙනෙව සබ්බපදෙසු යොජෙතබ්බං.

**අනත්තාධීනොති** න අත්තනි අධීනො, අත්තනො රුචියා කිඤ්චි කාතුං න ලභති. **පරාධීනොති** පරෙසු අධීනො, පරස්සෙව රුචියා පවත්තති. **න යෙන කාමඞ්ගමොති** යෙන දිසාභාගෙනස්ස කාමො හොති, ඉච්ඡා උප්පජ්ජති ගමනාය, තෙන ගන්තුං න ලභති. **දාසව්‍යාති** දාසභාවො. **භුජිස්සොති** අත්තනො සන්තකො. **තස්සො නිදානන්ති** භුජිස්සනිදානං. **කන්තාරද්ධානමග්ගන්ති** කන්තාරං අද්ධානමග්ගං නිරුදකං දීඝමග්ගන්ති අත්ථො. **තස්සො නිදානන්ති** ඛෙමභූමි[1]නිදානං.

**ඉමෙ පඤ්ච නීවරණෙ අප්පහීනෙති** එත්ථ භගවා අප්පහීනං කාමච්ඡන්දනීවරණං ඉණසදිසං සෙසානි රොගාදිසදිසානි කත්වා දස්සෙති. තත්‍රායං සදිසතා: යො හි පරෙසං ඉණං ගහෙත්වා විනාසෙති, සො තෙහි ඉණං දෙහීති වුච්චමානොපි ඵරුසං වුච්චමානොපි බජ්ඣමානොපි[2] කිඤ්චි පටිප්ඵරිතුං න සක්කොති, සබ්බං තිතික්ඛති. තිතික්ඛාකාරණං හිස්ස තං ඉණං හොති. එවමෙව යො යම්හි කාමච්ඡන්දෙන රජ්ජති, තණ්හාගහණෙන තං වත්ථුං ගණ්හාති, සො තෙන ඵරුසං වුච්චමානොපි බජ්ඣමානොපි පහරියමානොපි සබ්බං තිතික්ඛති. තිතික්ඛාකාරණං හිස්ස සො කාමච්ඡන්දො හොති; ඝරසාමිකෙහි වධීයමානානං ඉත්ථීනං වියාති. එවං ඉණං විය කාමච්ඡන්දො දට්ඨබ්බො.

යථා පන පිත්තරොගාතුරො මධුසක්ඛරාදීසුපි දින්නෙසු පිත්තරොගාතුරතාය තෙසං රසං න වින්දති, තිත්තකං තිත්තකන්ති උග්ගිරතියෙව එවමෙව බ්‍යාපන්නචිත්තො හිතකාමෙහි ආචරියුපජ්ඣායෙහි අප්පමත්තකම්පි ඔවදියමානො ඔවාදං න ගණ්හාති, අතිවිය මෙ තුම්හෙ උපද්දවෙථාති ආදීනි වත්වා විබ්භමති. පිත්තාතුරතාය සො පුරිසො මධුසක්ඛරාදිරසං[3] විය, කොධාතුරතාය ඣානසුඛාදිභෙදං සාසනරසං න වින්දතීති, එවං රොගො විය බ්‍යාපාදො දට්ඨබ්බො.

යථා පන නක්ඛත්තදිවසෙ බන්ධනාගාරෙ බද්ධො පුරිසො නක්ඛත්තස්ස නෙව ආදිං, න මජ්ඣං, න පරියොසානං පස්සති. සො දුතියදිවසෙ මුත්තො, අහො හියො නක්ඛත්තං මනාපං අහොසි, අහො නච්චං, අහො ගීතන්ති ආදීනි සුත්වාපි පටිවචනං න දෙති. කිං කාරණා? නක්ඛත්තස්ස අනනුභූතත්තා. එවමෙව ථීනමිද්ධාභිභූතො භික්ඛු විචිත්තනයෙපි ධම්මසවනෙ වත්තමානෙ නෙව තස්ස ආදිං, න මජ්ඣං, න පරියොසානං ජානාති. සො උට්ඨිතෙ[4] ධම්මසවනෙ, අහො ධම්මසවනං, අහො කාරණං, අහො උපමාති ධම්මසවනස්ස වණ්ණං භණමානානං

1. ඛෙමන්තභූමි-B, S.
2. වධීයමානොපි-T1; බජ්ඣමානොපි පහරියමානොපි-S.
3. මධුසක්ඛරරසං-L; මධුසක්ඛරාරසං-E.
4. උපට්ඨිතෙ-B, S.

සුත්වාපි පටිවචනං න දෙති. කිං කාරණා? ථිනමිද්ධවසෙන ධම්මකථාය අනනුභූතත්තාති. එවං බන්ධනාගාරං විය ථිනමිද්ධං දට්ඨබ්බං.

යථා පන නක්ඛත්තං කීළන්තොපි දාසො, ඉදං නාම අච්චායිකං කරණීයං අත්ථි, සීඝං තත්ථ ගච්ඡ, නො චෙ ගච්ඡසි, හත්ථපාදං වා[1] තෙ ඡින්දාමි, කණ්ණනාසං වාති වුත්තො සීඝං ගච්ඡතියෙව, නක්ඛත්තස්ස ආදිමජ්ඣපරියොසානං අනුභවිතුං න ලභති. කස්මා? පරාධීනතාය. එවමෙව[2] විනයෙ අපකතඤ්ඤුනා විවෙකත්ථාය අරඤ්ඤං පවිට්ඨෙනාපි කිස්මිඤ්චිදෙව අන්තමසො කප්පියමංසෙපි අකප්පියසඤ්ඤාය උප්පන්නාය විවෙකං පහාය සීලපරිසොධනත්ථං විනයධරස්ස සන්තිකං ගන්තබ්බං හොති; විවෙකසුඛං අනුභවිතුං න ලභති. කස්මා? උද්ධච්චකුක්කුච්චාභිභූතතායාති. එවං දාසබ්‍යං විය උද්ධච්චකුක්කුච්චං වෙදිතබ්බං.

යථා පන කන්තාරද්ධානමග්ගං පටිපන්නො පුරිසො චොරෙහි මනුස්සානං විලුත්තොකාසං, හතොකාසං[3] දිස්වා දණ්ඩකසද්දෙනපි සකුණසද්දෙනපි, චොරා ආගතාති උස්සඞ්කිත-පරිසඞ්කිතො හොති, ගච්ඡතිපි, තිට්ඨතිපි, නිවත්තතිපි. ගතට්ඨානතො ආගතට්ඨානමෙව බහුතරං හොති. සො කිච්ඡෙන කසිරෙන ඛෙමන්තභූමිං පාපුණාති වා, න වා පාපුණාති. එවමෙව යස්ස අට්ඨසු ඨානෙසු විචිකිච්ඡා උප්පන්නා හොති, සො, බුද්ධො නු ඛො, න නු ඛො බුද්ධොති ආදිනා නයෙන විචිකිච්ඡන්තො අධිමුච්චිත්වා සද්ධාය ගණ්හිතුං න සක්කොති. අසක්කොන්තො මග්ගං වා ඵලං වා න පාපුණාතීති. ඉති යථා කන්තාරද්ධානමග්ගෙ චොරා අත්ථි නත්ථීති පුනප්පුනං ආසප්පනපරිසප්පනං, අපරියොගාහනං, ඡම්භිතත්තං චිත්තස්ස උප්පාදෙන්තො ඛෙමප්පත්තියා අන්තරායං කරොති, එවං විචිකිච්ඡාපි, බුද්ධො න බුද්ධොති ආදිනා නයෙන පුනප්පුනං ආසප්පනපරිසප්පනං, අපරියොගාහනං, ඡම්භිතත්තං චිත්තස්ස උප්පාදයමානා අරියභූමිප්පත්තියා[4] අන්තරායං කරොතීති කන්තාරද්ධානමග්ගො විය දට්ඨබ්බා.

**ඉදානි සෙය්‍යථාපි භික්ඛවෙ ආණණ්‍යන්ති** එත්ථ භගවා පහීනකාමච්ඡන්දනීවරණං ආනණ්‍යසදිසං, සෙසානි ආරොග්‍යාදි-සදිසානි කත්වා දස්සෙති. තත්‍රායං සදිසතා: යථාහි පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙත්වා සමිද්ධකම්මන්තො, ඉණං නාම පලිබොධමූලන්ති චින්තෙත්වා සවඩ්ඪිකං ඉණං නිය්‍යාතෙත්වා පණ්ණං ඵාලාපෙය්‍ය. අථස්ස තතො පට්ඨාය නෙව කොචි දූතං පෙසෙති, න පණ්ණං, තෙ[5] ඉණසාමිකෙ දිස්වාපි සචෙ ඉච්ඡති, ආසනා උට්ඨහති, නො චෙ න උට්ඨහති. කස්මා? තෙහි සද්ධිං නිල්ලෙපතාය, අලග්ගතාය. එවමෙව භික්ඛු, අයං කාමච්ඡන්දො නාම පලිබොධමූලන්ති සතිපට්ඨානෙ වුත්ත-

1. හත්ථපාදං--S. E. 2. එවමෙවං--L.
3. පහතොකාසං ච--E; විලුත්තොකාසං ච--S.
4. අරියභූමිඛෙමප්පත්තියා--B; අරියමග්ගපත්තත්ථා--S. 5. තො--B, S.

නයෙනෙව ඉමං ධම්මං භාවෙත්වා කාමච්ඡන්දනීවරණං පජහති. තස්සෙවං පහීනකාමච්ඡන්දස්ස, යථා ඉණමුත්තස්ස පුරිසස්ස ඉණසාමිකෙ දිස්වා නෙව භයං, න ඡම්භිතත්තං හොති, එවමෙව පරවත්ථුම්හි නෙව සඞ්ගො, න බන්ධො[1] හොති, දිබ්බානිපි රූපානි පස්සතො කිලෙසො න සමුදාචරති. තස්මා භගවා ආනණ්‍යමිව කාමච්ඡන්දපහානං ආහ.

යථා පන සො පිත්තරොගාතුරො පුරිසො භෙසජ්ජකිරියාය තං රොගං වූපසමෙත්වා තතො පට්ඨාය මධුසක්කරාදීනං රසං වින්දති. එවමෙව භික්ඛු, අයං බ්‍යාපාදො නාම අනත්ථකරණොති ඉමං ධම්මං භාවෙත්වා බ්‍යාපාදනීවරණං පජහති. සො එවං පහීනබ්‍යාපාදො, යථා පිත්තරොගමුත්තො පුරිසො මධුසක්කරාදීනි මධුරානි සම්පියායමානො පටිසෙවති. එවමෙව ආචාරපණ්ණත්ති-ආදීනි සික්ඛාපියමානො සිරසා සම්පටිච්ඡිත්වා සම්පියායමානො සික්ඛති. තස්මා භගවා ආරොග්‍යමිව බ්‍යාපාදපහානං ආහ.

යථා සො නක්ඛත්තදිවසෙ බන්ධනාගාරං පවෙසිතපුරිසො අපරස්මිං නක්ඛත්තදිවසෙ, පුබ්බෙපි අහං පමාදදොසෙන බද්ධො තං නක්ඛත්තං නානුභවිං, ඉදානි අප්පමත්තො භවිස්සාමීති යථාස්ස පච්චත්ථිකා ඔකාසං න ලභන්ති, එවං අප්පමත්තො හුත්වා නක්ඛත්තං අනුභවිත්වා, අහො නක්ඛත්තන්ති උදානං උදානෙති. එවමෙව භික්ඛු, ඉදං ථීනමිද්ධං නාම මහානත්ථකරන්ති ඉමං ධම්මං භාවෙත්වා ථීනමිද්ධනීවරණං පජහති. සො එවං පහීනථීනමිද්ධො යථා බන්ධනා මුත්තපුරිසො සත්තාහම්පි නක්ඛත්තස්ස ආදිමජ්ඣපරියොසානං අනුභවති, එවමෙව ධම්මනක්ඛත්තස්ස ආදිමජ්ඣපරියොසානං අනුභවන්තො සහ පටිසම්භිදාහි අරහත්තං පාපුණාති. තස්මා භගවා බන්ධනමොක්ඛමිව ථීනමිද්ධපහානං ආහ.

යථා පන දාසො කිඤ්චිදෙව මිත්තං උපනිස්සාය සාමිකානං ධනං දත්වා අත්තානං භුජිස්සං කත්වා තතො පට්ඨාය යං ඉච්ඡති, තං කරෙය්‍ය. එවමෙව භික්ඛු, ඉදං උද්ධච්චකුක්කුච්චං නාම මහානත්ථකරන්ති ඉමං ධම්මං භාවෙත්වා උද්ධච්චකුක්කුච්චං පජහති. සො එවං පහීන-උද්ධච්චකුක්කුච්චො, යථා භුජිස්සො පුරිසො යං ඉච්ඡති තං කරොති, න තං කොචි බලක්කාරෙන තතො නිවත්තෙති, එවමෙව භික්ඛු යථාසුඛං නෙක්ඛම්මපටිපදං පටිපජ්ජති, න තං උද්ධච්චකුක්කුච්චං බලක්කාරෙන තතො නිවත්තෙති. තස්මා භගවා භුජිස්සං විය උද්ධච්චකුක්කුච්චපහානං ආහ.

යථා බලවා පුරිසො හත්ථසාරං ගහෙත්වා සජ්ජාවුධො සපරිවාරො කන්තාරං පටිපජ්ජෙය්‍ය. තං චොරා දූරතොව දිස්වා පලායෙය්‍යුං. සො සොත්ථිනා තං කන්තාරං නිත්ථරිත්වා ඛෙමන්තං පත්තො හට්ඨතුට්ඨො අස්ස. එවමෙව භික්ඛු, අයං විචිකිච්ඡා නාම අනත්ථකාරිකාති ඉමං ධම්මං භාවෙත්වා විචිකිච්ඡං පජහති. සො එවං පහීනවිචිකිච්ඡො, යථා බලවා

1. ගෙධො-B.

සජ්ජාවුධො සපරිවාරො පුරිසො චොරෙ දිස්වා නිබ්භයො, චොරෙ තිණම්පි[1] අගණෙත්වා සොත්ථිනා නික්ඛමිත්වා ඛෙමන්තභූමිං පාපුණාති, එවමෙව දුච්චරිතකන්තාරං නිත්ථරිත්වා පරමඛෙමන්තභූමිං අමතං නිබ්බානං පාපුණාති. තස්මා භගවා ඛෙමන්තභූමිං විය විචිකිච්ඡාපහානං ආහ.

**ඉමමෙව කායන්ති** ඉමං කරජකායං. **අභිසන්දෙතීති** තෙමෙති, සිනෙහෙති, සබ්බත්ථ පවත්තපීතිසුඛං කරොති. **පරිසන්දෙතීති** සමන්තතො සන්දෙති. **පරිපූරෙතීති** වායුනා භස්තං විය පූරෙති. **පරිප්ඵරතීති** සමන්තතො ඵුසති. **සබ්බාවතො කායස්සාති** අස්ස භික්ඛුනො සබ්බකොට්ඨාසවතො කායස්ස කිඤ්චි[2] උපාදින්නක-සන්තතිපවත්තිට්ඨානෙ ඡවිමංසලොහිතානුගතං අණුමත්තම්පි ඨානං පඨමජ්ඣානසුඛෙන අඵුටං නාම න හොති.

**දක්ඛොති** ඡෙකො, පටිබලො නහානියචුණ්ණානි කාතුඤ්චෙව යොජෙතුඤ්ච සන්නෙතුඤ්ච. **කංසථාලෙති** යෙන කෙනචි ලොහෙන කතභාජනෙ. මත්තිකභාජනං පන ථිරං න හොති, සන්නෙන්තස්ස[3] භිජ්ජති; තස්මා තං න දස්සෙති. **පරිප්ඵොසකං පරිප්ඵොසකන්ති** සිඤ්චිත්වා සිඤ්චිත්වා. **සන්නෙය්‍යාති** වාමහත්ථෙන කංසථාලකං ගහෙත්වා දක්ඛිණහත්ථෙන පමාණයුත්තං උදකං සිඤ්චිත්වා සිඤ්චිත්වා පරිමද්දන්තො පිණ්ඩං[4] කරෙය්‍ය. **ස්නෙහානුගතාති** උදකසිනෙහෙන අනුගතා. **ස්නෙහපරෙතාති** උදකසිනෙහෙන පරිගතා. **සන්තරබාහිරාති** සද්ධිං අන්තොපදෙසෙන ච බහිපදෙසෙන ච. සබ්බත්ථකමෙව උදකසිනෙහෙන ඵුටාති අත්ථො. **න ච පග්ඝරණීති** න බින්දු-බින්දු-උදකං පග්ඝරති. සක්කා හොති හත්ථෙනපි ද්වීහිපි අඞ්ගුලීහි ගහෙතුං, ඔවට්ටිකම්පි කාතුන්ති අත්ථො.

දුතියජ්ඣානසුඛ-උපමායං **උබ්භිදොදකොති** උබ්භින්න-උදකො. උබ්භිජ්ජිත්වා උග්ගච්ඡන-උදකො.[5] න හෙට්ඨා උබ්භිජ්ජිත්වා උග්ගච්ඡන-උදකො, අන්තොයෙව පන උප්පජ්ජන-උදකොති අත්ථො. **ආයමුඛන්ති** ආගමනමග්ගො. **දෙවොති** මෙඝො. **කාලෙන කාලන්ති**[6] අන්වද්ධමාසං වා අනුදසාහං වාති අත්ථො. **ධාරන්ති** වුට්ඨිං. **නානුප්පවෙච්ඡෙය්‍යාති** න පවෙසෙය්‍ය, න වස්සෙය්‍යාති අත්ථො. **සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වාති** සීතං වාරි තං රහදං[7] පූරයමානං උප්පජ්ජිත්වා.[8] හෙට්ඨා උග්ගච්ඡන-උදකං හි උග්ගන්ත්වා භිජ්ජන්තං උදකං ඛොභෙති. චතූහි දිසාහි පවිසන-උදකං පුරාණපණ්ණ-තිණකට්ඨ-දණ්ඩකාදීහි උදකං ඛොභෙති. වුට්ඨි-උදකං ධාරානිපාත-බුබ්බුළකෙහි උදකං ඛොභෙති. සන්නිසින්නමෙව පන හුත්වා ඉද්ධිනිම්මිතමිව උප්පජ්ජමානං උදකං ඉමං පදෙසං ඵරති,

1. තිණං විය-B. 2. යං කිඤ්චි-B, S. 3 මද්දන්තස්ස-S
4. පිණ්ඩං-L; පිණ්ඩකං-S. 5. උබ්භින්න-උදකො-S, E.
6. කාලෙන කාලන්ති කාලෙ කාලෙ-E. 7. උදකරහදං-B, S.
8. උබ්භිජ්ජිත්වා-B.

ඉමං පදෙසං න ඵරතීති නත්ථි. තෙන අප්ඵුටොකාසො නාම න හොති. තත්ථ රහදො විය කරජකායො. උදකං විය දුතියජ්ඣානසුඛං. සෙසං පුරිමනයෙනෙව වෙදිතබ්බං.

තතියජ්ඣානසුඛ-උපමායං උප්පලානි එත්ථ සන්තීති **උප්පලිනී**. සෙසපදද්වයෙපි එසෙව නයො. එත්ථ ච සෙත-රත්ත-නීලෙසු යං කිඤ්චි උප්පලමෙව.[1] ඌනකසතපත්තං පුණ්ඩරීකං, සතපත්තං පදුමං. පත්ත නියමං වා විනාපි සෙතං පදුමං, රත්තං පුණ්ඩරීකන්ති අයමෙත්ථ විනිච්ඡයො. **උදකානුග්ගතානීති** උදකතො න උග්ගතානි. **අන්තොනිමුග්ගපොසීනීති** උදකතලස්ස අන්තො නිමුග්ගානියෙව හුත්වා පුස්සන්ති,[2] වඩ්ඪන්තීති අත්ථො. සෙසං පුරිමනයෙනෙව වෙදිතබ්බං.

චතුත්ථජ්ඣානසුඛ-උපමායං **පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙනාති** එත්ථ නිරුපක්කිලෙසට්ඨෙන පරිසුද්ධං; පභස්සරට්ඨෙන පරියොදාතං වෙදිතබ්බං. **ඔදාතෙන වත්ථෙනාති** ඉදං උතුඵරණත්ථං වුත්තං. කිලිට්ඨවත්ථෙන හි උතුඵරණං න හොති; තංඛණං ධොතපරිසුද්ධෙන උතුඵරණං බලවං හොති.

ඉමිස්සා හි උපමාය වත්ථං විය කරජකායො. උතුඵරණං විය චතුත්ථජ්ඣානසුඛං. තස්මා යථා සුන්හාතස්ස පුරිසස්ස පරිසුද්ධං වත්ථං සසීසං පාරුපිත්වා නිසින්නස්ස සරීරතො උතු සබ්බමෙව වත්ථං ඵරති,[3] න කොචි වත්ථස්ස අප්ඵුටොකාසො හොති, එවං චතුත්ථජ්ඣානසුඛෙන භික්ඛුනො කරජකායස්ස න කොචි ඔකාසො අප්ඵුටො හොතීති එවමෙත්ථ අත්ථො දට්ඨබ්බො. චතුත්ථජ්ඣානචිත්තමෙව වා පාරුතවත්ථං විය; තංසමුට්ඨානරූපං උතුඵරණං විය. යථා හි කත්ථචි ඔදාතවත්ථෙ කායං අඵුසන්තෙපි තංසමුට්ඨානෙන උතුනා සබ්බත්ථකමෙව කායො ඵුට්ඨො හොති, එවං චතුත්ථජ්ඣානසමුට්ඨිතෙන[4] සුඛුමරූපෙන සබ්බත්ථකමෙව භික්ඛුනො කායො ඵුට්ඨො[5] හොතීති එවමෙපෙත්ථ අත්ථො දට්ඨබ්බො.

පුබ්බෙනිවාසඤාණ-උපමායං තං දිවසං කතකිරියා පාකටා හොතීති තං දිවසං ගතගාමත්තයමෙව ගහිතං. තත්ථ ගාමත්තයං ගත පුරිසො විය පුබ්බෙනිවාසඤාණලාභී දට්ඨබ්බො. තයො ගාමා විය තයො භවා දට්ඨබ්බා. තස්ස පුරිසස්ස තීසු ගාමෙසු තං දිවසං කතකිරියාය ආවිභාවො විය පුබ්බෙනිවාසාය චිත්තං අභිනීහරිත්වා නිසින්නස්ස භික්ඛුනො තීසු භවෙසු කතකිරියාය ආවිභාවො දට්ඨබ්බො.

දිබ්බචක්ඛු-උපමායං **ද්වෙ අගාරාති** ද්වෙ ඝරා. **සද්වාරාති** සම්මුඛද්වාරා. **අනුචඞ්කමන්තෙනාති** අපරාපරං චඞ්කමන්තෙ. **අනුවිචරන්තෙනාති** ඉතො චිතො ච විචරන්තෙ; ඉතො පන ගෙහා නික්ඛමිත්වා එතං ගෙහං, එතස්මා වා නික්ඛමිත්වා ඉමං ගෙහං පවිසනවසෙන දට්ඨබ්බා.

1. උප්පලං උප්පලමෙව-P3, T2 B, S. 2. ඵුසන්ති-S. 3. චරති-L.
4. සමුට්ඨාපිතෙන-B. S. 5. ඵුටො-E.

තත්ථ ද්වෙ අගාරා සද්වාරා විය චුතිපටිසන්ධියො. චක්ඛුමා පුරිසො විය දිබ්බචක්ඛුඤාණලාභී. චක්ඛුමතො පුරිසස්ස ද්වින්නං ගෙහානං අන්තරෙ ඨත්වා පස්සතො ද්වෙ අගාරෙ පවිසනක-නික්ඛමනකපුරිසානං පාකටකාලො විය දිබ්බචක්ඛුලාභිනො ආලොකං වඩ්ඪෙත්වා ඔලොකෙන්තස්ස චවනක-උප්පජ්ජනක[1]සත්තානං පාකටකාලො. කිං පන තෙ ඤාණස්ස පාකටා පුග්ගලස්සාති? ඤාණස්ස. තස්ස පාකටත්තා පන පුග්ගලස්ස පාකටා යෙවාති.

ආසවක්ඛයඤාණ-උපමායං **පබ්බතසඞ්ඛෙපෙති** පබ්බතමත්ථකෙ. **අනාවිලොති** නික්කද්දමො. සිප්පියො ච සම්බුකා ච **සිප්පිසම්බුකං**. සක්ඛරා ච කඨලා ච **සක්ඛරකඨලං**. මච්ඡානං ගුම්බං, ඝටාති **මච්ඡගුම්බං**. **තිට්ඨන්තම්පි චරන්තම්පීති** එත්ථ සක්ඛරකඨලං තිට්ඨති යෙව; ඉතරානි චරන්තිපි තිට්ඨන්තිපි. යථා පන අන්තරන්තරා ඨිතාසුපි නිසින්නාසුපි නිපජ්ජමානාසුපි, එතා ගාවො චරන්තීති චරන්තියො උපාදාය ඉතරාපි චරන්තීති වුච්චන්ති, එවං තිට්ඨන්තමෙව සක්ඛරකඨලං උපාදාය ඉතරම්පි ද්වයං තිට්ඨන්තන්ති වුත්තං. ඉතරඤ්ච ද්වයං චරන්තං උපාදාය සක්ඛරකඨලම්පි චරන්තන්ති වුත්තං.

තත්ථ චක්ඛුමතො පුරිසස්ස තීරෙ ඨත්වා පස්සතො සිප්පිසම්බුකාදීනං විභූතකාලො විය ආසවානං ඛයාය චිත්තං නීහරිත්වා නිසින්නස්ස භික්ඛුනො චතුන්නං සච්චානං විභූතකාලො දට්ඨබ්බො.

ඉදානි සත්තහාකාරෙහි සලිඞ්ගතො සගුණතො ඛීණාසවස්ස නාමං ගණ්හන්තො **අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සමණො ඉතිපීති** ආදිමාහ. තත්ථ **එවං ඛො භික්ඛවෙ භික්ඛු සමණො හොතීති** ආදීසු භික්ඛවෙ එවං භික්ඛු සමිතපාපත්තා **සමණො** හොති, බාහිතපාපත්තා **බ්‍රාහ්මණො** හොති, නහාතකිලෙසත්තා **නහාතකො** හොති, ධොතකිලෙසත්තාති අත්ථො. චතුමග්ගඤාණසඞ්ඛාතෙහි වෙදෙහි අකුසලානං ධම්මානං ගතත්තා **වෙදගූ** හොති, විදිතත්තාති අත්ථො. තෙනෙව, **විදිතාස්ස හොන්තීති** ආදිමාහ. කිලෙසානං සුතත්තා **සොත්ථියො** හොති. නිස්සුතත්තා, අපගතත්තාති[2] අත්ථො. කිලෙසානං ආරකත්තා **අරියො** හොති. දූරීභූතත්තාති අත්ථො. සෙසං සබ්බත්ථ පාකටමෙවාති.

**මහාඅස්සපුරසුත්තං නවමං.**

---

## 1. 4. 10.

**එවමෙම සුත්තන්ති** චූළ[3]අස්සපුරං. දෙසනාකාරණං පුරිමසදිසමෙව. **සමණසාමීචිපටිපදාති** සමණානං අනුච්ඡවිකා, සමණානං අනුලොමපටිපදා. **සමණමලානන්ති** ආදීසු එතෙ ධම්මා උප්පජ්ජමානා සමණෙ මලිනෙ කරොන්තීති මලග්ගහිතෙ, තස්මා සමණමලාති වුච්චන්ති. එතෙහි සමණා දුස්සන්ති, පදුස්සන්ති, තස්මා **සමණදොසාති** වුච්චන්ති. එතෙ

1. උප්පජ්ජනක-S, E. 2. අංඝතත්තාති-B; අංගතත්තාති-S. 3. චූල-L, S.

උපපජ්ජිත්වා සමණෙ කසටෙ නිරොජෙ කරොන්ති, මිලාපෙන්ති, තස්මා **සමණකසටාති** වුච්චන්ති. **ආපායිකානං ඨානානන්ති** අපායෙ නිබ්බත්තාපනකානං කාරණානං. **දුග්ගතිවෙදනියානන්ති** දුග්ගතියං විපාකවෙදනාය පච්චයානං.

**මතජං නාමාති** මනුස්සා තිඛිණං අයං අරෙන[1] ඝංසිත්වා තං අයචුණ්ණං මංසෙන සද්ධිං මද්දිත්වා කොඤ්චසකුණෙ ඛාදාපෙන්ති. තෙ උච්චාරං කාතුං අසක්කොන්තා මරන්ති. නො චෙ මරන්ති, පහරිත්වා මාරෙන්ති. අථ නෙසං කුච්ඡිං ඵාලෙත්වා අන්තානි[2] උදකෙ ධොවිත්වා චුණ්ණකං ගහෙත්වා මංසෙන සද්ධිං මද්දිත්වා පුන ඛාදාපෙන්තීති එවං සත්ත වාරෙ ඛාදාපෙත්වා ගහිතෙන අයචුණ්ණෙන ආවුධං කරොන්ති. සුසික්ඛිතාව නං අයකාරා බහුං හත්ථකම්මමූලං ලභිත්වා කරොන්ති. තං මතසකුණතො ජාතත්තා මතජන්ති වුච්චති; අතිතිඛිණං හොති. **පීතනිසිතන්ති** උදකපීතඤ්චෙව සිලාය ච සුනිසිතං. **සංඝාටියාති** කොසියා. **සම්පාරුතන්ති** පරියොනද්ධං. **සම්පලිවෙඨිතන්ති** සමන්තතො වෙඨිතං.

**රජොජල්ලිකස්සාති** රජොජල්ලධාරිනො. **උදකොරොහකස්සාති** දිවසස්ස තික්ඛත්තුං උදකං ඔරොහන්තස්ස. **රුක්ඛමූලිකස්සාති** රුක්ඛමූලවාසිනො. **අබ්භොකාසිකස්සාති** අබ්භොකාසවාසිනො. **උබ්භට්ඨකස්සාති** උද්ධං ඨිතකස්ස. **පරියායභත්තිකස්සාති** මාසවාරෙන වා අඩ්ඪමාසවාරෙන වා භුඤ්ජන්තස්ස. සබ්බමෙතං බාහිරසමයෙනෙව කථිතං. ඉමස්මිං හි සාසනෙ චීවරධරො භික්ඛු සංඝාටිකොති න වුච්චති. රජොජල්ලධාරණාදි-වතානි ච ඉමස්මිං සාසනෙ නත්ථියෙව. බුද්ධවචනස්ස බුද්ධවචනමෙව නාමං, න මන්තාති. රුක්ඛමූලිකො, අබ්භොකාසිකොති එත්තකංයෙව පන ලබ්භති. තම්පි බාහිරසමයෙනෙව කථිතං.

**ජාතමෙව නන්ති**, ජාතදිවසෙ ජාතමත්තංයෙව නං. **සඞ්ඝාටිකං කරෙය්‍යුන්ති** සංඝාටිකවත්ථං නිවාසෙත්වා ච පාරුපෙත්වා ච සංඝාටිකං කරෙය්‍යුං. එස නයො සබ්බත්ථ.

**විසුද්ධමත්තානං සමනුපස්සතීති** අත්තානං විසුද්ධන්ති පස්සති. විසුද්ධොති පන න තාව වත්තබ්බො. **පාමුජ්ජං ජායතීති** තුට්ඨාකාරො ජායති. **පමුදිතස්ස පීතීති** තුට්ඨස්ස සකලසරීරං ඛොභයමානා පීති ජායති. **පීතිමනස්ස කායොති** පීතිසම්පයුත්තස්ස පුග්ගලස්ස නාමකායො. **පස්සම්භතීති** විගතදරථො හොති. **සුඛං වෙදෙතීති** කායිකම්පි චෙතසිකම්පි සුඛං වෙදියති. **චිත්තං සමාධියතීති** ඉමිනා නෙක්ඛම්මසුඛෙන සුඛිතස්ස චිත්තං සමාධියති, අප්පනාපත්තං විය හොති.

---

1. අයෙන-L, B, S.  2. තානි-S; තං-B.

**සො මෙත්තාසහගතෙන චෙතසාති** හෙට්ඨා කිලෙසවසෙන ආරද්ධා දෙසනා පබ්බතෙ වට්ඨවුට්ඨි විය නදිං, යථානුසන්ධිනා බ්‍රහ්මවිහාරභාවනං ඔතිණ්ණා. තත්ථ යං වත්තබ්බං සියා, තං සබ්බං විසුද්ධිමග්ගෙ වුත්තමෙව. **සෙය්‍යථාපි භික්ඛවෙ පොක්ඛරණීති** මහාසීහනාදසුත්තෙ පොක්ඛරණියා මග්ගො උපමිතො, ඉධ සාසනං උපමිතන්ති වෙදිතබ්බං. **ආසවානං ඛයා සමණො හොතීති** සබ්බකිලෙසානං සමිතත්තා පරමත්ථසමණො හොති. සෙසං සබ්බත්ථ උත්තානමෙවාති.

**චූළඅස්සපුරසුත්තං දසමං.**

## නිට්ඨිතො චතුත්ථො වග්ගො.

---

### 1. 5. 1.

**එවමෙම සුතන්ති** සාලෙය්‍යකසුත්තං. තත්ථ **කොසලෙසූති** කොසලා නාම ජානපදිකා[1] රාජකුමාරා; තෙසං නිවාසො එකොපි ජනපදො රූළ්හිසද්දෙන කොසලාති වුච්චති; තස්මිං කොසලෙසු ජනපදෙ. පොරාණා පනාහු: යස්මා පුබ්බෙ මහාපනාදං රාජකුමාරං නානා නාටකානි දිස්වා සිතමත්තම්පි අකරොන්තං සුත්වා රාජා ආහ: යො මම පුත්තං හසාපෙති, සබ්බාලඞ්කාරෙන තං අලංකරෙමීති. තතො නඞ්ගලානිපි ඡඩ්ඩෙත්වා මහාජනකායෙ සන්නිපතිතෙ[2] මනුස්සා අතිරෙකානි සත්තවස්සානි නානාකීළිකායො දස්සෙත්වා තං හසාපෙතුං න සක්ඛිංසු. තතො සක්කො දෙවනාටකං පෙසෙසි. සො දිබ්බනාටකං දස්සෙත්වා හසාපෙසි. අථ තෙ මනුස්සා අත්තනො අත්තනො වසනොකාසාභිමුඛා පක්කමිංසු. තෙ පටිපථෙ මිත්තසුහජ්ජාදයො දිස්වා පටිසන්ථාරං කරොන්තා, කච්චි කුසලන්ති[3] ආහංසු. තස්මා තං කුසලං කුසලන්ති වචනං උපාදාය සො පදෙසො කොසලොති වුච්චතීති.

**චාරිකං චරමානොති** අතුරිතචාරිකං චරමානො. **මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධින්ති** සතං වා සහස්සං වා සතසහස්සං වාති එවං අපරිච්ඡින්නෙන මහාභික්ඛුසඞ්ඝෙන සද්ධිං. **බ්‍රාහ්මණගාමොති** බ්‍රාහ්මණානං සමොසරණගාමොපි බ්‍රාහ්මණගාමොති වුච්චති; බ්‍රාහ්මණානං භොගගාමොපි. ඉධ සමොසරණගාමො අධිප්පෙතො. **තදවසරීති** තං අවසරි. සම්පත්තොති අත්ථො. විහාරො පනෙත්ථ අනියාමිතො. තස්මා තස්ස අවිදූරෙ බුද්ධානං අනුච්ඡවිකො එකො වනසණ්ඩො භවිස්සති, සත්ථා තං වනසණ්ඩං ගතොති වෙදිතබ්බො.

**අස්සොසුන්ති** සුණිංසු, උපලභිංසු, සොතද්වාරසම්පත්තවචනනිග්ඝොසානුසාරෙන ජානිංසු. **ඛොති** අවධාරණත්ථෙ, පදපූරණ

---

1. ජනපදවාසිනො-S; ජානපදිනො-E. 2. මහාජනකායෙ සන්නිපතිතෙ-E.
3. කච්චි භො කුසලං කච්චි භො කුසලන්ති-B.

මත්ථො වා නිපාතො. තත්ථ අවධාරණත්ථෙන අස්සොසුං යෙව, න නෙසං කොචි සවනන්තරායො අහොසීති අයමත්ථො වෙදිතබ්බො; පදපූරණෙන බ්‍යඤ්ජනසිලිට්ඨතාමත්තමෙව.

ඉදානි **යමත්ථං** අස්සොසුං, තං පකාසෙන්තා. **සමණො ඛලු භො ගොතමොති** ආදි වුත්තං. තත්ථ සමිතපාපත්තා **සමණොති** වෙදිතබ්බො. **ඛලූති** අනුස්සවත්ථෙ නිපාතො. **භොති** තෙසං අඤ්ඤමඤ්ඤං ආලපනමත්තං. **ගොතමොති** භගවතො ගොත්තවසෙන පරිදීපනං. තස්මා **සමණො ඛලු භො ගොතමොති** එත්ථ, සමණො කිර භො ගොතමගොත්තොති එවමත්ථො දට්ඨබ්බො. **සක්‍යපුත්තොති** ඉදං පන භගවතො උච්චාකුලපරිදීපනං. **සක්‍යකුලා පබ්බජිතොති** සද්ධා පබ්බජිතභාවදීපනං. කෙනචි පාරිජුඤ්ඤෙන[1] අනභිභූතො, අපරික්ඛීණං යෙව තං කුලං පහාය සද්ධා පබ්බජිතොති වුත්තං හොති. තතො පරං වුත්තත්ථමෙව.

**තං ඛො පනාති** ඉත්ථම්භූතාඛ්‍යානත්ථෙ උපයොගවචනං. තස්ස ඛො පන භොතො ගොතමස්සාති අත්ථො. **කල්‍යාණොති** කල්‍යාණගුණසමන්නාගතො. සෙට්ඨොති වුත්තං හොති. **කිත්තිසද්දොති** කිත්ති යෙව, ථුතිඝොසො වා. **අබ්භුග්ගතොති** සදෙවකං ලොකං අජ්ඣොත්ථරිත්වා උග්ගතො. කින්ති? **ඉතිපි සො භගවා-පෙ-බුද්ධො භගවාති.** තත්‍රායං **පදසම්බන්ධො**: සො භගවා ඉතිපි අරහං, ඉතිපි සම්මාසම්බුද්ධො -පෙ-ඉතිපි භගවාති, ඉමිනා ච ඉමිනා ච කාරණෙනාති වුත්තං හොති.

තත්ථ "ආරකත්තා, අරීනං අරානං ච හතත්තා, පච්චයාදීනං අරහත්තා, පාපකරණෙ රහාභාවාති ඉමෙහි තාව කාරණෙහි සො භගවා **අරහන්ති** වෙදිතබ්බො"ති ආදිනා නයෙන මාතිකං නික්ඛිපිත්වා සබ්බානෙව එතානි පදානි විසුද්ධිමග්ගෙ බුද්ධානුස්සතිනිද්දෙසෙ විත්ථාරිතානීති තතො නෙසං විත්ථාරො ගහෙතබ්බො.

**සාධු ඛො පනාති** සුන්දරං ඛො පන. අත්ථාවහං සුඛාවහන්ති වුත්තං හොති. **තථාරූපානං අරහතන්ති** යථාරූපො සො භවං ගොතමො, එවරූපානං අනෙකෙහිපි කප්පකොටි-සතසහස්සෙහි දුල්ලභදස්සනානං බ්‍යාමප්පභාපරික්ඛිත්තෙහි අසීති-අනුබ්‍යඤ්ජනරතන-පතිමණ්ඩිතෙහි ද්වත්තිංසමහාපුරිසලක්ඛණවරෙහි[2] සමාකිණ්ණ-මනොරමසරීරානං අතප්පකදස්සනානං අතිමධුරධම්මනිග්ඝොසානං, යථාභූතගුණාධිගමෙන ලොකෙ අරහන්තොති ලද්ධසද්දානං අරහතං **දස්සනං හොතීති** පසාදසොම්මානි අක්ඛීනි උම්මීලෙත්වා දස්සනමත්තම්පි සාධු හොති; සචෙ පන අට්ඨඞ්ගසමන්නාගතෙන බ්‍රහ්මස්සරෙන ධම්මං දෙසෙන්තස්ස එකපදම්පි සොතුං ලභිස්සාම, සාධුතරං යෙව භවිස්සතීති එවං අජ්ඣාසයං කත්වා.

---

1. පාරිජඤ්ඤෙන-A. 2. ලක්ඛණවණ්ණෙහි-L. S.

**යෙන භගවා තෙනුපසංකමිංසූති** සබ්බකිච්චානි පහාය තුට්ඨමානසා ආගමිංසු. **එතදවොචුන්ති**, දුවිධා හි පුච්ඡා: අගාරියපුච්ඡා,[1] අනගාරියපුච්ඡා[2] ච. තත්ථ "කිං භන්තෙ කුසලං, කිං අකුසල"න්ති ඉමිනා නයෙන අගාරියපුච්ඡා[1] ආගතා. "ඉමෙ නු ඛො භන්තෙ පඤ්චුපාදානක්ඛන්ධා"ති ඉමිනා නයෙන අනගාරියපුච්ඡා[2]. ඉමෙ පන අත්තනො අනුරූපං අගාරියපුච්ඡං[1] පුච්ඡන්තා, එතං, **කො නු ඛො භො ගොතම හෙතු, කො පච්චයො**ති ආදිවචනං අවොචුං.

තෙසං භගවා යථා න සක්කොන්ති සල්ලක්ඛෙතුං, එවං සඞ්ඛිත්තෙනෙව තාව පඤ්හං විස්සජ්ජෙන්තො, **අධම්මචරියාවිසමචරියා හෙතු ඛො ගහපතයො**ති ආදිමාහ. කස්මා පන භගවා යථා න සල්ලක්ඛෙන්ති එවං විස්සජ්ජෙසීති? පණ්ඩිතමානිකා හි තෙ. ආදිතොව මාතිකං ඨපෙත්වා යථා සල්ලක්ඛෙන්ති එවං අත්ථෙ විත්ථාරිතෙ, දෙසනං උත්තානිකාති මඤ්ඤන්තා අවජානන්ති; මයම්පි කථෙන්තා එවමෙව කථෙය්‍යාමාති වත්තාරෙ භවන්ති. තෙන තෙසං භගවා යථා න සක්කොන්ති සල්ලක්ඛෙතුං එවං සංඛිත්තෙනෙව තාව පඤ්හං විස්සජ්ජෙසි.

තතො සල්ලක්ඛෙතුං අසක්කොන්තෙහි විත්ථාරදෙසනං යාචිතො විත්ථාරෙන දෙසෙතුං, **තෙනහි ගහපතයො**ති ආදිමාහ. තත්ථ **තෙන හීති** කාරණත්ථෙ නිපාතො. යස්මා මං තුම්හෙ යාචථ, තස්මාති අත්ථො. **තිවිධන්ති** තීහි කොට්ඨාසෙහි. **කායෙනා**ති කායද්වාරෙන. **අධම්මචරියාවිසමචරියා**ති අධම්මචරියසංඛාතා විසමචරියා. අයං පනෙත්ථ පදත්ථො: අධම්මස්ස චරියා අධම්මචරියා. අධම්මකාරණන්ති[3] අත්ථො. විසමං චරියා, විසමස්ස වා කම්මස්ස චරියාති විසමචරියා. අධම්මචරියා ච සා විසමචරියා චාති අධම්මචරියා-විසමචරියා. එතෙනුපායෙන සබ්බෙසු කණ්හසුක්කපදෙසු අත්ථො වෙදිතබ්බො.

**ලුද්දො**ති කක්ඛළො, දාරුණො, සාහසිකො. **ලොහිතපාණී**ති පරං ජීවිතා වොරොපෙන්තස්ස පාණී[4] ලොහිතෙන ලිප්පන්ති[5], සචෙපි න ලිප්පන්ති[5], තථාවිධො ලොහිතපාණිත්වෙව වුච්චති. **හතප්පහතෙ නිවිට්ඨො**ති හතෙ ච පරස්ස පහාරදානෙ, පහතෙ ච පරමාරණෙ නිවිට්ඨො. **අදයාපන්නො**ති නික්කරුණතං ආපන්නො.

**යං තං පරස්සා**ති යං තං පරස්ස සන්තකං. **පරවිත්තූපකරණ**න්ති තස්සෙව පරස්ස විත්තූපකරණං; තුට්ඨිජනනං පරික්ඛාරභණ්ඩකං. **ගාමගතං වා**ති අන්තොගාමෙ වා ඨපිතං. **අරඤ්ඤගතං වා**ති අරඤ්ඤෙ[6] රුක්ඛග්ග-පබ්බතමත්ථකාදිසු[7] ඨපිතං. **අදින්න**න්ති තෙහි පරෙහි කායෙන වා වාචාය වා අදින්නං. **ථෙය්‍යසංඛාත**න්ති එත්ථ ථෙනොති චොරො, ථෙනස්ස භාවො ථෙය්‍යං. අවහරණචිත්තස්සෙතං අධිවචනං. **සංඛාත**න්ති අත්ථතො එකකොට්ඨාසස්සෙතං අධිවචනං, "සඤ්ඤා

1. අගාරිකපුච්ඡා-B. S, 2. අනාගාරිකපුච්ඡා-B. S, 3. කාරණන්ති-E.
4. පාණි-S. 5. ලිම්පති-S. 6. අරඤ්ඤෙ වා-S. 7. මත්ථකාදිසු වා-B. S.

නිදානා හි පපඤ්චසඞ්ඛා"ති ආදීසු විය; ථෙය්‍යඤ්ච තං සඞ්ඛාතඤ්චාති ථෙය්‍යසඞ්ඛාතං. ථෙය්‍යචිත්තසඞ්ඛාතො එකො චිත්තකොට්ඨාසොති අත්‍ථො. කරණත්‍ථෙ චෙතං පච්චත්තවචනං; තස්මා ථෙය්‍යසඞ්ඛාතෙනාති අත්‍ථතො දට්ඨබ්බං.

**මාතුරක්ඛිතා**ති යං පිතරි නට්ඨෙ වා මතෙ වා ඝාසච්ඡාදනාදීහි පටිජග්ගමානා, වයප්පත්තං කුලඝරෙ දස්සාමීති මාතා රක්ඛති, අයං මාතුරක්ඛිතා නාම. එතෙනුපායෙන පිතුරක්ඛිතාදයොපි වෙදිතබ්බා. සභාගකුලානි පන කුච්ඡිගතෙසුපි ගබ්භෙසු කතිකං කරෙන්ති: සචෙ අම්හාකං පුත්තො හොති, තුම්හාකං ධීතා අඤ්ඤත්‍ථ ගන්තුං න ලභිස්සති, අම්හාකං පුත්තස්සෙව හොතූති. එවං ගබ්භෙපි පරිග්ගහිතා සස්සාමිකා නාම. යො ඉත්‍ථන්නාමං ඉත්‍ථිං ගච්ඡති, තස්ස එත්තකො දණ්ඩොති එවං ගාමං වා ගෙහං වා වීථිං වා උද්දිස්ස ඨපිතදණ්ඩා පන සපරිදණ්ඩා නාම. **අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපී**ති යා සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන, එසා මෙ භරියා භවිස්සතීති සඤ්ඤාය තස්සා උපරි කෙනචි මාලාගුණං ඛිපන්තෙන මාලාගුණමත්තෙනාපි පරික්ඛිත්තා හොති. **තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොතී**ති එවරූපාසු ඉත්‍ථීසු සම්මාදිට්ඨිසුත්තෙ වුත්ත-මිච්ඡාචාරලක්ඛණවසෙන වීතික්කමං කත්තා හොති.

**සභග්ගතො**ති[1] සභායං ඨිතො. **පරිසග්ගතො**ති ගාමපරිසාය ඨිතො. **ඤාතිමජ්ඣගතො**ති දායාදානං මජ්ඣෙ ඨිතො. **පූගමජ්ඣගතො**ති සෙනීනං මජ්ඣෙ ඨිතො. **රාජකුලමජ්ඣගතො**ති රාජකුලස්ස මජ්ඣෙ මහාවිනිච්ඡයෙ ඨිතො. **අභිනීතො**ති පුච්ඡනත්‍ථාය නීතො. **සක්ඛිපුට්ඨො**ති සක්ඛිං කත්වා පුච්ඡිතො. **එහම්භො පුරිසා**ති ආලපනමෙතං. **අත්තහෙතු වා පරහෙතු වා**ති අත්තනො වා පරස්ස වා හත්‍ථපාදාදිහෙතු වා ධනහෙතු වා. **ආමිසකිඤ්චික්ඛහෙතු වා**ති එත්‍ථ **ආමිස**න්ති ලඤ්චො අධිප්පෙතො. **කිඤ්චික්ඛ**න්ති යං වා තං වා අප්පමත්තකං. අන්තමසො තිත්තිර-වට්ටක-සප්පිපිණ්ඩ-නවනීතපිණ්ඩාදිමත්තකස්සපි ලඤ්චස්ස හෙතූති අත්‍ථො. **සම්පජානමුසා භාසිතා හොතී**ති ජානන්තොයෙව මුසාවාදං කත්තා හොති.

**ඉමෙසං භෙදායා**ති යෙසං **ඉතො**ති වුත්තානං සන්තිකෙ සුතං හොති, තෙසං භෙදාය. **අමූසං භෙදායා**ති යෙසං **අමුත්‍රා**ති වුත්තානං සන්තිකෙ සුතං හොති, තෙසං භෙදාය. **ඉති සමග්ගානං වා භෙත්තා**ති එවං සමග්ගානං වා ද්වින්නං සහායකානං භෙදකරො.[2] **භින්නානං වා අනුප්පදාතා**ති, සුට්ඨු කතං තයා තං පජහන්තෙන, කතිපාහෙනෙව තෙ මහන්තං අනත්‍ථං කරෙය්‍යාති එවං භින්නානං පුන අසන්ධානාය අනුප්පදාතා. උපත්‍ථම්භෙතා, කාරණං දස්සෙතාති අත්‍ථො. වග්ගො ආරාමො, අභිරතිට්ඨානමස්සාති **වග්ගාරාමො**. වග්ගෙසු

1. සභාගගතොති-B. S; සභාගතොති-E    2. භෙදං කත්තා-B.

රතොති **වග්ගරතො**. වග්ගෙ දිස්වා සුත්වා වා නන්දතීති **වග්ගනන්දී**. **වග්ගකරණිං වාචන්ති** යා වාචා සමග්ගෙපි සත්තෙ වග්ගෙ කරොති, භින්දති, තං කලහකාරකවාචං භාසිතා හොති.

**අණ්ඩකා**[1]ති යථා සදොසෙ රුක්ඛෙ අණ්ඩකානි[2] උට්ඨහන්ති, එවං සදොසතාය ඛුංසනවම්භනාදිවචනෙහි අණ්ඩකා[1] ජාතා. **කක්කසා**ති පූතිකා. සා යථා නාම පූතිරුක්ඛො කක්කසො හොති, පග්ඝරිතචුණ්ණො, එවං කක්කසා හොති, සොතං ඝංසමානා විය පවිසති. තෙන වුත්තං: කක්කසාති. **පරකටුකා**ති පරෙසං කටුකා, මනොපදොසජනනී.[3] **පරාභිසජ්ජනී**ති කුටිලකණ්ටකසාඛා විය මම්මෙසු විජ්ඣිත්වා පරෙසං අභිසජ්ජනී, ගන්තුකාමානම්පි ගන්තුං අදත්වා ලග්ගනකරී[4]. **කොධසාමන්තා**ති කොධස්ස ආසන්නා. **අසමාධිසංවත්තනිකා**ති අප්පනාසමාධිස්ස වා උපචාරසමාධිස්ස වා අසංවත්තනිකා. **ඉති සබ්බා** තෙවෙතාති සදොසවාචාය වෙවචනානි.

**අකාලවාදී**ති අකාලෙන වත්තා. **අභූතවාදී**ති යං නත්ථි, තස්ස වත්තා. **අනත්ථවාදී**ති අකාරණනිස්සිතං වත්තා. **අධම්මවාදී**ති අසභාවං වත්තා. **අවිනයවාදී**ති න සංවරවිනයපටිසංයුත්තස්ස වත්තා. **අනිධානවතිං වාචන්ති** හදයමඤ්ජූසාය නිධෙතුං අයුත්තං වාචං භාසිතා හොති. **අකාලෙනා**ති වත්තබ්බකාලස්ස පුබ්බෙ වා පච්ඡා වා අයුත්තකාලෙ වත්තා හොති. **අනපදෙස**න්ති සුත්තාපදෙසවිරහිතං. **අපරියන්තවති**න්ති අපරිච්ඡෙදං. සුත්තං වා ජාතකං වා නික්ඛිපිත්වා තස්ස[5] තස්ස උපලබ්භං වා උපමං වා වත්ථුං වා ආහරිත්වා බාහිරකථංයෙව කථෙති. නික්ඛිත්තං නික්ඛිත්තමත්තමෙව හොති. සුත්තං නු ඛො කථෙති, ජාතකං නු ඛො, නාස්ස අන්තං වා කොටිං වා පස්සාමාති වත්තබ්බතං ආපජ්ජති. යථා වටරුක්ඛසාඛානං ගතගතට්ඨානෙ[6] පාරොහා ඔතරන්ති, ඔතිණ්ණොතිණ්ණට්ඨානෙ සම්පජ්ජිත්වා පුන වඩ්ඪන්තියෙව, එවං අඩ්ඪයොජනම්පි යොජනම්පි ගච්ඡන්ති[7]යෙව, ගච්ඡන්තෙ ගච්ඡන්තෙ පන මූලරුක්ඛො විනස්සති, පවෙණිජාතකාව තිට්ඨන්ති, එවමයම්පි නිග්‍රොධධම්මකථිකො නාම හොති; නික්ඛිත්තං නික්ඛිත්තමෙව කත්වා පස්සෙනෙව පරිහරන්තො ගච්ඡති. යො පන බහුම්පි භණන්තො, එතදත්ථමිදං වුත්තන්ති ආහරිත්වා ආහරිත්වා ජානාපෙතුං සක්කොති, තස්ස කථෙතුං වට්ටති. **අනත්ථසංහිත**න්ති න අත්ථනිස්සිතං.

5. හෙට්ඨා කථිතනිද්දෙස සච්චානි පටිවත්තෙන්තො-L.
6. අසංපස්සන්තෙන-S; අසම්බන්ධෙන-B. 7. විසජ්ජෙතුං-S.
8. ඉදානි-A. P2; ඉදානි තං-S, E. 9. ඔවට්ටිකසාරං පන-S. 10. පඤ්හං-T.

තස්ස විස්සජ්ජනෙ, **අස්සුතවාති** ආදි මූලපරියායෙ විත්ථාරිතමෙව. **රූපං අත්තතො සමනුපස්සතීති** "ඉධෙකච්චො රූපං අත්තතො සමනුපස්සති, යං රූපං සො අහං, යො අහං තං රූපන්ති රූපඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි නාම තෙලපදීපස්ස ඣායතො යා අච්චි සො වණ්ණො, යො වණ්ණො සා අච්චීති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං අත්තතො-පෙ-අද්වයං සමනුපස්සතී"ති එවං රූපං අත්තාති දිට්ඨිපස්සනාය පස්සති. **රූපවන්තං වා අත්තානන්ති** අරූපං අත්තාති ගහෙත්වා ඡායාවන්තං රුක්ඛං විය රූපවන්තං අත්තානං සමනුපස්සති. **අත්තනි වා රූපන්ති** අරූපමෙව අත්තාති ගහෙත්වා පුප්ඵස්මිං ගන්ධං විය[1] අත්තනි රූපං සමනුපස්සති. **රූපස්මිං වා අත්තානන්ති** අරූපමෙව අත්තාති ගහෙත්වා කරණ්ඩාය මණිං විය[2] අත්තානං රූපස්මිං සමනුපස්සති. **වෙදනං අත්තතොති** ආදීසුපි එසෙව නයො.

තත්ථ, රූපං අත්තතො සමනුපස්සතීති සුද්ධරූපමෙව අත්තාති කථිතං. රූපවන්තං වං අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං අත්තතො, සඤ්ඤං, සඞ්ඛාරෙ, විඤ්ඤාණං අත්තතො සමනුපස්සතීති ඉමෙසු සත්තසු ඨානෙසු අරූපං අත්තාති කථිතං. වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානන්ති එවං චතූසු ඛන්ධෙසු තිණ්ණං තිණ්ණං වසෙන ද්වාදසසු ඨානෙසු රූපාරූපමිස්සකො අත්තා කථිතො.

තත්ථ, රූපං අත්තතො සමනුපස්සති, වෙදනං, සඤ්ඤං, සඞ්ඛාරෙ, විඤ්ඤාණං අත්තතො සමනුපස්සතීති පඤ්චසු ඨානෙසු උච්ඡෙදදිට්ඨි කථිතා; අවසෙසෙසු සස්සතදිට්ඨීති එවමෙත්ථ පන්නරස භවදිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො හොන්ති.

**න රූපං අත්තතොති**[3] එත්ථ, රූපං අත්තාති න සමනුපස්සති; අනිච්චං දුක්ඛං අනත්තාති සමනුපස්සති. **න රූපවන්තං අත්තානං -පෙ- න විඤ්ඤාණස්මිං අත්තානන්ති** ඉමෙ පඤ්චක්ඛන්ධෙ කෙනචි පරියායෙන අත්තතො න සමනුපස්සතීති සබ්බාකාරෙන පන අනිච්චා දුක්ඛා අනත්තාති සමනුපස්සති.

එත්තාවතා ථෙරියා, එවං ඛො ආවුසො විසාඛ සක්කායදිට්ඨි හොතීති එවං පුරිමපඤ්හං විස්සජ්ජෙන්තියා, එත්තකෙන ගමනං හොති, ආගමනං හොති, ගමනාගමනං හොති, වට්ටං වත්තතීති[4] වට්ටං මත්ථකං පාපෙත්වා දස්සිතං. එවං ඛො ආවුසො විසාඛ සක්කායදිට්ඨි න හොතීති පච්ඡිමපඤ්හං විස්සජ්ජෙන්තියා, එත්තකෙන ගමනං න හොති, ආගමනං න හොති, ගමනාගමනං න හොති, වට්ටං න වත්තතීති[5] විවට්ටං මත්ථකං පාපෙත්වා දස්සිතං.

---

1. විය තස්මිං-B. 2. විය තං-B, S. 3. අත්තාති-L, E.
4. වට්ටන්තීති-L. 5. තවවට්ටං නාම න වට්ටතීති-L. B.

**කතමො පනාය්‍යෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති** අයං පඤ්හො ථෙරියා පටිපුච්ඡිත්වා විස්සජ්ජෙතබ්බො භවෙය්‍ය: උපාසක තයා හෙට්ඨා මග්ගො පුච්ඡිතො, ඉධ කස්මා මග්ගමෙව පුච්ඡසීති. සො පන අත්තනො බ්‍යත්තතාය පණ්ඩිච්චෙන තස්ස අධිප්පායං සල්ලක්ඛෙසි: ඉමිනා උපාසකෙන හෙට්ඨා පටිපත්තිවසෙන මග්ගො පුච්ඡිතො භවිස්සති, ඉධ පන තං සංඛතාසංඛත-ලොකියලොකුත්තර-සඞ්ගහිතාසඞ්ගහිතවසෙන පුච්ඡිතුකාමො භවිස්සතීති තස්මා අපටිපුච්ඡිත්වාව යං යං පුච්ඡි, තං තං විස්සජ්ජෙසි. තත්ථ **සඞ්ඛතොති** චෙතිතො, කප්පිතො, පකප්පිතො, ආයූහිතො, නිබ්බත්තිතො, සමාපජ්ජන්තෙන සමාපජ්ජිතබ්බොති.

**තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහිතොති** එත්ථ යස්මා මග්ගො සප්පදෙසො තයො ඛන්ධා නිප්පදෙසා, තස්මා අයං සප්පදෙසත්තා නගරං විය රජ්ජෙන, නිප්පදෙසෙහි තීහි ඛන්ධෙහි සඞ්ගහිතො. තත්ථ සම්මාවාචාදයො තයො සීලමෙව. තස්මා තෙ සජාතිතො සීලක්ඛන්ධෙන[1] සඞ්ගහිතා. කිඤ්චාපි හි පාළියං **සීලක්ඛන්ධෙති** භුම්මෙන විය නිද්දෙසො කතො, අත්ථො පන කරණවසෙන වෙදිතබ්බො.

සම්මාවායාමාදීසු පන තීසු සමාධි අත්තනො ධම්මතාය ආරම්මණෙ එකග්ගභාවෙන අප්පෙතුං න සක්කොති, විරියෙ පන පග්ගහකිච්චං සාධෙන්තෙ, සතියා ච අපිලාපනකිච්චං සාධෙන්තියා ලද්ධුපකාරො හුත්වා සක්කොති.

තත්‍රායං උපමා: යථා හි, නක්ඛත්තං කීළිස්සාමාති උය්‍යානං පවිට්ඨෙසු තීසු සහායෙසු එකො සුපුප්ඵිතං චම්පකරුක්ඛං දිස්වා හත්ථං උක්ඛිපිත්වාපි ගහෙතුං න සක්කුණෙය්‍ය. අථස්ස දුතියො ඔනමිත්වා පිට්ඨිං දදෙය්‍ය. සො තස්ස පිට්ඨියං ඨත්වාපි කම්පමානො ගහෙතුං න සක්කුණෙය්‍ය. අථස්ස ඉතරො අංසකූටං උපනාමෙය්‍ය. සො එකස්ස පිට්ඨියං ඨත්වා එකස්ස අංසකූටං ඔලුබ්භ යථාරුචිං පුප්ඵානි ඔචිනිත්වා පිළන්ධිත්වා නක්ඛත්තං කීළෙය්‍ය. එවං සම්පදමිදං දට්ඨබ්බං.

එකතො උය්‍යානං පවිට්ඨා තයො සහායකා විය හි එකතො ජාතා සම්මාවායාමාදයො තයො ධම්මා. සුපුප්ඵිතචම්පකො විය ආරම්මණං. හත්ථං උක්ඛිපිත්වාපි ගහෙතුං අසක්කොන්තො විය අත්තනො ධම්මතාය ආරම්මණෙ එකග්ගභාවෙන අප්පෙතුං අසක්කොන්තො සමාධි. පිට්ඨිං දත්වා ඔනතසහායො විය වායාමො, අංසකූටං දත්වා ඨිතසහායො විය සති. යථා තෙසු එකස්ස පිට්ඨියං ඨත්වා එකස්ස අංසකූටං ඔලුබ්භ ඉතරො යථාරුචිං පුප්ඵං ගහෙතුං සක්කොති, එවමෙව විරියෙ පග්ගහකිච්චං,[2] සතියා ච අපිලාපනකිච්චං සාධෙන්තියා ලද්ධුපකාරො සමාධි සක්කොති අරම්මණෙ එකග්ගභාවෙන අප්පෙතුං. තස්මා සමාධියෙවෙත්ථ සජාතිතො සමාධික්ඛන්ධෙන සඞ්ගහිතො; වායාමසතියො පන කිරියතො සඞ්ගහිතා හොන්ති.

1. සීලක්ඛන්ධෙ-L. 2. විරියෙන පග්ගහකිච්චං සාධෙන්තෙන-B.

සම්මාදිට්ඨිසංකප්පෙසුපි පඤ්ඤා අත්තනො ධම්මතාය අනිච්චං දුක්ඛමනත්තාති ආරම්මණං නිච්ඡෙතුං න සක්කොති; විතක්කො පන ආකොටෙත්වා ආකොටෙත්වා දෙන්තො සක්කොති. කථං? යථාහි හෙරඤ්ඤිකො කහාපණං හත්ථෙ ඨපෙත්වා සබ්බභාගෙ[1] ඔලොකෙතුකාමො සමානොපි න චක්ඛුබලෙනෙව[2] පරිවත්තෙතුං සක්කොති; අඞ්ගුලිපබ්බෙහි පන පරිවත්තෙත්වා ඉතො චිතො ච ඔලොකෙතුං සක්කොති. එවමෙව න පඤ්ඤා අත්තනො ධම්මතාය අනිච්චාදිවසෙන ආරම්මණං නිච්ඡෙතුං සක්කොති; අභිනිරොපනලක්ඛණෙන පන[3] ආහනන-පරියාහනනරසෙන විතක්කෙන ආකොටෙන්තෙන විය පරිවත්තෙන්තෙන විය ච ආදායාදාය දින්නමෙව නිච්ඡෙතුං සක්කොති. තස්මා ඉධාපි සම්මාදිට්ඨියෙව සජාතිතො පඤ්ඤාක්ඛන්ධෙන සඞ්ගහිතා; සම්මාසංකප්පො පන කිරියතො සඞ්ගහිතො හොති.

ඉති ඉමෙහි තීහි ඛන්ධෙහි මග්ගො සඞ්ගහං ගච්ඡති. තෙන වුත්තං: **තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහිතොති.**

ඉදානි එකචිත්තක්ඛණිකං මග්ගසමාධිං අභිමිත්තං[4] සපරික්ඛාරං පුච්ඡන්තො, **කතමො පනාය්‍යෙ**ති ආදිමාහ. තස්ස විස්සජ්ජනෙ, **චත්තාරො සතිපට්ඨානා** මග්ගක්ඛණෙ චතුකිච්චසාධනවසෙන උප්පන්නා සති සමාධිස්ස පච්චයට්ඨෙන **නිමිත්තා**[5]. **චත්තාරො සම්මප්පධානා** චතුකිච්චසාධනවසෙනෙව උප්පන්නං විරියං. තං පරිවාරට්ඨෙන **පරික්ඛාරො** හොති. **තෙසංයෙව ධම්මාන**න්ති තෙසං මග්ගසම්පයුත්තධම්මානං. **ආසෙවනා**ති ආදිසු එකචිත්තක්ඛණිකාව ආසෙවනාදයො වුත්තා.

විතණ්ඩවාදී පන, එකචිත්තක්ඛණිකො නාම මග්ගො නත්ථි, "එවං භාවෙය්‍ය, සත්තවස්සානී"ති හි වචනතො සත්තපි[6] වස්සානි මග්ගභාවනා හොති; කිලෙසා පන ලහුං ඡිජ්ජන්තා සත්තහි ඤාණෙහි ඡිජ්ජන්තීති වදති. සො, සුත්තං ආහරාති වත්තබ්බො. අද්ධා අඤ්ඤං අපස්සන්තො, යා තෙසංයෙව ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මන්ති ඉදමෙව ආහරිත්වා, අඤ්ඤෙන චිත්තෙන ආසෙවති, අඤ්ඤෙන භාවෙති, අඤ්ඤෙන බහුලීකරොතීති වක්ඛති. තතො වත්තබ්බො: කිං පනිදං සුත්තං නෙය්‍යත්ථං, නීතත්ථන්ති? තතො වක්ඛති: නීතත්ථං; යථා සුත්තං තථෙව අත්ථොති.

තස්ස ඉදං උත්තරං: එවං සන්තෙ එකචිත්තං ආසෙවමානං උප්පන්නං, අපරම්පි ආසෙවමානං, අපරම්පි ආසෙවමානන්ති එවං දිවසම්පි ආසෙවනාව භවිස්සති, කුතො භාවනා, කුතො බහුලීකම්මං? එකං වා භාවයමානං උප්පන්නං, අපරම්පි භාවයමානං, අපරම්පි

1. සබ්බභාගෙසු-T1, B. S. 2. චක්ඛුතලෙනෙව-T1, B. S.
3. ලක්ඛණෙන-L. 4. සනිමිත්තං-B, S.
5. සම්මාසති සා සම්මාසමාධිස්ස පච්චයට්ඨෙන නිමිත්තං-B, S. 6. සත්ත-A, P2, S

භාවයමානානන්ති එවං දිවසං භාවනාව භවිස්සති, කුතො ආසෙවනා, කුතො බහුලීකම්මං? එකං වා බහුලීකරොන්තානං උප්පන්නානං, අපරම්පි බහුලීකරොන්තානං, අපරම්පි බහුලීකරොන්තානන්ති එවං දිවසම්පි බහුලීකම්මමෙව භවිස්සති, කුතො ආසෙවනා, කුතො භාවනාති?

අථ වා එවං වදෙය්‍ය: එකෙන චිත්තෙන ආසෙවති, ද්වීහි භාවෙති, තීහි බහුලීකරොති; ද්වීහි වා ආසෙවති, තීහි භාවෙති, එකෙන බහුලීකරොති; තීහි වා ආසෙවති, එකෙන භාවෙති, ද්වීහි බහුලීකරොතීති. සො වත්තබ්බො: මා සුත්තං මෙ ලද්ධන්ති යං වා තං වා අවච. පඤ්හං විස්සජ්ජෙන්තෙන නාම ආචරියසන්තිකෙ වසිත්වා බුද්ධවචනං උග්ගණ්හිත්වා අත්ථරසං විදිත්වා වත්තබ්බං හොති. එකචිත්තක්ඛණිකාව[1] අය ආසෙවනා, එකචිත්තක්ඛණිකා[1] භාවනා, එකචිත්තක්ඛණිකං බහුලීකම්මං. ඛයගාමී ලොකුත්තරමග්ගො බහුචිත්තක්ඛණිකො නාම නත්ථි, එකචිත්තක්ඛණිකො යෙවාති සඤ්ඤාපෙතබ්බො. සචෙ සඤ්ජානාති, සඤ්ජානාතු. නො චෙ සඤ්ජානාති, ගච්ඡ, පාතොව විහාරං පවිසිත්වා යාගුං පිවාහීති උය්‍යොජෙතබ්බො.

**කති පනය්‍යෙ සඞ්ඛාරාති** ඉධ කිං පුච්ඡති? යෙ සඞ්ඛාරෙ නිරොධෙත්වා නිරොධං සමාපජ්ජන්ති, තෙ පුච්ඡිස්සාමීති පුච්ඡති. තෙනෙවස්ස අධිප්පායං ඤත්වා ථෙරී, පුඤ්ඤාභිසඞ්ඛාරාදිසු අනෙකෙසු සඞ්ඛාරෙසු විජ්ජමානෙසුපි, කායසඞ්ඛාරාදයොව ආචික්ඛන්තී, **තයො මෙ ආවුසොති** ආදිමාහ. තත්ථ කායපටිබද්ධත්තා කායෙන සඞ්ඛරීයති[2] නිබ්බත්තීයතීති **කායසඞ්ඛාරො**. වචීපටිබද්ධත්තා වාචාය සඞ්ඛරීයති නිබ්බත්තීයතීති **වචීසඞ්ඛාරො**. චිත්තපටිබද්ධත්තා චිත්තෙන සඞ්ඛරීයති[2] නිබ්බත්තීයතීති **චිත්තසඞ්ඛාරො**.

**කතමො පනය්‍යෙති** ඉධ කිං පුච්ඡති? ඉමෙ සඞ්ඛාරා අඤ්ඤමඤ්ඤමිස්සා ආලුළිතා[3] අවිභූතා දුද්දීපනා. තථා හි, කායද්වාරෙ ආදාන-ගහණ-මුඤ්චන-චොපනානි පාපෙත්වා උප්පන්නා අට්ඨ කාමාවචරකුසලචෙතනා ද්වාදස අකුසලචෙතනාති එවං කුසලාකුසලා වීසතිචෙතනාපි අස්සාසපස්සාසාපි කායසඞ්ඛාරොත්වෙව වුච්චන්ති. වචීද්වාරෙ හනුසඤ්චොපනං වචීභෙදං පාපෙත්වා උප්පන්නා වුත්තප්පකාරාව වීසති චෙතනාපි විතක්කවිචාරාපි වචීසඞ්ඛාරොත්වෙව වුච්චන්ති. කායවචීද්වාරෙසු[4] චොපනං අප්පත්වා රහො නිසින්නස්ස චින්තයතො උප්පන්නා කුසලාකුසලා එකූනතිංසචෙතනාපි සඤ්ඤා වෙදනා චාති ඉමෙ ද්වෙ ධම්මාපි චිත්තසඞ්ඛාරොත්වෙව වුච්චන්ති. එවං ඉමෙ සඞ්ඛාරා අඤ්ඤමඤ්ඤමිස්සා ආලුළිතා අවිභූතා දුද්දීපනා. තෙ පාකටෙ විභූතෙ කත්වා කථාපෙස්සාමීති පුච්ඡති.

**කස්මා පනය්‍යෙති** ඉධ කායසඞ්ඛාරාදිනාමස්ස පදත්ථං පුච්ඡති. තස්ස විස්සජ්ජනෙ **කායපටිබද්ධාති** කායනිස්සිතා; කායෙ සති හොන්ති, අසති න හොන්ති. **චිත්තපටිබද්ධාති** චිත්තනිස්සිතා; චිත්තෙ සති හොන්ති, අසති න හොන්ති.

---

1. එකචිත්තක්ඛණිකා ච-B, S.  2. සංඛරීයති කරීයති-B.
3. ආලුලිතා-S, E.  4. එවං ඉමෙ සංඛාරා අඤ්ඤමඤ්ඤං කායවචීද්වාරෙසු-L.

ඉදානි, කින්නු ඛො එසා සඤ්ඤාවෙදයිතනිරොධං වලඤ්ජෙති, න වලඤ්ජෙති, **චිණ්ණවසී** වා තත්ථ නො චිණ්ණවසීති ජානනත්ථං පුච්ඡන්තො, **කථං පනය්‍යා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති හොතීති** ආදිමාහ.[1] තස්ස විස්සජ්ජනෙ **සමාපජ්ජිස්සන්ති වා සමාපජ්ජාමීති වා** පදද්වයෙන නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිකාලො කථිතො; **සමාපජ්ජන්තීති** පදෙන අන්තොනිරොධො. තථා පුරිමෙහි ද්වීහි පදෙහි සචිත්තකකාලො කථිතො; පච්ඡිමෙන අචිත්තකකාලො. **පුබ්බෙව තථා චිත්තං භාවිතං හොතීති** නිරොධසමාපත්තිතො පුබ්බෙ අද්ධානපරිච්ඡෙදකාලෙයෙව, **එත්තකං** කාලං අචිත්තකො භවිස්සාමීති අද්ධානපරිච්ඡෙදචිත්තං භාවිතං හොති **යං තං තථත්තාය උපනෙතීති** යං එවං භාවිතං චිත්තං තං පුග්ගලං තථත්තාය අචිත්තකභාවාය උපනෙති.

**පඨමං නිරුජ්ඣති වචීසඞ්ඛාරොති** සෙසසඞ්ඛාරෙහි පඨමං දුතියජ්ඣානෙයෙව නිරුජ්ඣති. **තතො කායසඞ්ඛාරොති** තතො පරං කායසඞ්ඛාරො චතුත්ථජ්ඣානෙ නිරුජ්ඣති. **තතො චිත්තසඞ්ඛාරොති** තතො පරං චිත්තසඞ්ඛාරො අන්තොනිරොධෙ නිරුජ්ඣති. **වුට්ඨහිස්සන්ති වා වුට්ඨහාමීති වා** පදද්වයෙන අන්තොනිරොධකාලො කථිතො; **වුට්ඨිතොති** පදෙන ඵලසමාපත්තිකාලො. තථා පුරිමෙහි ද්වීහි පදෙහි අචිත්තකකාලො කථිතො; පච්ඡිමෙන සචිත්තකකාලො. **පුබ්බෙව තථා චිත්තං භාවිතං හොතීති** නිරොධසමාපත්තිතො පුබ්බෙ අද්ධානපරිච්ඡෙදකාලෙයෙව **එත්තකං** කාලං **අචිත්තකො** හුත්වා තතො පරං සචිත්තකො **භවිස්සාමීති** අද්ධානපරිච්ඡෙදචිත්තං භාවිතං හොති. **යං තං තථත්තාය උපනෙතීති** යං එවං භාවිතං චිත්තං තං පුග්ගලං තථත්තාය සචිත්තකභාවාය උපනෙති. **ඉති හෙට්ඨා** නිරොධසමාපජ්ජනකාලො ගහිතො, ඉධ නිරොධතො උට්ඨානකාලො.

ඉදානි නිරොධකථං කථෙතුං වාරොති නිරොධකථා කථෙතබ්බා සියා, සා පනෙසා, "**ද්වීහි බලෙහි** සමන්නාගතත්තා තයො ච[2] **සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතාපඤ්ඤා නිරොධසමාපත්තියං ඤාණ**"න්ති මාතිකං ඨපෙත්වා සබ්බාකාරෙන විසුද්ධිමග්ගෙ කථිතා. තස්මා තත්ථ කථිතනයෙනෙව ගහෙතබ්බා.

කො පනායං නිරොධො නාම? චතුන්නං ඛන්ධානං පටිසඞ්ඛා අප්පවත්ති. අථ කිමත්ථමෙතං[3] සමාපජ්ජන්තීති චෙ? සඞ්ඛාරානං පවත්තෙ උක්කණ්ඨිතා සත්තාහං අචිත්තකා හුත්වා සුඛං විහරිස්සාම, දිට්ඨධම්මනිබ්බානං නාමෙතං යදිදං නිරොධොති එතදත්ථං සමාපජ්ජන්ති.

**පඨමං උප්පජ්ජති චිත්තසඞ්ඛාරොති** නිරොධා වුට්ඨහන්තස්ස හි ඵලසමාපත්තිචිත්තං පඨමං උප්පජ්ජති. තංසම්පයුත්තං සඤ්ඤඤ්ච

1. හොතීති ආහ-L, 2. තිණ්ණසඞ්ඛ-L,S. 3, මෙතං-L,

වෙදනාසඤ්ඤා සඤ්ඤාය පඨමං උප්පජ්ජති චිත්තසඞ්ඛාරොති ආහ. **තතො කායසඞ්ඛාරොති** තතො පරං භවඞ්ගසමයෙ කායසඞ්ඛාරො උප්පජ්ජති. කිං පන **ඵලසමාපත්ති** අස්සාසපස්සාසෙ න සමුට්ඨාපෙතීති? සමුට්ඨාපෙති.[1] **ඉමස්ස** පන චතුත්ථජ්ඣානිකා ඵලසමාපත්ති; සා න සමුට්ඨාපෙති. කිං **වා**[2] ඵලසමාපත්ති පඨමජ්ඣානිකා වා හොතු, දුතිය-තතිය-චතුත්ථජ්ඣානිකා වා, සන්තාය සමාපත්තියා වුට්ඨිතස්ස භික්ඛුනො අස්සාසපස්සාසා අබ්බොහාරිකා හොන්ති. තෙසං අබ්බොහාරිකභාවො සඤ්ජීවත්ථෙරවත්ථුනා වෙදිතබ්බො.

සඤ්ජීවත්ථෙරස්ස හි සමාපත්තිතො වුට්ඨාය කිංසුකපුප්ඵසදිසෙ වීතච්චිකඞ්ගාරෙ[3] මද්දමානස්ස ගච්ඡතො චීවරෙ අංසුමත්තම්පි න ඣායි; උසුමාකාරමත්තම්පි නාහොසි. සමාපත්තිබලං[4] නාමෙතන්ති වදන්ති. **එවමෙව** සන්තාය සමාපත්තියා වුට්ඨිතස්ස භික්ඛුනො අස්සාසපස්සාසා අබ්බොහාරිකා හොන්ති[5]. භවඞ්ගසමයෙනෙවෙතං කථිතන්ති වෙදිතබ්බං.

**තතො වචීසඞ්ඛාරොති**[6] තතො පරං කිරියමයපවත්ත-වලඤ්ජනකාලෙ වචීසඞ්ඛාරො උප්පජ්ජති[7]. කිං භවඞ්ගං විතක්කවිචාරෙ න සමුට්ඨාපෙතීති? සමුට්ඨාපෙති. තංසමුට්ඨානා පන විතක්කවිචාරා වාචං අභිසඞ්ඛාතුං න සක්කොන්තීති කිරියමයපවත්ත-වලඤ්ජනකාලෙනෙවෙතං[8] කථිතං.

**සුඤ්ඤතො ඵස්සොති** ආදයො සගුණෙනාපි ආරම්මණෙනාපි කථෙතබ්බා. **සගුණෙන** තාව සුඤ්ඤතා නාම ඵලසමාපත්ති, තාය සහජාතං ඵස්සං සන්ධාය සුඤ්ඤතො ඵස්සොති වුත්තං. අනිමිත්තප්පණිහිතෙසුපි එසෙව නයො. **ආරම්මණෙන** පන නිබ්බානං රාගාදීහි සුඤ්ඤත්තා **සුඤ්ඤතං** නාම, රාගනිමිත්තාදීනං අභාවා **අනිමිත්තං**, රාගදොසමොහපණිධීනං අභාවා **අප්පණිහිතං**. සුඤ්ඤතං නිබ්බානං ආරම්මණං කත්වා උප්පන්නඵලසමාපත්තියං ඵස්සො සුඤ්ඤතො නාම. අනිමිත්තප්පණිහිතෙසුපි එසෙව නයො.

අපරා ආගමනීයකථා නාම හොති: සුඤ්ඤතා, අනිමිත්තා, අප්පණිහිතාති හි විපස්සනාපි වුච්චති. තත්ථ යො භික්ඛු සඞ්ඛාරෙ අනිච්චතො පරිග්ගහෙත්වා අනිච්චතො දිස්වා අනිච්චතො වුට්ඨාති, තස්ස වුට්ඨානගාමිනී විපස්සනා අනිමිත්තා නාම හොති. යො දුක්ඛතො පරිග්ගහෙත්වා දුක්ඛතො දිස්වා දුක්ඛතො වුට්ඨාති, තස්ස අප්පණිහිතා නාම. යො අනත්තතො පරිග්ගහෙත්වා අනත්තතො දිස්වා අනත්තතො වුට්ඨාති, තස්ස සුඤ්ඤතා නාම. තත්ථ අනිමිත්තවිපස්සනාය මග්ගො

1. සමුට්ඨාපෙතීති?-L. E.
2. වා එතෙන-B, S.
3. විතච්ඡිකඞ්ගාරෙ-S; විතච්චිකඞ්ගාරෙ-E.
4. සමාපත්තිඵලං-B, S.
5. හොතීති-B, S.
6. වචීසඞ්ඛාරාති-L.
7. වචීසඞ්ඛාරා උප්පජ්ජන්ති-L, S.
8. කාලෙනෙව තං-B, E.

අනිමිත්තො නාම. අනිමිත්තමග්ගස්ස ඵලං අනිමිත්තං නාම. අනිමිත්තඵලසමාපත්තියා[1] සහජාතෙ ඵස්සෙ ඵුසන්තෙ, අනිමිත්තො ඵස්සො ඵුසතීති වුච්චති. අප්පණිහිත-සුඤ්ඤතෙසුපි එසෙව නයො.

ආගමනීයෙ කථිතෙ පන[2] සුඤ්ඤතො වා ඵස්සො, අනිමිත්තො වා ඵස්සො, අප්පණිහිතො වා ඵස්සොති විකප්පො[3] ආපජ්ජෙය්‍ය. තස්මා සගුණෙන චෙව ආරම්මණෙන ච කථෙතබ්බං. එවං හි තයො ඵස්සා ඵුසන්තීති සමෙති.

**විවෙකනින්න**න්ති ආදීසු නිබ්බානං විවෙකො නාම, තස්මිං විවෙකෙ නින්නං ඔනතන්ති විවෙකනින්නං. විවෙකෙ පොණං, අඤ්ඤතො ආගන්ත්වා යෙන විවෙකො තෙන වඞ්කං විය හුත්වා ඨිතන්ති **විවෙකපොණං**. යෙන විවෙකො තෙන පතමානං විය ඨිතන්ති **විවෙකපබ්භාරං**.

ඉදානි යා වෙදනා නිරොධෙත්වා නිරොධසමාපත්තිං සමාපජ්ජති, තා පුච්ඡිස්සාමීති පුච්ඡන්තො, **කති පනය්‍යෙ වෙදනා**ති ආහ. **කායිකං වා**ති ආදීසු පඤ්චද්වාරිකං සුඛං කායිකං නාම; මනොද්වාරිකං චෙතසිකං නාමාති වෙදිතබ්බං. තත්ථ **සුඛ**න්ති සභාවනිද්දෙසො. **සාත**න්ති තස්සෙව මධුරභාවදීපකං වෙවචනං. **වෙදයිත**න්ති වෙදයිතභාවදීපකං සබ්බවෙදනානං සාධාරණවචනං. සෙසපදෙසුපි එසෙව නයො.

**සුඛා වෙදනා ඨිතිසුඛා විපරිණාමදුක්ඛා**ති ආදීසු සුඛාය වෙදනාය අත්ථිභාවො සුඛං, නත්ථිභාවො දුක්ඛං. දුක්ඛාය වෙදනාය අත්ථිභාවො දුක්ඛං, නත්ථිභාවො සුඛං. අදුක්ඛමසුඛාය වෙදනාය ජානනභාවො සුඛං, අජානනභාවො දුක්ඛන්ති අත්ථො.

**කිංඅනුසයො අනුසෙතී**ති කතමො අනුසයො අනුසෙති. අප්පහීනට්ඨෙන සයිතො විය හොතීති අනුසයපුච්ඡං[4] පුච්ඡති. **න ඛො ආවුසො විසාඛ සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයො[5] අනුසෙතී**[6]ති න සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයො අනුසෙති. න සබ්බාය සුඛාය වෙදනාය සො අප්පහීනො, න සබ්බං සුඛං වෙදනං ආරබ්භ උප්පජ්ජතීති අත්ථො. එස නයො සබ්බත්ථ.

**කිං පහාතබ්බ**න්ති අයං පහානපුච්ඡා නාම. **රාගං තෙන පජහතී**ති එත්ථ එකෙන[7] ව්‍යාකරණෙන ද්වෙ පුච්ඡා විස්සජ්ජෙති. ඉධ භික්ඛු රාගානුසයං වික්ඛම්භෙත්වා පඨමජ්ඣානං සමාපජ්ජති; ඣානවික්ඛම්භිතං රාගානුසයං තථාවික්ඛම්භිතමෙව කත්වා[8] විපස්සනං වඩ්ඪෙත්වා අනාගාමිමග්ගෙන සමුග්ඝාතෙති. සො අනාගාමිමග්ගෙන පහීනොපි තථා වික්ඛම්භිතත්තාව[9] පඨමජ්ඣානෙ නානුසෙති නාම. තෙනාහ: **න තත්ථ රාගානුසයො අනුසෙතී**ති.

---

1. සමාපත්ති-B. S. 2. ආගමනීයෙන කථිතෙන-S. 3. විකප්පං-S.
4. අනුසයං-S. 5. කාමරාගානුසයො-S. E. 6. විසාඛ අනුසෙතීති-
7. එතෙනෙව-S; එකෙනෙව-E. 8. වික්ඛම්භිත්වා-A, M2, P2.
9. වික්ඛම්භිතත්තා ච-A, M2, P2; වික්ඛම්භිතත්තා-S, E.

**තදායතනන්ති** තං ආයතනං. පරමස්සාසභාවෙන පතිට්ඨාභූතං අරහත්තන්ති අත්ථො. **ඉති අනුත්තරෙසූ**ති එවං අනුත්තරවිමොක්ඛොති ලද්ධනාමෙ අරහත්තෙ[1] පිහං උපට්ඨපෙන්තස්ස. **උප්පජ්ජති පිහපච්චයා දොමනස්සන්ති** පිහාය උපට්ඨානමූලකං දොමනස්සං උප්පජ්ජති. තං පනෙතං න පිහාය උපට්ඨානමූලකං උප්පජ්ජති; පත්ථෙත්වා අලභන්තස්ස පන අලාභමූලකං උප්පජ්ජමානං, උප්පජ්ජති පිහපච්චයාති වුත්තං.

තත්ථ කිඤ්චාපි දොමනස්සං නාම එකන්තෙන අකුසලං, ඉදං[2] පන සෙවිතබ්බං දොමනස්සං වට්ටතීති වදන්ති. යොගිනො හි තෙමාසිකං, ඡම්මාසිකං, නවමාසිකං වා පටිපදං ගණ්හන්ති. තෙසු යො තං තං පටිපදං ගහෙත්වා අන්තොකාලපරිච්ඡෙදෙයෙව අරහත්තං පාපුණිස්සාමීති ඝටෙන්තො වායමන්තො න සක්කොති යථාපරිච්ඡින්නෙන කාලෙන[3] පාපුණිතුං, තස්ස බලවදොමනස්සං උප්පජ්ජති; ආළින්දකවාසි-මහාඵුස්සත්ථෙරස්ස විය අස්සුධාරා පවත්තන්ති. ථෙරො කිර එකූනවීසති වස්සානි ගතපච්චාගතවත්තං පූරෙසි. තස්ස, ඉමස්මිං වාරෙ අරහත්තං ගණ්හිස්සාමි, ඉමස්මිං වාරෙ විසුද්ධිපවාරණං පවාරෙස්සාමීති මානසං බන්ධිත්වා සමණධම්මං කරොන්තස්සෙව එකූනවීසති වස්සානි අතික්කන්තානි. පවාරණාදිවසෙ ආගතස්ස[4] ථෙරස්ස අස්සුපාතෙන මුත්තදිවසො නාම නාහොසි. වීසතිමෙ පන වස්සෙ අරහත්තං පාපුණි.

**පටිඝං තෙන පජහතීති** එත්ථ[5] දොමනස්සෙනෙව පටිඝං පජහති. න හි[6] පටිඝෙනෙව පටිඝප්පහානං, දොමනස්සෙන වා[7] දොමනස්සප්පහානං නාම අත්ථි. අයං පන භික්ඛු තෙමාසිකාදීසු අඤ්ඤතරං පටිපදං ගහෙත්වා ඉති පටිසඤ්චික්ඛති: පස්ස භික්ඛු, කිං තුය්හං සීලෙන හීනට්ඨානං අත්ථි, උදාහු විරියෙන, උදාහු පඤ්ඤාය? නනු තෙ සීලං සුපරිසුද්ධං, විරියං සුපග්ගහිතං, පඤ්ඤා සූරා හුත්වා වහතීති? සො එවං පටිසඤ්චික්ඛිත්වා, න දානි පුන ඉමස්ස දොමනස්සස්ස උප්පජ්ජිතුං දස්සාමීති විරියං දළ්හං[8] කත්වා අන්තොතෙමාසෙ[9] වා අන්තොඡම්මාසෙ[9] වා අන්තොනවමාසෙ[9] වා අනාගාමිමග්ගෙන තං සමුග්ඝාතෙති. ඉමිනා පරියායෙන පටිඝෙනෙව පටිඝං, දොමනස්සෙනෙව දොමනස්සං පජහති නාම. **න තත්ථ පටිඝානුසයො අනුසෙතීති** තත්ථ එවරූපෙ දොමනස්සෙ පටිඝානුසයො නානුසෙති. න තං ආරබ්භ උප්පජ්ජති, පහීනො[10] තත්ථ පටිඝානුසයොති අත්ථො.

**අවිජ්ජං තෙන පජහතීති** ඉධ භික්ඛු අවිජ්ජානුසයං වික්ඛම්භෙත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජති; ඣානවික්ඛම්භිතං අවිජ්ජානුසයං තථා-වික්ඛම්භිතමෙව කත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තමග්ගෙන

1. අරහත්තෙ, පිහං උපට්ඨාපයතොති-B, E. 2. ඉධ-A. M2. P2.
3. පරිච්ඡෙදකාලං-S. 4. ආගතෙ-B S. 5. එත්ථ න-L. S.
6. නාපි-B. S. 7. න දොමනස්සෙන වා-S; න දොමනස්සෙනෙව-L, B.
8. ගාළ්හං-B S. 9 මාසෙන-L. 10. පහීනොව-S, E.

සමුග්ඝාතෙති. සො අරහත්තමග්ගෙන පහීනොපි තථාවික්ඛම්භිතත්තාව[1] චතුත්ථජ්ඣානෙ නානුසෙති නාම. තෙනාහ: න තත්ථ අවිජ්ජානුසයො අනුසෙතීති.

ඉදානි පටිභාගපුච්ඡං පුච්ඡන්තො, සුඛාය පනාවුසොති ආදිමාහ. තස්ස විස්සජ්ජනෙ යස්මා සුඛස්ස දුක්ඛං, දුක්ඛස්ස ච සුඛං පච්චනීකං, තස්මා ද්වීසු වෙදනාසු විසභාගපටිභාගො කථිතො. උපෙක්ඛා පන අන්ධකාරා, අවිභූතා, දුද්දීපනා; අවිජ්ජාපි තාදිසාව.[2] තෙනෙත්ථ සභාගපටිභාගො කථිතො. යත්තකෙසු පන ඨානෙසු අවිජ්ජා තමං කරොති, තත්තකෙසු විජ්ජා තමං විනොදෙතීති එත්ථ විසභාගපටිභාගො කථිතො. විජ්ජාය ඛො ආවුසොති එත්ථ උභොපෙතෙ ධම්මා අනාසවා ලොකුත්තරාති සභාගපටිභාගොව කථිතො. විමුත්තියා ඛො ආවුසොති එත්ථ අනාසවට්ඨෙන, ලොකුත්තරට්ඨෙන, අබ්‍යාකතට්ඨෙන ච සභාගපටිභාගොව කථිතො.

අච්චසරාති එත්ථ පඤ්හං අතික්කමිත්වා ගතොසීති අත්ථො. නාසක්ඛි පඤ්හානං පරියන්තං ගහෙතුන්ති පඤ්හානං පරිච්ඡෙදං පමාණං ගහෙතුං නාසක්ඛි; අප්පටිභාගධම්මස්ස පටිභාගං පුච්ඡි. නිබ්බානං නාමෙතං අප්පටිභාගං, න සක්කා නීලං වා පීතකං වාති කෙනචි ධම්මෙන සද්ධිං පටිභාගං කත්වා දස්සෙතුං. තඤ්ච ත්වං[3] ඉමිනා අධිප්පායෙන පුච්ඡසීති අත්ථො.

එත්තාවතා චායං උපාසකො, යථා නාම සත්තමෙ ඝරෙ[4] සලාකභත්තං ලභිත්වා ගතො භික්ඛු සත්ත ඝරානි අතික්කමිත්වා අට්ඨමස්ස ද්වාරෙ ඨිතො සබ්බානිපි සත්තගෙහානි විරද්ධොව න අද්දස, එවමෙව අප්පටිභාගධම්මස්ස පටිභාගං පුච්ඡන්තො සබ්බාසුපි සත්තසු පටිභාග[5] පුච්ඡාසු විරද්ධො අහොසීති[6] වෙදිතබ්බො. නිබ්බානොගධන්ති නිබ්බානබ්භන්තරං, නිබ්බානං අනුපවිට්ඨං. නිබ්බානපරායනන්ති නිබ්බානං පරං අයනමස්ස, පරා ගති. න තතො පරං ගච්ඡතීති අත්ථො. නිබ්බානං පරියොසානං අවසානං අස්සාති නිබ්බානපරියොසානං.

පණ්ඩිතාති පණ්ඩිච්චෙන සමන්නාගතා, ධාතුකුසලා, ආයතනකුසලා, පටිච්චසමුප්පාදකුසලා, ඨානාට්ඨානකුසලා[7]. මහාපඤ්ඤාති මහන්තෙ අත්ථෙ, මහන්තෙ ධම්මෙ, මහන්තා නිරුත්තියො, මහන්තානි පටිභානානි පරිග්ගණ්හනසමත්ථාය පඤ්ඤාය සමන්නාගතා. යථා තං ධම්මදින්නායාති යථා ධම්මදින්නාය භික්ඛුනියා ව්‍යාකතං, අහම්පි එවමෙව ව්‍යාකරෙය්‍යන්ති.

---

1. තථාවික්ඛම්භිතත්තා-S. E. 2. තාදිසාවාති-B. S.
3. ත්වමත්ථං-A. P2; තමත්ථං-M2; තඤ්ච තං-R. 4. වාඝරෙ-A. M2, P2.
5. සබ්බාසුපි සප්පටිභාග-B. S.
6. විරුද්ධා හොතීති-A. M2. P2; විරද්ධාව හොතීති-L. S; විරුද්ධාව හොතීති-T1.
7 කුසලාති අත්ථො-B. S.

එත්තාවතා ච පන අයං සුත්තන්තො ජිනභාසිතො නාම ජාතො, න සාවකභාසිතො. යථා හි රාජයුත්තෙහි ලිඛිතං පණ්ණං යාව රාජමුද්දිකාය න ලඤ්ඡිතං හොති, න තාව රාජපණ්ණන්ති සඞ්ඛං ගච්ඡති; ලඤ්ඡිතමත්තං පන රාජපණ්ණං නාම හොති; තථා, අහම්පි තං[1] එවමෙව ව්‍යාකරෙය්‍යන්ති ඉමාය ජිනවචනමුද්දාය[2] ලඤ්ඡිතත්තා අයං සුත්තන්තො ආහච්චවචනෙන ජිනභාසිතො නාම ජාතො. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

චූළවෙදල්ලසුත්තං චතුත්ථං.

---

### 1. 5. 5.

**එවමෙම සුත**න්ති චූළධම්මසමාදානං. තත්ථ **ධම්මසමාදානානී**ති ධම්මොයි ගහිතගහණානි. **පච්චුප්පන්නසුඛ**න්ති පච්චුප්පන්නෙ සුඛං, ආයූහනක්ඛණෙ සුඛං, සුකරං, සුඛෙන සක්කා පූරෙතුං. **ආයතිං දුක්ඛවිපාක**න්ති අනාගතෙ විපාකකාලෙ දුක්ඛවිපාකං. ඉමිනා උපායෙන සබ්බපදෙසු අත්ථො වෙදිතබ්බො.

**නත්ථි කාමෙසු දොසො**ති වත්ථුකාමෙසුපි කිලෙසකාමෙසුපි දොසො නත්ථි. **පාතබ්‍යතං ආපජ්ජන්තී**ති තෙ වත්ථුකාමෙසු කිලෙසකාමෙන පාතබ්‍යතං පිවිතබ්බතං යථාරුචිං පරිභුඤ්ජිතබ්බතං ආපජ්ජන්තීති අත්ථො. **මොළිබද්ධාහී**ති මොළිං විය කත්වා බද්ධ[3]කෙසාහි තාපසපරිබ්බාජිකාහි. **එවමාහංසූ**ති එවං වදන්ති. **පරිඤ්ඤං පඤ්ඤපෙන්ති**ති පහානං සමතික්කමං පඤ්ඤපෙන්ති.

**මාලුවා-සිපාටිකා**ති දීඝසණ්ඨානං මාලුවාපක්කං. **ඵලෙය්‍යා**ති ආතපෙන සුස්සිත්වා භිජ්ජෙය්‍ය. **සාලමූලෙ**ති සාලරුක්ඛස්ස සමීපෙ[4] **සන්තාසං ආපජ්ජෙය්‍යා**ති කස්මා ආපජ්ජති? භවනවිනාසභයා. රුක්ඛමූලෙ පතිතමාලුවාබීජතො හි ලතා උප්පජ්ජිත්වා රුක්ඛං අභිරුහති. සා මහාපත්තා චෙව හොති බහුපත්තා ච කොවිළාරපත්තසදිසෙහි පත්තෙහි සමන්නාගතා. අථ තං රුක්ඛං මූලතො පට්ඨාය විනන්ධමානා[5] සබ්බවිටපානි සඤ්ඡාදෙත්වා මහන්තං භාරං ජනෙත්වා තිට්ඨති. සා වාතෙ වා වායන්තෙ, දෙවෙ වා වස්සන්තෙ ඔඝනං ජනෙත්වා තස්ස රුක්ඛස්ස සබ්බසාඛාපසාඛං භඤ්ජති; භූමියං නිපාතෙති. තතො තස්මිං රුක්ඛෙ පතිට්ඨිත[6]විමානං භිජ්ජති, විනස්සති. ඉති සා[7] භවනවිනාසභයා සන්තාසං ආපජ්ජති.

**ආරාමදෙවතා**ති තත්ථ තත්ථ පුප්ඵාරාම-ඵලාරාමෙසු අධිවත්ථා දෙවතා. **වනදෙවතා**ති අම්බවනසුභගවනාදීසු වනෙසු අධිවත්ථා දෙවතා. **රුක්ඛදෙවතා**ති අභිලක්ඛිතෙසු නළෙරු-පුචිමන්දාදීසු

---

1. තථාපි අහං-B. S. 2. මුද්දිකාය-B. S.
3. මොළිබන්ධාහීති මොළිං කත්වා බන්ධ-B. S. 4. සාලරුක්ඛමූලසමීපෙ-L.
5. විනද්ධමානා-S, E. 6. පතිතෙ-B. S. 7 විනාසති සො, L.

රුක්ඛෙසු අධිවත්ථා දෙවතා. **ඔසධිතිණවනප්පතීසූති** හරීතකී-ආමලකී-ආදීසු ඔසධීසු, තාලනාළිකෙරාදීසු තිණෙසු, වනජෙට්ඨකෙසු ච වනප්පතිරුක්ඛෙසු අධිවත්ථා දෙවතා. **වනකම්මිකාති** වනෙ කසන-දායන[1]-දාරු-ආහරණ-ගොරක්ඛාදිනා[2] කෙනචිදෙව කම්මෙන විචරණමනුස්සා. **උද්‍රභෙය්‍යුන්ති**[3] ඛාදෙය්‍යුං. **විලම්බිනීති** වාතෙන පහටපහටට්ඨානෙ කෙළිං කරොන්තී විය විලම්බිනී.[4]

**සුඛො ඉමිස්සාති** ඉමිස්සා එවරූපාය මාලුවාලතාය සම්ඵස්සොපි සුඛො, දස්සනම්පි සුඛං. අයං මෙ දාරකානං ආපානමණ්ඩලං භවිස්සති, කීළාභූමි භවිස්සති, දුතියං මෙ විමානං පටිලද්ධන්ති ලතාය දස්සනෙපි සම්ඵස්සෙපි සොමනස්සජාතා එවමාහ.

**විටපිං[5] කරෙය්‍යාති** සාඛානං උපරි ඡත්තාකාරෙන තිට්ඨෙය්‍ය. **ඔඝනං ජනෙය්‍යාති** හෙට්ඨා ඝනං ජනෙය්‍ය. උපරි ආරූළ්හා සකල රුක්ඛං පලිවෙඨෙත්වා පුන හෙට්ඨා භස්සමානා භූමිං ගණ්හෙය්‍යාති අත්ථො. **පදාලෙය්‍යාති** එවං ඔඝනං කත්වා පුන තතො පට්ඨාය යාව මූලා ඔභිණ්ණසාඛාහි අභිරූය්හමානා සබ්බසාඛා පලිවෙඨෙන්තී මත්ථකං පත්වා තෙනෙව නියාමෙන පුන ඔරොහිත්වා අභිරූහිත්වා ච සකලං රුක්ඛං සංසිබ්බිත්වා සබ්බසාඛා හෙට්ඨා කත්වා සයං උපරි ඨත්වා වාතෙ වා වායන්තෙ දෙවෙ වා වස්සන්තෙ පදාලෙය්‍ය. භින්දෙය්‍යාති අත්ථො; ඛාණුමත්තමෙව තිට්ඨෙය්‍ය.

තත්ථ යං සාඛට්ඨකවිමානං හොති, තං සාඛාසු භිජ්ජමානාසු තත්ථ තත්ථෙව භිජ්ජිත්වා සබ්බසාඛාසු භින්නාසු සබ්බං භිජ්ජති. රුක්ඛට්ඨක විමානං පන යාව රුක්ඛස්ස මූලමත්තම්පි තිට්ඨති, තාව න නස්සති. ඉදං පන විමානං සාඛට්ඨකං, තස්මා සබ්බසාඛාසු භින්නාසු භිජ්ජිත්ථ දෙවතා පුත්තකෙ ගහෙත්වා ඛාණුකෙ ඨිතා පරිදෙවිතුං ආරද්ධා.

**තිබ්බරාගජාතිකොති** බහලරාගසභාවො. **රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙතීති** තිබ්බරාගජාතිකත්තා දිට්ඨදිට්ඨෙ ආරම්මණෙ නිමිත්තං ගණ්හාති. අථස්ස ආචරියුපජ්ඣායා දණ්ඩකම්මං ආණාපෙන්ති. සො අභිණ්හං දණ්ඩකම්මං කරොන්තො දුක්ඛං දොමනස්සං පටිසං-වෙදෙති, න චෙව වීතික්කමං කරොති. තිබ්බදොසජාතිකොපි අප්ප මත්තකෙනෙව කුප්පති. දහරසාමණෙරෙහි සද්ධිං හත්ථපරාමාසාදීනි කරොන්තො ච කළෙති. සොපි දණ්ඩකම්මපච්චයා දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. මොහජාතිකො පන ඉධ කතං එත්ථ[6] න සල්ලක්ඛෙති, තානි තානි කිච්චානි විරාධෙති. සොපි දණ්ඩකම්මපච්චයා දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. **න තිබ්බරාගජාතිකොති** ආදීනි වුත්තනයෙන වෙදිතබ්බානි.

---

1. ලායන-B. S. 2. ගොරක්ඛාදිසු-B. S. 3. උට්ඨහෙය්‍යුන්ති-B. S.
4. විලම්බති-R, T1; විලම්බන්තී-B. S. 5. විටපං-B, S; විටභිං [පාළි]
6. ඉධ කතං වා කතතො අකතං වා අකතතො-B, S.

කස්මා පනෙත්ථ කොචි තිබ්බරාගාදිජාතිකො හොති, කොචි න තිබ්බරාගාදිජාතිකො? කම්මනියාමෙන. යස්ස හි කම්මායූහනක්ඛණෙ ලොභො බලවා හොති, අලොභො මන්දො, අදොසාමොහා බලවන්තො, දොසමොහා මන්දා, තස්ස මන්දො අලොභො ලොභං පරියාදාතුං න සක්කොති; අදොසාමොහා පන බලවන්තො දොසමොහෙ පරියාදාතුං සක්කොන්ති. තස්මා සො තෙන කම්මෙන දින්නපටිසන්ධිවසෙන නිබ්බත්තො ලුද්ධො හොති සුඛසීලො, අක්කොධනො පඤ්ඤවා වජිරූපමඤාණො.

යස්ස පන කම්මායූහනක්ඛණෙ ලොභදොසා බලවන්තො හොන්ති, අලොභාදොසා මන්දා, අමොහො බලවා, මොහො මන්දො, සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දුට්ඨො ච, පඤ්ඤවා පන හොති වජිරූපමඤාණො; දත්තාභයත්ථෙරො විය. යස්ස කම්මායූහනක්ඛණෙ ලොභාදොසමොහා[1] බලවන්තො හොන්ති, ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දන්ධො ච, සීලකො[2] පන හොති අක්කොධනො. තථා යස්ස කම්මායූහනක්ඛණෙ තයොපි ලොභදොසමොහා බලවන්තො හොන්ති, අලොභාදයො මන්දා, සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දුට්ඨො ච මූළ්හො ච.

යස්ස පන කම්මායූහනක්ඛණෙ අලොභදොසමොහා බලවන්තො හොන්ති, ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව අප්පකිලෙසො හොති දිබ්බාරම්මණම්පි දිස්වා නිච්චලො, දුට්ඨො ච පන හොති දන්ධපඤ්ඤො චාති. යස්ස කම්මායූහනක්ඛණෙ අලොභාදොසමොහා බලවන්තො හොන්ති, ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව අලුද්ධො චෙව හොති සීලකො ච,[3] දන්ධො ච පන හොති. තථා යස්ස කම්මායූහනක්ඛණෙ අලොභදොසාමොහා බලවන්තො හොන්ති, ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව අලුද්ධො චෙව හොති පඤ්ඤවා ච, දුට්ඨො පන හොති කොධනො. යස්ස පන කම්මායූහනක්ඛණෙ තයොපි අලොභාදයො බලවන්තො හොන්ති, ලොභාදයො මන්දා, සො මහාසඞ්ඝරක්ඛිතත්ථෙරො විය අලුද්ධො අදුට්ඨො පඤ්ඤවා ච හොති. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

චූළධම්මසමාදානසුත්තං පඨමං.

---

## 1. 5. 6.

**එවං මෙ සුතන්ති මහාධම්මසමාදානං. තත්ථ එවංකාමාති එවං-ඉච්ඡා. එවංඡන්දාති එවංඅජ්ඣාසයා. එවංඅධිප්පායාති එවංලද්ධිකා. තත්‍රාති තස්මිං අනිට්ඨවඩ්ඪනෙ[4] ඉට්ඨපරිහානෙ ච.**

---

1. ලොභදොසමොහා-S. 2. සුඛසීලකො-S. 3. සුඛසීලකො අක්කොධනො-S.
4. අනිට්ඨවඩ්ඪනෙ චෙව S, E,

**භගවංමූලකාති** භගවා මූලං **එතෙසන්ති** භගවංමූලකා. ඉදං වුත්තං හොති: ඉමෙ භන්තෙ අම්හාකං ධම්මා පුබ්බෙ කස්සපසම්මාසම්බුද්ධෙන උප්පාදිතා. තස්මිං පරිනිබ්බුතෙ එකං බුද්ධන්තරං අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා ඉමෙ ධම්මෙ උප්පාදෙතුං සමත්ථො නාම නාහොසි. භගවතා පන නො[1] ඉමෙ ධම්මා උප්පාදිතා. භගවන්තං හි නිස්සාය මයං ඉමෙ ධම්මෙ ආජානාම, පටිවිජ්ඣාමාති එවං භගවංමූලකා නො භන්තෙ ධම්මාති. **භගවංනෙත්තිකාති** භගවා හි ධම්මානං නෙතා විනෙතා අනුනෙතා,[2] යථාසභාවතො පාටියෙක්කං පාටියෙක්කං නාමං ගහෙත්වා දස්සෙතාති ධම්මා භගවංනෙත්තිකා නාම හොන්ති. **භගවංපටිසරණාති** චතුභූමක[3]ධම්මා සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස ආපාථං ආගච්ඡමානා භගවති පටිසරන්ති නාමාති භගවංපටිසරණා. පටිසරන්තීති ඔසරන්ති, සමොසරන්ති. අපි ච මහාබොධිමණ්ඩෙ නිසින්නස්ස භගවතො පටිවෙධවසෙන ඵස්සො ආගච්ඡති, අහං භගවා කිංනාමොති? ත්වං ඵුසනට්ඨෙන ඵස්සො නාම. වෙදනා, සඤ්ඤා, සඞ්ඛාරා, විඤ්ඤාණං ආගච්ඡති, අහං භගවා කිංනාමන්ති? ත්වං විජානනට්ඨෙන විඤ්ඤාණං නාමාති. එවං චතුභූමකා[3]ධම්මානං යථාසභාවතො පාටියෙක්කං පාටියෙක්කං නාමං ගණ්හන්තො භගවා ධම්මෙ පටිසරන්තීතිපි භගවංපටිසරණා. **භගවන්තංයෙව පටිභාතූති** භගවතොව එතස්ස භාසිතස්ස අත්ථො උපට්ඨාතු. තුම්හෙයෙව නො කථෙත්වා දෙථාති අත්ථො.

**සෙවිතබ්බාති** නිස්සිතබ්බා. **භජිතබ්බාති** උපගන්තබ්බා. **යථා තං අවිද්දසුනොති** යථා අවිද්දසුනො[4] බාලස්ස අන්ධපුථුජ්ජනස්ස. **යථා තං විද්දසුනොති** යථා විද්දසුනො[5] මෙධාවිනො පණ්ඩිතස්ස.

**අත්ථි භික්ඛවෙ ධම්මසමාදානන්ති**, පුරිමසුත්තෙ උප්පටිපාටි-ආකාරෙන මාතිකා ඨපිතා. ඉධ පන යථාධම්මරසෙනෙව සත්ථා මාතිකං ඨපෙසි. තත්ථ **ධම්මසමාදානන්ති** පාණාතිපාතාදීනං ධම්මානං ගහණං. **අවිජ්ජාගතොති** අවිජ්ජාය සමන්නාගතො **විජ්ජාගතොති** විජ්ජාය සමන්නාගතො පඤ්ඤවා.

**සහාපි දුක්ඛෙනාති** එත්ථ මිච්ඡාචාරෙ, අභිජ්ඣා, මිච්ඡාදිට්ඨීති ඉමෙ තාව තයො පුබ්බචෙතනාය ච අපරචෙතනාය චාති ද්වින්නං චෙතනානං වසෙන දුක්ඛවෙදනා හොන්ති, සන්නිට්ඨාපකචෙතනා පන සුඛසම්පයුත්තා වා උපෙක්ඛාසම්පයුත්තා වා හොති. සෙසා පාණාතිපාතාදයො සත්ත තිස්සන්නම්පි චෙතනානං වසෙන දුක්ඛවෙදනාව හොන්ති. ඉදං සන්ධාය වුත්තං: **සහාපි දුක්ඛෙන, සහාපි දොමනස්සෙනාති.** දොමනස්සමෙව චෙත්ථ දුක්ඛන්ති වෙදිතබ්බං; පරියෙට්ඨිං වා ආපජ්ජන්තස්ස පුබ්බභාගපරභාගෙසු කායික[6]දුක්ඛම්පි වට්ටතියෙව.

---

1. පන නෙ-L. 2. අනුනෙතාති-L. B. S. 3. චතුභූමකා-B; චතුභූමිකා-S.
4. අවිදුනො-B, S, L. 5. විදුනො-S, 6. කායිකං-B, S.

**සහාපි සුඛෙනාති** එත්ථ පාණාතිපාතො, ඵරුසවාචා, බ්‍යාපාදොති ඉමෙ තාව තයො පුබ්බචෙතනාය ච අපරචෙතනාය චාති ද්වින්නං චෙතනානං වසෙන සුඛවෙදනා හොන්ති, සන්නිට්ඨාපකචෙතනා පන දුක්ඛසම්පයුත්තාව හොති. සෙසා සත්ත තිස්සන්නම්පි චෙතනානං වසෙන සුඛවෙදනා හොන්තියෙව. **සහාපි සොමනස්සෙනාති**[1] සොමනස්සමෙව එත්ථ සුඛන්ති වෙදිතබ්බං; ඉට්ඨපොට්ඨබ්බසම්බන්ධිතො වා පුබ්බභාගපරභාගෙසු කායිකසුඛම්පි වට්ටතියෙව.

තතියධම්මසමාදානෙ ඉධෙකච්චො මච්ඡබන්ධො වා හොති, මාගවිකො වා, පාණූපඝාතංයෙව නිස්සාය ජීවිකං කප්පෙති. තස්ස ගරුට්ඨානියො භික්ඛු අකාමකස්සෙව පාණාතිපාතෙ ආදීනවං පාණාතිපාතවිරතියා ච ආනිසංසං කථෙත්වා සික්ඛාපදං දෙති. සො ගණ්හන්තොපි දුක්ඛිතො දොමනස්සිතොව හුත්වා ගණ්හාති; අපරභාගෙ කතිපාහං වීතිනාමෙත්වා රක්ඛිතුං අසක්කොන්තොපි දුක්ඛිතොව හොති. තස්ස පුබ්බාපරචෙතනා දුක්ඛසහගතාව හොන්ති, සන්නිට්ඨාපකචෙතනා පන සුඛසහගතා වා උපෙක්ඛාසහගතා වා. එවං සබ්බත්ථ අත්ථො වෙදිතබ්බො. ඉති පුබ්බභාගාපරභාගචෙතනාව සන්ධාය ඉදං වුත්තං: **සහාපි දුක්ඛෙන, සහාපි දොමනස්සෙනාති.** දොමනස්සමෙව එත්ථ දුක්ඛන්ති වෙදිතබ්බං.

**චතුත්ථධම්මසමාදානෙ** දසසුපි පදෙසු තිස්සොපි පුබ්බභාගාපරභාගසන්නිට්ඨාපකචෙතනා සුඛසම්පයුත්තා හොන්තියෙව. තං සන්ධාය ඉදං වුත්තං: **සහාපි සුඛෙන, සහාපි සොමනස්සෙනාති.** සොමනස්සමෙව එත්ථ සුඛන්ති වෙදිතබ්බං. **තිත්තකාලාබූති**[2] තිත්තකො අලාබු. **විසෙන සංසට්ඨොති** හලාහලවිසෙන සංයුත්තො මිස්සිතො ලුළිතො. **නච්ඡාදෙස්සතීති** න රුච්චිස්සති, න තුට්ඨිං කරිස්සති. **නිගච්ඡසීති**[3] ගමිස්සසි. **අප්පටිසඞ්ඛා**[4] **පිවෙය්‍යාති** අපච්චවෙක්ඛිත්වා පිවෙය්‍ය.

**ආපානීයකංසොති** ආපානීයස්ස මධුරපානකස්ස භරිතකංසො. **වණ්ණසම්පන්නොති** පානකවණ්ණාදීහි සම්පන්නකංසො. පක්ඛිත්තූපචාරෙන පන කංසො[5] එවං වුත්තො. **ඡාදෙස්සතීති** තං හි හලාහලවිසං යත්ථ යත්ථ පක්ඛිත්තං හොති, තස්ස තස්සෙව රසං දෙති. තෙන වුත්තං: **ඡාදෙස්සතීති.**

**පූතිමුත්තන්ති** මුත්තමෙව. යථා හි මනුස්සත්තභාවො සුවණ්ණවණ්ණොපි පූතිකායොත්වෙව, තදහු ජාතාපි ච ගළොචිලතා[6] පූතිලතාත්වෙව වුච්චති, එවං තඞ්ඛණං ගහිතං තරුණම්පි මුත්තං පූතිමුත්තමෙව. **නානාභෙසජ්ජෙහීති** හරීතකාමලකාදීහි නානොසධෙහි. **සුඛී අස්සාති** සුඛී අරොගො සුවණ්ණවණ්ණො සුඛිතො භවෙය්‍ය.

---

1. හොන්තියෙව-B, S. 2. ලාබූති-S, E. 3. නිගච්ඡස්සසීති-E.
4. අප්පටිසංඛාය-S T1. 5. පානීයකංසො-L; සම්පන්නකංසො-S.
6. තරුණා ච ලතා-S.

**දධි ච මධු චාති**[1] සුපරිසුද්ධං දධි ච මධුරසඤ්ච මධු. **එකජ්ඣං සංසට්ඨන්ති** එකතො කත්වා මිස්සිතං ආලුළිතං. **තස්ස තන්ති** තස්ස තං චතුමධුරභෙසජ්ජං පිවතොපි[2] රුච්චෙය්‍ය ඉදඤ්ච යං[3] භගන්දර සංසට්ඨං[4] ලොහිතං පක්ඛන්දති, න තස්ස භෙසජ්ජං; ආහාරං ඵමෙනත්වා මග්ගං අවලඤ්ජං කරොති. යං පන පිත්තසංසට්ඨං ලොහිතං, තස්සෙතං භෙසජ්ජං, සීතලකිරිය[5]පරියන්තභූතං.

**විද්ධෙති** උබ්බිද්ධෙ. මෙඝවිගමෙන දූරීභූතෙති අත්ථො. **විගතවලාහකෙති** අපගතමෙඝෙ. **දෙවෙති** ආකාසෙ. **ආකාසගතං තමගතන්ති** ආකාසගතං තමං. **පුථුසමණබ්‍රාහ්මණපරප්පවාදෙති** පුථූනං සමණබ්‍රාහ්මණසඞ්ඛාතානං පරෙසං වාදෙ. **අභිවිහච්චාති** අභිහන්ත්වා. **භාසතෙ ච තපතෙ ච විරොචති චාති** සරදකාලෙ මජ්ඣන්තිකසමයෙ ආදිච්චොව ඕභාසං මුඤ්චති, තපති, විජ්ජොතතීති.

ඉදං පන සුත්තං දෙවතානං අතිවිය පියං මනාපං. තත්‍රිදං වත්ථු. දක්ඛිණදිසායං කිර හත්ථිභොගජනපදෙ පණ්ඩුර[6]විහාරෙ නාම අත්ථි. තත්ථ[7] භොජනසාලාද්වාරෙ පණ්ඩුර[6]රුක්ඛෙ අධිවත්ථා දෙවතා රත්තිභාගෙ එකස්ස දහරස්ස පදභඤ්ඤවසෙන[8] ඉමං සුත්තං ඔසාරෙන්තස්ස සුත්වා සාධුකාරං අදාසි. දහරො, කො එසොති ආහ. අහං භන්තෙ ඉමස්මිං රුක්ඛෙ අධිවත්ථා දෙවතාති. දෙවතෙ කස්මිං පසන්නාසි, කිං සද්දෙ උදාහු සුත්තෙති? සද්දෙ නාම භන්තෙ යස්ස කස්සචි හොතියෙව, සුත්තෙ පසන්නාම්හි; සත්ථාරා ජෙතවනෙ නිසීදිත්වා කථිතදිවසෙ ච අජ්ජ ච එකබ්‍යඤ්ජනෙපි[9] නානං නත්ථීති. අස්සොසි ත්වං දෙවතෙ සත්ථාරා කථිතදිවසෙති? ආම භන්තෙ. කත්ථ ඨිතා අස්සොසීති? භන්තෙ ජෙතවනං ගතම්හි; මහෙසක්ඛාසු පන දෙවතාසු ආගච්ඡන්තීසු තත්ථ ඔකාසං අලභිත්වා ඉධෙව ඨත්වා අස්සොසින්ති. එත්ථ ඨිතාය සක්කා සත්ථු සද්දො සොතුන්ති? ත්වං පන භන්තෙ මය්හං සද්දං සුණසීති? ආම දෙවතෙති. දක්ඛිණකණ්ණපස්සෙ නිසීදිත්වා කථනකාලො විය භන්තෙ හොතීති. කිං පන දෙවතෙ සත්ථු රූපං පස්සසීති? සත්ථා මංයෙව ඔලොකෙතීති මඤ්ඤමානා සණ්ඨාතුං න සක්කොමි භන්තෙති. විසෙසං පන නිබ්බත්තෙතුං අසක්ඛිත්ථ දෙවතෙති? දෙවතා තත්ථෙව අන්තරධායි. තං දිවසං කිරෙස දෙවපුත්තො සොතාපත්තිඵලෙ පතිට්ඨිතො. එවමිදං සුත්තං දෙවතානං පියං මනාපං. සෙසං සබ්බත්ථ උත්තානත්ථමෙවාති.

### මහාධම්මසමාදානසුත්තං ඡට්ඨං

---

1. දධිං ච මධුං චාති-L. 2. පිවතො-B, S.
3. ඉදං ද්වයං-A M2, P2; ඉධ ද්වයං-P1; ඉධ ච යං-R.
4. ගණ්ඩරසංසට්ඨං-P1, R; භගන්දරසං-L; භගන්දලාසංසට්ඨං-S.
කිරියාය-A, M2, P2, S, E. 6. සණ්හර-B; පණ්ඩුර-S.
7. තස්ස-B, S. 8. පදභාජනවසෙන-P1, R, T; සරභඤ්ඤවසෙන-E.
9. එකබ්‍යඤ්ජනෙනපි-P1, R, B, S.

## 1. 5. 7.

**එවම්මෙ සුතන්ති** වීමංසකසුත්තං. තත්ථ **වීමංසකෙනාති** තයො වීමංසකා: අත්ථවීමංසකො, සඞ්ඛාරවීමංසකො, සත්ථුවීමංසකොති. තෙසු, “පණ්ඩිතා භාවුසො මනුස්සා වීමංසකා”ති එත්ථ අත්ථවීමංසකො ආගතො. “යතො ඛො ආනන්ද භික්ඛු ධාතුකුසලො ච හොති, ආයතනකුසලො ච හොති, පටිච්චසමුප්පාදකුසලො ච හොති, ඨානාට්ඨානකුසලො ච හොති, එත්තාවතා ඛො ආනන්ද පණ්ඩිතො භික්ඛු වීමංසකොති අලං වචනායා”ති එත්ථ සඞ්ඛාරවීමංසකො ආගතො. ඉමස්මිං පන සුත්තෙ සත්ථුවීමංසකො අධිප්පෙතො. **චෙතොපරියායන්ති** චිත්තපරිච්ඡෙදං.[1] **සමන්නෙසමානොති** එසන්තො පරියෙසන්තො උපපරික්ඛා. **ඉති විඤ්ඤාණායාති** එවං විජානනත්ථාය.

**ද්වීසු ධම්මෙසු තථාගතො සමන්නෙසිතබ්බොති** ඉධ කල්‍යාණමිත්තූපනිස්සයං දස්සෙති. මහා හි එස කල්‍යාණමිත්තූපනිස්සයො නාම. තස්ස මහන්තභාවො එවං වෙදිතබ්බො: එකස්මිං සමයෙ ආයස්මා ආනන්දො, උපඩ්ඪං අත්තනො ආනුභාවෙන හොති, උපඩ්ඪං කල්‍යාණමිත්තානුභාවෙනාති චින්තෙත්වා අත්තනො ධම්මතාය නිච්ඡිතුං අසක්කොන්තො භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡි: “උපඩ්ඪමිදං භන්තෙ බ්‍රහ්මචරියස්ස යදිදං කල්‍යාණමිත්තතා, කල්‍යාණසහායතා, කල්‍යාණසම්පවඞ්කතා”ති. භගවා ආහ: “මා හෙවං ආනන්ද අවච, මා හෙවං ආනන්ද අවච. සකලමෙව හිදං ආනන්ද බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා, කල්‍යාණසහායතා, කල්‍යාණසම්පවඞ්කතා. කල්‍යාණමිත්තස්සෙතං ආනන්ද භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස, කල්‍යාණසම්පවඞ්කස්ස, අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සති[2] කථඤ්චානන්ද භික්ඛු කල්‍යාණමිත්තො-පෙ-අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති? ඉධානන්ද භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති-පෙ-සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං-පෙ-එවං ඛො ආනන්ද භික්ඛු කල්‍යාණමිත්තො-පෙ-බහුලීකරොති. තදමිනාපෙතං ආනන්ද පරියායෙන වෙදිතබ්බං යථා සකලමෙව හිදං[3] බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා, කල්‍යාණසහායතා, කල්‍යාණසම්පවඞ්කතා. මමං හි ආනන්ද කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා-පෙ-සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්තී”ති.

භික්ඛූනං බාහිරඞ්ගසම්පත්තිං කථෙන්තොපි ආහ: “බාහිරං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි යං එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා.

---

1, චිත්තචාරං චිත්තපරිච්ඡෙදං-S. E. 2, කරිස්සතීති-L.
3, සකලමෙවිදං-L. S. E.

කල්‍යාණමිත්තතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතී"ති මහාචුන්දස්ස කිලෙසසල්ලෙඛපටිපදං කථෙන්තොපි, "පරෙ පාපමිත්තා භවිස්සන්ති, මයමෙත්ථ කල්‍යාණමිත්තා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො"ති ආහ.

මෙඝියත්ථෙරස්ස විමුත්තිපරිපාචනියධම්මෙ කථෙන්තොපි, "අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා පඤ්ච ධම්මා පරිපාකාය සංවත්තන්ති. කතමෙ පඤ්ච? ඉධ මෙඝිය භික්ඛු කල්‍යාණමිත්තො හොතී"ති කල්‍යාණමිත්තූපනිස්සයමෙව විසෙසෙසි.

පියපුත්තස්ස රාහුලත්ථෙරස්ස අභිණ්හොවාදං දදන්තොපි,

"මිත්තෙ භජස්සු කල්‍යාණෙ පන්තඤ්ච සයනාසනං
විවිත්තං අප්පනිග්ඝොසං මත්තඤ්ඤූ හොහි භොජනෙ.
චීවරෙ පිණ්ඩපාතෙ ච පච්චයෙ සයනාසනෙ
එතෙසු තණ්හං මාකාසි මා ලොකං පුනරාගමා"ති

කල්‍යාණමිත්තූපනිස්සයමෙව සබ්බපඨමං කථෙසි.

එවං මහා එස කල්‍යාණමිත්තූපනිස්සයො නාම. ඉධාපි තං දස්සෙන්තො භගවා, **ද්වීසු ධම්මෙසු තථාගතො සමන්නෙසිතබ්බොති** දෙසනං ආරභි; පණ්ඩිතො භික්ඛු ද්වීසු ධම්මෙසු තථාගතං එසතු ගවෙසතූති අත්ථො.

එතෙන භගවා, අයං මහාජච්චොති වා, ලක්ඛණසම්පන්නොති වා, අභිරූපො දස්සනීයොති වා, අභිඤ්ඤාතො අභිලක්ඛිතොති වා, ඉමං නිස්සායාහං චීවරාදයො පච්චයෙ ලභිස්සාමීති වා, එවං චින්තෙත්වා මං නිස්සාය වසිතබ්බං නත්ථි; යො පන එවං සල්ලක්ඛෙති: පහොති මෙ එස සත්ථා හුත්වා සත්ථුකිච්චං සාධෙතුන්ති, සො මං භජතූති සීහනාදං නදි[1]. බුද්ධසීහනාදො කිර නාමෙස සුත්තන්තොති.

ඉදානි තෙ ද්වෙ ධම්මෙ දස්සෙන්තො, **චක්ඛුසොතවිඤ්ඤෙය්‍යෙසූති** ආහ. තත්ථ සත්ථු කායිකො සමාචාරෙ වීමංසකස්ස චක්ඛුවිඤ්ඤෙය්‍යො ධම්මො නාම; වාචසිකො සමාචාරෙ සොතවිඤ්ඤෙය්‍යො ධම්මො නාම. ඉදානි තෙසු සමන්නෙසිතබ්බාකාරං දස්සෙන්තො, **යෙ සඞ්කිලිට්ඨාති** ආදිමාහ. තත්ථ **සඞ්කිලිට්ඨාති** කිලෙසසම්පයුත්තා. තෙ ච න[2] චක්ඛුසොතවිඤ්ඤෙය්‍යා. යථා පන උදකෙ චලන්තෙ වා බුබ්බුළකෙ වා මුඤ්චන්තෙ අන්තො මච්ඡො[3] අත්ථීති ඤායති[4], එවං පාණාතිපාතාදීනි වා කරෙන්තස්ස මුසාවාදාදීනි වා භණන්තස්ස කායවචීසමාචාරෙ දිස්වා ච සුත්වා ච තංසමුට්ඨාපකං චිත්තං සඞ්කිලිට්ඨන්ති ඤායති. තස්මා එවමාහ. සඞ්කිලිට්ඨචිත්තස්ස හි කායවචීසමාචාරාපි සඞ්කිලිට්ඨායෙව නාම. **න තෙ තථාගතස්ස සංවිජ්ජන්තීති** තෙ තථාගතස්ස නත්ථි. න උපලබ්භන්තීති එවං ජානාතීති අත්ථො. නත්ථිතායෙව හි තෙ න උපලබ්භන්ති, න පටිවජ්ඣන්තාය.

1. නදති-B. S, 2. තෙ න ච-L, 3. මච්ඡා-L. 4. විඤ්ඤායති-B, S.

තථා හි, භගවා එකදිවසං ඉමෙසු ධම්මෙසු භික්ඛුසඞ්ඝං පවාරෙන්තො ආහ: “හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි[1] වො, න ච මෙ කිඤ්චි ගරහථ කායිකං වා වාචසිකං වා”ති. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: න ඛො මයං භන්තෙ භගවතො කිඤ්චි ගරහාම කායිකං වා වාචසිකං වා. භගවා හි භන්තෙ අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා,[2] අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො, මග්ගානුගා ච පන භන්තෙ එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා”ති. එවං පරිසුද්ධා තථාගතස්ස කායවචීසමාචාරා.

උත්තරොපි සුදං මාණවො, තථාගතස්ස කායවචීද්වාරෙ අනාරාධනියං කිඤ්චි පස්සිස්සාමීති සත්ත මාසෙ අනුබන්ධිත්වා ලික්ඛා[3]මත්තම්පි න අද්දස. මනුස්සභූතො වා එස බුද්ධභූතස්ස කායවචීද්වාරෙ කිං අනාරාධනියං පස්සිස්සති? මාරොපි දෙවපුත්තො බොධිසත්තස්ස සතො මහාභිනික්ඛමනතො පට්ඨාය ඡබ්බස්සානි ගවෙසමානො කිඤ්චි අනාරාධනියං නාද්දස, අන්තමසො චෙතොපරිවිතක්කමත්තම්පි. මාරො කිර[4] චින්තෙසි: සචස්ස විතක්කිතමත්තම්පි අකුසලං පස්සිස්සාමි, තත්ථෙව තං මුද්ධනි පහරිත්වා පක්කමිස්සාමීති. සො ඡබ්බස්සානි අදිස්වා බුද්ධභූතම්පි එකං වස්සං අනුබන්ධිත්වා කිඤ්චි වජ්ජං අපස්සන්තො ගමනසමයෙ වන්දිත්වා[5],

“මහාවීර මහාපඤ්ඤ ඉද්ධියා යසසා ජලං
සබ්බවෙරභයාතීත පාදෙ වන්දාමි ගොතමා”ති

ගාථං වත්වා ගතො.

**වීතිමිස්සාති** කාලෙ කණ්හා කාලෙ සුක්කාති එවං වොමිස්සකා. **වොදාතාති**[6] පරිසුද්ධා නික්කිලෙසා. **සංවිජ්ජන්තීති** වොදාත[6]ධම්මා අත්ථි උපලබ්භන්ති. තථාගතස්ස හි පරිසුද්ධා කායසමාචාරාදයො. තෙනාහ: ‘චත්තාරිමානි භික්ඛවෙ තථාගතස්ස අරක්ඛෙය්‍යානි. කතමානි චත්තාරි? පරිසුද්ධකායසමාචාරො භික්ඛවෙ තථාගතො, නත්ථි තථාගතස්ස කායදුච්චරිතං, යං තථාගතො රක්ඛෙය්‍ය මා මෙ ඉදං පරො අඤ්ඤාසීති. පරිසුද්ධවචීසමාචාරො...පරිසුද්ධමනොසමාචාරො... පරිසුද්ධාජීවො භික්ඛවෙ තථාගතො, නත්ථි තථාගතස්ස මිච්ඡාආජීවො, යං තථාගතො රක්ඛෙය්‍ය මා මෙ ඉදං පරො අඤ්ඤාසී”ති.

**ඉමං කුසලං ධම්මන්ති** ඉමං ආජීවට්ඨමකසීලං. අයමායස්මා සත්ථා කිං නු ඛො දීඝරත්තං සමාපන්නො චිරකාලතො[7] පට්ඨාය ඉමිනා සමන්නාගතො, උදාහු ඉත්තරසමාපන්නො හිය්‍යො වා පරෙ වා පරතරෙ[8] වා දිවසෙ සමාපන්නොති එවං ගවෙසතීති[9] අත්ථො.

---

1. පවාරයාමි-S. E. 2. සඤ්ජනෙතා-B. S. 3. ලිඛා-S. E.
4. මාරෙ-B S. 5. වන්දි-B. S. 6. වොදාතාති-L.
7. අතිචිරකාලතො-B. S. 8 පරපරෙ-B; පරසුවෙ-S.
9. ගවෙසතූති-B. S.

එකච්චො හි එකස්මිං ඨානෙ වසන්තො බහුං මිච්ඡාජීවකම්මං කතං හොති.[1] තං අද්ධානාතික්කමෙ පඤ්ඤායති, පාකටං හොති. සො අඤ්ඤතරං පච්චන්තගාමං වා සමුද්දතීරං වා ගන්ත්වා පණ්ණසාලං කාරෙත්වා ආරඤ්ඤකො විය හුත්වා විහරති. මනුස්සා සම්භාවනං උප්පාදෙත්වා තස්ස පණීතෙ පච්චයෙ දෙන්ති. ජනපදවාසිනො භික්ඛු තස්ස පරිහාරං දිස්වා, අතිදප්පිතො වතායං ආයස්මා, කො නු ඛො එසොති පරිගණ්හන්තා, අසුකට්ඨානෙ අසුකං නාම මිච්ඡාජීවං කත්වා පක්කන්තභික්ඛූති ඤත්වා, න සක්කා ඉමිනා සද්ධිං උපොසථො වා පවාරණා වා කාතුන්ති සන්නිපතිත්වා ධම්මෙන සමෙන උක්ඛෙපනියාදිසු අඤ්ඤතරං කම්මං කරොන්ති. එවරූපාය පටිච්ඡන්නපටිපත්තියා අත්ථිභාවං වා නත්ථිභාවං වා වීමංසාපෙතුං එවමාහ. **එවං ජානාතීති** දීඝරත්තං සමාපන්නො න ඉත්තරසමාපන්නොති ජානාති. අනච්ඡරියඤ්චෙතං යං තථාගතස්ස එතරහි සබ්බඤ්ඤුතං පත්තස්ස දීඝරත්තං ආජීවට්ඨමකසීලං පරිසුද්ධං භවෙය්‍ය, යස්ස බොධිචරිය[2]කාලෙපි එවං අහොසි.

අතීතෙ කිර ගන්ධාරරාජා ච විදෙහරාජා[3] ච ද්වෙපි සහායකා හුත්වා කාමෙසු ආදීනවං දිස්වා රජ්ජානි පුත්තානං නිය්‍යාතෙත්වා ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා එකස්මිං අරඤ්ඤගාමකෙ පිණ්ඩාය චරන්ති. පච්චන්තෙ ච නාම දුල්ලභලොණො හොති. තෙ අලොණං යාගුං ලභිත්වා එකිස්සා සාලාය නිසීදිත්වා පිවන්ති. අන්තරන්තරෙ මනුස්සා ලොණචුණ්ණං ආහරිත්වා දෙන්ති. එකදිවසං එකො ඉසිස්ස[4] පණ්ණෙ පක්ඛිපිත්වා ලොණචුණ්ණං අදාසි. වෙදෙහ-ඉසි ගහෙත්වා උපඩ්ඪං ගන්ධාර-ඉසිස්ස සන්තිකෙ ඨපෙත්වා උපඩ්ඪං අත්තනො සන්තිකෙ ඨපෙසි. තතො ථොකං පරිභුත්තාවසෙසකං දිස්වා, මා ඉදං නස්සීති පණ්ණෙන වෙඨෙත්වා තිණගහනෙ ඨපෙසි. පුන එකස්මිං දිවසෙ යාගුපානකාලෙ සතිං කත්වා ඔලොකෙන්තො තං දිස්වා ගන්ධාර-ඉසිං[5] උපසඞ්කමිත්වා, ඉතො ථොකං ගණ්හථාචරියාති ආහ. කුතො තෙ ලද්ධං වෙදෙහ-ඉසීති? තස්මිං දිවසෙ පරිභුත්තාවසෙසකං මා නස්සීති මයා ඨපිතන්ති. ගන්ධාර-ඉසි ගහෙතුං න ඉච්ඡි. තං[6] අලොණිකං[7] යෙව යාගුං පිවිත්වා වෙදෙහිසිං අවොච:

"හිත්වා ගාමසහස්සානි පරිපුණ්ණානි සොළස
කොට්ඨාගාරානි ඵීතානි සන්නිධිං දානි කුබ්බසී"ති.

වෙදෙහිසි අවොච: තුම්හෙ රජ්ජං පහාය පබ්බජිතා ඉදානි කස්මා ලොණචුණ්ණමත්තසන්නිධිකාරණා පබ්බජ්ජාය අනුච්ඡවිකං න කරොථාති? කිං මයා කතං වෙදෙහිසීති? අථ නං ආහ:

"හිත්වා ගන්ධාරවිසයං පහූතධනධානියං
පසාසනතො නික්ඛන්තො ඉධ දානි පසාසසී"ති.

---

1. කත॰-B. S. 2. තස්ස බොධිසත්ත-S E; බොධිචරණ-B.
3. වෙදෙහරාජ॰-S. E. 4. වෙදෙහිසිස්ස-S; ගන්ධාරිසිස්ස-B.
5. ගන්ධාරිසි॰-L, S. 6. ඉච්ඡති-B, S. 7. අලොණක॰-S, E.

ගන්ධාරො ආහ :

“ධම්මං භණාමි භද්දන්තෙ අධම්මො මෙ න රුච්චති
ධම්මං මෙ භණමානස්ස න පාපමුපලිප්පතී”ති.

වෙදෙහො ආහ :

“යෙන කෙනචි වණ්ණෙන පරො ලබ්හති රුප්පනං
මහත්ථියම්පි[1] චෙ වාචං න තං භාසෙය්‍ය පණ්ඩිතො”ති.

ගන්ධාරො ආහ :

“කාමං රුප්පතු වා මා වා භුසංව විකිරීයතු
ධම්මං මෙ භණමානස්ස[2] න පාපමුපලිප්පතී”ති.

තතො වෙදෙහ-ඉසි යස්ස සකාපි බුද්ධි නත්ථි, ආචරියසන්තිකෙ විනයම්පි න සික්ඛති, සො අන්ධමහිසො විය වනෙ චරතීති විනෙත්වා ආහ :

“නො චෙ අස්ස සකා බුද්ධි විනයො වා සුසික්ඛිතො
වනෙ අන්ධමහිසොව චරෙය්‍ය බහුකො ජනො.

යස්මා ච පනිධෙකච්චෙ ආචාරම්හි සුසික්ඛිතා
තස්මා විනීතවිනයා චරන්ති සුසමාහිතා”ති.

එවඤ්ච පන වත්වා වෙදෙහ-ඉසි අජානිත්වා මයා කථිතන්ති ගන්ධාරිසිං )මාපෙසි. තෙ උභොපි තපං චරිත්වා බ්‍රහ්මලොකං අගමංසු. එවං තථා ාතස්ස බොධිසත්තකාලෙපි දීඝරත්තං ආජීවට්ඨමකසීලං පරිසුද්ධං අහොසි.

**ඤාතජ්ඣාපන්නො[3] අයමායස්මා භික්ඛු යසං පත්තොති** අයමායස්මා අම්හාකං සත්ථා භික්ඛු ඤාතත්තං පඤ්ඤාතභාවං පාකටභාවං අජ්ඣාපන්නො නු බො, යසඤ්ච පරිවාරසම්පත්තිං පත්තො නු බො නොති. තෙනිමස්ස[4] ඤාතත්ත[5]ජ්ඣාපන්නභාවෙන ච යසනිස්සිතභාවෙන ච කිං එකච්චෙ ආදීනවා සන්දිස්සන්ති, උදාහු නොති එවං සමන්නෙසතූති දස්සෙති. **න තාව භික්ඛවෙති** යාව භික්ඛු රාජරාජමහාමත්තාදීසු අභිඤ්ඤාතභාවං වා පරිවාරසම්පත්තිං වා අනාපන්නො[6] හොති, තාව එකච්චෙ මානාතිමානාදයො ආදීනවා න සංවිජ්ජන්ති; උපසන්තූපසන්තො සොතාපන්නො විය සකදාගාමී විය ච විහරති. අරියො නු බො පුථුජ්ජනො නු බොතිපි ඤාතුං න සක්කා හොති.

**යතො ච බො භික්ඛවෙති** යථා පන ඉධෙකච්චො භික්ඛු ඤාතො වා හොති පරිවාරසම්පන්නො වා, තදා තිණ්හෙන සිඞ්ගෙන ගොගණං විජ්ඣන්තො දුට්ඨගොණො විය, මිගසඞ්ඝං අභිමද්දමානො දීපි විය ච අඤ්ඤෙ භික්ඛූ තත්ථ තත්ථ විජ්ඣන්තො අගාරවො අසභාගවුත්ති අයගපාදෙන භූමිං ඵුසන්තො විය විචරති.

1. මහද්ධියම්පි-A. M2 P2, මහන්තියම්පි-S. E 2. භාසමානස්ස-B. S.
3. ඤාතජ්ඣාපත්තො-S. 4. තෙන-S; තෙන වස්ස-E, තෙ ඉමස්ස-I
5. ඤාතඤ්ඤත-B; පඤ්ඤාතත්ත-S. 6. ආපන්නො-B S.

එකච්චො පන කුලපුත්තො යථා යථා ඤාතො හොති යසස්සි, තථා තථා ඵලභාරභරිතො විය සාලි සුට්ඨුතරං ඔනමති; රාජරාජමහාමත්තාදීසු උපසඞ්කමන්තෙසු අකිඤ්චනභාවං පච්චවෙක්ඛිත්වා සමණසඤ්ඤං උපට්ඨාපෙත්වා ඡින්නවිසාණො උසභො විය, චණ්ඩාලදාරකො විය ච සොරතො නිවාතො නීචචිත්තො ච හුත්වා භික්ඛුසඞ්ඝස්ස චෙව සදෙවකස්ස ලොකස්ස හිතාය සුඛාය පටිපජ්ජති. එවරූපං පටිපත්තිං සන්ධාය, **නාස්ස ඉධෙකච්චෙ ආදීනවා**ති ආහ. තථාගතො පන අට්ඨසු ලොකධම්මෙසු තාදී. සො හි ලාභෙපි තාදී අලාභෙපි තාදී, යසෙපි තාදී අයසෙපි තාදී, නින්දායපි තාදී පසංසායපි තාදී, සුඛෙපි තාදී දුක්ඛෙපි තාදී. තස්මා සබ්බාකාරෙනෙව නාස්ස ඉධෙකච්චෙ ආදීනවා සංවිජ්ජන්ති.

**අභයූපරතො**ති අභයො හුත්වා උපරතො. අච්චන්තූපරතො සතතූපරතො නු ඛොති[1] අත්ථො. න වා භයෙන උපරතොතිපි **අභයූපරතො**. චත්තාරි හි භයානි: කිලෙසභයං, වට්ටභයං, දුග්ගතිභයං, උපවාදභයන්ති. පුථුජ්ජනො චතූහිපි භයෙහි භායති; සෙඛා[2] තීහි. තෙසං හි දුග්ගතිභයං පහීනං. ඉති සත්ත සෙඛා භයූපරතා, ඛීණාසවො අභයූපරතො නාම. තස්ස හි එකම්පි භයං නත්ථි. පරවාදභයං නත්ථීති?[3] පරානුද්දයං පන පටිච්ච මාදිසං ඛීණාසවං පටිච්ච සත්තා මා නස්සන්තූති උපවාදං රක්ඛති.

මූලුප්පලවාපි-විහාරවාසිත්ථෙරො[4] විය. ථෙරො කිර මූලුප්පලවාපි ගාමං පිණ්ඩාය පාවිසි. අථස්ස උපට්ඨාකකුලද්වාරං පත්තස්ස පත්තං ගහෙත්වා එණ්ඩිලපීඨකං[5] නිස්සාය ආසනං පඤ්ඤපෙසුං. අමච්චධීතාපි තං යෙව පීඨකං[5] නිස්සාය පරභාගෙ[6] නීචතරං ආසනං පඤ්ඤපෙත්වා නිසීදි. එකො නෙවාසිකො භික්ඛු පච්ඡා පිණ්ඩාය පවිට්ඨො ද්වාරෙ ඨත්වා ඔලොකෙන්තො, ථෙරො අමච්චධීතරා සද්ධිං එකමඤ්චෙ නිසින්නොති සල්ලක්ඛෙත්වා, අයං පංසුකූලිකො විහාරෙ උපසන්තූපසන්තො විය විහරති, අන්තොගාමෙ පන උපට්ඨායිකාහි සද්ධිං එකමඤ්චෙ නිසීදතීති[7] චින්තෙත්වා, කිං නු ඛො මයා දුද්දිට්ඨන්ති පුනප්පුනං ඔලොකෙත්වා තථාසඤ්ඤීව[8] හුත්වා පක්කාමි. ථෙරොපි භත්තකිච්චං කත්වා විහාරං ගන්ත්වා වසනට්ඨානං පවිසිත්වා ද්වාරං පිධාය නිසීදි. නෙවාසිකොපි කතභත්තකිච්චො විහාරං ආගන්ත්වා, තං පංසුකූලිකං නිග්ගණ්හිත්වා විහාරා නික්කඩ්ඪිස්සාමීති අසඤ්ඤතනීහාරෙන ථෙරස්ස වසනට්ඨානං ගන්ත්වා පරිභොගඝටතො උළුඞ්කෙන උදකං ගහෙත්වා මහාසද්දං කරොන්තො පාදෙ ධොවි. ථෙරො, කො නු ඛො අයං අසඤ්ඤතචාරිකොති ආවජ්ජෙන්තො සබ්බං ඤත්වා, අයං මයි මනං පදොසෙත්වා අපායූපගො මා අහොසීති වෙහාසං අබ්භුග්ගන්ත්වා කණ්ණිකමණ්ඩලසමීපෙ පල්ලඞ්කෙන නිසීදි. නෙවාසිකො දුට්ඨාකාරෙන

1. සතතූපරතොති-S. E. 2. සෙක්ඛා-S; සෙඛා-E. 3. නත්ථීති? නත්ථි-B.
4. මරවතත්ථෙරො-A. M2. P2; යසත්ථෙරො-B. 5 පීඨකං-S. E.
6. පරතො-B. S. 7. නිසීදති-B. S.
8. තථාසඤ්ඤී-A, M2, P2; තථාසඤ්ඤො-S.

සූචිකං උක්ඛිපිත්වා ද්වාරං විවරිත්වා අන්තො පවිට්ඨො ථෙරං අපස්සන්තො, හෙට්ඨාමඤ්චං පවිට්ඨො භවිස්සතීති ඔලොකෙත්වා තම්පි අපස්සන්තො නික්ඛමිතුං ආරභි. ථෙරො උක්කාසි. ඉතරො උද්ධං ඔලොකෙන්තො දිස්වා අධිවාසෙතුං අසක්කොන්තො එවමාහ: ආවුසො පංසුකූලික පතිරූපං නු[1] තෙ එවං ආනුභාවසම්පන්නස්ස උපට්ඨායිකාය සද්ධිං එකමඤ්චෙ නිසීදිතුන්ති. භන්තෙ පබ්බජිතා නාම මාතුගාමෙන සද්ධිං න එකමඤ්චෙ නිසීදන්ති, තුම්හෙහි පන දුද්දිට්ඨං එතන්ති. එවං ඛීණාසවා පරානුකම්පාය[2] උපවාදං රක්ඛන්ති.

**ඛයා රාගස්සාති** රාගස්ස ඛයෙනෙව වීතරාගත්තා කාමෙ න සෙවති, න පටිසඞ්ඛාය වාරෙත්වාති. **තථෙවාති** එවං තථාගතස්ස කිලෙසප්පහානං ඤත්වා තත්ථ තත්ථ සීතනිසින්නකාලාදීසුපි, චතුපරිසමජ්ඣෙ අලඞ්කත ධම්මාසනෙ නිසීදිත්වාපි, ඉතිපි සත්ථා වීතරාගො වීතදොසො වීතමොහො වන්තකිලෙසො පහීනමලො අබ්භාමුත්තපුණ්ණචන්දො විය සුපරිසුද්ධොති එවං තථාගතස්ස කිලෙසප්පහානෙ වණ්ණං කථයමානං තං වීමංසක භික්ඛුං පරෙ එවං පුච්ඡෙය්‍යුං චෙති අත්ථො. **ආකාරාති** කාරණා. **අන්වයාති** අනුබුද්ධියො.

**සඞ්ඝෙ වා විහරන්තොති** අප්පෙකදා අපරිච්ඡින්නස්ස[3] භික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ විහරන්තො. **එකො වා විහරන්තොති**, "ඉච්ඡාමහං භික්ඛවෙ අඩ්ඪමාසං පටිසල්ලීයිතුං", "තෙමාසං පටිසල්ලීයිතු"න්ති එවං පටිසල්ලීනො[4] චෙව පාරිලෙය්‍යකවනසණ්ඩෙ ච එකකො විහරන්තො. **සුගතාති** සුට්ඨුගතා, සුප්පටිපන්නා කාරකා යුත්තපයුත්තා. එවරූපාපි හි එකච්චෙ භික්ඛූ අත්ථි. **දුග්ගතාති** දුට්ඨුගතා, දුප්පටිපන්නා කායදළ්හි[5] බහුලා විස්සට්ඨකම්මට්ඨානා. එවරූපාපි එකච්චෙ අත්ථි. **ගණමනුසාසන්තීති** ගණබන්ධනෙන බද්ධා[6] ගණාරාමා ගණබාහුලිකා හුත්වා ගණං පරිහරන්ති. එවරූපාපි එකච්චෙ අත්ථි. තෙසං පටිපක්ඛභූතා ගණතො නිස්සටා විසංසට්ඨා විප්පයුත්ත[7]විහාරිනොපි අත්ථි. **ආමිසෙසු සන්දිස්සන්තීති** ආමිසගිද්ධා ආමිසචක්ඛුකා, චතුපච්චය-ආමිසත්ථමෙව ආහිණ්ඩමානා ආමිසෙසු සන්දිස්සන්තා[8] භික්ඛූපි අත්ථි. ආමිසෙන අනුපලිත්තා චතූහි පච්චයෙහි විනිවට්ටමානසා[9] අබ්භාමුත්තචන්දසදිසා හුත්වා විහරමානාපි අත්ථි.

**නායමායස්මා තං තෙන අවජානාතීති** අයමායස්මා තාය තාය පටිපත්තියා තං තං පුග්ගලං නාවජානාති. අයං සුප්පටිපන්නො කාරකො, අයං ගණතො නිස්සටො විසංසට්ඨො, අයං ආමිසෙන අනුපලිත්තො පච්චයෙහි විනිවට්ටමානසො අබ්භාමුත්තචන්දො වියාති එවමස්ස ගෙහසිතවසෙන උස්සාදනාපි නත්ථි; අයං දුප්පටිපන්නො අකාරකො කායදළ්හි[5]බහුලො විස්සට්ඨකම්මට්ඨානො,[10] අයං

1. පතිරූපං-B. S. 2. පරානුද්දයාය-B. S. 3. අපරිච්ඡින්නගණනස්ස-L. B. S.
4. පටිසල්ලානෙන-B. S. 5. කායදළ්හි-S. E. 6. බන්ධා-S. E.
7. විප්පමුත්ත-L. 8. සන්දිස්සමානකා-B. S.
9. විවිත්තමානසා-B; විවටමානසා-S. 10. විස්සට්ඨකම්මන්තො-L.

ගණබන්ධනබද්ධො, අයං ආමිසගිද්ධො ලොලො ආමිසචක්ඛුකොති එවමස්ස ගෙහසිතවසෙන අපසාදනාපි නත්ථීති අත්ථො. ඉමිනා කිං කථිතං හොති? තථාගතස්ස සන්තෙසු තාදිභාවො[1] කථිතො හොති. අයං හි,

"වධකස්ස දෙවදත්තස්ස චොරස්සඞ්ගුලිමාලිනො
ධනපාලකෙ රාහුලෙ ච සබ්බෙසං සමකො මුනී"ති.

**තත්‍ර භික්ඛවෙති** තෙසු ද්වීසු වීමංසකෙසු යො චායං, කෙ පනායස්මතො ආකාරාති පුච්ඡාය ආගතො ගණ්ඩිවීමංසකො, යො ච, අහස්සු-පරතො අයමායස්මාති ආගතො මූලවීමංසකො, තෙසු මූලවීමංසකෙන තථාගතොව[2] උත්තරිං පටිපුච්ඡිතබ්බො. සො හි පුබ්බෙ පරස්සෙව කථාය නිට්ඨං ගතො. පරො ච නාම ජානිත්වාපි කථෙය්‍ය, අජානිත්වාපි. එවමස්ස කථා භූතාපි හොති, අභූතාපි[3]. තස්මා පරස්සෙව කථාය නිට්ඨං අගන්ත්වා තතො උත්තරිං තථාගතොව පුච්ඡිතබ්බොති අත්ථො.

**බ්‍යාකරමානොති** එත්ථ යස්මා තථාගතස්ස මිච්ඡාබ්‍යාකරණං නාම නත්ථි, තස්මා සම්මා මිච්ඡාති අවත්වා බ්‍යාකරමානොත්වෙව වුත්තං. **එතපථොහමස්මි එතගොචරොති** මය්හං ආජීවට්ඨමකසීලං පරිසුද්ධං, එස මය්හං පථො, එස ගොචරොති අත්ථො. එතාපාථොතිපි පාඨො. තස්සත්ථො : මය්හං ආජීවට්ඨමකසීලං පරිසුද්ධං, ස්වාහං තස්ස පරිසුද්ධභාවෙන වීමංසකස්ස භික්ඛුනො සම්මුඛෙ එතාපාථො එවං ආපාථං ආගච්ඡාමීති වුත්තං හොති. **නො ච තෙන තම්මයොති** තෙනාපි චාහං පරිසුද්ධෙන සීලෙන න තම්මයො, න සතණ්හො, පරිසුද්ධසීලත්තාව නිත්තණ්හොහමස්මීති දීපෙති.

**උත්තරුත්තරිං පණීතපණීතන්ති** උත්තරුත්තරිං චෙව පණීතපණීතං ච කත්වා දෙසෙති. **කණ්හසුක්කසප්පටිභාගන්ති** කණ්හඤ්ච සුක්කඤ්ච තඤ්ච ඛො සප්පටිභාගං සවිපාකං කත්වා, කණ්හං පටිබාහිත්වා සුක්කං, සුක්කං පටිබාහිත්වා කණ්හන්ති එවං සප්පටිභාගං කත්වා කණ්හසුක්කං දෙසෙති. කණ්හං දෙසෙන්තොපි ච සඋස්සාහං සවිපාකං දෙසෙති. සුක්කං දෙසෙන්තොපි සඋස්සාහං සවිපාකං දෙසෙති.

**අභිඤ්ඤාය ඉධෙකච්චං ධම්මං ධම්මෙසු නිට්ඨං ගච්ඡතීති** තස්මිං දෙසිතෙ ධම්මෙ එකච්චං පටිවෙධධම්මං අභිඤ්ඤාය තෙන අභිඤ්ඤාතෙන පටිවෙධධම්මෙන දෙසනාධම්මෙ නිට්ඨං ගච්ඡති. **සත්ථරි පසීදතීති** එවං ධම්මෙ නිට්ඨං ගන්ත්වා භිය්‍යොසොමත්තාය, **සම්මාසම්බුද්ධො භගවාති** සත්ථරි පසීදති. තෙන පන භගවතා යො ධම්මො අක්ඛාතො, **සොපි ස්වාක්ඛාතො භගවතා ධම්මො** නිය්‍යානිකත්තා, යො චස්ස තං ධම්මං පටිපන්නො, සො[4] **සුපටිපන්නො සඞ්ඝො**[5] වඞ්කාදිදොසරහිතං

1. තාදිසභාවො-A, P2. 2. තථාගතො න-L.
3. අභූතාපි හොති-A, M2, P2. 4. සොපි-L, S. 5. සුපටිපන්නො-L.

පටිපදං පටිපන්නත්තාති එවං ධම්මසඞ්ඝෙසුපි[1] පසීදති. **තමෙනන්ති** තං එවං පසන්නං තත්ථ තත්ථ තිණ්ණං රතනානං වණ්ණං කථයන්තං[2] භික්ඛුං.

